

විස්තරාර්ථ සහිත

# සාරස්වතාඛ්‍යාත
# ව්‍යාඛ්‍යානය



විස්තරාර්ථ සහිත

# සාරස්වතාඛ්‍යාත ව්‍යාඛ්‍යානය.

---

චතුර්ථ භාගය.

---

කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහා විද්‍යාලයාධිපති
පණ්ඩිතාචාර්ය බද්දේගම
ශ්‍රී ප්‍රියරත්නාභිධාන නායක මාහිමියන්
වහන්සේ විසින් සම්පාදිත යි.

---

කොළඹ පුංචි බොරැල්ලේ
එච්. ජී. ටී. අප්පුහාමි වෙළඳ මහතා විසින්
දකුණු කළුතර
“විද්‍යාතිලක” මුද්‍රණාලයයෙහි මුද්‍රිත යි.

---

2485.
1941.

# විඥප්ති.

ශ්‍රීමත් පරමහංස පරිව්‍රාජකාචාර්ය අනුභූතිස්වරූපාචාර්යවරයන් විසින් විරචිත වූ සාරස්වත ව්‍යාකරණය වනාහි සංස්කෘත ව්‍යාකරණාභිලාෂී ආධුනිකයන්ගේ උද්ග්‍රහණ- ධාරණයෙහි අතිශය ප්‍රතිෂ්ඨාධාරවූ සුබොධ ප්‍රශස්ත ව්‍යාකරණයෙකි. එහෙයින් ම මෙකල ලක්දිව සංස්කෘත ව්‍යාකරණාධ්‍යාපනයෙහි සාරස්වත ව්‍යාකරණය පළමු කොට පරිශීලනය කරවන බව පෙණේ. එහි දු ශිෂ්‍යයන්ගේ දෘඪතරාවබොධය සලකා වදාළ දිවඞ්ගත විද්‍යෝදය පරිවෙණාධිපති අතිගරු සාහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන කොළඹ නව කෝරලයේ ප්‍රධාන නායක මාහිමියානන් වහන්සේ විසින් ආඛ්‍යාතයේ භ්වාදි ගණය අවසන් කොට ඇති කාණ්ඩත්‍රයාත්මක ප්‍රශස්ත ව්‍යාඛ්‍යානයක් සපයන ලද්දේ ය. ලඞ්කාවේ වර්තමාන සංස්කෘත සාහිත්‍යාභ්‍යුන්නතියට විශිෂ්ට සෙවයක් සිදු කොට වදාළ යථොක්ත නායක හිමිපානන් වහන්සේගේ එම සවිස්තර ව්‍යාඛ්‍යානය පණ්ඩිත ලොකයාගේ අකලඞ්ක ගෞරවාදරයට භාජන වූ බව සුප්‍රකට ය.

අර්ධයකට ස්වල්පයක් ඌන වූ අවශිෂ්ට භාගයට ද පැහැදිලි සන්නයක් නො මැති වීම ආධුනිකයන්ට මහත් පාඩුවකි. එහෙයින් සාරස්වතයේ ඉතිරි කොටසට ද ව්‍යාඛ්‍යානයක් සපයන ලෙස පූර්වොක්ත සාහවේ නායක මාහිමියානන් වහන්සේ ධ්‍රියමාණ අවස්ථායෙහි ම අපට අවසර දී වදාළහ. එපමණක් නො ව අප හිතමිත්‍රයන් හා ශිෂ්‍යයන් බොහෝ දෙනෙකුන් විසින් ද ඒ සඳහා අප වෙත නොයෙක් විට ආරාධනය කරණ ලදී. අප සිත්හි ද මේ කෘතිය ඉක්මනින් සම්පූර්ණ කිරීමට ඉතා ඕනෑ කමක් පැවැත්තේ වී නමුත් අනවකාශත්වහෙතුවෙන් අත පසු වන අතර අපගේ කිඞ්කර ශිෂ්‍යයෙකු වූ විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය ධුරයක් දරණ හැඟොඩ ධම්මින්ද තැනගේ බලවත් උත්සාහය කරණ කොට ගෙණ අදදියෙහි පටන් ආඛ්‍යාත ප්‍රක්‍රියාව අවසන් කොට ඇති මේ කොටස දැන් අපට ආධුනිකයන් හමුවෙහි තබන්නට පුළුවන් වූ බව සතුටින් ප්‍රකාශ කරමු. කෘදන්ත ප්‍රක්‍රියාත්මක අවසාන භාගය ද නො පමාව ම ප්‍රකාශයට පැමිණෙන හෙයින් සාරස්වත ව්‍යාකරණය පිළිබඳ ප්‍රමාණවත් සංඥාපනයක් එහි ඇතුළත් කිරීමට බලාපොරොත්තු වම්හ.

අපේ මේ ව්‍යාඛ්‍යානය ද කහවේ නායක මාහිමියන් වහන්සේගේ ව්‍යාඛ්‍යානය අනු ව ම එහි චතුර්ථ භාගය ලෙස සම්පාදිත වූ සවිස්තර සන්නයෙකි. සාරස්වත සූත්‍රයන්ට සානුවෘත්ත පදාර්ථ දැක්වීම මෙහි විශෙෂ ලක්‍ෂණයෙකි. එයින් සූත්‍රාර්ථය නිරවුල් වෙයි.

බොම්බාය- කල්කටාව ආදි ඉන්දියාවේ නොයෙක් ප්‍රදෙශයන්හි මුද්‍රිත වූ අන්‍යොන්‍ය විසදෘශ බොහෝ සාරස්වතයන් මෙකල දක්නට ලැබෙතත් ඒ සියල්ල ම අනෙක දොෂ දූෂිතය යි කිය හැකි ය. අෂ්ටාධ්‍යායී සූත්‍ර පාඨය පවා බොහෝ පොත්වල නො දක්නා ලැබේ. ඇතැම් සූත්‍රයන්ගේ අපගමනයෙන් හා අධික පාඨ සම්මිශ්‍රණයෙන් ද, ලිපි භ්‍රමාදියෙන් ද, ශොධකයන්ගේ අනවධානත්වයෙන් ද වූ බොහෝ දෝෂස්ථානයන් යථාශක්තීන් ශුද්ධියට පමුණුවා ගෙණ ම මේ කොටසෙහි ව්‍යාඛ්‍යානය සම්පාදනය කොළෙමු.

මෙහි මුද්‍රණයෙහි දී ශොධ්‍යපත්‍ර බලා දීම් ආදියෙන් බෙහෙවින් අපට උපකාර වූ වේලාපුර කලුතර පෞරාණික දීපාරාම දූවේ විහාරාධිපති බෙන්තර සද්ධාතිස්ස ස්ථවිරයන්ට හා මුද්‍රණ ද්‍රව්‍යයන් ඉතා දුර්ලභව පවත්නා මෙසමයෙහි පවා මෙය මුද්‍රාපණයට ඉදිරිපත් වූ කොළඹ පුංචි බොරැල්ලේ එච්. ජී. පී. අප්පුහාමි වෙළඳ මහතාට ද අපි කෘතඥ වම්හ. එසේ ම මෙහි මුද්‍රණය ශොභන ලෙසත් ශීඝ්‍ර ලෙසත් කර දුන් කලුතර "විද්‍යාතිලක" යන්ත්‍රාලයාධිපති කේ. ජේ. පීරිස් මහතාට ද ආශීර්වාද කරමු.

තව ද මෙහි 16 පිටේ 7 පෙළේ "ඝ්ඤුයාත්" යන්න "ඝ්ඤුයාත්" කියා ද, "ඝ්ඤුයාත්" යන්න "ඝ්ඤුයාත්" කියා ද, 24 පිටේ 9 පෙළේ "අවොචත්" යන්න "අවොචත්" කියා ද, 60 පිටේ ප්‍රථම පෙළේ හා එහි සන්නයෙහිත් වූ "ත්‍රීයාත්" යන්න "ත්‍රියාත්" කියා ද, 143 පිටේ 4 පෙළේ "අඩිසසොඃ" යන්න "අඩිසයොඃ" කියා ද ශුද්ධ විය යුතු යි. මුද්‍රණයෙන් හෝ අපගේ අනවධානත්වයෙන් වූ තවත් මෙබඳු දොෂස්ථාන වෙතොත් සුධීහු ඒ බැව් කාරුණාවෙන් දන්වත්වා.

මෙහි සියලු හිම් කම් මේ සඳහා ස්වකීය උත්සාහය හා කාලයත් මෙහෙයූ පූජෝත්තම හෑගොඩ ධම්මින්ද තැනගේ අදහස් පරිදි විය යුතු බව ද අවසාන වශයෙන් මෙහි සඳහන් කරම්හ.

ශාස්ත්‍රාභිවෘද්ධිකාමී,

බද්දේගම පියරතන,

විද්‍යොදය පරිවෙණාධිපති.

2485/1941 ජූලි 15 දින

විද්‍යොදය පිරිවෙණේ දී ය.

# අනුක්‍රමණිකා.


| විෂය. | | | | | පිට. |
|---|---|---|---|---|---|
| 1. | i | අදාදි | පරස්මෛපදි | ප්‍රක්‍රියා | 1 |
| | ii | ,, | ආත්මනෙපදි | ,, | 33 |
| | iii | ,, | උභයපදි | ,, | 40 |
| 2. | i | ජුහොත්‍යාදි | පරස්මෛපදි | ප්‍රක්‍රියා | 49 |
| | ii | ,, | ආත්මනෙපදි | ,, | 58 |
| | iii | ,, | උභයපදි | ,, | 59 |
| 3. | i | දිවාදි | පරස්මෛපදි | ප්‍රක්‍රියා | 66 |
| | ii | ,, | ආත්මනෙපදි | ,, | 76 |
| | iii | ,, | උභයපදි | ,, | 80 |
| 4. | i | ස්වාදි | උභයපදි | ප්‍රක්‍රියා | 81 |
| | ii | ,, | පරස්මෛපදි | ,, | 88 |
| | iii | ,, | ආත්මනෙපදි | ,, | 90 |
| 5. | i | රුධාදි | උභයපදි | ප්‍රක්‍රියා | 92 |
| | ii | ,, | පරස්මෛපදි | ,, | 95 |
| | iii | ,, | ආත්මනෙපදි | ,, | 98 |
| 6. | | තනාදි ප්‍රක්‍රියා | | | 99 |
| 7. | i | තුදාදි | උභයපදි | ප්‍රක්‍රියා | 107 |
| | ii | ,, | පරස්මෛපදි | ,, | 113 |
| | iii | ,, | ආත්මනෙපදි | ,, | 120 |
| 8. | i | ක්‍ර්‍යාදි | උභයපදි | ප්‍රක්‍රියා | 122 |
| | ii | ,, | පරස්මෛපදි | ,, | 129 |
| | iii | ,, | ආත්මනෙපදි | ,, | 132 |
| 9. | | චුරදි ප්‍රක්‍රියා | | | 133 |
| 10. | | ණ්‍යන්ත | ප්‍රක්‍රියා | | 141 |
| 11. | | සන්නන්ත | ,, | | 158 |
| 12. | | යඩන්ත | ,, | | 173 |
| 13. | | යඞ් ලුගන්ත | ,, | | 190 |
| 14. | | නාමධාතු | ,, | | 200 |
| 15. | | ආත්මනෙපද | ,, | | 211 |
| 16. | | භාවකර්මී | ,, | | 219 |
| 17. | | ලකාරාර්ථ | ,, | | 236 |

# සාරස්වතාඛ්‍යාත ව්‍යාඛ්‍යා.

නමස්තස්මෛ භගවතේ'ර්හතේ
සම්‍යක් සම්බුද්ධාය.

**a.** ඉදානීං ලුග්විකරණාදදාදෙර්ගණාත්කර්තරි තිබාදයො වර්ණ්‍යන්තෙ.

**1.** "අද්" භක්ෂණෙ, අප්.

## 114. අදාදෙ ලුක්. (අදාදෙඃ. 5-1. ලුක් 1-1.)

b. අදාදෙර්ගණාදුත්පන්නස්‍යාපො ලුග්භවති.

---

ප්‍රණම්‍ය සම්බුද්ධ මුනිං විමුක්තිදං
සධර්ම සඞ්ඝං ජගදර්ච්චිතං මුදා
අදාදිතො ධාතුගණාද්විතන්‍යතෙ
සාරස්වතං ව්‍යාකරණං සභාෂයා.

A. ඉදානීම්, දැන් (භ්වාදිගණයට අනතුරුව); ලුග්විකරණාත්, ලුක් වූ විකරණ ප්‍රත්‍යය ඇති; (හෙවත් "අප් කර්තරි" යන සූත්‍රයෙන් විහිත "අප්" ප්‍රත්‍යයට ලුක් වීම විකරණ කොට ඇති;) අදාදෙඃ ගණාත්, අද් භක්ෂණෙ යනාදි ධාතුගණයා කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; තිප් ආදයඃ; තිප් ආදිහු හෙවත් ලට් ආදිහු; වර්ණ්‍යන්තෙ, වර්ණනා කරනු ලැබෙත්.

1. "අද්" භක්ෂණෙ, අද් යන ධාතුව භක්ෂණාර්ථයෙහි (වැටේ;) අප්, ("අප් කර්තරි" යන සූත්‍රයෙන්) "අප්" යන විකරණ ප්‍රත්‍යය (වේ.)

114. ලුග් විධි සූත්‍ර යි. මීට "ධාතොඃ" යනු ද "අප් කර්තරි" යන සූත්‍රයෙන් විභක්ති විපර්යාස වශයෙන් "අපඃ" යනු ද අනුවෘත්ත යි.

අදාදෙඃ ධාතොඃ, අදාදි ධාතුගණයා කෙරෙන් පර වූ; අපඃ, අප් විකරණයට; ලුක්, ලුක් වේ.

"ධසෙ චපා ඣසානාම්" අත්ති අත්තඃ අදන්ති, අත්සි අත්ථඃ අත්ථ, අද්මි. අද්වඃ අද්මඃ, අද්‍යාත්. අත්තු- අත්තාද්වා අත්තාම් අදන්තු.

**115. ඣසාද්ධිර්හේඃ.** * (ඣසාත් 5-1. ධිඃ 1-1. හෙඃ 6-1.)
**ඣසාදුත්තරස්‍ය හේර්ධිර්භවති.**

**a. අද්ධි- අත්තාද්වා අත්තම් අත්ත, අදානි අදාව අදාම.**

---

අදාදේඃ ගණාත්, අදාදි ධාතු ගණයා කෙරෙන්; උත්පන්නස්‍ය, උපන්නාවූ; අපඃ, අප් විකරණයට; ලුග් භවති, ලුක් වේ.

"ධසෙ චපා ඣසානාම්" යන සූත්‍රයෙන් දකාරයට තකාරය වේ.

අත්ති—අද්මඃ, යනු ලට් පරස්මෛපද ප්‍රථම- මධ්‍යම- උත්තම පුරුෂ ඒක- ද්වි- බහු වචන යි.

අද්‍යාත්, (අද්‍යාතාම් අද්‍යුඃ, අද්‍යාඃ අද්‍යාතම් අද්‍යාත, අද්‍යාම් අද්‍යාව අද්‍යාම) යනු විධි ලිඞ් විභක්ති රූප යි.

අත්තු යනු ලොට් ප්‍රථමපුරුෂෛකවචන යි. අත්තාත් වා, අත්තාත් කියා හෝ වේ. අත්තාම්- අදන්තු යනු ද්වි- බහු වචන යි.

115. "ධි" යනාදේශ විධි සූත්‍ර යි.

ඣසාත්, ඣසප්‍රත්‍යාහාරයා කෙරෙන් පර වූ; හෙඃ, හියන්නට; ධිඃ, "ධි"යන්න වේ.

a. ඣසාත් උත්තරස්‍ය, ඣසප්‍රත්‍යාහාරයෙන් පර වූ; හෙඃ, හියන්නට; ධිඃ භවති, "ධි" යන්න වේ.

අද්ධි, යනු ලොට් මධ්‍යම පුරුෂෛක වචන යි. අත්තාත් වා, අත්තාත් කියා හෝ වේ. අත්තම්, අත්ත යනු ද්වි වචන-බහු වචන යි. අදානි, අදාව, අදාම යනු උත්තම පුරුෂ යි.

---

* මෙය "ඣසාත් ග් ධිඃ හෙඃ" යි පදච්ඡේද කොට වෘත්තිය ද "ඣසාද්ධ කාරාච්චෝත්තරස්‍ය" කියා සමහරු ගණිත්. එකල්හි "ඣසාත්" ඣසප්‍රත්‍යාහාරයා කෙරෙන් ද, ග්, හකාරයා කෙරෙන් ද (පරවූ) හෙඃ, හියන්නට. ධිඃ, ධි'යන්න වේ. කියා අර්ථ ගතයුතුයි. එසේ කල්හි මෙහි අන් තැනෙක පෙණෙන "හකාරස්‍ය ක්වචිජ්ඣස්භාවෝ වාච්‍යඃ" යනු නිරර්ථක ය.

ඣසාත් ග් ධිඃ යන තන්හි තකාරයෙන් පර හකාරයට "හො ඣභාඃ" යන්නෙන් ධකාරය ද සකාරයට "චපා අබෙ ජබාඃ" යන්නෙන් දකාරය ද "හසාත් පරස්‍ය ඣසස්‍ය සවර්ණෙ ඣසෙ ලොපො වාච්‍යඃ"යි මධ්‍ය ලොප යද කළ කල්හි එසේ ගතහැකි ය. එය ම වඩා යොග්‍යය යි හැඟේ.

## × 116. අද්‍රුදාදෙරට්. (අද්‍රුදාදෙඃ 5-1. අට් 1-1)

b. අදෙ රුදාදෙශ්ච පරයොර්දිසො‍්‍ය රඩාගමො භවති. ආදත්, ආදඃ, "සිසයොරදෙඃර් ඝස්ඍ ලිටි තු වා," ජඝාස, "ගමාං ස්වරෙ" "ඛසෙ චපාඃ" "ඝසාදෙඃ" ක්ෂඃ, ජක්ෂතුඃ, ජක්ෂුඃ.

c. ජඝසිථ, පක්ෂෙ:- ආද, ආදතුඃ, ආදුඃ, ආදිථ, අද්‍යාත්, අත්තා, අත්ස්‍යති, ආත්ස්‍යත්, ඝදිත්වාත් ඩඃ, අඝසත්, අඝසතාම්, අඝසන්.

---

116. අඩාගම විධි සූත්‍ර යි. "දිසො‍්‍යාභිසාත්" යි දිසො‍්‍යාඃ යනු අනුවෘත්ත යි.

අද්‍රුදාදෙඃ, අද් ධාතු හා රුදාදි පඤ්චකයා කෙරෙන් පර වූ; දිසො‍්‍යඃ, දිප්-සිප් දෙක සම්බන්ධ ව; අට්, අඩාගම වේ.

b. අදඃ, අද් ධාතු කෙරෙන් ද; රුදාදෙඃ ච, රුදාදි පඤ්චකයා කෙරෙන් ද; පරයොඃ, පර වූ; දිසො‍්‍යාඃ, දිප්-සිප් දෙක සම්බන්ධ ව; අඩාගමඃ භවති, අට් ආගම වේ.

ආදත්, ආදත්- (ආත්තාම්- ආදන්) යනු ලඞ් ප්‍රථම පුරුෂ යි. ආදඃ, ආදඃ- (ආත්තම්-ආත්ත) යනු මධ්‍යම පුරුෂ යි. (ආදම්-ආද්ව-ආද්ම යනු උත්තම පුරුෂ යි.)

සිසයොඃ, (ලුඞ් විභක්තියෙහි වූ) සිප්‍රත්‍යය (ඉච්ඡාර්ථයෙහි වූ) සප්‍රත්‍යය යන දෙක විෂයෙහි; අදෙඃ, අද් ධාතුහට; ඝස්ඍ, ඝස්ඍ යන ආදෙශය වේ; ලිටි තු, ලිට් පරකල්හි වනාහි; වා, විකල්පයෙන් වේ. "ජඝාස" යනු ලිට් ප්‍රථම පුරුෂෛක වචන යි.

"අද්- ණප්" යි සිටිකල්හි විකල්පයෙන් "ඝස්" වේ. (ඝස්-ණප්) "සස්වරාදිර් ද්වි ර ද්විඃ" යි ද්විරුක්ත වේ. (ඝ-ඝස්-ණප්) ඝකාරයට "කුහොශ් චුඃ" යි ඣකාරය වේ. (ඣ ඝස්-ණප්) "ඣපානාං ජබ චපාඃ" යි ජකාරය වේ. (ජඝස්-ණප්) උපධා අකාරයට "අත උපධායාඃ" යි වෘද්ධි වේ. ඉත් සංඥ ලොපාදියෙන් "ජඝාස" යනු වේ. ගමාං ස්වරෙ, "ගමාං ස්වරෙ" යන්නෙන් ඝකාරස්ථ උපධා අකාරයට ලොප් වේ. "ඛසෙ චපාඃ", ඛසෙ චපා ඣසානාම් යන්නෙන් ඝකාරයට කකාරය වේ. "ඝසාදෙඃ" යන්නෙන් ස හට ෂ වේ. ක්ෂඃ, (කකාර ෂකාර සංයොගයෙහි) ක්ෂ* යන්න වේ. ජක්ෂතුඃ- ජක්ෂුඃ යනු ප්‍රථම පුරුෂ ද්වි- බහු වචන යි.

---

× මේ සූත්‍ර-වෘත්ති දෙක සඳහා "අදෙර්දිසො‍්‍යරඩාගමො වක්තව්‍යඃ" යි පොත්හි පැණේ. එහෙත් ඒ සදොසි. ලඝු භාෂ්‍යාදිය බලනු.

* සිංහලාක්ෂර විෂයෙහි ක්ෂය නො යෙදේ.

**2. " පසා " භක්ෂණේ, පසාති, පසාතඃ, පසානති. පසායාත්, පසායාතාම්, පසායුඃ., පසාතු, පසාතාද්වා–පසාතාම්, පසාන්තු. අපසාත්–අපසාතාම්.**

---

c. ජඝසිථ, ඉඩාගම සල කල්හි මධ්‍යම පුරුෂෙක වචන යෙහි "ජඝසිථ" යනු වේ. (ද්වි– බහු වචනයන්හි ජක්ෂථුඃ–ජක්ෂ–යනු වේ. උත්තම පුරුෂයෙහි ජඝාස– ජඝස, ජක්ෂිව, ජක්ෂිම යනු වේ.) පක්ෂ:– ඝස්ඏ ආදෙශය නුවූ පක්ෂයෙහි; ආද– ආදතුඃ– ආදුඃ යනු ප්‍රථම පුරුෂ යි. ආදිථ, (ආදථුඃ–ආද, ආද–ආදිව–ආදිම) යනු මධ්‍යම (උත්තම) පුරුෂ යි. අද්‍යාත්, (අද්‍යාස්තාම්, අද්‍යාසුඃ. අද්‍යාඃ, අද්‍යාස්තම්, අද්‍යාස්ත අද්‍යාසම් අද්‍යාස්ව අද්‍යාස්ම) යනු ආශීර් ලිඞ් වචන යි.

අත්තා, අත්තා, (අත්තාරෞ අත්තාරඃ, අත්තාසි අත්තාස්ථඃ අත්තාස්ථ, අත්තාස්මි අත්තාස්වඃ අත්තාස්මඃ) යනු ලුට් පරස්මෛපද රූප යි.

අත්ස්‍යති, අත්ස්‍යති (අත්ස්‍යතඃ අත්ස්‍යන්ති) යනාදිය ලෘට් පරස්මෛපද යි.

ආත්ස්‍යත්, ආත්ස්‍යත් (ආත්ස්‍යතාම් ආත්ස්‍යන්) යනාදිය ලෘඞ් රූප යි. ඝදිත්වාත්, (ඝස්ඏ ආදෙශය) ඝකාරය ඉත්කොට ඇති බැවින්; ඞඃ, ("ලිත් පුෂාදෙර් ඞඃ" යන සූත්‍රයෙන්) "ඞ" ප්‍රත්‍යය වේ. අඝසත්, අඝසත් අඝසතාම් අඝසන් යනාදිය ලුඞ් රූප යි.

2. "ප්සා," ප්සා යන ධාතුව; භක්ෂණේ, කෑමෙහි වේ. ප්සාති, ප්සාති ප්සාතඃ ප්සාන්ති යනාදිය ලට් පරස්මෛපද යි. ප්සායාත්, ප්සායාත් ප්සායාතාම් ප්සායුඃ යනාදිය විධි ලිඞ් රූප යි. ප්සාතු, ප්සාතු යනු ලොට් ප්‍රථම පුරුෂෙක වචන යි. ප්සාතාත් වා, ප්සාතාත් කියා හෝ වේ. ප්සාතාම් ප්සාන්තු යනු ද්වි– බහු වචන යි. අප්සාත්– අප්සාතාම් යනු ලඞ් ප්‍රථම පුරුෂ ඒක– ද්වි–වචන යි.

d. ආදන්ත විද්විෂාම්, ආකාරාන්ත ධාතුය– විද් ධාතුය– ද්විෂ් ධාතුය යන මොවුන්ගේ; අනඃ, අන් ප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; උස්, උස් යනාදෙශය; වක්තව්‍යඃ, * කියයුතු යි; "උස්‍යාලොපඃ" යන

---

* "ස්‍යාවිදඃ" යන සූත්‍රයෙහි විද් ධාතුව ආ බැවින් මෙහි නො යෙදේ යයි හඟිමු. එහෙයින් ම සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි "ආදන්තාද්දවිෂො ලඞොන උස්වා" යි ඇණේ. එහෙත් මුග්ධ බොධයෙහි "අභිදන්–අවිදුඃ" යන රූපද්වය පෙණේ. සි: ච: තත්ත්ව දීපිකා ටීකාවෙහි ද "අනද්‍යතනෙ විකාලෙපන" යනු කීහ.

d. ආදන්ත විද්විෂාමන උස් වා වක්තව්‍යඃ.

"උස්‍යාලොපඃ" අපසුඃ- අපසාන්, පපෙසෞ පපසතුඃ පපසුඃ. පපසිථ- පපසාථ- පෙසයාත්- පසායාත්. පසාතා. පසාස්‍යති. අපසාස්‍යත්. ආදන්තානාම් ඉතිට් සකෞ. අපසාසිත් අපසාසිෂටාම්.

3. "මා" මානෙ. මාති. මායාත්. මාතු. අමාත්. අමාතාම්. අමුඃ-අමාන්, මමෞ. "දදෙරෙඃ" මෙයාත්. මාතා. මාස්‍යති. අමාස්‍යත් අමාසිත්.

---

සූත්‍රයෙන් උස් පරකල්හි ධාත්වන්ත ආකාරයට ලොප් වේ. අප්සුඃ- අප්සාන්, ලඞ් ප්‍රථමපුරුෂ බහුවචනයෙහි අප්සුඃ යනු ද උස් ආදෙශ නුවූ පක්‍ෂයෙහි සවර්‍ණ දීර්‍ඝයෙන් අප්සාන් යනු ද වේ.

පප්සෞ පප්සතුඃ පප්සුඃ, (ලිට් ප්‍රථම පුරුෂ එකවචනයෙහි "ආතො ණප්ඩෞ" යන සූත්‍රයෙන් "ණප්" ප්‍රත්‍යයට "ඩෞ" ආදෙශ හා "ඞිති ටෙඃ" යි ටිලොපයෙන්) පප්සෞ යනු ද, පප්සතුඃ-පප්සුඃ, (ද්වි- බහු වචනයන්හි "ආතොනපි" යි ආකාර ලොපයෙන්) පප්සතුඃ පප්සුඃ යනු ද වේ. (මධ්‍යම පුරුෂෛක වචනයෙහි) පප්සිථ පප්සාථ, "ස්වරාන්තානනිත්‍යානිටසථපොවෙට්" යි ඉඩාගම ව පපසිථ යනු ද (විකල්ප පක්‍ෂයෙහි) පප්සාථ, යනු ද වේ. පප්සෞ පප්සිව පප්සිම යනු උත්තම පුරුෂ යි.

ප්සෙයාත්- ප්සායාත්, ආශීර් ලිඞ් පරස්මෙ පද ප්‍රථම පුරුෂ එකවචනයෙහි ("සංයොගාදෙරාදන්තස්‍ය කිතියාදෞවෙකාරො වා වක්තව්‍යඃ" යි කී බැවින් ආකාරයට විකල්පයෙන් එකාර වීමෙන්) ප්සෙයාත් යනු ද (විකල්ප පක්‍ෂයෙහි) ප්සායාත් යනු ද වේ. ප්සාතා ප්සාස්‍යති-අප්සාස්‍යත්, ලුට්-ලෘට්-ලෘඞ් පරස්මෙ පද ප්‍ර: එකවචනයන්හි ප්සාතා-ප්සාස්‍යති-අප්සාස්‍යත් යනු වේ. ආදන්තානාම් ඉති, ආදන්තානාම් යනාදි සූත්‍රයෙන්; ඉට්සකෞ "ඉට්" "සක්" ආගමයෝ වෙත්. අප්සාසිත් අප්සාසිෂටාම්, ලුඞ් ප්‍ර: එක-ද්වි වචනයන්හි අප්සාසීත් අප්සාසිෂටාම් යනු වේ.

3 "මා" මානෙ, මා යන ධාතුව ප්‍රමාණයෙහි වැටේ. මාති මායාත් මාතු, ලට්- විධි ලිඞ්- ලොට් පරස්මෙ පද ප්‍රථම පුරුෂෛක වචනයන්හි පිළිවෙළින් මාති මායාත් මාතු යනු වේ. අමාත්, අමාතාම්, ලඞ් ප්‍ර: එක-ද්වි වචනයන්හි අමාත් අමාතාම් යනු වේ. අමුඃ අමාන්, බහුවචනයෙහි අමුඃ යනු ද-අමාන් යනු ද වේ. මමෞ, ලිට් ප්‍ර: එකවචනයෙහි මමෞ යනු වේ.

4. "යා" ප්‍රාපණෙ, යාති, යායාත්, යාතු, අයාත් අයාතාම් අයුඃ-අයාන්, යයෞ, යායාත්, යාතා, යාස්‍යති, අයාස්‍යත්, අයාසීත්.

5. "වා" ගති ගන්ධනයොඃ, වාති, යාති වත්.

6. "රා" දානෙ, තද්වත්.

7. "ලා" දාන ග්‍රහණයොඃ, ලාති, ලලෞ.

8. "ද්‍රා" කුත්සායාං ගතෞ ච. ද්‍රාති, දද්‍රෞ, ද්‍රායාත්-ද්‍රෙයාත්, ද්‍රාතා, ද්‍රාස්‍යති, අද්‍රාස්‍යත්, අද්‍රාසීත්.

---

දදෙරෙඃ, "දදෙරෙඃ" යන පූර්ව සූත්‍රයෙන් ආකාරයට එකාරය වේ. මෙයාත්, ආශිර්ලිඞ් ප්‍රː එකවචනයෙහි මෙයාත් යනු වේ. මාතා මාස්‍යති අමාස්‍යත් අමාසීත්, ලුට්-ලෘට්-ලෘඞ්-ලුඞ්- ප්‍රː එකවචනයන්හි මාතා මාස්‍යති අමාස්‍යත් අමාසීත් යනු වේ.

4. "යා" ප්‍රාපණෙ, යා ධාතුව ගමනෙහි වේ. යාති යායාත් යාතු, ලට්-විධිලිඞ්-ලොට් ප්‍රː එකවචනයන්හි යාති යායාත් යාතු යනු වේ. අයාත් අයාතාම් අයුඃ, ලඞ් ප්‍රː එක-ද්වි- බහුවචනයන්හි අයාත් අයාතාම් අයුඃ යනු වේ. අයාන්, බහුවචනයෙහි අයාන් යනු ද වේ. යයෞ යායාත් යාතා යාස්‍යති අයාස්‍යත් අයාසීත්, ලිට්-ආශිර්ලිඞ්-ලුට්-ලෘට්-ලෘඞ්- ලුඞ්ː ප්‍රː එකවචනයන්හි යයෞ යායාත් යාතා යාස්‍යති අයාස්‍යත් අයාසීත් යනු වේ.

5. "වා" ගති ගන්ධනයොඃ, වා ධාතුව ගමනය හිංසනය යන අර්ථදෙක්හි වේ. වාති, ලට් ප්‍රː පුරුෂෛක වචනයෙහි වාති යනු වේ. යාතිවත්, යා ධාතුව මෙනි.

6. "රා" දානෙ, රා ධාතුව දීමෙහි වේ; තද්වත්, එමෙනි; හෙවත් යා ධාතුව මෙනි.

7. * "ලා" දාන ග්‍රහණයොඃ, ලා ධාතුව දීමය- ගැණීමය යන අර්ථ දෙක්හි වේ. ලාති- ලලෞ, ලට්- ලිට් ප්‍රː පුරුෂෛක වචනයන්හි ලාති, ලලෞ යනු වේ.

8. "ද්‍රා" කුත්සායාං ගතෞ ච, ද්‍රා ධාතුව පිළිකුල් බැව්හි හා ගමනෙහි ද වේ. ද්‍රාති දද්‍රෞ, ලට්-ලිට් ප්‍රː එකවචනයන්හි ද්‍රාති, දද්‍රෞ යනු වේ. ද්‍රායාත් ද්‍රෙයාත්, ආශිර් ලිඞ් ප්‍රː එකවචනයෙහි ද්‍රායාත් යනු ද විකල්පයෙන් ආකාරයට එකාරය වීමෙන් ද්‍රෙයාත් යනු ද වේ. ද්‍රාතා ද්‍රාස්‍යති අද්‍රාස්‍යත් අද්‍රාසීත් යනු පිළිවෙළින් ලුට්-ලෘට්-ලෘඞ්- ලුඞ් ප්‍රː පුරුෂෛක වචන රූපයෝ යි.

---

* ලා, දානෙ- ඉති චන්ද්‍රඃ, ලා ආදානෙ ඉති කෙචිත්.

**9. "ඛ්‍යා" ප්‍රකථනෙ, ඛ්‍යාති, ඛ්‍යායාත්, ඛ්‍යාතු, අඛ්‍යාත්, චඛ්‍යෞ, ඛ්‍යායාත්- ඛ්‍යෙයාත්, ඛ්‍යාතා, ඛ්‍යාස්‍යති, අඛ්‍යාස්‍යත් පුෂාදිත්වාත් ඞඃ, "ආතොනපි" අඛ්‍යත්.**

**10. "පා" රක්‍ෂණෙ, පාති, පායාත්, පාතු, අපාත්, පපෞ, පායාත්, පාතා, පාස්‍යති, අපාස්‍යත්, අපාසීත්.**

**11. "භා" දීප්තෞ, භාති, බභෞ, අභාසීත්,**

**12. "ෂ්ණා" ශෞචෙ, ස්නාති, සස්නෞ, ස්නායාත්, ස්නෙයාත්, අස්නාසීත්**

---

9. "ඛ්‍යා" ප්‍රකථනෙ, ඛ්‍යා ධාතුව ප්‍රකාශ කිරීමෙහි වේ. ඛ්‍යාති, ඛ්‍යායාත්, ඛ්‍යාතු, අඛ්‍යාත්, චඛ්‍යෞ යනු ලට්-විධිලිඞ්-ලොට්-ලඞ්-ලිට් ප්‍ර: පුරුෂ එකවචන යි. ඛ්‍යායාත්- ඛ්‍යෙයාත් යනු ආකාරයට එකාරය නො වීමෙන් හා වීමෙන් සිද්ධ වූ ආශිර්ලිඞ් ප්‍ර: එකවචන රූපයෝ යි. ඛ්‍යාතා, ඛ්‍යාස්‍යති, අඛ්‍යාස්‍යත් යනු ලුට්-ලෘට්-ලෘඞ් ප්‍ර: එකවචන යි. පුෂාදිත්වාත් ඞඃ, පුෂාදිය බැවින් "ඞ" ප්‍රත්‍යය වේ. "ආතොනපි" යන සූත්‍රයෙන් ධාත්වාකාරයට ලොප් වේ. අඛ්‍යත්, ලුඞ් ප්‍ර: එකවචනයෙහි "අඛ්‍යත්" යනු වේ.

10. "පා" රක්‍ෂණෙ, පා ධාතුව රක්‍ෂණයෙහි වේ. පාති—අපාසීත් යනු පිළිවෙළින් ලට්- විධිලිඞ්- ලොට්- ලඞ්- ලිට්- ආශිර් ලිඞ්- ලුට්- ලෘට්-ලෘඞ්-ලුඞ් ප්‍ර: එකවචන රූපයෝ යි.

11. "භා" දීප්තෞ, භා ධාතුව බැබලීමෙහි වේ. භාති, බභෞ, අභාසීත්, ලට්- ලිට්- ලුඞ් ප්‍ර: එකවචනයන්හි භාති, බභෞ, අභාසීත්, යනු වේ.

12. "ෂ්ණා" ශෞචෙ, ෂොපදෙශ "ෂ්ණා" ධාතුව පිරිසිදු බැව්හි හෙවත් නෑමෙහි වේ. ස්නාති, සස්නෞ, යනු ලට්-ලිට් ප්‍ර: එකවචන යි. ස්නායාත්-ස්නෙයාත්, ස්නායාත් යනු ද ස්නෙයාත් යනු ද ආශිර් ලිඞ් ප්‍ර: එ: රූපයෝ යි. අස්නාසීත්, ලුඞ් ප්‍ර: එකවචනයෙහි අස්නාසීත්, යනු වේ.

13. "වශ" කාන්තෞ, වශ ධාතුව ඉච්ඡාර්ථයෙහි වේ. "ඡශෂරාජාදෙඃ ෂඃ" ඉති "ඡශෂරාජාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන්; ෂත්වං, ෂකාර බව වේ. ෂ්ටුත්වං, ("ෂ්ටුභිඃ ෂ්ටුඃ" යන සූත්‍රයෙන් තකාරයට) ටකාර බව වේ. වෂ්ටි, ලට් ප්‍රථම පුරුෂෙක වචනයෙහි වෂ්ටි යනු වේ."ග්‍රහ්‍යාං ඕති ච" ග්‍රහ්‍යාං ඕති ච යන සූත්‍රයෙන් වකාරයට සම්ප්‍රසාරණ උකාරය වේ.

**13. "වශ" ස්‍යානෙනෟ, "ජශෂරාජාදෙඃ ෂඃ" ඉති ෂත්වං, ෂටුත්වම්, වෂ්ටි, "ග්‍රහාං ඞිති ච" උෂ්ටඃ, උශන්ති, ෂත්වම් "ෂඪොඃ කඃ සෙ" ක්ෂඃ, වක්ෂි, උෂ්ඨඃ, උෂ්ඨ, වශ්මි, උශ්වඃ, උශ්මඃ, උශ්‍යාත්, උශ්‍යාතාම්, උශ්‍යුඃ, වෂ්ටු- උෂ්ටාත්, උෂ්ටාම්, උශන්තු. "ඣසාද්ධිහෙඃ" "ඣබෙ ජබාඃ" ජ්ටුත්වම්. උඩ්ඪි- උෂ්ටාත්, උෂ්ටම්, උෂ්ට, වශානි, වශාව, වශාම.**

## 117. දිසේ‍යාහසාත්. (දිසේ‍යාඃ 6-1. හසාත් 5-1.)

**a. හසාදුත්තරයොර් දිප්සිපොර්ලොපො භවති. ෂත්වම්, "ෂොඪඃ" "වාවසානෙ" අවට්-අවඩ්, සම්ප්‍රසාරණම්, අඩාගමඃ, "උඔ" "ඔඔෟ ඔෟ" ඖෂ්ටාම්, ඖශන්. අවට්- අවඩ්, ඖෂ්ටම්,**

---

උෂ්ටඃ- උශන්ති, ප්‍රඃද්වි – බහුවචනයන්හි උෂ්ටඃ උශන්ති යනු වේ. ෂත්වම්, ("ජශෂරාජාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන් ශකාරයට) ෂකාර බව වේ. "ෂඪොඃ කඃ සෙ" මේ සූත්‍රයෙන් ෂකාරයට කකාරය වේ. ("ක්විලාත් ෂඃ සඃ කෘතස්‍ය" යන සූත්‍රයෙන් සිප් ප්‍රත්‍යය පිළිබඳ සකාරයට ෂකාරය වේ.) ක්ෂඃ, කකාර ෂකාර සංයොගයෙහි "ක්ෂ" යන්න වේ. වක්ෂි, උෂ්ඨඃ, උෂ්ඨ යනු මධ්‍යම පුරුෂ එක- ද්වි- බහු වචන යි. වශ්මි, උශ්වඃ, උශ්මඃ යනු උත්තම පුරුෂ එක- ද්වි- බහු වචන යි. උශ්‍යාත් උශ්‍යාතාම් උශ්‍යුඃ යනු විධි ලිඞ් ප්‍රඃ එක–ද්වි– බහු වචන යි. වෂ්ටු- උෂ්ටාත් උෂ්ටාම් උශන්තු යනු ලොට් ප්‍රඃ එක–ව්–බහු වචන යි. "ඣසාද්ධිහෙඃ" මේ සූත්‍රයෙන් "හි" යන්නට "ධි" යනාදෙශය වේ. "ඣබෙ ජබාඃ" යන සූත්‍රයෙන් ෂකාරයට "ඩ" කාරය වේ. ෂ්ටුත්වම්, ෂ්ටුත්වය වේ. හෙවත් ධකාරයට ඪකාරය වේ. උඩ්ඪි- උෂ්ටාත්, ලොට් මධ්‍යම පුරුෂෛක වචනයෙහි උඩ්ඪි යනු ද උෂ්ටාත් යනු ද වේ. උෂ්ටම්, උෂ්ට, යනු ව්–බහුවචන යි. වශානි, වශාව, වශාම යනු උඃ එක–ද්වි–බහුවචන යි.

117. දිප්- සිප් ලොප විධි සූත්‍ර යි. මිට "ලොපඃ" යන සූත්‍රය අනුවෘත්ත වේ. හසාත්, හස ප්‍රත්‍යාහාරයා කෙරෙන් පර වූ; දිසේ‍යාඃ, දිප්–සිප් දෙදෙනාගේ; ලොපඃ, ලොපය වේ.

a. හසාත්, හසප්‍රත්‍යාහාරයා කෙරෙන්; උත්තරයොඃ, පර වූ; දිප් සිපොඃ, දිප්- සිප් දෙකට; ලොපඃ භවති, ලොප් වේ; ෂත්වම්, ("ජශෂරාජාදෙඃ ෂඃ" යි) ෂකාර බව වේ.

ඔඉෂට, අවශම් ඔඉශව ඔඉශ්ම, උවාශ- ඌශිව ඌශිම, උශ්‍යාත්, උශ්‍යාස්තාම් උශ්‍යාසුඃ, වශිතා, වශිෂ්‍යති, අවශිෂ්‍යත්, අවාශිත්-අවශිත්.

**14. "හන්" හිංසාගත්‍යොඃ, හන්ති.**

## 118. ලොපස්ඣවනුදාත්ත තනාම්.

(ලොපඃ 1-1. තු-"ති", අනුදාත්ත. 6-3. තනාම් 6-3.)

b. **අනුදාත්තානාං තනාදීනාං ච ඤමස්‍ය ලොපො භවති කිති ඞිති ඣසෙ පරෙ, තුශබ්දාත් ක්වචිදඣසෙ'පි ස්‍යාජ් ප්‍රත්‍යයා දෞ ඤමස්‍ය ලොපඃ.**

---

" ෂොඩඃ " මේ සූත්‍රයෙන් ෂකාරයට ඩකාරය වේ. "වා'වසානෙ" මේ සූත්‍රයෙන් ඩකාරයට විකල්පයෙන් ටකාරය වේ. අවට්-අවඩ්, ලඞ් ප්‍ර: එකවචනයෙහි අවට් යනු ද විකල්පයෙන් අවඩ් යනු ද වේ; සම්ප්‍රසාරණම්, ("ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන්) සම්ප්‍රසාරණ වේ. අඩාගමඃ, ("ස්වරාදෙඃ" යි) දෙවෙනි අට් ආගමය වේ. "උඔ" යන සූත්‍රයෙන් ඔකාරය වේ. "ඔ ඔෟ ඔෟ" යි ඔෟකාරය වේ. ඔෟෂ්ටාම් ඔෟශන් යනු ලඞ් ප්‍ර: ඒ වචන- බහුවචන රූපයෝ යි. අවට්- අවඩ් ඔෟෂ්ටම් ඔෟෂට යනු මධ්‍යම පුරුෂ එක-ඒ-බහුවචන යි. අවශම් ඔෟශ්ව ඔෟශම යනු උත්තම පුරුෂ එක-ඒ-බහුවචන යි. උවාශ, ("සස්වරාදිර්ව්රද්ධිඃ" යි ඒත්‍ව ච "ණබාදෞ පූර්වස්‍ය"යි. සම්ප්‍රසාරණ ච "අත උපධායාඃ"යි වෘද්ධි ච) ලිට් ප්‍ර: එකවචනයෙහි "උවාශ" යනු වේ. (ඌශතුඃ, ඌශුඃ, උවශිථ, ඌශථුඃ ඌශ, උවාශ-උවශ) ඌශිව, ඌශිම යනු සෙසු ලිඩ් රූපයෝ යි. උශ්‍යාත්, උශ්‍යාස්තාම් උශ්‍යාසුඃ යනු ආශිර්ලිඞ් ප්‍ර: එක-ඒ-බහුවචන යි. වශිතා වශිෂ්‍යති අවශිෂ්‍යත් යනු ලුට්, ලෘට්, ලෘඞ් ප්‍ර: ඒ: වචන රූපයෝ යි. අවාශිත්-අවශිත්, ("හසාදෙලීස්වකාරෙපධස්‍ය වා වෘද්ධිඃ සෙට් සෞ වාච්‍යා" යි කී හෙයින් විකල්පයෙන් වෘද්ධි ච) ලුඞ් ප්‍ර: එකවචනයෙහි අවාශීත් යනු ද- (විකල්ප පක්ෂයෙහි) අවශීත් යනු ද වේ.

14. හන් හිංසාගත්‍යොඃ, "හන්" ධාතුව හිංසා ය-ගමන ය යන අර්ථ දෙක්හි වේ. හන්ති, ලට් ප්‍ර: එකවචනයෙහි "හන්ති" යනු වේ.

118. ඤමප්‍රත්‍යාහාර ලොපවිධි සූත්‍ර යි. මීට "පූර්වස්‍ය ක්ඞිති ඣසෙ ධඃ" යන සූත්‍රයෙන් "ක්ඞිති"-"ඣසෙ" යනු අනුවෘත්ත වේ. ක්ඞිති ඣසෙ, කිත් වූ ද ඞිත් වූ ද ඣසප්‍රත්‍යාහාරය පර කල්හි; අනුදාත්තතනාම් තු, අනුදාත්ත ධාතූන්ගේ හා තනාදි ධාතූන්ගේ අන්තයට; ලොපඃ, ලොප් වේ.

c. “රමියමිනමි හන්ති රනුදාත්තා ගමිමනිඃ.
තනුඃ ක්ෂණ් ක්ෂිණ් ඍණු තෘණු වනු මනු තනාදයඃ”

d. හතඃ, “ගමාං ස්වරෙ” “හනොඝ්න” ඝ්නන්ති, හංසි, හථඃ, හථ. හන්මි, හන්වඃ, හන්මඃ, හන්‍යාත්, හන්‍යාතාම්, හන්‍යුඃ, හන්තු – හතාද්වා, හතාම්, ඝ්නන්තු.

## 119. ජහ්‍යෙධිශාධි. (ජහ්‍යෙධිශාධි 1–3 )

---

b. කිති, කිත්සංඥ වූ ද; ඞිති, ඞිත්සංඥ වූ ද; ඣසෙ, ඣස ප්‍රත්‍යාහාරය පර කල්හි; අනුදාත්තානාම්, අනුදාත්ත ධාතූන්ගේ ද; තනාදීනාං ච, තනාදි ධාතූන්ගේ ද; ඤමස්‍ය, ඤමප්‍රත්‍යාහාරයට; ලොපඃ භවති, ලොප් වේ. තුශබ්දාත්, තුශබ්දයෙන්; ක්වචිත්, කිසි තැනෙක්හි; අඣසෙ'පි, ඣසප්‍රත්‍යාහාර නුවූ ද; ක්‍යප් ප්‍රත්‍යයාදෞ, ක්‍යප් ප්‍රත්‍යයාදිය පර කල්හි; ඤමස්‍ය, ඤමප්‍රත්‍යාහාර වර්ණයට; ලොපඃ, ලොප් වේ. ( තු ශබ්දයෙන් ඤමාන්ත ධාතූන්ගේ ග්‍රහණය වේය යි සුබොධිනී – තත්ත්වදීපිකා ටීකාවන්හි කියන ලදී.)

මේ සූත්‍රයෙහි “අනුදාත්ත” යනු ලුප්ත ෂෂ්ඨී විභක්ත්‍යන්ත පදයෙකි. එහෙයින් සූත්‍රයෙහි පද සතරෙකි. ෂෂ්ඨී නිර්දිෂ්ට න්‍යායයෙන් ලොපය අන්තයට වන හෙයින් ද අනුදාත්ත සංඥ ධාතූන්ගේ හා තනාදි ධාතූන්ගේ අන්තය වශයෙන් ලැබෙනුයේ ඤම ප්‍රත්‍යාහාර වර්ණයක් ම හෙයින් ද සූත්‍ර වෘත්තියෙහි “ ඤමස්‍ය ” යි යොදන ලදී.

c. රමිඃ, රම් ධාතුවය; යමිනමී, යම් – නම් යන ධාතු දෙකය; හන්තිඃ, හන් ධාතුවය; ගමිඃ, ගම් ධාතුවය; මනිඃ, මන් ධාතුවය යන මොහු; අනුදාත්තාඃ, අනුදාත්ත නම් වෙත්. තනුඃ, තන් ධාතුවය; ක්ෂණ්, ක්ෂණ් ධාතුවය; ක්ෂිණ්, ක්ෂිණ් ධාතුවය; ඍණු තෘණු, ඍණි–තෘණි යන ධාතු දෙකය; වනුඃ, වන් ධාතුවය; මනුඃ, මන් ධාතුවය යන මොහු; තනාදයඃ, තනාදි ධාතූහු යි; (“ලොපස්ත්වනුදාත්ත තනාම්” යන සූත්‍රයෙන් ගණු ලබන අනුදාත්ත ධාතූන් හා තනාදී ධාතූහු මෙයින් නිර්දිෂ්ටයහ.)

d. හතඃ, ලට් ප්‍ර: ද්වි වචනයෙහි “හතඃ” යනු වේ. “ගමාං ස්වරෙ” යි උපධා සංඥ අකාරයට ලොප් වේ. “හනොඝ්න” යි හකාරයට ඝකාරාදෙශ වේ. ඝ්නන්ති, ලට්, ප්‍ර: බහුවචනයෙහි ඝ්නන්ති යනු වේ. හංසි, හථඃ, හථ, යනු ම: එක – ද්වි– බහුවචන යි. හන්මි, හන්වඃ, හන්මඃ, යනු උ: එක–ද්වි–බහු වචන යි. හන්‍යාත්, හන්‍යාතාම්, හන්‍යුඃ

ම. හන්තෙර්ජිශබ්දෝ'ස්තෙරෙධි ශබ්දඃ ශාස්තෙඃ ශාධි ශබ්දෝ නිපාත්‍යන්තෙ හි විෂයෙ. ජහි- හතාද්වා හතම් හත, හනානි හනාව හනාම, අහන් අහතාම් අඝ්නන්, අහන් අහතම් අහත, අහනම් අහන්ව අහන්ම, "හනො ඝෙත" වෘද්ධිඃ, ජඝාන ජඝ්නතුඃ ජඝ්නුඃ.

බ. ච්රුකාන්තස්‍ය හන්තෙස්ත්වපි ඝත්වං වාච්‍යම්. ජඝනිථ- ජඝන්ථ ජඝ්නතුඃ ජඝ්න, ජඝාන- ජඝන ජඝ්නිව ජඝ්නිම. හන්තෙඃ ස්‍යාශිර්ලිඞාදෞ වධාදෙශො වක්තව්‍යඃ. වධ්‍යාත් වධ්‍යාස්තාම් වධ්‍යාසුඃ, හන්තා හන්තාරෞ හන්තාරඃ.

---

යනු විධි ලිඞ් ප්‍ර: එක-ද්වි-බහු වචන යි. හතාත්-හතාද්වා, ලොට් ප්‍ර: එක වචනයෙහි හතාත් යනු ද විකල්පයෙන් හතාත් යනු ද වේ. ද්වි- බහු වචනයන්හි හතාම්, ඝ්නන්තු යනු වේ.

119. විධි සූත්‍රයි. මීට "හන්ත්‍යස්ති ශාස්තීනාං ප්‍රකෘතිභිඃ" යන සූත්‍රය ද, "ඛසාද්ධිහෙඃ" යන සූත්‍රයෙන් "හෙඃ" යනු ද අනුවෘත්ත වේ.

හන්ත්‍යස්තිශාස්තීනාං, හන්- අස්- ශාස් යන ධාතූන්ගේ; ප්‍රකෘතිභිඃ, ප්‍රකෘතීන් සමග; හෙඃ, හි විභක්තියට; ජහේ‍යධිශාධි, ජහි- එධි- ශාධි යන ආදෙශයෝ වෙත්.

ම. හිවිෂයෙ, හි විභක්ති විෂයෙහි; හන්තෙඃ, හන් ධාතුවට; ජහිශබ්දඃ, ජහි ශබ්දය ද; අස්තෙඃ, අස් ධාතුවට; එධිශබ්දඃ, එධි ශබ්දය ද; ශාස්තෙඃ, ශාස් ධාතුවට; ශාධිශබ්දඃ, ශාධි ශබ්දය ද; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ. ජහි, හන් ධාතු ලොට්-ම: පුරුෂ එකවචනයෙහි ජහි යනු වේ. හතාද්වා, විකල්පයෙන් (ජහි ආදෙශය නුවූ පක්ෂයෙහි) හතාත් යනු වේ. හතම්, හත යනු ම: පුරුෂ ද්වි වචන- බහු වචන යි. හනානි, හනාව, හනාම යනු උ: පුරුෂ එක- ද්වි- බහු වචන යි. අහන්, අහතාම්, අඝ්නන් යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අහන් අහතම් අහත යනු ම: එක- ද්වි- බහු වචන යි. අහනම්, අහන්ව, අහන්ම යනු උ: පුරුෂ එක- ද්වි- බහු වචන යි. "හනොඝෙත" යි හකාරයට ඝකාරාදෙශ වේ. වෘද්ධිඃ, (අත උපධායාඃ යන සූත්‍රයෙන්) වෘද්ධි වේ. ජඝාන, ජඝ්නතුඃ, ජඝ්නුඃ යනු ලිට් ප්‍ර:- එක ද්වි - බහු වචන යි. ("හන්-ණප්" යි සිටි කල්හි "ඝස්වරාදිර්ද්විරච්ඃ" යි ද්වීත්ව ව "කුහොශ්චුඃ" යි මුල් හකාරයට

**“හනෘතඃ ස්‍යපඃ” හනිෂ්‍යති හනිෂ්‍යතඃ හනිෂ්‍යන්ති, අහනිෂ්‍යත් අහනිෂ්‍යතාම් අහනිෂ්‍යන්.**

## 120. ජනිවධ්‍යෝර් න වෘද්ධිඃ.

(ජනිවධ්‍යොඃ, 6-2. න-නි. වෘද්ධිඃ 1-1.)

b. **වධාදෙශෙ ස්ථානෙ ඉට්, අවධීත් අවධිෂ්ටාම් අවධිෂුඃ, අවධීඃ- අවධිෂ්ටම් අවධිෂ්ට.**

**15. “ශ්‍රු” ශ්‍රවණෙ, “ශෘණුඃ”**

## 121. ඔරෞ. (ඔඃ-6-1-ඖ. 1-1.)

c. **උකාරස්‍යාවිරුද්ධස්‍ය ඖකාරාදෙශො භවති පිතිසම් අබාදෞ විෂයෙ. යෞති, යුතඃ.**

---

ඛකාරය වේ. ඊට “ඛපාතාං ජබ චපාඃ” යි ජකාරාදෙශ වේ. “හනොඝෙන” යි ධාතුවේ හකාරයට ඝකාරාදෙශ ව “අත උපධායාඃ” යි වෘද්ධි ව “ජඝාන” යි සිද්ධ යි.)

a. ථපි, ථප් ප්‍රත්‍යය පර කල්හි; විරුද්ධස්‍ය, විරුද්ධ වූ; හනෙතඃ, හන් ධාතුවට; ඝත්වම්, ඝකාර බව; වාච්‍යම්, කියයුතු යි. ජඝනිථ- ජඝන්ථ, (“අත්වතො නිත්‍යානිටස්ථපො වෙට්” යි කී බැවින්) ඉඩාගම වූ පක්ෂයෙහි “ජඝනිථ” කියා ද නුවූ පක්ෂයෙහි ජඝන්ථ කියා ද වේ. ජඝනතුඃ- ජඝන යනු ද්වි- බහුවචන යි. ජඝාන- ජඝන යනු උ: පුරුෂ එකවචන යි. (වෘද්ධිය විකල්ප හෙයිනි.) ජඝ්නිව ජඝ්නිම යනු ද්වි- බහු වචන යි.

ස්‍යාශිසිචාදෞ, සිප්‍රත්‍යය- ආශීර්ලිඞ් විභක්තිය යන දෙක පර කල්හි; හනෙතඃ, හන් ධාතුහට; වධාදෙශඃ, වධ යන්නාදෙශය; වක්තව්‍යඃ, කියයුතු යි. (දිබාදිය පර කල්හි “භූතෙ සිඃ” යි වන සිප්‍රත්‍යය හා ආශීර් ලිඞ් යාත් ආදිය ද පර කල්හි “හන්” ධාතුවට “වධ” යි ආදෙශ වන බව එහි අදහස යි.) වධ්‍යාත්, වධ්‍යාස්තාම්, වධ්‍යාසුඃ යනු ආශීර් ලිඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. හන්තා, හන්තාරෞ, හන්තාරඃ යනු ලුට් ප්‍ර: එක- ද්වි-බහු වචන යි.

“හනෘතඃ ස්‍යපඃ” යි ඉඩාගම වේ. හනිෂ්‍යති, හනිෂ්‍යතඃ, හනිෂ්‍යන්ති යනු ලෘට් ප්‍ර: එක- ද්වි- බහුවචන යි. අහනිෂ්‍යත්, අහනිෂ්‍යතාම්, අහනිෂ්‍යන් යනු ලෘඞ් ප්‍ර: එක- ද්වි- බහුවචන යි.

120. වෘද්ධි ප්‍රතිෂෙධ විධි සූත්‍ර යි. ජනිවධ්‍යොඃ, ජන් ධාතුවය- වධාදෙශය යන දෙකට; න වෘද්ධිඃ, වෘද්ධි නො වේ.

**"නුධාතොඃ" යුවන්ති, යොෂි, යුථඃ, යුථ, යොමි, යුවඃ, යුමඃ, යුයාත්, යොතු-යුතාද්වා, යුතාම්, යුවන්තු, යුහි-යුතාද්වා යුතම් යුත, යවානි යවාව යවාම.**

**අයෞත් අයුතාම් අයුවන්, අයෞඃ අයුතම් අයුත, අයවම් අයුව අයුම, "ධාතොර්නාමිනඃ" යුයාව, "නානපෙක්‍ෂාඃ" යුයුවතුඃ, යුයුවුඃ, යුයවිථ, යුයුවථුඃ. යූයාත්, යවිතා, යවිෂ්‍යති, අයවිෂ්‍යත්, අයාවීත්, අයාවිෂ්ටාම්, අයාවිෂුඃ.**

---

b. වධාදෙශෙ කෘතෙ, හන් ධාතුවට වධාදෙශය කළ කල්හි ඉට්, "සිසතාසීස්‍යපාමිට්" යි ඉඩාගම වේ. අවධීත් අවධිෂ්ටාම් අවධිෂුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අවධීඃ අවධිෂ්ටම් අවධිෂ්ට යනු ම: එක- ද්වි- බහු වචන යි.

15. "යු" මිශ්‍රණෙ, "යු" ධාතුව මිශ්‍ර කිරීමෙහි වේ. "ගුණඃ" යි ගුණය පැමිණි කල්හි:-

121. ඖකාරාදෙශ විධි සූත්‍ර යි. මිට "අබාදෞවිපිතිත්සමි" යන සූත්‍රයෙන් "අබාදෞ-පිති-ත්සමි" යනු ද "විදෙ නවානාං-පෙ- නව කො වා" යන සූත්‍රයෙන් "වා" යනු ද අනුවෘත්ත වේ.

අබාදෞ, අබාදි විෂයෙහි; පිති, පයන්ත ඉත්කොට ඇති; ත්සමි, තකාර- සකාර- මකාර පර කල්හි; ඖඃ, උකාරයට; වා ව්‍යවස්ථා වශයෙන්; ඖඃ, ඖකාරාදෙශ වේ. (ව්‍යවස්ථිත විභාෂා වාචක "වා" ශබ්ද බලයෙන් විරුක්ත නු වූ ධාතුහුගේ උකාරයට ඖකාරය වේ යයි දතයුතු යි.)

c. අබාදෞ විෂයෙ, අප් ආදි විකරණ විෂයෙහි; පිති, පිත් වූ; ත්සමි, තකාර- සකාර- මකාර පර කල්හි; අවිරුක්තස්‍ය, විරුක්ත නු වූ ධාතුහු පිළිබඳ; උකාරස්‍ය, උකාරයට; ඖකාරාදෙශඃ, ඖකාරාදෙශය; භවති, වේ. යෞති- යුතඃ යනු ලට්ප්‍ර: එකවචන- ද්විවචන යි.

"නු ධාතොඃ" යි උකාරයට "උව්" ආදෙශය වේ. යුවන්ති, ප්‍ර: බහු වචනයෙහි යුවන්ති යනු වේ. යෞෂි, යුථඃ, යුථ යනු ම: එක- ද්වි- බහු වචන යි. යෞමි යුවඃ යුමඃ යනු උ: එක-ද්වි- බහු වචන යි. යුයාත් යනු විධි ලිඞ් ප්‍ර: එකවචන යි. යෞතු, ලොට් ප්‍ර: එකවචන යෙහි යෞතු යනු වේ. යුතාද්වා, (තාතඞ් ආදෙශයෙන් ආශීරර්ථ යෙහි පමණක්) යුතාත් යනු ද වේ. යුතාම්, යුවන්තු යනු ද්වි- බහු වචන යි. යුහි, ම: එකවචනයෙහි යුහි යනු වේ. යුතාත් වා, විකල්පයෙන් යුතාත් කියා ද වේ. යුතම් යුත යනු ද්වි- බහු වචන යි. යවානි, යවාව, යවාම යනු උ: එක- ද්වි- බහු වචන යි.

**16. "තු" ගති වෘද්ධි හිංසාසු.**

**තුරුස්තුභ්‍යෝ 'ච්ඡරුකෝතභ්‍යෝ හසාදීනාං චතුර්ණාමීඩ්වා- තෞති- තවීති, තුතඃ- තුවිතඃ තුවන්ති, තෞෂි- තවිෂි, තුථඃ- තුවිථඃ, තුථ- තුවිථ, තෞමි- තාවිමි, තුයාත්- තුවියාත්, තෞතු- තවිතු, තුතාත්- තුවිතාත්, තුතාම්- තුවිතාම්, තුවන්තු, තුහි- තුවිහි, අතෞත්- අතවීත්, තුතාව, තූයාත්, තෝතා, තෝෂ්‍යති, අතෝෂ්‍යත්, අතෞෂීත්.**

**17. "රු" ශබ්දෙ, රෞති- රවීති, රුතඃ- රුවිතඃ රුවන්ති, රෞෂි- රවීෂි, රුයාත්- රුවියාත්, රෞතු- රවීතු, රුතාත්-**

---

අයෞත්, අයුතාම්, අයුවන් යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අයෞඃ, අයුතම්, අයුත යනු ම: එක-ද්වි- බහු වචන යි. අයවම් අයුව අයුම යනු උ: එක- ද්වි-බහුවචන යි. "ධාතෝර්නාමිනඃ" යි වෘද්ධි වේ. යුයාව යනු ලිට් ප්‍ර: එකවචන යි. "නානපෙක්‍ෂාජිඃ" යි ප්‍රතිෂේධයෙන් උකාරයට වකාරය නො වේ. (එහෙයින් "නුධාතෝඃ" යි "උව්" ආදේශය වේ.) යුයුවතුඃ යුයුවුඃ යනු ප්‍ර: ද්වි- බහු වචන යි. යුයවිථ යුයුවථුඃ යනු ම: එක-ද්වි වචන යි. යූයාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. ("යෙ" යන සූත්‍රයෙන් දීර්ඝ විය.) යවිතා යනු ලුට් ප්‍ර: එක- වචන යි. යවිෂ්‍යති යනු ලෘට් ප්‍ර: එකවචන යි. අයවිෂ්‍යත් යනු ලෘඞ් ප්‍ර: එකවචන යි. අයාවීත් අයාවිෂ්ටාම් අයාවිෂුඃ යනු ලුඞ් ප්‍ර: එක-ද්වි- බහු වචන යි.

16. "තු" ගති වෘද්ධි හිංසාසු, "තු" ධාතුව ගමන ය- වැඩීම ය- හිංසා කිරීම ය යන අර්ථයන්හි වේ. අච්ඡරුකෝතභ්‍යඃ, ච්ඡරුකොත නූ වූ; තුරුස්තුභ්‍යඃ, තු ගති වෘද්ධි හිංසාසු- රු ශබ්දෙ- ෂ්ටුඤ් ස්තුතෞ යන මේ ධාතූන් කෙරෙන් පර වූ; හසාදීනාං, හසප්‍රත්‍යාහාර වර්ණයක් ආදිකොට ඇති; චතුර්ණාම්, ලඩාදි සතර සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඊට්, ඊඩාගම වේ. (ලට්-විධි ලිඞ්-ලොට්- ලඞ් යන සතරෙහි ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයන් පර කල්හි පූර්වෝක්ත ධාතූන් කෙරෙන් ඊට් ආගමය වන බව මෙයින් දැක්විය.)

(මේ පාඨය පොත්හි "තුරුනුස්තුභ්‍යෝ" යි පෙණේ. "චන්ද්‍ර කීර්ත්තිටීකාවෙහි" ද එසේ ම යොදා ව්‍යාඛ්‍යාන කරණ ලදි. එහෙත් "සිද්ධාන්තචන්ද්‍රිකා" ටීකාවන්හි එය ප්‍රාමාදික පාඨයකැයි දැක්වේ.)

තෞති- තවීති, ලට් ප්‍ර: එකවචනයෙහි "තෞති" යනු ද ඊඩාගම වූ පක්‍ෂයෙහි "තවීති" යනු ද වේ. (එසේ ම) තුතඃ - තුවීතඃ යනු ද්වි වචන රූප යි. තුවන්ති, යනු බහු වචන යි. තෞෂි - තවීෂි

රුවිතාත්. අරෞත්- අරවීත් අරුතාම්- අරවිතාම් අරුවන්. අරෞඃ- අරවීඃ, රුරාව රුරුවතුඃ රුරුවුඃ, රුරවිථ. රුයාත්, * රවිතා, රවිෂ්‍යති, අරවිෂ්‍යත්, අරාවීත්.

18 "දු" ගතෞ, සෞවාදිකඃ, දවති, දවෙත්, දවතු, අදවත්, දුදාව, දූයාත්, දෝතා, දෝෂ්‍යති, අදෝෂ්‍යත්, අදෞෂීත්, අදෞෂ්ටාම්, අදෞෂුඃ.

---

යනු ම: එකවචන යි. තුථඃ- තුවීථඃ යනු ද්වි වචන යි. තුථ- තුවීථ යනු බහු වචන යි. තෞමි - තවීමි යනු උ: එකවචන යි. තුයාත්- තුවීයාත් යනු විධි ලිඞ් ප්‍ර: එකවචන යි. තෞතු - තවීතු - තුතාත්- තුවීතාත් යනු ලොට් ප්‍ර: එකවචන යි. (විකල්පයෙන් ඊඩාගමයෙන් හා "තාත්" ආදෙශයෙන් රූප සතරකි.)

තුතාම්- තුවීතාම් යනු ද්වි වචන යි. තුවන්තු යනු බහු වචන යි. තුහි- තුවීහි යනු ලොට් ම: එකවචන යි. අතෞත්- අතවීත් යනු ලඞ් ප්‍ර: එකවචන යි. තුතාව යනු ලිට් ප්‍ර: එකවචන යි. තුයාත් යනු ආශීර් ලිඞ්; ප්‍ර: එකවචන යි. තොතා යනු ලුට් ප්‍ර: එකවචන යි. තොෂ්‍යති යනු ලෘට් ප්‍ර: එකවචන යි. අතොෂ්‍යත් යනු ලෘඞ් ප්‍ර එකවචන යි. අතෞෂීත් යනු ලුඞ් ප්‍ර: එකවචන යි.

17. රු ශබ්දෙ, "රු" ධාතුව ශබ්ද කිරීමෙහි වේ. රෞති- රවීති යනු ලට් ප්‍ර: එක වචන යි. රුතඃ - රුවීතඃ යනු ද්වි වචන යි. රුවන්ති, යනු බහු වචන යි. රෞෂි - රවීෂි යනු ම: එකවචන යි. රුයාත්- රුවීයාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. රෞතු - රවීතු- රුතාත්- රුවීතාත් යනු ලොට් ප්‍ර: එකවචන යි. අරෞත්, අරවීත් යනු ලඞ් ප්‍ර: එකවචන යි. අරුතාම්-අරුවීතාම් යනු ද්වි වචන යි. අරුවන් යනු බහු වචන යි. අරෞඃ- අරවීඃ යනු ලඞ් ම: එකවචන යි. රුරාව - රුරුවතුඃ - රුරුවුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි - බහුවචන යි. රුරවිථ යනු ම: එකවචන යි. රුයාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එකවචන යි. රවිතා යනු ලුට් ප්‍ර: එකවචන යි. රවිෂ්‍යති, අරවිෂ්‍යත්, අරාවීත් යනු පිළිවෙළින් ලෘට්- ලෘඞ් - ලුඞ් ප්‍ර: එක වචන යි.

(මෙහි "රු" ධාතුව අනිට් ධාතුවක් ලෙස දැක්වීම සදෙසි, අනිට්කාරිකාවෙහි සෙට් යයි දක්වූ බැවිනි. එහෙත් තාරානාථයෝ "රු" ධාතුව "වෙට්" යයි කීහ. එසේ නම් "රවිතා-රොතා, රවිෂ්‍යති- රොෂ්‍යති, අරවිෂ්‍යත්- අරොෂ්‍යත්, අරාවීත්- අරෞෂීත්" යි කියයුතු යි.)

---

* රොතා, රොෂ්‍යති, අරොෂ්‍යත්, අරෞෂීත්, යනු සදෙසි.

19. "ණු" ස්තුතෞ, "ආදේඃ ෂ්ණඃ ස්නඃ" නෞති නුතඃ නුවන්ති, නුනාව, නූයාත් * නවිතා.

20. "ටු ක්ෂු" ශබ්දෙ, ටු ඉත්, ක්ෂෞති ක්ෂුතඃ ක්ෂුවන්ති, ක්ෂුයාත්, ක්ෂෞතු, අක්ෂෞත්, චුක්ෂාව චුක්ෂුවතුඃ චුක්ෂුවුඃ, ක්ෂූයාත්, ක්ෂවිතා, ක්ෂවිෂ්‍යති, අක්ෂවිෂ්‍යත්, අක්ෂාවීත්.

21. "ක්ෂ්ණු" තෙජනෙ, ක්ෂ්ණෞති ක්ෂ්ණුතඃ ක්ෂ්ණුවන්ති, ක්ෂ්ණුයාත්, ක්ෂ්ණෞතු, අක්ෂ්ණෞත්, චුක්ෂ්ණාව, ක්ෂ්ණූයාත්, ක්ෂ්ණවිතා, ක්ෂ්ණවිෂ්‍යති, අක්ෂ්ණවිෂ්‍යත්, අක්ෂ්ණාවීත්.

---

18. "ද්‍රු" ගතෞ, "ද්‍රු" ධාතුව ගමනෙහි වේ; හෞවාදිකඃ, භ්වාදි ගණයට අයත් ය. (එහෙයින් "අප් කර්තරි" යි අප් විකරණය වේ. "අදාදෙර්ලුක්" යි ලුක් නො වේ.) ද්‍රවති, ද්‍රවෙත්, ද්‍රවතු, අද්‍රවත්, දුද්‍රාව, ද්‍රූයාත්, ද්‍රෝතා, ද්‍රෝෂ්‍යති, අද්‍රෝෂ්‍යත් යනු පිළිවෙළින් ලට්-විධිලිඞ්-ලොට්-ලඞ්-ලිට්-ආශීර් ලිඞ්-ලුට්-ලෘට්-ලෘඞ් ප්‍රථම පුරුෂ එකවචන යි. අද්‍රෞෂීත්, අද්‍රෞෂ්ටාම්, අද්‍රෞෂුඃ යනු ලුඞ් ප්‍ර: එක-ද්වි-බහුවචන යි.

19. "ණු" ස්තුතෞ, "ණු" ධාතුව ස්තුති කිරීමෙහි වේ. "ආදේඃ ෂ්ණඃ ස්නඃ" යි මූර්ධන්‍ය ණකාරයට දන්ත්‍ය නකාරය වේ. නෞති, නුතඃ, නුවන්ති, යනු ලට් ප්‍ර: එක-ද්වි- බහුවචන යි. නුනාව, නූයාත්, නවිතා, නවිෂ්‍යති, අනවිෂ්‍යත්, අනාවීත් යනු පිළිවෙළින් ලිට්-ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ්- ප්‍ර: එකවචන යි.

මේ "ණු" ධාතුව අනිට්කාරිකාහි "සෙට්" ධාතුවක් ලෙස හදුරණ ලද්දකි. එහෙත් පොත්හි "අනිට්" ධාතුවක් මෙන් වර නගා තිබේ. මුග්ධබොධ ව්‍යාකරණයෙහි හා ශබ්දස්තොමයෙහි ද වෙට් (විල්පයෙන් ඉඩාගම ඇත්තකැ) යි දක්වන ලදී.

20. "ටු ක්ෂු" ශබ්දෙ, ටු යන්න ඉත්කොට ඇති "ක්ෂු" ධාතුව ශබ්ද කිරීමෙහි (කිවිසීමෙහි) වේ. ටු ඉත්, ටු යන්න ඉත්සංඥ වර්ණයෙකි; ක්ෂෞති, ක්ෂුතඃ, ක්ෂුවන්ති යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. ක්ෂුයාත්, ක්ෂෞතු, අක්ෂෞත්, යනු පිළිවෙළින් විධි ලිඞ්-ලොට්- ලඞ් ප්‍ර: එක වචන යි. චුක්ෂාව, චුක්ෂුවතුඃ, චුක්ෂුවුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහුවචන යි. ක්ෂූයාත්, ක්ෂවිතා, ක්ෂවිෂ්‍යති, අක්ෂවිෂ්‍යත්, අක්ෂාවීත් යනු පිළිවෙළින් ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්-ලුඞ් ප්‍ර: එකවචන යි.

21. "ක්ෂ්ණු" තෙජනෙ, "ක්ෂ්ණු" ධාතුව තියුණු කිරීමෙහි වේ. ක්ෂ්ණෞති, ක්ෂ්ණුතඃ, ක්ෂ්ණුවන්ති යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු

---

* නෝතා, නෝෂ්‍යති, අනෝෂ්‍යත්, අනෞෂීත්, යනු සදෙසි.

**22.** "ෂ්ණු" ප්‍රස්‍රවණෙ, ස්නෞති, ස්නුයාත්, ස්නෞතු, අස්නෞත්, සුස්නාව, ස්නූයාත්, ස්නවිතා, ස්නවිෂ්‍යති, අස්නවිෂ්‍යත්, අස්නාවීත්.

**23.** "ඉණ්" ගතෞ "ගුණඃ" එති ඉතඃ. "ඉණඃ ක්ඞිති ස්වරෙ යො වක්තව්‍යඃ." යන්ති. එෂි ඉථඃ ඉථ, එමි ඉවඃ ඉමඃ. ඉයාත් ඉයාතාම් ඉයුඃ. එතු- ඉතාද්වා ඉතාම් යන්තු, ඉහි- ඉතාද්වා ඉතම් ඉත, අයානි අයාව අයාම. අඩාගමවයම්. ඓත් ඓතාම් ආයන්, ඓඃ ඓතම් ඓත, ආයම් ඓව ඓම. ණිත්වම්, වෘද්ධිඃ, පූර්වස්‍ය ඉයාදෙශඃ, ඉයාය, "ඉණඃ කිති ණාදෞ පූර්වස්‍ය දීර්ඝො වක්තව්‍යඃ." ඊයතුඃ ඊයුඃ, ඉයයිථ- ඉයෙථ ඊයථුඃ ඊය, ඉයාය- ඉයය ඊයිව ඊයිම, "යෙ" ඊයාත් ඊයාස්තාම් ඊයාසුඃ, එතා, එෂ්‍යති, ඓෂ්‍යත්, "දදෙඃ ෂෙ" "ඉණ්ගොඃ සිලොපෙ ගා වක්තව්‍යඃ." අගාත් අගාතාම් අගුඃ.

---

වචන යි. ස්ෂ්ණුයාත්, ස්ෂ්ණෞතු, අස්ෂ්ණෞත්, චුස්ෂ්ණාව, ස්ෂ්ණූයාත්, ස්ෂ්ණවිතා, ස්ෂ්ණවිෂ්‍යති, අස්ෂ්ණවිෂ්‍යත්, අස්ෂ්ණාවීත් යනු පිළිවෙළින් විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට්- ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

22. "ෂ්ණු" ප්‍රස්‍රවණෙ, "ෂ්ණු" ධාතුව වැගිරීමෙහි වේ. ස්නෞති, ("ඔරෞ" යි ඖකාරය වීමෙන්) ලට් ප්‍ර: එකවචනයෙහි "ස්නෞති" යනු වේ. ස්නුයාත්, ස්නෞතු, අස්නෞත්, සුස්නාව, ස්නූයාත්, ස්නවිතා, ස්නවිෂ්‍යති, අස්නවිෂ්‍යත්, අස්නාවීත් යනු විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට්- ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එකවචන යි.

23. "ඉණ්" ගතෞ, ණකාරානුබන්ධ "ඉ" ධාතුව ගමනෙහි වේ. "ගුණඃ" යි ගුණ වේ. එති ඉතඃ යනු ලට් ප්‍ර: එක- ද්වි වචන යි. ක්ඞිති ස්වරෙ, කිත් වූ ද ඞිත් වූ ද ස්වරයා පර කල්හි; ඉණඃ, ඉණ් ධාතුවට; යඃ, යකාරාදෙශය; වක්තව්‍යඃ, කියයුතු යි. (මේ "නුධාතොඃ" යන සූත්‍රයට අනුවෘත්ත ව්‍යවස්ථා වාචක "වා" ශබ්ද බලයෙනි.) යන්ති, ("ඉ + අන්ති" යි සිටි තැන ස්වරය පර කල්හි යකාරාදෙශය වීමෙන්) ලට් ප්‍ර: බහු වචනයෙහි "යන්ති" යනු වේ. එෂි ඉථඃ ඉථ යනු ම: පු: එක- ද්වි- බහුවචන යි. එමි ඉවඃ ඉමඃ යනු උත්තමපුරුෂ එක- ද්වි- බහුවචන යි. ඉයාත් ඉයාතාම් ඉයුඃ යනු විධි ලිඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. එතු යනු ලොට් ප්‍ර: එකවචන යි. ඉතාද්වා, විකල්පයෙන් "ඉතාත්" කියා ද වේ. ඉතාම් යන්තු යනු ද්වි වචන- බහුවචන යි. ඉහි යනු ම: එක වචන යි. ඉතාද්වා, විකල්පයෙන් ඉතාත් කියා වේ. ඉතම් ඉත යනු ද්විවචන- බහුවචන යි. අයානි අයාව අයාම යනු උ: එක- ද්වි- බහු වචන යි.

**24. “ඉක්” ස්මරණෙ, “ඉඞිකාවධ්‍යුපසර්ගතො න ව්‍යභිචරතඃ.” අධ්‍යෙති අධීතඃ අධීයන්ති, අධීයාත්, අධ්‍යෙතු, අධ්‍යෛත් අධ්‍යෛතාම් අධ්‍යායන්, අධීයාය, අධීයාත්, අධ්‍යෙතා, අධ්‍යෙෂ්‍යති, අධ්‍යෛෂ්‍යත්, අධ්‍යගාත්. ඉණ් වත්**

---

අඩාගමවයම්, අඩාගම දෙසොකි; ඓත් ඓතාම් ආයන් යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. ඓඃ ඓතම් ඓත යනු ම: එක- ද්වි- බහු වචන යි. ආයම් ඓව ඓම යනු උත්තම පුරුෂ එක- ද්වි- බහු වචන යි. ද්විත්වම්, (“සස්වරාදිර් ද්විරච්ඃ” යන්නෙන්) ද්විත්ව වේ; වෘද්ධිඃ, (“ධාතොර්නාමිනඃ” යි) වෘද්ධි වේ. පූර්වස්‍ය, පූර්ව වූ ඉකාරයට; ඉයාදෙශඃ, “ඉය්” ආදෙශ වේ; ඉයාය, ලිට් ප්‍ර: එක වචනයෙහි “ඉයාය” යනු වේ. කිති ණාදෞ, කිත් වූ ණබාදිය පර කල්හි; ඉණඃ, ඉණ් ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව වූ ඉකාරයට; දීර්ඝඃ වක්තව්‍යඃ, දීර්ඝය කියයුතු යි. ඊයතුඃ ඊයුඃ යනු ද්විවචන-බහු වචන යි. (“ඉ + ඉ + අතුඃ’ යි සිටි කල්හි පූර්ව ඉකාරයට දීර්ඝ වීමෙන් හා පර ඉකාරයට “නු ධාතොඃ” යන මෙහි අනුවෘත්ත වා ශබ්ද බලයෙන් යකාරය වීමෙන් “ඊයතුඃ” යි සිද්ධ යි. සෙස්ස ද මෙසේ යි.) ඉයයිථ- ඉයෙථ යනු ම: පුරුෂ එකවචන යි. ඊයථුඃ ඊය යනු ද්වි වචන-බහු වචන යි. ඉයාය- ඉයය යනු උත්තම පුරුෂ එකවචන යි. ඊයිව ඊයිම යනු ද්විවචන-බහුවචන යි. “යෙ” යි යකාරය පර කල්හි පූර්වයට දීර්ඝ වේ. ඊයාත් ඊයාස්තාම් ඊයාසුඃ යනු ආශීර් ලිඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. එතා, එෂ්‍යති, ඓෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. “ද්‍යදෙඃ පෙ” යන සූත්‍රයෙන් සිප්‍රත්‍යයට ලොප් වේ. සිලොපෙ, සිප්‍රත්‍යය ලොප් කළ කල්හි; ඉණිකොඃ, “ඉණ්” ගතෞ- “ඉක්” ස්මරණෙ යන ධාතු දෙකට; ගා වක්තව්‍යඃ, “ගා” යනාදෙශය කියයුතු යි. අගාත් අගාතාම් අගුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. (ලුඞ් ලකාරයෙහි සිප්‍රත්‍යය ලොපයෙන් හා “ඉණ්” ධාතුවට ගා යනාදෙශය වීමෙන් මෙසේ වරනැගේ.)

24. “ඉක්” ස්මරණෙ, “ඉක්” ධාතුව සිහි කිරීමෙහි වේ. (මෙහි ක යන්න ඉත් ය.) ඉඞිකොෟ, ඉඞ් අධ්‍යයනෙ- ඉක් ස්මරණෙ යන ධාතු දෙදෙන; අධ්‍යුපසර්ගතඃ, අධි යන උපසර්ගයා කෙරෙන්; න ව්‍යභිචරතඃ, ව්‍යභිචාරී නො වෙත්. (ඉඞ්- ඉක් ධාතු අධි උපසර්ගය සමග ම විනා ඉන් තොර ව නො යෙදෙන බව කී නියා යි.)

අධ්‍යෙති අධීතඃ අධීයන්ති යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අධීයාත්, අධ්‍යෙතු යනු විධි ලිඞ්- ලොට් ප්‍රථම පුරුෂ එක වචන යි. අධ්‍යෛත් අධ්‍යෛතාම් අධ්‍යායන් යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අධිජගෞ, අධීයාත්, අධ්‍යෙතා, අධ්‍යෙෂ්‍යති, අධ්‍යෛෂ්‍යත්, අධ්‍යගාත් යනු පිළිවෙළින් ලිට්- ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එකවචන යි. ඉණ් වත්, ඉණ් ධාතුව මෙනි.

**25. "විද්" ඤාණෙ, "උපධාය ලහොඃ" වෙත්ති විත්තඃ විදන්ති, වෙත්සි විත්ථඃ විත්ථ, වෙද්මි විද්වඃ විද්මඃ.**

## 122. විදෙ ත්‍යවාත්‍යාං * තිබාදීනාං ණබාදිර් ත්‍යවකො වා.

(විදඃ 5-1. ත්‍යවාත්‍යාං 6-3. තිබාදීනාං 6-3. ණබාදඃ 1-1. ත්‍යවකඃ 1-1. වා-නි.)

**a. විද උත්තරෙෂාං තිබාදීනාං ත්‍යවාත්‍යාං ණබාදිර් ත්‍යවකො වා භවති. වෙද විදතුඃ විදුඃ, වෙත්ථ විදථුඃ විද, වෙද විද්ව විද්ම, විද්‍යාත්, වෙත්තු- විත්තාද්වා විත්තාම් විදන්තු, "ඣසාද්ධිහේඃ." විද්ධි- විත්තාද්වා විත්තම් විත්ත, වෙදානි වෙදාව වෙදාම. "දිස්‍යාහීසාත්." අවෙත්- අවෙද් අවිත්තාම්, × "අත උස්." අවිදුඃ.**

---

25. "විද්" ඤානෙ, "විද්" ධාතුව දැනීමෙහි වේ. "උපධාය ලහොඃ" යි ගුණ වේ. ("ධසෙ චපා ඣසාත්‍යාම්" යන සූත්‍රයෙන් දකාරයට තකාරය වේ.) වෙත්ති විත්තඃ විදන්ති යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. වෙත්සි විත්ථඃ විත්ථ යනු ම: එක- ද්වි- බහු වචන යි. වෙද්මි විද්වඃ විද්මඃ යනු උත්තම පුරුෂ එක- ද්වි- බහු වචන යි.

122. ආදෙශ විධි සූත්‍ර යි. විදඃ, "විද් ඥානෙ" යන ධාතුව කෙරෙන් පර වූ; තිබාදීනාං ත්‍යවාත්‍යාම්, තිප් ප්‍රත්‍යය ආදි කොට ඇති ත්‍යවයට; වා, විකල්පයෙන්; ණබාදිඃ ත්‍යවකඃ, ණප් ප්‍රත්‍යය ආදි කොට ඇති ත්‍යවකය ආදෙශ වේ.

a. විදඃ, "විද් ඥානෙ" යන ධාතුව කෙරෙන්; උත්තරෙෂාං පර වූ; තිබාදීනාං ත්‍යවාත්‍යාම්, තිප් ප්‍රත්‍යය ආදිකොට ඇති ත්‍යවයට; වා, විකල්පයෙන්; ණබාදිඃ ත්‍යවකඃ, ණප් ආදි ත්‍යවකය; භවති, වේ; (විද්ධාතුව කෙරෙන් පරවූ ලට් පරස්මෛපද තිප්, තස්, අන්ති යනාදි ප්‍රත්‍යය ත්‍යවයට ලිට් පරස්මෛපද ණප්, අතුස්, උස් යනාදි ප්‍රත්‍යය ත්‍යවය ආදෙශ වන බව මෙයින් සූචිත යි. එකී ආදෙශ පර කල්හි ධාතුවට ද්විත්ව නො වේ. වර්තමානාර්ථ බැවිනි.) වෙද විදතුඃ විදුඃ, යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. වෙත්ථ විදථුඃ විද යනු ම: එක- ද්වි- බහු වචන යි. වෙද විද්ව විද්ම යනු උ: එක- ද්වි- බහු වචන යි. විද්‍යාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. වෙත්තු යනු ලොට් ප්‍ර: එක වචන යි. විත්තාද්වා, විකල්පයෙන් "විත්තාත්" කියා ද වේ. විත්තාම් විදන්තු යනු ද්වි- බහු වචන යි. "ඣසාද්ධිහේඃ" යන සූත්‍රයෙන් හි

---

* ත්‍යාදීනාං ණබාදි වා- පොත්හි.

× අා උස් වා- අවිදන්, අවිදුඃ- පොත්හි.

## 123. දඃ සඃ. (දඃ 1-1. සඃ 1-1.)

**b. දකාරස්‍ය වා සකාරො භවති සි විෂයෙ. අවෙඃ- අවෙත්- අවෙද් අවිත්තාම් අවිත්ත, අවෙදම් අවිද්ව අවිදම. විවෙද විවිදතුඃ විවිදුඃ, විවෙදිථ, පක්‍ෂෙ:-ආමි විදෙර් න ගුණඃ. විදාඤ්චකාර-විදාමාස- විදාම්බභූව, විද්‍යාත් විද්‍යාස්තාම්, වෙදිතා, වෙදිෂ්‍යති, අවෙදිෂ්‍යත්, අවෙදීත් අවෙදිෂ්ටාම් අවෙදිෂුඃ.**

---

යන්නට "ධි" ආදෙශය වේ. විද්ධි යනු මධ්‍යම පුරුෂ ඒකවචන යි. විත්තාද්වා, විකල්පයෙන් "විත්තාත්" කියා ද වේ. විත්තම් විත්ත යනු ම- බහු වචන යි. වෙදානි වෙදාව වෙදාම යනු උ: ඒක- ද්වි- බහු වචන යි. "දිස්‍යොහ්සාත්" යන සූත්‍රයෙන් දිප්-සිප් දෙකට ලොප් වේ. අවෙත්- අවෙද්, අවිත්තාම් යනු ලඞ් ප්‍ර: ඒක- ද්වි වචන යි. අනඃ, "අන්"හට; උස්, "ස්‍යාවිදඃ" යන සූත්‍රයෙන් උස් යන ආදෙශය වේ. අවිදුඃ යනු ප්‍ර: බහු වචන යි.

(ලඞ් ප්‍රථම පුරුෂ බහු වචනයෙහි "අවිදන්- අවිදුඃ" යි සාරස්වතයෙහි රූප දෙකක් පෙණේ. මුග්ධ බොධයෙහි ද එසේ ම ය. පාණිනීයයෙහි එන්නේ "අවිදුඃ" යන්න පමණකි. සාරස්වත යෙහි ද "ස්‍යාවිදඃ" යන සූත්‍රයට විරුද්ධ බැවින් "අවිදන්" යි රූප යක් නො ලැබිය හැකි ය. එහෙයින් ම සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි "ආදන්තාද් විශෙෂො ලඞො'න උස් වා"යි දක්වා තිබේ.)

123. සකාරාදෙශ විධි සූත්‍ර යි. මීට "සිපි වා" යන්න අනුවෘත්ත වේ. සිපි, සිප් විෂයෙහි; දඃ, දකාරයට; වා, විකල්පයෙන්; සඃ, සකාරය වේ.

b. සි විෂයෙ, සිප් විභක්ති විෂයෙහි; දකාරස්‍ය, දකාරයට; වා, විකල්පයෙන්; සකාරඃ භවති, සකාරය වේ. ("සෞ පරෙ"යි නො කියා "සි විෂයෙ"යි කියන ලද්දේ "දිස්‍යොහ්සාත්" යන්නෙන් කලින් ම සිප් ලොප් කළ හෙයිනි.) අවෙඃ-අවෙත්- අවෙද් අවිත්තාම් අවිත්ත, අවෙදම් අවිද්ව අවිද්ම යනු පිළිවෙළින් ලඞ් ම: උ: ඒක- ද්වි- බහු වචන යි. විවෙද විවිදතුඃ විවිදුඃ යනු ලිට් ප්‍ර: ඒක-ද්වි- බහු වචන යි. විවෙදිථ යනු ම: ඒකවචන යි. පක්‍ෂෙ, එක් පක්‍ෂයෙක්හි; ආමි, ආම් ප්‍රත්‍යය පර කල්හි; විදෙඃ, විද් ධාතුහට; න ගුණඃ, ගුණ නො වේ. විදාඤ්චකාර, විදාමාස, විදාම්බභූව යනු ද ලිට් ප්‍ර: ඒක වචන යි. විද්‍යාත් විද්‍යාස්තාම් යනු ආශිර්ලිඞ් ප්‍ර: ඒක- ද්වි වචන යි. වෙදිතා, වෙදිෂ්‍යති, අවෙදිෂ්‍යත් යනු ලුට්- ලෘට්-ලෘඞ් ප්‍ර: ඒක වචන යි. අවෙදීත් අවෙදිෂ්ටාම් අවෙදිෂුඃ යනු ලුඞ් ප්‍ර: ඒක- ද්වි- බහු වචන යි.

**26. "අස්" භුවි, අසති.**

## 124. නමසො'ස්‍ය. (නම්සඃ 6-1. අස්‍ය 6-1.)

c. **නම් ඉත්‍යේතස්‍ය විකරණස්‍යාස් භුවිති ධාතොශ්චා-කාරස්‍ය ලොපො භවති ඞිති පරෙ. සතඃ, සන්ති.**

## 125. සි සඃ. (සි. 7-1. සඃ-6-1.)

d. **අසෙතොඃ සකාරස්‍ය ලොපො භවති සකාරෙ පරෙ. සිස ඉත්‍යත්‍ර අසෙතොඃ සලොපඃ සකාරමාත්‍රෙ, න තු පිති. තෙන ව්‍යතිසෙ.**

**අසි ස්ථඃ ස්ථ, අස්මි ස්වඃ ස්මඃ, ස්‍යාත් ස්‍යාතාම් ස්‍යුඃ, අස්තු- ස්තාත් ස්තාම් සන්තු, "ජහ්‍යොධි සාධි" එධි- ස්තාත් ස්තම් ස්ත, අසානි අසාව අසාම.**

---

26. අස් භුවි, "අස්" ධාතුව වීම් අර්ථයෙහි වේ. අස්ති යනු ලට් ප්‍ර: එකවචන යි.

124. අකාර ලොප විධි සූත්‍ර යි. මීට "ඞිත්‍යදුඃ" යන සූත්‍ර යෙන් "ඞිති" යනු ද– "ලොපඃ" යන සූත්‍රය ද අනුවෘත්ත වේ. ඞිති, ඞිත් පර කල්හි, නමසඃ, නම් විකරණයාගේ හා අස් ධාතුහුගේ; අස්‍ය, අකාරයට; ලොපඃ, ලොප් වේ.

c. ඞිති පරෙ, ඞිත්සංඥ විභක්ති පර කල්හි; නම් ඉති, නම් යන; එතස්‍ය විකරණස්‍ය, මේ විකරණයාගේ ද; අස්භුවි ඉති, "අස් භුවි" යන; ධාතොඃ ච, ධාතුහුගේ ද; අකාරස්‍ය, අකාරයට; ලොපඃ භවති, ලොප් වේ. (ඞිත්සංඥ වූ විභක්ති ප්‍රත්‍යයන් පර කල්හි "රුධාදෙර්නම්" යන සූත්‍රයෙන් වන රුධාදි ගණයෙහි වූ "නම්" විකරණයා ගේ ද "අස් භුවි" යන ධාතුහුගේ ද අකාරයට මෙයින් ලොප් වේ.) සතඃ, සන්ති යනු ප්‍ර: වි– බහු වචන යි.

125. සකාර ලොප විධි සූත්‍ර යි. "නමසො'ස්‍ය" යන්නෙන් අසඃ යනු ද– "ලොපඃ" යන සූත්‍රය ද මීට අනුවෘත්ත වේ. සි, සකාරය පර කල්හි; අසඃ, අස් ධාතුහුගේ; සඃ,සකාරයට; ලොපඃ, ලොප් වේ.

d සකාරෙ පරෙ, සකාරය පර කල්හි; අසෙතොඃ, අස් ධාතු හුගේ; සකාරස්‍ය, සකාරයට; ලොපඃ භවති, ලොප් වේ. සිසඃ ඉති අත්‍ර, "සිසඃ" යන මේ සූත්‍රයෙහි; අසෙතොඃ සලොපඃ, අස් ධාතුව පිළිබඳ සකාර ලොපය; සකාර,මාත්‍රෙ, සකාර මාත්‍රය පර කල්හි ය; පිති, පිත් වූ ස යන්න පමණක් පර කල්හි; න තු, නො වේ. තෙන, එහෙයින්; ව්‍යතිසෙ, "ව්‍යතිසෙ" යන තන්හි ද සකාර ලොපය විය.

## 126. අසෙතරීට්. (අසෙනා: 5-1. ඊට් 1-1.)

**a. අසෙන රුදාදෙශව පරයොර් දිසොෂාරීඩාගමො භවති– ආසීත්, "ලොපාගමයො මීධ්‍යෙ ආගමවිධිර් බලවාන්". ආසතාම් ආසන්, ආසීඃ ආසතම් ආසත, ආසම් ආසව ආසම. අසෙතරතසි-ත් වකානවාඃ. බහුව.**

---

("සිසඃ" යන සූත්‍රයෙන් වන අස් ධාතුහුගේ සකාර ලොපය කවර තමුත් සකාරයක් පර කල්හි ය. හෙවත් සකාරාදි ප්‍රත්‍යයන් පර කල්හි ය. "සිප්" ආදි පයන්ත ඉත් කොට ඇති ප්‍රත්‍යයන් පර කල්හි පමණක් නො වේ. "ව්‍යතිසෙ" යනු වි– අති පූර්ව අස් ධාතුහුගේ ලට් ආත්මනෙපද මධ්‍යම පුරුෂ එකවචන රූප යි. "ව්‍යති + අස් + සෙ" යි සිටි කල්හි "තමසො'ස්‍ය" යි අකාර ලොපයෙන් හා "සිසඃ" යි සකාර ලොපයෙන් ද සිද්ධ යි. අස් භුවි යනු පරස්මෛ පදී වුව ද "කර්මව්‍යතිහාරෙ'න්‍යත්‍ර හිංසාදෙරාත්" යන්නෙන් ආත්මනෙ පදය විය.) අසි සථඃ සථ, අස්මි සවඃ සමඃ යනු ම: උ: එක– ද්වි– බහු වචන යි. ස්‍යාත් ස්‍යාතාම් ස්‍යුඃ යනු විධි ලිඞ් ප්‍ර: එක– ද්වි– බහු වචන යි. අස්තු යනු ද– ස්තාත් යනු ද ලොට් ප්‍ර: එක වචන යි. ස්තාම් සන්තු යනු ද්වි– බහු වචන යි "ජහොත්‍යධි සාධි" යන සූත්‍රයෙන් "එධි" යි නිපාතනය කරණු ලැබේ. එධි යනු ද– ස්තාත් යනු ද ම: එක වචන යි. ස්තම් ස්ත යනු ද්වි– බහු වචන යි. අසානි අසාව අසාම යනු උ: එක– ද්වි– බහු වචන යි.

126. ඊඩාගම විධි සූත්‍ර යි. මීට "දිසොෂාභීසාත්" යන්නෙන් දිසොෂාඃ යනු ද– "අද්‍රුදාදෙරට්" යන්නෙන් රුදාදෙඃ යනු ද අනුවෘත්ත යි. අසෙතඃ, අස් ධාතුව කෙරෙන් ද; රුදාදෙඃ, රුදාදිය කෙරෙන් ද– පර වූ; දිසොෂාඃ, දිප්– සිප් දෙක සම්බන්ධ ව; ඊට්, ඊඩාගම වේ.

**a. අසෙතඃ, අස් ධාතුව කෙරෙන් ද; රුදාදෙඃ ච, රුදාදිය කෙරෙන් ද; පරයොඃ, පර වූ; දිසොෂාඃ, දිප්– සිප් දෙක සම්බන්ධ ව; ඊඩාගමඃ භවති, ඊට් ආගම වේ.**

**අස් ධාතුව කෙරෙන් හා රුදාදිගණය කෙරෙන් (රුදාදි ගණය මතු දක්‌ වේ.) පර වූ දිප්– සිප් දෙක සම්බන්ධ ව ඊඩාගමය මෙයින් විහිත ය. ආසීත් යනු ලඞ් ප්‍ර: එක වචන යි.**

**ලොපාගමයොඃ මධ්‍යෙ, ලොප– ආගම විධි දෙක අතරෙහි; ආගම විධිඃ, ආගම විධිය; බලවාන්, බලවත් වේ. (මෙහි "දිබාදාවට්– සවරාදෙඃ" යි අඩාගමවය ද "තමසො'ස්‍ය" යි අකාර ලොපය ද– එකවිට පැමිණි කල්හි ආගම විධිය බලවත් බැවින් පළමු කොට**

**27.** "මෘජූෂ්" * ශුද්ධෞ, මෘජේර් ගුණ නිමිත්තෙ ප්‍රත්‍යයෙ පරෙ වෘද්ධිර් වාච්‍යා කිති ඞිති ස්වරෙ වා. **ෂත්වම්, ටුත්වම්.**

b. **රාත්සස්‍ය.**

c. **රෙඵාදුත්තරස්‍ය සස්‍යෛව ලොපඃ ස්‍යාන්නාන්‍යස්‍ය.** මාර්ෂ්ටි මෘෂ්ටඃ මෘජන්ති-මාර්ජන්ති. මාර්ක්ෂි මෘෂ්ඨඃ මෘෂ්ඨ, මාර්ජ්මි මෘජ්වඃ මෘජ්මඃ, මෘජ්‍යාත්, මාර්ෂ්ටු - මෘෂ්ටාත් මෘෂ්ටාම් මෘජන්තු-මාර්ජන්තු, මෘඩ්ඪි-මෘෂ්ටාත් මෘෂ්ටම් මෘෂ්ට, මාර්ජානි මාර්ජාව මාර්ජාම, අමාර්ට්- අමාර්ඩ් අමෘෂ්ටාම් අමෘජන්-අමාර්ජන්, අමාර්ට්- අමාර්ඩ් අමෘෂ්ටම් අමෘෂ්ට, අමාර්ජ්ම අමෘජ්ව අමෘජ්ම. මමාර්ජ මමෘජතුඃ - මමාර්ජතුඃ මමෘජුඃ - මමාර්ජුඃ, මමාර්ජිථ - මමාර්ෂ්ඨ මමෘජථුඃ- මමාර්ජථුඃ, මෘජ්‍යාත්, මාර්ජිතා- මාර්ෂ්ටා, මාර්ජිෂ්‍යති - මාර්ක්ෂ්‍යති, අමාර්ජිෂ්‍යත් - අමාර්ක්ෂ්‍යත්, අමාර්ජීත් අමාර්ජිෂ්ටාම් අමාර්ජිෂුඃ, අමාර්ක්ෂීත් අමාර්ෂ්ටාම් අමාර්ක්ෂුඃ.

---

අඩාගම වය ව පසුව "තමසො 'ස්‍ය'' යි අස් ධාතුහුගේ අකාරයට ලොප් වේ. "සවර්ණේ දීර්ඝඃ සහ'' යි දීර්ඝය වේ.) ආසතාම් ආසන් යනු වි- බහු වචන යි. ආසීඃ ආසතාම් ආසත, ආසම් ආසව ආසම යනු ම: උ: එක- වි- බහු වචන යි. අස්තෙඃ, අස් ධාතුහට; අනපි, අනබ් විෂයෙහි; භූ වක්තව්‍යඃ, "භූ'' ආදෙශය කිය යුතු යි.(ලිට් ආදි විභක්ති සයෙහි අස් ධාතුහට භූ ආදෙශ වීමෙන් භූ ධාතුව මෙන් වර නැගෙන බව මෙයින් දැක් වේ.) බභූව යනු ලිට් ප්‍ර: එක වචන යි.

27. මෘජූෂ්, ඌකාර ෂකාරානුබන්ධ "මෘජ්'' ධාතුව; ශුද්ධෞ, පිරිසිදු බැව්හි වේ. මෘජේඃ, මෘජ් ධාතුහට; ගුණනිමිත්තෙ ප්‍රත්‍යයෙ පරෙ, ගුණයට නිමිති වූ ප්‍රත්‍යය පර කල්හි; වෘද්ධිඃ වාච්‍යා, වෘද්ධිය කිය යුතු යි. කිති ඞිති ස්වරෙ, කිත් වූ ද-ඞිත් වූ ද ස්වරයා පර කල්හි; වා, විකල්පයෙන් වෘද්ධිය වේ. (කිත්-ඞිත් නොවූ ප්‍රත්‍යයන් පර කල්හි මෘජ් ධාතුහට නිත්‍යයෙන් වෘද්ධි වන බව ද- කිත් වූ ද ඞිත් වූ ද ස්වරාදි ප්‍රත්‍යයන් පර කල්හි විකල්පයෙන් වෘද්ධි වන බව ද මෙයින් දක්වන ලදි.) ෂත්වම්, "ඡශෂරාජාදෙඃ ෂඃ'' යි ජකාරයට ෂකාර බව වේ. ටුත්වම්, "ෂ්ටුනාඃ ෂ්ටුඃ'' යි ත වර්ගයට ට වර්ග බව වේ.

b. රාත්, රේඵයා කෙරෙන් පර වූ; සස්‍ය, සකාරයට ලොප් වේ.

c. රෙඵාත් උත්තරස්‍ය, රේඵයා කෙරෙන් පර වූ; සස්‍ය එව, දන්ත්‍ය සකාරයට ම; ලොපඃ ස්‍යාත්, ලොප් වන්නේ ය; අන්‍යස්‍ය, අනික් වර්ණයකට; න තු, ලොප් නො වන්නේ ය. (මේ "සංයොගාන්තස්‍ය ලොපඃ'' යන සූත්‍රය සඳහා කියන ලද්දෙකි.)

---

* "අයං න ෂිත්, හිදුදිපාඨ සාමර්ථ්‍යාත්" සිද්ධාන්ත චන්ද්‍රිකා ටීකා.

28. "වච්" පරිභාෂණෙ, වක්ති වක්තඃ, "න හි වචි රන්තිපරඃ ප්‍රයොක්තව්‍යඃ, කින්තු වදන්තීත්‍යුච්චාරණීයම්." වදන්ති, වක්ෂි වක්ථඃ වක්ථ, වච්මි වච්වඃ වච්මඃ, වච්‍යාත්, වක්තු- වක්තාත් වක්තාම්, වග්ධි- වක්තාත් වක්තම් වක්ත, අවක්- අවග් අවක්තාම් අවචන්, අවක්- අවග් අවක්තම් අවක්ත, අවචම් අවච්ව, අවච්ම, "ණබාදෞ පූර්වස්‍ය" උවාච. "යජ්‍යාං යවරණාං ය්වෘතඃ සම්ප්‍රසාරණම්." ඌචතුඃ, ඌචුඃ, උවචිථ- උවක්ථ, උච්‍යාත්, වක්තා, වක්ෂ්‍යති, අවක්ෂ්‍යත්, "අස්‍යතිවක්ති-" ඉති ඩඃ. ඩෙ වචෙරුමාගමො වක්තව්‍යඃ. "උඩ" අවොචත් අවොචතාම්, අවොචන්.

---

මාර්ෂ්ටි මෘෂ්ටඃ මෘජන්ති- මාර්ජන්ති, මාර්ක්ෂි මෘෂ්ඨඃ මෘෂ්ඨ, මාර්ජ්මි මෘජ්වඃ මෘජ්මඃ යනු ලට් ප්‍ර: ම: උ: පුරුෂ එක- ද්වි- බහු වචන යි. මෘජ්‍යාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. මාර්ෂ්ටු- මෘෂ්ටාත් මෘෂ්ටාම් මෘජන්තු- මාර්ජන්තු, මෘඩ්ඪි- මෘෂ්ටාත් මෘෂ්ටම් මෘෂ්ට, මාර්ජානි මාර්ජාව මාර්ජාම යනු ලොට් ප්‍ර: ම: උ: එක- ද්වි- බහු වචන යි. අමාර්ට්- අමාර්ඩ් අමෘෂ්ටාම් අමෘජන්- අමාර්ජන්, අමාර්ට්- අමාර්ඩ් අමෘෂ්ටම් අමෘෂ්ට, අමාර්ජම් අමෘජ්ව, අමෘජ්ම යනු ලඞ් ප්‍ර: ම: උ: එක- ද්වි- බහු වචන යි. මමාර්ජ මමෘජතුඃ- මමාර්ජතුඃ මමෘජුඃ- මමාර්ජුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. මමාර්ජිථ- මමාර්ෂ්ඨ, මමෘජථුඃ- මමාර්ජථුඃ යනු ලිට් ම: එක- ද්වි- වචන යි. මෘජ්‍යාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. මාර්ජිතා- මාර්ෂ්ටා, මාර්ජිෂ්‍යති- මාර්ක්ෂ්‍යති, අමාර්ජිෂ්‍යත්- අමාර්ක්ෂ්‍යත් යනු පිළිවෙළින් ඉට්පක්ෂයෙහි හා අනිට් පක්ෂයෙහි ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. අමාර්ජීත් අමාර්ජිෂ්ටාම් අමාර්ජිෂුඃ යනු ඉට් පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අමාර්ක්ෂීත් අමාර්ෂ්ටාම් අමාර්ක්ෂුඃ යනු අනිට් පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

28. "වච්" පරිභාෂණෙ, "වච්" ධාතුව කීමෙහි වේ. වක්ති වක්තඃ යනු ලට් ප්‍ර: එක- ද්වි වචන යි. වචිඃ, වච් ධාතුව; අන්තිපරඃ, අන්ති ප්‍රත්‍යය පර කොට ඇත්තේ; න හි ප්‍රයොක්තව්‍යඃ, නො යෙදිය යුතු යි. කින්තු, වැලිදු; වදන්ති ඉති, වදන්ති කියා; උච්චාරණීයම්, උසුරු විය යුතු යි.

(වච් ධාතුව කෙරෙන් අන්ති ප්‍රත්‍යය යෙදුනු කල්හි ධාතුවේ වකාරයට දකාරය කිරීමෙන් "වදන්ති" යි සිටී. "බහුවචන පරෙ න ප්‍රයුජ්‍යතෙ ඉත්‍යපරෙ" යන්නෙන් වච් ධාතුවෙන් පර ව බහු වචන ප්‍රත්‍යයන් නො යෙදෙන බව සමහර ආචාර්‍ය්‍යවරයෝ පවසති යි සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි කීහ.) වදන්ති යනු ලට් ප්‍ර: බහු වචන යි. වක්ෂි,

29. "රුදිර්" අශ්‍රු විමොචනෙ,

## 127. රුදාදෙශ්චතුර්ණාං හ්වසාදෙඃ.

(රුදාදෙඃ 5-1. චතුර්ණාම්. 6-3. හ්වසාදෙඃ 6-1.)

a. **රුදාදෙඃ පරෙෂාං තිබාදි චතුර්ණාං මධ්‍යෙ හකාර වසාදෙඃ ප්‍රත්‍යයස්‍යෙඩ් භවති.**

---

වක්ථඃ වක්ථ, වච්මි වච්වඃ වච්මඃ යනු ම: උ: එක- ද්වි- බහු වචන යි. වච්‍යාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. වක්තු- වක්තාත්, වක්තාම් යනු ලොට් ප්‍ර: එක- ද්වි වචන යි. වග්ධි- වක්තාත් වක්තම් වක්ත යනු ම: එක- ද්වි- බහු වචන යි. අවක්- අවග් අවක්තාම් අවචන්, අවක්- අවග් අවක්තම් අවක්ත, අවචම් අවච්ව අවච්ම යනු ලඞ් පරස්මෛපද යි.

"ණබාදෞ පූර්වස්‍ය" යන සූත්‍රයෙන් පූර්වරූපයට සම්ප්‍රසාරණ වේ. උවාච යනු ලිට් ප්‍ර: එකවචන යි. "යජාං යවරාණාං ය්වෘතඃ සම්ප්‍රසාරණං කිති" යන සූත්‍රයෙන් ධාතු වකාරයට ද සම්ප්‍රසාරණ වේ. (සවර්ණ දීර්ඝත්වය කළ කල්හි) ඌචතුඃ ඌචුඃ යනු ද්වි- බහු වචන යි. උවචිථ- උවක්ථ යනු ම: එකවචන යි. උච්‍යාත්, වක්තා වක්‍ෂ්‍යති, අවක්‍ෂ්‍යත් යනු ආශිර් ලිඞ්-ලුට්-ලෘට්-ලෘඞ් ප්‍ර: එකවචන යි.

අස්‍යති වක්ති ඉති ඞඃ, "අස්‍යති වක්ති-" යනාදීන් ඞ ප්‍රත්‍යය වේ. ඞෙ, ඞ ප්‍රත්‍යය පර කල්හි; වචෙඃ, වච් ධාතුව සම්බන්ධව; උමාගමඃ, උම් ආගමය; වක්තව්‍යඃ, කියයුතු යි. (මකාරය ඉත් බැවින් මේ උකාරාගමය අන්ත්‍යස්වරය වූ වකාරසථ අකාරයෙන් පර ව වේ.) "උඹ" යන සූත්‍රයෙන් ඔකාරය වේ. අවොචත් අවොචතාම් අවොචන් යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

29. රුදිර්, ඉරනුබන්ධ "රුද්" ධාතුව; අශ්‍රු විමොචනෙ, කඳුලු මිදීමෙහි හෙවත් හැඬීමෙහි වේ.

127. ඉඩාගම විධි සූත්‍ර යි. මීට "සිසතාසිස්‍යපාමිට්" යන සූත්‍රයෙන් "ඉට්" යනු අනුවෘත්ත වේ. රුදාදෙඃ, රුදාදි ගණයා කෙරෙන් පර වූ; චතුර්ණාම්, ලඞාදි සතර පිළිබඳ; හවසාදෙඃ, හකාර- වස ප්‍රත්‍යාහාරාදි ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට්, ඉඩාගම වේ.

a. රුදාදෙඃ පරෙෂාම්, රුදාදි ගණයා කෙරෙන් පර වූ; තිබාදි චතුර්ණාං මධ්‍යෙ, තිබාදි විභක්ති සතර අතරෙහි, හකාර වසාදෙඃ, හකාරය- වසප්‍රත්‍යාහාරය යන මොවුන් ආදි කොට ඇති; ප්‍රත්‍යයස්‍ය, ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් භවති, ඉඩාගම වේ.

b. **"රොදිතිඃ ස්වපිතිශ්චෛව- ශ්වසිතිඃ ප්‍රාණිතිස්තථා,**
**ජක්ෂිතිශ්චෛව විඥෙයො- රුදාදි පඤ්චකො ගණඃ."**

c. **රොදිති රුදිතඃ රුදන්ති, රොදිෂි රුදිථඃ රුදිථ, රොදිමි රුදිවඃ රුදිමඃ, රුරොද, රොදිතු- රුදිතාද්වා රුදිතාම රුදන්තු, රුදිහි- රුදිතාද්වා රුදිතම් රුදිත, රොදනි රොදව රොදම.**

d. **"රුදාදෙර්දිසොර්ඊඩථෙව ච වක්තව්‍යෞ." අරොදීත්- අරොදත්, රුරොද රුරුදතුඃ, රුද්‍යාත්, රොදිතා, රොදිෂ්‍යති, අරොදිෂ්‍යත්, අරොදීත්. "ඉරිතො වා" අරුදත්.**

---

b. රොදිතිඃ, රුදිර් අශ්‍රු විමොචනෙ ය; ස්වපිතිඃ ච එව, ඤිෂ්වප් ශයෙ ය; ශ්වසිතිඃ, ශ්වස් ප්‍රාණනෙ ය; තථා, එසේ ම; ප්‍රාණිතිඃ, ප්‍ර පූර්ව අන ප්‍රාණනෙ ය; ජක්ෂිතිඃ ච එව, ජක්ෂ භක්ෂහසනයොඃ ය යන මේ; රුදාදි පඤ්චකඃ ගණඃ, රුදාදි පසක් ඇති ගණය යි; විඥෙයඃ, දතයුතු යි.

(මේ රුදාදි ධාතුගණයා කෙරෙන් පර වූ ලට්- විධිලිඞ්- ලොට්- ලඞ් විභක්තීන් පිළිබඳ හකාරය හා වස ප්‍රත්‍යාහාර වර්ණයන් ආදි කොට ඇති ප්‍රත්‍යයන් සම්බන්ධ ව ඉඩාගම වන බව පූර්වෝක්ත සූත්‍රයෙන් දැක්වේ. මෙහි හකාර වසප්‍රත්‍යාහාරාදි ප්‍රත්‍යයෝ නම් යකාරය හැර ඉතිරි ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයෝ ය.)

c. රොදිති රුදිතඃ රුදන්ති, රොදිෂි රුදිථඃ රුදිථ, රොදිමි රුදිවඃ රුදිමඃ යනු ලට් පරස්මෛපද යි. රුද්‍යාත් යනු විධිලිඞ් ප්‍ර: එකවචන යි. රොදිතු- රුදිතාත් රුදිතාම් රුදන්තු, රුදිහි- රුදිතාත් රුදිතම් රුදිත, රොදනි රොදව රොදම යනු ලොට් පරස්මෛපද යි.

d. රුදාදෙඃ, රුදාදිහු කෙරෙන් පර වූ; දිසොඃ, දිප්- සිප් දෙක සම්බන්ධ ව; ඊඩථෙව ච, ඊඩාගම- අඩාගම දෙදෙන ද; වක්තව්‍යෞ, කිය යුත්තාහ. ("අරොදීත්" යි ඊඩාගමය ද- "අරුදත්"යි අඩාගමය ද වේ.) අරොදීත් යනු ඊඩාගම පක්ෂයෙහි ද- අරොදත් යනු අඩාගම පක්ෂයෙහි ද ලඞ් ප්‍ර: එකවචන යි. රුරොද රුරුදතුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි වචන යි. රුද්‍යාත්- රොදිතා- රොදිෂ්‍යති- අරොදිෂ්‍යත්- අරොදීත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එකවචන යි." ඉරිතො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඞ ප්‍රත්‍යය වේ. අරුදත් යනු ඞප්‍රත්‍යය විෂයෙහි ප්‍ර: එකවචනයි.

**30.** "ඤි ෂ්වප්" ශයෙ, ඤි ඉත්, ස්වපිති, ස්වප්‍යාත්, ස්වපිතු- ස්වපිතාද්වා, අස්වපීත්- අස්වපත්, සම්ප්‍රසාරණම්. සුෂ්වාප සුෂුපතුඃ සුෂුපුඃ, සුෂ්වපිථ- සුෂ්වප්ථ, සුප්‍යාත්. ස්වප්තා, ස්වප්ස්‍යති, අස්වප්ස්‍යත්, අස්වාප්සීත් අස්වාප්තාම් අස්වාප්සුඃ.

**31.** "ශ්වස්" ප්‍රාණනෙ, ශ්වසිති, ශ්වස්‍යාත්, ශ්වසිතු, අශ්වසීත්- අශ්වසත් අශ්වසිතාම් අශ්වසන්, ශශ්වාස ශශ්වසතුඃ ශශ්වසුඃ, ශ්වස්‍යාත්, ශ්වසිතා, ශ්වසිෂ්‍යති, අශ්වසිෂ්‍යත්. හම්‍යන්තක්ෂණෙති වෘද්ධ්‍යභාවඃ, අශ්වසීත්.

**32.** "අන" ප්‍රාණනෙ. අනිති, * ප්‍රපූර්වඃ. "උපසර්ගස්ථාන් නිමිත්තාදනිතෙර්නස්‍ය ණත්වං වාච්‍යම්." ප්‍රාණිති. අන්‍යාත්, අනිතු, ආනීත්- ආනත්, ආන ආනතුඃ ආනුඃ, අන්‍යාත්, අනිතා, අනිෂ්‍යති, ආනිෂ්‍යත්, ආනීත් ආනිෂ්ටාම් ආනිෂුඃ.

---

30. ඤි ෂ්වප් ශයෙ, ඤියන්ත ඉත් කොට ඇති "ෂ්වප්" ධාතුව නිදීමෙහි වේ. ඤි ඉත්, ඤිකාරය ඉත් ය; ස්වපිති, ස්වප්‍යාත් යනු ලට්- විධිලිඞ් ප්‍ර: එකවචන යි. ස්වපිතු යනු ලොට් ප්‍ර: එකවචන යි. ස්වපිතාද්වා, (තාතඞ් ආදෙශයෙන්) ස්වපිතාත් කියා හෝ වේ. අස්වපීත්- අස්වපත් යනු ඊඩාගම- අඩාගම දෙපක්ෂයෙහි ලඞ් ප්‍ර: එකවචන යි. සම්ප්‍රසාරණම්, ("ණබාදෞ පූර්වස්‍ය" යි) සම්ප්‍රසාරණ වේ. සුෂ්වාප සුෂුපතුඃ සුෂුපුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. සුෂ්වපිථ- සුෂ්වප්ථ යනු ම: එකවචන යි. සුප්‍යාත්- ස්වප්තා- ස්වප්ස්‍යති- අස්වප්ස්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. අස්වාප්සීත් අස්වාප්තාම් අස්වාප්සුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

31. ශ්වස් ප්‍රාණනෙ, "ශ්වස්" ධාතුව ජීවත් වීමෙහි වේ. ශ්වසිති ශ්වස්‍යාත්, ශ්වසිතු යනු ලට්- විධිලිඞ්- ලොට් ප්‍ර: එකවචන යි. අශ්වසීත්- අශ්වසත් අශ්වසිතාම් අශ්වසන් යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. ශශ්වාස ශශ්වසතුඃ ශශ්වසුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහුවචන යි. ශ්වස්‍යාත්- ශ්වසිතා- ශ්වසිෂ්‍යති- අශ්වසිෂ්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. හම්‍යන්තක්ෂණ ඉති, "හම්‍යන්තක්ෂණ-" යනාදි සූත්‍රයෙන්; වෘද්ධ්‍යභාවඃ, වෘද්ධි ප්‍රතිෂේධය වේ. අශ්වසීත් යනු ලුඞ් ප්‍ර: එකවචන යි.

32. අන ප්‍රාණනෙ, "අන" ධාතුව ජීවත් වීමෙහි වේ. අනිති යනු ලට් ප්‍ර: එකවචන යි. ප්‍රපූර්වඃ, ප්‍ර යන උපසර්ගය පූර්ව කොට ඇත්තේ වේ. උපසර්ගස්ථාත්, උපසර්ගයෙහි පිහිටි; නිමිත්තාත්,

---

* පොත්හි මෙය සූත්‍රයක් ලෙස මුද්‍රිත වීම ප්‍රමාද දෝෂයෙකි.

**33.** "ජක්ෂ" භක්ෂ හසනයොඃ, ජක්ෂිති ජක්ෂිතඃ, "ජක්ෂාදෙරන්තො'දන උස්." ජක්ෂ ජාගෘ දරිද්‍රා ශාස් චකාසෘභ්‍යඃ පරස්‍ය අනන අත් අන උස් භවති. ජක්ෂති, ජක්ෂිෂි, ජක්ෂ්‍යාත්, ජක්ෂිතු, අජක්ෂීත්- අජක්ෂත්, ජජක්ෂ, ජක්ෂ්‍යාත්, ජක්ෂිතා, ජක්ෂිෂ්‍යති, අජක්ෂිෂ්‍යත්, අජක්ෂීත්.

**34.** "ජාගෘ" නිද්‍රාක්ෂයෙ, ජාගර්ති ජාගෘතඃ ජාග්‍රති, ජාගර්ෂි, ජාගෘයාත්, ජාගර්තු- ජාගෘතාත් ජාගෘතාම් ජාග්‍රතු, ජගෘහි- ජාගෘතාත් ජාගෘතම් ජාගෘත, ජාගරාණි ජාගරාව

---

නිමිත්තෙන් පර වූ; අනිතෙඃ, අන ධාතුහුගේ; නස්‍ය, දන්ත්‍ය නකාරයට; ණත්වම්, මූර්ධන්‍ය ණකාරභාවය; වාච්‍යම්, කියයුතු යි. ප්‍රාණිති යනු ප්‍ර පූර්ව අන ධාතුහුගේ නකාරයට ණකාරය වීමෙන් සිඩ ලට් ප්‍රඃ එකවචන රූපය යි. අන්‍යාත්, අනිතු, ආනීත්- ආනත් යනු විධිලිඞ්- ලොට්- ලඞ් ප්‍රඃ එකවචන යි. ආන ආනතුඃ ආනුඃ යනු ලිට් ප්‍රඃ එක- ද්වි- බහු වචන යි. අන්‍යාත්, අනිතා, අනිෂ්‍යති, ආනිෂ්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එකවචන යි. ආනීත් ආනිෂ්ටාම් ආනිෂුඃ යනු ලුඞ් ප්‍රඃ එක- ද්වි- බහු වචන යි.

*33.* ජක්ෂ භක්ෂහසනයොඃ, "ජක්ෂ" ධාතුව අනුභව ය- සිනාසීම ය යන දෙක්හි වේ. ජක්ෂිති ජක්ෂිතඃ යනු ලට් ප්‍රඃ එක- ද්වි වචන යි. ජක්ෂාදෙඃ, ජක්ෂාදියෙන් පර වූ; අන්තඃ, අන්ත් යන්නට; අත්, අත් යනාදෙශය ද; අනඃ, අන් ප්‍රත්‍යයට; උස්, උස් යනාදෙශය ද වේ.

ජක්ෂ ජාගෘ දරිද්‍රා ශාස් චකාසෘභ්‍යඃ, ජක්ෂ භක්ෂහසනයොඃ- ජාගෘ නිද්‍රාක්ෂයෙ- දරිද්‍රා දුර්ගතෞ- ශාස් අනුශිෂ්ටෞ- චකාසෘ දීප්තෞ යන ධාතූන් කෙරෙන්; පරස්‍ය, පර වූ; අන්තඃ, අන්ත් යන්නට; අත්, අත් යනාදෙශය ද; අනඃ, අන් ප්‍රත්‍යයට; උස්, උස් යනාදෙශය ද; භවති, වේ. ජක්ෂති යනු බහුවචන යි. ජක්ෂිෂි යනු මඃ එකවචන යි. ජක්ෂ්‍යාත්, ජක්ෂිතු, අජක්ෂීත්- අජක්ෂත්, ජජක්ෂ; ජක්ෂ්‍යාත්, ජක්ෂිතා, ජක්ෂිෂ්‍යති, අජක්ෂිෂ්‍යත්, අජක්ෂීත් යනු පිළිවෙළින් විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට්- ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රඃ එක වචන යි.

*34.* ජාගෘ නිද්‍රාක්ෂයෙ, ජාගෘ ධාතුව නිදි වර්ජිත කිරීමෙහි වේ. ජාගර්ති ජාගෘතඃ ජාග්‍රති යනු ලට් ප්‍රඃ එක- ද්වි- බහු වචන යි. ජාගර්ෂි යනු මඃ එකවචන යි. ජාගෘයාත් යනු විධිලිඞ් ප්‍රඃ එකවචන යි.

**ජාගරාම. "ගුණඃ" "දිසොහීයාත්" "ස්‍රොර්විසර්ගඃ" අජාගඃ, අජාගෘතාම්, "උසි ජාගතේඃධාතොර්ගුණො වක්තව්‍යඃ." අජාගරුඃ, අජාගඃ අජාගෘතම් අජාගෘත, අජාගරම් අජාගෘව අජාගෘම, ජජාගාර "ජාගතේඃ කිති ගුණො වක්තව්‍යඃ." ජජාගරතුඃ ජජාගරුඃ, ජජාගරිථ ජජාගරථුඃ ජජාගර, ජජාගාර- ජජාගර ජජාගරිව ජජාගරිම. "විද්-" ඉති පක්ෂෙ ආම්. ජාගරාඤ්චකාර- ජාගරාමාස- ජාගරාම්බභූව, ජාගය්‍යාත්, ජාගරිතා, ජාගරිෂ්‍යති, අජාගරිෂ්‍යත්, "හම්‍යන්තක්ෂණෙ"ති න වෘද්ධිඃ, අජාගරීත්.**

**35. "දරිද්‍රා" දුර්ගතෞ, දරිද්‍රාති.**

---

ජාගර්ති- ජාගෘතාත් ජාගෘතාම් ජාග්‍රතු, ජාගෘහි- ජාගෘතාත් ජාගෘත ජාගෘතම් ජාගෘත, ජාගරාණි ජාගරාව ජාගරාම යනු ලොට් පරස්මෛ පද යි. "ගුණඃ" යන සූත්‍රයෙන් ගුණ වේ. "දිසොහීසාත්" යි දිප්-සිප් ලොප් වේ. "ස්‍රොර්විසර්ගඃ" යි රකාරයට විසර්ගය වේ. අජාගඃ අජාගෘතාම් යනු ලඞ් ප්‍ර: එක- ද්වි වචන යි.

උසි, උස් යනාදෙශය පර කල්හි; ජාගතේඃ ධාතොඃ, ජාගෘ ධාතුවට; ගුණඃ වක්තව්‍යඃ, ගුණය කියයුතු යි. අජාගරුඃ යනු බහුවචන යි. අජාගඃ අජාගෘතම් අජාගෘත, අජාගරම් අජාගෘව අජාගෘම යනු ම: උ: එක- ද්වි- බහු වචන යි. ජජාගාර යනු ලිට් ප්‍ර: එකවචන යි.

කිති, කිත් සංඥය පර කල්හි; ජාගතේඃ, ජාගෘ ධාතුවට; ගුණඃ වක්තව්‍යඃ, ගුණය කියයුතු යි. (මෙහි 'කිත්' නම් "ණාදිඃ කිත්" යි දක්වනලද ප යන්න ඉත් කොට නැති ණාදි ප්‍රත්‍යයෝ ය.) ජජාගරතුඃ ජජාගරුඃ, ජජාගරිථ ජජාගරථුඃ ජජාගර, ජජාගාර- ජජාගර ජජාගරිව ජජාගරිම යනු ඉතිරි ලිට් පරස්මෛපද යි. (උත්තම පුරුෂ එකවචනයෙහි විකල්පයෙන් වෘද්ධි වීමෙන් රූප දෙකක් ලැබේ.) විද් ඉති, විද්- යනාදීන්; පක්ෂෙ, පක්ෂයෙක්හි; ආම්, ආම් ප්‍රත්‍යය වේ. ("විද් දරිද්‍රා කාශ් ජාගෘ උෂ එභ්‍යො වාම් වක්තව්‍යඃ" යි විකල්පයෙන් ආම් ප්‍රත්‍යය වේ.) ජාගරාඤ්චකාර, ජාගරාමාස, ජාගරාම්බභූව යනු ආම් ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ලිට් ප්‍ර: එකවචන යි. ජාගය්‍යාත්, ජාගරිතා, ජාගරිෂ්‍යති, අජාගරිෂ්‍යත් යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. හම්‍යන්තක්ෂණෙති, "හම්‍යන්තක්ෂණ-" යනාදීන්; න වෘද්ධිඃ, වෘද්ධි නො වේ. අජාගරීත් යනු ලුඞ් ප්‍ර: එකවචන යි.

35. දරිද්‍රා දුර්ගතෞ, දරිද්‍රා ධාතුව දිළිඳු බැව්හි වේ. දරිද්‍රාති යනු ලට් ප්‍ර: එකවචන යි.

## * 128. දරිද්‍රාතෙරිදාලොපශ්ච ඞිති.

(දරිද්‍රාතෙඃ 6-1, ඉත් 1-1, ආලොපඃ 1-1. ච-නි. ඞිති 7-1.)

**a. දරිද්‍රාතෙරාකාරස්‍ය ලොපො භවති ඞිති ස්වරෙ පරෙ, ඉකාරශ්ච ඞිති හසෙ පරෙ. දරිද්‍රිතඃ දරිද්‍රති, දරිද්‍රාසි දරිද්‍රිථඃ දරිද්‍රිථ, දරිද්‍රාමි දරිද්‍රිවඃ දරිද්‍රිමඃ, දරිද්‍රියාත්, දරිද්‍රාතු- දරිද්‍රිතාද්වා දරිද්‍රිතාම් දරිද්‍රතු, දරිද්‍රිහි × දරිද්‍රිතාද්වා දරිද්‍රිතම් දරිද්‍රිත, දරිද්‍රාණි දරිද්‍රාව දරිද්‍රාම. අදරිද්‍රාත් අදරිද්‍රිතාම් අදරිද්‍රුඃ, අදරිද්‍රාඃ අදරිද්‍රිතම් අදරිද්‍රිත, අදරිද්‍රාම් අදරිද්‍රිව අදරිද්‍රිම.**

**b. "ණප් වුණ් ස යුචො හිත්වා අන්‍යස්‍ය දරිද්‍රාතෙරනපත්‍යා ලොපො ලුඞි වා." දදරිද්‍රෞ දදරිද්‍රතුඃ දදරිද්‍රුඃ, දදරිද්‍රිථ- දදරිද්‍රථුඃ, පක්ෂෙ:-දරිද්‍රාඤ්චකාර, දරිද්‍රාත්, දරිද්‍රිතා, දරිද්‍රිෂ්‍යති, අදරිද්‍රිෂ්‍යත් අදරිද්‍රීත් අදරිද්‍රිෂ්ටාම් අදරිද්‍රිෂුඃ, පක්ෂෙ:- අදරිද්‍රාසීත් අදරිද්‍රාසිෂ්ටාම් අදරිද්‍රාසිෂුඃ.**

---

128. ඉකාරාදෙශ හා ආකාර ලොප විධි සූත්‍රයි. "යෙවාර්විහසෙ" යි "හසෙ" යනු ද- "වෙඃ ස්වරෙ'පි පිති නොපධායාඃ" යි- 'ස්වරෙ' යනු ද අනුවෘත්ත යි. ඞිති, ඞිත් වූ, හසෙ, ව්‍යඤ්ජනය පර කල්හි; දරිද්‍රාතෙඃ, දරිද්‍රා ධාතුහුගේ (අන්තයට); ඉත්,- ඉකාරාදෙශය ද; ස්වරෙ, ඞිත් වූ ස්වරය පර කල්හි; ආලොපඃ ච,- ආකාරලොපය ද වේ.

a. ඞිති ස්වරෙ පරෙ, ඞිත්සංඥ වූ ස්වරයා පර කල්හි, දරිද්‍රාතෙඃ, දරිද්‍රා ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාරයට; ලොපඃ භවති,- ලොප් වේ. ඞිති හසෙ පරෙ, ඞිත් වූ හසප්‍රත්‍යාහාර වර්ණයා පර කල්හි; ඉකාරඃ ච, (දරිද්‍රා ධාතුහුගේ අන්තයට) ඉකාරාදෙශය ද වේ. ("අපිත්තාදිර්ඞිත්" යි ඞිත් සංඥව ලබන ස්වරාදි විභක්ති පර කල්හි ආකාර ලොපය ද- ව්‍යඤ්ජනාදි විභක්ති පර කල්හි ඉකාරාදෙශය ද මෙයින් නිර්දිෂ්ට යි.)

දරිද්‍රිතඃ දරිද්‍රති යනු ද්වි- බහු වචන යි. දරිද්‍රාසි -පෙ- දරිද්‍රිමඃ යනු ම: උ: එක- ද්වි- බහු වචන යි. දරිද්‍රියාත් යනු විධිලිඞ් ප්‍ර: එක- වචන යි. දරිද්‍රාතු -පෙ- දරිද්‍රාම යනු ලොට් පරස්මෛපද යි. අදරිද්‍රාත් -පෙ- අදරිද්‍රිම යනු ලඞ් පරස්මෛපද යි.

b. අනපි, අනප් විෂයෙහි; ණප්වුණ්සයුචඃ, ණප්-වුණ්-ස-යුච් ප්‍රත්‍යයන්; හිත්වා, හැර; අන්‍යස්‍ය දරිද්‍රාතෙඃ, අනික් දරිද්‍රා ධාතුහුගේ; ආලොපඃ, ආකාරලොපය වේ. ලුඞි, ලුඞ් විෂයෙහි; වා, විකල්පයෙන්

---

* සූත්‍ර පාඨයෙහි "යඞි" යන සූත්‍රයට මුලින් යොදනු.

× දරිද්‍රාහි- මුද්‍රිත.

**36. "ශාස්" අනුශිෂ්ටෞ, ශාස්ති.**

**129. ශාසෙඃ.** (ශාසෙඃ. 6-1.)

**c. ශාසෙතරාකාරස්සෙකාරාදෙශො භවති කිති ඞිති හසෙ ඞෙ ච පරෙ. "ඝසාදෙඃ ෂඃ" ශිෂ්ටඃ ශාස්ති, ශාස්සි ශිෂ්ඨඃ ශිෂ්ඨ, ශාස්මි ශිෂ්වඃ ශිෂ්මඃ, ශිෂ්‍යාත්, ශාසතු- ශිෂ්ටාත්. ශිෂ්ටාම් ශාසතු, "ජහොත්‍යධි ශාධි" ශාධි- ශිෂ්ටාද්වා ශිෂ්ටම් ශිෂ්ට, ශාසානි ශාසාව ශාසාම.**

---

වේ. (ලට්- විධිලිඞ්- ලොට්-ලඞ් යන සතර හැර සෙසු විභක්තිවල දී දරිද්‍රා ධාතුහුගේ ආකාරය නිත්‍යයෙන් ලොප් වේ. එහෙත් ණප්- වුණ්- ස- යුට් යන ප්‍රත්‍යයන් පර කල්හි ලොප් නො වේ. ණප්= දද රිද්‍රෞ, වුණ්= දරිද්‍රායකඃ, ස= දිදරිද්‍රාසති, යුට්= දරිද්‍රාණඃ යි මෙසේ ආකාරය ලොප් නො වීමෙන් සිඩ ය. ලුඞ් විභක්ති විෂයෙහි විකල්ප යෙන් ආකාරලොපය වේ.)

දදරිද්‍රෞ දදරිද්‍රතුඃ දදරිද්‍රුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. දදරිද්‍රිථ දදරිද්‍රථුඃ යනු ම: එක- ද්වි වචන යි. පක්ෂෙ, පක්ෂයෙක්හි; දරිද්‍රාඤ්චකාර යනාදිය වේ. දරිද්‍ර්‍යාත්, දරිද්‍රිතා, දරිද්‍රිෂ්‍යති, අදරි ද්‍රිෂ්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. අදරිද්‍රීත් අදරිද්‍රිෂ්ටාම් අදරිද්‍රිෂුඃ යනු ආකාරලොප පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක-ද්වි- බහුවචන යි. පක්ෂෙ, (ආකාරය ලොප් නුවූ) පක්ෂයෙහි; අදරිද්‍රාසීත් අදරිද්‍රාසිෂ්ටාම් අදරිද්‍රාසිෂුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහුවචන යි.

36. ශාස් අනුශිෂ්ටෞ, "ශාස්" ධාතුව අනුශාසනයෙහි වේ. ශාස්ති යනු ලට් ප්‍ර: එකවචන යි.

129. ඉකාරාදෙශ විධි සූත්‍ර යි. මීට "නාතඃ" යන සූත්‍රයෙන් "ආතඃ" යනු ද- "දෘදෙරිඃ" යන්නෙන් "ඉඃ" යනු ද- "අපිත්තාදිර් ඞිත්" "ණාදිඃ කිත්" යන සූත්‍ර දෙකින් විභක්ති විපරිණාම වශයෙන් 'ඞිති- කිති' යනු ද- "යෙවාර්විහසෙ" යන්නෙන් 'හසෙ' යනු ද- "ලිත්‍යුෂාදෙර්ඞඃ" යි ඩි: වි: වශයෙන් 'ඞෙ' යනු ද අනුවෘත්ත වේ. ඞිති, ඞිත් වූ ද; කිති, කිත් වූ ද; හසෙ, හස ප්‍රත්‍යාහාරය පර කල්හි ද; ඞෙ, ඞප්‍රත්‍යය පර කල්හි ද; ශාසෙඃ, ශාස් ධාතුහුගේ; ආතඃ, ආකාරයට; ඉඃ, ඉකාරාදෙශ වේ.

c. කිති ඞිති හසෙ, කිත්-ඞිත් හස ප්‍රත්‍යාහාරය ද; ඞෙ ච, ඞප්‍රත්‍යය ද; පරෙ, පර කල්හි; ශාසෙතඃ, ශාස් ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාර යට; ඉකාරාදෙශඃ භවති, ඉකාරාදෙශ වේ. (කිත්- ඞිත් සංඥ වූ ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයන් හා ඞප්‍රත්‍යය පර කල්හි ශාස් ධාතුහුගේ ආකා රය ඉකාරය වන බව මෙයින් දක්වේ. මේ සූත්‍රය "ශාසෙරිඃ" යි

## 130. දිපි. (දිප 7-1.)

d. **දිපි පරෙ සස්‍ය තකාරො භවති.**

## 131. සිපි වා. (සිප 7-1. වා- නි.)

e. **සිපි පරෙ සස්‍ය තකාරො වා භවති. අශාත් අශිෂ්ටාම් අශාසුඃ, අශාත්- අශාඃ අශිෂ්ටම් අශිෂ්ට, අශාසම් අශිෂ්ව අශිෂ්ම, ශශාස ශශාසතුඃ ශශාසුඃ, ශිෂ්‍යාත්, ශාසිතා, ශාසිෂ්‍යති, අශාසිෂ්‍යත්. "ලිත්පුෂාදෙර්ඩඃ" "ශාසෙඃ" අශිෂත්.**

---

පොත්හි පෙණෙන නමුත් "ඉඃ" යන්න අනුවෘත්ත කරගත හැකි බැවින් සූත්‍රපාඨයෙහි එන "ශාසෙඃ" යන්න ම ශුද්ධපාඨය විය යුතු යි.)

"සසාදෙඃ ෂඃ"යි අන්ත්‍ය සකාරයට ෂකාරය වේ. ශිෂ්ටඃ ශාසති යනු වි- බහුවචන යි. ශාසසි ශිෂ්ඨඃ ශිෂ්ඨ යනු ම: එක-වි- බහුවචන යි. ශාසමි ශිෂ්වඃ ශිෂ්මඃ යනු උ: එක- වි- බහු වචන යි. ශිෂ්‍යාත් යනු විධිලිඞ් ප්‍ර: එකවචන යි. ශාසතු- ශිෂ්ටාත් ශිෂ්ටාම් ශාසතු යනු ලොට් ප්‍ර: එක- වි- බහුවචන යි. "ජහෙ‍්‍යාධිශාධි" යි ශාධි යනාදෙශය වේ. ශාධි- ශිෂ්ටාත් ශිෂ්ටම් ශිෂ්ට, ශාසානි ශාසාව ශාසාම යනු ම: උ: එක- වි- බහුවචන යි.

130. තකාරාදෙශ විධි සූත්‍ර යි. "සසෙතාතපි" යි "සඃ"- "තඃ" යනු අනුවෘත්ත යි. දිපි, දිප් පර කල්හි; සඃ, සකාරයට; තඃ, තකාරාදෙශ වේ.

c. දිපි පරෙ, දිප් ප්‍රත්‍යය පර කල්හි; සස්‍ය, සකාරයට; තකාරඃ භවති, තකාරය වේ.

131. තකාරාදෙශ විධි සූත්‍ර යි. "සසෙතාතපි" යි "සඃ"- "තඃ" යනු අනුවෘත්ත යි. සිපි, සිප් පර කල්හි; සඃ, සකාරයට; වා, විකල්පයෙන්; තඃ, තකාරය වේ.

e. සිපි පරෙ, සිප් ප්‍රත්‍යය පර කල්හි; සස්‍ය, සකාරයට; වා, විකල්පයෙන්; තකාරඃ භවති, තකාරය වේ. (මෙහි "දිපි" යන්නෙන් නිත්‍යයෙන් ද "සිපි වා" යන්නෙන් විකල්පයෙන් ද සකාරයට තකාරාදෙශය විහිත ය.)

අශාත් අශිෂ්ටාම් අශාසුඃ, අශාත්- අශාඃ අශිෂ්ටම් අශිෂ්ට, අශාසම් අශිෂ්ව අශිෂ්ම යනු ලඞ් පරස්මෛපද යි. ශශාස ශශාසතුඃ ශශාසුඃ යනු ලිට් ප්‍ර: එක- වි- බහුවචන යි. ශිෂ්‍යාත්, ශාසිතා, ශාසිෂ්‍යති, අශාසිෂ්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. "ලිත්පුෂාදෙර්ඩඃ" යි ඩප්‍රත්‍යය වේ. "ශාසෙඃ" යි ඉකාරය වේ. අශිෂත් යනු ලුඞ් ප්‍ර: එකවචන යි.

**37.** "චකාසෘ" දීප්තෞ, සෘ ඉත්, චකාසති චකාසතඃ චකාසති, චකාසත්‍යාත්, චකාසතු- චකාසතාත් චකාසතාම් චකාසතු, "ධිසාදිභේඃ" ධෞ සලොපො වා වාච්‍යඃ. චකාධි- චකාසතාත් චකාසතම් චකාසත, අචකාත් අචකාසතාම් අචකාසුඃ, අචකාත්- අචකාඃ. "කාසාදිප්‍රත්‍යයාදම්-" චකාසාංචකාර, චකාසත්‍යාත්, චකාසිතා, චකාසිෂ්‍යති, අචකාසිෂ්‍යත්, අචකාසීත් අචකාසිෂ්ටාම් අචකාසිෂුඃ.

ඉත්‍යදාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා.

---

a. අථාත්මනෙපදි ප්‍රක්‍රියා.

**1.** "චක්ෂිඞ්" ව්‍යක්තායාං වාචි. ඉකාර උච්චාරණාර්ථඃ, ඞකාර ආත්මනෙපදාර්ථඃ.

---

37. චකාසෘ දීප්තෞ, රතුබඹ "චකාස්" ධාතුව බැබලීමෙහි වේ. සෘ ඉත්, සෘයන්න ඉත් ය. චකාසති චකාසතඃ චකාසති යනු ලට් ප්‍ර: එක- ද්වි- බහුවචන යි. චකාසත්‍යාත් යනු විධිලිඞ් ප්‍ර: එකවචන යි. චකාසතු · චකාසතාත් චකාසතාම් චකාසතු යනු ලොට් ප්‍ර: එක- ද්වි- බහුවචන යි. "ධිසාදිභේඃ" යි කියන්නට ධි ආදෙශ වේ. ධෞ, ධි ආදෙශය පර කල්හි; සලොපඃ වා වාච්‍යඃ, සකාරලොපය කියයුතු යි. චකාධි- චකාසතාත් චකාසතම් චකාසත යනු ම: එක- ද්වි- බහු වචන යි. අචකාත් අචකාසතාම් අචකාසුඃ යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අචකාත්- අචකාඃ යනු ම: එකවචන යි.

"කාසාදිප්‍රත්‍යයාදම් කෘස්භූපරඃ" යි ආම් ප්‍රත්‍යය වේ. චකාසාංචකාර (චකාසාමාස- චකාසාම්බභූව) යනු ලිට් ප්‍ර: එකවචන යි. චකාසත්‍යාත්, චකාසිතා, චකාසිෂ්‍යති, අචකාසිෂ්‍යත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එකවචන යි. අචකාසීත් අචකාසිෂ්ටාම් අචකාසිෂුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

අදාදිෂු, අදාදි විෂයෙහි; පරස්මෛපදි ප්‍රක්‍රියා, පරස්මෛපදි ධාතූන්ගේ පදසාධන ක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

---

a. අථ, ඉක්බිති හෙවත් පරස්මෛපදි ප්‍රක්‍රියාවට අනතුරු ව; ආත්මනෙපදි ප්‍රක්‍රියා, (අදාදිගණික) ආත්මනෙපදි ධාතූන්ගේ පද සාධන ක්‍රියාව දක්වනු ලැබේ.

1. චක්ෂිඞ් ව්‍යක්තායාං වාචි, "චක්ෂ්" ධාතුව ව්‍යක්ත වචනයෙහි වේ. ඉකාරඃ, ඉකාරය; උච්චාරණාර්ථඃ, උසුරුවීම ප්‍රයෝජන කොට ඇත්තේ ය; ඞකාරඃ, ඞකාරය; ආත්මනෙපදාර්ථඃ, ආත්මනෙපදය ප්‍රයෝජන කොට ඇත්තේ ය. ("ආදනුදාත්තඞිතඃ" යි කී හෙයින් ඞකාර ඉත් කොට ඇති ධාතුහු ආත්මනෙපදි වෙති.)

**b. “සෙකාරාද්‍යෝශ්ච” ටුත්වම්. චෂ්ටෙ, චක්‍ෂාතෙ. “ආතො‘නෙතා’දනතඃ” චක්‍ෂතෙ, “ෂඪොඃ කඃ සෙ.” චක්‍ෂෙ චක්‍ෂාථෙ චඩ්ඪ්වෙ, චක්‍ෂෙ චක්‍ෂ්වහෙ චක්‍ෂ්මහෙ. චක්‍ෂීත, චෂ්ටාම්, අචෂ්ට අචක්‍ෂාතාම් අචක්‍ෂත.**

**c. “චක්‍ෂිඬො‘නපි ඛ්‍යාඤ්ක්ශාඤෞ ණාදෞ වා වක්තව්‍යෞ.” චඛ්‍යෞ චඛ්‍යතුඃ චඛ්‍යුඃ, චක්ශෞ චක්ශතුඃ චක්ශුඃ, චචක්‍ෂෙ, ඛ්‍යායාත්- ඛ්‍යෙයාත්, ක්ශායාත්- ක්ශෙයාත්, ඛ්‍යාසීෂ්ට- ක්ශාසීෂ්ට, ඛ්‍යාතා- ක්ශාතා, ඛ්‍යාස්‍යති- ඛ්‍යාස්‍යතෙ,**

---

b. “සෙකාරාද්‍යෝශ්ච” සි සංයොගාදි කකාරයට ලොප් වේ. ටුත්වම්, තවර්ගීයට ටවර්ගීභාවය වේ. චෂ්ටෙ චක්‍ෂාතෙ යනු ලට් ප්‍රඃ එක- ද්වි වචන සි. “ආතො‘නෙතා’දනතඃ” සි ‘අන්ත්’ හට ‘අත්’ ආදෙශ වේ. චක්‍ෂතෙ යනු බහුවචන සි. “ෂඪොඃ කඃ සෙ” සි ෂකාරයට කකාරය වේ. චක්‍ෂෙ චක්‍ෂාථෙ චඩ්ඪ්වෙ, චක්‍ෂෙ චක්‍ෂ්වහෙ චක්‍ෂ්මහෙ යනු මඃ උඃ එක- ද්වි- බහු වචන සි. චක්‍ෂීත, චෂ්ටාම්, යනු විධි ලිඞ්- ලොට් ප්‍රඃ එකවචන සි. අචෂ්ට අචක්‍ෂාතාම් අචක්‍ෂත යනු ලඞ් ප්‍රඃ එක- ද්වි- බහු වචන සි.

(චක්‍ෂෙ=“චක්‍ෂ් + සෙ” සි සිටි කල්හි “සෙකාරාද්‍යෝශ්ච” සි කකාරයට ලොප් ව “ෂඪොඃ කඃ සෙ” සි ෂකාරයට කකාරය ව “කිලාත් ෂඃ සඃ කෘතස්‍ය” සි සකාරයට ෂකාරය ව සිඬ සි.

චඩ්ඪ්වෙ= “චක්‍ෂ් + ධ්වෙ” සි සිටි කල්හි කකාර ලොපය ව “ෂොඪඃ” සි ෂකාරයට ඩකාරය ව ටුත්වය වීමෙන් සිඬ සි.)

c. අනපි, අනඞ් විෂයෙහි; චක්‍ෂිඞඃ, චක්‍ෂිඞ් ධාතුහට; ඛ්‍යාඤ් ක්ශාඤෞ, ඛ්‍යාඤ්- ක්ශාඤ් යන ආදෙශ දෙක; වක්තව්‍යෞ, කිය යුතු සි. ණාදෞ, ණබාදිය පර කල්හි; වා, විකල්පයෙන් කිය යුතු සි. (ලිට් හැර ඉතිරි ආර්ධධාතුක විභක්ති විෂයෙහි චක්‍ෂිඞ් ධාතුහට නිත්‍යයෙන් ඛ්‍යාඤ්- ක්ශාඤ් යන ආදෙශ දෙදෙන වෙති· ලිඞ් විෂයෙහි විකල්පයෙන් වෙත්. මෙහි ඤකාරය ඉත් ය. ඒ උභයපදි බව හඟවයි. “ඤිත් ස්වරිතෙත උභෙ” සි කී හෙයිනි. මෙසේ අනඞ් විෂයෙහි මේ ආදෙශවය වීමෙන් පරස්මෛපද ආත්මනෙපද දෙක්හි ම වරනැගේ.) චඛ්‍යෞ චඛ්‍යතුඃ චඛ්‍යුඃ- චක්ශෞ චක්ශතුඃ චක්ශුඃ යනු පූර්වෝක්ත ආදෙශවය වූ පක්‍ෂයෙහි ලිට් පරස්මෛපද ප්‍රඃ එක- ද්වි- බහු වචන සි. (චඛ්‍යෙ චඛ්‍යාතෙ චඛ්‍යිරෙ- චක්ශෙ චක්ශාතෙ චක්ශිරෙ යනාදීන් ආත්මනෙපදයෙහි ද වරනැගේ.) චචක්‍ෂෙ යනු ආදෙශ නු වූ පක්‍ෂයෙහි ප්‍රඃ

ක්ශාස්‍යති- ක්ශාස්‍යතෙ, අඛ්‍යාස්‍යත්- අඛ්‍යාස්‍යත, අක්ශාස්‍යත්- අක්ශාස්‍යත. පුෂාදිත්වාද් ඞඃ. අඛ්‍යත්.

a. "අස්‍යති වක්ති ඛ්‍යාතිනාමාත්මනෙපදෙ සෙර්ඞො වාච්‍යඃ." අඛ්‍යත, අක්ශාසිත්- අක්ශාස්ත. *

2. "ඊඩ" ස්තුතෞ. "ඣසෙ චපා ඣසානාම්." ඊට්ටෙ ඊඩාතෙ ඊඩතෙ.

b. ඊඩීශොඃ සධ්වයොරිඩ් වක්තව්‍යඃ. ඊඩිෂෙ ඊඩාථෙ ඊඩිධ්වෙ, ඊඩෙ ඊඩිවහෙ ඊඩිමහෙ, ඊඩිත, ඊට්ටාම්, ඓට්ට.

---

එකවචන සි. (චචක්ෂෙ චචක්ෂාතෙ චචක්ෂිරෙ යනාදීන් ආත්මනෙපදයෙහි පමණක් වරනැගෙ සි.

චඛ්‍යෞ= චක්ෂ් ධාතුවට ඛ්‍යාඤ් ආදෙශ ව "ඛ්‍යා + ණප්" සි සිටි කල්හි "ද්විශ්ච" සි ඛ්‍යාහට ද්විත්ව ව "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" සි ශෙෂ ව "කුහොශ්චුඃ" සි ඡකාරය ව "ඣපානාං ජබචපාඃ" සි චකාරය ව "ආතො ණප් ඖ" සි ණප්හට ඖ ආදෙශ ව "ඕති වොඃ" සි විසංන්ධි ලොපය ව පැමිණීමෙන් සිද්ධ සි. චඛ්‍යතුඃ යනාදිය "ආතො'නපි" සි ආකාර ලොපයෙන් මෙසේ ම සිද්ධ සි.)

ඛ්‍යායාත්- ඛ්‍යෙයාත්, ක්ශායාත්- ක්ශෙයාත් යනු ආශිර් ලිඞ් පරස්මෛපද ප්‍ර: එකවචන සි. (සංයොගාදි ආකාරාන්ත ධාතූන්ගේ ආකාරයට කිත් වූ යාත් ආදිය පර කල්හි විකල්පයෙන් එකාරය වන බැවින් රූපද්වය බැගින් ලැබේ.) ඛ්‍යාසීෂ්ට- ක්ශාසීෂ්ට යනු ආත්මනෙපද ප්‍ර: එකවචන සි. ඛ්‍යාතා- ක්ශාතා යනු ලුට් ප: ආ: ප්‍ර: එකවචන සි. ඛ්‍යාස්‍යති- ඛ්‍යාස්‍යතෙ, ක්ශාස්‍යති- ක්ශාස්‍යතෙ යනු ලෘට් පරස්මෛපද- ආත්මනෙපද ප්‍ර: එකවචන සි. අඛ්‍යාස්‍යත්- අඛ්‍යාස්‍යත, අක්ශාස්‍යත් අක්ශාස්‍යත යනු ලෘඞ් ප: ආ: ප්‍ර: එකවචන සි. පුෂාදිත්වාත්, පුෂාදිය බැවින්; ඞඃ, "ලිත්පුෂාදෙර් ඞඃ" සි ඞප්‍රත්‍යය වේ. අඛ්‍යත් යනු ලුඞ් ප: ප්‍ර: එකවචන සි.

a. අස්‍යති වක්ති ඛ්‍යාතීනාං, අසු ක්ෂෙපණෙ- වච් පරිභාෂණෙ- ඛ්‍යා ප්‍රකථනෙ යන ධාතූන් පිළිබඳ; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි; සෙඃ, සිප්‍රත්‍යය ස්ථානයෙහි; ඞඃ වාච්‍යඃ, ඞප්‍රත්‍යය කියයුතු සි. (පූර්වෝක්ත සූත්‍රයෙන් ඞප්‍රත්‍යය වනුයේ පරස්මෛපදයෙහි ය. එබැවින් මේ කීහ. "අස්‍යති වක්ති ඛ්‍යාතිභ්‍යො'ඞ්" යනු පාණිනීය සූත්‍ර සි.) අඛ්‍යත යනු ආ: ප්‍ර: එකවචන සි. අක්ශාසිත්- අක්ශාස්ත යනු ක්ශාඤ් ආදෙශ පක්ෂයෙහි ප: ආ: ප්‍ර: එකවචන සි.

2. ඊඩ ස්තුතෞ, "ඊඩ" ධාතුව ස්තුති කිරීමෙහි වේ. "ඣසෙ චපා ඣසානාම්" සි ඩකාරයට ටකාරය වේ; (ට්ටුත්වය ද වේ.) ඊට්ටෙ ඊඩාතෙ ඊඩතෙ යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන සි.

---

* අක්ශාස්තාම්- ඇතැම් පොත්හි.

**ලඞො ධ්වස්‍ය නෙට්. ඓඩ්ඪ්වම්, ඊඩාඤ්චක්‍රෙ, ඊඩිෂීෂ්ට, ඊඩිතා, ඊඩිෂ්‍යතෙ, ඓඩිෂ්‍යත, ඓඩිෂ්ට.**

**3. "ඊශ්" ඓශ්වර්‍ය්‍යෙ. ඊෂ්ටෙ, ඊශිෂෙ, ඊශීත, ඊෂ්ටාම්, ඓෂ්ට, ඊශාඤ්චක්‍රෙ, ඊශිෂීෂ්ට, ඊශිතා, ඊශිෂ්‍යතෙ, ඓශිෂ්‍යත, ඓශිෂ්ට.**

**4. "ආස්" උපවෙශනෙ. ආස්තෙ, ආසීත, ආස්තාම්, ආස්ත, කාසාදිත්වාදාම්. ආසාඤ්චක්‍රෙ, ආසිෂීෂ්ට, ආසිතා, ආසිෂ්‍යතෙ, ආසිෂ්‍යත, ආසිෂ්ට.**

**5. "වස" ආච්ඡාදනෙ. වස්තෙ, වසීත, අවසිෂ්ට.**

**6. "ෂූඞ්" ප්‍රාණි ගර්භ විමොචනෙ. "ආදෙඃ ෂ්ණඃ ස්නඃ" සූතෙ, සුවීත, සූතාම්.**

---

b. ඊඩීශොඃ, ඊඩ ස්තුතෞ– ඊශ් ඓශ්වර්‍යෙයි යන ධාතු දෙක සම්බන්ධි වූ; සධ්වයොඃ, සකාර– ධ්වශබ්ද දෙක පිළිබඳ ව; ඉට් වක්තව්‍යඃ, ඉඩාගමය කියයුතු යි. ඊඩිෂෙ ඊඩාථෙ ඊඩිධ්වෙ, ඊඩෙ ඊඩ්වහෙ ඊඩ්මහෙ යනු ම: උ: එක– ද්වි– බහු වචන යි. ඊඩීත, ඊට්ටාම්, ඓට්ට යනු විධිලිඞ්– ලොට්– ලඞ් ප්‍ර: එකවචන යි.

ලඞඃ, ලඞ් ලකාරයාගේ; ධ්වස්‍ය, ධ්ව යන්න සම්බන්ධ ව; න ඉට්, ඉඩාගම නො වේ. ("ඊඩීශොඃ සධ්වයොරිඩ් වක්තව්‍යඃ" යි දක්වනලද ඉඩාගමය ලඞ් විභක්තියෙහි ධ්වයන්න සම්බන්ධ ව නො වන බව මෙයින් සූචිත යි.) ඓඩ්ඪ්වම් යනු ම: බහු වචන යි. ඊඩාඤ්චක්‍රෙ, ඊඩිෂීෂ්ට, ඊඩිතා, ඊඩිෂ්‍යතෙ, ඓඩිෂ්‍යත, ඓඩිෂ්ට යනු ලිට්– ආශීර් ලිඞ්– ලුට්– ලෘට්– ලෘඞ්– ලුඞ් ප්‍ර: එකවචන යි.

3. ඊශ් ඓශ්වර්‍යෙයි, "ඊශ්" ධාතුව ඉසුරු බැව්හි වේ. ඊෂ්ටෙ යනු ලට් ප්‍ර: එකවචන යි. ("ඊශ් + තෙ" යි සිටි කල්හි "ඡශෂරාජාදෙඃ ෂඃ" යි ශ හට ෂාදෙශ ව ටුත්වයෙන් සිද්ධ යි.) ඊශිෂෙ යනු ම: එක වචන යි. (ඉඩාගම වූ බව දැක්වීමට මෙය කීහ.) ඊශීත, ඊෂ්ටාම්, ඓෂ්ට, ඊශාඤ්චක්‍රෙ, ඊශිෂීෂ්ට, ඊශිතා, ඊශිෂ්‍යතෙ, ඓශිෂ්‍යත, ඓශිෂ්ට යනු පිළිවෙළින් විධිලිඞ්– ලොට්– ලඞ්– ආශීර් ලිඞ්– ලුට්– ලෘට්– ලෘඞ්– ලුඞ් ප්‍ර: එකවචන යි.

4. ආස් උපවෙශනෙ, "ආස්" ධාතුව හිඳීමෙහි වේ. ආස්තෙ –පෙ– ආස්ත යනු ලට් –පෙ– ලඞ් ප්‍ර: එකවචන යි. කාසාදිත්වාත්, කාසාදිය බැවින්; ආම්, ආම් ප්‍රත්‍යය වේ. ආසාඤ්චක්‍රෙ –පෙ– ආසිෂ්ට යනු ලිට් –පෙ– ලුඞ් ප්‍රථම පුරුෂ එකවචන යි.

a. **සුතෙඃ පිති ගුණාභාවො වාච්‍යඃ. සුවෙ සුවාවයෙහ සුවාමයෙහ, අසුත, සුසුවෙ, "සවරති-" ඉති වෙට්. සවිෂිෂට- සොෂිෂට, සවිතා- සොතා, සවිෂ්‍යතෙ- සොෂ්‍යතෙ, අසවිෂ්‍යත- අසොෂ්‍යත, අසවිෂට- අසොෂට.**

7. **"ශීඞ්" සවප්නෙ.**

132. **ශීඞඃ සාර්වත්‍රං.** (ශීඞඃ 6-1. සර්වත්‍ර 7-1.)

b. **ශීඞඃ සර්වත්‍ර ගුණො භවත්‍යපි විෂයෙ. ශෙතෙ ශයාතෙ.**

---

5. වස ආච්ඡාදනෙ, "වස" ධාතුව වැසීමෙහි (=හැඳීමෙහි) වේ. වස්තෙ, වසීත, අවසිෂ්ට යනු ලට්– විධි ලිඞ්– ලුඞ් ප්‍ර: එක වචන යි. (ඉතිරි ලොට්– ලඞ්– ලිට්– ආශීර් ලිඞ්– ලුට්– ලෘට්– ලෘඞ් ලකාර ප්‍ර: එක වචනයන්හි පිළිවෙළින් වස්තාම්, අවස්ත, වවසෙ, වසිෂීෂ්ට, වසිතා, වසිෂ්‍යතෙ, අවසිෂ්‍යත යනු වේ.)

6. ෂූඞ් ප්‍රාණිගර්භවිමොචනෙ, ඞකාරානුබන්ධ "ෂූ" ධාතුව ප්‍රාණියකු ගැබින් මිදීමෙහි (=වැදීමෙහි) වේ. "ආදෙඃ ෂණඃ සනඃ" යි ෂකාරයට සකාරය වේ. සූතෙ, සුවීත, සූතාම් යනු ලට්– විධි ලිඞ්– ලොට් ප්‍ර: එකවචන යි. ("නු ධාතොඃ" යි උව් ආදෙශයෙන් සුවාතෙ යනාදිය සිඬ යි.)

a. පිති, පිත් පර කල්හි; සූතෙඃ, ෂූඞ් ධාතුහට; ගුණාභාවඃ, ගුණ නො වීම; වාච්‍යඃ, කියයුතු යි. (එහෙයින් "නුධාතොඃ" යි උව් ආදෙශය වේ.) සුෂුවෙ සුවාවහෙ සුවාමහෙ යනු ලොට් උ: එක– ද්වි– බහු වචන යි. අසූත, සුෂුවෙ යනු ලඞ්– ලිට් ප්‍ර: එකවචන යි. "සවරති" ඉති, සවරති සූයති– යනාදීන්; වෙට්, විකල්පයෙන් ඉඩාගම වේ. සවිෂීෂ්ට– සොෂීෂ්ට –පෙ– අසවිෂ්ට– අසොෂ්ට යනු ආශීර් ලිඞ් –පෙ– ලුඞ් ප්‍රථම පුරුෂ එකවචන යි. (ඉඩාගමය විකල්ප හෙයින් රූප දෙක බැගින් ලැබේ.)

7. ශීඞ් සවප්නෙ, ඞානුබන්ධ "ශී" ධාතුව නිදීමෙහි වේ.

132. ගුණ විධි සූත්‍ර යි. මීට "ගුණඃ" යන සූත්‍රය ද– "ද්වොඃ සවරෙ'පි පිති නොපධායාඃ" යි 'අපි' යනු ද අනුවෘත්ත යි. අපි, අපි විෂයෙහි; සර්වත්‍ර, හැම තැන්හි (=සියලු ප්‍රත්‍යයන් පර කල්හි); ගුණඃ, ගුණ වේ.

## 133. වෙතෙතරතො රුට්.

(වෙතෙතඃ 5-11. අතඃ 6-1. රුට් 1-1.)

**c. ශීඩඃ පරස්‍යාදිත්‍යෙතස්‍ය රුඩාගමො භවති, වෙතෙතා වා. ශෙරතෙ, ශයිත, ශෙතාම් ශයාතාම් ශෙරතාම්, අශෙත අශයාතාම් අශෙරත, ශිශෙ ශිශ්‍යාතෙ, ශයිෂීෂ්ට, ශයිතා, ශයිෂ්‍යතෙ, අශයිෂ්‍යත, අශයිෂ්ට.**

**8. "ඉඞ්" අධ්‍යයනෙ. අධි පූර්වඃ. අධීතෙ අධියාතෙ අධීයතෙ, අධියීත, අධීතාම් අධියාතාම් අධීයතාම්, අධ්‍යෛත ඉයාදෙශෙ ස්‍යතෙ පශ්චාදඩාගමමයම්. අධ්‍යෛයාතාම් අධ්‍යෛයත.**

---

b. අපි විෂයෙ, අපි විෂයෙහි; සර්වත්‍ර, හැම තැන්හි; හෙවත් සියලු ප්‍රත්‍යයන් පර කල්හි; ශීඩඃ, ශීඞ් ධාතුහට; ගුණඃ භවති, ගුණ වේ. (ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් ලකාරයන්හි ශීඞ් ධාතුවට ගුණ වන බව මෙයින් සූචිත සි. මෙහි "සර්වත්‍ර" යන්නෙන් පිත් පර කල්හි පමණක් නො ව ඒ සිවු ලකාරයෙහි සියලු ම ප්‍රත්‍යයන් පර කල්හි ගුණ වන බව හඟව සි.

මේ සූත්‍රය සාරස්වත පොත්වල නො දක්නා ලැබේ. සූත්‍ර වෘත්තිය පමණක් යොදා තිබේ. එහෙත් මෙය සූත්‍රපාඨයෙහි එන බැවිනුත් මේ ස්ථානයෙහි අවශ්‍යයෙන් යෙදිය යුතු හෙයිනුත් සූත්‍ර පාඨයෙන් ගෙණ මෙහි යොදන ලදි.) ශෙතෙ ශයාතෙ යනු ලට් ප්‍රථ- එක- වි වචන සි.

133. රුඩාගම විධි සූත්‍ර සි. "ශීඩඃ සර්වත්‍ර" සි 'ශීඩඃ' යනු ද- "ජසිං හෙෂ" සි 'වා' යනු ද අනුවෘත්ත සි. ශීඩඃ, ශීඞ් ධාතුහු කෙරෙන් පර වූ; අතඃ, අත් ආදෙශය සම්බන්ධ ව; රුට්, රුඩාගම වේ. වෙතෙතඃ, විද් ධාතුහු කෙරෙන් (පර වූ අත් යන්න සම්බන්ධ ව); වා, විකල්පයෙන් (රුඩාගම) වේ.

c. ශීඩඃ පරස්‍ය, ශීඞ් ස්වප්නෙ යන ධාතුහු කෙරෙන් පර වූ; අත් ඉති එතස්‍ය, අත් යන මොහු සම්බන්ධ ව; රුඩාගමඃ භවති, රුට් ආගම වේ. වෙතෙතඃ, විද් ධාතුහු කෙරෙන් (පර වූ අත් යන්න සම්බන්ධ ව;) වා, විකල්පයෙන් වේ.

(ශීඞ් ධාතුහු කෙරෙන් පර වූ "ආතොනෙතාදන්තඃ" සි ආදෙශ වූ අත් යන්න සම්බන්ධ ව නිත්‍යයෙන් ද- විද් ධාතුහු කෙරෙන් විකල්පයෙන් ද රුට් ආගම වන බව මෙයින් දැක් වේ. ශෙරතෙ- සංවිද්‍රතෙ- සංවිදතෙ යනාදිය නිදර්ශන සි.)

a. "ඉඞො ණාදෞ ගා වක්‍යතවායඃ." අධිජගෙ, අධ්‍යෙෂ්ඨ, අධ්‍යෙෂ්ටා, අධ්‍යෙෂ්ඨතෙ.

b. "ඉඞො වා ගී සෞ ලෘඞි ච, තත්පරස්‍ය ප්‍රත්‍යයස්‍ය ඞිත්ත්වං වාච්‍ය ම්." ඞිත්ත්වාද් ගුණො න. අධ්‍යගීෂ්‍යත අධ්‍යගීෂ්‍යෙතාම් අධ්‍යගීෂ්‍යන්ත, අධ්‍යෛෂ්‍යත. අධ්‍යගීෂ්ට අධ්‍යගීෂාතාම් අධ්‍යගීෂත, අධ්‍යෛෂ්ට අධ්‍යෛෂාතාම් අධ්‍යෛෂත.

ඉත්‍යදාදිගණාත්මනෙපදි ප්‍රක්‍රියා.

---

(මේ සූත්‍රය සාරස්වතයන්හි "ශීඞො'නොරුට්"යි මෙ තැන්හි පෙණේ. එහෙත් අග "ආත්මනෙපදව්‍යවස්ථා" කොටසෙහි "වෙතෙත රතො රුට්" යි යොදා තිබේ. සිද්ධාන්තචන්ද්‍රිකා සූත්‍රය "ශීඞො'තො රුට්" යනු යි. එහෙයින් මෙහි ද එසේ යෙදිය යි සිතිය හැක. සූත්‍රපාඨයෙහි "ශීඞඃ සර්වත්‍ර" යන සූත්‍රයට අනතුරුව ම මේ සූත්‍රය පෙණේ. එහෙයින් "ශීඞඃ" යි මීට අනුවෘත්ත වේ. එවිට "වෙතෙත රතො රුට්" යනු ම ශුද්ධපාඨය විය යුතු යි. ඒ අනුව සූත්‍රයෙහි සම්පූර්ණ අදහස පැහැදිලි වන සේ වෘත්තියට ද- "වෙතෙතාඑා" යි එකතු කරණ ලදි.)

ශෙරතෙ යනු ලට් ප්‍ර: බහුවචන යි. ශයීත යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. ශෙතාම් ශයාතාම් ශෙරතාම් යනු ලොට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අශෙත අශයාතාම් අශෙරත යනු ලඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. ශිශ්‍යෙ ශිශ්‍යාතෙ යනු ලිට් ප්‍ර: එක- ද්වි වචන යි. ශයිෂීෂ්ට -පෙ- අශයිෂ්ට යනු ආශීර්ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එකවචන යි.

8. ඉඞ් අධ්‍යයනෙ, ඞානුබන්ධ "ඉ" ධාතුව හැදෑරීමෙහි වේ. අධි පූර්වඃ, අධි උපසර්ගය පෙරටු කොට ඇත්තේ වේ. (අධි පූර්වක ව ම යෙදේ. හුදු 'ඉඞ්' ධාතුව නො යෙදේ.) අධීතෙ අධීයාතෙ අධියතෙ යනු ලට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අධීයීත යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. අධීතාම් අධියාතාම් අධීයතාම් යනු ලොට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අධ්‍යෛත යනු ලඞ් ප්‍ර: එකවචන යි. ඉයාදෙශෙ කෘතෙ, "න්‍ව්ධාතොඃ" යි ඉය් ආදෙශය කළ කල්හි; පශ්චාත්, පසු ව; අඩාගමවශම්, අඩාගම දෙකක් වේ. ("දිබාදාවට්" යි එකක් ද- "ස්වරාදෙඃ" යි එකක් දැයි මෙසේ අඩාගම දෙකකි.) අධ්‍යෛයාතාම් අධ්‍යෛයත යනු ද්වි වචන- බහු වචන යි. (අඩාගමවය වූ පසු "අ ඉ එ." "එ ඓ ඓ." යන සූත්‍ර දෙකින් සන්ධි වීමෙන් අධ්‍යෛත යනාදිය සිද්ධ යි.)

a. අථොභයපදි ප්‍රක්‍රියා ප්‍රදර්ශ්‍යතෙ:-

**1. "මිෂ" අප්‍රීතෞ, අකාර උභයපදෘජීඃ, මෙෂති- මිෂෙට, මිෂ්‍යාත්- මිෂිත, මෙෂ්ටු- මිෂටාත්- මිෂටාම්, අමෙට්- අමෙඩ් අමිෂටාම් අමිෂුඃ- අමිෂන්, අමිෂට, දිමෙෂ- දිමිෂෙ, මිෂ්‍යාත්- මික්ෂීෂ්ට, මෙෂ්ටා- මෙෂ්ටා, මෙක්ෂ්‍යති- මෙක්ෂ්‍යතෙ, අද්වෙක්ෂ්‍යත්- අද්වෙක්ෂ්‍යත, "හශෂාන්තාත් සක්." අද්වික්ෂත්- අද්වික්ෂත.**

---

a. ණාදෞ, ණබාදිය පර කල්හි; ඉඩඃ, ඉඞ් ධාතුවට; ගා වකානව්‍යඃ, ගා ආදෙශය කියයුතු සි. අධිජගෙ යනු ලිට් ප්‍රඃ එකවචන සි. (ගා ආදෙශය වූ පසු ණිත්වාදිය වීමෙන් අධිජගෙ අධිජගාතෙ අධිජගිරෙ යනාදීන් ලිට් ආත්මනෙපදයෙහි වරනැගේ.) අධ්‍යෙෂීෂ්ට, අධ්‍යෙතා, අධ්‍යෙෂ්‍යතෙ යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට් ප්‍රඃ එකවචන සි.

b. සෞ, සිප්‍රත්‍යය පර කල්හි ද; ලෘඞි ච, ලෘඞ් විෂයෙහි ද; ඉඩඃ, ඉඞ් ධාතුහට; වා, විකල්පයෙන්; ගී, ගී යනාදෙශ වේ. තතපරස්‍ය, එයින් පර වූ; ප්‍රත්‍යයස්‍ය, ප්‍රත්‍යයාගේ; ඞිත්ත්වං වාච්‍යම්, ඞිත් බව කියයුතු සි. (ලෘඞ්- ලුඞ් ලකාර වයෙහි ඉඞ් ධාතුවට විකල්පයෙන් 'ගී' ආදෙශ වන බවත්, ඉන් පර වූ ප්‍රත්‍යයන් ඞිත් සංඥ වන බවත් මෙයින් දැක් වේ.) ඞිත්ත්වාත්, ඞිත් බැවින්; ගුණඃ න, ගුණ නො වේ. අධ්‍යගීෂ්‍යත අධ්‍යගීෂ්‍යෙතාම් අධ්‍යගීෂ්‍යන්ත යනු ගී ආදෙශ පක්ෂයෙහි ලෘඞ් ප්‍රඃ එක- ද්වි- බහු වචන සි. අධ්‍යෙෂ්‍යත (අධ්‍යෙෂ්‍යෙතාම් අධ්‍යෙෂ්‍යන්ත) යනු එහි විකල්ප පක්ෂය සි. අධ්‍යගීෂ්ට අධ්‍යගීෂාතාම් අධ්‍යගීෂත යනු ගී ආදෙශ පක්ෂයෙහි ලුඞ් ප්‍රඃ එක- ද්වි- බහු වචන සි. අධ්‍යෙෂ්ට අධ්‍යෙෂාතාම් අධ්‍යෙෂත යනු එහි විකල්ප පක්ෂය සි.

**අදාදිෂු ආත්මනෙපදි ප්‍රක්‍රියා, අදාදීන් විෂයෙහි ආත්මනෙපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්තා සි.**

---

a. **අථ, ඉක්බිති;** උභයපදි ප්‍රක්‍රියා, අදාදිය පිළිබඳ උභයපදි ප්‍රක්‍රියාව; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

**b. "සසහ්‍යාත්මනෙපදෙ සවරෙ විලොපො වාච්‍යඃ." අද්වික්ෂාතාම් අද්වික්ෂතත.**

**2. "දුහ" ප්‍රපූරණෙ. "දදෙසිඃ." දෙග්ධි දුග්ධඃ දුහන්ති, ධොක්ෂි දුග්ධඃ දුග්ධ, දොහ්මි දුහ්වඃ දුහ්මඃ, දුග්ධෙ, දුහාත්- දුහිත, දෙග්ධු.**

**c. "හකාරස්‍ය ඝවිජ්ඣඝ්භාවො වාච්‍යඃ." දුග්ධි- දුග් ධාම්, අධොක්- අධොග් අදුග්ධාම් අදුහන්; අදුග්ධ, දුදෙහ- දුදුහෙ, දුහ්‍යාත්- ධුක්ෂීෂ්ට, දෙග්ධා- දෙග්ධා, ධොක්ෂ්‍යති- ධොක්ෂ්‍යතෙ, අධොක්ෂ්‍යත්- අධොක්ෂ්‍යත, අධුක්ෂත්- අධුක්ෂත.**

---

1. ද්විෂ අප්‍රීතෞ, අකාරානුබන්ධ "ද්විශ්" ධාතුව නො සතුටෙහි වේ; අකාරඃ, අකාරය; උභය පදාර්ථඃ, උභය පදය වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. (මේ අකාරය ස්වරිත ය. ස්වරිත වර්ණයක් ඉත් කොට දැක්වීම ද ධාතුන් උභයපදී බවට ලකුණකි. "ස්වරිතෙත උභෙ" යි ඒ බැව් දැක්වූහ.)

ද්වෙෂ්ටි- ද්විෂෙට, ද්විෂ්‍යාත්- ද්විෂිත යනු ලට්- විධිලිඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂ එකවචන යි. ද්වෙෂ්ටු- ද්විෂ්‍යාත් යනු ලොට් ප: ප්‍ර: එකවචන යි. විෂ්ටාම් යනු ආ: ප්‍ර: එක ද්විවචන යි. අද්වෙට්- අද්වෙඩ් යනු ලඞ් ප: ප්‍ර: එකාවචන යි. අද්විෂාතාම් යනු ද්වි වචන යි. අද්විෂුඃ- අද්විෂන් යනු බහු වචන යි. අද්විෂට යනු ආ: ප්‍ර: එකවචන යි. දිද්වෙෂ- දිද්විෂෙ, ද්විෂ්‍යාත්- ද්වික්ෂීෂ්ට, ද්වෙෂ්ටා- ද්වෙෂ්ටා, ද්වෙක්ෂ්‍යති- ද්වෙක්ෂ්‍යතෙ, අද්වෙක්ෂ්‍යත්- අද්වෙක්ෂ්‍යත යනු පිළිවෙළින් දෙක බැගින් ලිට් -පෙ- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. "හ ශ ෂාන්තාත් සක්" යන සූත්‍රයෙන් සක් ප්‍රත්‍යය වේ. අද්වික්ෂත්- අද්වික්ෂත යනු ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

b. ආත්මනෙ පදෙ සවරෙ, ආත්මනෙ පදයෙහි වූ ස්වරයා පර කල්හි; සස්‍ය, සප්‍රත්‍යයාගේ; විලොපඃ වාච්‍යඃ, විසංඥ ලොපය කියයුතු යි. (ආත්මනෙපදයෙහි ස්වරාදි ප්‍රත්‍යයන් පර කල්හි ස ප්‍රත්‍යයාගේ අකාරය ලොප් වේ.) අද්වික්ෂාතාම් අද්වික්ෂාතා යනු ආ: ප්‍ර: ද්වි- බහු වචන යි. (වෘත්තියෙන් ද්වෙෂ්ටි යනාදිය ද- "ෂඪෝඃ කඃ සෙ" යි ෂකාරයට කකාරය වීමෙන් ද්වෙක්ෂි යනාදිය ද සිද්ධ යි.)

2. දුහ ප්‍රපූරණෙ, අකාරානුබන්ධ "දුහ්" ධාතුව ප්‍රකර්ෂයෙන් පිරීමෙහි (=දෙවීමෙහි) වේ. (අනුබන්ධ අකාරය උභයපදී බවට ය.) "දදෙසිඃ" යන සූත්‍රයෙන් හකාරයට ඝකාරය වේ. දෙග්ධි දුග්ධඃ දුහන්ති, ධොක්ෂි දුග්ධඃ දුග්ධ, දොහ්මි දුහ්වඃ දුහ්මඃ යනු ලට්

a. "දුහ් දිහ් ලිහ් ගුහූභ්‍යඃ සකො ලුග් වා වකාර තවර්ගයො රති." අදුග්ධ අධුක්ෂාතාම් අධුක්ෂතාන, අදුග්ධාඃ- අධුක්ෂථාඃ අධුක්ෂාථාම් අධුග්ධවම්- අධුක්ෂධවම්, අධුක්ෂාවහි- අදුහ්වහි අධුක්ෂාමහි.

3. "දිහ්" උපචයෙ, දෙග්ධි. තද්වත්.

4. "ලිහ්" ආස්වාදනෙ. "හො ඪඃ." ලෙඪි. තද්වත්.

---

පරස්මෛපද යි. දුග්ධෙ යනු ආ: ප්‍ර: එකවචන යි. ("දාදෙඝඃ" යි ඝකාරය වූ පසු "තථොර්ධඃ" යි තකාරයට ධකාරය ච "ඣබෙ ජබාඃ" යි ඝකාරය හට ගකාරය වීමෙන් දෙග්ධි යනාදිය සිඩ ය. ධොක්ෂි යනාදියෙහි "ආදිජබානාං ඣභාන්තස්‍ය ඣභාඃ ස්ධ්වොඃ" යි ආදියෙහි වූ දකාරයට ධකාරය හා "ඪසෙ චපා ඣසානාම්" යි ඝකාරය හට කකාරය ද- "ෂ්ටිලාත්" යනාදීන් ෂකාරය ද වේ.) දුහ්‍යාත්- දුහීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර: එකවචන යි. දෙග්ධු යනු ලොට් ප: ප්‍ර: එකවචන යි.

c. හකාරස්‍ය, හකාරයාගේ; ක්වචිත්, කිසි තැනෙක්හි; ඣස් භාවඃ, ඣසප්‍රත්‍යාහාර භාවය; වාච්‍යඃ, කිය යුතු යි. (මෙයින් හකාරය ඣසප්‍රත්‍යාහාර වර්ණයක් කොට ඉන් පසු "ඣසාදධිහේඃ" යි හි ප්‍රත්‍යයට ධි යනාදෙශ කරණු ලැබේ. එහෙත් එම සූත්‍රය "ඣසාත් + ග් + ධිඃ + හෙඃ" යි පදච්ඡේද කළ කල්හි හකාරයෙන් පර වූ "හි" හට ද ධි ආදෙශය කළ හැකි ය. එවිට මේ කියමන නිරර්ථක වන්නේ ය.)

දුග්ධි යනු ම: එක වචන යි. දුග්ධාම් යනු ආ: ප්‍ර: එක වචන යි. අධොග්- අධොක් අදුග්ධාම් අදුහන් යනු ලඞ් ප: ප්‍ර: එක- ද්වි- බහු වචන යි. අදුග්ධ යනු ආ: ප්‍ර: එක වචන යි. දුදොහ- දුදුහෙ, දුහ්‍යාත්- ධුක්ෂීෂ්ට, දොග්ධා- දොග්ධා, ධොක්ෂ්‍යති- ධොක්ෂ්‍යතෙ, අධොක්ෂ්‍යත්- අධොක්ෂ්‍යත, අධුක්ෂත්- අධුක්ෂත යනු පිළිවෙළින් දෙක බැගින් ලිට්- ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප: ආ: ප්‍ර: එකවචන යි.

a. ආති, ආත්මනෙපද විෂයෙහි; වකාර තවර්ගීයොඃ, වකාර- තවර්ගී දෙක පර කල්හි; දුහ් දිහ් ලිහ් ගුහූභ්‍යඃ, දුහ ප්‍රපූරණෙ- දිහ් උපචයෙ- ලිහ් ආස්වාදනෙ- ගුහූ සංවරණෙ යන ධාතූන් කෙරෙන් පර වූ; සකඃ, සක් ප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; ලුක්, ලුග් වේ. (ආත්මනෙ පදයෙහි වකාරය ද- තවර්ගීය වර්ණයක් ද ආදි කොට ඇති ප්‍රත්‍යයන් පර කල්හි යථොක්ත ධාතූන් කෙරෙන් පර වූ සක් ප්‍රත්‍යය විකල්පයෙන් ලුග් වන බව මෙයින් දක් වේ.) අදුග්ධ යනු එසේ ලුග් වූ පක්ෂයෙහි ලුඞ් ආ: ප්‍ර: එකවචන යි.

**5. "ෂ්ටුඤ්" ස්තුතෞ. "ආදෙඃ ෂණඃ ස්නඃ" "ඔරෞ" ස්තෞති- ස්තවීති ස්තුතඃ- ස්තුවීතඃ ස්තුවන්ති, ස්තුෂෙ- ස්තුවීෂෙ, ස්තුයාත්- ස්තුවීයාත්, ස්තුවීත, ස්තෞතු- ස්තවීතු, ස්තුතාත්- ස්තුවීතාත් ස්තුතාම්- ස්තුවීතාම් ස්තුවන්තු, ස්තුහි- ස්තුවීහි ස්තුතාත්- ස්තුවීතාත්, ස්තුතාම්- ස්තුවීතාම් අස්තෞත්- අස්තවීත් අස්තුතාම්- අස්තුවීතාම් අස්තුවන්, අස්තුත- අස්තුවීත, තුෂ්ටාව තුෂ්ටුවතුඃ තුෂ්ටුවුඃ, ක්‍රාදිනා නෙනට්. තුෂ්ටොථ තුෂ්ටුවථුඃ තුෂ්ටුව, තුෂ්ටව (=තුෂ්ටව)**

---

අධුක්ෂාතාම් අධුක්ෂන්ත යනු ද්වි- බහු වචන යි. අදුග්ධාඃ යනු ලුක් වූ පක්ෂයෙහි ම: එකවචන යි. අධුක්ෂථාඃ යනු අලුක් පක්ෂයෙහි යි. අධුක්ෂාථාම් යනු ද්වි වචන යි. අධුග්ධ්වම්- අධුක්ෂධ්වම් යනු ලුක් වූ හා නොවූ දෙපක්ෂයෙහි ම: බහුවචන යි. අදුහ්වහි- අධුක්ෂාවහි යනු එසේ ම උත්තම පුරුෂ ද්වි වචන යි. අධුක්ෂාමහි යනු බහු වචන යි.

3. දිහ් උපචයෙ, "දිහ්" ධාතුව වැඩීමෙහි වේ. දෙග්ධි යනු ලට් ප: ප්‍ර: එකවචන යි. තදාදී, එමෙනි හෙවත් දුහ් ධාතුව මෙන් වරනැගේ.

4. ලිහ් ආස්වාදනෙ, "ලිහ්" ධාතුව රස විඳ ගැන්මෙහි වේ. "හොඪඃ" යි හකාරයට ඪකාරය වේ. ලෙඪි යනු ලට් ප: ප්‍ර: එක වචන යි. තදාදී, එමෙනි. ("ලිහ් + ති" යි සිටි කල්හි "හොඪඃ" යි හකාරයට ඪකාරය වේ. "තථොර්ධඃ" යි තකාරයට ධකාරය වේ. ටුත්වය වේ "උපධායා ලඝොඃ" යි ගුණ වීමෙන් හා "ඪි ඪො ලොපො දීර්ඝශ්ච" යි මුල් ඪකාර ලොපයෙන් සිඩ යි. ලීඪඃ යනාදිය ද මෙසේ යි. ගුණ නො වේ, දීර්ඝ වේ.)

5. ෂ්ටුඤ් ස්තුතෞ, ඤකාරානුබන්ධ "ෂ්ටු" ධාතුව ස්තුති කිරීමෙහි වේ. ("ඤිත් ස්වරිතෙත උභෙ" යි කී හෙයින් මෙහි ඤකාරය උභයපදි බව ඇඟවීමට ය.) "ආදෙඃ ෂණඃ ස්නඃ" යි ෂකාරයට සකාරය වේ. (ඒ සමග ම "නිමිත්තාභාවෙ නෛමිත්තිකස්‍යාප්‍යභාවඃ" යි ටකාරය තකාරය වේ.) "ඔරෞ" යි උකාරයට ඖකාරය වේ. ස්තෞති- ස්තවීති ස්තුතඃ- ස්තුවීතඃ ස්තුවන්ති යනු ලට් ප: ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

(අප් විෂයෙහි හෙවත් ලඩාදි සිවු විබතෙහි ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයන් සම්බන්ධ ව "තුරුස්තුශම්‍යමඃ සාර්වධාතුකෙ" යනාදීනාං ඡන්දසි වා" යි විකල්පයෙන් ඊඩාගම වේ. ඉන් පසු ගුණ වීමෙන් හා අව් ආදෙශයෙන් ස්තවීති යනු ද- "හුශ්නුවොඃ" යි උව් ආදෙශයෙන් ස්තුවීතඃ යනාදිය ද සිඩ යි.)

**තුෂ්ටුව තුෂ්ටුම, තුෂ්ටුවෙ. ස්තූයාත්- ස්තොෂීෂ්ට, ස්තොතා- ස්තොතා, ස්තොෂ්‍යති- ස්තොෂ්‍යතෙ, අස්තොෂ්‍යත්- අස්තොෂ්‍යත, "ස්තු සු ධූඤං පෙ සෙරිඩ වක්තව්‍යඃ." අස්තාවීත්- අස්තොෂ්ට.**

**6. "බ්‍රූඤ්" ව්‍යක්තායාං වාචි.**

## 134. අබාදවී පිති ත්ස්මි.

(අබාදෞ 7-1. ඊ 1-1. පිති 7-1 ත්ස්මි 7-1.)

a. **බ්‍රුව ඊකාරඃ ප්‍රත්‍යයො භවති තකාර සකාර මකාරාදෞ පිති පරෙ අබාදෞ විෂයෙ. බ්‍රවිති බ්‍රූතඃ බ්‍රුවන්ති, බ්‍රවිෂි බ්‍රූථඃ.**

---

සතුතෙ- සතුවීතෙ යනු ආ: ප්‍ර: එකවචන යි. සතුයාත්- සතුවීයාත්, සතුවීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර: එකවචන යි. ස්තෞතු- සතාවීතු, සතුතාත්- සතුවීතාත් යනු ලොට් ප: ප්‍ර: එකවචන යි. සතුතාම්- සතුවීතාම් සතුවනතු යනු ව්- බහු වචන යි. සතුහි- සතුවීහි, සතුතාත්- සතුවීතාත් යනු ම: එකවචන යි. සතුතාම්- සතුවීතාම් යනු ආ: ප්‍ර: එකවචන යි. අස්තෞත්- අසතාවීත් අසතුතාම්- අසතුවීතාම් අසතුවන් යනු ලඞ් ප: ප්‍ර: එක- ද්වි- බහුවචන යි. අසතුත- අසතුවීත යනු ආ: ප්‍ර: එකවචන යි. තුෂ්ටාව තුෂ්ටුවතුඃ තුෂ්ටුවුඃ යනු ලිට් ප: ප්‍ර: එක- ව්- බහු වචන යි.

ක්‍රාදිත්වාත්, ක්‍රාදිය බැවින්; න ඉට්, ඉඩාගමය නො වේ. ("ක්‍රාදෙණීාදෙඃ" යි ප්‍රතිෂිඩ හෙයිනි.) තුෂ්ටොථ තුෂ්ටුවථුඃ තුෂ්ටුව, තුෂ්ටාව (=තුෂ්ටව) තුෂ්ටුව තුෂ්ටුම යනු ම: උ: එක- ව්- බහු වචන යි. තුෂ්ටුවෙ යනු ආ: ප්‍ර: එකවචන යි. ස්තූයාත්- ස්තොෂීෂ්ට -පෙ- අස්තොෂ්‍යත්- අස්තොෂ්‍යත යනු පිළිවෙළින් දෙක බැගින් ආශීර් ලිඞ් -පෙ- ලෘඞ් ප: ආ: ප්‍ර: එකවචන යි. සතුසුධූඤ්ම්, සතු- සු- ධූඤ් ධාතූන් පිළිබඳ; පෙ, පරස්මෛපදයෙහි; සෙඃ, සිප්‍රත්‍යය සම්බන්ධ ව; ඉඩ් වක්තව්‍යඃ, ඉට් ආගමය කියයුතු යි. (මෙයින් ලුඞ් පරස්මෛපදයෙහි පමණක් ඉඩාගම වේ.) අස්තාවීත්- අස්තොෂ්ට යනු ලුඞ් ප: ආ: ප්‍ර: එකවචන යි.

6. බ්‍රූඤ් ව්‍යක්තායාං වාචි, ඤකාරානුබන්ධ "බ්‍රූ" ධාතුව ව්‍යක්ත වචනයෙහි වේ.

134. * ඊ ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "බ්‍රුව ආහශ්ච පඤ්චානාම්" යි 'බ්‍රුවඃ' යනු අනුවෘත්ත යි. අබාදෞ, අබාදි විෂයෙහි; පිති, පිත් වූ; ත්ස්මි, තකාර-සකාර-මකාර පර කල්හි; බ්‍රුවඃ, බ්‍රූ ධාතුහු කෙරෙන්; ඊ, ඊ ප්‍රත්‍යය වේ.

---

* ඊඩාගමය යි ද කියන ලදී.

## 135. බ්‍රූව ආහශ්ච පඤ්චානාම්.

( බ්‍රූවඃ 6-1. ආහඃ 1-1. ච -නි. පඤ්චානාම් 6-3. )

**b. බ්‍රූව උත්තරෙෂාං තිබාදීනාං පඤ්චානාං ණබාදයඃ පඤ්චාදෙශා වා භවන්ති. බ්‍රූව ආහශ්චාදෙශො භවති. ආහ ආහතුඃ ආහුඃ.**

---

a. අබාදෞ විෂයෙ, අබාදි විෂයෙහි (=අබ් විෂයෙහි); තකාර සකාර මකාරාදෞ, තකාර- සකාර- මකාර ආදි කොට ඇති; පිති පරෙ, පිත් වූ (=ප යන්න ඉත් කොට ඇති) ප්‍රත්‍යය පර කල්හි; බ්‍රූවඃ; බ්‍රූ ධාතුහු කෙරෙන්; ඊකාරඃ ප්‍රත්‍යයඃ භවති, ඊ ප්‍රත්‍යය වේ.

(ලඩාදි සතරෙහි බ්‍රූ ධාතුවෙන් පර ව ප යන්න ඉත් කොට ඇති ත- ස- ම යන අකුරු ආදි කොට ඇති ප්‍රත්‍යයන් පර කල්හි ඊකාරයක් වන බව මෙයින් දක් වේ. මෙහි "අබාදෞ" යන්නෙන් අබ් විෂය ම ගැණේ. එ බැවින් මෙහි ආදි ශබ්දය කුමක් පිණිස දයි සිතිය යුතු යි. යම් ලෙසකින් **අප් ආදිඃ ප්‍රථමො යස්‍ය සඃ අබාදිඃ**= අප් ප්‍රත්‍යය පළමු වූයේ යමකට ද හේ අබාදි යයි ගතහොත් අබ් ලුග් විෂය ගැණේ. එහෙයින් 'අප්' හට ලුක් වූ කල්හි ඒ අප් ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි ධාතු- ප්‍රත්‍යය දෙක මැද ඊකාරය වේ යයි දත යුතු යි. **චන්ද්‍රකීර්ති** ටීකාවෙහි මෙය ඊප් ප්‍රත්‍යය වශයෙන් දක්වන ලදී. එසේ ම මෙහි "ත්සමි" යන්න "ත්ත්සමි" යි ප්‍රකාරාන්තරයකින් ද දක්වූහ. ද් ච ත් ච ස් ච මි ච= ත්ත්ස්මි, තස්මින්= ත්ත්සමි යනු එහි විග්‍රහ යි. "ධසෙ චප්‍රාඃ" යනාදීන් දකාරයට තකාරය වේ. එවිට පිත් වූ දකාරාදි ප්‍රත්‍යය පර කල්හි ද ඊ ප්‍රත්‍යය වේ.)

බ්‍රවීති බ්‍රූතඃ බ්‍රුවන්ති යනු ලට් පඃ ප්‍රඃ එක- ද්වි- බහු වචන යි. බ්‍රවීෂි බ්‍රූථඃ යනු මඃ එක- ද්වි වචන යි.

135. ආදෙශ විධි සූත්‍ර යි. "විදෙ ඃ පඤ්චානාං තිබාදීනාං ණබාදීනිචකො වා" යි 'තිබාදීනාං- ණබාදිඃ- වා' යනු අනුවෘත්ත යි. බ්‍රූවඃ, බ්‍රූ ධාතුහු කෙරෙන් පර වූ; තිබාදීනාං පඤ්චානාං, තිබාදි පසට; ණබාදිඃ, ණබාදි පස ද; ආහඃ ච, (බ්‍රූ ධාතුවට) ආහ යනාදෙශය ද; වා, විකල්පයෙන් වෙත්.

b. බ්‍රූවඃ උත්තරෙෂාම්, බ්‍රූ ධාතුහු කෙරෙන් පර වූ; තිබාදීනාං පඤ්චානාම්, තිප් ආදි පසට; ණබාදයඃ පඤ්චාදෙශාඃ, ණප් ආදි ආදෙශයෝ පස් දෙන; වා භවන්ති, විකල්පයෙන් වෙත්. බ්‍රූවඃ, බ්‍රූ ධාතුහට; ආහඃ ච ආදෙශඃ භවති, ආහ යනාදෙශය ද වේ.

## 136. තශ්ඨෙ. (තඃ 1-1. ණෙ 7-1.)

**a. ආහො හකාරස්‍ය තකාරාදෙශො භවති ණෙ පරෙ.- ආත්ථ ආහථුඃ බ්‍රූථ, බ්‍රවීමි බ්‍රූවඃ බ්‍රූමඃ, බ්‍රූතෙ, බ්‍රූයාත්- බ්‍රුවීත,- බ්‍රවීතු- බ්‍රූතාම්, අබ්‍රවීත්- අබ්‍රූත.**

**b. බ්‍රුවො වචිඃ.**

**c. බ්‍රුවො වචිරාදෙශො භවති අනපි විෂයෙ. * උවාච- ඌචෙ, අවොචත්- අවොචත, ශෙෂස්‍ය පූර්‍වවත් ප්‍රක්‍රියා.**

---

(බ්‍රූ ධාතුවෙන් පර 'තිප්-තස්-අන්ති-සිප්-ථස්' යන ප්‍රත්‍යය පසට පිළිවෙළින් 'ණප්-අතුස්-උස්-ථප්-අථුස්'යන පස විකල්පයෙන් වේ. එසේ ආදෙශ වූ පක්‍ෂයෙහි බ්‍රූ ධාතුවට ආහ යන ආදෙශය ද වේ යයි මෙයින් කාර්‍ය්‍ය දෙකක් විහිත ය. මේ ආහාදෙශය හලන්තය, අකාරය උච්චාරණය පිණිස යි. මේ සූත්‍රය ආහශ්ච පඤ්චානාම් යි සාරස්වත යෙහි පෙණේ. එහෙත් සූත්‍ර පාඨයෙහි හා සිද්ධාන්ත චන්ද්‍රිකාදියෙහි එන සේ මෙහි යෙදින.) ආහ ආහතුඃ ආහුඃ යනු එසේ සිද්ධ පඃ ප්‍රථම පුරුෂ යි.

*136.* තකාරාදෙශ විධි සූත්‍ර යි. "බ්‍රූව ආහශ්ච පඤ්චානාම්" යි. විඃ විඃ වශයෙන් 'ආහස්‍ය' යනු අනුවෘත්ත වේ. ථෙ, ථකාරය පර කල්හි; ආහස්‍ය, ආහ යන ආදෙශයාගේ අන්තයට; තඃ, තකාරාදෙශ වේ.

a. ථෙ පරෙ, ථකාරය පර කල්හි; ආහඃ හකාරස්‍ය, ආහ් ආදෙශයාගේ හකාරයට; තකාරාදෙශඃ භවති, තකාරදෙශ වේ. ආත්ථ ආහථුඃ යනු මඃ එක-වි වචන යි. බ්‍රූථ යනු බහු වචන යි. බ්‍රවීමි බ්‍රූවඃ බ්‍රූමඃ යනු උත්තම පුරුෂ යි. බ්‍රූතෙ යනු ආඃ ප්‍රඃ එකවචන යි. බ්‍රූයාත්- බ්‍රුවීත, බ්‍රවීතු- බ්‍රූතාම්, අබ්‍රවීත්- අබ්‍රූත යනු විධි ලිඞ්- ලොට්- ලඞ් පඃ ආඃ ප්‍රඃ එකවචන යි.

b. බ්‍රුවඃ, බ්‍රූ ධාතුහට; වචිඃ, (අනඞ් විෂයෙහි) වච් ධාතුව ආදෙශ වේ. (සාරස්වත සූත්‍රයක් නො වේ.)

c. අනපි විෂයෙ, අනඞ් විෂයෙහි; බ්‍රුවඃ, බ්‍රූ ධාතුවට; වචිරාදෙශඃ භවති, 'වචි' ආදෙශය වේ. (වච් පරිභාෂණෙ යන ධාතුව මෙන් වරනැගේ. වචි යන මෙහි ඉකාරය ඉත් යයි කිම සුදුසු නො වේ. එය "ඉක්ශ්තිපෞ ධාතු නිර්දේශෙ" යන සූත්‍රෙන් වූවකි. වච් ධාතුව ම වචි නම් වේ.)

උවාච- ඌචෙ, අවොචත්- අවොචත යනු ලිට්- ලුඞ් පඃ ආඃ ප්‍රඃ එකවචන යි. (විචි ච "ණබාදෞ පූර්‍වස්‍ය" යි පූර්‍වයට සම්ප්‍රසාරණ ව

---

* ඉකාර ඉත්- පොත්හි.

**7. "ඌර්ණුඤ්" ආච්ඡාදනෙ, ඌර්ණොතෙර්වා වෘද්ධිර්හලාදෞ පිති. ඌර්ණෞති- ඌර්ණොති,**

**a. ඌර්ණොතෙර්ගුණො දිසෙත්‍යොඃ, වෘද්ධෙරපවාදඃ. ඖර්ණොත්- ඖර්ණොඃ. ඌර්ණොතෙරාම් න.**

## 137. ස්වරාදෙඃ පරඃ. (ස්වරාදෙඃ 6-1. පරඃ 1-1.)

**b. ස්වරාදෙර්ධාතොර්ද්විතීයො 'වයවො 'ද්විරුක්තඃ සන් ද්විර්භවති.**

---

"අත උපධායාඃ" යි වෘද්ධි වීමෙන් උවාච යනු ද- "ග්‍රහාං ඤිති ච" යි ධාත්වාදි වූ වයන්නටත් සම්ප්‍රසාරණ ව ඌෂෙ යනු ද වේ. ධ ප්‍රත්‍යය ච "ධෙ චවෙරුමාගමො වක්තව්‍යඃ" යි උමාගම ව සන්ධි වීමෙන් අවොචත් යනාදිය සිද්ධ යි.) ශෙෂස්‍ය, සෙස්ස පිළිබඳ; ප්‍රක්‍රියා, පද සාධනක්‍රියාව, පූර්වත්, පෙර මෙති.

7. ඌර්ණුඤ් ආච්ඡාදනෙ, ඤකාරානුබන්ධ "ඌර්ණු" ධාතුව වැසීමෙහි වේ. හලාදෞ, හල්ප්‍රත්‍යාහාර වර්ණයක් ආදි කොට ඇති; පිති, පිත් වූ ප්‍රත්‍යය පර කල්හි; ඌර්ණොතෙඃ, ඌර්ණු ධාතුහට; වා, විකල්පයෙන්; වෘද්ධිඃ, වෘද්ධි වේ; ඌර්ණෞති යනු වෘද්ධි වූ පක්ෂයෙහි ද- ඌර්ණොති යනු විකල්ප පක්ෂයෙහි ද ලට් ප: ප්‍ර: එකවචන යි. (ඌර්ණුයාත්- ඌර්ණුවීත, ඌර්ණෞතු= ඌර්ණොතු- ඌර්ණුතාම් යනු විධි ලිඞ්- ලොට් ප: ආ: ප්‍ර: එකවචන යි.)

a. දිසෙත්‍යොඃ, දිප්- සිප් දෙක පර කල්හි; ඌර්ණොතෙඃ, ඌර්ණු ධාතුහට; ගුණඃ, ගුණ වේ. වෘද්ධෙඃ, වෘද්ධිහුගේ; අපවාදඃ, වැළැක්ම වේ. ඖර්ණොත්- ඖර්ණොඃ යනු ලඞ් ප: ප්‍ර: ම: එකවචන යි. ("දිබාදෞ වට්" "ස්වරාදෙඃ" යන සූත්‍රවලයෙන් අඩාගම දෙකක් වීමෙන් ඖර්ණොත් යනාදිය සිද්ධ යි.) ඌර්ණොතෙඃ, ඌර්ණු ධාතුහු කෙරෙන් ආම් න, ආම් ප්‍රත්‍යය නො වේ.

137. ද්විත්ව විධි සූත්‍ර යි. "සස්වරාදිර්ද්විරද්විඃ" යි 'සස්වරඃ- ද්විඃ- අද්විඃ යනු ද- "ධාතොඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. ස්වරාදෙඃ; ධාතොඃ, ස්වරාදි ධාතුහුගේ; සස්වරඃ, ස්වර සහිත වූ; අද්විඃ, ද්විරුක්ත නුවූ; පරඃ, පරාවයවය; ද්විඃ, ද්විරුක්ත වේ.

**c. "ස්වරාත් පරාඃ සංයෝගාදයෝ නදරා මිනි." ඌර්ණුනාව ඌර්ණුනුවතුඃ.**

**a. "ඌර්ණෝතෙරිඩාදිඃ ප්‍රත්‍යයෝ වා ඞිත්." ඌර්ණුනුවිථ-ඌර්ණුනවිථ, ඌර්ණුයාත්, ඌර්ණුවිෂිෂ්ට-ඌර්ණවිෂිෂ්ට, ඌර්ණුවිතා- ඌර්ණවිතා, ඌර්ණුවිෂ්‍යති- ඌර්ණවිෂ්‍යති, ඌර්ණුවිෂ්‍යතෙ- ඌර්ණවිෂ්‍යතෙ, ඖර්ණුවිෂ්‍යත්- ඖර්ණවිෂ්‍යත්, ඖර්ණුවිෂ්‍යත- ඖර්ණවිෂ්‍යත.**

---

b. ස්වරාදෙඃ ධාතොඃ, ස්වරාදි ධාතුහුගේ; අද්විරුක්තඃ, ද්විරුක්ත නුවූ, සස්වරඃ, ස්වර සහිත වූ; ද්විතීයඃ අවයවඃ, දෙවැනි අවයවය, ද්විර්භවති, ද්විරුක්ත වේ. (ලිට් පර කල්හි ස්වරාදි ධාතූන්ගේ ආදි වර්ණය ද්විරුක්ත නො වන බවත් ස්වර සහිත දෙවැනි වර්ණය ද්විරුක්ත වන බවත් මෙයින් දක්වූහ.)

c. ස්වරාත් පරාඃ, ස්වරයා කෙරෙන් පර වූ; සංයෝගාදයඃ, සංයෝගයාගේ ආදි වූ; නදරාඃ, නකාර- දකාර- රකාරයෝ; මිඃ න, ද්විරුක්ත නො වෙත්. (පූර්ව සූත්‍රයෙන් ස්වරාදි ධාතූන්ගේ දෙවැනි අවයවයට ද්විත්ව වේ යයි කී හෙයින් ඌර්ණුඤ් ධාතුවේ රකාර සහිත දෙවැනි අවයවයට ද්විත්ව වියයුතු ය. එහෙත් සංයෝගාදියෙහි පවත්නා නකාර- දකාර- රකාරයන්ට ද්විත්ව නො වන බව මෙයින් දක්වූහ. එබැවින් නුකාරයට ද්විත්ව වේ. "ධාතො නාමිනඃ" යි වෘද්ධි වේ.) ඌර්ණුනාව ඌර්ණුනුවතුඃ ඌර්ණුනුවුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

(ඌර්ණු ධාතුහුගේ ප්‍රකෘතියට අයත් දන්තජ නුකාරය යි "ෂ්‍රාටවර්ගීසනවර්ගී ජඃ" යි කී බැවින් රකාරයෙන් පර නුකාරය ණුකාර විය. ද්විත්ව වන්නේ නුයන්නට යි. ඉන්පසු රකාරය පූර්ව නකාරයාගේ මූර්ධන්‍යත්වයට ම නිමිති වේ. පර නකාරයාගේ මූර්ධන්‍යත්වයට නිමිති නො වේ.)

a, ඌර්ණෝතෙඃ, ඌර්ණුඤ් ධාතුහු කෙරෙන් පර වූ; ඉඩාදිඃ ප්‍රත්‍යයඃ, ඉඩාගමය ආදි කොට ඇති ප්‍රත්‍යය තෙමේ, වා ඞිත්, විකල්පයෙන් ඞිත් වේ. (ඞිත් පක්ෂයෙහි ගුණ නො වී "නුධාතොඃ" යි උව් ආදෙශ වේ.) ඌර්ණුනුවිථ- ඌර්ණුනවිථ යනු ම: එකවචන යි. ඌර්ණුයාත් යනු ආශීර්ලිඞ් ප: ප්‍ර: එකවචන යි. ඌර්ණුවිෂිෂ්ට- ඌර්ණවිෂිෂ්ට යනු ආ: ප්‍ර: එකවචන යි. ඌර්ණුවිතා- ඌර්ණවිතා යනු ලුට් ප: ප්‍ර: එකවචන යි. (ආත්මනෙ පදයෙහිත් මෙසේ ම ය. ඌර්ණුවිෂ්‍යති- ඌර්ණවිෂ්‍යති, ඌර්ණුවිෂ්‍යතෙ- ඌර්ණවිෂ්‍යතෙ, ඖර්ණුවිෂ්‍යත්- ඖර්ණවිෂ්‍යත්, ඖර්ණුවිෂ්‍යත- ඖර්ණවිෂ්‍යත යනු දෙක බැගින් ලෘට්- ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

b. ඌර්ණෝතේර්වා වෘද්ධිඃ සෞ පරෙ. පක්ෂෙ ගුණඃ. ඖර්ණෝවීත්- ඖර්ණවීත්- ඖර්ණුවීත්, ඖර්ණවිෂට- ඖර්ණුවිෂට.

ඉත්‍යදාදිෂූභයපදි ප්‍රක්‍රියා.

## ඉති ලුග්විකරණා අදාදයො ධාතවඃ

c. ලුග්විකරණස්‍යාපි ජුහොත්‍යාදි ගණස්‍ය විශෙෂඃ.

1. හු දානාදනයොඃ.

## 138. ශ්වාදෙර් ද්විශ් ච. (ශ්වාදෙඃ 5-1. ද්විඃ 1-1. ච.- නි.)

---

b. සෞ පරෙ, සි ප්‍රත්‍යය පර කල්හි; ඌර්ණෝතෙඃ, ඌර්ණුඤ් ධාතුහට; වා වෘද්ධිඃ, විකල්පයෙන් වෘද්ධි වේ. පක්ෂෙ, පක්ෂයෙක්හි; ගුණඃ, ගුණ වේ. ඖර්ණෝවීත්- ඖර්ණවීත්- ඖර්ණුවීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (විකල්පයෙන් ඩිත් බැවින් ගුණ නො වීමෙන් ද රූපයක් සිට්.) ඖර්ණවිෂට- ඖර්ණුවිෂට යනු ආ: ප්‍ර: එකවචන යි.

අදාදිෂු, අද් ආදි ධාතු විෂයෙහි; උභයපදි ප්‍රක්‍රියා, උභය පදි ධාතූන් සම්බන්ධි පද සාධන ක්‍රියාව; ඉති, මෙසේ යි.

ලුග්විකරණාඃ, ලුක් වූ විකරණ ප්‍රත්‍යය ඇති; අදාදයඃ ධාතවඃ, අදාදි ධාතූහු; ඉති, මෙසේ යි.

## අදාදි ගණය සමාප්ත යි.

---

c. ලුග්විකරණස්‍යාපි, ලුග් විකරණ වූ ද; ජුහොත්‍යාදිගණස්‍ය, ජුහොත්‍යාදි ගණයාගේ හෙවත් හු ආදි ධාතු සමූහයාගේ; විශෙෂඃ, වෙනස දක්වනු ලැබේ. (ජුහොත්‍යාදි ගණය නම් ලඩාදි සතරෙහි ද්විත්ව වීමෙන් වරනැගෙන ධාතු සමූහය යි.)

1. හු, "හු" යන ධාතුව; දානාදනයොඃ, දීම ය- කෑම ය යන අර්ථ දෙක්හි වේ. (මෙහි දීම නම් ගිතෙල් ආදිය ගින්නෙහි බහා ලීම යි.)

138. ලුක් හා ද්විත්ව විධි සූත්‍ර යි. "අදාදෙර්ලුක්" යි වි: වි: වශයෙන් 'ලුකි' යනු ද- "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද- "අප් කර්තරි" යි වි: වි: වශයෙන් 'අපඃ' යනු ද- "ධාතොඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි.

චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; ශ්වාදෙඃ ධාතොඃ, හවාදි ධාතු ගණයා කෙරෙන් පර වූ; අපඃ, අප් විකරණයට; ලුකි, ලුක් වූ කල්හි; ද්විශ්ච, ධාතුහට ද්විත්ව ද වේ.

**a. හු ඉත්‍යාදෙර්ගණාදුත්පන්නස්‍යාපො ලුග් භවති, තස්මින් ලුකි සති ධාතොර් ද්විර්වචනම්. "කුහොශ්චුඃ." "ගුණඃ." ජුහොති ජුහුතඃ.**

**139. ද්වෙඃ.** (දෙවඃ 5-1.)

**b. ද්විරුක්තාදුත්තරස්‍යාන්ත ඉත්‍යෙතස්‍යාද් භවති. ජුහ්වති, ජුහොෂි ජුහුථඃ ජුහුථ, ජුහොමි ජුහුවඃ ජුහුමඃ, ජුහුයාත් ජුහුයාතාම්, ජුහොතු- ජුහුතාත් ජුහුතාම් ජුහ්වතු.**

**c. හෙර්ධිඃ.** *

**d. ජුහොතෙ රුත්තරස්‍ය හෙර්ධිර්භවති. ජුහුධි, අජුහොත් අජුහුතාම්.**

**140. අන උස්.** ×(අනඃ 6-1. උස් 1-1.)

---

a. හු ඉත්‍යාදෙර්ගණාත්, හු යනාදි ධාතු ගණයා කෙරෙන් පර ව; උත්පන්නස්‍ය, උපන්නා වූ; අපඃ, අප් විකරණයට, ලුග් භවති, ලුක් වේ; තස්මින් ලුකි සති, ඒ ලුක්වීම ඇති කල්හි; ධාතොඃ, ධාතු හට; ද්විර්වචනම්, ද්විරුක්තිය වේ. "කුහොශ් චුඃ" සි පූර්‍ව හකාරයට ඣකාර ව ඊට "ඣපානාම්-" සි ජකාරය වේ. "ගුණඃ" සි ගුණ වේ. ජුහොති ජුහුතඃ යනු ලට් ප්‍ර: එක- ද්වි වචන සි.

139. අත් ආදෙශ විධි සූත්‍ර සි. "ධාතොඃ" යනු ද- "ආතො 'නෙනා'දන්තඃ" සි 'අන්තඃ- අත්' යනු ද අනුවෘත්ත සි. ද්වෙඃ ධාතොඃ, ද්විරුක්ත ධාතුහු කෙරෙන් පර වූ; අන්තඃ, අන්ත් යන්නට; අත්, අත් යනාදෙශ වේ.

b. ද්විරුක්තාත් උත්තරස්‍ය, ද්විරුක්ත ධාතුවෙන් පර වූ; අන්තඃ ඉති එතස්‍ය, අන්ත් යන මෝහට; අද් භවති, අත් යනාදෙශ වේ. ජුහ්වති යනු බහු වචන සි. ජුහොෂි ජුහුථඃ ජුහුථ, ජුහොමි ජුහුවඃ ජුහුමඃ යනු ම: උ: එක- ද්වි- බහු වචන සි. ජුහුයාත් ජුහුයාතාම් ( ජුහුයුඃ ) යනු විධි ලිඞ් ප්‍රථම පුරුෂ සි. ජුහොතු- ජුහුතාත් ජුහුතාම් ජුහවතු යනු ලොට් ප්‍රථම පුරුෂ සි.

c. හෙඃ, (හු ධාතුවෙන් පර ) හි ප්‍රත්‍යයට; ධිඃ, ධි යනාදෙශ වේ.

d. ජුහොතෙඃ උත්තරස්‍ය, හු ධාතුහු කෙරෙන් පර වූ; හෙඃ, හි ප්‍රත්‍යයට; ධිඃ භවති, ධියනාදෙශ වේ. ජුහුධි (ජුහුතාත්) යනු ලොට් ම: එක වචන සි. අජුහොත් අජුහුතාම් යනු ලඞ් ප්‍ර: එක- ද්වි වචනසි.

140. උස් ආදෙශ විධි සූත්‍ර සි. "ද්වෙඃ" යන සූත්‍රය අනුවෘත්ත සි. ද්වෙඃ, ද්විරුක්ත ධාතුහු කෙරෙන් පර වූ; අනඃ, අන් ප්‍රත්‍යයට; උස්, උස් යනාදෙශ වේ.

---

* සාරසවත සූත්‍රයක් නො වේ. × පොත්හි නො පෙණේ.

a. ද්විරුක්තාදන උස් භවති. * අද්ව්‍යුසිත්‍යුක්තෙර්ගුණඃ. අජුහවුඃ, අජුහොඃ අජුහුතම් අජුහුත, අජුහවම් අජුහුව අජුහුම. ජුහාව ජුහුවතුඃ ජුහුවුඃ, ජුහවිථ- ජුහොථ.

b. "භීහුභෘභ්‍රීණාමාම් වා වක්තව්‍යඃ, ස ලුග්වත්." ලුකි සති ධාතොර් ද්විත්වම්. ජුහවාඤ්චකාර, හූයාත්, හොතා, හොෂ්‍යති, අහොෂ්‍යත්, අහෞෂීත් අහෞෂ්ටාම් අහෞෂුඃ.

2. ඤිභී භයෙ. ඤි ඉත්. බිභෙති බිභීතඃ,

c. "ඞිති හසෙ භිය ඉකාරෙ වා වක්තව්‍යඃ සාර්වධාතුකෙ" බිභිතඃ බිභ්‍යති, බිභියාත්- බිභියාත්, බිභෙතු- බිභිතාත්- බිභිතාත් බිභිතාම්- බිභිතාම්, අබිභෙත් අබිභිතාම්- අබිභිතාම් අබිභයුඃ, බිභාය, පක්ෂෙ ආම්. බිභයාඤ්චකාර, භියාත්, භෙතා, භෙෂ්‍යති, අභෙෂ්‍යත්, අභෛෂීත්.

---

a. ද්විරුක්තාත්, ද්විරුක්ත ධාතුවෙන් පර වූ; අනඃ, අන් ප්‍රත්‍යයට; උස් භවති, උස් ආදෙශ වේ. අද්ව්‍යුසි ඉති උක්තෙඃ, 'අද්ව්‍යුසි' යයි කී හෙයින්; ගුණඃ, ගුණ වේ. ("ක්ඞිත්‍යද්ව්‍යුසි" යන සූත්‍රයෙන් කිත්- ඞිත් පර කල්හි ගුණ ප්‍රතිෂෙධය වන බවත්, එහෙත් ද්විරුක්ත ධාතුන් කෙරෙන් පර 'උස්' යන්න පර කල්හි ප්‍රතිෂෙධ නො වන බවත් කිහ. එබැවින් මෙහි ගුණ වේ.) අජුහවුඃ යනු බහු වචන යි. අජුහොඃ අජුහුතම් අජුහුත, අජුහවම් අජුහුව අජුහුම යනු මධ්‍යම- උත්තම පුරුෂ යි. ජුහාව ජුහුවතුඃ ජුහුවුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. ජුහවිථ- ජුහොථ යනු ම: එකවචන යි. (විකල්ප යෙන් ඉඩාගම යි.)

b. භීහුභෘභ්‍රීණාම්, භී- හු- භෘ- භ්‍රී යන ධාතුන් සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ආම් වක්තව්‍යඃ, ආම් ප්‍රත්‍යය කියයුතු යි. සඃ ලුග්වත්, හෙතෙමේ ලුක් මෙනි. ලුකි සති, ලුක් ඇති කල්හි; ධාතොඃ, ධාතුහට; ද්විත්වම්, ද්විත්ව වේ. ජුහවාඤ්චකාර යනු ආම් ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ලිට් ප්‍ර: එක වචන යි. හූයාත් -පෙ- අහොෂ්‍යත් යනු ආශීර් ලිඞ් -පෙ- ලෘඞ් ප්‍ර: එකවචන යි. අහෞෂීත් අහෞෂ්ටාම් අහෞෂුඃ යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි.

2. ඤිභී භයෙ, ඤි අනුබන්ධ "භී" ධාතුව බිය වීමෙහි වේ. ඤි ඉත්, ඤිකාරය ඉත් ය. බිභෙති බිභීතඃ යනු ලට් ප්‍ර: එක- ද්වි වචන යි. (ආදි භකාරයාට "ඣපානාං ජබ චපාඃ" යි බකාරය වේ.)

c. සාර්වධාතුකෙ, සාර්වධාතුක විෂයෙහි හෙවත් ලඩාදි සත රෙහි; ඞිති හසෙ, ඞිත් වූ හසප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; භියඃ, භී ධාතුහුගේ අන්තයට; වා, විකල්පයෙන්; ඉකාරඃ වක්තව්‍යඃ, ඉකාරය කියයුතු යි (ඞිත් සංඥා වූ ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයන් පර

---

* පොත්හි නො පෙණේ.

**3. හ්‍රී ලජ්ජායාම්, ජිහ්‍රෙති ජිහ්‍රීතඃ ජිහ්‍රියති, ජිහ්‍රීයාත්, ජිහ්‍රෙතු, අජිහ්‍රෙත් අජිහ්‍රීතාම් අජිහ්‍රයුඃ, ජිහ්‍රාය ජිහ්‍රියතුඃ ජිහ්‍රියුඃ, ජිහ්‍රයාඤ්චකාර, හ්‍රියාත්, හ්‍රෙතා, හ්‍රෙෂ්‍යති, අහ්‍රෙෂ්‍යත්, අහ්‍රෙෂීත්.**

**4. පෲ පාලන පූරණයොඃ.**

## 141. සෲප්‍රෝඃ. (සෘප්‍රොඃ 6-2.)

**a. සෲප්‍රෝඃ පූර්වස්‍ය සෲකාරස්‍ය ඉකාරෝ භවති ලුකි සති. "ගුණඃ." පිපර්ති.**

---

කාල්හි ලඩාදි සතරෙහි භී ධාතුවේ ඊකාරයට ඉකාරය වන බව මෙයින් කීහ.) බිභිතඃ යනු එසේ සිඩ ලට් ප්‍ර: ද්වි වචන යි. බිභ්‍යති යනු බහු වචන යි. බිභියාත්- බිභීයාත් යනු විධි ලිඞ් ප්‍ර: එකවචන යි. බිභෙතු- බිභිතාත්- බිභීතාත් යනු ලොට් ප්‍ර: එක වචන යි. බිභිතාම්- බිභීතාම් යනු ද්වි වචන යි. අබිභෙත් අබිභිතාම්- අබිභීතාම් අබිභයුඃ යනු ලඞ් ප්‍රථම පුරුෂ යි. බිභාය යනු ලිට් ප්‍ර: එක වචන යි. පක්‍ෂෙ, පක්‍ෂයෙක්හි; ආම්, ආම් ප්‍රත්‍යය වේ. බිභයාඤ්චකාර යනු ද ලිට් ප්‍ර: එක වචන යි. භීයාත් -පෙ- අභෛෂීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එකවචන යි.

3. හ්‍රී ලජ්ජායාම්, "හ්‍රී" ධාතුව ලජ්ජාවෙහි වේ. ජිහ්‍රෙති ජිහ්‍රීතඃ ජිහ්‍රියති යනු ලට් ප්‍රථම පුරුෂ යි. (ද්විත්වයෙහි පූර්ව හකාරයට "කුහොශ් චුඃ" යි ඣකාර ව ඊට ජකාරය වේ.) ජිහ්‍රීයාත්, ජිහ්‍රෙතු යනු විධි ලිඞ්- ලොට් ප්‍ර: එක වචන යි. අජිහ්‍රෙත් අජිහ්‍රීතාම් අජිහ්‍රයුඃ යනු ලඞ් ප්‍රථම පුරුෂ යි. ජිහ්‍රාය ජිහ්‍රියතුඃ ජිහ්‍රියුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. ජිහ්‍රයාඤ්චකාර යනු ආම් ප්‍රත්‍යය වූ පක්‍ෂයෙහි ලිට් ප්‍ර: එක වචන යි. හ්‍රියාත් -පෙ- අහ්‍රෛෂීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එකවචන යි.

4. පෲ පාලන පූරණයොඃ, "පෲ" ධාතුව පාලන ය- පිරීම ය යන අර්ථ දෙක්හි වේ.

141. ඉකාරාදෙශ විධි සූත්‍ර යි. "හ්‍රස්වං ලුකි" යි 'ලුකි' යනු ද- "දෘදෙරිඃ" යි 'ඉඃ' යනු ද- "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද අනුවෘත්ත යි. ලුකි, ලුක් වීම ඇති කල්හි; සෘප්‍රොඃ, සෘ- පෲ යන ධාතුද්වය පිළිබඳ; පූර්වස්‍ය, පූර්ව රූපයට; ඉඃ, ඉකාරයෙක් වේ.

a. ලුකි සති, ලුක් ඇති කල්හි; සෘප්‍රොඃ, සෘ ගතෞ- පෲ පාලනපූරණයොඃ යන ධාතු දෙදෙනාගේ; පූර්වස්‍ය සෘකාරස්‍ය, පූර්ව සෘකාරයට; ඉකාරඃ භවති, ඉකාරය වේ. (ද්විත්ව වූ පසු පූර්ව සෘකාරයට මෙයින් ඉකාරය වේ.)

## 142. පොරුර්. (පොඃ 5-1. උර් 1-1.)

**b. පවර්ගාදුත්තරස්‍ය ඍකාරස්‍ය උර් භවති කිති ඞිති ච පරෙ. "ය්වොර්ව් හසෙ." පිපූර්තිඃ පිපුරති, පිපූර්‍යාත්, පිපර්තු- පිපූර්තාත් පිපූර්තාම් පිපුරතු, පිපූර්හි, අපිපඃ.**

**c. "ඍප්‍රොර්දිසොස්‍යාරඩාගමො වා වක්තව්‍යඃ" ඉති කෙචිත්. අපිපරත් අපිපූර්තාම් අපිපරුඃ, අපිපඃ- අපිපරඃ අපිපූර්තම් අපිපූර්ත, අපිපරම් අපිපූර්ව අපිපූර්ම. පපාර.**

---

(මේ සූත්‍රය "ඍප්‍රොරිඃ පූර්ණස්‍ය" යි සාරස්වතයන්හි පෙණෙයි. එහෙත් සූත්‍රපාඨයෙහි දක්වෙනුයේ "ඍප්‍රොඃ" යි පමණෙකි. "ඉඃ පූර්ණස්‍ය" යනු සමීප සූත්‍රවලින් අනුවෘත්ත කරගත හැකි හෙයින් සූත්‍ර පාඨය අනුව මෙහි යොදන ලදි. "රඃ" යන සූත්‍රයෙන් වන අකාරාදෙශය මෙයින් වළකී.) "ගුණඃ" යන සූත්‍රයෙන් ගුණ වේ. පිපර්ති යනු ලට් ප්‍රඃ එකවචන යි.

142. උර් ආදෙශ විධි සූත්‍ර යි. "ඍත ඉර්" යි 'ඍතඃ' යනු ද- "පූර්ණස්‍ය ක්ඞිති ඛසෙ ධඃ" යි 'ක්ඞිති' යනු ද අනුවෘත්ත යි. ක්ඞිති, කිත්- ඞිත් පර කල්හි; පොඃ, පවර්ගයා කෙරෙන් පර වූ; ඍතඃ, ඍකාරයට; උර්, උර් යනාදෙශ වේ.

b. කිති ඞිති ච පරෙ, කිත් වූ ද- ඞිත් වූ ද ප්‍රත්‍යය පර කල්හි; පවර්ගාත් උත්තරස්‍ය, පවර්ගයා කෙරෙන් පර වූ; ඍකාරස්‍ය, ඍකාරයට; උර් භවති, උර් ආදෙශ වේ. "යොර්ව් හසෙ" යන සූත්‍රයෙන් උකාරයට දීර්ඝ වේ. පිපූර්තිඃ පිපුරති යනු ද්වි- බහු වචන යි. පිපූර්‍යාත් යනු විධිලිඞ් ප්‍රඃ එක වචන යි. පිපර්තු- පිපූර්තාත් පිපූර්තාම් පිපුරතු යනු ලොට් ප්‍රථම පුරුෂ යි. පිපූර්හි යනු මඃ එක වචන යි. අපිපඃ යනු ලඞ් ප්‍රඃ එක වචන යි. ("දිසොස්‍යාභ්‍යාත්" යි දිප්- සිප් ලොප් ව "ස්‍රොර්විසර්ගඃ" යි රකාරයට විසර්ග වේ.)

c. ඍප්‍රොඃ, ඍ- පෘ ධාතු දෙදෙනාගේ; දිසොස්‍යාඃ, දිප්- සිප් දෙක සම්බන්ධ ව; අඩාගමඃ, අට් ආගමය; වා වක්තව්‍යඃ ඉති, විකල්පයෙන් කියයුතු යැයි; කෙචිත්, සමහරු කියත්. (දිප්-සිප් දෙකට පෙරටු ව අකාරයෙක් ආගම වේ. එකල්හි දිප්-සිප් ලොපය නොවේ.) අපිපරත් යනු ඒ මතයෙහි ලඞ් ප්‍රඃ එක වචන යි. අපිපූර්තාම් අපිපරුඃ යනු ප්‍රඃ ද්වි- බහු වචන යි. අපිපඃ -පෙ- අපිපූර්ම යනු මධ්‍යම- උත්තම පුරුෂ යි. පපාර යනු ලිට් ප්‍රඃ එක වචන යි.

**4. “ඍසංයොගාණ්ණාදෙරකිත්ත්වං වාච්‍යම්.” කිත්ත්වා භාවාද් ගුණඃ. පපරතුඃ පපරුඃ, පපරිථ, ප්‍රූයසීාත්, “ඊටො ග්‍රහාම්” පරීතා- පරිතා, පරීෂ්‍යති- පරිෂ්‍යති, අපරීෂ්‍යත්- අපරිෂ්‍යත්, අපාරීත්. “වෘද්ධි හෙතෞ සාවිටො න දීඝඃ.” අපාරිෂ්ටාම්, අපාරිෂුඃ.**

**5. හ්‍රස්වො'පි පිපර්තිරසති, පිපර්ති පිපෘතඃ පිප්‍රති, පිපෘයාත්, පිපර්තු, අපිපඃ- අපිපරත් අපිපෘතාම් අපිපරුඃ, අපිපඃ- අපිපරඃ, පපාර පප්‍රතුඃ පප්‍රුඃ, ඍශනාරිඞ්. ප්‍රියාත්, පතිාං. “හනෘතඃ ස්‍යපඃ.” පරිෂ්‍යති, අපරිෂ්‍යත්, අපාර්ෂිත්.**

---

4. ඍ සංයොගාත්, ඍකාරාන්ත ධාතු ය- සංයොගාන්ත ධාතු ය යන මෙයින් පර වූ; ණාදෙඃ, ණබාදිහුගේ; අකිත්ත්වං, අකිත්ත්වය හෙවත් කිත් නො වන බව; වාච්‍යම්, කියයුතු යි. (“ඍ සංයොගාන්ත” යන සූත්‍රයෙන් කියන ලද්ද ම මෙයින් සිහි පත් කළහ.) කිත්ත්වාභාවාත්, කිත් නො වන බැවින්; ගුණඃ, ගුණ වේ. පපරතුඃ, පපරුඃ යනු ද්වි- බහු වචන යි. පපරිථ යනු ම: එක වචන යි. ප්‍රූයසීාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. “ඊටො ග්‍රහාම්” යන සූත්‍රයෙන් ඉඩාගමයට විකල්පයෙන් ඊකාරය වේ. පරීතා- පරිතා, පරීෂ්‍යති- පරිෂ්‍යති, අපරීෂ්‍යත්- අපරිෂ්‍යත් යනු දෙක බැගින් ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි.

වෘද්ධිහෙතෞ, වෘද්ධියට හෙතු වූ; සෞ, සි ප්‍රත්‍යය පර කල්හි; ඉටඃ, ඉඩාගමයට; න දීඝඃ, දීඝ නො වේ. (“ඊටො ග්‍රහාම්” සි ඊකාරය නොවේ.) අපාරීත් අපාරිෂ්ටාම් අපාරිෂුඃ යනු ලුඞ් ප්‍ර: එක- ද්වි- බහු වචන යි.

5. හ්‍රස්වඃ අපි, හ්‍රස්ව වූ ද; පිපර්තිඃ, පෘ ධාතුවෙක්; අසති, ඇත්තේ ය. පිපර්ති පිපෘතඃ පිප්‍රති යනු එහි ලට් ප්‍රථම පුරුෂ යි. පිපෘයාත්, පිපර්තු යනු විධිලිඞ්- ලොට් ප්‍ර: එකවචන යි. අපිපඃ- අපිපරත් අපිපෘතාම් අපිපරුඃ යනු ලඞ් ප්‍රථම පුරුෂ යි. අපිපඃ- අපිපරඃ යනු ම: එකවචන යි. පපාර පප්‍රතුඃ පප්‍රුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. (කිත් බැවින් ගුණ නො වේ.) ඍතඃ, ඍකාරයට; රිඞ්, “යාදෘදෙඃ” සි රිඞාදෙශ වේ. ප්‍රියාත්, පතීා යනු ආශීර් ලිඞ්- ලුට් ප්‍ර: එක වචන යි. “හනෘතඃ ස්‍යපඃ” යන සූත්‍රයෙන් ඉඩාගම වේ. පරිෂ්‍යති, අපරිෂ්‍යත්, අපාර්ෂිත් යනු ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එක වචන යි. (පෘ ධාතුව අනිට් ද- පෲ ධාතුව සෙට් ද වෙයි. එහෙත් ලෘට්- ලෘඞ් දෙකෙහි පෘ ධාතුව ද “හනෘතඃ ස්‍යපඃ” සි ඉඩාගමයෙන් වරතැගේ.)

**6. ඔහාක් ත්‍යාගෙ, ඔකාවිතෞ, ජහාති.**

**143. වෙසෙතෞ.** (ද්‍රාවිඃ 6-1. තෙඃ 1-2.)

**a. (ලොපො'නුවත්තෙ * ඊකාරශච.) ද්විරුක්තස්‍ය ධාතොරාකාරස්‍ය ලොපො භවති ඞිති සවරෙ, ඊකාරශච ඞිති හසෙ පරෙ. ජහිතඃ.**

**b. "ජහාතෙරාකාරස්‍ය ක්ඞිති හසෙ × ඉචා වාච්‍යඃ." ජහිතඃ ජහති.**

---

6. ඔහාක් ත්‍යාගෙ, "ඔහාක්" ධාතුව ත්‍යාගයෙහි හෙවත් හැරීමෙහි වේ. ඔකෞ ඉතෞ, ඔකාර- කකාර දෙක ඉත් ය. ජහාති යනු ලට් ප්‍ර: එක වචන යි.

143. ලොප හා ආදෙශ විධි සූත්‍ර යි. "ඊ හසෙ" – "ලොපඃ" යන සූත්‍රවය ද– "නාතඃ" යි 'ආතඃ' යනු ද– "ඞිත්‍යදඃ" යි 'ඞිති' යනු ද අනුවෘත්ත යි. ඞිති, ඞිත් (සවරය)පර කල්හි; ද්වොඃ, ද්විරුක්ත ධාතු හුගේ; ආතඃ, ආකාරයට; ලොපඃ, ලොපය ද; හසෙ, (ඞිත් වූ) ව්‍යඤ්ජනය පර කල්හි; ඊ, ඊකාරය ද (යන); තෞ, ඒ දෙදෙන වෙත්.

a. ලොපඃ, 'ලොපඃ' යනු ද; ඊකාරශච, 'ඊ' යනු ද; අනුවත්තෙ, අනුවෘත්ත වේ. ඞිති සවරෙ පරෙ, ඞිත් සංඥ සවරය පර කල්හි; ද්විරුක්තස්‍ය ධාතොඃ, ද්විරුක්ත ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාරයට; ලොපඃ භවති, ලොප් වේ. ඞිති හසෙ පරෙ, ඞිත් වූ හස ප්‍රත්‍යාහාරය පර කල්හි; ඊකාරශච, ඊකාරාදෙශය ද වේ.

(මීට "ඊ හසෙ" යන්න පමණක් අනුවෘත්ත කොට එක කාර්‍ය්‍යක් පමණක් දැක්විය හැකි හෙයින් සූත්‍රයෙහි "තෞ" යනු යොදන ලදි. එසේ ම සූත්‍රයට "සවරෙ" යනු අනුවෘත්ත නො වන නමුත් ඞිත් වූ ව්‍යඤ්ජනය පර කල්හි ආකාරයට ඊකාරාදෙශය වන බව කී කල්හි ආකාරය ලොප් වන්නේ ඞිත් සවරය පර කල්හි ය යනු එයින් ම හැගේ.) ජහිතඃ යනු ද්වි වචන යි.

b. ක්ඞිති හසෙ, කිත් වූ ද– ඞිත් වූ ද හසප්‍රත්‍යාහාරය හෙවත් ව්‍යඤ්ජනය පර කල්හි, ජහාතෙඃ, 'හා' ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාරයට; ඉඃ, ඉකාරාදෙශය; වා වාච්‍යඃ, විකල්පයෙන් කියයුතු යි. ජහිතඃ යනු එසේ ඉකාරාදෙශයෙන් සිද්ධ ලට් ප්‍ර: ද්වි වචන යි. ජහති යනු බහු වචන යි.

---

* ඉකාරශ්ච- පොත්හි. × ඊචා- පොත්හි.

**"ජහාතෙඊාදෘදවාලොපො වාච්‍යඃ." ජහ්‍යාත්, ජහාතු- ජහිතාත්- ජහිතාත් ජහිතාම්- ජහිතාම් ජහතු.**

**144. ඊර්වා හෞ.** (ඊඃ 1-1. වා -හි. හෞ 7-1.)

**a. ජහාතෙ හෞ පරෙ ඊකාරඃ සිද්ධ එව, පක්‍ෂෙ ආකාරෙකාරෞ භවතඃ. ජහීහි- ජහිහි- ජහාහි, අජහාත් අජහීතාම්- අජහිතාම් අජහුඃ, ජහෞ ජහතුඃ ජහුඃ, ජහිථ- ජහාථ, "දෘදෙරෙඃ" හෙයාත්, හාතා, හාස්‍යති, අහාස්‍යත්, අහාසීත්.**

---

යාදෘදෞ, (විධිලිඞ්) යාත් ආදිය පර කල්හි; ජහාතෙඃ, හා ධාතුහුගේ; ආලොපඃ, ආකාරලොපය; වාච්‍යඃ, කියයුතු යි. ජහ්‍යාත් යනු විධි ලිඞ් ප්‍ර: එකවචන යි. ජහාතු- ජහිතාත්- ජහිතාත්, ජහීතාම්- ජහිතාම්, ජහතු යනු ලොට් ප්‍රථම පුරුෂ යි.

144. ඊ ආදෙශ විකල්ප විධි සූත්‍ර යි. "ආතඃ" යි "ආ" යනු ලුප්ත විභක්තික ෂෂ්ඨ්‍යන්ත වචන වශයෙන් අනුවෘත්ත වේ. හෞ, හි ප්‍රත්‍යය පර කල්හි; ආ, ආකාරයට; වා, විකල්පයෙන්; ඊඃ, ඊකාරය; වේ.

a. හෞ පරෙ, හි ප්‍රත්‍යය පර කල්හි; ජහාතෙඃ, හා ධාතුහුගේ ආකාරයට; ඊකාරඃ, ඊකාරය; සිද්ධඃ එව, ("වෙසොතෞ" යන සූත්‍රයෙන්) සිද්ධ ම ය; පක්‍ෂෙ, පක්‍ෂයෙක්හි; ආකාර + ඉකාරෞ, ආකාර- ඉකාර දෙදෙන; භවතඃ, වෙත්.

(මෙයින් ඊ ආදෙශය විකල්ප කෙරෙති. "ජහාතෙරාකාරස්‍ය ක්ඞිති හසෙ ඉඊා වාච්‍යඃ" යි ආකාරයට වන ඉකාරය ද විකල්පයෙන් වේ. එබැවින් ඒ දෙක හැර "ජහාහි" යි ප්‍රකෘති රූපයක් ද සිටී.) "ජහීහි- ජහිහි- ජහාහි" යනු ලොට් මධ්‍යම පුරුෂ එකවචන යි.

සිද්ධාන්ත චන්ද්‍රිකා තත්ත්ව දීපිකාවෙහි "ඊ + ඉඃ + වා + හෞ"යි මේ සූත්‍රය චතුෂ්පද කොට දක්වන ලදී. එකල්හි සූත්‍රාර්ථය:- ඊ, ඊකාරය ද; ඉඃ, ඉකාරය ද වේ කියා ගතයුතු යි.)

අජහාත් අජහීතාම්-අජහිතාම් අජහුඃ යනු ලඞ් ප්‍රථම පුරුෂ යි. ජහෞ ජහතුඃ ජහුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. ("ආතො ණප් ඩෞ" යි ඩෞ ආදෙශයෙන් හා ටිසංඥලොපයෙන් "ජහෞ" යනු සිද්ධ ය.) ජහිථ- ජහාථ යනු මː එක වචන යි. "දෘදෙරෙඃ" යන සූත්‍රයෙන් ආශීර් ලිඞ් යාත් ආදිය පර කල්හි ආකාරයට එකාරය වේ. හෙයාත්, හාතා, හාස්‍යති, අහාස්‍යත්, අහාසීත් යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එක වචන යි.

**7. ඍ ගතෞ. “ඍප්‍රොඃ.”**

**b. අසවර්ණේ ස්වරෙ පූර්වස්‍ය ඉයාදෙශො භවති. ඉයර්ති ඉයෘතඃ ඉය්‍රති, ඉයෘයාත්, ඉයර්තු- ඉයෘතාත් ඉයෘතාම් ඉය්‍රතු, ඉයෘහි- ඉයෘතාත් ඉයෘතම් ඉයෘත, ඉයරාණි ඉයරාව ඉයරාම, ඓයඃ- ඓයරත් ඓයෘතාම් ඓයරුඃ, ඓයඃ- ඓයරඃ ඓයෘතම් ඓයෘත, ඓයරම් ඓයෘව ඓයෘම.**

**c. “රඃ.” වෘද්ධිඃ. ආර. “* ගුණොර්ති සංයොගාද්‍යොඃ.” ආරතුඃ ආරුඃ, අර්‍යාත්, අර්තා, අරිෂ්‍යති, ආරිෂ්‍යත්. ඍදෘශොඃ පුෂාදිත්වාද් ඞ ප්‍රත්‍යයඃ. සෙරපවාදඃ. ගුණඃ. ආරත්.**

**ඉති ජුහොත්‍යාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා.**

———o———

7. ඍ ගතෞ, “ඍ” ධාතුව ගමනෙහි වේ. “ඍප්‍රොඃ” යන සූත්‍රයෙන් පූර්ව ඍකාරයට ඉකාර වේ.

b. අසවර්ණේ ස්වරෙ, අසවර්ණ ස්වරය පර කල්හි; පූර්වස්‍ය, පූර්ව ඉකාරයට; ඉයාදෙශඃ භවති, ඉය් ආදෙශ වේ. ඉයර්ති ඉයෘතඃ ඉය්‍රති යනු ලට් ප්‍රථම පුරුෂ යි. ඉයෘයාත් යනු විධිලිඞ් ප්‍රඃ එක වචන යි. ඉයර්තු -පෙ- ඉයරාම යනු ලොට් පරස්මෛ පද යි. ඓයඃ -පෙ- ඓයෘම යනු ලඞ් පරස්මෛ පද යි. (අඩාගම ද්වයෙකි. “ඍප්‍රොර්දිස්‍යො රඩාගමො වා වක්තව්‍යඃ” යි කී හෙයින් දිප්- සිප් දෙක සම්බන්ධ ව විකල්පයෙන් අඩාගම වීමෙන් “ඓයඃ- ඓයරත්, ඓයඃ- ඓයරඃ” යි රූප ද්වය බැගින් ලැබේ.)

c. “රඃ” යන සූත්‍රයෙන් ද්විත්වයෙහි පූර්ව ඍකාරයට අකාරය වේ. වෘද්ධිඃ, “ධාතොර්නාමිනඃ” යි වෘද්ධි වේ. (“සවර්ණේ දීර්ඝඃ සහ” යි දීර්ඝ වේ.) ආර යනු ලිට් ප්‍රඃ එක වචන යි. “ගුණොර්ති සංයොගාද්‍යොඃ” යන සූත්‍රයෙන් ගුණ වේ. ආරතුඃ ආරුඃ යනු ද්වි- බහු වචන යි. අර්‍යාත්, අර්තා, අරිෂ්‍යති, ආරිෂ්‍යත් යනු ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන යි. ඍදෘශොඃ, ඍ- දෘශ් ධාතු ද්වය; පුෂාදිත්වාත්, පුෂාදිය බැවින්; ඞ ප්‍රත්‍යයඃ, ඞ ප්‍රත්‍යය වේ. සෙඃ අපවාදඃ, සි ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. ගුණඃ, (× “දෘශාදෙර්ඞෙ ගුණඃ” යි කී බැවින්) ගුණ වේ. ආරත් යනු ලුඞ් ප්‍රඃ එක වචන යි.

ජුහොත්‍යාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා, ජුහොත්‍යාදි ගණයෙහි පරස්මෛපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

———o———

* “අර්ති සංයොගාද්‍යොඃ” යනු සූත්‍ර යි. “ගුණඃ” යනු අනුවෘත්ත යි.

× “සාවර්ණිදෘශොර්ඞෙ ගුණඃ” සි: ච: “ඍදෘශො‘ඞි ගුණඃ” පා:7: 4: 16.

**a. අථාත්මනෙපදිනඃ:-**

**1. ඔහාඞ් ගතෞ.**

## 145. හාඃඤ්‍යං ලුකි. (හාඃඤ්ම් 6-3. ලුකි. 7-1.)

**b. ඩුභෘඤ් ධාරණ පොෂණයොඃ, ඔ හාඞ් ගතෞ, මාඞ් මානෙ ඉත්‍යෙතෙෂාං පූර්වස්‍යාකාරස්‍ය ඉකාරො භවති ලුකි සති.**

**c. "ද්වෙසෙනෞ" ජිහිතෙ ජිහාතෙ ජිහතෙ, ජිහිත, ජිහිතාම්, අජිහිත අජිහාතාම්, ජහෙ, හාසීෂ්ට, හාතා, හාස්‍යතෙ, අහාස්‍යත, අහාසත අහාසාතාම් අහාසත.**

---

a. අථ, පරස්මෛපදි ප්‍රක්‍රියාවට අනතුරු ව; ආත්මනෙපදිනඃ, ආත්මනෙපදි ධාතූහු දක්වනු ලැබෙත්:-

1. ඔ හාඞ් ගතෞ, ඔකාර- ඞකාරානුබන්ධ "හා" ධාතුව ගමන්හි වේ. ඔකාරය "ඌදොදෙනිතශච" යි නිෂ්ඨා තකාරයට නකාරය වීමටය. ඞකාරය ආත්මනෙපදි බවට ය.

*145.* ඉකාරාදෙශ විධි සූත්‍ර යි. "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද- "යසෙස" යි 'ඉ- අඃ' යනු ද අනුවෘත්ත යි. ලුකි, ලුක් වීම ඇති කල්හි; භෘඤ්ම්, භෘඤ් ආදි ධාතූන්ගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධවූ; අඃ, අකාරය තෙමේ; ඉ, ඉකාරයෙක් වේ.

b. ලුකි සති, ලුක් වීම ඇති කල්හි; ඩු භෘඤ් ධාරණපොෂණයොඃ, ධාරණ- පොෂණ අර්ථ දෙක්හි වූ 'ඩුභෘඤ්' ධාතුව ය; ඔහාඞ් ගතෞ, ගමන්හි වූ 'ඔහාඞ්' ධාතුව ය; මාඞ් මානෙ ඉති, ප්‍රමාණයෙහි වූ 'මාඞ්' ධාතුව ය යන; එතෙෂාම්, මොවුන්ගේ; පූර්වස්‍ය අකාරස්‍ය, පූර්ව අකාරයට; ඉකාරඃ භවති, ඉකාරය වේ. (සූත්‍රයෙහි "භෘඤ්ම්" යන බහු වචනය ආද්‍යර්ථ යි. එබැවින් "භෘඤ් ආදීන්ගේ" යන අර්ථය ලැබේ.)

c. "ද්වෙසෙනෞ" යන සූත්‍රයෙන් ඕත් ස්වරය පර කල්හි ආකාර ලොපය ද- ඕත් ව්‍යඤ්ජනය පර කල්හි ආකාරයට ඊකාරාදෙශය ද වේ. ජිහීතෙ ජිහාතෙ ජිහතෙ යනු ලට් ආ: ප්‍රථම පුරුෂ යි. ජිහීත, ජිහීතාම් යනු විධි ලිඞ්- ලොට් ආ: ප්‍ර: එක වචන යි. අජිහිත අජිහාතාම් යනු ලඞ් ආ ප්‍ර: එක-ද්වි වචන යි. ජහෙ -පෙ- අහාස්‍යත යනු ලිට් -පෙ- ලෘඞ් ආ: ප්‍ර: එක වචන යි. අහාසත අහාසාතාම් අහාසත යනු ලුඞ් ආ: ප්‍රථම පුරුෂ යි.

**2. මාඞ් මානෙ. මිමීතෙ මිමාතෙ මිමතෙ. මිමීත, මිමීතාම්, අමිමීත, මමෙ, මාසීෂ්ට, මාතා, මාස්‍යතෙ, අමාස්‍යත, අමාස්ත.**

**ඉති ජුහොත්‍යාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා.**

---

**a. අථොභය පදිනඃ:-**

**1. ඩු භෘඤ් ධාරණ පොෂණයොඃ, ඩුඤ,විතෞ.**

**b. බිභර්ති බිභෘතඃ බිභ්‍රති, බිභෘතෙ, බිභෘයාත්-බිභ්‍රීත, බිභර්තු- බිභෘතාම්. අබිභඃ අබිභෘතාම් අබිභරුඃ, අබිභෘත. බභාර බභ්‍රතුඃ බභ්‍රුඃ, බභර්ථ,- බභ්‍රෙ, බිභරාඤ්චකාර- බිභරාඤ්චක්‍රෙ.**

---

2. මාඞ් මානෙ, ඞකාරානුබන්ධ "මා" ධාතුව ප්‍රමාණ කිරීමෙහි වේ. මිමීතෙ මිමාතෙ මිමතෙ යනු ලට් ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. මිමීත -පෙ- අමාස්ත යනු පිළිවෙළින් විධිලිඞ් -පෙ- ලුඞ් ආත්මනෙපද ප්‍රථම පුරුෂ එක වචන යි.

ජුහොත්‍යාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා, ජුහොත්‍යාදි ගණයෙහි ආත්මනෙපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

---

a. අථ, අනතුරු ව; උභය පදිනඃ, උභයපදි ධාතූහු දක්වනු ලැබෙත්:-

1. ඩු භෘඤ් ධාරණ පොෂණයොඃ "ඩු භෘඤ්" ධාතුව දැරීම ය-පොෂණය කිරීම ය යන අර්ථ දෙක්හි වේ. ඩුඤෞ ඉතෞ, ඩුකාර-ඤකාර දෙදෙන ඉත් වෙත්. (ඩුකාරය "ඞ්විතඃ ක්ත්‍රිමක්" යි ත්‍රිමක් ප්‍රත්‍යය වීමට ය; ඤකාරය උභයපදි බවට ය.)

b. බිභර්ති බිභෘතඃ බිභ්‍රති යනු ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂ යි. (ද්විත්වයෙන් පසු "භෘ භෘ + තිප්" යි සිටි කල්හි "රඃ" යි පූර්ව ඍකාරයට අකාරය වේ. "ඛ්‍යාපානාං ජබ චපාඃ" යි පූර්ව භකාරයට බකාරය වේ. "භෘඤාං ඉත්" යි "රඃ" යන්නෙන් වූ අකාරයට ඉකාරය වේ. "ගුණඃ" යි ගුණ වේ. එවිට "බිභර්ති" යි සිද්ධ යි. සෙස්ස ද ඒ අනුව දතයුතු යි.) බිභෘතෙ යනු ආ: ප්‍ර: එක වචන යි. බිභෘයාත්- බිභ්‍රීත, බිභර්තු- බිභෘතාම් යනු විධිලිඞ්- ලොට් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂ එක වචන යි. අබිභඃ අබිභෘතාම් අබිභරුඃ යනු ලඞ් පරස්මෛපද ප්‍රථම පුරුෂ යි. අබිභෘත යනු ආත්මනෙපද ප්‍ර: එක වචන යි. බභාර බභ්‍රතුඃ බභ්‍රුඃ යනු ලිට් පරස්මෛපද ප්‍රථම පුරුෂ යි. බභර්ථ යනු ම: එක වචන යි.

**බිභරාමාස- බිභරාම්බභූව. "යාදෘදෙඃ" හ්‍රියාත්- හෘෂීෂ්ට, හර්තා- හර්තා, "හනෘතඃ ස්‍යපඃ" හරිෂ්‍යති- හරිෂ්‍යතෙ, අහරිෂ්‍යත්- අහරිෂ්‍යත, අහාර්ෂීත්. "උඃ". අහෘත.**

**2. ඩු දාඤ් දානෙ. දදාති.**

## 146. දාදෙඃ. (දාදෙඃ 6-1.)

**a. ද්විරුක්තස්‍ය දාදෙර් ධාතො රාකාරස්‍ය ලොපො භවති ඞිති පරෙ. දත්තඃ දදති, දත්තෙ දදාතෙ, දදතෙ, දද්‍යාත්- දදීත, දදාතු- දත්තාද්වා දත්තාම් දදතු.**

## 147. දාං හෞ. (දාම් 6-3. හෞ 7-1.)

---

බභ්‍රෙ යනු ආ: ප්‍ර: එක වචන යි. බිභරාඤ්චකාර- බිභරාමාස- බිභරාම්බභූව යනු ආම් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ ප: ප්‍ර: එක වචන යි. බිභරාඤ්චක්‍රෙ යනු ආ: ප්‍ර: එක වචන යි. "යාදෘදෙඃ." යන සූත්‍රයෙන් රිඩාදෙශ වේ. හ්‍රියාත්- හෘෂීෂ්ට, හර්තා- හර්තා යනු ආශීර්ලිඞ්-ලුට් ප: ආ: ප්‍ර: එක වචන යි. "හනෘතඃ ස්‍යපඃ." යන සූත්‍රයෙන් ඉඩාගම වේ. හරිෂ්‍යති- හරිෂ්‍යතෙ, අහරිෂ්‍යත්- අහරිෂ්‍යත යනු ලෘට්-ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. අහාර්ෂීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. "උඃ" යන සූත්‍රයෙන් ගුණ ප්‍රතිෂෙධය වේ. අහෘත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ එක වචන යි.

2. ඩුදාඤ් දානෙ, ඩුකාර- ඤකාරානුබන්ධ "දා" ධාතුව දීමෙහි වේ. දදාති යනු ලට් ප්‍ර: එක වචන යි.

146. ආකාරලොප විධි සූත්‍ර යි. "උසස්‍යාලොපඃ." යි 'ආලොපඃ, යනු ද- "ඞිත්‍යද්‍රුඃ" යි 'ඞිති' යනු ද- "ද්වෙඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. ඞිති, ඞිත් පර කල්හි; ද්වෙඃ, ද්විරුක්ත වූ; දාදෙඃ, දා ආදි ධාතුහුගේ; ආ ලොපඃ, ආකාර ලොපය වේ.

a. ඞිති පරෙ, ඞිත් පර කල්හි; ද්විරුක්තස්‍ය, ද්විරුක්ත වූ; දාදෙඃ ධාතොඃ, දා ආදි ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාරයට; ලොපඃ භවති, ලොප් වේ. (ලඞාදි සතරෙහි ස්වරාදි වූ හෝ ව්‍යඤ්ජනාදි වූ ඞිත් සංඥ ප්‍රත්‍යය පර කල්හි මෙයින් ආකාර ලොපය වේ. මෙය "ද්වෙසෙනෞ" යන සූත්‍රයට අපවාද යි. "ධසෙ චපා ඣසානාම්" යි පර දකාරයට තකාරය වේ.)

දත්තඃ දදති යනු ද්වි වචන-බහු වචන යි. දත්තෙ දදාතෙ දදතෙ යනු ආ: ප්‍රථම පුරුෂ යි. දද්‍යාත්- දදීත යනු විධිලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. දදාතු-දත්තාත් දත්තාම් දදතු යනු ලොට් ප: ප්‍රථම පුරුෂ යි.

b. දධොරාකාරස්සෙකාරො භවති පූර්වස්‍ය ච ලොපො භවති හෞ පරෙ.

c. දෙහි, දදානි, අදදාත් අදදාම් අදදුඃ, අදත්ත, දදෞ- දදෙ, දෙයාත්- දාසීෂ්ට, දාතා- දාතා, දාස්‍යති- දාස්‍යතෙ, අදාස්‍යත්- අදාස්‍යත, "දාදෙඃ පෙ." අදාත් අදාම් අදුඃ. "දාධාස්ථාමිත්වං සෙර්ඝිත්ත්වම්." ඝිත්ත්වාන්න ගුණඃ, "*හ්‍රස්වාජ්ඣසෙ." අදිත අදිෂාතාම් අදිෂත.

3. ඩුධාඤ් ධාරණ පොෂණයොඃ, දධාති. "දාදෙඃ"

---

147 ලොප හා ආදෙශ විධි සූත්‍ර සි. "ලොපඃ පචාං කිතොය චාස්‍ය" සි 'ලොපඃ- එ' යනු ද- "පූර්වස්‍ය හලාදිඃ ශෙෂඃ" සි 'පූර්වස්‍ය' යනු ද- අනුවෘත්ත සි. හෞ, හි ප්‍රත්‍යය පර කල්හි; දාම්, දා ආදි ධාතූන්ගේ අන්තයට; එ, එකාරාදෙශ වේ. පූර්වස්‍ය, පූර්ව රූපයට; ලොපඃ, ලොප් වේ.

b. හෞ පරෙ, හි ප්‍රත්‍යය පර කල්හි; දාධොඃ, දා- ධා යන ධාතු ද්වය පිළිබඳ; ආකාරස්‍ය, ආකාරයට; එකාරඃ භවති, එකාරය වේ. පූර්වස්‍ය ච, (ද්විත්වයෙහි) පූර්ව රූපයට ද; ලොපඃ භවති, ලොප් වේ. (සූත්‍රයෙහි "දාම්" සි බහුවචන ග්‍රහණය දා- ධා යන ධාතු දෙක ම ගැණීම පිණිස ය.)

c. දෙහි යනු ම: එක වචන සි. දදානි යනු ආ: ප්‍ර: එක වචන සි. අදදාත් අදදාම් අදදුඃ යනු ලඞ් ප: ප්‍රථම පුරුෂ සි. අදත්ත යනු ආ: ප්‍ර: එක වචන සි. දදෞ - දදෙ -පෙ- අදාස්‍යත්- අදාස්‍යත යනු දෙක බැගින් ලිට් -පෙ- ලෘඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂ එක වචන සි. "දාදෙඃ පෙ" යන සූත්‍රයෙන් සි ප්‍රත්‍යය ලොප් වේ. අදාත් අදාම් අදුඃ යනු ලුඞ් ප: ප්‍රථම පුරුෂ සි.

දාධාස්ථාම්, දා- ධා- ස්ථා යන ධාතූන්ගේ අන්ත (ආකාර)යට; ඉත්වම්, ඉකාර බව වේ. සෙඃ, (ආත්මනෙ පදයෙහි) සි ප්‍රත්‍යයාගේ; ඝිත්ත්වම්, ඝිත් බව වේ. ඝිත්ත්වාත්, ඝිත් බැවින්; න ගුණඃ, ගුණ නො වේ. "හ්‍රස්වාජ්ඣසෙ" යන සූත්‍රයෙන් සි ප්‍රත්‍යය ලොප් වේ. අදිත අදිෂාතාම් අදිෂත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ සි.

3. ඩුධාඤ් ධාරණපොෂණයොඃ, ඩුකාර- ඤකාරානුබන්ධ "ධා" ධාතුව දැරීම ය- පොෂණය කිරීම ය යන අර්ථ දෙක්හි වේ. දධාති යනු ලට් ප: ප්‍ර: එක වචන සි. (ද්විවචනාදියෙහි) "දාදෙඃ" යන සූත්‍රයෙන් ආකාර ලොප් වේ.

---

* ලොපො හ්‍රස්වාජ්ඣසෙ- පොත්හි, ලොපඃ යනු අනුවෘත්ත සි.

## 148. පූර්වස්‍ය ක්ඩිති * ඛසෙ ධඃ.

(පූර්වස්‍ය 6-1. ක්ඩිති 7-1. ඛසෙ 7-1. ධඃ 1-1.)

**a. ඛභාන්තස්‍ය දධාතෙඃ පූර්ව දකාරස්‍ය ධකාරෙ භවති, කිති ඩිති ඛසෙ පරෙ.**

**b. ධත්තඃ දධති- ධත්තෙ, දධ්‍යාත්- දධීත, දධාතු, ධෙහි, ධත්තාම්, අදධාත්, අදධාඃ, අධත්ත, දධෞ- දධෙ, ධෙයාත්- ධාසීෂ්ට, ධාතා- ධාතා, ධාස්‍යති- ධාස්‍යතෙ, අධාස්‍යත්- අධාස්‍යත, "දුදෙඃ පෙ." අධාත්- අධිත.**

**4. ණිජිර් ශෞචපොෂණයොඃ, ඉඩිත්. "ආදෙඃ ෂ්ණඃ ස්නඃ."**

---

148. ධකාරාදෙශ විධි සූත්‍ර යි. "දධාතෙර්හිඃ" සි "දධාතෙඃ" යනු අනුවෘත්ත යි. ක්ඩිති ඛසෙ, කිත්- ඩිත් වූ ඛස ප්‍රත්‍යාහාරය පර කල්හි; දධාතෙඃ, ධා ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව රූපයට; ධඃ, ධකාරය වේ.

a. ක්ඩිති ඛසෙ පරෙ, කිත්-ඩිත් වූ ඛසප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; ඛභාන්තස්‍ය, ඛභප්‍රත්‍යාහාර වර්ණයක් අන්ත කොට ඇති; දධාතෙඃ, ධා ධාතුහුගේ; පූර්ව දකාරස්‍ය, පූර්ව වූ දකාරයට; ධකාරඃ භවති, ධකාරය වේ.

(ධා ධාතුවට ද්විත්ව වූ පසු "ඛපාතාං ජබ චපාඃ"යි පූර්ව ධකාරයට දකාරය ව ඊට මෙයින් ධකාරය වේ. මේ ආදෙශය වන්නේ ධා ධාතුව පිළිබඳ දකාරයට ම ය. "ධධ් + තස්" යි සිටි කල්හි "ධා" ධාතුව හැර "=දධාතිං විනා" යයි කී හෙයින් "තථොර්ධඃ" යි තකාරයට ධකාරය නො වේ. "ඛසෙ චපාඃ-" යනාදීන් පර ධකාරයට තකාරය වේ.)

b. ධත්තඃ දධති යනු ලට් ප්‍ර: ද්වි- බහු වචන යි. ධත්තෙ යනු ආ: ප්‍ර: එක වචන යි. දධ්‍යාත්- දධීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර එක වචන යි. දධාතු යනු ලොට් ප: ප්‍ර: එක වචන යි. ධෙහි යනු ම:එක වචන යි. ධත්තාම් යනු ආ: ප්‍ර: එක වචන යි. අදධාත් යනු ලඞ් ප: ප්‍ර: පුරුෂයෙහි ද- අදධාඃ යනු ම: පුරුෂයෙහි ද- අධත්ත යනු ආ: ප්‍ර: පුරුෂයෙහි ද එක වචන යි. දධෞ- දධෙ -පෙ- අධාස්‍යත්- අධාස්‍යත යනු දෙක බැගින් ලිට් -පෙ- ලෘඞ් ප: ආ: ප්‍ර:. එක වචන යි. "දුදෙඃ පෙ" යන සූත්‍රයෙන් පරස්මෛපද සි ප්‍රත්‍යය ලොප් වේ. (ආත්මනෙ පදයෙහි "දුධ්‍ඃස්ථාම්-" යනාදීන් ආකාරයට ඉකාර ව "හ්‍රස්වාජ්ඣසෙ" යි සි ලොපය වේ.) අධාත්- අධිත යනු ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

---

* ඩිති- පොත්හි. මතු සූත්‍රවලට අනුවෘත්ත වනු පිණිස "ක්ඩිති" යි ගත යුතු යි. "ඤුම්ස්‍ය ක්ඩිති ඤසෙ.- ලඝුභාෂ්‍ය.

**149. නිජාං ගුණඃ.** (නිජාම් 6-3. ගුණඃ 1-1.)

a. **නිජ් විජ් විෂාං පූර්වස්‍ය ගුණො භවති ලුකි සති.**

b. **නෙනෙක්ති නෙනික්තඃ නෙනිජති, නෙනෙක්ෂි නෙනික්ථඃ නෙනික්ථ, නෙනෙජ්මි නෙනිජ්වඃ නෙනිජ්මඃ, නෙනික්තෙ, නෙනිජ්‍යාත්- නෙනිජීත, නෙනෙක්තු- නෙනික්තාත් නෙනික්තාම් නෙනිජතු, නෙනිග්ධි- නෙනික්තාත් නෙනික්තම් නෙනික්ත.**

---

4. **ණිජිර්** ශෞචපොෂණයොඃ, "ණිජිර්" ධාතුව පවිත්‍ර බව ය- පොෂණය කිරීම ය යන අර්ථ දෙක්හි වේ. ඉරිත්, "ඉර්" යනු ඉත් ය; ("ඉරිතො වා" යි පරස්මෛපදයෙහි විකල්පයෙන් ඞ ප්‍රත්‍යය වීම එහි ප්‍රයොජනය යි.) "ණාදෙඃ ෂණඃ සනඃ" යන සූත්‍රයෙන් ණකාරයට නකාරය වේ. (මේ ධාතුවෙහි ණකාරය උපදෙශයක් දැක්වීම පිණිස යොදන ලද්දකි. උපදෙශය නම් මූර්ධන්‍යත්වයට නිමිති ඇති තැන්හි ධාතුවේ නකාරයට ණකාරය වන බව ය. එබඳු ධාතුන්ට **"ණොපදෙශ ධාතු"** ය යි කියනු ලැබේ.)

149. ගුණ විධි සූත්‍ර යි. "හඃඤං ලුකි" යි 'ලුකි' යනු ද- "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද අනුවෘත්ත යි. ලුකි, විකරණයට ලුක් වීම ඇති කල්හි; නිජාම්, නිජාදි ධාතුන්ගේ, පූර්වස්‍ය, පූර්වරූපයට; ගුණඃ, ගුණ වේ.

a. ලුකි සති, ලුක්වීම ඇති කල්හි; නිජ්විජ්විෂාම්, නිජ්- විජ්- විෂ් යන ධාතුන්ගේ; පූර්වස්‍ය, පූර්ව රූපයට; ගුණඃ භවති, ගුණ වේ. (**"බහුවචන මාද්‍යර්ථම්"** යි කී හෙයින් මේ සූත්‍රයෙහි "නිජාම්" යන බහු වචනය ආද්‍යර්ථ ය. එ බැවින් නිජ්- විජ්- විෂ් යන ධාතු ත්‍රය ම ගණු ලැබේ. ඒ ධාතුන්ගේ ද්විත්වයෙහි පූර්ව රූපයට ලඞාදි සතරෙහි පුරුෂ ත්‍රය පිළිබඳ සියලු වචන .පර කල්හි මේ සූත්‍රයෙන් ගුණ වේ. ධාතුවට ගුණ වීම පෙර කී සේ "උපධායා ලඝොඃ" යනු වෙනි. "චොඃ කුඃ" යි 'ජ' හට 'ග' වේ. "ඛසෙ චපාඃ-" යනාදීන් ගකාරයට කකාරය වේ.)

b. නෙනෙක්ති -පෙ- නෙනිජ්මඃ යනු ලට් පරස්මෛපද යි. නෙනික්තෙ යනු ආ: ප්‍ර: එක වචන යි. නෙනිජ්‍යාත්- නෙනිජීත යනු විධිලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. නෙනෙක්තු -පෙ- නෙනික්ත යනු ලොට් ප: ප්‍රථම- මධ්‍යම පුරුෂ යි.

## 150. ංවෙඃ සවරේ'පි පිති නොපධායාඃ.

(ංවෙඃ 6-1. සවරෙ 7-1. අපි 7-1. පිති 7-1. න. ති. උපධායාඃ 6-1)

**a. ද්විරුක්තස්‍ය ධාතොරපි විෂයෙ පිති සවරෙ උපධායා ගුණො න භවති.**

**b. නෙනිජානි නෙනිජාව නෙනිජාම, නෙනික්තාම්, අනෙනෙක්-අනෙනෙග් අනෙනික්තාම් අනෙනිජුඃ, අනෙනික්ත නිනෙජ- නිනිජෙ නිජ්‍යාත්, "සිසෙ‍ය්‍යාඃ" නික්ෂීෂට, නෙක්තා-නෙක්තා, නෙක්ෂ්‍යති- නෙක්ෂ්‍යතෙ, අනෙක්ෂ්‍යත්- අනෙක්ෂ්‍යත, අනිජත් අනිජතාම් අනිජන්, "අනිටො 'නාමිවතඃ." අනෛක්ෂීත් අනෛක්තාම් අනෛක්ෂුඃ, අනික්ත අනික්ෂාතාම් අනික්ෂත.**

---

150. ගුණ ප්‍රතිෂෙධ විධි සූත්‍ර යි. පූර්ව සූත්‍රයෙන් 'ගුණඃ' යනු අනුවෘත්ත යි. අපි, අබ් විෂයෙහි; පිති සවරෙ, පිත් වූ සවරය පර කල්හි; ංවෙඃ, ද්විරුක්ත ධාතුහුගේ; උපධායාඃ, උපධා සංඥයට; න ගුණඃ, ගුණ නො වේ.

a. අපි විෂයෙ, අප් ප්‍රත්‍යය විෂයෙහි හෙවත් ලඞාදි සතරෙහි; පිති සවරෙ, පිත් සවරය පර කල්හි; ද්විරුක්තස්‍ය ධාතොඃ, ද්විරුක්ත ධාතුහුගේ; උපධායාඃ, උපධා සංඥයට; ගුණඃ න භවති, ගුණ නො වේ.

(මේ සූත්‍රය "ද්වෙඃ සවරෙ'පි නොපධා ගුණඃ"යි සාරසවතයන්හි පෙණෙන නමුත් සූත්‍රපාඨයෙහි දක්වෙන ලෙස මෙහි යෙදින. ලඞාදි සතරෙහි ප යන්න ඉත් කොට ඇති ප්‍රත්‍යයන් පර කල්හි ද්විත්ව ව වරනැගෙන ධාතූන්ගේ උපධා සංඥයට වන ගුණය මෙයින් වළකී.)

b. නෙනිජානි නෙනිජාව නෙනිජාම යනු ලොට් උත්තම පුරුෂ යි. නෙනික්තාම් යනු ආ: ප්‍ර: එක වචන යි. අනෙනෙක්-අනෙනෙග් අනෙනික්තාම් අනෙනිජුඃ යනු ලඞ් ප: ප්‍රථම පුරුෂ යි. අනෙනික්ත යනු ආ: ප්‍ර: එක වචන යි. නිනෙජ- නිනිජෙ යනු ලිට් ප: ආ: ප්‍ර: එක වචන යි. නිජ්‍යාත් යනු ආශීර්ලිඞ් ප: ප්‍ර: එක වචන යි. "සිසෙය්‍යාඃ" යන සූත්‍රයෙන් ගුණ ප්‍රතිෂෙධ වේ. නික්ෂීෂට යනු ආ: ප්‍ර: එක වචන යි. ("නිජ් + සීෂට" යි සිටි කල්හි "චොඃ කුඃ" යි ජකාරයට ගකාර ව "ඛසෙ චපාඃ" යි ගකාරයට කකාර ව "ක්ලාත් ෂඃ සඃ කෘතස්‍ය." යි සකාරයට ෂකාරය වීමෙන් සිඞ යි. නෙක්ෂ්‍යති යනාදියත් මෙසේ යි.) නෙක්තා-නෙක්තා, නෙක්ෂ්‍යති-නෙක්ෂ්‍යතෙ,

**5. විජිර් පෘථග්භාවෙ. වෙවෙක්ති, නෙනෙක්ති වත්.**

**6. විෂෟ ව්‍යාපෙනෟ, වෙවෙෂ්ටි- වෙවිෂෙට, වෙවිෂ්‍යාත්- වෙවිෂිත, වෙවෙෂ්ටු- වෙවිෂටාම්, අවෙවෙට්= අවෙවෙඩ්- අවෙවිෂට, විවෙෂ- විවිෂෙ, විෂ්‍යාත්- විශ්ෂිට, වෙෂ්ටා- වෙෂ්ටාං, වෙක්ෂ්‍යති- වෙක්ෂ්‍යතෙ, අවෙක්ෂ්‍යත්- අවෙක්ෂ්‍යත, "ලිත්පුෂාදෙර්ඩඃ" අවිෂත්, ඩො වෙති කොවිත්. "හශ ෂාන්තාත් සක්" අවික්ෂත්- අවික්ෂත.**

**ඉති ජුහොත්‍යාදිප්‍රභයපදි ප්‍රක්‍රියා.**

---

## ඉති ලුග්විකරණා ජුහොත්‍යාදයඃ.

---

අනෙක්ෂ්‍යත්- අනෙක්ෂ්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. අනිජත් අනිජතාම් අනිජන් යනු "ඉරිතො වා." යි ඞ ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ලුඞ් පඃ ප්‍රථම පුරුෂ යි. "අනිටො'නාම් වතඃ." යන සූත්‍රයෙන් වෘඩි වේ. අනෛක්ෂීත් අනෛක්තාම් අනෛක්ෂුඃ යනු විකල්ප පක්ෂයෙහි ලුඞ් පඃ ප්‍රථම පුරුෂ යි. අනික්ත අනික්ෂාතාම් අනික්ෂත යනු ලුඞ් ආඃ ප්‍රථම පුරුෂ යි. (ආත්මනෙ පදයෙහි ඞ ප්‍රත්‍යය නො වේ.)

5. විජිර් පෘථග්භාවෙ, ඉර් අනුබන්ධ "විජ්" ධාතුව වෙන් වීමෙහි වේ. වෙවෙක්ති යනු ලට් පඃ ප්‍රඃ එක වචන යි. නෙනෙක්ති වත්, 'නිජ්' ධාතුව මෙනි.

6. විෂෟ ව්‍යාපෙනෟ, ලනුබන්ධ "විෂ්" ධාතුව පැතිරීමෙහි වේ. ("ලිත් පුෂාදෙර්ඩඃ" යි ඞ ප්‍රත්‍යය වීම ඍකාරය ඉත් කිරීමේ ප්‍රයෝජනය යි.) වෙවෙෂ්ටි -පෙ- වෙවිෂටාම් යනු දෙක බැගින් ලට්- විධිලිඞ්- ලොට් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. (ද්විත්ව වීමෙන් "විවිෂ් + ති" යි සිටි කල්හි "නිජාං ගුණඃ." යි පූර්වයට ගුණ ව "උපධායා ලඝොඃ" යි ධාතුවට ගුණ ව ටුත්වයෙන් "වෙවෙෂ්ටි" යනාදිය සිද්ධ යි.) අවෙවෙට්- අවෙවෙඩ් යනු ලඞ් පඃ ප්‍රඃ එක වචන යි. අවෙවිෂට යනු ආඃ ප්‍රඃ එක වචන යි. විවෙෂ -පෙ- අවෙක්ෂ්‍යත යනු පිළිවෙළින් දෙක බැගින් ලිට් -පෙ- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. "ලිත් පුෂාදෙර්ඩඃ" යන සූත්‍රයෙන් පරස්මෛපදයෙහි ඞප්‍රත්‍යය වේ. අවිෂත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. ඩඃ වා ඉති, ඞ ප්‍රත්‍යය විකල්පයෙන් වේ යති; කෙවිත්, සමහරු කියත්. "හශෂාන්තාත් සක්" යි (ඒ ඞ ප්‍රත්‍යය නො වන පක්ෂයෙහි) සක් ප්‍රත්‍යය වේ. අවික්ෂත්- අවික්ෂත යනු ඒ පක්ෂයෙහි ලුඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. ("විෂ් + ස + ත්" යි සිටි කල්හි "ෂඪොඃ කඃ සෙ." යි ෂකාරයට කකාර ව "ක්විලාත්-" යි සකාරයට ෂකාර ව "දිබාදෟවට්"යි අඩාගම යෙන් "අවික්ෂත්" යනු සිද්ධ යි. සෙස්ස ද එසේ යි.)

a. අථ දිවාදයඃ:-

1. දිවු ක්‍රීඩා විජිගීෂා ව්‍යවහාර ද්‍යුති සතුති මොද මද සවප්න කානති ගතිෂු.

**151. දිවාදෙයඃ.** (දිවාදෙඃ 5-1. යඃ 1-1.)

b. **දිවාදෙගිණාද්‍යඃ ප්‍රත්‍යයො භවති චතුර්ෂු පරෙෂු, අපො'පවාදඃ. "ය්වොර්වි හසෙ." දීව්‍යති, දිව්‍යෙත්, දීව්‍යතු, අදිව්‍යත්, දිදෙව දිදිවතුඃ දිදිවුඃ, දිදෙවිථ, දීව්‍යාත්, දෙවිතා, දෙවිෂ්‍යති, අදෙවිෂ්‍යත්, අදෙවීත්.**

---

ජුහොත්‍යාදිෂු උභයපදී ප්‍රක්‍රියා, ජුහොත්‍යාදි ගණයෙහි උභය පදී ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

ලුග්විකරණාඃ, අප් ප්‍රත්‍යයට ලුක් වීම විකරණ කොට ඇති; ජුහොත්‍යාදයඃ, ජුහොත්‍යාදීහු; ඉති, මෙසේ යි.

## ජුහොත්‍යාදි ගණය සමාප්ත යි.

---

a. අථ, ජුහොත්‍යාදි ගණයට අනතුරු ව; දිවාදයඃ, දිවාදි ධාතුහු දක්වනු ලැබෙත්:-

1. දිවු, උකාරානුබන්ධ "දිව්" ධාතුව; ක්‍රීඩා විජිගීෂා ව්‍යවහාර ද්‍යුති සතුති මොද මද සවප්න කානති ගතිෂු, සෙල්ලම් කිරීම ය- දිනනු කැමති බව ය- ගණු දෙනු ය- බැබලීම ය- පැසසීම ය- සතුටු වීම ය- මත් වීම ය- නිදීම ය- ඉච්ඡා ය- ගමන ය යන අර්ථයන්හි වේ. (උකාරානුබන්ධත්වය "උදිතඃ ක්ත්වා වෙට්" යි විකල්ප යෙන් ඉඩාගමය පිණිස යි.)

151. ය විකරණ විධි සූත්‍ර යි "අප් කර්තරි" යි 'කර්තරි' යනු ද- "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද අනුවෘත්ත යි. දිවාදෙඃ, දිව් ආදි ධාතු ගණයා කෙරෙන්; කර්තරි, කර්තෘ කාරකයෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; යඃ, ය ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; දිවාදෙඃ ගණාත්, දිවාදි ධාතු ගණයා කෙරෙන්; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. අපඃ අපවාදඃ, ("අප් කර්තරි" යි විහිත) අප් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. "ය්වොර්විහසෙ" යන සූත්‍රයෙන් ඉකාරයට දීර්ඝ වේ. දීව්‍යති -පෙ- අදීව්‍යත් යනු ලට් -පෙ- ලඞ් ප්‍ර: එක වචන යි. (විධි යාදි දියෙහි යාකාරයට "යා" යි ඊකාර ව දීව්‍යෙත් යනාදිය සිද්ධ යි.) දිදෙව දිදිවතු දිදිවුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. දිදෙවිථ යනු ම: එක වචන යි. දීව්‍යාත් -පෙ- අදෙවීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි.

**2. ෂිවු තන්තු සන්තානෙ, සීව්‍යති, සීව්‍යෙත්, සීව්‍යතු, අසීව්‍යත්, සිෂෙව, සීව්‍යාත්, සෙවිතා, සෙවිෂ්‍යති, අසෙවිෂ්‍යත්, අසෙවීත්.**

**3. නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, ඊකාර ඉත්. නෘත්‍යති, නෘත්‍යෙත්, නෘත්‍යතු, අනෘත්‍යත්, නනර්ත නනෘතතුඃ නනෘතුඃ, නෘත්‍යාත්, නර්තිතා, නර්තිෂ්‍යති, අනර්තිෂ්‍යත්. "නෘද් තෘද් ඡෘද් චෘත් කෘතාං සස්‍යාසෙරිඩ් වා වක්තව්‍යඃ." නර්ත්ස්‍යති, අනර්ත්ස්‍යත්, අනර්තීත්.**

**4. ජෘෂ් ඉර් වයොහානෞ. "ඍත ඉර්." "ය්වොර් වි හසෙ." ජීර්‍යති, ජීර්‍යෙත්, ජීර්‍යතු, අජීර්‍යත්, ජජාර, "ගුණඃ."**

---

2. ෂිවු තන්තු සන්තානෙ, උකාරානුබන්ධ "ෂිව්" ධාතුව නූල් පැතිරවීමෙහි වේ. (මෙය ෂොපදෙශ ය. සකාරාදි යම් ධාතුවක සකාරය මූර්ධන්‍යත්වයට හෙතු වන උපසර්ගාදි නිමිත්තක් ඇති කල්හි මූර්ධන්‍ය වේ නම් ඒ ධාතුව මූර්ධන්‍ය ෂකාරයෙන් යුක්ත කොට දක්වනු ලැබේ. ඊට "ෂොපදෙශ" යයි කියති. පසු ව "ආදෙඃ ෂණඃ සනඃ" සි දන්ත්‍ය සකාරය වේ.) "ය්වොර්වි හසෙ" සි දීර්ඝ වේ. සීව්‍යති -පෙ- අසෙවීත් යනු පිළිවෙළින් ලට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂ එක වචන සි.

3. නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, "නෘතී" ධාතුව අවයව විසුරුවීමෙහි හෙවත් නැටීමෙහි වේ. ඊකාරඃ ඉත්, ඊකාරය ඉත් ය. ("ආදිදිතඃ" සි ඉඩාගම නො වීම ඊකාර ඉත් කිරීමේ ප්‍රයෝජන සි.) නෘත්‍යති -පෙ- අනෘත්‍යත් යනු ලට් -පෙ- ලඞ් ප්‍රඃ එක වචන යි. නනර්ත නනෘතතුඃ නනෘතුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. නෘත්‍යාත් -පෙ- අනර්තිෂ්‍යත් යනු ආශීර් ලිඞ් -පෙ- ලෘඞ් ප්‍රඃ එක වචන යි. නෘත් තෘද් ඡෘද් චෘත් කෘතාම්, නෘත්- තෘද්- ඡෘද්- චෘත්- කෘත් යන මේ ධාතූන් පිළිබඳ; අසෙඃ, සි ප්‍රත්‍යය තොර කොට ඇති; සස්‍ය, සකාරය සම්බන්ධ ව; (=සකාරාදි ප්‍රත්‍යය සම්බන්ධව ය යූ සේ සි.) වා, විකල්පයෙන්; ඉට් වක්තව්‍යඃ, ඉඩාගමය කිය යුතු සි. (ලෘට්- ලෘඞ් දෙක්හි ඉඩාගමය මෙයින් විකල්ප කෙරෙ සි.) නර්ත්ස්‍යති, අනර්ත්ස්‍යත් යනු ඉඩාගම නුවූ පක්ෂයෙහි ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන සි. අනර්තීත් යනු ලුඞ් ප්‍රඃ එක වචන සි.

4. ජෘෂ් ඉර් වයොහානෞ, ෂකාර හා ඉර් අනුබන්ධ කොට ඇති "ජෘ" ධාතුව වයස් පිරිහීමෙහි වේ. ("ෂිද්භිදාදිභ්‍යොඞ්" සි අඞ් ප්‍රත්‍යය වීම ෂකාර ඉත් කිරීමේ ප්‍රයෝජන සි. "ඉර්" යන්නෙහි ප්‍රයෝජන පෙර දැක්වින.)

ජජරතුඃ ජජරුඃ, ජීර්‍යාත්, "ඍවො ග්‍රහාම්" ජරිතා- ජරීතා, ජරිෂ්‍යති- ජරීෂ්‍යති අජරිෂ්‍යත්- අජරීෂ්‍යත්. "ඉරිතො වා." අජරත්- අජාරීත්.

**5. ශො තනූ කරණෙ.**

## 152. යෙ ඔඃ. (සි 7-1. ඔඃ 6-1.)

**a. යප්‍රත්‍යයෙ පරෙ ධාතොරොකාරස්‍ය ලොපො භවති. ශ්‍යති, ශ්‍යෙත්, ශ්‍යතු, අශ්‍යත්, ශශෞ, ශායාත්, ශාතා, ශාස්‍යති, අශාස්‍යත්, වා සිලොපඃ. අශාත්- අශාසීත්.**

---

"ඍෘත ඉර්" යන සූත්‍රයෙන් ඍෘකාරයට 'ඉර්' ආදෙශ වේ. "ය්වොර්වි හසෙ" යන සූත්‍රයෙන් දීර්ඝ වේ. ජීර්‍යති -පෙ- ජජාර යනු ලට් -පෙ- ලිට් ප්‍ර: එක වචන යි. (දීර්ඝ ඍෘකාරයෙන් පර අපිත් ණාදිය කිත් නො වන බැවින්) "ගුණඃ." යන්නෙන් ගුණ වේ. ජජරතුඃ ජජරුඃ යනු ලිට් ප්‍ර: ද්වි- බහු වචන යි. ජීර්‍යාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. "ඍවො ග්‍රහාම්" යන්නෙන් විකල්පයෙන් ඊකාරය වේ. ජරිතා- ජරීතා, ජරිෂ්‍යති- ජරීෂ්‍යති, අජරිෂ්‍යත්- අජරීෂ්‍යත් යනු දෙක බැගින් ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. "ඉරිතො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඞ ප්‍රත්‍යය වේ. අජරත් යනු ඞ ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ද- අජාරීත් යනු විකල්ප පක්ෂයෙහි ද ලුඞ් ප්‍ර: එක වචන යි.

5. ශො තනූ කරණෙ, "ශො" ධාතුව කෘශ (=තුනී) කිරීමෙහි පවතී යි.

152. ඔකාර ලොප විධි සූත්‍ර යි. "නො ලොපඃ" යි 'ලොපඃ' යනු ද- "ධාතොඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. යි, යකාරය පර කල්හි; ධාතොඃ, ධාතුහුගේ; ඔඃ, ඔකාරයට; ලොපඃ, ලොප් වේ.

a, යප්‍රත්‍යයෙ පරෙ, ය ප්‍රත්‍යය පර කල්හි; ධාතොඃ, ධාතුහු පිළිබඳ; ඔකාරස්‍ය, ඔකාරයට; ලොපඃ භවති, ලොප් වේ. (විකරණ ප්‍රකරණය බැවින් මෙයින් දිවාදි ය විකරණය පර කල්හි ම ඔකාරය ලොප් වේ. එබැවින් "ලව්‍යම්" යනාදියෙහි ලොප් නො වේ.) ශ්‍යති -පෙ- අශාස්‍යත් යනු පිළිවෙළින් ලට් -පෙ- ලෘඞ් ප්‍ර: එක වචන යි. (අනබ් විෂයෙහි "සන්ධ්‍යක්ෂරාණාමා" යි ඔකාරයට ආකාරය වේ. ශශෞ- ශායාත් යනාදිය එසේ සිද්ධ ය.) වා සිලොපඃ, විකල්පයෙන් සිප්‍රත්‍යය ලොපය වේ. ("ශාච්ඡාසාහ්වා වෙවො වා" යනු කී හෙයිනි.) අශාත් යනු සිලොප පක්ෂයෙහි ද- අශාසීත් යනු විකල්ප පක්ෂයෙහි ද ලුඞ් ප්‍ර: එක වචන යි.

**6.** ඡො ඡෙදනෙ. ඡ්‍යති, ඡ්‍යෙත්, ඡ්‍යතු, අච්ඡ්‍යත්, චච්ඡෞ, ඡායාත්, ඡාතා, ඡාස්‍යති, අච්ඡාස්‍යත්, අච්ඡාත්- අච්ඡාසීත්.

**7.** ෂො ‘න්තකර්මණි. ස්‍යති, ස්‍යෙත්, ස්‍යතු, අස්‍යත්, සසෞ, සෙයාත්, සාතා, සාස්‍යති, අසාස්‍යත්, අසාත්- අසාසීත්.

**8.** දො අවඛණ්ඩනෙ. ද්‍යති, ද්‍යෙත්, ද්‍යතු, අද්‍යත්, දදෞ, දෙයාත්, දාතා, දාස්‍යති, අදාස්‍යත්, අදාත්.

**9.** රාධ- සාධ සංසිද්ධෞ. රාධ්‍යති, රාධ්‍යෙත්, රාධ්‍යතු, අරාධ්‍යත්, රරාධ, “රාධොර්හිංසායාං කිති ණාදෞ සෙටි ථපි චෛත්වාභ්‍යාසලොපෞ වා.” රෙධතුඃ- රරාධතුඃ, රාධ්‍යාත්, රාද්ධා, රාත්ස්‍යති, අරාත්ස්‍යත්, අරාත්සීත්, අරාද්ධාම්.

---

6. ඡෝ ඡේදනෙ, “ඡෝ” ධාතුව සිදීමෙහි වේ. ඡ්‍යති -පෙ- අච්ඡාස්‍යත් යනු ලට් -පෙ- ලෘඞ් ප්‍ර: එක වචන යි. අච්ඡාත්- අච්ඡාසීත් යනු සිලොප පක්ෂයෙහි හා විකල්ප පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක වචන යි. (ද්විත්ව වූ කල්හි හා අඩාගම වූ කල්හිත් “ඡඃ” යි ඡකාර ද්විත්ව ව “ඛසෙ චපාඃ” යනාදීන් පූර්වයට චකාර වේ.)

7. ෂෝ අන්තකර්මණි, (ෂොපදෙශ) “ෂෝ” ධාතුව අවසන් කිරීමෙහි හෙවත් නැසීමෙහි වේ. ස්‍යති -පෙ- අසාස්‍යත් යනු පිළිවෙළින් ලට් -පෙ- ලෘඞ් ප්‍ර: එක වචන යි. (“ආදෙඃ ෂණඃ සනඃ’ යි ෂකාරයට සකාරාදෙශ යි. “දාදෙරෙඃ” යි ආශිෂ්‍යාදිය පර කල්හි ආකාරයට එකාර වීමෙන් ‘සෙයාත්’ යනාදිය සිද්ධ යි.) අසාත්- අසාසීත් යනු සිලොප පක්ෂයෙහි හා විකල්ප පක්ෂයෙහි ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

8. දෝ අවඛණ්ඩනෙ, “දෝ” ධාතුව කැඩීමෙහි වේ. ද්‍යති -පෙ- අදාත් යනු පිළිවෙළින් ලට් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. (මෙහිදු “දාදෙරෙඃ” යි එකාරාදෙශයෙන් ආශීර් ලිඞ් විබතෙහි “දෙයාත්” යනාදීන් වරනැගේ. “දාදෙඃ පෙ” යි සිලොපය නිත්‍ය හෙයින් ලුඞ් විබතෙහි “අදාත්” යනාදි එක රූපය බැගින් ම වේ.)

9. රාධ- සාධ සංසිද්ධෞ, “රාධ- සාධ” ධාතු ද්වය මනා කොට සිදු වීමෙහි වේ. (පරස්මෛපදි බැවින් අකාරය උදාත්ත- ඉත් ය.) රාධ්‍යති -පෙ- රරාධ යනු ලට් -පෙ- ලිට් ප්‍ර: එක වචන යි.

**10. ඉෂ් සම්පිණෙ. ඉෂ්‍යති, ඉෂ්‍යෙත්, ඉෂ්‍යතු, ඓෂ්‍යත්, ඉෂ්‍යෙෂ, ඉෂ්‍යාත්, එෂිතා, එෂිෂ්‍යති, ඓෂිෂ්‍යත්, ඓෂිත්.**

**11. ව්‍යධ තාඩනෙ. "ග්‍රහාං ඞිති ච." විධ්‍යති, විධ්‍යෙත්, විධ්‍යතු, අවිධ්‍යත්, විව්‍යාධ, විධ්‍යාත්, ව්‍යද්ධා, ව්‍යත්ස්‍යති, අව්‍යත්ස්‍යත්, අව්‍යාත්සීත් අව්‍යාද්ධාම් අව්‍යාත්සුඃ.**

**12, පුෂ් පුෂ්ටෞ. පුෂ්‍යති, පුෂ්‍යෙත්, පුෂ්‍යතු, අපුෂ්‍යත්, පුපොෂ, පුෂ්‍යාත්, පොෂ්ටා, පොක්ෂ්‍යති, අපොක්ෂ්‍යත්, අපුෂත්.**

---

කිති ණාදෞ, කිත් වූ ණබාදිය පර කල්හි ද; සෙට් ථපි ච, ඉඩාගම සහිත ථප් ප්‍රත්‍යය පර කල්හි ද; හිංසායාම්, හිංසාර්ථයෙහි වූ; රුධතෙඃ, රුධ් ධාතුහට; එත්ව පූර්වලොපෞ, එත්ව- පූර්වලොප දෙක; වා, විකල්පයෙන් වේ. (ආකාරයට එකාර ව ද්විත්වයෙහි පූර්ව රූපයට ලොප් වේ. විකල්ප බැවින් රූප ද්වය බැගින් ලැබේ.) රෙධතුඃ- ররුධතුඃ යනු ලිට් ප්‍ර: ද්වි වචන යි. (රෙධුඃ- රරුධුඃ රෙධිථ- රරුධිථ රෙධථුඃ- රරුධථුඃ රෙධ- රරුධ, රරුධ රෙධිව- රරුධිව රෙධිම- රරුධිම යනු ඉතිරි ලිට් රූප යි.) රුධ්‍යාත් -පෙ- අරුත්සීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. අරුද්ධාම් යනු ලුඞ් ප්‍ර: ද්වි වචන යි. ("රුධ් + තාං" යි සිටි කල්හි "තථොර්ධඃ" යි 'ත' හට 'ධ' ව "ඣබෙ ජබාඃ" යි පූර්ව "ධ" හට 'ද' ව රුද්ධාං යනු ද- "රුධ් + ස්‍යති" යි සිටි කල්හි "ඛසෙ චපාඃ-" යනාදීන් 'ධ' හට 'ත' ව රුත්ස්‍යති යනු ද සිද්ධ යි. මෙ බඳු සෙස්ස ද මෙසේ ම දතයුතු යි.)

10. **ඉෂ් සම්පිණෙ,** "ඉෂ්" ධාතුව ගමනාර්ථයෙහි වේ. ඉෂ්‍යති- ඓෂිත් යනු පිළිවෙළින් දශ ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි. ("ඓෂ්‍යත්" යනාදියෙහි "දිබාදෞවට්- ස්වරාදෙඃ" යි අඩාගම ව්‍ද යෙකි. "ඉයෙෂ" යනාදියෙහි "ත්‍රධාතොඃ" යි අසවර්ණ ස්වරය පර කල්හි පූර්ව ඉකාරයට "ඉය්" ආදෙශ යි.)

11. **ව්‍යධ තාඩනෙ,** අකාරානුබන්ධ "ව්‍යධ්" ධාතුව තැළීමෙහි වේ. "ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන් යකාරයට සම්ප්‍රසාරණ වේ. විධ්‍යති- අව්‍යාත්සීත් යනු . පිළිවෙළින් ලඩාදි දශයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි. අව්‍යාද්ධාම් අව්‍යාත්සුඃ යනු ලුඞ් ප්‍ර: ද්වි- බහු වචන යි. ("ද්විශ්ච" යි ද්විත්ව වීමෙන් "ව්‍ය ව්‍යධ් + ණප්" යි සිටි කල්හි "ණබාදෞ පූර්වස්‍ය" යි පූර්වයට සම්ප්‍රසාරණ ව "අත උපධායාඃ" යි වෘද්ධි වීමෙන් "විව්‍යාධ" යනු සිද්ධ යි.)

12. **පුෂ් පුෂ්ටෞ,** "පුෂ්" ධාතුව පොෂණයෙහි වේ. පුෂ්‍යති- -පෙ- අපුෂත් යනු ලඩාදි දශයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.

**13. ශ්ලිෂ් ආලිඞ්ගනෙ. ශ්ලිෂ්‍යති, ශ්ලිෂ්‍යෙත්, ශ්ලිෂ්‍යතු, අශ්ලිෂ්‍යත්, ශිශ්ලෙෂ, ශ්ලිෂ්‍යාත්, ශ්ලෙෂ්ටා, ශ්ලෙක්ෂ්‍යති, අශ්ලෙක්ෂ්‍යත්, "හශෂාන්තාත් ක්සක්" ශ්ලිෂෙරාලිඞ්ගනෙ සක්. ඞාපවාදඃ. අශ්ලික්ෂත් කන්‍යාං චෛත්‍රඃ. අනාලිඞ්ගනෙ:- සමශ්ලිෂත් ජතු කාෂ්ඨම්.**

**14. තෘප් ප්‍රීණනෙ, තෘප්‍යති, තෘප්‍යෙත්, තෘප්‍යතු, අතෘප්‍යත්, තතර්ප, තෘප්‍යාත්, රධාදිභ්‍යාදිඞ විකල්පෙන. තර්පිතා- ත්‍රප්තා- තර්ප්තා. "රාරෙ කඩසෙ දෘශාම්" තර්පිෂ්‍යති-**

---

("උපධායා ලඝොඃ"යි ගුණ වීමෙන් හා ටුත්වයෙන් "පොෂ්ටා" යනාදිය සිද්ධ යි. ගුණ වීමෙන් "පොෂ් + ස්‍යති" යි සිටි කල්හි "ෂඪොඃ කඃ සෙ" යි ෂකාරයට කකාර ව "ක්විලාත්-" යනාදීන් සකාරයට ෂකාර ව "පොක්ෂ්‍යති" යනාදිය සිද්ධ යි. "අපුෂත්" යන තන්හි "ලිත්පුෂාදෙර්ඞඃ" යි ඞ ප්‍රත්‍යය විය. ඞිත් බැවින් ගුණ නොවී ය.)

13. ශ්ලිෂ් ආලිඞ්ගනෙ, "ශ්ලිෂ්" ධාතුව වැළඳ ගැන්මෙහි වේ. ශ්ලිෂ්‍යති— අශ්ලෙක්ෂ්‍යත් යනු ලට් -පෙ- ලෘඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. (ද්විත්ව ව "ශ්ලි ශ්ලිෂ් + ණප්" යි සිටි කල්හි "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි ශෙෂ ව "උපධායා ලඝොඃ" යි ගුණ වීමෙන් "ශිශ්ලෙෂ" යනාදිය සිද්ධ යි. ශිශ්ලෙෂිථ යනු මː එක වචන යි.)

"හශෂාන්තාත් ක්සක්" යන සූත්‍රයෙන් "සක්" ප්‍රත්‍යය වේ. ආලිඞ්ගනෙ, ආලිඞ්ගනාර්ථයෙහි වූ; ශ්ලිෂෙඃ, ශ්ලිෂ් ධාතුහු කෙරෙන්; සක්, සක් ප්‍රත්‍යය වේ. ("හශෂාන්තාත් සක්" යි වත් සක් ප්‍රත්‍යය ආලිඞ්ගනාර්ථ ශ්ලිෂ් ධාතුහු කෙරෙන් පමණක් වෙයි යූ සේ යි. මෙහි **ආලිඞ්ගනය** නම් ප්‍රාණියකු විසින් කරණු ලබන වැළඳ ගැන්ම යි.) ඞාපවාදඃ, ඞ ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. අශ්ලික්ෂත් යනු සක් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ ලුඞ් ප්‍රː එක වචන යි. (අශ්ලික්ෂතාම්- අශ්ලික්ෂන් යනු ද්වි- බහු වචන යි.) චෛත්‍රඃ, චෛත්‍ර තෙමේ; කන්‍යාම්, කන්‍යාව; අශ්ලික්ෂත්, වැළඳ ගත්තේ ය. (භාෂාවෙහි ව්‍යවහාර ප්‍රාප්ත බව මෙයින් දැක්වී.) අනාලිඞ්ගනෙ, ආලිඞ්ගනාර්ථ නො වූ කල්හි; සමශ්ලිෂත්, සම් පූර්ව 'ශ්ලිෂ්' ධාතු ලුඞ් ප්‍රථම පුරුෂෛක වචනයෙහි "සමශ්ලිෂත්" යනු වේ. ("ලිත්පුෂාදෙර්ඞඃ" යි ඞ ප්‍රත්‍යය වීමෙනි.) ජතු, ලාකඩ; කාෂ්ඨම්, කාෂ්ඨයට; සමශ්ලිෂත්, සංසෘෂ්ට විය.

ත්‍රප්ස්‍යති- තර්ප්ස්‍යති, අතර්පිෂ්‍යත්- අත්‍රප්ස්‍යත්- අතර්ප්ස්‍යත්. ස්පෘශ් මෘශ්කෘශ්තෘප්දෘපාං සිචො වක්තව්‍යඃ. රධාදිත්වාද් වෙට්. අතර්පිත්- අත්‍රාප්සිත්- අතාර්ප්සිත්. පුෂාදිත්වාද් ඞඃ. අතෘපත්.

**15.** එවං දෘප් හර්ෂ විමොහනයොඃ. දෘප්‍යති.

**16.** මුහ් වෛචිත්‍යෙ. මුහ්‍යති, මුමොහ, මුහ්‍යාත්, ද්‍රුහාදීනාං සන්ධ්‍යෙෙව වා. මොඪා- මොග්ධා- මොහිතා, රධාදිත්වාද්වෙට්. මොක්ෂ්‍යති- මොහිෂ්‍යති, අමොක්ෂ්‍යත්- අමොහිෂ්‍යත්, පුෂාදිත්වාද් ඞඃ. අමුහත්.

---

14. තෘප් ප්‍රීණනෙ, "තෘප්" ධාතුව පිණා යාමෙහි වේ. තෘප්‍යති -පෙ- තෘප්‍යාත් යනු ලට් -පෙ- ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. රධාදිත්වාත්, රධාදිය බැවින් හෙවත් රධාදියට අයත් බැවින්; විකල්පෙන, විකල්පයෙන්; ඉට්, ඉඩාගම වේ. තර්පිතා- ත්‍රප්තා- තර්ප්තා යනු ලුට් ප්‍ර: එක වචන යි. "රාරෙ ඛසෙ දෘශාම්" යි "අර්" හට "ර" ආදෙශ වේ. (ඉඩාගම හා ගුණ වීමෙන් "තර්පිතා" යනු ද- ඉඩාගම නො වන පක්ෂයෙහි ගුණ වීමෙන් "තර්ප් + තා" යි සිටි කල්හි "රාරඃ" - යනාදීන් "අර්" හට "ර" වීමෙන් "ත්‍රප්තා" යනු ද- එය ද විකල්ප බැවින් "ර" ආදෙශය නු වූ පක්ෂයෙහි "තර්ප්තා යනු ද වේ. මෙසේ ලුඩාදියෙහි රූප ත්‍රය බැගින් ලැබේ.) තර්පිෂ්‍යති- ත්‍රප්ස්‍යති- තර්ප්ස්‍යති යනු ලෘට් ප්‍ර: එක වචන යි. අතර්පිෂ්‍යත්- අත්‍රප්ස්‍යත්- අතර්ප්ස්‍යත් යනු ලෘඞ් ප්‍ර: එක වචන යි. (පද සිද්ධිය ලුට් ප්‍රථම පුරුෂෛක වචනයට දැක්වූ සේ යි.)

ස්පෘශ් මෘශ් කෘශ් තෘප් දෘපාම්, ස්පෘශ්- මෘශ්- කෘශ්- තෘප්- දෘප් යන ධාතූන් සම්බන්ධ ව; සිඃ, සි ප්‍රත්‍යය; වා වක්තව්‍යඃ, විකල්පයෙන් වේ යයි කිය යුතු යි. රධාදිත්වාත්, රධාදිය බැවින්; වා ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. අතර්පීත්- අත්‍රාප්සීත්- අතාර්ප්සීත් යනු සි ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක වචන යි. පුෂාදිත්වාත්, පුෂාදිය බැවින්; ඞඃ, ("ලිත් පුෂාදෙර්ඞඃ" යි) ඞ ප්‍රත්‍යය වේ. අතෘපත් යනු සි විකල්ප පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක වචන යි. (ඉඩාගම හා ගුණ වීමෙන් අතර්පීත් යනාදියද ඉඩාගම නුවූ පක්ෂයෙහි "අතිටො 'නාම්වතඃ" යි වෘඩි ව "රාරඃ"- යනාදීන් "ආර්" හට "රා" යන්න වීමෙන් හා නො වීමෙන් අත්‍රාප්සීත්= අතාර්ප්සීත් යනාදිය දැයි සි ප්‍රත්‍යය පක්ෂයෙහි රූප ත්‍රය බැගින් ද- ඞ ප්‍රත්‍යය වීමෙන් අතෘපත් යනාදිය දැයි මෙසේ ලුඞ් ලකාරයෙහි රූප චතුෂ්කය බැගින් ලැබේ.)

**17. ණශ් අදර්ශනෙ. නශ්‍යති, ននාශ, පචාදිත්වාදෙත්ව පූර්වලොපෞ. නෙශතුඃ, නෙශුඃ, නශ්‍යාත්, මස්ජිනශොර්ඣලෙ නුම් වක්තව්‍යඃ. "ඡශෂ රාජ්‍යාදෙඃ ෂඃ." නංෂ්ටා.**

**c. නශෙඃ ෂාන්තස්‍ය.**

**d. නශෙඃ ෂාන්තස්‍ය ණත්වං න ස්‍යාත්. ප්‍රනංෂ්ටා- නශිතා, නංක්‍ෂ්‍යති- නශිෂ්‍යති, අනංක්‍ෂ්‍යත්- අනශිෂ්‍යත්, පුෂාදිත්වාද් ඞඃ. ඞෙ නශෙරත එත්වං වා වාච්‍යම්. අනෙශත්- අනශත්.**

---

15. දෘප් හර්ෂ විමොහනයොඃ, සතුටු වීම ය- මුළා වීම ය හෙවත් ගර්ජිය යන අර්ථ ද්වයෙහි වූ "දෘප්" ධාතුව ද; එවම්, මෙසේ සි. දෘප්‍යති යනු ලට් ප්‍රථම පුරුෂෛක වචන සි. (සියලු විබතෙහි තෘප් ධාතුව මෙනි.)

16. මුහ් වෛචිත්‍යෙ, "මුහ්" ධාතුව මුළා බැවිහි වේ. මුහ්‍යති, මුමොහ, මුහ්‍යාත් යනු ලට්- ලිට්- ආශිර් ලිඞ් ප්‍ර: එක වචන සි. ද්‍රුහාදීනාම්, ද්‍රුහාදි ධාතූන්ගේ අන්තයට; ඝත්ව ඪත්ව, ඝකාර භාවය- ඪකාර භාවය යන දෙදෙන; වා, විකල්පයෙන් වෙත්. ("ද්‍රුහාං වා" යන සූත්‍රය මෙයින් සිහි පත් කෙරෙයි. සාරස්වතයෙහි මෙය ම සූත්‍රය ලෙස පෙණෙන නමුත් සූත්‍ර පාඨයෙහි දක්වෙනුයේ "ද්‍රුහාං වා" කියා සි.) මොඪා- මොග්ධා- මොහිතා යනු ලුට් ප්‍ර: එක වචන සි. රධාදිත්වාත්, රධාදිය බැවින්; වා ඉට්, විකල්ප යෙන් ඉඩාගම වේ. ("මුහ් + තා" සි සිටි කල්හි "ද්‍රුහාං වා" සි හකාරයට ඪකාරය ව "උපධායා ලඝොඃ" සි ගුණ ව "තථොර්ධඃ" සි තකාරයට ධකාර ව ෂ්ටුත්වයෙන් "මොඪ්ඪා" සි වූ පසු "ඪි ඪෙ ලොපො දීර්ඝශ්ච" සි පූර්ව ඪකාර ලොපයෙන් "මොඪා" සි වේ. "මොග්ධා" යනු "ද්‍රුහාං වා" සි හකාරයට ඝකාර ව "තථොර්ධඃ" සි. තකාරයට ධකාර ව "ඣබෙ ජබාඃ" සි ඝකාරයට ගකාර වීමෙන් සිද්ධ සි. විකල්පයෙන් ඉඩාගම වූ පක්‍ෂයෙහි "මොහිතා" යනු වේ. මෙසේ ලුට් විබතෙහි රූප ත්‍රය බැගින් වේ.)

මොක්‍ෂ්‍යති- මොහිෂ්‍යති, අමොක්‍ෂ්‍යත්- අමොහිෂ්‍යත් යනු ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන සි. (වෙට් බැවින් රූප ද්වය බැගිනි. "මුහ් + ස්‍යති" සි සිටි කල්හි හකාරයට ඪකාර ව ඊට "ෂඪොඃ කඃ සෙ" සි කකාර ව "කිලාත්-" යනාදීන් සකාරයට ෂකාර ව 'මොක්‍ෂ්‍යති' යනාදිය සිද්ධ සි. හකාරයට ඝත්ව වූ කල්හි ද "ඛසෙ චපාඃ-" යනාදීන් කකාර ව "මොක්‍ෂ්‍යති" යනාදිය ම වේ. මෙබඳු සෙසු රූප ද මෙසේ සි.) පුෂාදිත්වාත්, පුෂාදිය බැවින්; ඞඃ, ("ලිත් පුෂාදෙර්ඞඃ" සි) ඞ ප්‍රත්‍යය වේ. අමුහත් යනු ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන සි. (මුහ් ධාතුව ලුඞ් ලකාරයෙහි ඉඩාගම වීමෙන් අමොහීත්-

**18. ශම්- දම් උපශමෙ.**

**153. ශමාං දීර්ඝඃ.** (ශමාම් 6-3. දීර්ඝඃ 1-1.)

a. **ශමාදීනාං දීර්ඝො භවති යෙ පරෙ අබාදෞ විෂයෙ ච.**

b. **ශාම්‍යති, ශාම්‍යෙත්, ශාම්‍යතු, අශාම්‍යත්, ශශාම ශෙමතුඃ ශෙමුඃ, ශම්‍යාත්, ශමිතා, ශමිෂ්‍යති, අශමිෂ්‍යත්. "ලිත් පුෂාදෙර්ඩඃ." අශමත්. අශමිදිති කෙචිත්.**

---

අමොහිෂ්ටාම්- අමොහිෂුඃ යනාදි වශයෙන් ද, ඉඩාගම නො ව "අතිටො 'නාමිවතඃ" යි වෘද්ධි වීමෙන් අමෞක්ෂීත්- අමෞක්ෂාම්- අමෞක්ෂුඃ යනාදි වශයෙන් ද, "හශෂාන්තාත් සක්" යි "සක්" ප්‍රත්‍යය වීමෙන් අමුක්ෂත්- අමුක්ෂතාම්- අමුක්ෂන් යනාදි වශයෙන් ද, පුෂාදිය බැවින් "ඩ" ප්‍රත්‍යය වීමෙන් අමුහත්- අමුහතාම්- අමුහන් යනාදි වශයෙන් දැයි මෙසේ සතර අයුරකින් වර නැගෙන බව චන්ද්‍රකීර්ති ටීකාවෙහි පෙණේ.)

17. ණශ් අදර්ශනෙ, (ණොපදෙශ) "ණශ්" ධාතුව නො දක්මෙහි වේ. නශ්‍යති, නනාශ යනු ලට්- ලිට් ප්‍ර: එක වචන යි. පචාදිත්වාත්, පචාදිය බැවින්; එත්ව පූර්ව ලොපෞ, එත්ව- පූර්වලොප දෙදෙන වෙත්. ("ලොපඃ පචාං කිතෙය චාස්‍ය" යි ද්විත්වයෙහි පූර්ව රූපයට ලොප් ව ධාතුහුගේ අකාරයට එකාරය වේ.) නෙශතුඃ නෙශුඃ යනු ලිට් ප්‍ර: ද්වි- බහු වචන යි. නශ්‍යාත් යනු ආශීර්ලිඞ් ප්‍ර: එක වචන යි. ඣසෙ, ඣස ප්‍රත්‍යාහාරය පර කල්හි; මස්ජිනශොඃ, වූ මස්ජො ශුද්ධෞ- ණශ් අදර්ශනෙ යන ධාතු ද්වය සම්බන්ධ ව; නුම් වක්තව්‍යඃ, නුමාගමය කිය යුතු යි. (මෙයින් අකාරයෙන් පර ව නකාරාගම ව ඊට "නශ්චාපදාන්තෙ ඣසෙ" යි අනුස්වාරය වේ.) "ඡශෂ රාජාදෙඃ ෂඃ" යන සූත්‍රයෙන් ශකාරයට ෂකාරය වේ. (පසු ව ටුත්වයෙන්) "නංෂ්ටා" යනු වේ. ලුට් ප්‍ර: එක වචන යි.

c. ෂාන්තස්‍ය, ෂකාරාන්ත වූ; නශෙඃ, නශ් ධාතුහුගේ (නකාරයට ණකාරය නො වේ.)

d. ෂාන්තස්‍ය නශෙඃ, ෂකාරාන්ත වූ නශ් ධාතුහට; ණත්වං න ස්‍යාත්, ණත්වය නො වන්නේ ය. ("ඡශෂ රාජාදෙඃ ෂඃ" යි ෂකාර වූ පසු උපසර්ගාදි නිමිත්තෙන් "නශ්" ධාතුහුගේ නකාරයට මූර්ධන්‍ය ණකාර නො වන බව මෙයින් දක් වේ. මෙය සාරස්වත සූත්‍රයක් නො වේ.) "ප්‍රනංෂ්ටා" යනු ණත්වය නො වන බවට නිදර්ශන යි. නශිතා යනු ඉඩාගම පක්ෂයෙහි ලුට් ප්‍ර: එක වචන යි. නංක්ෂ්‍යති- නශිෂ්‍යති, අනංක්ෂ්‍යත්- අනශිෂ්‍යත් යනු ලෘට්- ලෘඞ්

c. **දම්– ශ්‍රම්– තම්– භ්‍රම්– ක්‍ෂම්– ක්‍රම්– මද්– එතෙ ශමාදයඃ, රූපං තද්වත්.**

**19. ඝදිමිදු ස්නෙහනෙ, ආඝදී ඉනෙ.**

d. **මිදෙසයේ ගුණො වක්‍තව්‍යඃ. මෙද්‍යති, මෙද්‍යෙත්, මෙද්‍යතු, අමෙද්‍යත්, මිමෙද මිමිදතුඃ මිමිදුඃ, මිද්‍යාත්, මෙදිතා, මෙදිෂ්‍යති, අමෙදිෂ්‍යත්, අමිදත්.**

---

ප්‍ර: එක වචන යි. (වෙට් බැවින් රූප ද්වය බැගිනි.) පුෂාදිත්වාත්, පුෂාදිය බැවින්; ඩඃ, ඩ ප්‍රත්‍යය වේ. ඩෙ, ඩ ප්‍රත්‍යය පර කල්හි; තශෙඃ, තශ් ධාතුහුගේ; අතඃ, අකාරයට; වා, විකල්පයෙන්; එත්වම්, එකාර බව; වාච්‍යම්, කියයුතු යි. අතෙශත් යනු එකාර වූ පක්‍ෂයෙහි ද– අතශත් යනු නුවූ පක්‍ෂයෙහි ද ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

18. ශම් දම් උපශමෙ, "ශම්– දම්" යන ධාතු ද්වය සන්සිඳී මෙහි වේ.

153. දීඝ විධි සූත්‍ර යි. "යේ‍යාඃ" යි 'යි' යනු ද– "අබාදෞවි පිති ත්ස්මි" යි "අබාදෞ" යනු ද අනුවෘත්ත යි. අබාදෞ, අබාදි විෂයෙහි; යි, ය ප්‍රත්‍යය පර කල්හි; ශමාම්, ශමාදි ධාතුන්ට; දීඝඃ, දිඝ වේ.

a. අබාදෞ විෂයෙ, අබාදි විෂයෙහි; යෙ ච පරෙ, ය ප්‍රත්‍යය පර කල්හි ද; ශමාදීනාම්, ශම් ආදි ධාතූන්ට; දීඝඃ භවති, දීඝ වේ. (ශමාදීහු මතු දක්වනු ලැබෙත්. ය විකරණය වන්නේත් අබාදි විෂයෙහි ම ය. එ බැවින් මෙහි "අබාදෞ" යනුවෙන් දිවාදි ගණික නොවන ශමාදි ධාතූන්ට ද අබ් විෂයෙහි දීඝ වන බව දක්ව යි. **ක්‍රාමති** යනාදිය නිදර්ශන යි.)

b. **ශාම්‍යති** –පෙ– **අශාම්‍යත්** යනු ලට් –පෙ– ලඞ් ප්‍ර: එක වචන යි. ශශාම ශෙමතුඃ ශෙමුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. (පචාදිය බැවින් එත්ව– පූර්වලොපයෝ වෙත්.) ශම්‍යාත් –පෙ– අශමිෂ්‍යත් යනු ආශීර් ලිඞ් –පෙ– ලෘඞ් ප්‍ර: එක වචන යි. "ලිත් පුෂාදෙර්ඩඃ" යන සූත්‍රයෙන් ඩ ප්‍රත්‍යය වේ. අශමත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි. අශමීත් ඉති, අශමීත් කියා; කෙචිත්, සමහරු කියත්.

c. **දම්— මද් එතෙ,** දමු උපශමෙ– ශ්‍රමු තපසි ඛෙදෙ ච– තමු කාඞ්ක්‍ෂායාම්– භ්‍රමු අනවස්ථානෙ– ක්‍ෂමූ සහනෙ– ක්‍රමු පාද වික්‍ෂෙපෙ– මදී හර්‍ෂේ යන මොහු; ශමාදයඃ, ශමාදි ධාතුහු වෙත්. රූපං, රූපය; තද්වත්, එමෙනි හෙවත් ශම් ධාතුව මෙනි. (ශමාදි

**20. අසු ක්ෂෙපණෙ. අස්‍යති, ආස, අසිතා, අසිෂ්‍යති, "අස්‍යතෙර්ථෙ ථුග් වක්තව්‍යඃ." ආස්ථත්.**

**ඉති දිවාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා.**

---

**a. අථාත්මනෙ පදිනඃ:-**

---

ධාතු අටකි. සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි 'ක්‍රමු' ධාතුව වෙනුවට 'ක්ලමු ග්ලානෞ' යන ධාතුව පෙණේ. එහෙයින් ම භ්වාදි පරස්මෛපදි ප්‍රක්‍රියාවේ "**ක්‍රමඃ පෙ චතුර්ෂු දීර්ඝො වක්තව්‍යා**"යනු කියන ලදැයි හැඟේ.)

19. ඤිමිදා ස්නෙහනෙ, "ඤිමිදා" ධාතුව ප්‍රෙම කිරීමෙහි වේ. ආඤී ඉතෞ, ආකාර- ඤිකාර දෙක ඉත් ය. (ඤිකාරය "ඤීතාං තක් වර්තමානෙ'පි" සි වර්තමානාර්ථයෙහි "තක්" ප්‍රත්‍යය කිරීමට ද- ආකාරය "ආදිදිතඃ" සි ක්ත ප්‍රත්‍යය සම්බන්ධ ව ඉඩාගම නො වීම ට ද වෙත්.)

d. යෙ, ය ප්‍රත්‍යය පර කල්හි; මිදෙඃ, මිද් ධාතුහට; ගුණඃ වක්තව්‍යඃ, ගුණය කිය යුතු සි. මෙද්‍යති -පෙ- අමෙද්‍යත් යනු ලට් -පෙ- ලඞ් ප්‍රː එක වචන සි. මිමෙද මිමිදතුඃ මිමිදුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ සි. මිද්‍යාත් -පෙ- අමිදත් යනු ආශීර් ලිඞ්-පෙ- ලුඞ් ප්‍රː එක වචන සි.

20. අසු ක්ෂෙපණෙ, උකාරානුබන්ධ "අස්" ධාතුව දැමීමෙහි වේ. (උකාරය "උදිතඃ ක්ත්වා වෙට්" සි ක්ත්වා ප්‍රත්‍යය සම්බන්ධ ව විකල්පයෙන් ඉඩාගම වීම පිණිස ය.) අස්‍යති- ආස- අසිතා- අසිෂ්‍යති යනු ලට්- ලිට්- ලුට්- ලෘට් ප්‍රථම පුරුෂෛක වචන සි. (විධිලිඞ්- ලොට්- ලඞ්- ආශීර් ලිඞ්- ලෘඞ් ප්‍රː එක වචනයන්හි පිළිවෙළින් අස්‍යෙත්- අස්‍යතු- ආස්‍යත්- අස්‍යාත්- ආසිෂ්‍යත් යනු වේ.) ඩෙ, ඩ ප්‍රත්‍යය පර කල්හි; අස්‍යතෙඃ, අස් ධාතුහු සම්බන්ධ ව; ථුක් වක්තව්‍යඃ, ථුගාගමය කිය යුතු සි. ආස්ථත් යනු ලුඞ් ප්‍රː එක වචන සි. (මේ ථුක් ආගමයෙන් "ථ්" යන්න පමණක් ඉතිරි වේ. උකාරය උච්චාරණය පිණිස ද- කකාරය ස්ථාන නියමය පිණිස ද ඉත් කරණ ලදහ. "**කිත්වාදන්තෙ**" සි කී හෙයින් අස් ධාතුවට හා ඩ ප්‍රත්‍යයට ද අතරෙහි ථුගාගමය වේ.)

ඉති -පෙ- ප්‍රක්‍රියා, දිවාදි ගණයෙහි පරස්මෛපදි ප්‍රක්‍රියාව නිමි.

---

a. අථ, පරස්මෛපදි ප්‍රක්‍රියාවට අනතුරු ව; ආත්මනෙ පදිනඃ, ආත්මනෙපදි ධාතුහු දක්වනු ලැබෙත්:-

**1. ජනී ප්‍රාදුර්භාවෙ, ඊකාරෙත්.**

## 154. ඥජනෝර්ජා. * (ඥජනොඃ 6-2. ජා 1-1.)

**b. ජනී ප්‍රාදුර්භාවෙ– ඥා අවබොධනෙ අනයොර්ජාදෙශො භවති චතුර්ෂු පරෙෂු.**

**c. ජායතෙ, ජායෙත, ජායතාම්, අජායත, "ගමාං ඛවරෙ." චුත්වම් "ජඤෝර්ඥඃ." ජඥෙ, ජනිෂීෂ්ට, ජනිතා, ජනිෂ්‍යතෙ, අජනිෂ්‍යත, අජනිෂ්ට.**

**d. පදදෙඃසනනි ඝාතීඝිපි සෙරිණ් වක්තව්‍යඃ, දිපාදිභ්‍යො වා. පද් දිප් ජන් බුධ් පූරි තායි ප්‍යායි එතෙ පදදයඃ.**

---

1. ජනී ප්‍රාදුර්භාවෙ, "ජනී" ධාතුව පහළ වීමෙහි වේ. ඊකාරෙත්, ඊකාරය ඉත් කොට ඇත්තේ ය. (ඒ වනාහි "ආදීදිතඃ" සි ක්ත ප්‍රත්‍යය පර කල්හි ඉඩාගම නො වීම පිණිස ය.)

154. ජා ආදෙශ විධි සූත්‍ර සි. "අබාදුවී පිති ත්ස්මි" සි 'අබාදෞ' යනු අනුවෘත්ත වේ. අබාදෞ, අබාදි විෂයෙහි; ඥජනොඃ, ඥා- ජන් ධාතු දෙකට; ජා, ජා යනාදෙශ වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; ජනී ප්‍රාදුර්භාවෙ– ඥා අවබොධනෙ අනයොඃ, ජනී ප්‍රාදුර්භාවෙ– ඥා අවබොධනෙ යන මේ ධාතු ද්වයට; ජාදෙශඃ භවති, ජා යනාදෙශ වේ. (මෙයින් ය ප්‍රත්‍යය ම පර කල්හි ; ජා ආදෙශ වේ.)

c. ජායතෙ -පෙ- අජායත යනු ලට් -පෙ- ලඞ් ප්‍ර: එක වචන සි. "ගමාං ඛවරෙ" යන සූත්‍රයෙන් උපධා ලොපය වේ. චුත්වම්, චුත්වය වේ. ජඤොඃ ඥඃ, ජකාර– ඤකාර දෙකට "ඥ" යන්න වේ. ජඥෙ -පෙ- අජනිෂ්ට යනු ලිට් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන සි. (ද්විත්වයෙන් පසු "ජජන් + එ" සි සිටි කල්හි "ගමාං ඛවරෙ" සි උපධා ලොප ව "ස්තොඃ ශ්චුභිඃ ශ්චුඃ" සි චුත්වය වූ විට "ජ ජ්ඤ් + එ" සි වේ. පසු ව "ජඤෝර්ඥඃ" සි ජ– ඤ දෙකට "ඥ" යන්න කොට පැමිණවීමෙන් "ජඥෙ" සි සිද්ධ සි. ජඥාතෙ– ජඥිරෙ යනාදිය ද මෙසේ සි.)

d. තනි, තන් ප්‍රත්‍යය පර කල්හි; ඝාතීරි අපි, ඝාතීෘ කාරක යෙහි ද, පදදෙඃ, පදදිහු කෙරෙන් පර ව; සෙඃ, සි ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි; ඉණ් වක්තව්‍යඃ, ඉණ් ප්‍රත්‍යය කිය යුතු සි. දීපාදිභ්‍යඃ

---

* ජා ජනීඥොඃ- පොත්හි.

## 155. ලොපඃ. (ලොපඃ- 1-1.)

**a. ඉණ් සංයොගෙ තනො ලොපො භවති. "ජනිවධ්‍යානී වෘද්ධිඃ." අජනි, අජනිෂාතාම්.**

**2. දිපී දීප්තෞ. දීප්‍යතෙ, දීප්‍යෙත, දීප්‍යතාම්, අදීප්‍යත, දිදීපෙ, දීපිෂීෂ්ට, දීපිතා, දීපිෂ්‍යතෙ, අදීපිෂ්‍යත, අදීපි-අදීපිෂ්ට.**

**3. පූරී ආප්‍යායනෙ. පූර්‍යතෙ, අපූරිෂ්‍යත, අපූරි- අපූරිෂ්ට.**

---

දීප් ආදිහු කෙරෙන්; වා, විකල්පයෙන් වේ යයි කියයුතු යි. ("ඉණ් තත්‍යකර්තරි" යි භාව- කර්ම දෙක්හි විහිත ඉණ් ප්‍රත්‍යය පදාදිහු කෙරෙන් කර්තෘ කාරකයෙහිත් වන බව මෙයින් කීහ.) පද්— ප්‍රාප්ති එතෙ, පද්- දීප්- ජන්- බුධ්- පූරී- තායි- ප්‍යායි යන මොහු; පදාදයඃ, පදාදීහු යි. (මෙහි පද් ධාතුහු කෙරෙන් නිත්‍ය යෙන් ද- ඉතිරි දීප් ආදිහු කෙරෙන් විකල්පයෙන් ද ඉණ් ප්‍රත්‍යය වේ.)

*155.* තන් ප්‍රත්‍යය ලොප විධි සූත්‍ර යි. "ඉණ් තත්‍යකර්තරි" යි වි: වි: වශයෙන් "ඉණි- තනඃ" යනු අනුවෘත්ත යි. ඉණි, ඉණ් ප්‍රත්‍යය පර කල්හි; තනඃ, තන් ප්‍රත්‍යයට; ලොපඃ, ලොප් වේ.

**a.** ඉණ් සංයොගෙ, ඉණ් ප්‍රත්‍යය හා එක් ව යෙදීම ඇති කල්හි; තනඃ ලොපඃ භවති, තන් ප්‍රත්‍යයට ලොප් වේ. "ජනි වධ්‍යානී වෘද්ධිඃ" යන සූත්‍රයෙන් වෘද්ධි ප්‍රතිෂෙධය වේ. (ඉණ් ප්‍රත්‍යයේ ණකාරය වෘද්ධිය පිණිස හෙයින් මෙහි වෘද්ධි විය යුතු නමුත් යථොක්ත සූත්‍රයෙන් එය වළකී.) අජනි යනු ඉණ් ප්‍රත්‍යය ව තන් ප්‍රත්‍යයට ලොප් වීමෙන් සිද්ධ ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. අජනිෂාතාම් යනු ද්වි වචන යි.

*2.* දීපී දීප්තෞ, ඊකාරානුබන්ධ "දීප්" ධාතුව බැබලීමෙහි වේ. දීප්‍යතෙ -පෙ- අදීපිෂ්‍යත යනු ලට් -පෙ- ලෘඞ් ප්‍ර: එක වචන යි. අදීපි- අදීපිෂ්ට යනු ඉණ් ප්‍රත්‍යය වීමෙන් හා නො වීමෙන් සිද්ධ ලුඞ් ප්‍ර: එක වචන යි.

*3.* පූරී ආප්‍යායනෙ, ඊකාරානුබන්ධ "පූර්" ධාතුව පිරීමෙහි වේ. පූර්‍යතෙ, අපූරිෂ්‍යත යනු ලට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. අපූරි- අපූරිෂ්ට යනු ලුඞ් ප්‍ර: එක වචන යි. (පූර්‍යෙත, පූර්‍යතාම්, අපූර්‍යත, පුපූරෙ, පූරිෂීෂ්ට, පූරිතා, පූරිෂ්‍යතෙ යනු පිළිවෙළින් විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට්- ආශීර් ලිඞ්- ලුට්- ලෘට් ප්‍රථම පුරුෂෛක වචන යි.)

**4. පද් ගතෞ. පද්‍යතෙ, පද්‍යන්ත, පද්‍යතාමි, අපද්‍යත, පෙදෙ, පත්සිෂට, පත්තා, පත්ස්‍යතෙ, අපත්ස්‍යත, අපාදි අපත්සාතාමි අපත්සත.**

**5. බුධ අවගමනෙ. බුධ්‍යතෙ, බුධ්‍යන්ත, බුධ්‍යතාමි, අබුධ්‍යත, බුබුධෙ· "ආදිජබානාම්"–"සිස්සොඃ" "ධසෙ චපා ඛසානාම්" භුත්සීෂට, බොද්ධා, භොත්ස්‍යතෙ, අභොත්ස්‍යත, අබුද්ධ අභුත්සාතාමි අභුත්සත, අබොධි.**

**6. තායඞ් පාලනසන්තනයොඃ. තායතෙ, තතායෙ, තායිෂීෂට, තායිතා, තායිෂ්‍යතෙ, අතායිෂ්‍යත, අතායි–අතායිෂට.**

---

4. පද් ගතෞ, "පද්" ධාතුව ගමන්හි වේ. පද්‍යතෙ –පෙ– අපත්ස්‍යත යනු ලට් –පෙ– ලෘඞ් ප්‍ර: එක වචන යි. අපාදි අපත්සාතාම් අපත්සත යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි. ("ලොපඃ පචාං කිතො‍ය චාස්‍ය" යි එත්‍ව– පූර්‍වලොප වීමෙන් ලිට් විබතෙහි "පෙදෙ–පෙදාතෙ–පෙදිරෙ" යනාදීන් වරනැගේ.) පත්සීෂට යනාදියෙහි "ධසෙ චපා ඛසා නාම්" යි දකාරයට තකාරය විය. පද් ධාතුහු කෙරෙන් ඉණ් ප්‍රත්‍යය නිත්‍යයෙන් වන හෙයින් ලුඞ් ප්‍රථම පුරුෂෛක වචනයෙහි "අපාදි" යි එක ම රූපයෙකි.)

5. බුධ අවගමනෙ, අකාරානුබන්ධ "බුධ්" ධාතුව අවබොධ කිරීමෙහි වේ. බුධ්‍යතෙ –පෙ– බුබුධෙ යනු ලට් –පෙ– ලිට් ප්‍ර: එක වචන යි. "ආදිජබානාං ඛභාන්තස්‍ය ඛභාඃ ස්ධ්වොඃ" යන සූත්‍රයෙන් බකාරයට භකාරය වේ. "සිස්සොඃ" යන සූත්‍රයෙන් ගුණ ප්‍රතිෂෙධය වේ. "ධසෙ චපා ඛසානාම්" යන සූත්‍රයෙන් ධකාරයට තකාරය වේ. භුත්සීෂට යනු ආශිර් ලිඞ් ප්‍ර: එක වචන යි. ලුට් ප්‍ර: එක වචනයෙහි බොද්ධා යනු වේ. ("බුධ් + තා" යි සිටි කල්හි ගුණ ව "තථොර්ධඃ" යි තකාරයට ධකාර ව "ඣබෙ ජබාඃ" යි ධාත්‍වන්ත ධකාරයට දකාර වීමෙන් සිද්ධ යි.) භොත්ස්‍යතෙ, අභොත්ස්‍යත යනු ලෘට්– ලෘඞ් ප්‍ර: එක වචන යි. අබුද්ධ අභුත්සාතාම් අභුත්සත යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි. අබොධි යනු ඉණ් ප්‍රත්‍යය වීමෙන් සිද්ධ ලුඞ් ප්‍ර: එක වචන යි.

6. තායඞ් පාලනසන්තනයොඃ, අකාර– ඞකාරානුබන්ධ "තාය්" ධාතුව පාලන ය– පැතිරීම ය යන අර්‍ථ දෙක්හි වේ. තායතෙ, තතායෙ, තායිෂීෂට, තායිතා, තායිෂ්‍යතෙ, අතායිෂ්‍යත යනු ලට්– ලිට්– ආශිර් ලිඞ්– ලුට්– ලෘට්– ලෘඞ් ප්‍ර: එක වචන යි. අතායි– අතායිෂට යනු ලුඞ් ප්‍ර: එක වචන යි. (විධි ලිඞ්– ලොට්– ලඞ් ප්‍රථම පුරුෂෛක වචනයන්හි "තායෙත– තායතාම්– අතායත යනු වේ.)

**7. ඔප්‍යායිඞ් වෘද්ධෞ. ප්‍යායතෙ, පප්‍යායෙ, ප්‍යායිෂීෂ්ට, ප්‍යායිතා, ප්‍යායිෂ්‍යතෙ, අප්‍යායිෂ්‍යත, අප්‍යායි- අප්‍යායිෂ්ට, අප්‍යායිෂාතාම්. ඉමෞ ද්වෞ භෞවාදිකෞ.**

**ඉති දිවාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා.**

---

a. **අථොභය පදිනඃ:-**

**1. ණහ බන්ධනෙ. නහ්‍යති- නහ්‍යතෙ, නහ්‍යෙත්- නහ්‍යෙත, නහ්‍යතු- නහ්‍යතාම්, අනහ්‍යත්- අනහ්‍යත, නනාහ නෙහතුඃ නෙහුඃ, නෙහිථ- නනද්ධ, නෙහෙ. නහ්‍යාත්- නත්සීෂ්ට, "නහො ධඃ" නද්ධා- නද්ධා, නත්ස්‍යති- නත්ස්‍යතෙ,**

---

7. ඔප්‍යායිඞ් වෘද්ධෞ, ඔකාර- ඞකාරානුබන්ධ "ප්‍යාය්" ධාතුව වැඩීමෙහි වේ. ප්‍යායතෙ යනු ලට් ප්‍ර: එක වචන සි. ("ප්‍යායෙත- ප්‍යායතාම්- අප්‍යායත" යනු විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචන සි.) පප්‍යායෙ-පෙ- අප්‍යායිෂ්‍යත යනු ලිට්-පෙ- ලෘඞ් ප්‍ර: එක වචන සි. අප්‍යායි- අප්‍යායිෂ්ට යනු ලුඞ් ප්‍ර: එක වචන සි. අප්‍යායිෂාතාම් යනු ද්වි වචන සි. ඉමෞ ද්වෞ, මේ (තාය්- ප්‍යාය්) ධාතු දෙදෙන; භෞවාදිකෞ, භ්වාදි ගණයට අයත් වෙත්. (එබැවින් "අප් කර්තරි" සි අප් විකරණය වේ. පදාදියට අයත් බැවින් මෙහි ම දැක්වූහ.)

දිවාදිෂු, දිවාදි විෂයෙහි; ආත්මනෙපදි ප්‍රක්‍රියා,
ආත්මනෙපදි ධාතුන්ගේ පදසාධන ක්‍රියාව; ඉති, මෙසේ සි.

---

a. **අථ**, ඉක්බිති; **උභයපදිනඃ**, උභයපදි ධාතුහු දක්වනු ලැබෙත්:-

1. **ණහ** බන්ධනෙ, ණොපදෙශ අකාරානුබන්ධ "ණහ්" ධාතුව බැඳීමෙහි වේ. නහ්‍යති- නහ්‍යතෙ -පෙ- අනහ්‍යත්- අනහ්‍යත යනු ලට් -පෙ- ලඞ් පරස්මෛපද හා ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන සි.

නනාහ නෙහතුඃ නෙහුඃ යනු ලිට් පරස්මෛපද ප්‍රථම පුරුෂ සි. නෙහිථ- නනද්ධ යනු මධ්‍යම පුරුෂෛක වචන සි. ("අත්වතො නිත්‍යානිටස්ථපො වෙට්" සි ඉඩ් විකල්ප හෙයින් රූප ද්වයෙකි.) නෙහෙ යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන සි. නහ්‍යාත්- නත්සීෂ්ට යනු ආශීර් ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. නද්ධා -

**අනහ්‍යත්- අනහ්‍යත, අනාත්සිත් අනාද්ධාම් අනාත්සුඃ, අනද්ධ අනහ්‍යාතාම් අනහ්‍යත.**

**ඉති දිවාදිමුභයපදි ප්‍රක්‍රියා.**

---

## ඉති යවිකරණා දිවාදයො ධාතවඃ.

---

**a. අථ ස්වාදයඃ. තත්‍රාදාවුභයපදිනඃ.**

**1. ෂුඤ් අභිෂවෙ, ඤ උභයපදාර්ථඃ. "ආදෙඃ ෂණඃ ස්නඃ."**

---

අනහ්‍යත යනු දෙකක් බැගින් ලුට්- ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. අනාත්සිත්- අනාද්ධාම්- අනාත්සුඃ යනු ලුඞ් පරස්මෛ පද ප්‍රථම පුරුෂ යි. අනද්ධ- අනහ්‍යාතාම්- අනහ්‍යත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. (ද්විත්ව වීමෙන් "න නහ්+ථ" යි සිටි කල්හි "නහොධඃ" යි හකාරයට ධකාර ව "නථොර්ධඃ" යි ථකාරයට ධකාර ව "ඣබෙ ජබාඃ" යි පූර්ව ධකාරයට දකාර ව "ननद्ध" යි සිද්ධ යි. "නද්ධා- නද්ධාරෞ- නද්ධාරඃ" යනාදිය ද එසේ යි. "නත්සීෂ්ට" යනාදියෙහි හකාරයට ධකාර ව "ඛසෙ චපාඃ" යනාදීන් ධකාරයට තකාර වේ. අනාත්සීත් යනාදියෙහි "අත උපධායාඃ" යි වෘද්ධි වේ.)

දිවාදිමුභයපදි ප්‍රක්‍රියා, දිවාදි ගණයෙහි උභයපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

යවිකරණාඃ, යකාරය විකරණ කොට ඇති; දිවාදයඃ ධාතවඃ, දිවාදි ධාතූහු; ඉති, මෙසේ යි.

## දිවාදි ගණය සමාප්ත යි.

---

a. අථ, දිවාදි ගණයට අනතුරු ව; ස්වාදයඃ, ස්වාදීහු දක්වනු ලැබෙත්. තත්‍ර, එහි; ආදෞ, ආදියෙහි, හෙවත් පළමු කොට; උභයපදිනඃ, උභයපදි ධාතූහු කියනු ලැබෙත්.

1. ෂුඤ් අභිෂවෙ, ෂොපදෙශ- ඤකාරානුබන්ධ "ෂු" ධාතුව අභිෂවයෙහි වේ. (අභිෂව නම් නෑවීම, නෑම, පෙළීම, රා ගැඞීම යන සතර යි.) ඤඃ උභයපදාර්ථඃ, ඤකාරය උභයපද වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. "ආදෙඃ ෂණඃ ස්නඃ" යන සූත්‍රයෙන් ෂකාර යට සකාර වේ.

## 156. ස්වාදේර් නුඃ. (ස්වාදෙඃ 5-1. නුඃ 1-1.)

b. ස්වාදිගණාන්නුප්‍රත්‍යයො භවති චතුර්ෂු පරෙෂු. අපො'පවාදඃ.

## 157. නූපඃ. (නූපඃ. 6-1.)

c. විකරණස්‍ය නුප්‍රත්‍යයස්‍ය උප් ප්‍රත්‍යයස්‍ය ච ගුණො භවති පිති පරෙ.

d. සුනොති, සුනුතඃ. "නුධාතොඃ" සුන්වන්ති. සුනොෂි සුනුථඃ සුනුථ, සුනොමි.

## 158. ඔර්ව්මොඃ. (ඔඃ 6-1. ව්මොඃ 7-2.)

---

156. නු ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද, "අප් කර්තරි" යි 'කර්තරි' යනු ද අනුවෘත්ත යි. කර්තරි, කර්තෘ කාරක යෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; ස්වාදෙඃ, ස්වාදි ධාතු ගණයා කෙරෙන්; නුඃ, නු ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; ස්වාදෙඃ ගණාත් ස්වාදි ගණයා කෙරෙන්; නු ප්‍රත්‍යයඃ භවති, නු ප්‍රත්‍යය වේ. අපඃ අපවාදඃ, අප් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. (මෙයින් ස්වාදි ගණයට 'නු' විකරණය විහිත ය.)

157. ගුණ විධි සූත්‍ර යි. "ද්වෞ ස්වරෙ'පි පිති නොපධායාඃ" යි 'පිති' යනු ද, "ගුණඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. පිති, පිත් පර කල්හි; නූපඃ, නු– උප් යන විකරණ ද්වයට; ගුණඃ, ගුණ වේ.

c. පිති පරෙ, ප යන්න ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; විකරණස්‍ය, විකරණ වූ; නු ප්‍රත්‍යයස්‍ය, නු ප්‍රත්‍යයට ද; උප් ප්‍රත්‍ය යස්‍ය ච, උප් ප්‍රත්‍යයට ද; ගුණඃ භවති, ගුණ වේ. (නු විකරණයට හා තනාදි ගණයෙහි උප් විකරණයට ද "තිප්" ආදි පයන්න ඉත් කොට ඇති ප්‍රත්‍යයන් පර කල්හි මෙයින් ගුණ වේ.)

d. සුනොති, සුනුතඃ යනු ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂ එක– ද්වි වචන යි. "නුධාතොඃ" යන සූත්‍රයෙන් උකාරයට වකාර වේ. සුන්වන්ති යනු බහු වචන යි. සුනොෂි සුනුථඃ සුනුථ යනු මධ්‍යම පුරුෂ යි. සුනොමි යනු උත්තම පුරුෂෛක වචන යි.

158. උකාරලොප විධි සූත්‍ර යි. "ලොපඃ" යන සූත්‍රය ද, "ඔජ්ඣෙඃ" යි 'වා' යනු ද අනුවෘත්ත යි. ව්මොඃ, වකාර–මකාර ද්වය පර කල්හි; ඔඃ, උකාරයට; වා, ව්‍යවස්ථා වශයෙන්; ලොපඃ, ලොප් වේ.

**a. අසංයොගාදුත්තරස්ස ප්‍රත්‍යය සම්බන්ධින උකාරස්ස වා ලොපො භවති ව්මොඃ පරයොඃ.**

**b. සුනුවඃ- සුන්වඃ, සුනුමඃ- සුන්මඃ. සුනුතෙ සුන්වාතෙ සුන්වතෙ. සුනුයාත්- සුන්වීත. සුනොතු- සුනුතාද්වා සුනුතාම් සුන්වන්තු.**

## 159. ඔර්වාහෙඃ. (ඔඃ 5-1. වා-නි: හෙඃ 6- 1.)

**c. ප්‍රත්‍යය සම්බන්ධින උකාරාදුත්තරස්ස හෙර්ලොපො භවති. වාග්‍රහණාත්සංයොගාන්ත. තෙන තක්ෂ්ණුහි- ත්වක්ෂ්ණුහීත්‍යත්‍ර න.**

---

a. ව්මොඃ පරයොඃ, වකාර- මකාර දෙදෙන පර කල්හි; අසංයොගාත් උත්තරස්ස, අසංයොගයා කෙරෙන් පර වූ; ප්‍රත්‍යය සම්බන්ධිනඃ, ප්‍රත්‍යය පිළිබඳ වූ; උකාරස්ස, උකාරයට; වා, විකල්පයෙන්; ලොපඃ භවති, ලොප් වේ. (ප්‍රත්‍යයන් පිළිබඳ උකාරය වකාර-මකාර පර කල්හි ව්‍යවස්ථා වශයෙන් ලොප් වේ. වා යනු ව්‍යවස්ථා වාචක බැවින් සංයොගයක් පූර්ව කොට නැති ප්‍රත්‍යය වූ හෝ ප්‍රත්‍යයාන්ත වූ උකාරයට ලොප් වේ. මුලින් සංයොගයක් ඇති කල්හි මෙකී ලොපය නො වේ.)

(මේ සූත්‍රය සාරස්වතයන්හි "ඛර්වමොර්වා ලොපඃ" යි පෙණේ. ලොපඃ යනු ද- වා යනු ද අනුවෘත්ත විය හැකි ය. "වමොඃ" යනු අපපාඨ යි. සප්තමී ද්විවචනයෙහි "වමොඃ" යි වීමට ප්‍රකෘතිය "වම්" යි විය යුතු. "ව් ච ම් ච" යි ද්වන්ද්ව සමාස කළ කල්හි "ව්ම්" කියා මිස "වම්" යි වීමට හේතුවෙක් නැත. "වශ්ච මශ්ච" යි ස්වරාන්ත කොට ගතහොත් "වම" යි ප්‍රකෘතිය වී සප්තමී ද්විවචනයෙහි "වමයොඃ" යි වේ. මෙසේ හෙයින් ශුද්ධ පාඨය "ඛර්ව්මොඃ" යනු මැයි.)

b. සුනුවඃ- සුන්වඃ, සුනුමඃ- සුනමඃ යනු උ: ද්වි- බහු වචන යි. සුනුතෙ සුන්වාතෙ සුන්වතෙ යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. සුනුයාත්- සුන්වීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. සුනොතු යනු ලොට් ප: ප්‍ර: එක වචන යි. සුනුතාත් වා, (තාතඞ් ආදෙශයෙන්) සුනුතාත් කියා හෝ වේ. සුනුතාම් සුන්වන්තු යනු ද්වි- බහු වචන යි.

159. හිලොප විධි සූත්‍ර යි. "ලොපඃ" යන සූත්‍රය අනුවෘත්ත යි. ඔඃ, උකාරයා කෙරෙන් පර වූ; හෙඃ, හි ප්‍රත්‍යයට; වා, ව්‍යවස්ථා වශයෙන්; ලොපඃ, ලොප් වේ.

c. ප්‍රත්‍යය සම්බන්ධිනඃ, ප්‍රත්‍යය පිළිබඳ වූ; උකාරාත් උත්තරස්ස, උකාරයා කෙරෙන් පර වූ; හෙඃ, හි ප්‍රත්‍යයට; ලොපඃ භවති, ලොප් වේ. වා ග්‍රහණාත්, වා ග්‍රහණයෙන්; සංයොගාත්, සංයොගයා

**a. සුනු- සුනුනාත්, සුනවානි, සුනුතාම්. අසුනොත්- අසුනුත, සුෂාව සුෂුවතුඃ, සුෂවිථ- සුෂොථ, සුෂුවෙ, සූයාත්- සොෂීෂ්ට, සොතා- සොතා, සොෂ්‍යති- සොෂ්‍යතෙ, අසොෂ්‍යත්- අසොෂ්‍යත.**

**b. සනුසුධූඤාං පෙ සෙඩ් වා වක්තව්‍යඃ. අසාවීත්- අසෞෂීත්, දුසුසනුනු ධාතුනාම්ඩ වෙති කෙචිත්. අසවිෂ්ට- අසොෂ්ට.**

---

කොරෙන් පර වූවහුට; න, ලොප් නො වේ. තෙන, එහෙයින්; තක්ෂ්ණුහි ත්වක්ෂ්ණුහි ඉති අත්‍ර, තක්ෂ්ණුහි- ත්වක්ෂ්ණුහි යන මෙහි; න, හිලොපය නො වේ.

(මේ සූත්‍රයෙහි වා ශබ්දය විකල්ප විධානය පිණිස නො වේ. ප්‍රත්‍යය සම්බන්ධ නො වූ උකාරයෙන් හා සංයොග පූර්වක උකාර යෙන් පර හි ප්‍රත්‍යයට ලොප් නො වීම පිණිස ය. යුහි- රුහි යනාදි යෙහි ප්‍රත්‍යය සම්බන්ධ නො වූ උකාරයෙන් පර හි ප්‍රත්‍යය ද; ශක්නුහි- තක්ෂ්ණුහි යනාදියෙහි සංයොග පූර්වක උකාරයෙන් පර හි ප්‍රත්‍යය ද ලොප් නුවූහ. සංයොග පූර්වක නොවූ, හුදු ප්‍රත්‍යය වූ ද- ප්‍රත්‍යයාවයව වූ ද උකාරයෙන් පර හි ප්‍රත්‍යය නිත්‍යයෙන් ලොප් වේ.)

a. සුනු- සුනුතාත් යනු ලොට් ම: එක වචන යි. සුනවානි යනු උ: එක වචන යි. සුනුතාම් යනු ආ: ප්‍ර: එක වචන යි. අසුනොත් අසුනුත යනු ලඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. සුෂාව සුෂුවතුඃ යනු ලිට් ප: ප්‍ර: එක- ද්වි වචන යි. සුෂවිථ- සුෂොථ යනු ම: එක වචන යි. සුෂුවෙ යනු ආ: ප්‍ර: එක වචන යි. සූයාත්- සොෂීෂ්ට, සොතා- සොතා, සොෂ්‍යති- සොෂ්‍යතෙ, අසොෂ්‍යත්- අසොෂ්‍යත යනු ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

b. පෙ, පරස්මෛපදය පර කල්හි; සනුසුධූඤාම්, සනු- සු- ධූඤ් යන ධාතූන් පිළිබඳ; සෙඃ, සි ප්‍රත්‍යය සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඉට් වක්තව්‍යඃ, ඉඩාගමය වේ යයි කිය යුතු යි. අසාවීත් යනු ඉඩාගම පක්ෂයෙහි ලුඞ් ප: ප්‍ර: එක වචන යි. ("ධාතොර්නාමිනඃ" යි වෘද්ධි විය.) අසෞෂීත් යනු විකල්ප පක්ෂය යි. දුසුසනුනු ධාතූනාම්, දු- සු- සනු- නු යන ධාතූන්ගේ සිප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් වා ඉති, ඉඩාගමය විකල්පයෙන් වේ යයි; කෙචිත්, සමහරු කියත්. (මෙයින් ආත්මනෙ පදයෙහි ද විකල්පයෙන් ඉඩාගම වේ.) අසවිෂ්ට- අසොෂ්ට යනු ලුඞ් ආ: ප්‍ර: එක වචන යි. (අසවිෂ්ට- අසවිෂාතාම්- අසවිෂත යනාදීන් ඉට් පක්ෂයෙහි ද, අසොෂ්ට- අසොෂාතාම්- අසොෂත යනාදීන් අනිට් පක්ෂයෙහි ද වර නැඟේ).

**2. චිඤ් චයනෙ. චිනොති- චිනුතෙ, චිනුයාත්- චින්වීත, චිනොතු- චිනුතාම්, අචිනොත්- අචිනුත.**

**a. චිනොතෙඃ සණාදෞ කිත්වං වාච්‍යම්. චිකාය චික්‍යතුඃ චික්‍යුඃ. චිචාය, චික්‍යෙ- චිච්‍යෙ, චීයාත්-චෙෂීෂ්ට, චෙතා-චෙතා, චෙෂ්‍යති- චෙෂ්‍යතෙ, අචෙෂ්‍යත්- අචෙෂ්‍යත, අචෛෂීත්- අචෙෂ්ට.**

**3. ස්තෘඤ් ආච්ඡාදනෙ, ස්තෘණොති- ස්තෘණුතෙ, තස්තාර. "ගුණො'ර්තිසංයොගාද්‍යොඃ"* තස්තරතුඃ, තස්තරුඃ. තස්තර්ථ- තස්තරෙ, ස්තර්‍යාත්.**

---

2. චිඤ් චයනෙ, ඤකාරානුබන්ධ "චි" ධාතුව රැස් කිරීමෙහි වේ. චිනොති -පෙ- අචිනුත යනු දෙක බැගින් ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් ප: ආ: ප්‍ර: එක වචන සි.

a. සණාදෞ, ස ප්‍රත්‍යය හා ණබාදිය පර කල්හි; චිනොතෙඃ, චි ධාතුහට; වා, විකල්පයෙන්; කිත්වං වාච්‍යම්, කිකාර බව කිය යුතු සි. (ස ප්‍රත්‍යය පර කල්හි සහ ලිට් විබතෙහිත් චි ධාතුවට විකල්පයෙන් "කි" යනාදෙශ වන බව මෙයින් දැක්වේ.) චිකාය, චික්‍යතුඃ, චික්‍යුඃ යනු "කි" ආදෙශයෙන් සිද්ධ ලිට් ප: ප්‍රථම පුරුෂ සි. (ද්විත්ව ව "කිකි + ණප්" සි සිටි කල්හි "කුහොශ්චුඃ" සි පූර්ව කකාරයට චකාර ව "ධාතොර්නාමිනඃ" සි වෘද්ධි වී "ඓ ආය්" සි ආය් ආදෙශයෙන් "චිකාය" සි සිද්ධ සි. "නුධාතොඃ" සි ඉකාරයට යකාර වීමෙන් චික්‍යතුඃ යනු වේ. සෙස්ස ද මේ නයින් දත යුතු.) චිචාය, චිච්‍යතුඃ, චිච්‍යුඃ යනු කි ආදෙශ නුවූ පක්ෂයෙහි ප්‍රථම පුරුෂ සි. චික්‍යෙ- චිච්‍යෙ යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ එක වචන සි. (චික්‍යෙ, චික්‍යාතෙ, චික්යිරෙ- චිච්‍යෙ, චිච්‍යාතෙ, චිච්යිරෙ යනාදීන් දෙපසෙහි වරනැගේ.) චීයාත් -පෙ- අචෙෂ්ට යනු පිළිවෙළින් දෙක බැගින් ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. ("චීයාත්" යනාදියෙහි "යෙ" සි දීර්ඝ වේ. "චෙෂීෂ්ට" යනාදියෙහි සකාරයට "ක්ෂිලාත්-" යනාදීන් ෂකාර වේ.)

3. ස්තෘඤ් ආච්ඡාදනෙ, ඤකාරානුබන්ධ "ස්තෘ" ධාතුව වැසීමෙහි වේ. ස්තෘණොති- ස්තෘණුතෙ යනු ලට් ප: ආ: ප්‍ර: එක වචන සි. (විධිලිඞ්- ලොට්- ලඞ් ලකාරයන්හි පිළිවෙළින් ස්තෘණුයාත්- ස්තෘණ්වීත, ස්තෘණොතු- ස්තෘණුතාම්, අස්තෘණොත්- අස්තෘණුත යනු වේ. "ඍෘනෝර්ණො'නතෙත" සි නකාරයට මූර්ධන්‍ය ණකාර

---

* "ගුණඃ" යනු අනුවෘත්ත සි. "අර්තිසංයොගාද්‍යොඃ" යනු සූත්‍ර සි.

**b. සංයොගාදි ඍදන්තවෘඞ්වෘඤං සිසෙය්‍යාරාත්මනෙපදෙ ඉඩ් වා වක්තව්‍යඃ. ස්තරිෂීෂ්ට. "උඃ." ස්තෘෂීෂ්ට, ස්තර්තා– ස්තර්තා, ස්තරිෂ්‍යති– ස්තරිෂ්‍යතෙ, අස්තරිෂ්‍යත්- අස්තරිෂ්‍යත, අස්තාර්ෂීත්– අස්තරිෂ්ට, අස්තෘත.**

**4. වෘඤ් වරණෙ, වෘණොති- වෘණුතෙ, වවාර වව්‍රතු, වව්‍රුඃ.**

---

වේ.) තස්තාර යනු ලිට් ප: ප්‍ර: එක වචන සි. (ද්විත්ව ව "ස්තෘ ස්තෘ + ණප්" සි සිටි කල්හි "ශසාත් ඛපාඃ" සි පූර්ව රූපයේ තකාර ශෙෂ වේ. "රඃ" සි පූර්ව ඍකාරයට අකාර වේ. ඉන් පසු "ධාතොර්නාමිනඃ" සි වෘද්ධි වීමෙන් "තස්තාර" සි සිද්ධ සි.) "ගුණො'ර්ති සංයොගාද්‍යොඃ" යන සූත්‍රයෙන් ගුණ වේ. තස්තරතුඃ තස්තරුඃ යනු ද්වි– බහු වචන සි. තස්තර්ථ යනු ම: එක වචන සි. තස්තරෙ යනු ආ: ප්‍ර: එක වචන සි. (තස්තරාතෙ, තස්තරිරෙ යනු එහි ද්වි– බහු වචන සි.) ස්තර්යාත්, යනු ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචන සි.

b. සංයොගාදි ඍදන්ත වෘඞ් වෘඤූම්, සංයොගාදි ඍකාරාන්ත ධාතූය– වෘඞ්- වෘඤ් ධාතු ය යන මොවුන්ගේ; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි; සිසෙය්‍යාඃ, සි– සී දෙක සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඉට් වක්තව්‍යඃ, ඉඩාගමය කිය යුතු සි. (සංයොගයක් ආදි කොට ඇති ඍකාරය අන්ත කොට ඇති ධාතූන් කෙරෙන් ද– වෘඞ් වෘඤ් යන ධාතු ද්වයෙන් ද පර වූ ආත්මනෙපද සි ප්‍රත්‍යය සම්බන්ධ ව හා සීෂ්ට යනාදි ප්‍රත්‍යයන්ගේ "සී" යන්න සම්බන්ධව ද විකල්පයෙන් ඉඩාගම වන බව මෙයින් දක්වී. ස්තෘ ධාතුව සංයොගාදි ඍදන්ත ධාතුවක් හෙයින් එසේ ඉඩාගම වේ.) ස්තරිෂීෂ්ට යනු ඉට් පක්ෂයෙහි ආ: ප්‍ර: එක වචන සි. "උඃ" යන සූත්‍රයෙන් ගුණ ප්‍රතිෂෙධය වේ. ස්තෘෂීෂ්ට යනු අනිට් පක්ෂයෙහි ආශීර් ලිඞ් ආ: ප්‍ර: එක වචන සි. ස්තර්තා - අස්තරිෂ්ට යනු දෙක බැගින් ලුට්– ලෘට්– ලෘඞ්– ලුඞ් ප: ආ: ප්‍ර: එකවචන සි. අස්තෘත යනු අනිට් පක්ෂයෙහි ලුඞ් ආ: ප්‍ර: එක වචන සි.

4. වෘඤ් වරණෙ: ඤකාරානුබන්ධ "වෘ" ධාතුව රිස්සීමෙහි වේ. වෘණොති– වෘණුතේ යනු. ලට් ප: ආ: ප්‍ර: එක වචන සි. (වෘණුයාත්– වෘණ්වීත, වෘණොතු– වෘණුතාම්, අවෘණොත්– අවෘණුත යනු විධි ලිඞ්– ලොට්– ලඞ් ප: ආ: ප්‍ර: එක වචන සි.) වවාර වව්‍රතුඃ වව්‍රුඃ යනු ලිට් ප: ප්‍රථම පුරුෂ සි.

**4. වෘණොතෙස්ඵපො නිත්‍යමිට්. වවරිථ වව්‍රථුඃ වව්‍ර, වවාර- වවර වවෘව වවෘම. වව්‍රෙ, වවෘඪ්වෙ, ව්‍රියාත්- වරිෂීෂ්ට, "ඊටො ග්‍රහාම්." වරීෂීෂ්ට, වරිතා- වරීතා, වරිතා- වරීතා, වරිෂ්‍යති- වරීෂ්‍යති, වරිෂ්‍යතෙ- වරීෂ්‍යතෙ, අවරිෂ්‍යත්- අවරීෂ්‍යත්, අවරිෂ්‍යත- අවරීෂ්‍යත. අවාරීත්, අවරිෂ්ට- අවරීෂ්ට- අවෘත.**

**5. ධූඤ් කම්පනෙ. ධූනොති- ධූනුතෙ, ධූනුයාත්- ධූන්වීත, ධූනොතු- ධූනුතාම්, අධූනොත්- අධූනුත, දුධාව- දුධුවෙ, ධූයාත්- ධවිෂීෂ්ට= ධොෂීෂ්ට.**

---

4. වෘණොතෙඃ, වෘ ධාතුහු කෙරෙන් පර වූ; ඵපඃ, ඵප් ප්‍රත්‍යය සම්බන්ධ ව, නිත්‍යම්, නිත්‍යයෙන්; ඉට්, ඉඩාගම වේ. වවරිථ වව්‍රථුඃ වව්‍ර යනු මධ්‍යම පුරුෂ සි. වවාර- වවර වවෘව වවෘම යනු උත්තම පුරුෂ සි. ("ණබුත්තමො වා ණිද්වක්තව්‍යඃ" සි කී හෙයින් උත්තම පුරුෂෙක වචනයෙහි වෘද්ධිය විකල්පයෙනි. එබැවින් එහි රූප ද්වයෙකි.) වව්‍රෙ යනු ආ: ප්‍ර: එක වචන සි. වවෘඪ්වෙ යනු ම: බහු වචන සි. ("නාමිනො 'චතුර්ණාං ධො ඪඃ" සි ධකාරයට ඪකාර විය.) ව්‍රියාත්- වරිෂීෂ්ට යනු ආශීර් ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. ("යාදෘදෙඃ" සි රිඞාදෙශයෙන් ව්‍රියාත් යනාදිය සිද්ධ සි.) "ඊටො ග්‍රහාම්" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඊකාරය වේ. වරීෂීෂ්ට යනු එසේ සිද්ධ ලිඞ් ආ: ප්‍ර: එක වචන සි. ("සංයොගාදි ඍදන්තා වෘඞ් වෘඤම්" යනාදීන් ඉට් විකල්ප කළ හෙයින් "වෘෂීෂ්ට" සි ඉඩාගම නො වීමෙන් ද රූපයක් ලැබේ. එවිට ආශීර් ලිඞ් ආත්මනෙපදයෙහි "වරිෂීෂ්ට- වරීෂීෂ්ට- වෘෂීෂ්ට" යනාදි රූප ත්‍රය බැගින් විය යුතු.)

වරිතා -පෙ- අවරීෂ්‍යත යනු පිළිවෙළින් රූප චතුෂ්කය බැගින් ලුට්- ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. ("ඊටො ග්‍රහාම්" සි විකල්ප යෙන් ඊකාර වන හෙයින් සියලු වචනයන්හි රූප ද්වය බැගින් ලැබේ.) අවාරීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන සි. අවරිෂ්ට- අවරීෂ්ට- අවෘත යනු ආ: ප්‍ර: එක වචන සි. (මෙහි ද ආත්මනෙපදයෙහි ඉඩ් විකල්පත්වයෙන් රූප ත්‍රය බැගින් ලැබේ. පරස්මෛපදයෙහි නිත්‍ය හෙයින් ද, වෘද්ධි හෙතුවෙන් ඊට දීර්ඝ නො වන හෙයින් ද එක ම රූපය බැගිනි.)

5. ධූඤ් කම්පනෙ, ඤකාරානුබන්ධ "ධූ" ධාතුව සෑලීමෙහි වේ. ධූනොති -පෙ- අධූනුත යනු දෙක බැගින් ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. දුධාව- දුධුවෙ යනු ලිට් ප: ආ: ප්‍ර: එක වචන සි. ධූයාත් යනු ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචන සි. ධවිෂීෂ්ට- ධොෂීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන සි. (පද සිද්ධිය සුගම සි.)

b. "ස්වරතිසූතිසූයතිධූඤ්රධාදිනාං වා" ධවිතා-ධොතා, ධවිෂ්‍යති- ධොෂ්‍යති, අධවිෂ්‍යත්- අධොෂ්‍යත්, අධාවීත්- අධෞෂීත්, අධවිෂ්ට- අධොෂ්ට.

ඉති ස්වාදිෂූභයපදි ප්‍රක්‍රියා.

---

a. අථ පරස්මෛපදිනඃ:—

**1. හි ගතෞ වෘද්ධෞ ච. හිනොති.**

b. ද්විරුක්තස්‍ය හිනොතෙඃ කුත්වං වාච්‍යම්. ජිඝාය, හියාත්, හෙතා, හෙෂ්‍යති, අහෙෂ්‍යත්, අහෛෂීත්.

---

b. ස්වරති සූති සූයති ධූඤ් රධාදීනාම්, ස්වෘ ශබ්දෙ- ෂූඞ් ප්‍රසවෙ (අදාදි) ෂූඞ් ප්‍රාණිගර්භවිමොචනෙ- (දිවාදි) ධූඤ් කම්පනෙ- යන මේ ධාතූන් හා රධාදි ධාතූන්ගේ ප්‍රත්‍යය සම්බන්ධ ව; වා, විකල්පයෙන් ඉඩාගම වේ. ධවිතා- ධොතා, ධවිෂ්‍යති- ධොෂ්‍යති, අධවිෂ්‍යත්- අධොෂ්‍යත්, අධාවීත්- අධෞෂීත් යනු රූප ධූඤ ඛැගින් ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. (ධවිතා- ධොතා, ධවිෂ්‍යතෙ, ධොෂ්‍යතෙ, අධවිෂ්‍යත- අධොෂ්‍යත,) අධවිෂ්ට- අධොෂ්ට යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යි.

ස්වාදිෂු උභයපදි ප්‍රක්‍රියා, ස්වාදි ගණයෙහි උභයපදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

---

a. අථ, උභයපදි ප්‍රක්‍රියාවට අනතුරු ව; පරස්මෛපදිනඃ, පරස්මෛපදි ධාතුහු දක්වනු ලැබෙත්.

1. හි ගතෞ වෘද්ධෞ ච, "හි" ධාතුව ගමනෙහි ද වැඩීමෙහි ද වේ. හිනොති යනු ලට් ප්‍ර: එක වචන යි. (විධිලිඞ්- ලොට්- ලඞ්- ප්‍ර: එක වචනයන්හි හිනුයාත් හිනොතු අහිනොත් යනු වේ.)

b. ද්විරුක්තස්‍ය, ද්විරුක්ත වූ; හිනොතෙඃ, හි ධාතුහට; කුත්වම්; කවර්ග බව, වාච්‍යම්, කිය යුතු යි. (ද්විත්ව වූ පසු ධාතුහුගේ හකාරය මෙයින් ඝකාරය වේ. "වර්ග චතුර්ථා හස්‍ය සවර්ණඃ" යි කී හෙයින් වර්ගයන්ගේ සතර වන අකුර හකාරයට සවර්ණ වේ. එබැවින් හකාරයට කවර්ගය වේ යයි කී කල්හි සවර්ණත්වයෙන් ඝකාරය ම වන බව හැඟේ.) ජිඝාය යනු ලිට් ප්‍ර: එක වචන යි. හියාත් -පෙ- අහෛෂීත් යනු ආශීර්ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි.

**2. ශක්‍ෂ ශකෙනෟ. ශක්නොති, ශශාක, "ලොපඃ පචාං කිතො‍ය චාස්‍ය." ශෙකතුඃ ශෙකුඃ, ශක්‍යාත්, ශකතා, ශක්‍ෂ්‍යති, අශක්‍ෂ්‍යත්, අශකත්.**

**3. ධිවි ප්‍රීනෞ. "ඉදිතඃ-" ඉති නුම්. ධින්විකෘණ්‍ණො ර්‍යාණෝ ලොපො වාච්‍යශචතුර්ෂු.**

**c. යවයොඃර්සෙ හකාරෙ ච ලොපඃ. ධිනොති, ධිනුයාත්, ධිනොතු, අධිනොත්, දිධිව, ධිව්‍යාත්, ධින්විතා, ධින්විෂ්‍යති, අධින්විෂ්‍යත්, අධින්විත්.**

---

("කි + ණප්" සි සිටි කල්හි ද්විත්ව ච හකාරයට "ද්විරුක්තස්‍ය හිතොතෙඃ-" යනාදීන් සකාර ව පූර්ව හකාරයට "කුහොශ්චුඃ" සි ඛකාර ව නැවත ඊට "ඛපානාම්-" යනාදින් ජකාර ව "ජිකි + ණප්" සි සිටී. පසු ව "ධාතොනීාමිනඃ" සි වෘද්ධි ව "ආය්" ආදෙශ යෙන් "ජිකාය" සි සිද්ධ යි. ජිකයතුඃ- ජිකයුඃ යනාදිය ද මෙසේ ව ඉකාරයට "නුධාතොඃ" සි යකාර වීමෙන් සිඩ යි.)

2. ශකෟ ශකෙනෟ, ලනුබන්ධ "ශක්" ධාතුව හැකි බැව්හි වේ. ශක්නොති, (ශක්නුයාත්, ශක්නොතු, අශක්නොත්,) ශශාක යනු ලට්- (විධිලිඞ්- ලොට්- ලඞ්-) ලිට් ප්‍ර: එක වචන යි. "ලොපඃ පචාං කිතො‍ය චාස්‍ය" යන සූත්‍රයෙන් එත්ව- පූර්වලොප දෙක වේ. ශෙකතුඃ ශෙකුඃ යනු ලිට් ද්වි- බහු වචන යි. ශක්‍යාත්-පෙ- අශකත් යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

3. ධිවි ප්‍රීතෞ, ඉකාරානුබන්ධ "ධිව්" ධාතුව ප්‍රීතියෙහි වේ. "ඉදිතො නුම්" යන සූත්‍රයෙන් නුමාගම වේ. (මේ ඉකාර ඉත් කිරීමෙහි ප්‍රයෝජන යි.) චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; ධින්වි කෘණ්වොඃ, ධිව්- කෘවි ධාතු ද්වය පිළිබඳ; නඃ, නකාරයට; ලොපඃ වාච්‍යඃ, ලොපය කිය යුතු යි. ("ඉදිතො නුම්" සි ආගම වන 'ධිව්- කෘවි, ධාතු ද්වය පිළිබඳ නකාරය ලඩාදි සතරෙහි දී ලොප් වන බව මෙයින් දැක්වේ.)

c. වසෙ, වස ප්‍රත්‍යාහාරය ද; හකාරෙ ච, හකාරය ද පර කල්හි; යවයොඃ, යකාර- වකාර දෙකට; ලොපඃ, ලොප් වේ. (යකාරය හැර ඉතිරි සියලු ව්‍යඤ්ජනයන් පර කල්හි යකාර- වකාර ලොප් වන බව මෙයින් දැක්වේ. එබැවින් යාදිය හැර ඉතිරි ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයන් පරකල්හි ධිව්- කෘවි ධාතු දෙකේ වකාර ලොප් වේ.)ධිනොති-පෙ-අධින්වීත් යනු පිළිවෙළින් දශලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි. (නුමාගමයෙන් "ධින්ව් නු + ති" සි සිටි කල්හි නකාර- වකාර ලොප් ව "නූපඃ" සි ගුණ ව "ධිනොති" යි සිද්ධ යි. සෙස්ස සුගම යි.)

4. ක්‍ෂිවි හිංසායාම්. ක්‍ෂිණොති, චක්‍ෂිණ්ව, ධිනොති වත්.

5. ශ්‍රු ශ්‍රවණෙ.

## 160. ශ්‍රුවඃ ශෘ. (ශ්‍රුවඃ 6-1. ශෘ 1-1.)

a. ශ්‍රුවඃ ශෘ භවති චතුර්ෂු පරෙෂු.

b. ශෘණොති, ශුශ්‍රාව, ශුශ්‍රොථ, ශ්‍රුයාත්, ශ්‍රොතා, ශ්‍රොෂ්‍යති, අශ්‍රොෂ්‍යත්, අශ්‍රෞෂීත්.

ඉති ස්වාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා.

---

c. අථාත්මනෙපදිනඃ:—

---

4. ක්‍ෂිවි හිංසායාම්, ඉකාරානුබන්ධ "ක්‍ෂිවි" ධාතුව පෙළීමෙහි වේ. ක්‍ෂිණොති, චක්‍ෂිණ්ව යනු ලට්– ලිට් ප්‍ර: එක වචන යි. ධිනොති වත්, ධිවි ධාතුව මෙනි. ("ෂ්‍රුනෝණො'නතෙන" යි නකාරයට ණකාර වේ. ක්‍ෂිණුයාත්, ක්‍ෂිණොතු, අක්‍ෂිණොත්, ක්‍ෂිණිව්‍යාත්, ක්‍ෂිණිවිතා, ක්‍ෂිණිවිෂ්‍යති, අක්‍ෂිණිවිෂ්‍යත්, අක්‍ෂිණිවීත් යනු ඉතිරි ලකාරයන්හි ප්‍රථම පුරුෂෛක වචන යි.)

5. ශ්‍රු ශ්‍රවණෙ, "ශ්‍රු" ධාතුව ඇසීමෙහි වේ.

160. ශෘ ආදෙශ විධි සූත්‍ර යි. "අබාදෞවී පිති ත්සම්" යි 'අබාදෞ' යනු අනුවෘත්ත යි. අබාදෞ, අබාදි විෂයෙහි; ශ්‍රුවඃ, ශ්‍රු ධාතුහට; ශෘ, ශෘ යනාදෙශ වේ.

a. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; ශ්‍රුවඃ, ශ්‍රු ධාතුහට; ශෘ භවති, ශෘ ආදෙශ වේ. (සූත්‍ර පාඨයෙහි මේ සූත්‍රය "ශ්‍රුවඃ ශෘ ච" යි පෙණේ.)

b. ශෘණොති, (ශෘණුයාත්, ශෘණොතු, අශෘණොත්,) ශුශ්‍රාව යනු ලට්– (විධිලිඞ්–ලොට්– ලඞ්–) ලිට් ප්‍ර: එක වචන යි. (නකාරයට ණකාර වේ.) ශුශ්‍රොථ යනු ලිට් ම: එක වචන යි. ශ්‍රුයාත් –පෙ– අශ්‍රෞෂීත් යනු ආශීර් ලිඞ් –පෙ–ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

ස්වාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා, ස්වාදි ගණයෙහි පරස්මෛපදී ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

---

c. අථ, අනතුරු ව; ආත්මනෙපදිනඃ, ආත්මනෙපදී ධාතූහු දක්වනු ලැබෙත්:-

**1. අශූඞ් ව්‍යාපෙනෟ, ඌෟධාවිතෟ.**

**අශ්නුතෙ, අශ්නුවීත, අශ්නුතාම්, ආශ්නුත. "නුගශාම්" "ආහ්වොණ්ාදෞ." ආනශෙ, "ඌෟදිතො වා." අශිෂිෂට- අක්ෂිෂට, අශිතා- අෂටා, අශිෂ්‍යතෙ- අක්‍ෂ්‍යතෙ, ආශිෂ්‍යත- ආක්ෂ්‍යත. ආශිෂට- ආෂ්ට ආක්ෂාතාම් ආක්ෂත.**

**ඉති ස්වාදිෂ්වාතමනෙපදි ප්‍රක්‍රියා.**

---

## ඉති නුවිකරණාඃ ස්වාදයඃ.

---

1. අශූඞ් ව්‍යාපනෟ, "අශ්" ධාතුව පැතිරීමෙහි වේ. ඌෟධෞ ඉතෟ, ඌෟකාර- ඞකාර දෙක ඉත් ය. ("ඌෟදිතො වා" යි විකල්ප යෙන් ඉට් වන බව ද, ඞකාරයෙන් ආතමනෙපදි බව ද ඇඟවීම ප්‍රයෝජන යි.)

අශ්නුතෙ, අශ්නුවීත, අශ්නුතාම්, ආශ්නුත යනු ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ්- ප්‍ර: එක වචන යි. "නුගශාම්" යන සූත්‍රයෙන් පූර්ව රූපය සම්බන්ධ ව නුගාගම වේ. "ආහ්වොණ්ාදෞ" යන සූත්‍රයෙන් පූර්ව අකාරයට ආකාර වේ. ආනශෙ යනු ලිට් ප්‍ර: එක වචන යි. (ද්විත්ව ව "අ අශ් + එ" යි සිටි කල්හි නුගාගමයෙන් "අන් අශ් + එ" යි වේ. පසු ව පූර්වයට ආකාරාදෙශ කොට පැමිණ වීමෙන් "ආනශෙ" යි සිද්ධ ය.) "ඌෟදිතො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඉඩාගම වේ. අශිෂිෂට-පෙ-ආෂට යනු පිළිවෙළින් රූප ද්වය බැගින් ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ආක්ෂාතාම්, ආක්ෂත යනු අතිට් පක්ෂයෙහි ලුඞ් ප්‍ර: ද්වි- බහු වචන යි. ("අශ් + ෂිෂට" යි සිටි කල්හි "ඡශෂරාජාදෙඃ ෂඃ" යි ශකාරයට ෂකාර ව "ෂඪොඃ කඃ සෙ" යි ඊට කකාර ව "ක්විලාත්-" යනාදීන් සකාරයට ෂකාර වීමෙන්; "අක්ෂිෂට" යනාදිය ද ෂත්වය හා ටුත්වය වීමෙන් "අෂටා" යනාදිය ද සිද්ධ යි.)

ස්වාදිෂු ආත්මනෙපදි ප්‍රක්‍රියා, ස්වාදි ගණයෙහි ආත්මනෙපදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

නුවිකරණාඃ "නු"යන්න විකරණ කොට ඇති; ස්වාදයඃ, ස්වාදි ධාතුහු; ඉති, මෙසේ වර නැගෙත්.

## ස්වාදි ගණය සමාප්ත යි.

**a, අථ රුධාදයඃ. තත්‍රාදෞ උභය පදිනඃ:-**

**1. රුධිර් ආවරණෙ, ඉරිත්.**

## 161. රුධාදෙර්නම්. (රුධාදෙඃ 5-1. නම් 1-1.)

**b. රුධාදෙර්ගණාත්නම් ප්‍රත්‍යයො භවති චතුර්ෂු පරෙෂු. අපො'පවාදඃ, මකාරඃ ස්ථාන නියමාර්ථඃ.**

**c, ණත්වම්, "තථොර්ධඃ" රුණද්ධි. "නමසො 'ස්‍ය." හසාත් පරස්‍ය ඛසස්‍ය සවර්ණෙ ඛසෙ ලොපො වාච්‍යඃ.* රුන්ධඃ රුන්ධන්ති, රුණත්සි රුන්ධඃ රුන්ධ, රුණද්මි රුන්ධ්වඃ රුන්ධ්මඃ.**

---

a. අථ, සවාදි ගණයට අනතුරු ව; රුධාදයඃ, රුධාදීහු දක්වනු ලැබෙත්:- තත්‍ර, එහි; ආදෞ, පළමු කොට; උභයපදිනඃ, උභය පදි ධාතුහු දක්වනු ලැබෙත්:-

1. රුධිර් ආවරණෙ, "රුධ්" ධාතුව ඇවිරීමෙහි වේ. ඉර් ඉත්, ඉර් යනු ඉත් ය. ("ඉරිතො වා" යි විකල්පයෙන් ඞ ප්‍රත්‍යය කිරීම එහි ප්‍රයෝජන යි.)

161. නම් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද, "අප් කර්තරි" යි 'කර්තරි' යනු ද අනුවෘත්ත යි. කර්තරි, කර්තෘ කාරකයෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; රුධාදෙඃ, රුධාදි ගණයෙන් පර ව; නම්, නම් ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; රුධාදෙඃ ගණාත්, රුධාදි ගණයෙන් පර ව; නම් ප්‍රත්‍යයඃ භවති, නම් ප්‍රත්‍යය වේ; අපඃ අපවාදඃ, අප් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. මකාරඃ, මකාරය; ස්ථාන නියමාර්ථඃ, ස්ථාන නියමය ප්‍රයෝජන කොට ඇත්තේ ය. (මෙයින් "නම්" විකරණය විහිත ය. විකරණයෙහි මකාරය ස්ථාන නියමය පිණිස ය. එහෙයින් "මිදන්ත්‍යාත් ස්වරාත්පරො වක්තව්‍යඃ" යි කී ලෙස අන්ත්‍යස්වරයෙන් පර ව වේ.)

c. ණත්වම්, "අවකුප්වන්තරෙ'පි" යි නකාරයට ණකාර බව වේ. "තථොර්ධඃ" යන සූත්‍රයෙන් තකාරයට ධකාරය වේ. රුණද්ධි යනු ලට් පරස්මෛපද ප්‍ර: එක වචන යි. "නමසො 'ස්‍ය" යන සූත්‍රයෙන් නම් විකරණයෙහි අකාර ලොප් වේ. සවර්ණෙ ඛසෙ, සවර්ණ වූ ඛස ප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; හසාත් පරස්‍ය, හස ප්‍රත්‍යාහාරයෙන් හෙවත් ව්‍යඤ්ජනයෙන් පර වූ; ඛසස්‍ය, ඛසප්‍රත්‍යාහාර

---

* "ත්‍රයො යත්‍රෛකා වර්ගීයා- මධ්‍යමස්‍යාත්‍ර ලුප්‍යතෙ." මු: බො: ටීකා.

a. **රුන්ධෙ රුන්ධාතෙ රුන්ධතෙ, රුන්ධ්‍යාත්- රුන්ධීත, රුණද්ධු- රුන්ධාම්, අරුණද්= අරුණත්- අරුන්ධ, රුරොධ රුරුධතුඃ රුරුධුඃ, රුරොධිථ, රුරුධෙ රුරුධාතෙ, රුධ්‍යාත්- රුත්සීෂට, රොද්ධා- රොද්ධා, රොත්ස්‍යති- රොත්ස්‍යතෙ, අරොත්ස්‍යත්-අරොත්ස්‍යත. "අනිටො'නාමිවතඃ" අරෞත්සීත්. "සිසෙ‍ය්‍යාඃ." අරුද්ධ අරුත්සාතාම් අරුත්සත. "ඉරිතො වා." අරුධත්.**

---

වර්ණයට; ලොපඃ වාච්‍යඃ, ලොපය කිය යුතු සි. (අතර සවර රහිත ව එක ලඟ සිටි ව්‍යඤ්ජන ත්‍රයයෙන් අග දෙක එක ම වර්ගයට අයත් ඣස ප්‍රත්‍යාහාර වර්ණ නම් එයින් පූර්ව වර්ණය ලොප් වන බව මෙයින් දැක්වේ.) රුන්ධඃ රුන්ධන්ති යනු ද්වි-බහු වචන සි. රුණත්සි රුන්ධඃ රුන්ධ, රුණධ්මි රුන්ධ්වඃ රුන්ධ්මඃ යනු මධ්‍යමොත්තම පුරුෂ සි.

("රුනධ් + තස්" සි සිටි කල්හි "නමසො'ස්‍ය" යි විකරණයේ අකාර ලොප් ව "තථොර්ධඃ" යි තකාරයට ධකාර ව "ඣසාත් පරස්‍ය ඣසස්‍ය" යනාදීන් පූර්ව ධකාර ලොප් ව "ස්‍රොර් විසර්ගඃ" යි සකාරයට විසර්ග වීමෙන් "රුන්ධඃ" යි සිද්ධ සි. සෙස්ස ද මේ නයින් දත යුතු.)

a. රුන්ධෙ රුන්ධාතෙ රුන්ධතෙ යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ සි. රුන්ධ්‍යාත්- රුන්ධීත, රුණද්ධු- රුන්ධාම් යනු විධි ලිඞ්- ලොට් පඃ ආඃ ප්‍රඃ එක වචන සි. අරුණද්-අරුණත් යනු ලඞ් පඃ ප්‍රඃ එක වචන සි. ("වාවසානෙ" යි තකාර- දකාර වන හෙයින් රූප ද්වයෙකි. අරුන්ධාම් අරුන්ධන් යනු ද්වි- බහු වචන සි.) අරුන්ධ යනු ආඃ ප්‍රඃ එක වචන සි. (අරුන්ධාතාම් අරුන්ධත යනු ද්වි- බහු වචන සි.) රුරොධ රුරුධතුඃ රුරුධුඃ යනු ලිට් පඃ ප්‍රථම පුරුෂ සි. රුරොධිථ යනු මඃ එක වචන සි. රුරුධෙ රුරුධාතෙ යනු ආඃ ප්‍රඃ එක- ද්වි වචන සි. රුධ්‍යාත්- රුත්සීෂට, රොද්ධා- රොද්ධා, රොත්ස්‍යති- රොත්ස්‍යතෙ, අරොත්ස්‍යත්- අරොත්ස්‍යත යනු ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන සි. "අනිටො'නාමිවතඃ" යන සූත්‍ර යෙන් වෘද්ධි වේ. අරෞත්සීත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන සි. "සිසෙ‍ය්‍යාඃ" යන සූත්‍රයෙන් ගුණ ප්‍රතිෂෙධය වේ. අරුද්ධ අරුත්සා තාම් අරුත්සත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ සි. "ඉරිතො වා" යන සූත්‍රයෙන් පරස්මෛපදයෙහි ඩ ප්‍රත්‍යය වේ. අරුධත් යනු ඩ ප්‍රත්‍යය වීමෙන් සිද්ධ ලුඞ් පඃ ප්‍රඃ එක වචන සි.(අරුධතාම් අරුධන් යනු ද්වි- බහු වචන සි.)

**2. උච්ඡෘදිර් දීප්ති දෙවනයොඃ, උඉරාවිතෞ.**

**a. ඡෘණත්ති ඡෘන්තඃ ඡෘන්දන්ති– ඡෘන්තෙ, ඡෘන්ද්‍යාත්– ඡෘන්දීත, ඡෘණත්තු– ඡෘන්තාම්, අච්ඡෘණත්= අච්ඡෘණද්, "දඃ සඃ." අච්ඡෘණඃ= අච්ඡෘණත් අච්ඡෘන්තම් අච්ඡෘන්ත– අච්ඡෘන්ත, චච්ඡර්ද– චච්ඡෘදෙ, ඡෘද්‍යාත්– ඡෘත්සීෂ්ට= ඡර්දිෂීෂ්ට, ඡර්දිතා– ඡර්දිතා, ඡර්දිෂ්‍යති= ඡත්ස්‍යති– ඡර්දිෂ්‍යතෙ= ඡත්ස්‍යතෙ, අච්ඡර්දිෂ්‍යත්= අච්ඡත්ස්‍යත්– අච්ඡර්දිෂ්‍යත= අච්ඡත්ස්‍යත, "ඉරිතො වා." අච්ඡෘදත්= අච්ඡර්දීත්– අච්ඡර්දිෂ්ට.**

**3. උතෘදිර් හිංසානාදරයොඃ. තෘණත්ති තෘන්තඃ තෘන්දන්ති–තෘන්තෙ, තෘන්ද්‍යාත්–තෘන්දීත, තෘණත්තු–තෘන්තාම්, අතෘණත්– අතෘන්ත, තතර්ද– තතෘදෙ, තෘද්‍යාත්– තෘත්සීෂ්ට=**

---

2. උච්ඡෘදිර් දීප්ති දෙවනයොඃ, "ඡෘද්" ධාතුව බැබලීම– ක්‍රීඩා කිරීම යන අර්ථ දෙක්හි වේ. උඉරෞ ඉතෞ, උ– ඉර් දෙක ඉත් ය.

a. ඡෘණත්ති ඡෘන්තඃ ඡෘන්දන්ති යනු ලට් ප: ප්‍රථම පුරුෂ යි. ඡෘන්තෙ යනු ආ: ප්‍ර: එක වචන යි. ඡෘන්ද්‍යාත්– ඡෘන්දීත, ඡෘණත්තු– ඡෘන්තාම් යනු විධිලිඞ්– ලොට් ප: ආ: ප්‍ර: එක වචන යි. අච්ඡෘණත්– අච්ඡෘණද්, යනු ලඞ් ප: ප්‍ර: එක වචන යි. "දඃ සඃ" යන සූත්‍රයෙන් විකල්පයෙන් දකාරයට සකාරය වේ. අච්ඡෘණඃ– අච්ඡෘණත් අච්ඡෘන්තම් අච්ඡෘන්ත යනු ලඞ් ප: මධ්‍යම පුරුෂ යි. අච්ඡෘන්ත යනු ආ: ප්‍ර: එක වචන යි. චච්ඡර්ද– චච්ඡෘදෙ යනු ලිට් ප: ආ: ප්‍ර: එක වචන යි. ඡෘද්‍යාත් යනු ආශිර් ලිඞ් ප: ප්‍ර: එක වචන යි. ඡෘත්සීෂ්ට– ඡර්දිෂීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි. (ඉඩ් විකල්පත්ව යෙන් රූප ද්වයෙකි.) ඡර්දිතා– ඡර්දිතා යනු ලුට් ප: ආ: ප්‍ර: එක වචන යි. ඡර්දිෂ්‍යති–පෙ– අච්ඡත්ස්‍යත යනු රූප චතුෂ්කය බැගින් ලෘට්– ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. "ඉරිතො වා" යන්නෙන් විකල්පයෙන් ඞ ප්‍රත්‍යය වේ. අච්ඡෘදත් යනු ඞ ප්‍රත්‍යය වීමෙන් ද, අච්ඡර්දීත් යනු සි ප්‍රත්‍යය වීමෙන් ද සිද්ධ ලුඞ් ප: ප්‍ර: එක වචන යි. අච්ඡර්දිෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි.

3. උතෘදිර් හිංසානාදරයොඃ, උ– ඉර් අනුබන්ධ "තෘද්" ධාතුව හිංසා– අනාදර යන අර්ථ දෙක්හි වේ. තෘණත්ති තෘන්තඃ තෘන්දන්ති යනු ලට් ප: ප්‍රථම පුරුෂ යි. තෘන්තෙ යනු ආ: ප්‍ර: එක වචන යි. තෘන්ද්‍යාත්–පෙ–තතෘදෙ යනු රූප ද්වය බැගින් විධිලිඞ්–ලොට්–ලඞ්–

තර්දිෂීෂ්ට, තර්දිතා- තර්දිතා, තර්දිෂ්‍යති= තර්ත්ස්‍යති- තර්දිෂ්‍යතෙ= තර්ත්ස්‍යතෙ, අතර්දිෂ්‍යත්= අතර්ත්ස්‍යත්- අතර්දිෂ්‍යත= අතර්ත්ස්‍යත, අතෘදත්- අතර්දීත්.

b. නෘත් තෘද් ඡෘද් චෘත් කෘද්භ්‍යෝ'සෙඃ සාදෙරිඩ් වා. අතර්දිෂ්ට.

ඉති රුධාදිඋභයපදි ප්‍රක්‍රියා.

—:०:—

a. අථ පරස්මෛපදිනඃ :-

**1.** ශිෂ්ඌ විශෙෂණෙ. ශිනෂ්ටි ශිංෂ්ටඃ ශිංෂන්ති, ශිංෂ්‍යාත්, ශිනෂ්ටු, අශිනට්, ශිශෙෂ, ශිෂ්‍යාත්, ශෙෂ්ටා, ශෙක්ෂ්‍යති, අශෙක්ෂ්‍යත්, අශිෂත්.

---

ලිට් ප: ආ: ප්‍ර: එක වචන යි. තෘද්‍යාත් යනු ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචන යි. තෘත්සීෂ්ට- තර්දිෂීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි. තර්දිතා- තර්දිතා යනු ලුට් ප: ආ: ප්‍ර: එක වචන යි. තර්දිෂ්‍යති-පෙ- අතත්ස්‍යත යනු රූප චතුෂ්කය බැගින් ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. අතෘදත්- අතර්දීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

b. නෘත්— කෘද්භ්‍යඃ, නෘත්- තෘද්- ඡෘද්- චෘත්- කෘත් යන ධාතූන් කෙරෙන් පර වූ; අසෙඃ, සි ප්‍රත්‍යය තොර කොට ඇති; සාදෙඃ, සකාරාදි ප්‍රත්‍යය සම්බන්ධ ව; වා ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. (මේ අදහස ම ඇති වාක්‍යයක් සාරස්වත 160 වෙනි පිටේ ද පෙණේ. මෙය මෙහි දක්වන ලද්දේ සි ප්‍රත්‍යය සම්බන්ධ ව නිත්‍ය යෙන් ඉඩාගම වන බව දැක්වීම පිණිස ය.) අතර්දිෂ්ට යනු ලුඞ් ආ: ප්‍ර: එක වචන යි. ("තෘනද් + ති" යි සිටි කල්හි "ෂ්‍රෑනෝ ණො 'නනෙත" යි නකාරයට ණකාර ව "ඛසෙ චපාඃ-* යනාදීන් දකාරයට තකාර ව "තෘණත්ති" යි සිද්ධ යි.)

රුධාදි ගණයෙහි උභයපදි ප්‍රක්‍රියාව මෙසේ යි.

—(०)—

a. අථ, ඉක්බිති; පරස්මෛපදිනඃ, පරස්මෛපදි ධාතූහු දක්වනු ලැබෙත්.

1. ශිෂ්ඌ විශෙෂණෙ, ලනුබන්ධ "ශිෂ්" ධාතුව වෙසෙසීම් අර්ථයෙහි වේ. ශිනෂ්ටි ශිංෂ්ටඃ ශිංෂන්ති යනු ලට් ප්‍රථම පුරුෂ යි. ශිංෂ්‍යාත්-පෙ-අශිෂත් යනු පිළිවෙළින් විධි ලිඞ්-පෙ-ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ("ශිෂ් + ති" යි සිටි කල්හි නම් විකරණය වීමෙන්

**2. හිසි හිංසායාම්. "ඉදිතඃ.-"**

## 162. නමඃ. (නමඃ 5-1.)

**b. නමඃ ප්‍රත්‍යයාත්පරස්‍ය නස්‍ය ලොපො භවති.**

**c. හිනස්ති හිංස්තඃ හිංසන්ති, හිංස්‍යාත්, හිනස්තු, ධෞ සලොපො වා සස්‍ය ද ඉති කෙචිත්. හින්ධි-හින්ද්ධි, අහිනත්-අහිනද්. දිපි සස්‍ය දඃ, සිපි වා. අහිනත්- අහිනඃ, ජිහිංස, හිංස්‍යාත්, හිංසිතා, හිංසිෂ්‍යති, අහිංසිෂ්‍යත්, අහිංසීත්.**

---

"ශිනශ් + ති" යි වේ. පසු ව ටුත්වයෙන් "ශිනෂ්ටි" යි වේ. "ශිංෂ්ටඃ" යනාදි තන්හි "නමසොʻස්‍ය" යි නම් විකරණයෙහි අකාර ලොප් ව නකාරයට "නශ්චාපදාන්තෙ ඣසෙ" යි අනුස්වාරය වේ. "ශිනක්ෂි" යන මධ්‍යම පුරුෂෛක වචනයෙහි "ෂඪොඃ කඃ සෙ" යි ෂකාරයට කකාර වේ. "ස්ථිලාත්-" යනාදීන් සකාරයට ෂකාර වේ. ලිත් බැවින් හෙවත් ඞ කාරය ඉත් කොට ඇති බැවින් "ලිත්පුෂාදෙර්ඞඃ" යි ඞ ප්‍රත්‍යය වීමෙන් "අශිෂත්" යනාදීන් ලුඞ් ලකාරයෙහි වර නැගේ.)

2. හිසි හිංසායාම්, ඉකාරානුබන්ධ "හිස්" ධාතුව පෙළීමෙහි වේ; "ඉදිතො නුම්" යන සූත්‍රයෙන් නුමාගම වේ.

162. නකාර ලොප විධි සූත්‍ර යි. "නො ලොපඃ" යන සූත්‍රය මීට අනුවෘත්ත වේ. නමඃ, නම් ප්‍රත්‍යයා කෙරෙන් පර වූ; නඃ, නකාරයට; ලොපඃ, ලොප් වේ.

b. නමඃ ප්‍රත්‍යයාත් පරස්‍ය, නම් ප්‍රත්‍යයා කෙරෙන් පර වූ; නස්‍ය, නකාරයට; ලොපඃ භවති, ලොප් වේ.

c. හිනස්ති හිංස්තඃ හිංසන්ති යනු ලට් ප්‍රථම පුරුෂ යි. හිංස්‍යාත් හිනස්තු යනු විධි ලිඞ්- ලොට් ප්‍ර: ඒක වචන යි. ධෞ, ධි ආදෙශය පර කල්හි; සලොපඃ, සකාරයට ලොප් වේ; වා, විකල්ප යෙන්, සස්‍ය දඃ ඉති, සකාරයට දකාරය වේ යයි; කෙචිත්, සමහරු කියත්. සකාරය ලොප් වූ කල්හි "හින්ධි" යනු ද, දකාරය වූ කල්හි "හින්ද්ධි" යනු ද ලොට් මධ්‍යම පුරුෂෛක වචන යි. අහිනත්-අහිනද් යනු ලඞ් ප්‍ර: ඒක වචන යි. දිපි, දිප් ප්‍රත්‍යය පර කල්හි; සස්‍ය දඃ, සකාරයට දකාරය වේ; සිපි වා, සිප් ප්‍රත්‍යය පර කල්හි විකල්පයෙන් සකාරයට දකාරය වේ. ("දිපි"- "සිපි.වා" යන සූත්‍ර ද්වයමෙයින් සිහිපත් කෙරේ.)අහිනත්-අහිනඃ යනු ලඞ් ම: ඒක වචන යි- ජිහිංස-පෙ- අහිංසීත් යනු ලිට්-පෙ- ලුඞ් ප්‍ර· ඒක වචන යි.

**3. භඤ්ජො ආමද්දනෙ, ඹ ඉත්. භනක්ති භඞ්කතෘ භඤ්ජන්ති, බභඤ්ජ, භජ්‍යාත්, භඞ්කතා, භඞ්ක්‍ෂ්‍යති, අභඞ්ක්‍ෂ්‍යත්.**

a. **සාවනිටො නිත්‍යං වෘද්ධිඃ.**

b. **අනිටො ධාතොර්නිත්‍යං වෘද්ධිර්භවති පරස්මෛපදෙ සෞ පරෙ. අභාඞ්ක්ෂීත් අභාඞ්ක්තාම් අභාඞ්ක්ෂුඃ.**

---

3. භඤ්ජො ආමද්දනෙ, "භන්ජ්" ධාතුව මැඩීමෙහි (=බිඳීමෙහි) වේ; ඹ ඉත්, ඹකාරය ඉත් ය; (ප්‍රයෝජන ක්ත ප්‍රත්‍යය පිළිබඳ නකාරයට නකාර වීම යි.)

භනක්ති භඞ්කතෘ භඤ්ජන්ති යනු ලට් ප්‍රථම පුරුෂ යි. (නම් විකරණය වීමෙන් "භනන්ජ්+ති" යි සිටි කල්හි "නමඃ" යි ධාතු හුගේ නකාරයට ලොප් ව "චොඃ කුඃ" යි ජකාරයට ගකාර ව "ඛසෙ චපාඃ–" යනාදීන් ගකාරයට කකාර ව "භනක්ති" යි සිද්ධ යි. "භනන්ජ්+තස්" යි සිටි කල්හි නකාර ලොප හා ජකාරයට ගකාර ද ඊට කකාර ද වීමෙන් "භනක්තස්" යි වූ පසු "නමසො "ස්‍ය" යි නම් විකරණයේ අකාර ලොප් ව "නශ්චාපදාන්තෙ ඣසෙ" යි නකාරයට අනුස්වාර ව ඊට "යමාං යපෙ'ස්‍ය" යි ඞකාර ව සකාර යට විසර්ග වීමෙන් "භඞ්කතෘ" යි සිද්ධ යි. මෙබඳු සෙස්ස ද මේ නයින් දත යුතු. භඤ්ජ්‍යාත්, භනක්තු යනු විධි ලිඞ්– ලොට් ප්‍ර: එක වචන යි. අභනක්– අභනඞ් අභඞ්කතාම් අභඤ්ජන් යනාදීන් ලඞ් ලකාරයෙහි වර නැගේ.) බභඤ්ජ -පෙ- අභඞ්ක්‍ෂ්‍යත් යනු ලිට් -පෙ- ලෘඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ("බභඤ්ජ" යනාදියෙහි ධාතුසථ නකාරයට අනුස්වාරය වී නැවත ඊට "යමාං යපෙ'ස්‍ය" යි වර්ගාන්ත ඤකාරය වෙයි. ආශීර් ලිඞ් ලකාරයෙහි "නො ලොපඃ" යි ධාතුසථ නකාරයට ලොප් වීමෙන් "භජ්‍යාත්" යනාදීන් වර නැගේ.)

a. සෞ, සි ප්‍රත්‍යය පර කල්හි; අනිටඃ, අනිට් ධාතුහට; නිත්‍යම්, නිත්‍යයෙන්; වෘද්ධිඃ, වෘද්ධි වේ.

b. පරස්මෛපදෙ, පරස්මෛ පදයෙහි; සෞ පරෙ, සි ප්‍රත්‍යය පර කල්හි; අනිටඃ ධාතොඃ, අනිට් ධාතුහට; නිත්‍යම්, නිත්‍යයෙන්; වෘද්ධිඃ භවති, වෘද්ධි වේ. (මේ වෘද්ධිය වනුයේ "අනිටො'නාම්වතඃ"* යන සූත්‍රයෙනි. මෙයින් එය ම නැවත සිහිපත් කරයි.) අභාඞ්ක්ෂීත් අභාඞ්ක්තාම් අභාඞ්ක්ෂුඃ යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි.

---

* මේ සූත්‍රයේ වෘත්තිය "අචතො නාම්වතශ්චානිටො ධාතොඃ" යි විය යුතු ය. එහෙත් පොතේ මුද්‍රිත ව තිබෙන්නේ "නාම්වතො'නිටො ධාතොඃ" කියා යි. එය සදෙසි.

4. අඤ්ජූ ව්‍යක්ති ම්‍රක්‍ෂණ කාන්ති ගතිෂු.

අනක්ති, අඤ්ජ්‍යාත්, අනක්තු, ආනක්- ආනග්, ආනඤ්ජ, අජ්‍යාත්, අඤ්ජිතා- අඩ්ක්තා, අඤ්ජිෂ්‍යති- අඞ්ක්‍ෂ්‍යති, ආඤ්ජිෂ්‍යත්- ආඞ්ක්‍ෂ්‍යත්, "අඤ්ජෙඃ සෙර්නිත්‍යම්ඩ වාච්‍යඃ." ආඤ්ජීත්.

ඉති රුධාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා.

---

a. අථාත්මනෙපදිනඃ:-

1. ඤි ඉන්ධී දීප්තෞ, ඤි ඊ ඉතෞ.

---

4. අඤ්ජූ ව්‍යක්ති- ම්‍රක්‍ෂණ- කාන්ති- ගතිෂු, ඌකාරානුබන්ධ "අන්ජ්" ධාතුව ව්‍යක්ත භාව ය- ගෑම ය- දිලිසීම ය- ගමන ය යන අර්ථයන්හි වේ.

අනක්ති, අඤ්ජ්‍යාත්, අනක්තු යනු ලට්- විධි ලිඞ්- ලොට් ප්‍ර: එක වචන යි. ආනක්- ආනග් යනු ලඞ් ප්‍ර: එක වචන යි. ("දිස්‍යාභිස්‍යාත්" යි දිප් ලොප හා "චොඃ කුඃ" යි ජකාරයට ගකාරාදෙශ ද, "වාවසානෙ" යි විකල්පයෙන් කකාරාදෙශ ද වේ.) ආනඤ්ජ අජ්‍යාත් යනු ලිට්- ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. (ද්විරුක්ත වීමෙන් "අ අන්ජ් + ණප්" යි සිටි කල්හි "නුගශාම්" යි නුගාගම ව "ආත්වොණ්ාදෞ" යි පූර්ව අකාරයට ආකාර ව ධාතුස්ථ නකාරයට අනුස්වාර හා ඊට වර්ග්‍යාන්තාදෙශ වීමෙන් "ආනඤ්ජ" යි සිද්ධ යි. අඤ්ජිතා -පෙ- ආඞ්ක්‍ෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. (වෙට් බැවින් රූප ද්වය බැගිනි.) අඤ්ජෙඃ, අන්ජ් ධාතුහු කෙරෙන් පර වූ; සෙඃ, සි ප්‍රත්‍යය සම්බන්ධ ව; නිත්‍යම්, නිත්‍යයෙන්; ඉට් වාච්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. (ධාතුව ඌකාරානුබන්ධ බැවින් "ඌදිතො වා" යි විකල්පයෙන් පැමිණෙන ඉඩාගමය මෙයින් නිත්‍ය කෙරේ.) ආඤ්ජීත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි. (ආඤ්ජිෂ්ටාම් ආඤ්ජිෂුඃ යනු ද්වි- බහු වචන යි.)

රුධාදිෂු, රුධාදි ගණයෙහි; පරස්මෛපදි ප්‍රක්‍රියා, පරස්මෛපදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

---

a. අථ, අනතුරු ව; ආත්මනෙ පදිනඃ, ආත්මනෙපදි ධාතුහු දක්වනු ලැබෙත්:-

1. ඤි ඉන්ධී දීප්තෞ, "ඉන්ධ්" ධාතුව බැබලීමෙහි වේ. ඤි ඊ ඉතෞ, ඤිකාර- ඊකාර දෙක ඉත් ය; (ප්‍රයෝජන "ඤීතාං තක් වර්තමානෙ'පි."- "ආදිදිතශ්ච." යන දෙසූතුරෙහි පෙණේ.)

**ඉන්‍ධෙ, ඉන්‍ධිහ, ඉන්‍ධාමි, ඓන්‍ධ, ඉන්‍ධාඤ්චක්‍රෙ, ඉන්‍ධිෂීෂ්ට, ඉන්‍ධිතා, ඉන්‍ධිෂ්‍යතෙ, ඓන්‍ධිෂ්‍යත, ඓන්‍ධිෂ්ට.**

**ඉති රුධාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා.**

# ඉති නම්විකරණා රුධාදයඃ.

**a. අථ තනාදයඃ. සර්වේ උභයපදිනඃ.**

**1. තනු විස්තාරෙ.**

---

ඉන්‍ධෙ -පෙ- ඓන්‍ධිෂ්ට යනු පිළිවෙළින් ලඩාදි දශ ලකාරයෙහි ආත්මනෙපද ප්‍රථම පුරුෂෛකවචන යි. (නම් විකරණය ව "ඉනන්ධ් + තෙ" යි සිටි කල්හි "නමඃ" යි ධාතුසථ නකාරයට ලොප් වේ. "තථොර්ධඃ" යි තකාරයට ධකාර වේ. "නමසො'ස්‍ය" යි විකරණයේ අයන්තට ලොප් වේ. "ඣසාත් පරස්‍ය ඣසස්‍ය"- යනාදීන් පූර්ව ධකාරයට ලොප් වේ. ඉන් පසු "නශ්චාපදාන්තෙ ඣසෙ" යි නයන්තට අනුස්වාරය ව නැවත ඊට "යමාං යපෙ'ස්‍ය" යි වර්ගාන්ත නකාරය වීමෙන් "ඉන්‍ධෙ" යි සිද්ධ යි. සෙස්ස ද මෙසේ යි. ලිට් ලකාරයෙහි "කාසාදි ප්‍රත්‍යයාදාම් ක්‍රස්භූපරඃ" යි ආම් ප්‍රත්‍යය වීමෙන් ඉන්‍ධාඤ්චක්‍රෙ යනාදීන් වර නැගේ. ලඞ්- ලෘඞ්- ලුඞ් ලකාර යන්හි "දිබාදාවට්"-"ස්වරාදෙඃ" යන සූත්‍ර ද්වයෙන් අඩාගම ද්වය වීමෙන් "ඓන්‍ධ" යනාදිය සිද්ධ යි.)

රුධාදිෂු, රුධාදි ගණයෙහි; ආත්මනෙපදි ප්‍රක්‍රියා, ආත්මනෙපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

නම් විකරණාඃ, නම් යන්න විකරණ කොට ඇති; රුධාදයඃ රුධාදි ධාතූහු; ඉති, මෙසේ යි.

# රුධාදි ගණය නිමි.

---

අථ, රුධාදි ගණයට අනතුරු ව; තනාදයඃ, තනාදි ධාතූහු දක්වනු ලැබෙත්. සර්වේ, සියලු තනාදි ධාතූහු; උභයපදිනඃ, උභයපදීහු වෙත්. (එහෙත් මේ කොටසෙහි ම අන්තයෙහි "මන්- වන්" යි ආත්මනෙපදි ධාතු ද්වයෙක් දක් වේ. පරස්මෛපදි යයි සමහරුන් කියන බව ද ඒ සමග ම කිය යි. සුබොධිනී ටීකායෙහි ද "වන්" ධාතුව දක්වා එසේ ම කීහ.)

1. තනු විස්තාරෙ, උකාරානුබන්ධ "තන්" ධාතුව විස්තාර කිරීමෙහි (=පැතිරවීමෙහි) වේ.

## 163. තනාදෙරුප්. (තනාදෙඃ 5-1. උප් 1-1.)

**b. තනාදෙර්ගණාදුප් ප්‍රත්‍යයො භවති චතුර්ෂු පරෙෂු. අපො'පවාදඃ. "නුපඃ."**

**c. තනොති- තනුතෙ, තනුයාත්- තන්වීත, තනොතු- තනුතාම්, අතනොත්- අතනුත, තතාන තෙනතුඃ තෙනුඃ- තෙනෙ, තන්‍යාත්- තනිෂීෂට, තනිතා- තනිතා, තනිෂ්‍යති- තනිෂ්‍යතෙ, අතනිෂ්‍යත්- අතනිෂ්‍යත, අතානීත්= අතනීත්- අතනිෂට.**

**d. තනාදෙරකාරෙතෙෂකාන්ඨාසොඩ් සිලොපො වාච්‍යඃ. "ලොපස්ඛනුදාත්ත තනාම්." අතත, අතථාඃ= අතනිෂ්ඨාඃ.**

---

163. උප් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද, "අප් කර්තරි" යි 'කර්තරි' යනු ද අනුවෘත්ත යි. කර්තරි, කර්තෘ කාරකයෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; තනාදෙඃ, තනාදි ගණයා කෙරෙන්; උප්, උප් ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; තනාදෙඃ ගණාත්, තනාදි ධාතු ගණයා කෙරෙන්; උප් ප්‍රත්‍යයඃ භවති, උප් ප්‍රත්‍යය වේ. (මෙයින් තනාදි ගණයෙන් පර ව "උප්" විකරණය විහිත ය. මෙහි "ප" යන්න "කුරුතඃ කුර්වන්ති" යනාදි තැන්හි ගුණය පිණිස යි. නො එසේ වීනම් "ඞිත්" බැවින් ගුණ නො වේ.) අපඃ අපවාදඃ, අප් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. "නුපඃ" යන සූත්‍ර යෙන් උප් විකරණයට ගුණ වේ.

c. තනොති -පෙ- අතනුත යනු රූප ද්වය බැගින් ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යි. තතාන තෙනතුඃ තෙනුඃ යනු ලිට් පඃ ප්‍රථම පුරුෂ යි. (එත්ව- පූර්වලොප වේ.) තෙනෙ යනු ලිට් ආඃ ප්‍රඃ එක වචන යි. (තෙනාතෙ තෙනිරෙ යනු ද්වි- බහු වචන යි.) තන්‍යාත් -පෙ- අතනිෂ්‍යත යනු රූප දෙක බැගින් ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. අතානීත්- අතනීත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. ("හසාදෙර්ලීස්වකාරොපධස්‍ය වා වෘද්ධිඃ සෙටි සෞ වාච්‍යා." යි කී හෙයින් විකල්පයෙන් වෘද්ධි වන බැවින් රූප ද්වයෙකි.) අතනිෂට යනු ආඃ ප්‍රඃ එක වචන යි.

**2. ක්ෂණු ක්ෂිණු හිංසායාම්.**

**ක්ෂණොති- ක්ෂණුතෙ, ක්ෂණුයාත්- ක්ෂණ්වීත, ක්ෂණොතු- ක්ෂණුතාම්, අක්ෂණොත්- අක්ෂණුත, චක්ෂාණ- චක්ෂණෙ, ක්ෂණ්‍යාත්- ක්ෂණිෂීෂ්ට, ක්ෂණිතා- ක්ෂණිතා, ක්ෂණිෂ්‍යති- ක්ෂණිෂ්‍යතෙ, අක්ෂණිෂ්‍යත්- අක්ෂණිෂ්‍යත, හම්‍යන්තක්ෂණෙති න වෘද්ධිඃ. අක්ෂණීත්, අක්ෂණිෂ්ට- අක්ෂත, අක්ෂථාඃ- අක්ෂණිෂ්ඨාඃ.**

---

d. අකාරෙතෙඃ, කෘ ධාතුව තොර කොට ඇති; තනාදෙඃ, තනාදිහු කෙරෙන්; තන් ථාසොඃ, තන්- ථාස් යන ප්‍රත්‍යය දෙක පර කල්හි; වා, විකල්පයෙන්; සිලොපඃ වාච්‍යඃ, සි ප්‍රත්‍යය ලොපය කිය යුතු සි. ("හ්‍රස්වාජ්ඣසෙ" සි නිත්‍යයෙන් විහිත සිප්‍රත්‍යය ලොපය මෙයින් විකල්ප කෙරේ. එහෙත් "අකාරෙතෙඃ" සි කී හෙයින් කෘ ධාතුහු කෙරෙන් පර සිප්‍රත්‍යයට නිත්‍යයෙන් ලොප් වේ.) "ලොපස්ත්වනුදාත්ත තනාම්" යන සූත්‍රයෙන් ධාත්වන්ත නකාර යට ලොප් වේ. අතත යනු සි ප්‍රත්‍යය ලොපයෙන් වූ ලුඞ් ආ: ප්‍ර: එක වචන සි. අතථාඃ යනු ම: එක වචන සි. අතනිෂ්ඨාඃ යනු විකල්පයෙන් සිප්‍රත්‍යය ලොප් නො වූ පක්ෂයෙහි ම: එක වචන සි.

2. ක්ෂණු- ක්ෂිණු හිංසායාම්, උකාරානු බන්ධ "ක්ෂන්- ක්ෂින්" ධාතු ද්වය හිංසාර්ථයෙහි වේ. (මේ ධාතු ද්වය ම දන්ත්‍ය නකාරාන්ත ය. මූර්ධන්‍ය වූයේ "අට්කුප්වාඞන්තරෙ'පි" යන සූත්‍ර බලයෙනි. නො එසේ නම් යඞ් ලුග් විෂයෙහි "චඞ්ක්ෂන්ති" සි ඞකාරය වීමට අනුස්වාරයෙක් නො ලැබේ.)

ක්ෂණොති -පෙ- අක්ෂණිෂ්‍යත යනු පිළිවෙළින් රූප දෙක බැගින් ලට් -පෙ- ලෘඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෙක වචන සි. හම්‍යන්තක්ෂණ ඉති, "හම්‍යන්තක්ෂණශ්වසිජාගෘණි ශ්වෙද්‍යිතාං සෙටි සෞ න වෘද්ධිඃ" යන සූත්‍රයෙන්; න වෘද්ධිඃ, වෘද්ධි නො වේ. ("අත උපධායාඃ." සි පැමිණෙන වෘද්ධිය මෙයින් වළකී.) අක්ෂණීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන සි. (අක්ෂණිෂ්ටාම් අක්ෂණිෂුඃ යනු ද්වි- බහු වචන සි.) අක්ෂණිෂ්ට- අක්ෂත යනු ආ: ප්‍ර: එක වචන සි. (අක්ෂණිෂාතාම් අක්ෂණිෂත යනු ද්වි- බහු වචන සි.) අක්ෂථාඃ- අක්ෂණිෂ්ඨාඃ යනු මධ්‍යම පුරුෂෙක වචන සි. (අක්ෂණිෂාථාම් අක්ෂණිඪ්වම්- අක්ෂණිද්වම් යනු ද්වි- බහු වචන සි. ආත්මනෙපද ප්‍රථම- මධ්‍යම පුරුෂෙක වචනයන්හි සිලොපය විකල්ප බැවින් රූප ද්වය බැගිනි.)

**3. තනාදෙරුපධායා ගුණො වොපි.* ක්ෂිණොති- ක්ෂෙණොති, අක්ෂෙණීත්, අක්ෂිත- අක්ෂෙණිෂට.**

**4. ෂණු දානෙ. සනෙ, සායාත්, සන්‍යාත්, අසනීත්- අසානීත්, අසත- අසනිෂ්ට, අසථාඃ- අසනිෂ්ඨාඃ.**

---

3. උපි, උප් ප්‍රත්‍යය පර කල්හි; තනාදෙඃ, තනාදි ධාතු ගණය පිළිබඳ, උපධායාඃ, උපධා සංඥයට; වා, විකල්පයෙන්; ගුණඃ, ගුණ වේ. (මෙහි තනාදි ගණයේ උපධාවට යයි සාමාන්‍යයෙන් කියන ලද නමුත් ගුණය නාමින් ස්වරස්ථානී බැවින් උපධාව "නාමින්" ස්වරයක් විය යුතු යි. එබැවින් තනු- ෂනු- ක්ෂණු ධාතූන් පිළිබඳ උපධාවට ගුණයක් නො ලැබේ.) ක්ෂිණොති- ක්ෂෙණොති යනු ලට් ප: ප්‍ර: එක වචන යි. (ක්ෂිණුතඃ ක්ෂිණ්වන්ති යනු ද්වි- බහු වචන යි. ක්ෂිණුතෙ ක්ෂිණ්වාතෙ ක්ෂිණ්වතෙ යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. ක්ෂිණුයාත්- ක්ෂිණ්වීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. ක්ෂිණොතු- ක්ෂෙණොතු- ක්ෂිණුතාත් යනු ලොට් ප: ප්‍ර: එක වචන යි. ක්ෂිණුතාම් යනු ආ: ප්‍ර: එක වචන යි. අක්ෂිණොත්- අක්ෂෙණොත් යනු ලඞ් ප: ප්‍ර: එක වචන යි. අක්ෂිණුත යනු ආ: ප්‍ර: එක වචන යි. ලිට් පරස්මෛපදයෙහි "චික්ෂෙණ චික්ෂිණතුඃ චික්ෂිණුඃ" යනාදි වශයෙන් ද, ආත්මනෙපදයෙහි "චික්ෂිණෙ චික්ෂිණාතෙ චික්ෂිණිරෙ" යනාදි වශයෙන් ද වර නැගේ. ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛකවචනයන්හි පිළිවෙළින් "ක්ෂිණ්‍යාත්- ක්ෂෙණිෂීෂට ක්ෂෙණිතා- ක්ෂෙණිතා, ක්ෂෙණිෂ්‍යති- ක්ෂෙණිෂ්‍යතෙ, අක්ෂෙණිෂ්‍යත්- අක්ෂෙණිෂ්‍යත" යනු වේ.) අක්ෂෙණීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචනයි. අක්ෂිත- අක්ෂෙණිෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි.

4. ෂණු දානෙ, ෂොපදෙශ උකාරානුබන්ධ "ෂන්" ධාතුව දීමෙහි වේ. (මෙහි ද නකාරය දන්ත්‍ය ය. ණත්වය සූත්‍ර බලයෙනි. නො එසේ වුව යඞ් ලුග් විෂයෙහි සංසන්ති සංසනතඃ යනාදියෙහි අනුස්වාරයෙක් නො ලැබේ. ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනයන්හි පිළිවෙළින් "සනොති- සනුතෙ, සනුයාත්- සන්වීත, සනොතු- සනුතාම්, අසනොත්- අසනුත" යනු වේ. "ආදෙඃ ෂණඃ සනඃ" යි ෂකාරයට සකාර වේ. ලිට් පරස්මෛපදයෙහි "සසාන සෙනතුඃ සෙනුඃ" යනාදි වශයෙන් වර නැගේ.)

---

* වා. පිති- පොත්හි.

**5. ඩු කෘඤ් කරණෙ, ඩුඤවිතෞ. "ගුණඃ" "නුපඃ" කරොති.**

## 164. ඕත්‍යදුඃ. (ඕති 7-1. අත් 1-1. උඃ 1-1.)

**a. කරොතෙරකාරස්‍ය උකාරො භවති ඕති විභක්තෞ පරතඃ.**

**b. කුරුතඃ කුර්වන්ති, කරොෂි කුරුථඃ කුරුථ, කරොමි. කුර්ඡුරොර් දීර්ඝඃ. කෘඤො නිත්‍යං වමො රුලොපො වාච්‍යඃ. කුර්වඃ කුර්මඃ, කුරුතෙ.**

---

සෙතෙ යනු ලිට් ආ: ප්‍ර: එක වචන යි. (සෙතාතෙ සෙතිරෙ යනු ද්වි- බහු වචන යි.) සායාත්, සත්‍යාත් යනු ආශීර්ලිඞ් ප: ප්‍ර: එක වචනයි. ("සන් + යාත්" යි සිටි කල්හි "ජනඛනසනාං ක්ඣිති යෙ ආකාරො වා වක්තව්‍යඃ" යි කී හෙයින් ධාත්වන්තයට විකල්පයෙන් ආකාරය වීමෙන් "සායාත්" යි සිද්ධ යි. පරස්මෛපද ද්විවචනාදියෙහි ද "සායාස්තාම්- සත්‍යාස්තාම්" යනාදි වශයෙන් රූප අවය බැගින් ලැබේ. ආත්මනෙපදයෙහි "සනිෂීෂ්ට- සනිෂීයාස්තාම් සනිෂීරන්" යනාදීන් වර නැගේ. ලුට්- ලෘට්- ලෘඞ්- ප: ආ: ප්‍ර: එක වචනයන්හි පිළිවෙළින් "සනිතා- සනිතා, සනිෂ්‍යති- සනිෂ්‍යතෙ, අසනිෂ්‍යත්- අසනිෂ්‍යත" යනු වේ.) අසනීත්- අසානීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. අසත- අසනිෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි. අසථාඃ- අසනිෂ්ඨාඃ යනු ම: එක වචන යි.

5. ඩු කෘඤ් කරණෙ, "කෘ" ධාතුව කිරීමෙහි වේ. ඩුඤෞ ඉතෞ, ඩුකාර- ඤකාර දෙක ඉත් ය. (ඩුකාරය "ඩ්විතස්ත්‍රිමක්" යි ත්‍රිමක් ප්‍රත්‍යය කිරීම පිණිස ය. ඤකාරය උභයපදී බව ඇඟවීමට ය.) "ගුණඃ" යන සූත්‍රයෙන් ධාතුහට ගුණ වේ. "නුපඃ" යන සූත්‍රයෙන් 'උප්' විකරණයට ගුණ වේ. කරොති යනු ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි.

164. උකාරාදෙශ විධි සූත්‍ර යි. "කෘඤො යෙ"යි 'කෘඤඃ' යනු අනුවෘත්ත වේ. ඕති, ඕත් පර කල්හි; කෘඤඃ, කෘ ධාතුහුගේ; අත්, අකාරය තෙමේ; උඃ, උකාරයෙක් වේ.

a. ඕති විභක්තෞ පරතඃ, ඕත් සංඥ විභක්ති පරකල්හි; කරොතෙඃ, කෘ ධාතුහුගේ; අකාරස්‍ය, අකාරයට; උකාරඃ භවති, උකාරය වේ. (ඍකාරයට ගුණ වීමෙන් ලැබෙන; "අර්" යන්නෙහි අකාරයට උකාරය වන බව මෙයින් දක්වේ.)

## 165. කෘඤො යෙ. (කෘඤඃ 5-1, යෙ 7-1.)

**c. කෘඤඃ උත්තරස්‍ය උප් ප්‍රත්‍යයස්‍ය ලොපො භවති යෙ පරෙ.**

**d. කුර්‍යාත්- කුර්වීත, කරොතු, කරවාණි, කුරුතාම්, කරවෛ, අකරොත්- අකුරුත, චකාර චක්‍රතුඃ චක්‍රුඃ, චකර්ථ, චක්‍රෙ, ක්‍රියාත්- කෘෂීෂ්ට, කර්තා, කරිෂ්‍යති, අකරිෂ්‍යත්, අකාර්ෂීත්- අකෘත අකෘෂාතාම් අකෘෂත.**

---

b. කුරුතඃ කුර්වන්ති යනු ද්වි- බහු වචන යි. කරොෂි කුරුථඃ කුරුථ යනු මධ්‍යම පුරුෂ යි. කරොමි යනු උත්තම පුරුෂෙක වචන යි. කුර්ඡුරොඃ, කුර්- ඡුර් දෙකට; න දීර්ඝඃ, දීර්ඝ නො වේ. (කුර්වන්ති කුර්වඃ කුර්මඃ යනාදියට "ර්වොර්ව් හසෙ" යි පැමිණෙන දීර්ඝය මෙයින් වළක්වන ලදී.) වමොඃ, වකාර- මකාර දෙක පර කල්හි; කෘඤඃ, කෘ ධාතුහු කෙරෙන්; උලොපඃ, උකාර ලොපය; නිත්‍යං වාච්‍යඃ, නිත්‍යයෙන් වේ යයි කිය යුතු යි. ("ඔර්ව්මො ර්වඃ"යි විහිත විකල්ප විධිය 'කෘ' ධාතුවෙන් පර උකාරයට නිත්‍යයෙන් වන බව මෙයින් දක්වයි.) කුර්වඃ කුර්මඃ යනු උ: ද්වි- බහු වචන යි. කුරුතෙ යනු ආ: ප්‍ර: එක වචන යි. (ද්විවචනාදියෙහි කුර්වාතෙ කුර්වතෙ යනාදීන් වර නැගේ.)

165. උප් ප්‍රත්‍යය ලොප විධි සූත්‍ර යි "ඔර්ව්මොඃ"යි 'ඔඃ' යනු ද, "ලොපඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. යෙ, යකාරය පර කල්හි; කෘඤඃ, කෘඤ් ධාතුහු කෙරෙන් පර වූ; ඔඃ, උකාරයට; ලොපඃ, ලොප් වේ.

c. යෙ පරෙ, යකාරය පර කල්හි; කෘඤඃ උත්තරස්‍ය, කෘඤ් ධාතුහු කෙරෙන් පර වූ; උප් ප්‍රත්‍යයස්‍ය, උප් ප්‍රත්‍යයට; ලොපඃ භවති, ලොප් වේ. (විධි ලිඞ් පරස්මෛපදයෙහි 'උප්' විකරණය මෙයින් ලොප් වේ.)

d. කුර්‍යාත්- කුර්වීත යනු විධිලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. කරොතු- (කුරුතාත් කුරුතාම් කුර්වන්තු, කුරු- කුරුතාත් කුරුතම් කුරුත;) කරවාණි (කරවාව කරවාම) යනු ලොට් පරස්මෙ පද යි. කුරුතාම්(කුර්වාතාම් කුර්වතාම්, කුරුෂ්ව කුර්වාථාම් කුරුධ්වම්,) කරවෛ (කරවාවහෛ කරවාමහෛ) යනු ආත්මනෙපද යි අකරොත්- අකුරුත යනු ලඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. චකාර චක්‍රතුඃ චක්‍රුඃ, චකර්ථ චක්‍රථුඃ (චක්‍ර, චකාර-චකර චකෘව චකෘම) යනු

## 166. සංකරොතේර්භූෂණෙ සුට්.

(සම් 5-1. කරොතෙඃ 6-1 භූෂණෙ 7-1. සුට් 1-1.)

a. **සම්පර්‍යුපෙභ්‍යඃ කරොතෞ භූෂණෙ'ර්ථෙ සුට් භවති. සංස්කරොති.**

b. **අඩ්ද්විත්වව්‍යවධානෙ'පි සුට් ස්‍යාත්. සමස්කරොත්, සඤ්චස්කාර.**

---

ලිට් පරස්මෛපද යි. ආත්මනෙපද ප්‍ර: එක වචනයෙහි චක්‍රෙ යනු වේ. (ද්වි වචනාදියෙහි චක්‍රාතෙ චක්‍රිරෙ යනාදීන් වර නැගේ.) ක්‍රියාත්- කෘෂීෂ්ට යනු ආශීර්ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. ("යාදෘදෙඃ" යි ආශීඃසීඃදදිය පරකල්හි ඍකාරයට රිඞාදෙශයෙන් "ක්‍රියාත්" යනාදිය සිද්ධ යි.) කර්තා, කරිෂ්‍යති, අකරිෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප: ප්‍ර: එක වචන යි. (ආ: ප්‍ර: එක වචනයන්හි "කර්තා, කරිෂ්‍යතෙ, අකරිෂ්‍යත" යනු වේ. "හනෘතඃ ස්‍යපඃ" යි ලෘට්- ලෘඞ් දෙක්හි ඉඩාගම වේ.) අකාර්ෂීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (අකාර්ෂ්ටාම් අකාර්ෂුඃ යනු ද්වි- බහු වචන යි.) අකෘත අකෘෂාතාම් අකෘෂත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. (මෙහි තන්- ථාස් දෙක පර කල්හි "හ්‍රස්වාජ්ඣසෙ" යි නිත්‍යයෙන් සිලොපය වේ. එබැවින් මධ්‍යම පුරුෂෛක වචනයෙහි ද "අකෘථාඃ" යන්න පමණකි.)

166. සුඩාගම විධි සූත්‍ර යි. "ව්‍යාඞ්පර්‍යුපෙභ්‍යො රමඃ" යි එක දෙශයක් "පර්‍යුපාභ්‍යාම්" යි අනුවෘත්ත වේ. සම්, සම් උපසර්ගයා කෙරෙන් ද; පර්‍යුපාභ්‍යාම්, පරි- උප යන උපසර්ග දෙදෙනා කෙරෙන් ද පර වූ; භූෂණෙ, භූෂණාර්ථයෙහි වූ; කරොතෙඃ, කෘ ධාතුහු සම්බන්ධ ව; සුට්, සුඩාගම වේ.

a. සම්පර්‍යුපෙභ්‍යඃ, සම්- පරි- උප යන උපසර්ගයන් කෙරෙන් පර වූ; භූෂණෙ අර්ථෙ, සැරසීම් අර්ථයෙහි පවත්නා වූ; කරොතෙඃ, කෘ ධාතුහු සම්බන්ධ ව; සුට් භවති, සුඩාගම වේ. (ටිත් බැවින් කෘ ධාතුහුගේ ආදියෙහි වේ.) සංස්කරොති, "සංකරොති" යන තැන්හි සුඩාගමයෙන් සංස්කරොති යනු වේ.

b. අඩ් ද්විත්වව්‍යවධානෙ අපි, අඩාගමයෙන් හා ද්විත්වයෙන් අතර ඇති කල්හි ද; සුට් ස්‍යාත්, සුඩාගමය වන්නේ ය. (අඩාගමය හා ද්විරුක්ත කෘ ධාතුවෙහි පූර්ව රූපය ද සුඩාගමයට බාධක නො වන බව මෙයින් දක්වයි. එකල්හි ද සුඩාගමය කකාරයෙන් පෙරටු ව ම සිටී.) සමස්කරොත් යනු "සම් + අකරොත්" යි අඩාගමය අතර ඇති කල්හි සුඩාගමයට ද; සඤ්චස්කාර යනු "සඤ්චකාර" යි ද්විරුක්තය අතර ඇති කල්හි සුඩාගමයට ද නිදර්ශන යි.

c. සසුට්කෘෂ්ණේ ණාදේර්නිත්‍යම්ඩ් වාච්‍යඃ. සංස්කරිඨ, එවමුපස්කුරුතෙ.

**6.** මනු අවබොධනෙ. මනුතෙ. මෙනෙ. මනිතා.*

**7.** වනු යාචනෙ. පරස්මෛපදෘයමිත්‍යෙකෙ, වනුතෙ.

ඉති තනාදිෂුභයපදි ප්‍රක්‍රියා.

## ඉත්‍යුබ්විකරණාස්තනාදයඃ.

c. සසුට් කෘෂ්ණඃ, සුඩාගම සහිත කෘඤ් ධාතුවෙන් පර වූ; ණාදෙඃ, ණබාදිය සමබන්ධ ව; නිත්‍යම් ඉට් වාච්‍යඃ, නිත්‍යයෙන් ඉඩාගමය කිය යුතු සි. සංස්කරිඨ යනු ඊට උදාහරණ සි. උපස්කුරුතෙ, "උප + කුරුතෙ" යන තන්හි "උපස්කුරුතෙ" යනු ද; එවම්, මෙසේ (සුඩාගමයෙන් සිඩ) සි.

6. මනු අවබොධනෙ, උකාරානුබන්ධ "මන්" ධාතුව දැනීමෙහි වේ. (ආත්මනෙපදයෙහි පමණක් වර නැගේ.) මනුතෙ යනු ලට් ප්‍රථම පුරුෂෛක වචන සි. (විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍රඃ එක වචන යන්හි "මන්වීත, මනුතාම්, අමනුත" යනු වේ.) මෙනෙ, මනිතා යනු ලිට්- ලුට් ප්‍රඃ එක වචන සි. (ආශීර් ලිඞ්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන යන්හි "මනිෂීෂ්ට, මනිෂ්‍යතෙ, අමනිෂ්‍යත" යනු වේ. ලුඞ් ප්‍රඃ එක වචන යෙහි අමත- අමනිෂ්ට යනු වේ.)

7. වනු යාචනෙ, උකාරානුබන්ධ "වන්" ධාතුව යැදීමෙහි වේ. (මෙද ආත්මනෙපදි ධාතුවෙකි.) අයම්, මෙය; පරස්මෛපදී ඉති, පරස්මෛපදි යයි; එකෙ, සමහරු කියත්. වනුතෙ යනු ලට් ප්‍රඃ එක වචන සි. (වන්වීත, වනුතාම්, අවනුත, වවනෙ, වනිෂීෂ්ට, වනිතා, වනිෂ්‍යතෙ, අවනිෂ්‍යත, අවත- අවනිෂ්ට යනු පිළිවෙළින් විධි ලිඞ් ආදි සෙසු ලකාරයන්හි ප්‍රථම පුරුෂෛක වචන සි.)

(සමහරුන්ගේ මතය ලෙස වනොති, වනුයාත්, වනොතු- වනුතාත්, අවනොත්, වවාන, වන්‍යාත්, වනිතා, වනිෂ්‍යති, අවනිෂ්‍යත්, අවානීත්- අවනීත් යනාදි වශයෙන් දශ ලකාර පරස්මෛපදයෙහි වර නැගේ.)

තනාදිෂු, තනාදි ගණයෙහි; උභයපදි ප්‍රක්‍රියා, උභයපදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ සමාප්ත සි.

උප් විකාරණාඃ, උප් ප්‍රත්‍යය විකරණ කොට ඇති; තනාදයඃ, තනාදි ධාතුහු; ඉති මෙසේ සි.

## තනාදි ගණය නිමි.

* මනතා. පොත්හි.

**a. අථ තුදාදයඃ. තත්‍රාදාවුභයපදිනඃ.**

**1. තුද ව්‍යථනෙ, අකාර උභයපදත්ථඃ.**

## 167. තුදාදෙරඃ. (තුදදෙඃ. 5-1. අඃ. 1-1.)

**b. තුදාදෙර්ගණාද ප්‍රත්‍යයො භවති චතුර්ෂු පරෙෂු. අපෝ'ප වාදඃ. ඞිත්වාන්න ගුණඃ.**

**c. තුදති- තුදතෙ, තුදෙත්- තුදෙත, තුදතු- තුදතාම්, අතුදත්- අතුදත, තුතොද- තුතුදෙ, තුද්‍යාත්- තුත්සීෂ්ට, තොත්තා- තොත්තා, තොත්ස්‍යති- තොත්ස්‍යතෙ, අතොත්ස්‍යත්- අතොත්ස්‍යත, අතෞත්සීත් අතෞත්තාම් අතෞත්සුඃ, අතුත්ත අතුත්සාතාම් අතුත්සත.**

---

a. අථ, තනාදි ගණයට අනතුරු ව; තුදාදයඃ, තුදාදි ධාතුහු දක්වනු ලැබෙත්. තත්‍ර, එහි; ආදෞ, ආදියෙහි; උභයපදිනඃ, උභය පදි ධාතුහු වෙත්.

1. තුද ව්‍යථනෙ, අකාරානුබන්ධ "තුද්" ධාතුව පෙළීමෙහි වේ. අකාරඃ උභයපදත්ථඃ, අකාරය උභය පදයෙහි වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය.

167. අ ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද "අප් කර්තරි" යි 'කර්තරි' යනු ද අනුවෘත්ත යි. කර්තරි, කර්තෘ කාරක යෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; තුදාදෙඃ, තුදාදි ගණයෙන් පර ව; අඃ, අ ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; තුදාදෙඃ ගණාත්, තුදාදි ධාතු ගණයෙන් පර ව; අප්‍රත්‍යයඃ භවති, අ ප්‍රත්‍යය වේ. අපඃ අපවාදඃ, අප් ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ. ඞිත්වාත්, ඞිත් බැවින්; න ගුණඃ, ගුණ නො වේ. (අ ප්‍රත්‍යය පිත් නො වන හෙයින් "අපිත්තාදිර්ඞිත්" යි ඞිත් සංඥ වේ. එබැවින් "ක්ඞිත්‍යද්‍රුසි" යි ගුණය වළකී. අප් විකරණයට වඩා මේ "අ" විකරණයේ වෙනස එපමණෙකි.)

c. තුදති- තුදතෙ -පෙ- අතොත්ස්‍යත්- අතොත්ස්‍යත යනු පිළිවෙළින් රූප ද්වය බැගින් ලට් -පෙ- ලෘඞ් පරස්මෛපද- ආත්ම නෙපද ප්‍රථම පුරුෂෛක වචන යි. අතෞත්සීත් අතෞත්තාම් අතෞත්සුඃ යනු ලුඞ් පඃ ප්‍රථම පුරුෂ යි. අතුත්ත අතුත්සාතාම් අතුත්සත යනු ආඃ ප්‍රථම පුරුෂ යි.

**2. භ්‍රස්ජ පාකෙ.**

**a. “සෙකාරාදේශශ්ච” අනෙන සලොපො න. සෙතොඃ ශ්චුභිඃ ශ්චුරිති සස්‍ය ශඃ. “ඣබෙ ජබාඃ” ඉති ජඃ. * “ග්‍රහාං ඞිති ච” අප්‍රත්‍යයො ඞිද්වත්. භෘජ්ජති- භෘජ්ජතෙ.**

**b. බභ්‍රජ්ජ, සෘසංයොගාදිති කිත්ත්වාභාවාන්න සම්ප්‍රසාරණම්. බභ්‍රජ්ජතුඃ, බභ්‍රජ්ජුඃ. බභ්‍රජ්ජිථ- බභ්‍රෂ්ඨ, බභ්‍රජ්ජෙ.**

---

2. භ්‍රස්ජ පාකෙ, අකාරානුබන්ධ “භ්‍රස්ජ්” ධාතුව පිසීමෙහි (=බැදීමෙහි) වේ. (මෙය “භ්‍රස්ජෝ පාකෙ” යි පොත්හි පෙණේ. එහෙත් මෙහි ඔකාරෙත්ත්වයෙක් නැත. ඔකාරය ඉත් කිරීමේ ප්‍රයොජනය නිෂ්ඨා ප්‍රත්‍යයන්ගේ තකාරයට නකාරය වීම ය. භෘෂ්ටඃ, භෘෂ්ටවාන් යනාදියෙහි එසේ නකාරාදෙශයෙක් නො වේ.)

a. සෙකාරාදේශශ්ච අනෙන, “සෙකාරාදේශශ්ච” යන මේ සූත්‍රයෙන්; සලොපඃ න, සකාර ලොපය නො වේ. සෙතොඃ ශ්චුභිඃ ශ්චුඃ ඉති, “සෙතොඃ ශ්චුභිඃ ශ්චුඃ” යන සූත්‍රයෙන්; සස්‍ය, දන්ත්‍ය සකාරයට; ශඃ, තාලුජ ශකාරය වේ.

ඣබෙ ජබාඃ ඉති, “ඣබෙ ජබාඃ” යන සූත්‍රයෙන්; ජඃ, (ශකාරයට) ජකාරය වේ. “ග්‍රහාං ඞිති ච” යන සූත්‍රයෙන් රකාරයට සම්ප්‍රසාරණ ඍකාරය වේ. අප්‍රත්‍යයඃ, (විකරණ වූ) අප්‍රත්‍යය; ඞිත්වත්, ඞිත් මෙනි. (“ප” යන්න ඉත් කොට නැති බැවින් “අපිත්තාදිර් ඞිත්”යි ඞිත්සංඥ වේ.) භෘජ්ජති- භෘජ්ජතෙ යනු ලට් ප: ආ: ප්‍ර: එක වචන යි. (විධි ලිඞ්- ලොට්- ලඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනයන්හි පිළිවෙළින් “භෘජ්ජෙත්- භෘජ්ජෙත, භෘජ්ජතු- භෘජ්ජතාම්, අභෘජ්ජත්- අභෘජ්ජත” යනු වේ.)

b. බභ්‍රජ්ජ යනු ලිට් ප: ප්‍ර: එක වචන යි. සෘ සංයොගාත් ඉති, “සෘසංයොගාන්ත” යන සූත්‍රයෙන්; කිත්ත්වාභාවාත්, කිත් බව නො වන හෙයින්; න සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ නො වේ. (“ණාදිඃ කිත්” යි ණබාදියට වන කිත්ත්වය සංයොගාන්ත බැවින් යථොක්ත සූත්‍රයෙන් වළකී. කිත් නො වන කල්හි සම්ප්‍රසාරණය ද වළකී.) බභ්‍රජ්ජතුඃ, බභ්‍රජ්ජුඃ යනු ද්වි- බහු වචන යි. බභ්‍රජ්ජිථ- බභ්‍රෂ්ඨ යනු ම: එක වචන යි. (“අසෘතො නිත්‍යානිට්සප්පො වෙට්” යි කී හෙයින් ඉඞ් විකල්ප පක්ෂයෙහි ඉට්ත්වාදිය වීමෙන් “බභ්‍රස්ජ් + ථප්” යි සිටි කල්හි “සෙකාරාදේශශ්ච” යි සකාරයට ලොප් වේ. “ජශෂරාජාදෙඃ ෂඃ” යි ජකාරයට ෂකාරය වේ. ඉන් පසු ටුත්වයෙන් “බභ්‍රෂ්ඨ” යි සිද්ධ යි.) බභ්‍රජෙ යනු ආ: ප්‍ර: එක වචන යි.

---

* මේ පාඨ පොත්හි නො පෙණේ. මෙ තැන්හි “අන්‍යත්‍ර සො ජඃ- ඣස් පරත්වාභාවෙ සස්‍ය ජො භවති” යි පෙණේ. ඒ නිරර්ථක ය. සිද්ධාන්ත චන්ද්‍රිකාදිය බලනු

a. භ්‍රස්ජතෙඃ සකාරරේඵයෝ ලුප්ත්වා රමාගමෝ'නපි වා වාච්‍යඃ. බභර්ජ- බභජ්ජේ, භ්‍රජ්ජ්‍යාත්- භජ්ජීාත්, භ්‍රක්ෂීෂට- භර්ක්ෂීෂට, භ්‍රෂ්ටා- භර්ෂ්ටා, භ්‍රක්ෂ්‍යති- භක්ෂ්‍යති, අභ්‍රක්ෂ්‍යත්- අභක්ෂ්‍යත්, අභ්‍රාක්ෂීත්- අභාර්ක්ෂීත්, අභ්‍රෂ්ට- අභර්ෂ්ට.

3. දිශ අතිසර්ජනෙ. දික්ෂීෂට, අදික්ෂත්- අදික්ෂත.

4. ක්ෂිප ප්‍රේරණෙ. ක්ෂිප්සීෂ්ට, අක්ෂිපත.

---

a. අනපි, අනබ් විෂයෙහි; භ්‍රස්ජතෙඃ, භ්‍රස්ජ් ධාතුහුගේ; සකාරරේඵයෝ, සකාර- රේඵ දෙක; ලුප්ත්වා, ලොප් කොට; රමාගමඃ, රම් ආගමය; වා වාච්‍යඃ, විකල්පයෙන් කිය යුතු සි. (මිත් බැවින් අන්ත්‍යස්වරයෙන් පර ව වේ. මෙසේ ලිට් ආදි ෂඩ් ලකාර යෙහි රමාගමය වීමෙන් දෙපරිද්දකින් වර නැගේ.) බභර්ජ- බභජ්ජේ යනු ද ලිට් පඃ ආඃ ප්‍රඃ එක වචන සි. භ්‍රජ්ජ්‍යාත්-භජ්ජීාත්, භ්‍රක්ෂීෂට- භර්ක්ෂීෂට යනු ආශිර් ලිඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන සි. භ්‍රෂ්ටා- භර්ෂ්ටා, භ්‍රක්ෂ්‍යති- භක්ෂ්‍යති, අභ්‍රක්ෂ්‍යත්- අභක්ෂ්‍යත්, අභ්‍රාක්ෂීත්-අභාර්ක්ෂීත් යනු ලුට් - ලෘට්- ලෘඞ්- ලුඞ් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන සි. ලුට්- ලෘට්- ලෘඞ් ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනයන්හි පිළිවෙළින් "භ්‍රෂ්ටා- භර්ෂ්ටා, භ්‍රක්ෂ්‍යතෙ- භක්ෂ්‍යතෙ, අභ්‍රක්ෂ්‍යත- අභක්ෂ්‍යත" යනු වේ ) ලුඞ් ආඃ ප්‍රඃ එක වචනයෙහි අභ්‍රෂ්ට අභර්ෂ්ට යනු වේ. ("භ්‍රස්ජ් + සීෂ්ට" සි සිටි කල්හි "සෙකාරුද්ධෙශව" සි සකාර ලොප් ව "ජශෂරුජාදෙඃ ෂඃ" සි ජකාරයට ෂකාර ව "ෂඩොඃ කඃ සෙ" සි ෂකාරයට කකාර ව ක්විලාත්- යනාදින් ප්‍රත්‍යයෙහි සකාරයට ෂකාර වීමෙන් "භ්‍රක්ෂීෂට" සි සිද්ධ සි. සෙස්ස ද මේ නයින් දත යුතු.)

3. දිශ අතිසර්ජනෙ, අකාරානුබන්ධ "දිශ්" ධාතුව දීමෙහි වේ. (ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනයන්හි "දිශති- දිශතෙ, දිශෙත්- දිශෙත, දිශතු- දිශතාම්, අදිශත්- අදිශත, දිදෙශ- දිදිශෙ" යනු වේ. ආශිර් ලිඞ් පඃ ප්‍රඃ එක වචනයෙහි දිශ්‍යාත් යනු වේ.) දික්ෂීෂට යනු ආඃ ප්‍රඃ එක වචන සි. (ලුට්- ලෘට්- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචනයන්හි "දෙෂ්ටා- දෙෂ්ටා, දෙක්ෂ්‍යති- දෙක්ෂ්‍යතෙ, අදෙක්ෂ්‍යත්- අදෙක්ෂ්‍යත යනු වේ.) අදික්ෂත්- අදික්ෂත යනු ලුඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන සි. ("හශ ෂාන්තාත් සක්" සි සක් ප්‍රත්‍යය ව "ජශෂරුජාදෙඃ ෂඃ" සි ධාතුසථ ශකාරයට ෂකාර ව ඊට "ෂඩොඃ කඃ සෙ" සි කකාර ව ක්විලාත්- යනාදීන් ප්‍රත්‍යය සකාරයට ෂකාර ව අඩාගම වීමෙන් අදික්ෂත් යනාදිය සිද්ධ සි.)

**5. කෘෂ් විලෙඛනෙ. කෘක්ෂීෂ්ට, ක්‍රෂ්ටා- කර්ෂ්ටා, අකාර්ක්ෂීත්- අක්‍රාක්ෂීත්- අකෘක්ෂත්, අකෘක්ෂත- අකෘෂ්ට අකෘක්ෂාතාම් අකෘක්ෂන්ත.**

**6. මිල සංගමනෙ. මිමිලෙ, අමෙලිෂ්ට.**

---

4. ක්ෂිප ප්‍රේරණෙ, අකාරානුබන්ධ "ක්ෂිප්" ධාතුව මෙහෙයීමෙහි වේ. (ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචනයන්හි "ක්ෂිපති- ක්ෂිපතෙ, ක්ෂිපෙත්- ක්ෂිපෙත, ක්ෂිපතු- ක්ෂිපතාම්, අක්ෂිපත්- අක්ෂිපත, චික්ෂෙප- චික්ෂිපෙ" යනු වේ. ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචනයෙහි ක්ෂිප්‍යාත් යනු වේ.) ක්ෂිප්සීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන සි. (ක්ෂෙප්තා- ක්ෂෙප්තා, ක්ෂෙප්ස්‍යති- ක්ෂෙප්ස්‍යතෙ, අක්ෂෙප්ස්‍යත්- අක්ෂෙප්ස්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. අක්ෂෛප්සීත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන සි.) අක්ෂිප්ත යනු ආ: ප්‍ර: එක වචන සි.

5. කෘෂ් විලෙඛනෙ, "කෘෂ්" ධාතුව ඉරි ගැසීමෙහි වේ. (කෘෂති- කෘෂතෙ, කෘෂෙත්- කෘෂෙත, කෘෂතු- කෘෂතාම්, අකෘෂත්- අකෘෂත, චකර්ෂ- චකෘෂෙ යනු ලට් -පෙ- ලිට් ප: ආ: ප්‍ර: එක වචන සි. කෘෂ්‍යාත් යනු ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචන සි.) කෘක්ෂීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන සි. ක්‍රෂ්ටා- කර්ෂ්ටා යනු ලුට් ප: ප්‍ර: එක වචන සි. (ආත්මනෙපදයෙහි ද මෙසේ සි. ලුට් ලකාරයෙහි පටන් "රුරෙ ඛඩසෙ දෘශාම්" සි "අර්" හට විකල්පයෙන් රකාර වීමෙන් ද වර නැගේ. කර්ක්ෂ්‍යති- ක්‍රක්ෂ්‍යති, කර්ක්ෂ්‍යතෙ- ක්‍රක්ෂ්‍යතෙ, අකර්ක්ෂ්‍යත්- අක්‍රක්ෂ්‍යත්, අකර්ක්ෂ්‍යත- අක්‍රක්ෂ්‍යත යනු රූප ද්වය බැගින් ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන සි.) අකාර්ක්ෂීත්- අක්‍රාක්ෂීත්- අකෘක්ෂත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන සි. (අකෘක්ෂත් යනු "හශෂාන්තාත් සක්" සි සක් ප්‍රත්‍යය වූ පක්ෂයෙහි ය.) අකෘක්ෂත- අකෘෂ්ට යනු ආ: ප්‍ර: එක වචන සි. අකෘක්ෂාතාම්, අකෘක්ෂන්ත යනු ද්වි- බහු වචන සි.

6. මිල සංගමනෙ, අකාරානුබන්ධ "මිල්" ධාතුව එක්වීමෙහි වේ. (ලඩාදි චතුෂ්කයෙහි ප: ආ: ප්‍ර: එක වචනයන්හි "මිලති- මිලතෙ, මිලෙත්- මිලෙත, මිලතු- මිලතාම්, අමිලත්- අමිලත" යනු වේ. ලිට් ප: ප්‍ර: එක වචනයෙහි මිමෙල යනු වේ.) මිමිලෙ යනු ආ: ප්‍ර: එක වචන සි. (ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප: ආ: ප්‍ර: එක වචනයන්හි මිල්‍යාත් - මෙලිෂීෂ්ට, මෙලිතා- මෙලිතා, මෙලිෂ්‍යති- මෙලිෂ්‍යතෙ, අමෙලිෂ්‍යත්- අමෙලිෂ්‍යත, අමෙලීත්)- අමෙලිෂ්ට යනු වේ.

**7. මුචඃ මොක්ඛණෙ.**

## 168. මුචාදෙර්මුම්. (මුචාදෙඃ. 6-1. මුම් 1-1.)

**a. මුචාදීනාං මුමාගමො භවති අප්‍රත්‍යයෙ පරෙ.**

**b. මුච් ලුප් විද් ලිප් සිච් කෘත් පිශ් ඛිද් එතෙ මුචාදයඃ. මුඤ්චති- මුඤ්චතෙ, මුමොච- මුමුචෙ, මුච්‍යාත් "සිසෙ‍්‍යාඃ." අනෙන ගුණාභාවඃ. "චොඃ කුඃ" මුක්ෂීෂ්ට, මොක්තා- මොක්තා, මොක්ෂ්‍යති- මොක්ෂ්‍යතෙ, අමොක්ෂ්‍යත්- අමොක්ෂ්‍යත, අමුචත්- අමුක්ත.**

---

7\. මුචඃ මොක්ෂණෙ, ඍකාරානුබන්ධ "මුච්" ධාතුව මිදීමෙහි වේ.

168\. මුමාගම විධි සූත්‍ර යි. "අබාදෞ විපති න්සම්" යි 'අබාදෞ' යනු අනුවෘත්ත යි. අබාදෞ, අප් ආදි විකරණ විෂයෙහි හෙවත් ලඩාදි සතර පර කල්හි; මුචාදෙඃ, මුචාදිය සම්බන්ධ ව; මුම්, මුමාගම වේ.

a\. අප්‍රත්‍යයෙ පරෙ, අ ප්‍රත්‍යය පර කල්හි; මුචාදීනාම්, මුච් ආදි ධාතූන් සම්බන්ධ ව; මුමාගමඃ භවති, මුම් ආගම වේ.

b\. මුච් –පෙ– ඛිද් එතෙ, මුච්–ලුප්–විද්–ලිප්–සිච්–කෘත්– පිශ්- ඛිද් යන මොහු; මුචාදයඃ, මුචාදීහු වෙති. (මෙහි ආගම වන්නේ "ම්" යන්න පමණකි. උකාරය උච්චාරණය පිණිස ද, මකාරය ස්ථාන නියම පිණිස ද වේ.) මුඤ්චති-මුඤ්චතෙ යනු ලට් පඃ ආඃ ප්‍රඃ එක වචන යි.(විධි ලිඞ්- ලොට්- ලඞ් පඃ ආඃ ප්‍රඃ එක වචනයන්හි "මුඤ්චෙත්- මුඤ්චෙත, මුඤ්චතු- මුඤ්චතාම්, අමුඤ්චත්- අමුඤ්චත" යනු වේ. මුමාගමයෙන් "මුම්ච් + අති" යි සිටි කල්හි "නශ්චාපදාන්තෙ ඣසෙ" යි මයන්නට අනුස්වාර වේ. ඊට වර්ගාන්තාදෙශ වීමෙන් "මුඤ්චති" යි සිද්ධ යි. සෙස්ස ද මෙසේ යි.) මුමොච- මුමුචෙ යනු ලිට් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. මුච්‍යාත් යනු ආශිර් ලිඞ් පඃ ප්‍රඃ එක වචන යි. සිසෙ‍්‍යාඃ අනෙන, "සිසෙ‍්‍යාඃ" යන මේ සූත්‍රයෙන්; ගුණාභාවඃ, ගුණ ප්‍රතිෂෙධය වේ. "චොඃ කුඃ" යන සූත්‍රයෙන් චකාරයට කකාරය වේ. ("ස්විලාත්- යනාදීන් ප්‍රත්‍යය පිළිබඳ සකාරයට ෂකාර වේ.) මුක්ෂීෂ්ට යනු ආඃ ප්‍රඃ එක වචන යි. මොක්තා –පෙ– අමුක්ත යනු ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. (ලුඞ් පරස්මෛපදයෙහි "ලිත් පුෂාදෙර්ඞඃ" යි ඞ ප්‍රත්‍යය වේ. ආත්මනෙපදයෙහි "ඣසාත්-" යි සි ප්‍රත්‍යයට ලොප් වේ.)

**8. ලුපෘ ඡේදනෙ. ලුම්පති, ලුප්සීෂ්ට, අලුපත්.**

**9. විදෘ ලාභෙ. වින්දති- අවෙදිෂ්ට, අනිඩයම්නෙ‍්‍යකෙ. වෙත්තා.**

**10. ලිප් උපදෙහෙ. ලිම්පති, ලිලෙප, අලිපත්- අලිපත.**

**a. ලිපිසිචිහ්වයතිනාමාත්මනෙපදෙ සෙර්ඩො වා වාච්‍යඃ. අලිප්ත.**

**11. ෂිවෘ ක්ෂරණෙ. සීඥවති, සිෂෙව, සිව්‍යාත්, සික්ෂීෂ්ට, සෙක්තා, සෙක්ෂ්‍යති, අසෙක්ෂ්‍යත්, අසිවත්, අසිවත- අසික්ත.**

---

8. ලුපෘ ඡේදනෙ, ඍකාරානුබන්ධ "ලුප්" ධාතුව සිඳීමෙහි වේ. ලුම්පති යනු ලට් ප: ප්‍ර: එක වචන යි. ලුප්සීෂ්ට යනු ආශීර් ලිඞ් ආ: ප්‍ර· එක වචනයි. අලුපත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (සෙස්ස ද මුච් ධාතුව මෙන් වර නැගිය යුතු.)

9. විදෘ ලාභෙ, ලනුබන්ධ "විද්" ධාතුව ලැබීමෙහි වේ. වින්දති- (වින්දතෙ, වින්දෙත්- වින්දෙත, වින්දතු- වින්දතාම්, අවින්දත්- අවින්දත, විවෙද- විවිදෙ, විද්‍යාත්- වෙදිෂීෂ්ට, වෙදිතා- වෙදිතා, වෙදිෂ්‍යති- වෙදිෂ්‍යතෙ, අවෙදිෂ්‍යත්- අවෙදිෂ්‍යත, අවිදත්-) අවෙදිෂ්ට යනු (පිළිවෙළින් දශ ලකාරයෙහි) පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යි. අයම්, මේ විද් ධාතුව; අනිට් ඉති, අනිට් යයි; එකෙ, සමහරු කියත්. (තෘතීයාන්තයෙහි) වෙත්තා යනු ලුට් ප: ප්‍ර: එක වචන යි.

10. ලිප් උපදෙහෙ, "ලිප්" ධාතුව ගෑමෙහි වේ. ලිම්පති ලිලෙප යනු ලට්- ලිට් ප: ප්‍ර: එක වචන යි. අලිපත්- අලිපත යනු ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

a. ලිපිසිචිහ්වයතීනාම්, ලිප්- සිච්- හ්වෙ යන ධාතූන් පිළි බඳ; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි; සෙඃ, සිප්‍රත්‍යයාගේ ස්ථාන යෙහි; වා, විකල්පයෙන්; ඩඃ වාච්‍යඃ, "ඩ" ප්‍රත්‍යය කිය යුතු යි. අලිප්ත යනු ඩ ප්‍රත්‍යය නුවූ පක්ෂයෙහි ලුඞ් ආ: ප්‍ර: එක වචන යි. ("ඣසාත්-" යි සිලොපය විය.)

11. ෂිවෘ ක්ෂරණෙ, ෂොපදෙශ ලනුබන්ධ "ෂිව්" ධාතුව වැගි රීමෙහි වේ. සීව්‍යති යනු ලට් ප: ප්‍ර: එක වචන යි. (සීව්‍යතෙ යනු ආ: ප්‍ර: එක වචන යි. සීව්‍යෙත්- සීව්‍යෙත, සීව්‍යතු- සීව්‍යතාම්, අසීව්‍යත්- අසීව්‍යත ලිඞාදි තුනෙහි ප: ආ: ප්‍ර: එක වචන යි.) සිෂෙව යනු ලිට් ප: ප්‍ර: එක වචන යි. (සිෂිවෙ යනු ආ: ප්‍ර: එක වචන යි.) සිව්‍යාත්-සික්ෂීෂ්ට යනු ආශීර්ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

**ඉති තුදාදිඥුභයපදි ප්‍රක්‍රියා.**

———○———

**a. අථ පරස්මෛපදිනඃ:-**

**1. කෘතී ඡෙදනෙ, කෘන්තති, චකර්ත, කෘන්ත්‍යාත්, කර්තිතා, කර්තිෂ්‍යති- කර්ත්ස්‍යති,* අකර්තිෂ්‍යත්- අකර්ත්ස්‍යත්,* අකර්තීත්.**

**2. ලුභ විමොහනෙ, ලොභිතා- ලොබ්ධා, අලොභීත්.**

---

සෙක්තා, සෙක්ෂ්‍යති, අසෙක්ෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප: ප්‍ර: එක වචන යි. (ආ: ප්‍ර: එක වචනයන්හි සෙක්තා, සෙක්ෂ්‍යතෙ, අසෙක්ෂ්‍යත යනු වේ.) අසිචත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. අසිචත- අසික්ත යනු ආ: ප්‍ර: එක වචන යි.

තුදාදිඥු උභයපදි ප්‍රක්‍රියා, තුදාදි ගණයෙහි උභයපදී ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

———○———

a. අථ, ඉක්බිති; පරස්මෛපදිනඃ, පරස්මෛපදී ධාතූහු දක්වනු ලැබෙත්:-

1. කෘතී ඡෙදනෙ, ඊකාරානුබන්ධ "කෘත්" ධාතුව සිඳීමෙහි වේ. (ඊකාරය "ආදිදිතඃ" සි ඉට් ප්‍රතිෂෙධය පිණිස යි.) කෘන්තති යනු ලට් ප්‍ර: එක වචන යි. (කෘන්තෙත්, කෘන්තතු, අකෘන්තත් යනු විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචන යි.) චකර්ත, කෘත්‍යාත්, කර්තිතා යනු ලිට්- ආශීර් ලිඞ්- ලුට් ප්‍ර: එක වචන යි. කර්තිෂ්‍යති- කර්ත්ස්‍යති, අකර්තිෂ්‍යත්- අකර්ත්ස්‍යත් යනු ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. (**නෘත් තෘද් ඡෘද් චෘත් කෘතාං සස්‍යාසෙරිඩ් වා වක්තව්‍යඃ** සි කී හෙයින් විකල්පයෙන් ඉඩාගම විය.) අකර්තීත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි.

2. ලුභ විමොහනෙ, අකාරානුබන්ධ "ලුභ්" ධාතුව මූළා වීමෙහි වේ. (ලුභති, ලුභෙත්, ලුභතු, අලුභත්, ලුලොභ, ලුභ්‍යාත් යනු ලට් -පෙ- ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. ලොභිතා- ලොබ්ධා යනු ලුට් ප: ප්‍ර: එක වචන යි. (පක්ෂයෙක්හි **ඉෂුසහලුභරිෂරුෂාමනාපි තාසෙඩ් වා වක්තව්‍යඃ** සි කී හෙයින් විකල්පයෙන් ඉඩාගම විය. "ලුභ් + තා" සි සිටි කල්හි ගුණ ව "තථොර්ධොඃ" සි තකාරයට ධකාර ව "ඣෂෙ ජබාඃ" සි භකාරයට බකාර ව "ලොබ්ධා" සි සිද්ධ සි) (ලොභිෂ්‍යති, අලොභිෂ්‍යත්,) අලොභීත් යනු (ලෘට්- ලෘඞ්) -ලුඞ් ප්‍ර: එක වචන යි.

---

* පොත්හි නො පෙණෙයි.

**3. චෘතී හිංසාග්‍රන්ථනයොඃ. චෘතති, චර්තිෂ්‍යති- චත්ස්‍යති, අචර්තීත්.**

**4. විධ විධානෙ. වෙධිතා.**

**5. කුට කෞටිල්‍යෙ.**

**c. කුටාදෙර්ඤ්ණිද්වර්ජඃ ප්‍රත්‍යයො ඞිද්වත්. චුකොට- චුකුටිථ, කුටිතා, අකුටීත්.**

**6. ත්‍රුට ඡෙදනෙ ත්‍රුට්‍යති- ත්‍රුටති.**

---

3. චෘතී හිංසාග්‍රන්ථනයොඃ, ඊකාරානුබන්ධ "චෘත්" ධාතුව හිංසාය- ගෙතීමය යන අර්ථ දෙක්හි වේ. චෘතති, (චෘතෙත්, චෘතතු, අචෘතත්, චචර්ත, චෘත්‍යාත්, චර්තිතා) යනු ලට්- (විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට්-ආශීර් ලිඞ්- ලුට්) ප්‍ර: එක වචන යි. චර්තිෂ්‍යති- චත්ස්‍යති. යනු ලෘට් ප්‍ර: එක වචන යි. (අචර්තිෂ්‍යත්- අචත්ස්‍යත් යනු ලෘඞ් ප්‍ර: එක වචන යි. "තෘත් තෘද් -පෙ-" යනු කී හෙයින් මෙහි ද විකල්ප යෙන් ඉඩාගම විය.) අචර්තීත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි.

4. විධ විධානෙ, අකාරානුබන්ධ "විධ්" ධාතුව නියොග කිරී මෙහි වේ. (විධති, විධෙත්, විධතු, අවිධත්, විවෙධ, විධ්‍යාත්,) වෙධිතා, (වෙධිෂ්‍යති, අවෙධිෂ්‍යත්, අවෙධීත් යනු පිළිවෙළින් දශ ලකාර යෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි.

5. කුට කෞටිල්‍යෙ, අකාරානුබන්ධ "කුට්" ධාතුව කුටිල බැව්හි වේ. (කුටති, කුටෙත්, කුටතු, අකුටත් යනු ලඩාදී සතරෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.)

c. කුටාදෙඃ, කුටාදියෙන් පර වූ; ඤ්ණිත් වර්ජඃ, ඤිත්- ණිත් තොර කොට ඇති; ප්‍රත්‍යයඃ, ප්‍රත්‍යය තෙමේ; ඞිත් වත්, ඞිත් මෙනි. (කුටාදියෙන් පර ඤකාර- ණකාරයන් ඉත් කොට නැති ප්‍රත්‍යයෝ ඞිත් වැනි යයි මෙයින් කීහ. එහෙයින් පිත්- තා ආදි ප්‍රත්‍යය ද ඞිත් බඳු වීමෙන් ගුණ නො වේ. චුකුටිථ, කුටිතා යනාදිය උදාහරණ යි.) චුකොට, චුකුටිථ යනු ලිට් ප්‍රථම- මධ්‍යම පුරුෂෛක වචන යි. කුටිතා, (කුටිෂ්‍යති, අකුටිෂ්‍යත්) අකුටීත් යනු ලුට්- (ලෘට්- ලෘඞ්-) ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

6. ත්‍රුට් ඡෙදනෙ, "ත්‍රුට්" ධාතුව සිඳීමෙහි වේ. ත්‍රුට්‍යති- ත්‍රුටති යනු ලට් ප්‍ර: එක වචන යි. (භ්‍රාශභ්ලාශභ්‍රමුක්‍රමුක්ලමුත්‍රසිත්‍රුටිලෂ්ග්‍රාශ් හ්ලාශො වා යඃ ප්‍රත්‍යයො වක්තව්‍යශවතුර්ෂු යි කී හෙයින් ලඩාදී සතරෙහි විකල්පයෙන් ය ප්‍රත්‍යය වේ. ත්‍රුට්‍යෙත්- ත්‍රුටෙත්, ත්‍රුට්‍යතු- ත්‍රුටතු, අත්‍රුට්‍යත්- අත්‍රුටත්, තුත්‍රොට, ත්‍රුට්‍යාත්, ත්‍රුටිතා, ත්‍රුටිෂ්‍යති, අත්‍රුටිෂ්‍යත්, අත්‍රුටීත් යනු සෙසු නව ලකාර යෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.)

**7. ඔව්‍රශ්චූ ඡේදනෙ, ඔ- ඌ ඉතෞ. "ග්‍රහ්‍යාං ඞිති ච" වෘශ්චති, වව්‍රශ්ච, වව්‍රශ්චතුඃ, වව්‍රශ්චුඃ, * වව්‍රශ්චිථ- වව්‍රෂ්ඨ, වෘශ්ච්‍යාත්. "ඌදිතො වා" ව්‍රශ්චිතා- ව්‍රෂ්ටා, "ස්කොරා ද්‍යොශ්ච" ව්‍රශ්චිෂ්‍යති-ව්‍රක්ෂ්‍යති, අව්‍රශ්චීත්- අව්‍රාක්ෂීත්, අව්‍රාෂ්ටාම්.**

**8. කෲ වික්ෂෙපෙ. "ඎත ඉර්" කිරති, චකාර, චකරතුඃ, කීර්‍යාත්, කරිතා, "ඊටො ග්‍රහාම්" කරීතා, කරිෂ්‍යති- කරීෂ්‍යති, අකරිෂ්‍යත්- අකරීෂ්‍යත්, අකාරීත්.**

---

7. ඔව්‍රශ්චූ ඡේදනෙ, "ව්‍රස්ච්" ධාතුව ද සිදීමෙහි වේ. ඔ- ඌ ඉතෞ, ඔකාර- ඌකාර දෙක ඉත් ය. "ග්‍රහ්‍යාං ඞිති ච" යන සූත්‍රයෙන් රකාරයට සම්ප්‍රසාරණ ඍකාරය වේ. වෘශ්චති, (වෘශ්චෙත්, වෘශ්චතු, අවෘශ්චත් යනු ලඩාදි සතරෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි. වව්‍රශ්ච, වව්‍රශ්චතුඃ, වව්‍රශ්චුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. වව්‍රශ්චිථ- වව්‍රෂ්ඨ යනු මධ්‍යම පුරුෂෛක වචන යි. (ඉඩාගම නුවූ පක්ෂයෙහි ද්විරුක්තත්‍යාදිය වීමෙන් "වව්‍රස්ච් + ථජ්" යි සිටි කල්හි "ස්කොරාද්‍යොශ්ච" යි සකාර ලොප් වේ. "ඡශෂරාජාදෙඃ ෂඃ" යි චකාරයට ෂකාර වේ. පසු ව "ෂ්ටුනාඃ ෂ්ටුඃ" යි ථකාරයට ඨකාර ව "වව්‍රෂ්ඨ" යි වේ.) වෘශ්ච්‍යාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. "ඌදිතො වා" යන සූත්‍රයෙන් විකල්පයෙන් ඉඩාගම වේ. ව්‍රශ්චිතා- ව්‍රෂ්ටා යනු ලුට් ප්‍ර: එක වචන යි. "ස්කොරාද්‍යොශ්ච" යන සූත්‍රයෙන් සකාරයට ලොප් වේ. ව්‍රශ්චිෂ්‍යති- ව්‍රක්ෂ්‍යති යනු ලෘට් ප්‍ර· එක වචන යි. (අනිට් පක්ෂයෙහි "ව්‍රස්ච් + ස්‍යති" යි සිටි කල්හි "ස්කොරාද්‍යොශ්ච" යි සකාරයට ලොප් ව "ඡශෂ-" යනාදීන් චකාරයට ෂකාර ව "ෂඪොඃ කඃ සෙ" යි ෂකාරයට කකාර ව "ඉණ්ලාත් ෂඃ සඃ කෘතසය" යි ප්‍රත්‍යයෙහි සකාරයට ෂකාර ව "ව්‍රක්ෂ්‍යති" යි වේ. ලෘඞ් ප්‍රථම පුරුෂෛක වචනයෙහි අව්‍රශ්චිෂ්‍යත්- අව්‍රක්ෂ්‍යත් යනු වේ.) අව්‍රශ්චීත්- අව්‍රාක්ෂීත් යනු ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. අව්‍රාෂ්ටාම් යනු (අනිට් පක්ෂයෙහි) ද්වි වචන යි. (ඉට් පක්ෂයෙහි අව්‍රශ්චිෂ්ටාම් යනු වේ.)

8. කෲ වික්ෂෙපෙ, "කෲ" ධාතුව විසිරවීමෙහි වේ. "ඎත ඉර්" යන සූත්‍රයෙන් ඎකාරයට "ඉර්" ආදෙශ වේ. කිරති යනු ලට් ප්‍ර: එක වචන යි. (විධිලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචනයන්හි කිරෙත්, කිරතු, අකිරත් යනු වේ.) චකාර, චකරතුඃ, (චකරුඃ) යනු ලිට් ප්‍රථම පුරුෂ යි. කීර්‍යාත්, කරිතා යනු ආශීර් ලිඞ්- ලුට් ප්‍ර: එක වචන යි. (කීර්‍යාත් යනාදියෙහි "යොර්වි හසෙ" යි දීර්ඝ විය.) "ඊටො ග්‍රහාම්" යන සූත්‍රයෙන් ඉකාරයට ඊකාර වේ. කරීතා යනු එසේ සිද්ධ වූ ලුට් ප්‍ර: එක වචන යි. කරිෂ්‍යති- කරීෂ්‍යති, අකරිෂ්‍යත්- අකරීෂ්‍යත් යනු ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. අකාරීත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි.

---

* වවෘශ්චතුඃ, වවෘශ්චුඃ- පොත්හි.

**a. උපාත් කිරතෞ ඡේදෙ'පි සුඩ් වාච්‍යඃ හිංසායාං ප්‍රතෙශ්ච, උපස්කිරති, උපචස්කාර, ප්‍රතිස්කිරති.**

**9. ගෲ නිගරණෙ, ගිරති.**

**b. ගිරතෙ රස්‍ය වා ලඃ ස්වරෙ වාච්‍යඃ. ගිලති, ජගාර- ජගාල, ජගරතුඃ- ජගලතුඃ, ජගරුඃ- ජගලුඃ. අගාරීත්- ආගාලීත්.**

**10. ස්පෘශ් ස්පර්ශනෙ. ස්පෘශති, පස්පර්ශ, ස්පෘශ්‍යාත්, ස්ප්‍රෂ්ටා- ස්පර්ෂ්ටා, ස්ප්‍රක්ෂ්‍යති- ස්පර්ක්ෂ්‍යති, අස්ප්‍රක්ෂ්‍යත්- අස්පර්ක්ෂ්‍යත්, අස්ප්‍රාක්ෂීත්- අස්පාර්ක්ෂීත්.**

---

a. උපාත්, උප උපසර්ගයා කෙරෙන් පර වූ; කිරතෞ, කෲ ධාතුව සම්බන්ධ ව; ඡේදෙ අපි, ඡේදනාර්ථයෙහි; සුට් වාච්‍යඃ, සුඩාගමය කිය යුතු යි. හිංසායාම්, හිංසාර්ථයෙහි; ප්‍රතෙඃ ච, ප්‍රති උපසර්ගයා කෙරෙන් පර කෲ ධාතුව සම්බන්ධ ව ද සුඩාගම වේ. උපස්කිරති යනු උප උපසර්ගයෙන් පර කෲ ධාතුව පිළිබඳ සුඩාගමයට නිදර්ශන යි. උපචස්කාර යනු ද්විරුක්තය අතර ඇති කල්හිත් සුඩාගමය වන බවට නිදර්ශන යි. ප්‍රතිස්කිරති යනු ප්‍රති උපසර්ගයෙන් පර කෲ ධාතුව සම්බන්ධ සුඩාගමයට නිදර්ශන යි.

9. ගෲ නිගරණෙ, "ගෲ" ධාතුව ගිලීමෙහි වේ. ගිරති යනු ලට් ප්‍රථම පුරුෂෛක වචන යි.

b. ස්වරෙ, ස්වරයා පර කල්හි; ගිරතෙඃ, ගෲ ධාතුහුගේ; රස්‍ය, රකාරයට; වා, විකල්පයෙන්; ලඃ වාච්‍යඃ, ලකාරය කිය යුතු යි. (ගුණයෙන් හා වෘද්ධියෙන් ලැබෙන අර්- ආර් දෙදෙනාගේ හා "ඍෘත ඉර්" යි වන ඉර් ආදෙශයාගේත් රකාරයට පර ව ස්වරයක් ඇති කල්හි විකල්පයෙන් ලකාරය වන බව මෙයින් සූචිත යි.) ගිලති යනු ද ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. (විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍රථම පුරුෂෛක වචනයන්හි ගිරෙත්- ගිලෙත්, ගිරතු- ගිලතු, අගිරත්- අගිලත් යනු වේ.) ජගාර -පෙ- ජගලුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. (ගීර්‍යාත් යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචනයෙහි ද, ගරිතා- ගරීතා- ගලිතා, ගරිෂ්‍යති- ගරීෂ්‍යති- ගලිෂ්‍යති, අගරිෂ්‍යත්- අගරීෂ්‍යත්- අගලිෂ්‍යත් යනු රූප ත්‍රය බැගින් ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචනයන්හි ද,) අගාරීත්- අගාලීත් යනු ලුඞ් ප්‍ර: එක වචනයෙහි ද වේ.

10. ස්පෘශ් ස්පර්ශනෙ, "ස්පෘශ්" ධාතුව ස්පර්ශ කිරීමෙහි වේ. ස්පෘශති, පස්පර්ශ, ස්පෘශ්‍යාත් යනු ලට්- ලිට්- ආශීර් ලිඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ස්ප්‍රෂ්ටා -පෙ- අස්පාර්ක්ෂීත් යනු රූප දෙක බැගින් ලුට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ("රාරෙ ඣසෙ දෘශාම්" යි විකල්පයෙන් 'ර- රා' විය.)

c. ස්පෘශාදීනාං වා සිඃ වක්තව්‍යඃ. තත්පක්‍ෂෙ, "හශෂාන්තාත්සක්, අස්පෘක්‍ෂත්.

**11.** ප්‍රච්ඡ ඥීප්සායාම්. සම්ප්‍රසාරණම්, පෘච්ඡති, පප්‍රච්ඡ, පප්‍රච්ඡතුඃ, පප්‍රච්ඡිථ- පප්‍රෂ්ඨ, පෘච්ඡ්‍යාත්, ප්‍රෂ්ටා, ප්‍රක්‍ෂ්‍යති, අප්‍රක්‍ෂ්‍යත්, අප්‍රාක්‍ෂීත්.

**12.** සෘජ් විසර්ගෙ. සෘජති, සසර්ජ, සසෘජතුඃ, සසෘජුඃ, සසර්ජිථ- සස්‍රෂ්ඨ, සෘජ්‍යාත්, "රුරෙ ඛසෙ දෘශාම්" ස්‍රෂ්ටා, ස්‍රක්‍ෂ්‍යති, අස්‍රක්‍ෂ්‍යත්, අස්‍රාක්‍ෂීත්.

---

c. ස්පෘශාදීනාම්, ස්පෘශාදි ධාතූන් සම්බන්ධ ව; සිඃ, සි ප්‍රත්‍යය; වා, විකල්පයෙන්; වක්තව්‍යඃ, කිය යුතු සි. තත්පක්‍ෂෙ, ඒ (විකල්පයෙන් සි ප්‍රත්‍යය නො වන) පක්‍ෂයෙහි; "හශෂාන්තාත්සක්" යන සූත්‍රයෙන් සක් ප්‍රත්‍යය වේ. අස්පෘක්‍ෂත් යනු එසේ නිපන් ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන සි.

11. ප්‍රච්ඡ ඥීප්සායාම්, අකාරානුබන්ධ "ප්‍රච්ඡ්" ධාතුව දැන ගනු කැමැති බැව්හි වේ. සම්ප්‍රසාරණම්, ("ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන්) සම්ප්‍රසාරණ වේ. පෘච්ඡති යනු ලට් ප්‍ර: එක වචන සි. (මෙහි "ඡඃ" සි ඡකාරයට ද්විත්ව වේ. පූර්ව ඡකාරයට "ඛසෙ චපාඃ" යනාදීන් චකාරය වේ. අන් තන්හි ද මෙසේ සි. සෙස්ස සුගම සි.) පප්‍රච්ඡ, පප්‍රච්ඡතුඃ යනු ලිට් ප්‍ර: එක- ද්වි වචන සි. පප්‍රච්ඡිථ- පප්‍රෂ්ඨ යනු ම: එක වචන සි. (අනිට් පක්‍ෂයෙහි ද්විරුක්තාද්‍යාදිය වීමෙන් "පප්‍රච්ඡ් + ථප්" සි සිටි කල්හි "ඡශෂරාජාදෙඃ ෂඃ" සි ධාත්වන්තයට ෂකාර ව ෂ්ටුත්වය වීමෙන් "පප්‍රෂ්ඨ" සි සිද්ධ සි. ප්‍රෂ්ටා යනාදිය ද මෙසේ සි.) පෘච්ඡ්‍යාත් -පෙ- අප්‍රාක්‍ෂීත් යනු ආශිර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන සි. (ප්‍රක්‍ෂ්‍යති යනාදියෙහි "ඡශෂ-" ආදි සූත්‍රයෙන් ෂකාර වූ පසු ඊට "ෂඪොඃ කඃ සෙ" සි කකාර වේ.)

12. සෘජ් විසර්ගෙ, "සෘජ්" ධාතුව ත්‍යාගයෙහි හෝ මැවීමෙහි වේ. සෘජති යනු ලට් ප්‍ර: එක වචන සි. සසර්ජ, සසෘජතුඃ, සසෘජුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ සි. සසර්ජිථ- සස්‍රෂ්ඨ යනු මධ්‍යම පුරුෂෛක වචන සි. සෘජ්‍යාත් යනු ආශිර් ලිඞ් ප්‍රථම පුරුෂෛක වචන සි. "රුරෙ ඛසෙ දෘශාම්" යන සූත්‍රයෙන් අර්- ආර් දෙක ට ර- රා දෙක වේ. ස්‍රෂ්ටා -පෙ- අස්‍රාක්‍ෂීත් යනු ලුට්-ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන සි.

**13. ටුමස්ජෝ ශුද්ධෞ. ටු- ඔ ඉතෞ. * මජ්ජති, මමජ්ජ.**

**a. මස්ජිනශොර්ඣසෙ නුම්. මඞ්ක්තා, මඞ්ක්ෂ්‍යති, අමඞ්ක්ෂ්‍යත්, අමාඞ්ක්ෂීත්, අමාඞ්ක්තාම්, අමාඞ්ක්ෂුඃ.**

**14. විශ් ප්‍රවෙශනෙ, වෙෂ්ටා, අවික්ෂත්.**

**15. මෘශ් ආමශීනෙ, අම්‍රාක්ෂීත්, අමාර්ක්ෂීත්, අමෘක්ෂත්.**

---

13. ටුමස්ජෝ ශුද්ධෞ, "මස්ජ්" ධාතුව පිරිසිදු බැව්හි වේ. ටු ඔ ඉතෞ, ටුකාර- ඔකාර දෙක ඉත් ය. (ටුකාරය "ට්විතොʻථුඃ" සි අථු ප්‍රත්‍යය කිරීම පිණිස ය. ඔකාරය නිෂ්ඨා තකාරයට නකාර කිරීමට ය.) මජ්ජති යනු ලට් ප්‍ර: එක වචන සි.(අවිකරණය වීමෙන් "මස්ජ් + අ + තිප්" සි සිටි කල්හි "සෙතාඃ ශ්චුභිඃ ශ්චුඃ" සි සකාර යට ශකාර ව ඊට "ඣබෙ ජබාඃ" සි ජකාර ව "මජ්ජති" සි වේ. සෙස්ස ද මේ නයින් දත යුතු සි. විධිලිඞ්- ලොට්- ලඞ් ප්‍රථම පුරුෂෙක වචනයන්හි මජ්ජෙත්, මජ්ජතු, අමජ්ජත් යනු වේ.) මමජ්ජ යනු ලිට් ප්‍ර: එක වචන සි.

a. ඣසෙ, ඣස ප්‍රත්‍යාහාරය පර කල්හි, මස්ජිනශොඃ, මස්ජ්- නශ් ධාතු දෙක සම්බන්ධ ව; නුම්, නුමාගම වේ. මඞ්ක්තා, මඞ්ක්ෂ්‍යති, අමඞ්ක්ෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන සි. අමාඞ්ක්ෂීත්, අමාඞ්ක්තාම්, අමාඞ්ක්ෂුඃ යනු ලුඞ් ප්‍රථම පුරුෂ සි ("මස්ජ් + ස්‍යති" සි සිටි කල්හි "සෙකාරාද්ධ්‍යෙශව" සි ධාතුහුගේ සකාරයට ලොප් ව "චොඃ කුඃ" සි ජකාරයට ගකාර ව ඊට "ඛසෙ චපාඃ-" යනාදීන් කකාර වේ. ඉක්බිති "මස්ජිනශොර්ඣසෙ නුම්" සි කී හෙයින් නුමාගම ව, ඒ නකාරයට "නශ්වාපදනෙත ඣසෙ" සි අනුස්වාර ව නැවත ඊට "යමා යපෙ ස්‍ය" සි වර්ගාන්ත ඞකාර වේ. පසු ව "ක්විලාත්"- යනාදීන් ප්‍රත්‍යයස්ථ සකාරයට ෂකාර ව "මඞ්ක්ෂ්‍යති" සි සිද්ධ සි. මෙබඳු සෙස්ස ද මේ නයින් දත යුතු සි.)

14. විශ් ප්‍රවෙශනෙ, "විශ්" ධාතුව පිවිසීමෙහි වේ. (විශති, විශෙත්, විශතු, අවිශත්, විවෙශ, විශ්‍යාත් යනු ලට් -පෙ- ආශීර්ලිඞ් ප්‍ර: එක වචන සි.) වෙෂ්ටා යනු ලුට් ප්‍ර: එක වචන සි. (වෙක්ෂ්‍යති, අවෙක්ෂ්‍යත් යනු ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන සි.) අවික්ෂත් යනු ලුඞ් ප්‍ර: එක වචන සි. ("හශෂාන්තාත්සක්" සි සක් ප්‍රත්‍යය විය.)

15. මෘශ් ආමශීනෙ, "මෘශ්" ධාතුව සපිරීම කිරීමෙහි වේ. (මෘශති, මෘශෙත්, මෘශතු, අමෘශත්, මමර්ශ, මෘශ්‍යාත්, ම්‍රෂ්ටා- මර්ෂ්ටා, ම්‍රක්ෂ්‍යති- මර්ක්ෂ්‍යති, අම්‍රක්ෂ්‍යත්- අමර්ක්ෂ්‍යත්,) අම්‍රාක්ෂීත්-

* මෙතැන්හි "අත්‍යත්‍ර සො ජඃ" සි පොත්හි පැණේ. ඒ නිරර්ථක ය.

**16. විචඡ ගතෞ. "ආයඃ" විචඡායති, විචඡායාඤචකාර, විවිචඡ, විචඡායය්‍යාත්- විචඡ්‍යාත්, විචඡායිතා, අවිචඡායිත්.**

**17. ඉෂු ඉච්ඡායාම්. "ගමාං ඡඃ" ඉච්ඡති, ඉච්ඡෙත්, ඉයෙෂ, එෂිතා- එෂ්ටා.**

**18. ජුප ස්පශේ, ජොපතා, අජෞප්සීත්.**

**19. ලිශ් ගතෞ, ලෙෂ්ටා, අලික්‍ෂත්.**

---

අමාක්‍ෂීර්ත් යනු (පිළිවෙළින් දශ ලකාරයෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි. (ලුට් ලකාරයෙහි පටන් රූප ඛය බැගිනි.) අමෘක්‍ෂත් යනු සක් ප්‍රත්‍යය වූ පක්‍ෂයෙහි ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

16. විචඡ ගතෞ, අකාරානුබන්ධ "විඡ්" ධාතුව ගමන්හි වේ. "ආයඃ" යන සූත්‍රයෙන් අබ් විෂයෙහි නිත්‍යයෙන් ද, අනබ් විෂයෙහි විකල්පයෙන් ද ස්වාර්‍ථයෙහි ආය ප්‍රත්‍යය වේ. විචඡායති, (විචඡායෙත් විචඡායතු, අවිචඡායත් යනු ලඩාදි සතරෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි. විචඡායාඤ්චකාර- විවිචඡ, විචඡායය්‍යාත්- විචඡ්‍යාත්, විචඡායිතා (-විචඡිතා, විචඡායිෂ්‍යති විචඡිෂ්‍යති, අවිචඡායිෂ්‍යත්- අවිචඡිෂ්‍යත්,) අවිචඡායීත්- (අවිචඡීත්) යනු ලිට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි.

17. ඉෂු ඉච්ඡායාම්, උකාරානුබන්ධ "ඉෂ්" ධාතුව කැමති වීමෙහි වේ. "ගමාං ඡඃ" යන සූත්‍රයෙන් ධාත්වන්තයට "ඡ" ආදෙශ වේ ඉච්ඡති; ඉච්ඡෙත්, (ඉච්ඡතු, ඓච්ඡත් යනු ලඩාදි සතරෙහි) ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි. ලිට් ලකාරයෙහි ඉයෙෂ (ඊෂතුඃ ඊෂුඃ) යනාදීන් වර නැගේ. එෂිතා- එෂ්ටා යනු ලුට් ප්‍රඃ එක වචන යි. ("ඉෂුසහලුභරිෂරුෂාමනපි තසෝඩ් වා වක්තව්‍යඃ" යි කී හෙයින් විකල්පයෙන් ඉඩාගම විය. සෙස්ස භ්වාදි ගණික ඉෂ් ධාතුව වර නැගූ ලෙස වරනැගිය යුතු. දශ ලකාරයෙහි ම රූප සමාන ය.)

18. ජුප ස්පශේ, අකාරානුබන්ධ "ජුප්" ධාතුව ස්පශී කිරීමෙහි වේ. (ජුපති, ජුපෙත්, ජුපතු, අජුපත්, ජුජොප, ජුප්‍යාත්,) ජොප්තා, (ජොප්ස්‍යති, අජොප්ස්‍යත්,) අජෞප්සීත් යනු (දශ ලකාරයෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි.

19. ලිශ් ගතෞ, "ලිශ්" ධාතුව ගමන්හි වේ. (ලිශති, ලිශෙත්, ලිශතු, අලිශත්, ලිලෙශ, ලිශ්‍යාත්,) ලෙෂ්ටා, (ලෙක්‍ෂ්‍යති, අලෙක්‍ෂ්‍යත්,) අලික්‍ෂත් යනු (ලඩාදි දශයෙහි) ප්‍රථම පුරුෂෛක වචනයෝ යි. (ලුඞ් ලකාරයෙහි සක් ප්‍රත්‍යය වේ.)

**20. භිද් පරිඝාතෙ, භිනත්ති, ඛෙත්තා, අභෛත්සීත්.**

**21. පිශ අවයවෙ, පිංශති, පෙශිතා.**

**ඉති තුදාදිප්‍ර පරස්මෛපදි ප්‍රක්‍රියා.**

---

a. **අථාත්මනෙපදිනඃ:-**

**1. මෘඞ් ප්‍රාණත්‍යාගෙ.**

## 169. අයකි. (අයකි. 7. 1.)

b. **ඍකාරස්‍ය රිඞාදෙශො භවති අකාරෙ ප්‍රත්‍යයෙ යකි ච පරෙ. "නුධාතොඃ" ම්‍රියතෙ.**

---

20. භිද් පරිඝාතෙ, "භිද්" ධාතුව බෙදයෙහි වේ. ("මුචාං-දෙර්මුම්" යි මුමාගම වේ.) භිනත්ති, (භිනෙත්, භිනත්තු, අභිනත්, බිභෙද, භිද්‍යාත්,) ඛෙත්තා, (ඛෙත්ස්‍යති, අඛෙත්ස්‍යත්,) අභෛත්සීත් යනු (දශලකාර) ප්‍රථම පුරුෂෛක වචන යි.

21. පිශ අවයවෙ, අකාරානුබන්ධ "පිශ්" ධාතුව අවයවාර්ථයෙහි වේ. (මෙද මුචාදියට අයත් හෙයින් මුමාගම වේ.) පිංශති, (පිංශෙත්, පිංශතු, අපිංශත්, පිපෙශ, පිශ්‍යාත්,) පෙශිතා, (පෙශිෂ්‍යති, අපෙශිෂ්‍යත්, අපෙශීත් යනු ලඞාදි දශයෙහි) ප්‍රථම පුරුෂෛක වචන යි.

තුදාදිප්‍ර, තුදාදි ගණයෙහි; පරස්මෛපදි ප්‍රක්‍රියා, පරස්මෛපදි ප්‍රක්‍රියාව; ඉති මෙතෙකින් සමාප්ත යි.

---

a. අථ, ඉක්බිති; ආත්මනෙපදිනඃ, ආත්මනෙපදි ධාතූහු දක්වනු ලැබෙත්:-

1. මෘඞ් ප්‍රාණත්‍යාගෙ, ඞකාරානුබන්ධ "මෘ" ධාතුව පණ හැරීමෙහි වේ.

169. රිඞාදෙශ විධි සූත්‍ර යි. "ඍතො රිඞ්" යන සූත්‍රය අනුවෘත්ත වේ. අයකි, අවිකරණය හා යක් ප්‍රත්‍යය පර කල්හි; ඍතඃ, ඍකාරයට; රිඞ්, රිඞාදෙශ වේ.

b. අකාරෙ ප්‍රත්‍යයෙ, අ ප්‍රත්‍යය ද; යකි ච, යක් ප්‍රත්‍යය ද; පරෙ, පර කල්හි; ඍකාරස්‍ය, ඍකාරයට; රිඞාදෙශඃ භවති, රිඞ් ආදෙශ වේ. ("තුදාදෙරඃ" යි විහිත අප්‍රත්‍යය හා "යක් චතුර්ෂු" යි විහිත යක් ප්‍රත්‍යය ද පර කල්හි අන්ත ඍකාරයට රිඞාදෙශ වේ. "නුධාතොඃ" යන සූත්‍රයෙන් ඉකාරයට ඉය් ආදෙශ වේ. ම්‍රියතෙ යනු ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. (විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍රථම පුරුෂෛක වචනයන්හි ම්‍රියෙත, ම්‍රියතාම්, අම්‍රියත යනු වේ.)

c. "ස්‍යපරොක්ඛයොඃස්තාදෞ ම්‍රියතෙඃ පරස්මෛපදං වාච්‍යම්." මමාර මම්‍රතුඃ මම්‍රුඃ, මෘෂීෂ්ට, මෘ්‍ට, මරිෂ්‍යති, අමරිෂ්‍යත්- "හ්‍රස්වාජ්ඣසෙ" අමෘත අමෘෂාතාම් අමෘෂත.

2. දෘඞ් ආදරෙ. ද්‍රියතෙ, දද්‍රෙ, දෘෂීෂ්ට, දෘ්‍ට, "හනෘතඃ ස්‍යපඃ" දරිෂ්‍යතෙ, අදරිෂ්‍යත, අදෘත.

3. ධෘඞ් අවස්ථානෙ. ධ්‍රියතෙ. තද්වත්.

4. පෘඞ් ව්‍යාපාරෙ. ව්‍යාප්‍රියතෙ, ව්‍යාපරිෂ්‍යතෙ, ව්‍යාපෘත ව්‍යාපෘෂාතාම් ව්‍යාපෘෂත.

---

c. ස්‍යපරොක්ෂයොඃ, ස්‍ය ප්‍රත්‍යය- පරොක්ෂ ලිට් යන දෙක පර කල්හි ද; තාදෞ, තාදිය පර කල්හි ද; ම්‍රියතෙඃ, මෘ ධාතුහු කෙරෙන්; පරස්මෛපදම්, පරස්මෛපදය; වාච්‍යම්, කියයුතු යි.(ලිට්- ලුට්- ලෘට්- ලෘඞ් යන සිවු ලකාරයෙහි මෘ ධාතුහුගේ ආත්මනෙපද වෙනුවට පරස්මෛපද ප්‍රයොගය වන බව මෙයින් දක්වූහ.) මමාර, මම්‍රතුඃ, මම්‍රුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. මෘෂීෂ්ට, යනු ආශීර් ලිඞ් ආ: ප්‍ර: එක වචන යි. මර්‍තා, මරිෂ්‍යති, අමරිෂ්‍යත් යනු ලුට්- ලෘට්- ලෘඞ් ප: ප්‍රථම පුරුෂෛක වචන යි. "හ්‍රස්වාජ්ඣසෙ" යි සි ප්‍රත්‍යයට ලොප් වේ. අමෘත, අමෘෂාතාම්, අමෘෂත යනු ලුඞ් ආ: ප්‍රථම පුරුෂ යි.

2. දෘඞ් ආදරෙ, ඞකාරානුබන්ධ "දෘ" ධාතුව ආදරාර්ථයෙහි වේ. ද්‍රියතෙ, (ද්‍රියෙත, ද්‍රියතාම්, අද්‍රියත,) දද්‍රෙ, දෘෂීෂ්ට, දර්‍තා යනු ලට් -පෙ- ලුට් ප්‍රථම පුරුෂෛක වචන යි. "හනෘතඃ ස්‍යපඃ" යන සූත්‍රයෙන් ඉඩාගම වේ. දරිෂ්‍යතෙ, අදරිෂ්‍යත, අදෘත යනු ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

3. ධෘඞ් අවස්ථානෙ, ඞනුබන්ධ "ධෘ" ධාතුව දැරීමෙහි හෙවත් පිහිටීමෙහි වේ. ධ්‍රියතෙ යනු ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. තත් වත්, එමෙනි, හෙවත් දශ ලකාරයෙහි ම දෘ ධාතුව මෙන් වර නැගේ.

4. පෘඞ් ව්‍යාපාරෙ, ඞනුබන්ධ "පෘ" ධාතුව උත්සාහයෙහි වේ. (වි- ආ පූර්ව කොට ඇත්තේ වේ.) ව්‍යාප්‍රියතෙ, (ව්‍යාප්‍රියෙත, ව්‍යාප්‍රියතාම්, ව්‍යාප්‍රියත, ව්‍යාපප්‍රෙ, ව්‍යාපෘෂීෂ්ට, ව්‍යාපර්‍තා,) ව්‍යාපරිෂ්‍යතෙ, ව්‍යාපරිෂ්‍යත යනු ලට් -පෙ- ලෘඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ව්‍යාපෘත, ව්‍යාපෘෂාතාම්, ව්‍යාපෘෂත, යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි.

**5. ඔවිජී භයචලනයොඃ. විජතෙ, විජෙත, විජතාම්, අවිජත, විවිජෙ, විජෙඃ පර ඉට් කිද් වක්තව්‍යඃ. තතො නොපධාගුණඃ. විජිෂීෂට, විජිතා, විජිෂ්‍යතෙ, අවිජිෂ්‍යත, අවිජිෂට.**

**6. ඔලස්ජී ව්‍රීඩායාම්. ලජ්ජතෙ, ලලජෙජ, අලජ්ජිෂට.**

**ඉති තුදාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා.**

---

## ඉත්‍යවිකරණාස්තුදාදයඃ.

---

**a. අථ ක්‍ර්‍යාදයඃ. තත්‍රාදාවුභය පදිනඃ:-**

**1. ඩුක්‍රීඤ් ද්‍රව්‍යවිනිමයෙ.**

---

5. ඔවිජී භයචලනයොඃ, ඔකාර-ඊකාරානුබන්ධ "විජ්" ධාතුව බිය- සැලීම් යන අර්ථ දෙක්හි වේ. විජතෙ -පෙ- විවිජෙ යනු ලට් -පෙ- ලිට් ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි. විජෙඃ පරඃ, විජ් ධාතුහු කෙරෙන් පර වූ; ඉට්, ඉඩාගමය; කිත් වක්තව්‍යඃ, කිත් යයි කිය යුතු යි. තතඃ, එහෙයින්; න උපධා ගුණඃ, උපධා සංඥයට ගුණ නො වේ. විජිෂීෂට -පෙ- අවිජිෂට යනු ආශීර්ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

6. ඔලස්ජී ව්‍රීඩායාම්, ඔ-ඊ අනුබන්ධ "ලස්ජ්" ධාතුව ලජ්ජායෙහි වේ. ("සෙතාඃ ශ්චුභිඃ ශ්චුඃ" යි සකාරයට ශකාරය වේ. ඊට "ඣබෙ ජබාඃ" යි ජකාරය වේ.) ලජ්ජතෙ, (ලජ්ජෙත, ලජ්ජතාම්, අලජ්ජත,) ලලජ්ජෙ, (ලජ්ජිෂීෂට, ලජ්ජිතා, ලජ්ජිෂ්‍යතෙ, අලජ්ජිෂ්‍යත) අලජ්ජිෂට, යනු ප්‍රථම පුරුෂෛක වචන යි.

තුදාදිෂු ආත්මනෙපදි ප්‍රක්‍රියා, තුදාදි ගණයෙහි ආත්මනෙපදි ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

අවිකරණාඃ, අකාරය විකරණ කොට ඇති; තුදාදයඃ, තුදාදීහු; ඉති, මෙසේ යි.

## තුදාදි ගණය නිමි.

---

a. අථ, තුදාදි ගණයට අනතුරු ව; ක්‍ර්‍යාදයඃ, ක්‍ර්‍යාදීහු දක්වනු ලැබෙත්. තත්‍ර, එහි; ආදෞ, ආදියෙහි; උභයපදිනඃ, උභයපදි ධාතුහු වෙත්.

1. ඩුක්‍රීඤ් ද්‍රව්‍යවිනිමයෙ, ඩුකාර-ඤකාරානු බන්ධ "ක්‍රී" ධාතුව ද්‍රව්‍ය ගණු දෙනු කිරීමෙහි වේ.

## 170. නා ක්‍ර්‍යාදෙඃ. (නා 1-1. ක්‍ර්‍යාදෙඃ 5-1.)

**b. ක්‍ර්‍යාදෙගීණානනාප්‍රත්‍යයො භවති චතුර්ෂ්‍ු පරෙෂු. අපො'පවාදඃ. ණත්‍වම්. ක්‍රීණාති.**

## 171. ඊ හසෙ. (ඊ 1-1. හසෙ 7-1.)

**c. නා ඉත්‍යස්‍යාකාරස්‍ය ඊකාරො භවති ඞිති හසෙ පරෙ. ක්‍රීණීතඃ.**

## 172. නාතඃ. (නා-අවිභක්තික. ආතඃ 6-1.)

**e. නා ඉත්‍යස්‍යාකාරස්‍ය ලොපො භවති ඞිති සවරෙ පරෙ.**

---

170. නා ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "යක් චතුර්ෂු" යි 'චතුර්ෂු' යනු ද–"අප් කත්‍රීරි" යි 'කත්‍රීරි' යනු ද අනුවෘත්ත යි. කත්‍රීරි, කත්‍රෘ කාරකයෙහි; චතුර්ෂු, ලඩාදි සතර පර කල්හි; ක්‍ර්‍යාදෙඃ, ක්‍රී ආදි ධාතු ගණයා කෙරෙන්; නා, නා ප්‍රත්‍යය වේ.

b. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; ක්‍ර්‍යාදෙඃ ගණාත්, ක්‍ර්‍යාදි ගණයා කෙරෙන් පර ව; නා ප්‍රත්‍යයඃ භවති, නා ප්‍රත්‍යය වේ. අපඃ අපවාදඃ, අප් විකරණයාගේ වැළැක්ම වේ. ණත්‍වම්, "අව කුප්වන්තරෙ'පි" යි ණකාර බව වේ. ක්‍රීණාති යනු ලට් පරස්මෛ පද ප්‍රථම පුරුෂෛක වචන යි.

171. ඊකාරාදෙශ විධි සූත්‍ර යි. "ඞිත්‍යදුඃ" යි 'ඞිති' යනු ද–"නාතඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. ඞිති හසෙ, ඞිත් වූ හස ප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; නාතඃ, නා විකරණයාගේ ආකාරයට; ඊ, ඊකාරාදෙශ වේ.

c. ඞිති හසෙ පරෙ, ඞිත් සංඥ වූ හස ප්‍රත්‍යාහාරය පර කල්හි; නා ඉති අස්‍ය, නා යන මේ විකරණය පිළිබඳ; ආකාරස්‍ය, ආකාරයට; ඊකාරඃ භවති, ඊකාරය වේ. ක්‍රීණීතඃ යනු ලට් පඃ ප්‍රඃ ද්වි වචන යි.

172. ආකාර ලොප විධි සූත්‍ර යි. "ලොපඃ" යන සූත්‍රය ද, "ඞිත්‍යදුඃ" යි 'ඞිති' යනු ද අනුවෘත්ත යි. ඞිති, ඞිත් සංඥ වූ සවරයා පර කල්හි; නාතඃ, නා ප්‍රත්‍යය පිළිබඳ ආකාරයට; ලොපඃ, ලොප් වේ.

e. ඞිති සවරෙ පරෙ, ඞිත් වූ සවරයා පර කල්හි; නා ඉති අස්‍ය ආකාරස්‍ය, නා යන මේ විකරණ ප්‍රත්‍යය පිළිබඳ ආකාරයට; ලොපඃ භවති, ලොප් වේ. (මේ සූත්‍රයට "සවරෙ" යි අනුවෘත්ත නො වතුදු "ඊ හසෙ" යන පූර්ව සූත්‍රයෙන් ව්‍යඤ්ජනයා පර කල්හි ඊකාර විධානය කළ හෙයින් පරිශෙෂ වශයෙන් "සවරයා පර කල්හි" යයි ලැබේ.)

a. ක්‍රීණාති, ක්‍රීණාසි ක්‍රීණීථඃ ක්‍රීණීථ, ක්‍රීණාමි ක්‍රීණීවඃ ක්‍රීණීමඃ. ක්‍රීණීතෙ. ක්‍රීණීයාත්- ක්‍රීණීත, ක්‍රීණාතු- ක්‍රීණීතාම්, අක්‍රීණාත්- අක්‍රීණීත, චික්‍රාය චික්‍රියතුඃ චික්‍රියුඃ. චික්‍රයිථ - චික්‍රෙථ, චික්‍රියෙ, ක්‍රීයාත්- ක්‍රෙෂීෂ්ට, ක්‍රෙතා- ක්‍රෙතා, ක්‍රෙෂ්‍යති- ක්‍රෙෂ්‍යතෙ, අක්‍රෙෂ්‍යත්- අක්‍රෙෂ්‍යත, අක්‍රෛෂීත්- අක්‍රෙෂ්ට.

2. ප්‍රීඤ් තර්පණෙ කාන්තෞ ච, පිප්‍රියෙ.

3. මීඤ් හිංසායාම්. මිනාති.

b. "මිනාති මිනොති දීඩාං ගුණවෘද්ධිවිෂයෙ ක්‍යපි ච. ආත්වං වාච්‍යම්." මමෞ මිම්‍යතුඃ මිම්‍යුඃ. මමිථ- මමාථ, මාසීෂ්ට, මාතා, අමාසීත්. අමාසත*.

a. ක්‍රීණාති යනු බහු වචන යි. ක්‍රීණාසි -පෙ- ක්‍රීණීමඃ යනු මධ්‍යමොත්තම පුරුෂ එක- ද්වි- බහු වචන යි. ක්‍රීණීතෙ, (ක්‍රීණාතෙ, ක්‍රීණතෙ,) යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂ යි. ක්‍රීණීයාත් -පෙ- අක්‍රීණීත යනු රූප ද්වය බැගින් විධි ලිඞ්- ලොට්- ලඞ් ප: ආ: ප්‍ර: එක වචන යි. චික්‍රාය, චික්‍රියතුඃ, චික්‍රියුඃ යනු ලිට් ප: ප්‍රථම පුරුෂ යි. චික්‍රයිථ- චික්‍රෙථ යනු ම: එක වචන යි. ("ස්වරාන්තානාන්ත්‍යානිටස්ථපො වෙට්" යි ඉඩ් විකල්පත්වයෙන් රූප ද්වයෙකි.) චික්‍රියෙ, (චික්‍රියාතෙ, චික්‍රියිරෙ) යනු ආ: ප්‍රථම පුරුෂ යි. ක්‍රීයාත් -පෙ- අක්‍රෙෂ්ට යනු පිළිවෙළින් ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි

2. ප්‍රීඤ් තර්පණෙ කාන්තෞ ච, ඤකාරානුබන්ධ "ප්‍රී" ධාතුව පිණවීමෙහි ද ඉච්ඡාර්ථයෙහි ද වේ. පිප්‍රියෙ යනු ලිට් ආ: ප්‍ර: එක වචන යි. (පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනයෙහි "පිප්‍රාය" යනු වේ. සෙස්ස සියලු ලකාරයන්හි ක්‍රී ධාතුව මෙන් වර නැගිය යුතු.)

3. මීඤ් හිංසායාම්, ඤකාරානුබන්ධ "මී" ධාතුව පෙළීමෙහි වේ. මිනාති යනු ලට් ප: ප්‍ර: එක වචන යි. (මිනීතෙ යනු ආ: ප්‍ර: එක වචන යි. මිනීයාත්- මිනීත, මිනාතු- මිනීතාම්, අමිනාත්- අමිනීත යනු විධිලිඞ්- ලොට්- ලඞ් ප: ආ: ප්‍ර: එක වචනයෝ යි.)

b ගුණ වෘද්ධි විෂයෙ, ගුණ- වෘද්ධි දෙකට විෂය වූ ප්‍රත්‍යයන් පර කල්හි ද; ක්‍යපි ච, ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි ද; මිනාති මිනොති දීඩාම්, මීඤ් හිංසායාම්- ඩුමිඤ් ප්‍රක්ෂෙපෙ- දීඞ් ක්ෂයෙ යන

* අමෙෂ්ට - පොත්හි.

**4. ස්කුඤ් ආප්ලවනෙ.***

c. **"ස්තම්භුස්තුම්භුස්කම්භුස්කුම්භුස්කුඤ්භ්‍යො ශ්නුශ්නාශ්ච". ස්කුනොති- ස්කුනාති, අස්කුනින, චුස්කුවිෂෙ, අස්කෞෂිත්- අස්කොෂ්ට.**

---

ධාතූන්ට; ආත්වම්, ආකාර බව; වාච්‍යම් කිය යුතු යි. (ෂෂ්ඨී නිර්දිෂ්ට බැවින් අන්ත්‍යයට වේ. "මීනාති මිනොති" යි විකරණ සහිත කොට දක්වූ හෙයින් ක්‍ර්‍යාදි- ස්වාදි ගණ දෙක්හි මී-මි ධාතු ද්වය ගැණේ.) මමෞ, මිම්‍යතුඃ, මිම්‍යුඃ යනු ලිට් ප: ප්‍රථම පුරුෂ යි. මමිථ- මමාථ යනු ම: එකවචන යි. (ආත්මනෙපදයෙහි මිම්‍යෙ, මිම්‍යාතෙ, මිම්‍යිරෙ යනාදීන් වර නැගේ. ආශීර් ලිඞ් ප: ප්‍ර: එක වචනයෙහි මීයාත් යනු වේ.) ආත්මනෙපදයෙහි මාසීෂ්ට යනු වේ. ලුට් ප: ආ: දෙක්හි ම ප්‍ර: එක වචනයෙහි මාතා යනු වේ. (මාස්‍යති- මාස්‍යතෙ, අමාස්‍යත්- අමාස්‍යත යනු ලෘට්- ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.) අමාසීත්- අමාස්ත යනු ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

4. ස්කුඤ් ආප්ලවනෙ, ඤකාරානුබන්ධ "ස්කු" ධාතුව ඉදිරි මෙහි වේ.

c. ස්තම්භුස්තුම්භුස්කම්භුස්කුම්භුස්කුඤ්භ්‍යඃ, ස්තම්භු- ස්තුම්භු- ස්කම්භු- ස්කුම්භු- ස්කුඤ් යන ධාතූන් කෙරෙන් පර ව; (ලඩාදි සතරෙහි) ශ්නුඃ, ශ්නු ප්‍රත්‍යය ද; ශ්නාඃ ච, ශ්නා ප්‍රත්‍යය ද වේ. (මෙසේ මේ විකරණ දෙක ම වීමෙන් ඒ ධාතු පඤ්චකය **ස්වාදි ගණ්‍ය** ලෙස හා **ක්‍ර්‍යාදි ගණ්‍ය** ලෙස ලඩාදි සතරෙහි වර නැගේ. ) ස්කුනොති යනු ශ්නු විකරණය වීමෙන් ද, ස්කුනාති යනු ශ්නා විකරණය වීමෙන් ද සිද්ධවූ ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. ආත්මනෙපද යෙහි) ස්කුනුතෙ- ස්කුනීතෙ යනු වේ. විධිලිඞ්- ලොට් - ලඞ් ප: ආ ප්‍ර: එක වචනයන්හි ස්කුනුයාත්= ස්කුනීයාත්, ස්කුන්වීත= ස්කුනීත, ස්කුනොතු= ස්කුනාතු,- ස්කුනුතාම්= ස්කුනීතාම්, අස්කුනොත්= අස්කුනාත්,- අස්කුනුත=) අස්කුනීත යනු වේ. (චුස්කාව, චුස්කුවතුඃ, චුස්කුවුඃ. චුස්කවිථ=චුස්කොථ, චුස්කුවථුඃ,චුස්කුව. චුස්කාව= චුස්කව, චුස්කුවිව, චුස්කුවිම යනු ලිට් පරස්මෛපද යි. චුස්කුවෙ,චුස්කුවාතෙ, චුස්කුවිරෙ.) චුස්කුවිෂෙ, (චුස්කුවාථෙ, චුස්කුවිධ්වෙ= චුස්කුවිඪ්වෙ, චුස්කුවෙ, චුස්කුවිවහෙ, චුස්කුවිමහෙ) යනු ආත්මනෙපද යි. (ස්කූයාත් - ස්කොෂීෂ්ට, ස්කොතා - ස්කොතා, ස්කොෂ්‍යති- ස්කොෂ්‍යතෙ, අස්කොෂ්‍යත්- අස්කොෂ්‍යත යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට් ලෘඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.) අස්කෞෂිත්- අස්කොෂ්ට යනු ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

---

* ආප්‍රවණෙ - පොත්හි.

**5–8. ස්තම්භුස්තුම්භුස්කම්භුස්කුම්භු රෝධනෙ. ස්තභ්නොති- ස්තභ්නාති, ස්තුභ්නොති- ස්තුභ්නාති, ස්කභ්නොති- ස්කභ්නාති, ස්කුභ්නොති- ස්කුභ්නාති, ස්තභාන, ස්තුභාන, ස්කභාන, ස්කුභාන, අස්තභත්.**

**d. "ජෘස්තම්භු ම්‍රැචුම්ලුචුග්‍රැචුග්ලුචුග්ලුඤ්චුශ්විභ්‍යශ්චලෙ රඞ් වා". අස්තම්භිත්.**

---

5–8. ස්තම්භුස්තුම්භුස්කම්භුස්කුම්භු රෝධනෙ, උකාරානුබන්ධ "ස්තන්භ්- ස්තුන්භ්- ස්කන්භ්- ස්කුන්භ්" යන ධාතු සතර ඇවිරීමෙහි වේ. (සමහරු මෙයින් දෙවැන්න නිෂ්කොෂණාර්ථ යයි ද, සතර වැන්න ධාරණාර්ථ යයි ද කියති. ධාතු නිර්දේශයෙහි වූ මකාරය ලාක්ෂණිකය, හෙවත් සූත්‍ර වශයෙන් නකාරයට අනුස්වාර ව ඒට වර්ගාන්තාදෙශ වශයෙන් වූවකි.)

ස්තභ්නොති –පෙ– ස්කුභ්නාති යනු පිළිවෙළින් රූප දෙක බැගින් ඒ ධාතු සතරෙහි ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. "නො ලොපඃ" යි ධාතුහුගේ නකාරයට ලොප් වේ. ස්තභ්නුයාත්- ස්තභ්නීයාත්, ස්තභ්නොතු- ස්තභ්නාතු, යනු 'ස්තන්භ්' ධාතු විධිලිඞ්- ලොට්- ප: ප්‍ර: එක වචන යි. සෙසු ධාතු ත්‍රය ද මෙසේ යි.) ස්තභාන–පෙ– ස්කුභාන යනු ධාතු සතරෙහි ම පරස්මෛපද මධ්‍යම පුරුෂෛක වචන යි. (නුප්‍රත්‍යය පක්ෂයෙහි ආන ප්‍රත්‍යය නො ව **"ස්තභ්නුහි"– ස්තුභ්නුහි– ස්කභ්නුහි– ස්කුභ්නුහි"** යි සිටී. "ස්තන්භ් + හි" යි සිටි කල්හි "හසාදන හෙඃ" යි නා විකරණය විය යුතු තන්හි ආන ප්‍රත්‍යය වේ. "නො ලොපඃ" යි නකාරයට ලොප් වේ. ඉන් පසු "අතඃ" යි හි ප්‍රත්‍යය ලොපයෙන් "ස්තභාන" යි සිද්ධ යි. සෙස්ස ද මෙසේ යි. අස්තභ්නොත්- අස්තභ්නාත් යනු ලඞ් ප: ප්‍ර: එක වචන යි. තස්තම්භ, ස්තභ්‍යාත්, ස්තම්භිතා, ස්තම්භිෂ්‍යති, අස්තම්භිෂ්‍යත් යනු ලිට්- ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්–පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. )අස්තභත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (ඞ ප්‍රත්‍යය වීමෙන් සිද්ධ යි.)

d. ජෘස්තම්භු— ශ්විභ්‍යඃ, ජෘෂ්ඉර් වයොහානෞ- ස්තම්භු රොධනෙ- ම්‍රැචු- ම්ලුචු ගතෞ- ග්‍රැචු- ග්ලුචු ස්තෙය කරණෙ- ග්ලුඤ්චු ගතෞ- ටුඕශ්විඉර් ගතිවෘද්ධ්‍යොඃ යන ධාතූන් කෙරෙන් පර වූ; ච්ලෙඃ, ච්ලි ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි; වා, විකල්පයෙන්; අඞ්, අඞ් ආදෙශය වේ. (මේ සානුවෘත්ත **පාණිනීය සූත්‍රයෙකි. එහි ච්ලි ප්‍රත්‍යය** හා අඞ් ආදෙශය මේ ව්‍යාකරණයෙහි සි ප්‍රත්‍යය හා ඞ

**9. පූඤ් පවනෙ.**

## 173. ප්වාදෙර්හ්‍රස්වඃ. (ප්වාදෙඃ 6-1 හ්‍රස්වඃ 1-1.)

a. **ප්වාදීනාං හ්‍රස්වො භවති චතුර්ෂු පරෙෂු.**

b. **පුනාති- පුනීතෙ, පුනීයාත්- පුනීත, පුනාතු-- පුනීතාම්, අපුනාත්- අපුනීත, පුපාව- පුපුවෙ, පූයාත්- පවිෂීෂ්ට, පවිතා- පවිතා, පවිෂ්‍යති- පවිෂ්‍යතෙ, අපවිෂ්‍යත්- අපවිෂ්‍යත, අපාවීත්- අපවිෂ්ට.**

**10. කෘඤ් හිංසායාම්. කෘණාති- කෘණීතෙ, චකාර- චකරෙ, කීර්‍ය්‍යාත්- කරිෂීෂ්ට, අකාරීත්.**

---

ප්‍රත්‍යය යි. එහෙයින් ඒ පාණිනීය විධානය අනු ව යථොක්ත ධාතූන් කෙරෙන් පර ව සි ප්‍රත්‍යයාගේ ස්ථානයෙහි හෙවත් සි ප්‍රත්‍යය වියයුතු තැන්හි විකල්පයෙන් ඕ ප්‍රත්‍යය වේ.) අස්තම්භීත් යනු ඕ ප්‍රත්‍යය නුවූ පක්ෂයෙහි ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. (මේ ස්තම්භු ධාතුව වරනැගූ ලෙස සෙසු ධාතු ත්‍රය ද වරනැගිය යුතු.)

9. පූඤ් පවනෙ, ඤකාරානුබන්ධ "පූ" ධාතුව පිරිසිදු කිරීමෙහි වේ.

173. හ්‍රස්ව විධි සූත්‍ර යි. "අබාදෞ විපි ත්සම්" යි 'අබාදෞ' යනු අනුවෘත්ත වේ. අබාදෞ, අප් ආදි විකරණ විෂයෙහි, ප්වාදෙඃ, පූ ආදි ධාතු ගණයට; හ්‍රස්වඃ, හ්‍රස්ව වේ.

a. චතුර්ෂු පරෙෂු, ලඩාදි සතර පර කල්හි; ප්වාදීනාම්, ප්වාදි ධාතූන්ට; හ්‍රස්වඃ භවති, හ්‍රස්ව වේ. පුනාති- පුනීතෙ -පෙ- අපාවීත් අපවිෂ්ට යනු පිළිවෙළින් දශ ලකාරයෙහි පරස්මෛපද- ආත්මනෙ පද ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි.

10. කෘඤ් හිංසායාම්, ඤකාරානුබන්ධ "කෘ" ධාතුව පෙළීමෙහි වේ. කෘණාති- කෘණීතෙ යනු ලට් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. ("ෂ්‍රෘනෘභ්‍යො ණො 'නශෙන" යි නකාරයට ණකාරය වේ. විධි ලිඞ්- ලොට්- ලඞ් පඃ ආඃ ප්‍රඃ එක වචනයන්හි කෘණීයාත්- කෘණීත, කෘණාතු- කෘණීතාම්, අකෘණාත්- අකෘණීත යනු වේ.) චකාර- චකරෙ, කීර්‍ය්‍යාත්- කරිෂීෂ්ට යනු ලිට්- ආශීර් ලිඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි. (කීර්‍ය්‍යාත් යනු "ඍෘත ඉර්" යි ඉර් ආදෙශ ව "ය්වොර්විහසෙ"යි දීර්ඝ වීමෙන් සිද්ධ යි. කරිතා-කරිතා, කරිෂ්‍යති- කරිෂ්‍යතෙ, අකරිෂ්‍යත්- අකරිෂ්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් පඃ ආඃ ප්‍රඃ එක වචන යි.) අකාරීත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි (ආඃ ප්‍රඃ එක වචනයෙහි "අකරිෂ්ට" යනු වේ.)

**11.** **ධූඤ් කම්පනෙ. ධුනාති- ධුනීතෙ, දුධාව, අධවිෂට- අධොෂට.**

**12.** **ග්‍රහ උපාදනෙ. "ග්‍රහාං ඞිති ච" ගෘහ්ණාති- ගෘහ්ණීතඃ, ගෘහ්ණීතෙ, ගෘහ්ණීයාත්- ගෘහ්ණීත, ගෘහ්ණාතු= ගෘහ්ණීතාත් ගෘහ්ණීතාම් ගෘහ්ණන්තු.**

## 174. හසාද්නා හෞ. (හසාත් 5-1. ආන 1-1. හෞ 7-1.)

a. **හසාන්තාත් ක්‍ර්‍යාදෙර්ගණාදානප්‍රත්‍යයො භවති හෞ පරෙ, නා ප්‍රත්‍යයාභාවඃ.**

---

11. ධූඤ් කම්පනෙ, ඤකාරානුබන්ධ "ධූ" ධාතුව සෙලවීමෙහි වේ. ධුනාති- ධුනීතෙ යනු ලට් ප: ආ: ප්‍ර: එක වචන සි. දුධාව යනු ලිට් ප: ප්‍ර: එක වචන සි. (දුධුවෙ යනු ආ: ප්‍ර: එක වචන සි.) අධවිෂට- අධොෂට යනු ලුඞ් ආ: ප්‍ර: එක වචන සි. (**"ස්වරතිසූතිසූයති ධූඤ්රධාදීනාං වා"** සි කී හෙයින් විකල්පයෙන් ඉඩාගම වේ. ලිට් ලකාරයෙහි පටන් ස්වාදි ගණික ධූ ධාතුව වර නැගූ ලෙස ම මෙ ද වර නැගිය යුතු සි. මෙහි 87 පිට බලනු.)

12. ග්‍රහ උපාදනෙ, අකාරානුබන්ධ "ග්‍රහ්" ධාතුව ගැණීමෙහි වේ. "ග්‍රහාං ඞිති ච" යන සූත්‍රයෙන් සම්ප්‍රසාරණ වේ. ගෘහ්ණාති, ගෘහ්ණීතඃ යනු ලට් ප: ප්‍ර: එක- ද්වි වචන සි. ගෘහ්ණීතෙ යනු ආ: ප්‍ර: එක වචන සි. ගෘහ්ණීයාත්- ගෘහ්ණීත යනු විධි ලිඞ් ප: ආ: ප්‍ර: එක වචන සි. ගෘහ්ණාතු- ගෘහ්ණීතාත්, ගෘහ්ණීතාම්, ගෘහ්ණන්තු යනු ලොට් ප: ප්‍රථම පුරුෂ සි.

174. ආන ප්‍රත්‍යය විධි සූත්‍ර සි. "නාක්‍ර්‍යාදෙඃ" සි 'ක්‍ර්‍යාදෙඃ' යනු අනුවෘත්ත වේ. හෞ, හි ප්‍රත්‍යය පර කල්හි; හසාත් ක්‍ර්‍යාදෙඃ, හස ප්‍රත්‍යාහාර වර්ණාන්ත ක්‍ර්‍යාදි ගණයා කෙරෙන්; ආන, ආන ප්‍රත්‍යය වේ.

a. හෞ පරෙ, හි ප්‍රත්‍යය පර කල්හි; හසාන්තාත්, හස ප්‍රත්‍යාහාර වර්ණයක් හෙවත් ව්‍යඤ්ජනයක් අන්ත කොට ඇති; ක්‍ර්‍යාදෙඃ, ගණාත්, ක්‍ර්‍යාදි ගණයා කෙරෙන් පර ව; ආන ප්‍රත්‍යයඃ භවති, ආන ප්‍රත්‍යය වේ. නා ප්‍රත්‍යයාභාවඃ, නා ප්‍රත්‍යයාගේ වැළැක්ම වේ.

a. ගෘහාණ, අගෘහ්ණාත්. ජග්‍රාහ- ජගෘහෙ, ගෘහ්‍යාත් "ඊටො ග්‍රහාම්" ඉති ඊඃ. ග්‍රහීෂීෂට, ග්‍රහීතා. ග්‍රහීෂ්‍යති, අග්‍ර හීෂ්‍යත්- අග්‍රහීෂ්‍යත, අග්‍රහීත්- අග්‍රහීෂට.

ඉති ක්‍ර්‍යාදිසුභයපදී ප්‍රක්‍රියා.

b. අථ පරස්මෛපදිනඃ:-

1. පුෂ් පුෂ්ටෞ. පුෂ්ණාති, පුෂ්ණීයාත්, පුෂ්ණාතු- පුෂ්ණීතාත් පුෂ්ණීතාම් පුෂ්ණන්තු, පුෂාණ, අපුෂ්ණාත්, පුපොෂ, පුෂ්‍යාත්, පොෂිතා, පොෂිෂ්‍යති, අපොෂිෂ්‍යත්, අපොෂිත්.

2. මුෂ ස්තෙයෙ. මුෂ්ණාති, මුමොෂ, මුෂ්‍යාත්, මොෂිතා, මොෂිෂ්‍යති, අමොෂිෂ්‍යත්, අමොෂිත්.

---

a. ගෘහාණ යනු ප: ම: එක වචන යි. අගෘහ්ණාත් යනු ලඞ් ප: ප්‍ර: එක වචන යි. (අගෘහ්ණීත යනු ආ: ප්‍ර: එක වචන යි. "අවකුප්වනානරෙ'පි" යි ණකාරාදෙශ වේ.) ජග්‍රාහ- ජගෘහෙ යනු ලිට් ප: ආ: ප්‍ර: එක වචන යි. ගෘහ්‍යාත් යනු ආශිර් ලිඞ් ප: ප්‍ර: එක වචන යි. ඊටො ග්‍රහාම් ඉති, "ඊටො ග්‍රහාම්" යන සූත්‍රයෙන්; ඊඃ, ඉකාරයට ඊකාරය වේ. ග්‍රහීෂීෂ්ට යනු ආ: ප්‍ර: එක වචන යි. ග්‍රහීතා, ග්‍රහීෂ්‍යති යනු ලුට්- ලෘට් ප: ප්‍ර: එක වචන යි. (ආත්මනෙ පද ප්‍ර: එක වචනයන්හි ග්‍රහීතා- ග්‍රහීෂ්‍යතෙ යනු වේ.) අග්‍රහීෂ්‍යත් -පෙ- අග්‍රහීෂ්ට යනු ලෘඞ්- ලුඞ් ප: ආ: ප්‍ර: එක වචන යි.

ක්‍ර්‍යාදිෂූභයපදී ප්‍රක්‍රියා, ක්‍ර්‍යාදි ගණයෙහි උභයපදී ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

b. අථ, අනතුරු ව; පරස්මෛපදිනඃ, පරස්මෛපදී ධාතුහු දක්වනු ලැබෙත්.

1. පුෂ් පුෂ්ටෞ, "පුෂ්" ධාතුව පොෂණය කිරීමෙහි වේ. පුෂ්ණාති, පුෂ්ණීයාත් යනු ලට්- විධිලිඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. පුෂ්ණාතු- පුෂ්ණීතාත්, පුෂ්ණීතාම්, පුෂ්ණන්තු යනු ලොට් ප්‍රථම පුරුෂ යි. ("ඥානෞ ණො 'න්තෙත" යි ණත්වය වේ.) පුෂාණ යනු මධ්‍යම පුරුෂෛක වචන යි. ("හසාදන හෙඃ" යි ආන ප්‍රත්‍යය ව "අවකුප්වනානරෙ'පි" යි ණත්වය වේ.) අපුෂ්ණාත් -පෙ- අපොෂිත් යනු ලඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

**3. ශෲ හිංසායාම්. ශෲණාති, ශශාර ශශරතුඃ ශශරුඃ. * ශිශීයාත්, ශරිතා, ශරිෂ්‍යති, අශරිෂ්‍යත්, අශාරීත්.**

**4. ජ්‍යා වයෝහානෞ. ග්‍රහාදිත්වාත් සම්ප්‍රසාරණම්. ජිනාති, ජිනියාත්, ජිජ්‍යෞ ජිජ්‍යතුඃ ජිජ්‍යුඃ, ජිජ්‍යිථ- ජිජ්‍යාථ, ජියාත්, ජ්‍යාතා, ජ්‍යාස්‍යති, අජ්‍යාස්‍යත්, අජ්‍යාසීත්.**

**5. ඥා අවබෝධනෙ, "ඥාජනෝර්ජා" ජානාති, ජඥෞ, ඥායාත්- ඥෙයාත්, ඥාතා, අඥාසීත්.**

---

2: මූෂ ස්තෙයෙ, අකාරානුබන්ධ "මූෂ්" ධාතුව සොරකම්හි වේ. මූෂ්ණාති, (මූෂ්ණීයාත්, මූෂ්ණාතු- මූෂ්ණීතාත්, අමූෂ්ණාත්,) මුමෝෂ, මූෂ්‍යාත්, මෝෂිතා, මෝෂිෂ්‍යති, අමෝෂිෂ්‍යත්, අමෝෂීත් යනු පිළිවෙළින් ලඩාදි ලකාරයන්හි ප්‍රථම පුරුෂෛක වචන යි.

3. ශෲ හිංසායාම්, "ශෲ" ධාතුව හිංසාවෙයෙහි වේ. ("ප්වාදේර් හ්‍රස්වඃ" යි විකරණ විෂයෙහි හ්‍රස්ව වේ.) ශෘණාති යනු ලට් ප්‍ර: ඒක වචන යි. (සිවු ලකාරයෙහි සෙස්ස සුගම යි.) ශශාර, ශශරතුඃ, ශශරුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. ශීර්‍ය්‍යාත් -පෙ- අශාරීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. (ද්විරුක්ත ව "ශෲශෲ + ණප්" යි සිටි කල්හි "රඃ" යි පූර්ව රූපයේ ඍකාරයට අකාර ව "ධාතෝර්නාමිනඃ" යි වෘද්ධි ව "ශශාර" යි වේ.)

4. ජ්‍යා වයෝහානෞ, "ජ්‍යා" ධාතුව වයස් පිරිහීමෙහි වේ. ග්‍රහාදිත්වාත්, ග්‍රහාදිය බැවින්; සම්ප්‍රසාරණම්, ("ග්‍රහාං ඞිති ච" යි) සම්ප්‍රසාරණ වේ. (ප්වාදේර්හ්‍රස්වඃ" යි හ්‍රස්ව වේ.) ජිනාති, ජිනීයාත්, (ජිනාතු, අජිනාත්) යනු ලඩාදි ප්‍රථම පුරුෂෛක වචන යි. ජිජ්‍යෞ, ජිජ්‍යතුඃ, ජිජ්‍යුඃ යනු ලිට් ප්‍රථම පුරුෂ යි. ජිජ්‍යිථ- ජිජ්‍යාථ යනු මධ්‍යම පුරුෂෛක වචන යි. ජීයාත් -පෙ- අජ්‍යාසීත් යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ්- ප්‍ර: ඒක වචන යි.

5. ඥා අවබෝධනෙ, "ඥා" ධාතුව අවබෝධ කිරීමෙහි වේ. "ඥාජනෝ ර්ජා" යන සූත්‍රයෙන් ඥා ධාතුහට ජා ආදේශ වේ. ජානාති යනු ලට් ප්‍ර: ඒක වචන යි. (සෙසු තුනෙහි ජානීයාත්, ජානාතු, අජානාත් යනු වේ.) ජඥෞ යනු ලිට් ප්‍ර: ඒක වචන යි. ("ආතෝ ණප් ඖ" යි ඖ ආදේශයෙන් සිද්ධ යි. **"සංයෝගාදේරාදන්තස්‍යාකිති ශාද්‍යද්වෙකාරෝ වා වක්තව්‍යඃ"** යි කී හෙයින් ආකාරයට විකල්පයෙන් ඒකාරය වීමෙන්) ආශීර් ලිඞ් ප්‍රථම පුරුෂෛක වචනයෙහි ඥායාත් යනු ද, ඥෙයාත් යනු ද වේ. ඥාතා, ඥාස්‍යති, අඥාස්‍යත්, අඥාසීත් යනු ලුට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

---

* "ශෲද්‍යෘප්‍රාං හ්‍රස්වෝ වා ලිටි." සි: ච: ශශ්‍රතුඃ, ශශ්‍රුඃ.

**6. ලී ශ්ලෙෂණෙ. ලිනාති.**

a. **"ලීලිඞො රස්‍වං වා." ලලෞ- ලිලාය ලිල්‍යතුඃ ලිල්‍යුඃ, ලාතා- ලෙතා, අලාසීත්- අලෛෂීත්.**

**7. බන්ධ බන්‍ධනෙ. බධ්නාති, බබන්‍ධ, බධ්‍යාත්, භන්ත්‍ස්‍යති, අභාන්ත්සීත්.**

**8. මන්‍ථ විලොඩනෙ. මථ්නාති.**

**9. කුෂ් නිෂ්කාෂෙ, කුෂ්ණාති, කුෂාණ, චුකොෂ, කුෂ්‍යාත්, කොෂිතා, අකොෂීත්.**

---

6. ලී ශ්ලෙෂණෙ, "ලී" ධාතුව වැලඳ ගැන්මෙහි වේ. ලීනාති යනු ලට් ප්‍ර: එක වචන යි.

a. ලීලිඞොඃ, ලී- ලිඞ් ධාතු ද්වයට; වා, විකල්පයෙන්; ආත්වම්, ආකාර බව වේ. (ගුණ- වෘද්ධි දෙකට විෂය වූ ප්‍රත්‍යයන් පර කල්හි ද- ක්‍යප් ප්‍රත්‍යය පර කල්හි ද ලී- ලිඞ් ධාතු දෙකට ආකාරාදෙශ වීමෙන් ලා ධාතුව මෙන් ද රූපසිද්ධිය වේ.) ලලෞ- ලිලාය යනු ලිට් ප්‍රථම පුරුෂෙක වචන යි. ලිල්‍යතුඃ, ලිල්‍යුඃ යනු ද්වි බහු වචන යි. (මධ්‍යම පුරුෂෙක වචනයෙහි "ලලිථ- ලලාථ= ලිලයිථ- ලිලෙථ" යි රූප සතරකි. ආශීර් ලිඞ් ප්‍ර: එක වචනයෙහි ලීයාත් යනු වේ.) ලාතා- ලෙතා- (ලාස්‍යති- ලෙෂ්‍යති, අලාස්‍යත්- අලෙෂ්‍යත්,) අලාසීත්- අලෛෂීත් යනු ලුට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෙක වචන යි.

7. බන්ධ බන්‍ධනෙ, "බන්ධ" ධාතුව බැඳීමෙහි වේ. බධ්නාති, (බධ්නීයාත්, බධ්නාතු, අබධ්නාත් යනු ලඞාදි සතරෙහි) ප්‍ර: එක වචන යි. "නො ලොපඃ" යි නකාර ලොප් වේ. බබන්‍ධ, බධ්‍යාත්, (බන්‍ධා,) භන්ත්ස්‍යති, (අභන්ත්ස්‍යත්,) අභාන්ත්සීත් යනු ලිට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෙක වචන යි. ("බන්ධ + ස්‍යති" යි සිටි කල්හි "ආදිජබාන්‍තාං"- යනාදි සූත්‍රයෙන් බකාරයට භකාරය වේ. "ඛසෙ චපාඃ" යනාදීන් ධකාරයට තකාරය වේ. එවිට "භන්ත්ස්‍යති" යි වේ. සෙස්ස ද මේ නයින් දතයුතු.)

8. මන්‍ථ විලොඩනෙ, අකාරානුබන්‍ධ "මන්ථ" ධාතුව කැලඹීමෙහි වේ. මථ්නාති, (මථ්නීයාත්, මථ්නාතු, අමථ්නාත් යනු ලඞාදි සතරෙහි) ප්‍රථම පුරුෂෙක වචන යි. සෙසු ලකාර සයෙහි භ්වාදි පරස්මෛපදී 'මන්ථ' ධාතුව වරනැගූ ලෙස ම වරනැගිය යුතු යි.)

**10. අශ භොජනෙ, අශනාති, අශ්නියාත්, අශනාතු- අශ්නිතාත් අශ්නිතාම් අශනන්තු. අශාන, ආශ, අශිතා, ආශීත්.**

**ඉති ක්‍ර්‍යාදිජු පරස්මෛපදි ප්‍රක්‍රියා.**

———o———

**a. අථාත්මනෙපදිනඃ:-**

**1. වෘඞ් සම්භක්තෞ. වෘණීතෙ, වෘණීත, වෘණීතාම්, අවෘණීත, වව්‍රෙ, වරිෂීෂ්ට- වරීෂීෂ්ට.**

---

9. කුෂ් නිෂ්කර්ෂෙ, "කුෂ්" ධාතුව නිකුත් කිරීමෙහි වේ. (**"අන්තර්ගතස්‍ය බහිර්නිෂ්කාසනං නිෂ්කර්ෂඃ"** යි ඇතුළත වූවක් පිටත ප්‍රකට කිරීම **නිෂ්කර්ෂ** නමැයි සුබොධිනී ටීකාවෙහි කීහ.) කුෂ්ණාති යනු ලට් ප්‍ර: එක වචන යි. (කුෂ්ණීයාත්, කුෂ්ණාතු, අකුෂ්ණාත් යනු සෙසු තුනෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.) කුෂාණ යනු ලොට් ම: එක වචන යි. චුකොෂ, කුෂ්‍යාත් යනු ලිට්- ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. කොෂිතා, (කොෂිෂ්‍යති, අකොෂිෂ්‍යත්,) අකොෂීත් යනු ලුට් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.

10. අශ භොජනෙ, අකාරානුබන්ධ "අශ්" ධාතුව අනුභව කිරීමෙහි වේ. අශනාති, අශ්නීයාත් යනු ලට්- විධි ලිඞ් ප්‍ර: එක වචන යි. අශනාතු- අශ්නීතාත්, අශ්නීතාම්, අශනන්තු යනු ලොට් ප්‍රථම පුරුෂ යි. අශාන යනු ම: එක වචන යි. (ආශනාත් යනු ලඞ්හි ද,) ආශ- අශිතා යනු ලිට්- ලුට් දෙක්හි ද; (අශ්‍යාත්, අශිෂ්‍යති, ආශිෂ්‍යත් යනු ආශීර් ලිඞ්- ලෘට්- ලෘඞ් තුනෙහි ද,) ආශීත් යනු ලුඞ්හි ද ප්‍රථම පුරුෂෛක වචන යි.

ක්‍ර්‍යාදිෂු පරස්මෛපදි ප්‍රක්‍රියා, ක්‍ර්‍යාදි ගණයෙහි පරස්මෛපදී ප්‍රක්‍රියාව; ඉති, මෙසේ යි.

———o———

a. අථ, ඉක්බිති; ආත්මනෙපදිනඃ, ආත්මනෙපදි ධාතුහු (දක්වනු ලැබෙත්:-)

1. වෘඞ් සම්භක්තෞ, ඞකාරානුබන්ධ "වෘ" ධාතුව සෙවනය කිරීමෙහි වේ. (**"සම්භක්තිර් භජනම්"** යනු සුබොධිනී ටීකා යි.) වෘණීතෙ -පෙ- අවෘණීත යනු ලඞාදි සතරෙහි ප්‍රථම පුරුෂෛක වචන යි. වව්‍රෙ යනු ලිට් ප්‍ර: එක වචන යි. වරිෂීෂ්ට- වරීෂීෂ්ට යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි.

a. "සංයොගාදිසෘදන්තවෘඩ්වෘඤාං සිස්‍යොරාත්මනෙපදෙ ඉඩ් වා වාච්‍යඃ." වෘෂිෂ්ට. "උඃ" අවරිෂ්ට- අවරීෂ්ට- අවෘත ඉත්‍යාදි.

ඉති ක්‍ර්‍යාදිෂ්වාත්මනෙපදි ප්‍රක්‍රියා.

## ඉති නාවිකරණාඃ ක්‍ර්‍යාදයඃ.

b. අථ චුරාදයඃ:-

**1. චුර ස්තෙයෙ.**

## 175. චුරාදෙඃ. (චුරාදෙඃ 5-1.)

---

a. "සංයොගාදි සෘදන්තවෘඩ්වෘඤාං සිස්‍යොරාත්මනෙපදෙ ඉඩ් වා වාච්‍යඃ*" යි කී හෙයින් සි – සී දෙක සම්බන්ධ ඉඩාගමය විකල්පයෙන් වේ. වෘෂිෂ්ට යනු ඉඩාගම නුවූ පක්‍ෂයෙහි ප්‍ර: එක වචන යි. "උඃ" යන සූත්‍රයෙන් අනිට් පක්‍ෂයෙහි ගුණ ප්‍රතිෂෙධ වේ. (වරිතා- වරීතා, වරිෂ්‍යතෙ- වරීෂ්‍යතෙ, අවරිෂ්‍යත- අවරීෂ්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි.) අවරිෂ්ට- අවරීෂ්ට- අවෘත යනු ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. ඉති ආදි, යනාදිය වේ.

ඉති- ප්‍රක්‍රියා, ක්‍ර්‍යාදි ගණයෙහි ආත්මනෙපදි ප්‍රක්‍රියාව මෙතෙකින් නිමියා ය.

නාවිකරණාඃ, "නා" යන්න විකරණ කොට ඇති; ක්‍ර්‍යාදයඃ, ක්‍ර්‍යාදි ධාතූහු; ඉති, මෙසේ යි.

## ක්‍ර්‍යාදි ගණය සමාප්ත යි.

b. අථ, ක්‍ර්‍යාදි ගණයට අනතුරු ව; චුරාදයඃ, චුරාදි ධාතූහු (දක්වනු ලැබෙත්:-)

1. චුර ස්තෙයෙ, අකාරානුබන්ධ "චුර්" ධාතුව සොරකම්හි වේ.

175. ණිච් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ණිර්ඹිත් කරණෙ" යි 'ණිඃ' යනු ද- "ධාතොඃ ප්‍රෙරණෙ" යි 'ධාතොඃ' යනු ද අනුවෘත්ත යි. චුරාදෙඃ ධාතොඃ, චුරාදි ධාතූහු කෙරෙන්; ණිඃ, ණි ප්‍රත්‍යය වේ.

---

* මේ වාක්‍යය භ්වාදි උභයපදී ප්‍රක්‍රියාවෙහි ද දක්වූහ. එබැවින් මෙහි අර්ථ සඳහා 86 පිට බලනු.

**b. චුරාදෙර්ණිච් ස්වාර්ථෙ ණිප්‍රත්‍යයො භවති.**

**c. උපධායා ගුණඃ. "ස ධාතුඃ." අප්ගුණායඃ. චොරයති, චොරයෙත්, චොරයතු, අචොරයත්. චොරයාඤ්චකාර- චොරයාම්බභූව- චොරයාමාස- චොරයාඤ්චක්‍රෙ,"ණෙඃ" චොර්‍ය්‍යාත්, චොරයිතා, චොරයිෂ්‍යති, අචොරයිෂ්‍යත්. "ණෙරඩ් ද්විශ්ච" "අඩි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" "ලඝොර්දීර්ඝඃ" අචූචුරත්.**

---

b. චුරාදෙඃ ගණාත්, චුරාදි ගණයා කෙරෙන් පර ව; ස්වාර්ථෙ, ස්වාර්ථයෙහි; ණිච් ප්‍රත්‍යයඃ භවති, ණිච් ප්‍රත්‍යය වේ.

(මෙයින් චුරාදි ගණයෙන් පර ව ණිච් ප්‍රත්‍යය විහිත ය. "ධාතොඃ ප්‍රෙරණෙ" යි චුරාදිය කෙරෙන් ද ණිච් ප්‍රත්‍යය කළ හැකි නමුත් "චුරාදෙඃ" යි වෙන ම සූත්‍රයක් හදුරණ ලද්දේ ස්වාර්ථයෙහි වීම පිණිස ය. මෙය අබාදි විකරණයන් මෙන් ලඩාදි සතරෙහි පමණක් නො ව දශ ලකාරයෙහි ම වේ. නැවත ඒ ණිච් ප්‍රත්‍යයාන්තය "ස ධාතුඃ" යි ධාතුවක් මෙන් වීමෙන් ඉන් පර ව ලඩාදි සතරෙහි අප් විකරණය ද වේ. මෙහි ඤකාරය ඉත් බැවින් "ඤිත් ස්වරිතෙත උභෙ" යි කී පරිදි පරස්මෛපද- ආත්මනෙපද දෙකම වේ. එහෙයින් චුරාදීහු උභයපදීහු ය.)

උපධායාඃ, උපධා සංඥයට; ගුණඃ, ("උපධායා ලඝොඃ" යි) ගුණ වේ. "ස ධාතුඃ" යන සූත්‍රයෙන් ණිච් ප්‍රත්‍යයාන්තය ධාතු සංඥ වේ. අප්ගුණායඃ "අප් කර්තරි" යි අප් විකරණය ද, "ගුණඃ" යි ණිච් ප්‍රත්‍යයාගේ ඉකාරයට ගුණ ද; "එ අය්" යි එකාරයට අයාදෙශය ද යන මොහු වෙත්. චොරයති -පෙ- අචොරයත් යනු ලඩාදි සතරෙහි පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. (ආත්මනෙපදයෙහි චොරයතෙ, චොරයෙත, චොරයතාම්, අචොරයත යනු වේ.) චොරයාඤ්චකාර,- චොරයාම්බභූව- චොරයාමාස යනු ලිට් පඃ ප්‍රඃ එක වචන යි. චොරයාඤ්චක්‍රෙ යනු ආඃ ප්‍රඃ එක වචන යි."ණෙඃ" යන සූත්‍රයෙන් ඉඩාගම රහිත අනබ් විෂයෙහි ණිච් ප්‍රත්‍යයට ලොප් වේ. චොර්‍ය්‍යාත්, චොරයිතා චොරයිෂ්‍යති, අචොරයිෂ්‍යත් යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් පඃ ප්‍රඃ එක වචන යි. (ආත්මනෙපදයෙහි චොරයිෂීෂ්ට, චොරයිතා, චොරයිෂ්‍යතෙ, අචොරයිෂ්‍යත යනු වේ.) "ණෙරඩ් ද්විශ්ච" යන සූත්‍රයෙන් ණිච් ප්‍රත්‍යයාන්තයා කෙරෙන් පර ව අඩ් ප්‍රත්‍යය හා ධාතුහට ද්විරුක්ති ද වේ. (සි ප්‍රත්‍යය වළකී.) "අඩි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" යන සූත්‍රයෙන් උපධාසංඥ ඔකාරයට හ්‍රස්ව වේ. "ලඝොර්දීර්ඝඃ" යන සූත්‍රයෙන් පූර්වාවයවයේ ලඝුවට දීර්ඝ වේ. අචූචුරත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. (අචූචුරතාම්, අචූචුරන්යනු ද්වි-

**2. චිතී සංඥානෙ, චෙතයති, අචිචිතත්.**

**3. චිති ස්මෘත්‍යාම්. "ඉදිතො නුම්" චින්තයති, ලඝොර භාවා නන දීඝඃ. අචිචින්තත්.**

**a. චුරාදෙර්ණිජ්වේති කෙචිත්. චින්තති.**

**4. පීඩ අවගාහනෙ. පීඩයති.**

**b. භ්‍රාජභාසභාෂදීපජීවමීලපීඩාං වොපධායා හ්‍රස්වො 'ඬපරෙ ණෞ. අපිපීඩත්- අපීපිඩත්.**

---

බහු වචන යි. ආත්මනෙපදයෙහි ද අචූචුරත යනාදීන් වරනැගේ. ණිච් ප්‍රත්‍යය ව "චොරි" යි සිටි කල්හි අඩ් ප්‍රත්‍යය හා' ද්විරුක්ති ද වී "චො + චොරි + අඩ් + දිප්" යි වේ. ඉත් අකුරුවලට ද "ණෞඃ" යි ණිච් ප්‍රත්‍යයට ද ලොප් ව පූර්ව රූපයේ ඔකාරයට "හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් ද, ධාතුහුගේ උපධා සංඥ ඔකාරයට "අඩි ලඝෞ ණෞ හ්‍රස්ව උපධායාඃ" යන සූත්‍රයෙන් ද හ්‍රස්ව කළ කල්හි "චුචුරත්" යි වේ. "ලඝොර්දීඝඃ" යි දීඝී ව "දිබාදෘවට්" යි අඩාගම වීමෙන් "අචූචුරත්" යි සිද්ධ යි.)

2. චිතී සංඥානෙ, ඊකාරානුබන්ධ "චිත්" ධාතුව දැනීමෙහි හෙවත් සිතීමෙහි වේ. චෙතයති, (චෙතයෙත්, චෙතයතු, අචෙතයත්, චෙතයාඤ්චකාර, චෙත්‍යාත්, චෙතයිතා, චෙතයිෂ්‍යති, අචෙතයිෂ්‍යත්,) අචීචිතත් යනු පිළිවෙළින් පරස්මෛපද ප්‍රථම පුරුෂෙක වචන රූපයෝ යි. (ආත්මනෙපදයෙහි ද මේ අනුව දත යුතු.)

3. චිති ස්මෘත්‍යාම්, ඉකාරානුබන්ධ "චිත්" ධාතුව සිහි කිරීමෙහි වේ. "ඉදිතො නුම්" යන සූත්‍රයෙන් නුමාගම වේ. චින්තයති යනු ලට් පː ප්‍රː එක වචන යි. ලඝොඃ අභාවාත්, ලඝුවක් පර ව නැති හෙයින්; න දීඝඃ, දීඝී නො වේ. (නුමාගම වූ කල්හී ධාතුහුගේ ඉකාරය සංයොගාදි භාවයෙන් ගුරු වේ. එබැවින් "ලඝොර් දීඝඃ" යි දීඝී නො වේ. අචිචින්තත් යනු ලුඞ් පː ප්‍රː එක වචන යි. (සෙස්ස සුගම යි.)

a. චුරාදෙඃ, චුරාදි ගණයා කෙරෙන්; ණිජ්ඃ, ණිච් ප්‍රත්‍යය; වා ඉති, විකල්පයෙන් වේ යයි; කෙචිත්, සමහරු කියත්. ඒ මතය ලෙස චින්තති, (චින්තෙත්, චින්තතු, අචින්තත්) යනාදිය වේ.

4. පීඩ අවගාහනෙ, අකාරානුබන්ධ "පීඩ්" ධාතුව බැස ගැනීමෙහි වේ. පීඩයති යනු ලට් පː ප්‍රː එක වචන යි. (උපධාව ලඝු නොවන හෙයින් ධාතුහට ගුණ නො වේ.)

5. ප්‍රථ ප්‍රඛ්‍යානෙ. ප්‍රථයති.*

c. ස්මෘදෘත්වරප්‍රථම්‍රදස්තෘස්පෘශාං පූර්වස්‍යාතො 'දඞිපරෙ ණ්‍යෙ. ඉත්වාපවාදඃ. අපප්‍රථත්.

6. පෘථ ප්‍රක්ෂෙපෙ.

---

b. අඞිපරෙ, අඞ් ප්‍රත්‍යය පර කොට ඇති; ණ්‍යෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; භ්‍රාජ- භාස- භාෂ- දීප- ජීව- මීල- පීඩාම්, භ්‍රාජෘ දීප්තෞ- භාසෘ දීප්තෞ- භාෂ ව්‍යක්තායාං වාචි- දීපී දීප්තෞ- ජීව ප්‍රාණ ධාරණෙ- මීල නිමීලනෙ- පීඩ අවගාහනෙ යන ධාතූන්ගේ; උපධායාඃ, උපධා සංඥයට; වා, හ්‍රස්වඃ, විකල්පයෙන් හ්‍රස්ව වේ. ("අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" යි විහිත හ්‍රස්ව කාර්‍ය්‍යය මෙයින් විකල්ප කෙරේ.) අපීපිඩත් යනු හ්‍රස්ව වූ පක්‍ෂයෙහි ද, අපිපීඩත් යනු හ්‍රස්ව නුවූ පක්‍ෂයෙහි ද ලුඞ් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. (උපධාවට හ්‍රස්ව වූ කල්හි "හ්‍රස්වඃ" යි හ්‍රස්ව ව පැවති පූර්ව රූපයට "ලඝොර්දීර්ඝඃ" යි දීර්ඝ වේ. ආත්මනෙපදයෙහි ද අපීපිඩත- අපිපීඩත යනාදීන් වර නැගිය යුතු. සෙස්ස සුගම යි.)

5. ප්‍රථ ප්‍රඛ්‍යානෙ, අකාරානුබන්ධ "ප්‍රථ්" ධාතුව ප්‍රකාශ කිරීමෙහි වේ. ප්‍රථයති යනු ලට් ප: ප්‍ර: එක වචන යි.

c. අඞ් පරෙ, අඞ් ප්‍රත්‍යය පර කොට ඇති; ණ්‍යෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; ස්මෘදෘත්වරප්‍රථම්‍රදස්තෘස්පෘශාම්, ස්මෘ චින්තායාම්- දෘ භයෙ- ඤිත්වරා සම්භ්‍රමෙ- ප්‍රථ ප්‍රඛ්‍යානෙ- ම්‍රද මර්දනෙ- ස්තෘඤ් ආච්ඡාදනෙ- ස්පෘශ් බාධනග්‍රන්ථනයොඃ යන ධාතූන්ගේ; පූර්වස්‍ය අතඃ, පූර්ව රූපයේ අකාරයට; අත්, අකාරයෙක් වේ. ඉත්වාපවාදඃ, ඉකාර භාවය වැළැක්වීම යි. (අකාරයට නැවත අකාරයක් කිරීම "අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" යි වන ඉකාරාදෙශය වළක්වනු පිණිස ය යනු භාව යි.) අපප්‍රථත්, (අපප්‍රථතාම්, අපප්‍රථන්) යනු ලුඞ් විභක්ති යි.

6. පෘථ ප්‍රක්ෂෙපෙ, අකාරානුබන්ධ "පෘථ්" ධාතුව බහාලීමෙහි වේ. (පර්ථයති, පර්ථයෙත්, පර්ථයතු, අපර්ථයත්, පර්ථයාඤ්චකාර, පර්ථ්‍යාත්, පර්ථයිතා, පර්ථයිෂ්‍යති, අපර්ථයිෂ්‍යත් යනාදි වශයෙන් ලඞාදි නවයෙහි වර නැගේ.)

---

* ප්‍රාථයති- සිද්ධාන්ත චන්ද්‍රිකා. මේ ධාතුව මිත් නො වන හෙයින් හ්‍රස්ව නො වේ යයි සුබොධිනියෙහි කීහ. ඝඨාදිය නම් ප්‍රේරණාර්ථයෙහි ණි ප්‍රත්‍යය වූ කල්හි මිත් බැවින් හ්‍රස්ව ව 'ප්‍රථයති' කියා වේ. අදන්ත චුරාදි නම් ණි ප්‍රත්‍යය ව වෘද්ධි නො වීමෙන් එසේ ම වේ. හලන්ත නම් වෘද්ධි වීමෙන් 'ප්‍රාථයති' කියා විය හැකි යි.

**a. උපධායා ඍවර්ණස්‍යාඞි ඍ වා වක්තව්‍යඃ. ඉරරාරමපවාදඃ. අපිපෘථත්– අපපර්ථත්.**

**7. ඥප ඥාන- ඥාපනයොර්මිත්.**

**176. මිතාං හ්‍රස්වඃ.** (මිතාම් 6-3. හ්‍රස්වඃ 1-1.)

**b. මිතාං ධාතූනා මුපධායා හ්‍රස්වො භවති ණෞ පරෙ. ඥපයති.**

**8. චිඤ් චයනෙ, මිත්. චිස්ඵුරෝර්ණාවාත්වං වා.**

---

a. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; උපධායාඃ ඍවර්ණස්‍ය, උපධා සංඥ වූ ඍවර්ණයට; වා, විකල්පයෙන්; ඍ වක්තව්‍යඃ, ඍකාරාදෙශය කිය යුතු යි. ඉරරාරමපවාදඃ, ඉර්– අර්– ආර් යන මොවුන්ගේ වැළැක්ම වේ. ("ඍෘත ඉර්" යි වන 'ඉර්' ආදෙශය ද– ගුණයෙන් වන 'අර්' ආදෙශය ද– වෘද්ධියෙන් වන 'ආර්' ආදෙශය ද මෙයින් වළකී.) අපිපෘථත්– යනු ඍකාරාදෙශ වූ පක්‍ෂයෙහි ද, අපපර්ථත් යනු නුවූ පක්‍ෂයෙහි ද ලුඞ් පː ප්‍රː එක වචන යි.

7. ඥප ඥාන-ඥාපනයොඃ, "ඥප්" ධාතුව දැනීම– දැන්වීම යන අර්ථ දෙක්හි වේ. මිත්, මිත් සංඥ වේ. (අනන්තර සූත්‍රයෙන් හ්‍රස්ව වීම එහි ප්‍රයෝජන යි.)

176. හ්‍රස්ව විධි සූත්‍ර යි. "අත උපධායාඃ" යි 'උපධායාඃ' යනු ද– "රුතො ණෞ පුක්" යි 'ණෞ' යනු ද අනුවෘත්ත යි. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; මිතාම්, මිත් සංඥ ධාතූන්ගේ; උපධායාඃ, උපධා සංඥයට; හ්‍රස්වඃ, හ්‍රස්ව වේ.

b. ණෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; මිතාං ධාතූනාම්, මිත් සංඥ ධාතූන්ගේ; උපධායාඃ, උපධාවට; හ්‍රස්වඃ භවති, හ්‍රස්ව වේ. (මෙහි මිත් සංඥ ධාතු නම් ධාතු පාඨයෙහි "මිත්" යයි හඳුරණ ලද ඝටාදි ධාතුහු ය.) ඥපයති යනු ලට් පː ප්‍රː එක වචන යි. (ඥපයෙත්, ඥපයතු, අඥපයත්, ඥපයාඤ්චකාර, ඥප්‍යාත්, ඥපයිතා, ඥපයිෂ්‍යති, අඥපයිෂ්‍යත්, අජිඥපත් යනාදි වශයෙන් සෙසු නව ලකාරයෙහි වර නැගේ.)

8. චිඤ් චයනෙ, ඤකාරානුබන්ධ "චි" ධාතුව රැස් කිරීමෙහි වේ. මිත්, මිත් සංඥ වේ. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; චිස්ඵුරොඃ, චි– ස්ඵුර් ධාතු දෙකට; වා, විකල්පයෙන්; ආත්වම්, ආකාර බව වේ. (මෙයින් චි ධාතුවට ආකාරාදෙශ කළ කල්හි "චා + ණි" යි සිටී.)

**177. රාතො ඤෞ පුක්.** (රාතඃ 6-1. ඤෞ 7-1. පුක් 1-1.)

**a. ඍගතාවිත්‍යස්‍යාකාරස්‍ය ච පුගාගමො භවති ඤෞ පරෙ. චපයති– වයයති.**

**9. අර්ච පූජායාම්. අර්චයති. "ස්වරාදෙඃ පරඃ" "නදරාඃ සංයොගාදයො න ද්විඃ" ඉති රෙඵස්‍ය න ද්විත්වම්. ආර්චිචත්.**

**10. කෘතත * සංශබ්දෙ.**

---

177. පුගාගම විධි සූත්‍ර යි. ඤෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; රාතඃ, ඍ ධාතුව හා ආකාරාන්ත ධාතු සම්බන්ධ ව; පුක්, පුගාගම වේ.

a. ඤෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; ඍ ගතෞ ඉති අස්‍ය, 'ඍ ගතෞ' යන මේ ධාතුහු සම්බන්ධ ව ද; ආකාරස්‍ය ච,; ආකාරාන්ත ධාතුහු සම්බන්ධ ව ද; පුගාගමඃ භවති, 'පුක්' ආගම වේ. (මෙහි උ යන්න උච්චාරණය පිණිස ය. කයන්න ස්ථාන නියමය පිණිස ය. එහෙයින් ඍ ධාතුවේ හා ආකාරාන්ත ධාතූන්ගේ අන්තයෙහි "ප්" යනු ආගම වේ. "වාප් + ණි" යි වේ. ඉත් වූ ණයන්න ලොප් වීමෙන් "වාපි" යි සිටි කල්හි ඊට "ස ධාතුඃ" යි ධාතු සංඥා ද "මිතාං හ්‍රස්වඃ" යි හ්‍රස්ව ද කොට තිප් ප්‍රත්‍යය හා අප් විකරණය ද යොදා ගුණ කිරීමෙන් "චපයති" යි වේ.) චපයති යනු ලට් ප: ප්‍ර: එක වචන යි. (ධාත්වන්තයට ආකාරාදෙශ නුවූ පක්‍ෂයෙහි) වයයති යනු ද වේ. (ලුඞ් පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනයෙහි අවීවයත් යනු වේ. විකල්පයෙන් ආත්වය වන හෙයින් සියලු ලකාරයන්හි රූප ද්වය බැගින් සිටී.)

9. අර්ච පූජායාම්, අකාරානුබන්ධ "අර්ච්" ධාතුව පිදීමෙහි වේ. අර්චයති, (අර්චයෙත්, අර්චයතු, ආර්චයත්, අර්චයාඤ්චකාර, අර්චීචත්, අර්චයිතා, අර්චයිෂ්‍යති, ආර්චයිෂ්‍යත් යනු ලඩාදි නවයෙහි) ප: ප්‍ර: එක වචන යි. "ස්වරාදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පර අවයවය ද්විරුක්ත වේ. නදරාඃ— න ද්විඃ ඉති, "නදරාඃ සංයොගාදයො න ද්විඃ" යි කී හෙයින්; රෙඵස්‍ය, රෙඵයට; න ද්විත්වම්, ද්විත්ව නො වේ. (එහෙයින් පූර්වෝක්ත සූත්‍රයෙන් චකාරය ද්විරුක්ත වේ. "දිබාදාවට්–ස්වරාදෙඃ" යන සූත්‍ර ද්වයෙන් අඩාගම ද්වය වේ.) ආර්චිචත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි

10. කෘතත සංශබ්දෙ, අකාරානුබන්ධ "කෘතත්" ධාතුව මහා ශබ්දයෙහි (=කීර්තනයෙහි) වේ.

---

* කෘත– පොත්හි. සඳෙසි, සිද්ධාන්ත කෞමුදී 401 සහ සි: ච: 106 පිට බලනු.

**a. ධාතොරුපධායා ඍකාරස්‍ය ඉරාදෙශො වාච්‍යො ණිප්‍රත්‍යයෙ පරෙ. කීර්තයති- අචිකීර්තත්.**

**11. ගණ සඞ්ඛ්‍යානෙ. අකාරාන්තඃ. අල්ලොපස්‍ය ස්ථානිවත්ත්වාන්න වෘද්ධිඃ. ගණයති.**

**b. අල්ලොපිනො නාඞ්කාර්‍යම්. අජගණත්. කථගණයොරඞ්කාර්‍යඤ්චෙති කෙචිත්. අජීගණත්.**

**12. කථ වාක්‍යප්‍රබන්ධෙ. කථයති, අචකථත්- අචීකථත්.**

---

a. ණි ප්‍රත්‍යයෙ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; ධාතොඃ, ධාතුහුගේ; උපධායාඃ ඍකාරස්‍ය, උපධා සංඥ වූ ඍකාරයට; ඉරාදෙශඃ වාච්‍යඃ, 'ඉර්' ආදෙශය කිය යුතු යි. ("ඍත ඉර්" යන සූත්‍රයෙන් ඉරාදෙශය නො වන හෙයින් ද "ඍකාරියති" යනාදි තන්හි ඉරාදෙශය නො වීම පිණිස ද මෙසේ හදරණ ලදී. "යොවාර්වි හසෙ" යි දීර්ඝ ද වේ.) කීර්තයති, (කීර්තයෙත්, කීර්තයතු, අකීර්තයත්, කීර්තයාඤ්චකාර, කීර්ත්‍යාත්, කීර්තයිතා, කීර්තයිෂ්‍යති, අකීර්තයිෂ්‍යත්,) අචිකීර්තත් යනු පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. ("උපධායා ඍවර්ණස්‍යාඞි ඍ වා වක්තව්‍යඃ" යි කී හෙයින් විකල්පයෙන් ඍකාරාදෙශ වීමෙන් අචීකෘතත්, අචීකෘතතාම්, අචීකෘතන් යනාදි වශයෙන් ද ලුඞ් ලකාරයෙහි වර නැගේ.)

11. ගණ සඞ්ඛ්‍යානෙ, "ගණ" ධාතුව ගිණීමෙහි වේ. අකාරාන්තඃ, (මේ ධාතුව) අකාරාන්ත වේ. අත් ලොපස්‍ය, අකාර ලොපය තමා; ස්ථානිවත්ත්වාත්, ස්ථානිවත් බැවින්; න වෘද්ධිඃ, "අත උපධායාඃ" යි වෘද්ධි නොවේ. (ධාතු ප්‍රකෘතියේ උපධාව අකාරය නො වන හෙයිනි. ගණ ධාතුවෙන් පර ව ණි ප්‍රත්‍යය වූ පසු "යතඃ" යි ධාත්වන්ත අකාරයට ලොප් වේ.) ගණයති යනු ලට් ප: ප්‍ර: එක වචන යි.

b. අත් ලොපිනඃ, අකාරලොපය ඇත්තහු සම්බන්ධ ව; න අඞ් කාර්‍යම්, අඞ් කාර්‍යය හෙවත් අඞ් ප්‍රත්‍යය නිමිති කොට ඇති කාර්‍යය නො වේ. ("අඞි ලඝොඃ හ්‍රස්ව උපධායාඃ- ලඝොර්දීර්ඝඃ" යන සූත්‍ර දෙකින් විහිත කාර්‍ය ද්වය මෙයින් වළකී.) අජගණත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. කථගණයොඃ, කථ- ගණ ධාතු දෙක සම්බන්ධ ව; අඞ් කාර්‍යං ච ඉති, අඞ් කාර්‍යය ද වේ යයි; කෙචිත්, සමහරු කියත්. අජීගණත් යනු තන්මතයෙහි ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

12. කථ වාක්‍ය ප්‍රබන්ධෙ, "කථ" ධාතුව වාක්‍ය පරම්පරායෙහි වේ. (මෙ ද අකාරාන්ත ය.) කථයති, (කථයෙත්, කථයතු, අකථ

**13. ඌන පරිහාණෙ. ඌනයති-ඖනනත්.**

**a. ඤිනිමිත්තසවරදෙශො ද්විතෙව කර්තව්‍ය ස්ථානිවත්. "සවරදෙඃ පරඃ."**

**14. අර්ථි යාචනෙ, අර්ථයතෙ-ආර්ත්ථත.**

**15. සඞ්ග්‍රාමඞ් යුද්ධෙ, අසසඞ්ග්‍රාමත.**

---

යත්, කථයාඤ්චකාර, කථ්‍යාත්, කථයිතා, කථයිෂ්‍යති, අකථයිෂ්‍යත්,) අචකථත්- අචීකථත් යනු පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. (විකල්පයෙන් අඞ් ක්‍රායයිය ද වන හෙයින් ලුඞ් ලකාරයෙහි රූප ද්වය බැගිනි.)

13. ඌන පරිහාණෙ, අකාරාන්ත "ඌන" ධාතුව පිරිහීමෙහි වේ. ඌනයති, (ඌනයෙත්, ඌනයතු, ඖනයත්, ඌනයාඤ්චකාර, ඌන්‍යාත්, ඌනයිතා, ඌනයිෂ්‍යති, ඖනයිෂ්‍යත්,) ඖනනත් යනු ප: ප්‍රථම පුරුෂෛක වචන යි.

a. ඤි නිමිත්තසවරදෙශඃ, ඤි ප්‍රත්‍යය නිමිති කොට ඇති සවරදෙශය; ද්විතෙව කර්තව්‍ය, ද්විත්ව කටයුතු කල්හි; ස්ථානිවත්, ස්ථානීන් මෙනි. (ඤි ප්‍රත්‍යය පර කල්හි ධාත්වන්ත අකාරය "යතඃ" යි ලොප් වන නමුත් ද්විත්ව කළ යුතු කල්හි එය ලොප් නුවූ ලෙස ම හෙවත් පෙර පැවති ලෙස ම සැලකිය යුතු බව මෙයින් දැක්වූහ.) "සවරදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පරාවයව වූ (අකාරයෙන් යුත්) නකාරයට ද්විත්ව වේ. (ඖනනත් යනු වේ.)

14. අර්ථි යාචනෙ, ඉකාරානුබන්ධ "අර්ථ" ධාතුව යැදීමෙහි වේ. අර්ථයතෙ, (අර්ථයෙත, අර්ථයතාම්, ආර්ථයත, අර්ථයාඤ්චක්‍රෙ, අර්ථයිෂීෂ්ට, අර්ථයිතා, අර්ථයිෂ්‍යතෙ, ආර්ථයිෂ්‍යත,) ආර්ත්ථත යනු ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යි. ("සවරදෙඃ පරඃ" යි ථකාරයට ද්විරුක්ති වූ කල්හි "ඣපානාං ජබචපාඃ" යි සූත් ථකාරයට තකාරය ව "ආර්ත්ථත" යි වේ.)

15. සඞ්ග්‍රාමඞ් යුද්ධෙ, ඞකාරානුබන්ධ "සඞ්ග්‍රාම" ධාතුව යුද්ධ කිරීමෙහි වේ. (සඞ්ග්‍රාමයතෙ, සඞ්ග්‍රාමයෙත සඞ්ග්‍රාමයතාම්, අසඞ්ග්‍රාමයත, සඞ්ග්‍රාමයාඤ්චක්‍රෙ, සඞ්ග්‍රාමයිෂීෂ්ට, සඞ්ග්‍රාමයිතා, සඞ්ග්‍රාමයිෂ්‍යතෙ, අසඞ්ග්‍රාමයිෂ්‍යත,) අසසඞ්ග්‍රාමත යනු ආ: ප්‍ර: එක වචන යි. (මොහු ඤි ප්‍රත්‍යය බලයෙන් උභයපදීහු නො වෙත්.)

**16. අඞ්ඝ දෘෂ්ට්‍යුපඝාතෙ, ආඤ්ජඝත්.**

**17-18. අඞ්ක- අඞ්ග පදෙ ලක්ෂණෙ ච. ආඤ්චකත්.**

---

## ඉති චුරාදි ප්‍රක්‍රියා.

---

a. **අථ ණ්‍යන්තාඃ:-**

**178. ධාතොඃ ප්‍රේරණෙ.** (ධාතොඃ 5-1. ප්‍රේරණෙ 7-1.)

---

16. අඞ්ඝ දෘෂ්ටි + උපඝාතෙ, "අඞ්ඝ" ධාතුව දැක්ම නැසීමෙහි වේ. (අඞ්ඝයති, අඞ්ඝයෙත්, අඞ්ඝයතු, ආඞ්ඝයත්, අඞ්ඝයාඤ්චකාර, අඞ්ඝ්‍යාත්, අඞ්ඝිතා, අඞ්ඝිෂ්‍යති, ආඞ්ඝිෂ්‍යත්,) ආඤ්ජඝත් යනු ප: ප්‍ර: එක වචන සි.

17-18. අඞ්ක- අඞ්ග පදෙ ලක්ෂණෙ ච, "අඞ්ක- අඞ්ග" ධාතු ද්වය පා තැබීමෙහි ද, ලකුණු කිරීමෙහි ද වේ. ("අඞ්කයති, අඞ්කයෙත්, අඞ්කයතු, ආඞ්කයත්, අඞ්කයාඤ්චකාර, අඞ්ක්‍යාත්, අඞ්කිතා, අඞ්කිෂ්‍යති, ආඞ්කිෂ්‍යත්,) ආඤ්චකත්" යනු අඞ්ක ධාතුහුගේ ප: ප්‍ර: එක වචන සි. ("අඞ්ගයති, අඞ්ගයෙත්, අඞ්ගයතු, ආඞ්ගයත්, අඞ්ගයාඤ්චකාර, අඞ්ග්‍යාත්, අඞ්ගිතා, අඞ්ගිෂ්‍යති, ආඞ්ගිෂ්‍යත්, ආඤ්ජගත්" යනු අඞ්ග ධාතුහුගේ ප: ප්‍ර: එක වචන සි. ආත්මනෙපදයෙහි ද වරනැගිය යුතු. ආඤ්චකත්- ආඤ්ජගත් යන දෙතැන්හි "ස්වරාදෙඃ පරඃ" සි. කකාර- ගකාර ද්විරුක්ත වූ පසු පූර්ව රූප ක - ග දෙකට "කුහොශ්චුඃ" සි චකාර- ජකාර වේ.)

චුරාදි ප්‍රක්‍රියා, චුරාදි ප්‍රක්‍රියාව; ඉති, මෙසේ සි.

## චුරාදි ප්‍රක්‍රියාව සමාප්ත සි.

---

a. අථ, ඉක්බිති හෙවත් දශ ගණය පිළිබඳ පද සාධන ක්‍රියාවට අනතුරුව; ණ්‍යන්තාඃ, ණ්‍යන්ත ධාතුහු දක්වනු ලැබෙත්. (මෙහි ණ්‍යන්ත ධාතුහු නම් අනන්තර සූත්‍රයෙන් විධාන කරණු ලබන ප්‍රේරණාර්ථයෙහි වූ ණි ප්‍රත්‍යය අන්ත කොට ඇත්තෝ ය.)

178. ණි ප්‍රත්‍යය විධි සූත්‍ර සි. "ණිර්විතකරණෙ" සි 'ණිඃ' යනු අනුවෘත්ත වේ. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ප්‍රේරණෙ, මෙහෙයීම් අර්ථයෙහි; ණිඃ, ණි ප්‍රත්‍යය වේ.

**b. ප්‍රයෝජකව්‍යාපාරේ‘ෙච ධාතෝර් ණිඃ ප්‍රත්‍යයෝ භවති. කුර්වන්තං ප්‍රේරයති යඃ ස ප්‍රයෝජකඃ.**

---

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ප්‍රයොජකව්‍යාපාරෙ අපෙ, ප්‍රයොජක ව්‍යාපාරාර්ථයෙහි; ණිඃ ප්‍රත්‍යයඃ භවති, ණි ප්‍රත්‍යය වේ. යඃ, යමෙක්; කුර්වන්තං, කරන්නහු; ප්‍රේරයති, මෙහෙයා ද; සඃ, හෙතෙමේ; ප්‍රයොජකඃ, ප්‍රයොජක නම්.

(මෙයින් ප්‍රේරණයක් ගම්‍යමාන කල්හි ධාතුන් කෙරෙන් ණි ප්‍රත්‍යය විහිත ය. ප්‍රේරණය නම් ප්‍රයොජක ව්‍යාපාරය යි. යමෙක් ස්වප්‍රධාන ව අනිකෙකු ලවා ක්‍රියාව කරවා නම් හෙතෙමේ ප්‍රයො ජක නම්. ඒ ප්‍රයොජකයාගේ නියොගය හෙවත් මෙහෙයුම ප්‍රයො ජක ව්‍යාපාරය යි. හෙ ද (1) ප්‍රේරණ- (2) අධ්‍යෙෂණ- (3) තත්සමර්ථාචරණ වශයෙන් අනෙක ප්‍රභෙද වේ. (1) තමන්ට හීන වූ දාසාදීන් කෙරෙහි පැවැත්විය යුතු ආඥාව ප්‍රේරණය යි. (2) ආචාර්‍ය්‍යාදි තමහට වැඩි හිටියන් කෙරෙහි පැවැත්විය යුතු ප්‍රාර්ථනය හෙවත් ආරාධනය අධ්‍යෙෂණය යි. (3) තත්සමර්ථාචරණය නම් (1) අනුමිති- (2) උපදෙශ- (3) අනුග්‍රහ- (4) අන්නදානාදි වශයෙන් ඒ ප්‍රයොජක ව්‍යාපාරයට අනුකූල ක්‍රියා කිරීම යි. (1) යමෙක් රජාදි යම්කිසි ප්‍රධානයෙකුගේ අනුදැනීම ඇති කල්හි ම විනා අනුදැනීම නො ලද කල්හි ක්‍රියාව නො කෙරේ ද, අනුමිතිය එහි ප්‍රයොජක ව්‍යාපාරය යි. (2) යමෙක් වෙදෙකුගේ උපදෙශය හෙවත් අවවාදය අනු ව අසත්ප්‍රාය දෙයින් වළකී නම්, සත්ප්‍රාය දේ කෙරේ නම්, එහි උපදෙශය ප්‍රයොජක ව්‍යාපාරය යි. (3) පැන යන්නකු අනුකම්පායෙන් වළක්වා නම් එහි අනුග්‍රහය ප්‍රයොජක ව්‍යාපාරය යි. (4) ප්‍රත්‍යය දුර්ලභත්වයෙන් සොරකම් කරණ සොර තෙමේ ප්‍රත්‍යය ලාභයෙන් ඉන් වැළකේ. එසේ ආහාර පානාදිය දීමෙන් සොර කමින් වළක්වන කල්හි අන්නදානාදිය එහි ප්‍රයොජක ව්‍යාපාරය යි.

තව ද, ලොට් විභක්තිය ද ප්‍රේරණාර්ථයෙහි යෙදෙන හෙයින් ණි ප්‍රත්‍යයාගේ හා ලොට් විභක්තිහුගේ අන්‍යොන්‍ය සදෘශත්වයෙක් ඇත්තේ නුසි ඉදානීං පෘච්ඡතු භවාන් යනාදි ලොට් විභක්ත්‍යන්ත ක්‍රියාවලින් යුත් වාක්‍ය “ප්‍රච්ඡයති” යනාදි වශයෙන් ණි ප්‍රත්‍යයාන්ත ක්‍රියායෙන් ද යෙදිය හැකි ය යි ඇතැමෙකුට සිතිය හැක්ක. එය එසේ නො වේ. හුදෙක් ක්‍රියාව කරන්නහුට පමණක් කරණ මෙහෙයීමක් ඇති කල්හි ලොට් විභක්තිය යොදනු ලැබේ. ක්‍රියා සහිත කර්තෘහට යම් මෙහෙයීමක් වේ නම් එකල්හි ණි ප්‍රත්‍යය යොදනු ලැබේ. කියන ලද මැයි:-

**(1) කාරයති- කාරයතෙ, අචීකරත්. (2) පාචයති- අපීපචත්. (3) භවන්තං ප්‍රේරයති= භාවයති- භාවයතෙ, භාවයාම්බභූව.**

**a. අඩ්සයොඃ පූර්වස්‍යාකාරස්‍යේත්වං පවර්ග යවරල ජකාරෙෂ්වවර්ණපරෙෂු පරතඃ.**

---

**"ද්‍රව්‍යමාත්‍රස්‍ය තු ප්‍රෛෂෙ - ප්‍රච්ඡාදෙර්ලෝඩ් විධියතෙ**
**සක්‍රියස්‍ය යදි ප්‍රෛෂ - ස්තදා ස විෂයො ණිචඃ."**

ද්‍රව්‍ය මාත්‍රයාගේ ප්‍රෙෂණයක් ගම්‍යමාන කල්හි ප්‍රච්ඡාදි ධාතූන් කෙරෙන් ලොට් විභක්තිය කරණු ලැබේ. යම් කලෙක්හි ක්‍රියා සහිත ද්‍රව්‍යයාගේ ප්‍රෙෂණයෙක් වේ ද, එකල්හි එය "ණිච්" ප්‍රත්‍යයට විෂය වේ යනු එහි අර්ථ යි. පාණිනීයයෙහි වූ මේ "ණිච්" ප්‍රත්‍යය මේ ව්‍යාකරණයෙහි "ණි" ප්‍රත්‍යය යි.

**"භික්ෂා වාසයති- කාරීෂොග්නිරධ්‍යාපයති"** යනාදියෙහි භික්ෂාදිය අචෙතන බැවින් ද, ප්‍රෙරණය චෙතන ධර්ම හෙයින් ද හෙවත් සචෙතනකයෙකු විසින් කළ යුත්තක් හෙයින් ද ණි ප්‍රත්‍යය කෙසේ වී ද යත්? එහි දු අනුකූල ක්‍රියා කිරීම ම ප්‍රයොජක ව්‍යාපාරය වශයෙන් සලකනු ලැබේ. ඒ එසේ මැයි. භික්ෂාව සුලභ ව ලැබෙන්නී ම සත්‍වයන්ගේ වාසයට ඉවහල් වේ. නිර්මාත ස්ථානයෙහි දල්වන ලද ගින්න ශීතයෙන් ජනිත අධ්‍යයන විරොධි උපද්‍රවයන් දුරු කෙරෙමින් අධ්‍යයනයට අනුකූල වේ.)

(1) කාරයති- කාරයතෙ යනු ණ්‍යන්ත කෘ ධාතුහුගේ ලට් පරස්මෛපද- ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යි. (කාරයෙත්- කාරයෙත, කාරයතු- කාරයතාම්, අකාරයත්- අකාරයත, කාරයාඤ්චකාර- කාරයාඤ්චක්‍රෙ, කාය්‍යාත්- කාරයිෂීෂ්ට, කාරයිතා- කාරයිතා, කාරයිෂ්‍යති- කාරයිෂ්‍යතෙ, අකාරයිෂ්‍යත්- අකාරයිෂ්‍යත, අචීකරත්- අචීකරත යනු සෙසු නව ලකාරයෙහි ප: ආ: ප්‍ර: එක වචන යි. මෙසේ ණ්‍යන්ත ධාතුහු පරස්මෛපද- ආත්මනෙපද දෙක්හි දශ ලකාරයෙහි ම වර නැගිය යුත්තාහ. පද සිද්ධි චුරාදි ගණයෙහි මෙනි.) (2) පාචයති, "පචන්තං ප්‍රෙරයති"යි කිව මනා තන්හි පාචයති යනු වේ. අපීපචත් යනු එහි ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (3) භවන්තං ප්‍රෙරයති= භාවයති, වන්නහු මෙහෙයයි යන අර්ථයෙහි භාවයති යනු වේ. භාවයතෙ යනු එහි ආ: ප්‍ර: එක වචන යි. භාවයාම්බභූව යනු ලිට් ප: ප්‍ර: එක වචන යි.

a. අවර්ණපරෙෂු, අවර්ණය පර කොට ඇති; පවර්ග යවරල ජකාරෙෂු, පවර්ග- යවරල- ජකාර යන අකුරු; පරතඃ, පර කල්හි; අඩ්සයොඃ, අඩ් ප්‍රත්‍යය-සප්‍රත්‍යය දෙක; (ඉන් පර ව) ඇති කල්හි; පූර්වස්‍ය,

**a. ද්විර්නිමිත්තෙ'චි.***

**b. ද්විත්වනිමිත්තෙ'චි අච ආදෙශො න ද්විත්වෙ කර්තව්‍යෙ. අබීභවත්.**

**(4) මූඞ බන්ධනෙ,† මාවයති- අමීමවත්. (5) යු මිශ්‍රණෙ, අයීයවත්. (6) රු ශබ්දෙ, අරීරවත්. (7) ලූඤ් ඡෙදනෙ, අලීලවත්. (8) ජු ගතෞ, අජීජවත්.**

**c. ස්‍රවති ශෘණොති ද්‍රවති ප්‍රවති ප්ලවති ච්‍යවතීනාං වා. ×**

---

පූර්ව රූපය සම්බන්ධි වූ; උකාරස්‍ය, උකාරයට; ඉත්වම්, ඉකාර බව වේ. (ද්විරුක්ත වූ පසු පූර්ව රූපයෙහි උකාරයට ඉන් පර ව පවර්ග- යවරල- ජකාර හා ඉනුත් පර ව අවර්ණය ද ඇති කල්හි ඉකාරය වන බව මෙයින් කිහ. නැවත ඒ ඉකාරයට "ලඝොර්දීර්ඝඃ" යි දීර්ඝ වේ.)

a. ද්විර්නිමිත්තෙ, ද්විත්වයට නිමිති වූ; අචි, ස්වරයා පර කල්හි (ස්වරාදෙශය නො වේ.)

b. ද්විර්නිමිත්තෙ අචි, ද්විරුක්තියට නිමිති වූ ස්වරයා පර කල්හි; ද්විත්වෙ කර්තව්‍යෙ, ද්විත්වය ද කටයුතු කල්හි; අචඃ ආදෙශඃ න, ස්වරයට කළ යුතු ආදෙශය නො වේ. (ලුඞ් විභක්තියෙහි "ඬෙදර්ඞ් ද්විශ්ච" යි වන ද්විත්වය "ධාතොර්නාමිනඃ" යි වන වෘද්ධි සඞ්ඛ්‍යාත ස්වරාදෙශයට ප්‍රථමයෙන් ම කළ යුතුය යනු මෙහි අදහස යි.) අබීභවත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි.

(4) මූඞ බන්ධනෙ, ඞකාරානුබන්ධ "මූ" ධාතුව බැඳීමෙහි වේ. "මවමානං ප්‍රේරයති" යන විග්‍රහයෙහි මාවයති යනු වේ. (මාවයති, මාවයෙත්, මාවයතු, අමාවයත්, මාවයාඤ්චකාර, මාව්‍යාත්, මාව යිතා, මාවයිෂ්‍යති, අමාවයිෂ්‍යත්,) අමීමවත් යනු පඃ ප්‍රඃ එක වචන යි.

(5) යු මිශ්‍රණෙ "යු" ධාතුව මිශ්‍රණාර්ථයෙහි වේ. අයීයවත්, අයීයවත් යනු ද; (6) රු ශබ්දෙ, 'රු' ධාතුව ශබ්දාර්ථයෙහි වේ. අරීර වත්, අරීරවත් යනු ද, (7) ලූඤ් ඡෙදනෙ, ඤිත් වූ 'ලූ' ධාතුව ඡෙදනාර්ථයෙහි වේ. අලීලවත්, අලීලවත් යනු ද; (8) ජු ගතෞ, 'ජු' ධාතුව ගමනාර්ථයෙහි වේ. අජීජවත්, අජීජවත් යනු ද ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. (සෙස්ස "මූ" ධාතුව මෙනි.)

c. ස්‍රවති— ච්‍යවතීනාම්, ස්‍රු ගතෞ- ශ්‍රු ශ්‍රවණෙ- ද්‍රු- ප්‍රුඞ්- ප්ලුඞ්- ච්‍යුඞ් ගතෞ යන මේ ධාතූන් පිළිබඳ (පූර්ව රූපය සම්බන්ධි උකාරයට ඉකාරය) වා, විකල්පයෙන් වේ.

---

* සාරස්වත සූත්‍රයක් නො වේ. පාණිනීය සූත්‍රය "ද්විර්වචනෙ'චි" යනු යි.
† මුඞ මොහනෙ- පොත්හි.
× මේ පාණිනීය සූත්‍රයෙකි. 7. 4. 81.

**a. අඩ්සයොඃ පූර්වස්‍යොත්වං වා 'වර්ණපරෙ ධාත්වක්ෂරෙ පරෙ. (9) අශිස්‍රවත්-අසුස්‍රවත්, (10) අශිශ්‍රවත්-අශුශ්‍රවත්, (11) අදිද්‍රවත්-අදුද්‍රවත්.**

## 179. හනො ඝත්. (හනඃ 6-1. ඝත් 1-1.)

**b. හනෙනඝ්දෙශො භවති ඤ්ණිති ණබ්වර්ජිතෙ පරතඃ. (12) ඝාතයති- අජීඝනත්, (13) ශදෟ ශාතනෙ.**

---

a. අවර්ණපරෙ, අවර්ණය පර කොට ඇති; ධාත්වක්ෂරෙ පරෙ, ධාත්වක්ෂරය පර කල්හි; අඩ්සයොඃ, අඩ් ප්‍රත්‍යය- ස ප්‍රත්‍යය දෙක ( ඉන් පර ව ) ඇති කල්හි; පූර්වස්‍ය, පූර්ව රූපයේ උකාරයට; වා, විකල්පයෙන්; ඉත්වම්, ඉකාර බව වේ. ("අඩ්සයොඃ" යනාදීන් දක්වන ලද කාර්‍ය්‍යය මෙයින් විකල්ප කෙරේ.) (9) අසිස්‍රවත්- අසුස්‍රවත් යනු ස්‍රු ධාතුහුගේ ද, (10) අශිශ්‍රවත්- අශුශ්‍රවත් යනු ශ්‍රු ධාතුහුගේ ද; (11) අදිද්‍රවත්-අදුද්‍රවත් යනු ද්‍රු ධාතුහුගේ ද පූර්ව උකාරයට ඉකාරාදෙශ වූ පක්ෂයෙහි හා විකල්ප පක්ෂයෙහි ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

179. ඝත් ආදෙශ විධි සූත්‍ර යි. "ආදිස්වරස්‍ය ඤ්ණිති" යි 'ඤ්ණිති' යනු ද, "නො වා" යි 'වා' යනු ද අනුවෘත්ත යි. ඤ්ණිති, ඤිත්-ණිත් පර කල්හි; හනඃ, හන් ධාතුහට; වා, ව්‍යවස්ථා වශයෙන්; ඝත්, ඝත් යනාදෙශ වේ.

b. ණප් වර්ජිතෙ, ණප් ප්‍රත්‍යය තොර කොට ඇති; ඤ්ණිති පරතඃ, ඤකාර- ණකාර ඉත් කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; හනෙනඃ, හන් ධාතුහට; ඝදෙශඃ භවති, 'ඝත්' ආදෙශ වේ. (මේ සූත්‍රයට අනුවෘත්ත වන වා ශබ්දය **ව්‍යවස්ථා වාචක ය.** ව්‍යවස්ථාව නම් "ණප්" ප්‍රත්‍යය "ණිත්" වුවත් එය පර කල්හි මේ ආදෙශය නො වන බව ය. ඒ වා ශබ්දයාගේ අර්ථය ගෙණ සූත්‍ර වෘත්තියෙහි **"ණප් වර්ජිතෙ"** යි කීහ.) (12) "ඝනන්තං ප්‍රේරයති" යන විග්‍රහයෙහි ඝාතයති යනු වේ. (ඝාතයති, ඝාතයෙත්, ඝාතයතු, අඝාතයත්, ඝාතයාඤ්චකාර, ඝාත්‍යාත්, ඝාතයිතා, ඝාතයිෂ්‍යති, අඝාතයිෂ්‍යත්, අජීඝනත් යනු හන් ධාතුහුගේ දශලකාර ප: ප්‍ර: එක වචන යි. "අජීඝනත්" යන තන්හි ද්විත්වයෙහි පූර්ව ඝකාරයට "කුහොශ්චුඃ" යි ඣකාර ව ඊට "ඣපානාං ජබචපාඃ" යි ජකාර විය.)

(13) ශදෟ ශාතනෙ, ඏකාරානුබන්ධ 'ශද්' ධාතුව කෘශ කිරීමෙහි නොහොත් නැසීමෙහි වේ.

## 180. ශදේඃ ශත්. (ශදේඃ 6-1. ශත් 1-1.)

a. **ශදේඃ ශතාදේශො භවති අගතෞ ණෞ පරෙ. ශාතයති, ගතෞ තු ශාදයති, අශිශතත්. "රුතො ණෞ පුක්" (14) ඬුදෘඤ් දානෙ, දාපයති- අදීදපත්. (15) ධාපයති- අදීධපත්.**

b. **පුගනතස්‍ය ගුණො වක්තව්‍යඃ. (16) අපියති. "ස්වරාදෙඃ පරඃ" ආර්පිපත්. (17) ෂ්ඨා ගතිනිවෘත්තෞ, ස්ථාපයති. තිෂ්ඨතෙ රූපධායා ඉකාරෙ වක්තව්‍යො 'ඩ පරෙ. තතො ද්විත්වම්, අතිෂ්ඨිපත්.**

---

180. ශත් ආදෙශ විධි සූත්‍ර යි. "රුතො ණෞ පුක්" යි 'ණෞ' යනු ද, "විදෙ නවානාං -පෙ- වා" යි 'වා' යනු ද අනුවෘත්ත යි. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; ශදේඃ, ශද් ධාතුහට; වා, ව්‍යවස්ථා වශයෙන්; ශත්, ශත් යනාදෙශ වේ.

a. ණෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; අගතෞ, ගමනාර්ථයෙහි නුවූ; ශදේඃ, ශද් ධාතුහට; ශතාදෙශඃ භවති, ශත් යනාදෙශ වේ. (මේ සූත්‍රයට අනුවෘත්ත වන වා ශබ්දය ද ව්‍යවස්ථා වාචක යං. ඒ ව්‍යවස්ථාව නම් ශද් ධාතුව ගමනාර්ථ කල්හි මේ ශත් ආදෙශය නො වන බව ය. වා ශබ්දාර්ථය ගෙණ සූත්‍ර වෘත්තියෙහි "අගතෞ"යි කීහ.) "ශීයමානං ප්‍රේරයති" යන විග්‍රහයෙහි ශාතයති යනු වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. ගතෞ තු, ගමනාර්ථයෙහි වනාහි; ශාදයති, ශාදයති යනු වේ. අශිශතත් යනු (ශත් ආදෙශ පක්‍ෂයෙහි) ලුඞ් ප: ප්‍ර: එක වචන යි. "රුතො ණෞ පුක්" යන සූත්‍රයෙන් පුගාගම වේ. (14) ඬුදෘඤ් දානෙ, ඬුකාර- ඤකාරානුබන්ධ "දා" ධාතුව දීම් අර්ථයෙහි වේ. දාපයති- අදීදපත් යනු දා ධාතුහුගේ ද, (15) ධාපයති- අදීධපත් යනු 'ධා' ධාතුහුගේ ද ලට්- ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

b. පුගනතස්‍ය, පුගාගමය අන්ත කොට ඇත්තහුට; ගුණඃ වක්තව්‍යඃ, ගුණය කිය යුතු යි. "සෘණිවනානං, ඉච්ඡනං, සෘච්ඡනතං වා ප්‍රේරයති" යන විග්‍රහයෙහි අපියති යනු වේ. සෘ ධාතුහුගේ ලට් ප: ප්‍ර: එක වචන රූප යි. "ස්වරාදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පරාවයවයට ද්විත්ව වේ. ආර්පිපත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

(17) ෂ්ඨා ගති නිවෘත්තෞ, ෂොපදෙශ 'ෂ්ඨා' ධාතුව ගමන් නැවැත්මෙහි (=සිටීමෙහි) වේ. ("ආදෙඃ ෂණඃ සනඃ" යි ෂකාරයට සකාර වේ. "නිමිත්තාභාවෙ නෛමිත්තිකස්‍යාප්‍යභාවඃ" යි කී හෙයින් ඨකාරයට ථකාරය වේ.) "තිෂ්ඨනතං ප්‍රේරයති" යන විග්‍රහයෙහි ස්ථාපයති යනු වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. අඞි පරෙ, අඞ් ප්‍රත්‍යය පර කල්හි; තිෂ්ඨතෙඃ, ෂ්ඨා ධාතුහුගේ; උපධායාඃ,

a. **පාදෙර් යුක්.***

b. **පාශාඡාසාහ්වෙඤ් ව්‍යෙඤ් වෙඤං යුගාගමො හවති ණෞ පරෙ. (18) පායයති.**

c. **"පිබතෙරඩි පූර්වස්‍යෙකාරොපධාලොපෞ වක්තව්‍යෞ."† අපීප්‍යත්. (19) ශො තනූ කරණෙ. "සන්ධ්‍යක්ෂරාණාමා" ශායයති- අශිශයත්. (20) ඡො ඡෙදනෙ, ඡායයති- අචිච්ඡයත්. (21) ෂො'න්තකර්මණි, සායයති- අසීෂයත්.**

---

උපධා සංඥයට; ඉකාරඃ වක්තව්‍යඃ, ඉකාරාදෙශය කිය යුතු යි. තතඃ, ඉන් පසු; ද්විත්වම්, ද්විත්ව වේ. අතිෂ්ඨිපත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

a. පාදෙඃ, පා ආදිය සම්බන්ධ ව; යුක්, යුගාගම වේ.

b. ණෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; පාශා— වෙඤම්, පා පානෙ- ශො තනූ කරණෙ- ඡො ඡෙදනෙ- ෂො'න්තකර්මණි- හ්වෙඤ් ස්පර්ධායාම්- ව්‍යෙඤ් සංවරණෙ- වෙඤ් තන්තුසන්තානෙ යන ධාතූන් සම්බන්ධ ව; යුගාගමඃ භවති, යුක් ආගම වේ. (මෙහි ආගම වන්නේ "ය්" යන්න පමණකි. සෙස්ස ඉත් ය. උ යන්න උච්චාරණයට ද, ක යන්න ස්ථාන නියමයට ද වේ.) (18) "පිබන්තං ප්‍රේරයති" යන විග්‍රහයෙහි පායයති යනු වේ. පා ධාතු ලට් ප: ප්‍රථම පුරුෂෛක වචන යි.

c. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; පිබතෙඃ, පා ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව රූපයට; ඊකාර- උපධාලොපෞ, ඊකාරාදෙශය ද- උපධා ලොපය ද යන දෙක; වක්තව්‍යෞ, කිය යුතු යි. අපීප්‍යත් යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (19) ශො තනූ කරණෙ, 'ශො' ධාතුව තුනී කිරීමෙහි වේ. "සන්ධ්‍යක්ෂරාණාමා" යන සූත්‍රයෙන් ඔකාරයට ආකාරය වේ. ශායයති, "ශ්‍යන්තං ප්‍රේරයති" යන විග්‍රහයෙහි ශායයති යනු වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. ලුඞ්හි අශීශයත් යනු වේ. (20) ඡො ඡෙදනෙ, 'ඡො' ධාතුව සිඳීමෙහි වේ. ඡායයති, "ඡ්‍යන්තං ප්‍රේරයත්" යන විග්‍රහයෙහි ඡායයති යනු වේ. ලුඞ්හි අචිච්ඡයත් යනු වේ. (21) ෂො අන්තකර්මණි, 'ෂො' ධාතුව අවසන් කිරීමෙහි වේ. "ස්‍යන්තං ප්‍රේරයති" යන විග්‍රහයෙහි සායයති යනු වේ. ලුඞ්හි අසීෂයත් යනු වේ.

---

* මුග්ධබොධ, 782 සූ: සහ පාණිනීය, 7. 3. 37,

† "ලොපඃ පිබතෙරීච්චාභ්‍යාසස්‍ය" පාණිනීය 7: 4: 4:

(22) හ්වෙඤ් ස්පර්ධායාම්. හ්වයතෙරඞි සම්ප්‍රසාරණං යුගභාවශ්ච වක්තව්‍යඃ. කෘතසම්ප්‍රසාරණස්‍ය හ්වයතෙරඞි ක්‍රමාද් ගුණවෘද්ධී වාච්‍යෙ. අජුහාවත්- අජූහවත්, අජුහාවතාම්- අජූහවතාම්.

(23) ව්‍යෙඤ් සංවරණෙ, ව්‍යායයති- අවිව්‍යයත්. (24) වෙඤ් තන්තුසන්තානෙ, වායයති- අවීවයත්. පාතෙර්ණෞ ලුග් වක්තව්‍යඃ. යුකො'පවාදඃ. (25) පාලයති- අපීපලත්.

(26) රහ රාහස්‍යෙ, රහසො වෙගහර්ෂයොඃ. රහලභොඃ ස්වරෙ ණාද්‍යපෞ විනා නුම් වාච්‍යඃ. රම්හයති- අරරම්හත්. (27) ඩු ලභෂ් ප්‍රාප්තෞ, ලම්භයති- අලලම්භත්. (28) ප්‍රීඤ් තර්පණෙ.

---

(22) හ්වෙඤ් ස්පර්ධායාම්, ඤනුබන්ධ "හ්වෙ" ධාතුව අනුන් මැඩ ලනු කැමැති බැව්හි වේ. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; හ්වයතෙඃ, හ්වෙ ධාතුහට; සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණය ද; යුක් අභාවඃ ච, යුගාගම නො වීම ද, වක්තව්‍යඃ, කිය යුතු යි. කෘත සම්ප්‍රසාරණස්‍ය, කරණලද සම්ප්‍රසාරණ ඇති; හ්වයතෙඃ, හ්වෙ ධාතුහට; අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; ක්‍රමාත්, පිළිවෙළින්; ගුණ වෘද්ධී, ගුණ- වෘද්ධි දෙක; වාච්‍යෙ, කිය යුතු යි. ("හ්වයන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි හ්වායයති යනු වේ.) අජුහාවත් යනු වෘද්ධි වූ පක්ෂයෙහි ද, අජූහවත් යනු ගුණ වූ පක්ෂයෙහි ද ලුඞ් ප: ප්‍ර: එක වචන යි. අජුහාවතාම්- අජූහවතාම් යනු ද්වි වචන යි. (ගුණ පක්ෂයෙහි "ලඝොර්දීර්ඝඃ" යි පූර්වයට දීර්ඝ වේ.)

(23) ව්‍යෙඤ් සංවරණෙ, ඤනුබන්ධ "ව්‍යෙ" ධාතුව සංවරණාර්ථයෙහි වේ. "ව්‍යයන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ව්‍යායයති යනු වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. ලුඞ්හි අවිව්‍යයත් යනු වේ. (24) වෙඤ් තන්තුසන්තානෙ, ඤනුබන්ධ "වෙ" ධාතුව නූල් පැතිරවීමෙහි (=විවීමෙහි) වේ. "වයන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි වායයති යනු වේ. ලුඞ්හි අවීවයත් යනු වේ. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; පාතෙඃ, "පා රක්ෂණෙ" යන ධාතුහු සම්බන්ධ ව; ලුක් වක්තව්‍යඃ, ලුගාගමය කිය යුතු යි. යුකඃ අපවාදඃ, යුගාගමයේ වැළැක්ම වේ. (25) "පාන්තං ප්‍රේරයති" යන විග්‍රහයෙහි පාලයති යනු වේ. ලුඞ්හි අපීපලත් යනු වේ.

(26) රහ රාහස්‍යෙ, "රහ්" ධාතුව උත්සුක භාවයෙහි වේ. රහසඃ වෙගහර්ෂයොඃ, රහස ශබ්දය වෙග- හර්ෂ යන අර්ථ දෙක්හි වේ. (රහසස්‍ය භාවො= රාහස්‍යං, තස්මින්= රාහස්‍යෙ.) ණාදි + අපෞ විනා, ණබාදිය- අප් විකරණය යන දෙක හැර; ස්වරෙ, ස්වරයා

a. ප්‍රීඤ් ධූඤෝර් නුක්.*

b. අනයෝර් නුගාගමෝ භවති ණ්‍යෙ පරෙ. ප්‍රීණයති- අපිප්‍රීණත්. (29) ධූඤ් කම්පනෙ. ධූනයති- අදූධුනත්.

(30) ස්මිඞ් ඊෂද්ධසනෙ. ස්මයතෙරාත්වං ණ්‍යෙ වාච්‍යම්. විස්මාපයතෙ- ව්‍යසිෂ්මපත. ආති කිම්? විස්මායයති- ව්‍යසිෂ්මයත්.

---

පර කල්හි; රහලඝෝඃ, රහ්- ලඝ් ධාතු ද්වය සම්බන්ධ ව, නුම් වාච්‍යඃ, නුමාගමය කිය යුතු යි. (ණ්‍යාදිය නම් ලිට් ප්‍රත්‍යයයෝ යි. නුමාගමය මිත් බැවින් අන්ත්‍යස්වරයෙන් පර ව වේ.) “රහමාණං ප්‍රේරයති” යන වාක්‍යයෙහි රම්හයති යනු වේ. ලුඞ්හි අරරම්හත් යනු වේ. (නුමාගමයෙහි නකාරයට “නශ්චාපදාන්තෙ ඣසෙ” යි අනුස්වාර ව නැවත ඊට “යමා යපෙ'ස්‍ය” යි මකාර විය.) (27) ඪු ලඝශ් ප්‍රාපණෙ, ඪු- අශ් අනුබන්ධ “ලඝ්” ධාතුව පැමිණීමෙහි වේ. “ලඝමානං ප්‍රේරයති” යන වාක්‍යයෙහි ලම්ඝයති යනු වේ. ලුඞ්හි අලලම්ඝත් යනු වේ. (28) ප්‍රීඤ් තර්පණෙ, ඤනුබන්ධ “ප්‍රී” ධාතුව තෘප්තියෙහි වේ.

a. ප්‍රීඤ් ධූඤෝඃ, ප්‍රීඤ්- ධූඤ් යන ධාතු ද්වය සම්බන්ධ ව; නුක්, නුගාගම වේ.

b. ණ්‍යෙ පරෙ, ණ්‍යි ප්‍රත්‍යය පර කල්හි; අනයෝඃ, මේ ප්‍රීඤ්- ධූඤ් ධාතු දෙක සම්බන්ධ ව; නුගාගමඃ භවති, නුක් ආගම වේ. “ප්‍රීණ්වන්තං ප්‍රීණන්තං වා ප්‍රේරයති” යන වාක්‍යයෙහි ප්‍රීණයති යනු වේ. ලුඞ්හි අපිප්‍රීණත් යනු වේ. (“අවකුප්වන්තරෙ'පි” යි ණත්වය වේ.) (29) ධූඤ් කම්පනෙ, ඤනුබන්ධ “ධූ” ධාතුව චලනයෙහි වේ. “ධූනන්තං ප්‍රේරයති” යන වාක්‍යයෙහි ධූනයති යනු වේ. ලුඞ්හි අදූධූනත් යනු වේ.

(30) ස්මිඞ් ඊෂත් හසනෙ, ඞනුබන්ධ “ස්මි” ධාතුව මඳ සිනායෙහි වේ. ණ්‍යෙ, ණ්‍යි ප්‍රත්‍යය පර කල්හි; ආති, ආත්මනෙපදයෙහි; ස්මයතෙඃ, ස්මි ධාතුවට; ආත්වං වාච්‍යම්, ආකාර බව කිය යුතු යි. (ආත්වය වූ කල්හි “රාතො ණ්‍යෙ පුක්” යි පුගාගම වේ.) “විස්මයමානං ප්‍රේරයති” යන වාක්‍යයෙහි විස්මාපයතෙ යනු වේ. ලට් ආ: ප්‍ර: එක වචන යි. ලුඞ්හි ව්‍යසිෂ්මපත යනු වේ. ආති කිම්, “ආත්මනෙ පදයෙහි” යනු කිම? විස්මායයති- ව්‍යසිෂ්මයත්, (විස්මායයති, විස්මායයෙත්, විස්මායයතු, ව්‍යස්මායයත්, විස්මායයාඤ්චකාර, විස්මාය්‍යාත්, විස්මායයිතා, විස්මායයිෂ්‍යති, ව්‍යස්මායයිෂ්‍යත්, ව්‍යසිෂ්මයත්) යි පරස්මෛපදයෙහි ආත්වය නො වනු පිණිස ය. (ආත්වය නො වන හෙයින් පුගාගමය නො වේ.)

---

* මු: බොධයෙහි විකල්පයෙනැයි කීහ. “ප්‍රීණයති- ප්‍රායයති, ධූනයති- ධාවයති.”

**a. රුහෙර් ණෞ පො වා වාච්‍යඃ. (31) රුහ බීජ ජන්මනි ප්‍රාදුර්භාවෙ ච. රොහයති- රොපයති, අරූරුහත්- අරූරුපත්.**

**(32) කෟපූ සාමර්ථ්‍යෙ. "කෟපො රෙ ලඃ" කල්පයති. "උපධායා ඍවර්ණස්‍යාඩ් ඍ වා වක්තව්‍යඃ." ඉරරාරාමපවාදඃ. අචීකෟපත්- අචකල්පත්. (33) වෘතුඞ් වර්තනෙ. වර්තයති, අවීවෘතත්- අවවර්තත්. (34) මෘජූෂ් ශුද්ධෞ. මාර්ජයති, අමීමෘජත්- අමමාර්ජත්.**

**b. ඉඩාදෙර් ණෞ පුක් ච.**

---

a. ණෞ, ණිදි ප්‍රත්‍යය පර කල්හි; රුහෙඃ, රුහ් ධාතුහුගේ අන්තයට (=හකාරයට); වා, විකල්පයෙන්; පඃ වාච්‍යඃ, පකාරාදෙශය කිය යුතු යි. (ෂෂ්ඨී නිර්දිෂ්ට බැවින් ධාතුහුගේ අන්තයට වේ.) (31) රුහ බීජ ජන්මනි ප්‍රාදුර්භාවෙ ච, අකාරානුබන්ධ "රුහ්" ධාතුව බීජ හටගැන්මෙහි ද, පහළ වීමෙහි ද වේ. "රොහන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි රොහයති යනු ද, හයන්නට පයන්න වීමෙන් රොපයති යනු ද වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. ලුඞ්හි අරූරුහත් යනු ද, අරූරුපත් යනු ද වේ.

(32) කෟපූ සාමර්ථ්‍යෙ, ඌ අනුබන්ධ "කෟප්" ධාතුව සමත් බැව්හි වේ. "කෟපො රෙ ලඃ" යි කී හෙයින් ගුණයෙන් වන 'අර්' ආදෙශයාගේ රකාරයට ළකාරය වේ. "කල්පමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි කල්පයති යනු වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. උපධායා- වක්තව්‍යඃ, "උපධායා ඍවර්ණස්‍යාඩ් ඍ වා වක්තව්‍යඃ* යි කී හෙයින් විකල්පයෙන් ඍකාරයට ඍකාරය ම වේ. ඉරරාරම් අප වාදඃ, ඉර්- අර්- ආර් ආදෙශයන්ගේ වැළැක්ම වේ. අචීකෟපත් යනු ඍකාරාදෙශ පක්ෂයෙහි ද, අචකල්පත් යනු විකල්ප පක්ෂයෙහි ද ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (33) වෘතුඞ් වර්තනෙ, උඞ් අනුබන්ධ "වෘත්" ධාතුව පැවැත්මෙහි වේ. "වර්තමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි වර්තයති යනු ද, ලුඞ්හි අවීවෘතත්- අවවර්තත් යනු ද වේ. (34) මෘජූෂ් ශුද්ධෞ, ඌ-ෂ් අනුබන්ධ "මෘජ්" ධාතුව පවිත්‍ර බැව්හි වේ. "මෘජන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි මාර්ජයති යනු ද, ලුඞ්හි අමීමෘජත්- අමමාර්ජත් යනු ද වේ.

b. ණෞ, ණිදි ප්‍රත්‍යය පර කල්හි; ඉඩාදෙඃ, ඉඩ් ආදි ධාතු ගණයාගේ අන්තයට (ආකාරාදෙශය ද, ශ්‍රී ආදි ධාතූන් සම්බන්ධ ව) පුක් ව, පුගාගමය ද වේ.

---

* මේ වාක්‍යය චුරාදි ප්‍රක්‍රියායෙහි ද පෙණේ. අර්ථ එයින් දත යුතු. 137 පිට.

**a. ඉඞ් ක්‍රීජීනාමාත්වං භවති ණෞ පරෙ. හ්‍රීබ්ලීරික්නූයීක්‍ෂ්මායීනාං පුගාගමො භවති ණෞ පරෙ. (35) ඉඞ් අධ්‍යයනෙ. අධ්‍යාපයති- අධ්‍යාපිපත්. අඞ්පරෙ ණෞ ඉඞො ගාඞ් වා වක්තව්‍යඃ. අධ්‍යජීගපත්.**

**(36) ඩුක්‍රීඤ් ද්‍රව්‍ය විනිමයෙ. ක්‍රාපයති- අචික්‍රපත්. (37) ජි ජයෙ, ජාපයති- අජීජපත්. (38) හ්‍රී ලජ්ජායාම්, හ්‍රෙපයති- අජිහ්‍රිපත්. (39) බ්ලී වරණෙ, බ්ලෙපයති- අබිබ්ලිපත්. (40) රීඞ් ක්‍ෂරණෙ, රෙපයති- අරීරිපත්.**

---

a. ණෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; ඉඞ්ක්‍රීජීනාම්, ඉඞ් අධ්‍යයනෙ- ඩු ක්‍රීඤ් ද්‍රව්‍යවිනිමයෙ- ජි ජයෙ යන ධාතූන්ට; ආත්වං භවති, ආකාර බව වේ. (ෂෂ්ඨී නිර්දිෂ්ට බැවින් අන්තයට වේ. ආත්වය වූ කල්හි "රාතො ණෞ පුක්" යි පුගාගම වේ.) ණෞ පරෙ, ණි ප්‍රත්‍යය පර කල්හි; හ්‍රීබ්ලීරික්නූයීක්‍ෂ්මායීනාම්, හ්‍රී ලජ්ජායාම්- බ්ලී වරණෙ- රීඞ් ක්‍ෂරණෙ- ක්නූයී දුර්ගන්ධෙ- ක්‍ෂ්මායී විධූනනෙ යන ධාතූන් සම්බන්ධ ව; පුගාගමඃ භවති, පුක් ආගම වේ. ( ආත්වය නො වන බැවින් පුගාගමය මෙසින් වේ.) (35) ඉඞ් අධ්‍යයනෙ, ඞනුබන්ධ "ඉ" ධාතුව හැදෑරීමෙහි වේ. (මේය අධි උපසර්ගය සමග ම යෙදේ.) "අධීයානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි අධ්‍යාපයති යනු ද, ලුඞ්හි අධ්‍යාපිපත් යනු ද වේ. ("ස්වරාදෙඃ පරඃ" යි පරාවයවයට ද්විත්ව විය. අධ්‍යාපයත්- අධ්‍යාපයිෂ්‍යත් යනු ලඞ්- ලෘඞ් ප: ප්‍ර: එක වචන යි. සෙස්ස සුගම යි.) අඞ් පරෙ, අඞ් ප්‍රත්‍යය පර කොට ඇති; ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; ඉඞඃ, ඉඞ් ධාතුහට; වා විකල්පයෙන්; ගාඞ් වක්තව්‍යඃ, ගාඞ් ආදේශය කිය යුතු යි. අධ්‍යජීගපත් යනු වේ. ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

(36) ඩු ක්‍රීඤ් ද්‍රව්‍ය විනිමයෙ, ඩු-ඤ් අනුබන්ධ "ක්‍රී" ධාතුව ද්‍රව්‍ය මාරු කිරීමෙහි වේ. "ක්‍රීණන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ක්‍රාපයති යනු ද, ලුඞ්හි අචික්‍රපත් යනු ද වේ. (37) ජි ජයෙ, "ජි" ධාතුව දිනීමෙහි වේ. "ජයන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ජාපයති යනු ද, ලුඞ්හි අජීජපත් යනු ද වේ. (38) හ්‍රී ලජ්ජායාම්, "හ්‍රී" ධාතුව ලජ්ජාවීයෙහි වේ. "ජිහ්‍රියතං ප්‍රේරයති" යන වාක්‍යයෙහි හ්‍රෙපයති යනු ද, ලුඞ්හි අජිහ්‍රිපත් යනු ද වේ. (39) බ්ලී වරණෙ, "බ්ලී" ධාතුව ගිවිසීමෙහි වේ. " බ්ලීනන්තං ප්‍රේරයති " යන වාක්‍යයෙහි බ්ලෙපයති යනු ද, ලුඞ්හි අබිබ්ලිපත් යනු ද වේ. (40) රීඞ් ක්‍ෂරණෙ, ඞනුබන්ධ "රී" ධාතුව වැගිරීමෙහි වේ. "රීයමාණං රීණන්තං වා ප්‍රේරයති" යන වාක්‍යයෙහි රෙපයති යනු ද, ලුඞ්හි අරීරිපත් යනු ද වේ.

**(41) ක්නූයී දුර්ගන්ධෙ, "යවයොර්වසෙ හකාරෙ ච ලොපො වක්තව්‍යඃ" ක්නොපයති අචුක්නූපත්. (42) ක්ෂ්මායී විධූනනෙ, එකඃ ක්ෂ්මායති, තමන්‍යඃ ප්‍රෙරයති= ක්ෂ්මාපයති- අචික්ෂ්මපත්.**

**(43) ලීඞ් ශ්ලෙෂණෙ, ලියතෙර්ණ්‍යාත්වං වා. විලාපයති. ලීලොඃ පුග් වක්තව්‍යඃ. විලෙපයති. ව්‍යලීලපත්- ව්‍යලිලිපත්. ලීලොර්ණෞ ක්‍රමාන්නුග්ලුකෞ වා. විලීනයති. ව්‍යලීලිනත්. (44) ලා ග්‍රහණෙ. ලාපයති- අලීලපත්. ලාලයති- අලීලලත්, අලීලලතාම්.**

---

(41) ක්නූයී දුර්ගන්ධෙ, ඊ අනුබන්ධ "ක්නූය්" ධාතුව දුගඳෙහි වේ.

වසෙ, වස ප්‍රත්‍යාහාරය ද; හකාරෙ ච, හකාරය ද පර කල්හි; යවයොඃ, යකාර- වකාර දෙකට; ලොපඃ වක්තව්‍යඃ, ලොපය කිය යුතු යි. (මෙයින් යකාරය හැර ඉතිරි සියලු ව්‍යඤ්ජනාක්ෂරයන් පර කල්හි ධාතූන්ගේ යකාර- වකාර දෙකට ලොප් වේ.) "ක්නූය මානං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ක්නොපයති යනු ද, ලුඞ්හි අචුක්නූපත් යනු ද වේ.) (42) ක්ෂ්මායී විධූනනෙ, ඊකාරානුබන්ධ "ක්ෂ්මාය්" ධාතුව කම්පිත කිරීමෙහි වේ. එකඃ, එකෙක්; ක්ෂ්මායති, කම්පිත කෙරෙයි; තම්, ඔහු; අන්‍යඃ, අනිකෙක්; ප්‍රෙරයති, මෙහෙයයි හෝ "ක්ෂ්මායමාණම් ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ක්ෂ්මාපයති යනු වේ. ලට් පː ප්‍රː එක වචන යි. ලුඞ්හි අචික්ෂ්මපත් යනු වේ.

(43) ලීඞ් ශ්ලෙෂණෙ, ඞනු බන්ධ "ලී" ධාතුව ඇලඳ ගැන් මෙහි වේ. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; ලියතෙඃ, ලී ධාතුවට; වා, විකල්පයෙන්; ආත්වම්, ආකාර බව වේ. (වි උපසර්ගය පූර්ව කොට ඇත්තේ ය.) "විලීයමානං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි විලාපයති යනු වේ. ආත්ව පක්ෂයෙහි ලට් පː ප්‍රː එක වචන යි. ලීලොඃ, ලී- ලා යන ධාතු ද්වය සම්බන්ධ ව; පුක් වක්තව්‍යඃ, පුගාගමය කිය යුතු යි. (මෙයින් ආත්ව නුවූ පක්ෂයෙහි ද පුක් ආගම වේ.) විලෙපයති යනු වේ. ව්‍යලීලපත් යනු ආත්ව පක්ෂයෙහි ද, ව්‍යලීලිපත් යනු විකල්ප පක්ෂයෙහි ද ලුඞ් පː ප්‍රː එක වචන යි. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; ලීලොඃ, ලී-ලා ධාතු දෙක සම්බන්ධ ව; ක්‍රමාත්, පිළිවෙළින්; වා විකල්පයෙන්; නුග්ලුකෞ, නුක්- ලුක් ආගමයෝ වෙත්. ("ක්‍රමාත්" යි කී හෙයින් ලී ධාතුව සම්බන්ධ ව නුගාගමය ද, ලා ධාතුව සම්බන්ධ ව ලුගාගමය ද වේ.) විලීනයති- ව්‍යලීලිනත් යනු ලී ධාතුව සම්බන්ධ ව නුගාගම වූ පක්ෂයෙහි ලට්- ලුඞ් පː ප්‍රː එක වචන යි. (44) ලා ග්‍රහණෙ, ලා ධාතුව ගැණීම් අර්ථයෙහි වේ.

## 181. න රිතඃ. (න- නි: රිතඃ 6-1.)

a. සෘකාරෙතො'නෙකස්වරස්‍ය ශාසශ්චාඞි උකන්තං කායඞීං න භවති.

(45) ඪෞකෘ ගතෞ, ඪෞකයති- අඩුඪෞකත්. (46) ටු යාචෘ යාච්ඤායාම්, යාචයති- අයයාචත්. (47) ශාසු අනුශිෂ්ටෞ, ශාසයති- අශශාසත්. (48) දරිද්‍රා දුර්ගතෞ, දරිද්‍රයති- අදදරිද්‍රත්, අදදරිද්‍රතාම්.

---

"ලාතනං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ලාපයති යනු ද, ලුඞ්හි අලීල පත් යනු ද වේ. ලාලයති- අලීලලත් යනු ලුගාගම වූ පක්ෂයෙහි ලට්- ලුඞ් ප: ප්‍ර: ඒක වචන යි. අලීලලතාම් යනු ලුඞ් ප: ප්‍ර: ද්වි වචන යි.

181. ප්‍රතිෂෙධ විධි සූත්‍ර යි. "ශාසෙඃ" යන සූත්‍රය ද, "අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" යි "අඞි- හ්‍රස්වඃ- උපධායාඃ" යනු ද අනුවෘත්ත යි. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; රිතඃ, සෘකාරය ඉත් කොට ඇති ධාතුහුගේ ද; ශාසෙඃ, ශාස් ධාතුහුගේ ද; උපධායාඃ, උපධා සංඥයට; න හ්‍රස්වඃ, හ්‍රස්ව නො වේ.

a. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; සෘකාරෙතඃ, සෘකාරය ඉත් කොට ඇති ධාතුහට ද; අනෙකස්වරස්‍ය, * අනෙකස්වර ධාතුහට ද; ශාසඃ ච, ශාස් ධාතුහට ද; උකන්තං කායඞීම්, කියන ලද කායඞීය හෙවත් "අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ" යි විහිත හ්‍රස්වය; න භවති, නො වේ.

(45) ඪෞකෘ ගතෞ, ඍනුබන්ධ "ඪෞක්" ධාතුව ගමන්හි වේ. "ඪෞකමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ඪෞකයති යනු ද, ලුඞ්හි අඩුඪෞකත් යනු ද වේ. ("හ්‍රස්වාදෙශෙ සන්ධ්‍යක්ෂරාණාමිකාරොකාරෞ ච වක්තව්‍යෞ" යි කී හෙයින් "හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් පූර්වාවයවයට හ්‍රස්ව කිරීමෙහි දී ඖකාරයට උකාරය වේ. "ඣපානාං ජබචපාඃ" යි ඪකාරයට ඩකාර වේ.) (46) ටුයාචෘ යාච්ඤායාම්, ටු- සෘ අනුබන්ධ "යාච්" ධාතුව යැදීමෙහි වේ. "යාචමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි යාචයති යනු ද, ලුඞ්හි අයයාචත් යනු ද වේ. (47) ශාසු අනුශිෂ්ටෞ, උකාරානුබන්ධ "ශාස්" ධාතුව අනුශාසනයෙහි වේ. "ශාසතං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ශාසයති යනු ද, ලුඞ්හි අශශාසත් යනු ද වේ. (48) දරිද්‍රා දුර්ගතෞ, "දරිද්‍රා"

---

* මෙය නිරර්ථක යි. කවර හෙයින් ද? අග් (=අය්වෘ) ලොපය ඇති ධාතු සම්බන්ධ ව අඞ් කාර්‍ය්‍යය නො වන බැවිනි. "න රිතඃ" යනු ද අඞ්කාර්‍ය්‍ය ප්‍රතිෂෙධක යි.

**(49) දුෂ වෛකෘතෙ‍්‍ය. දුෂෙර්ණෞ වා දීර්ඝො වක්තව්‍යඃ. දූෂයති- දෞෂයති. අදූදුෂත්. (50) ෂට වෙෂ්ටායාම්. "මිතාං හ්‍රස්වඃ" ෂටයති- අජීෂටත්. (51) ව්‍යථ දුඃඛභයචලනයොඃ, ව්‍යථයති- අවිව්‍යථත්. එවං පඤ්චපඤ්චාශතො රූපම්.**

**a. ජනිජෘෂ්ක්නසුරඤ්ජො'මන්තාශ්ච.**

**b. එතෙ'පි මිතඃ. (52) ජනයති- අජීජනත්. (53) ජෘෂ් වයොහානෞ, ෂ් ඉත්. ජරයති- අජීජරත්. (54) ක්නසු හ්වරණ දීප්ත්‍යොඃ, ක්නසයති- අචික්නසත්. (55) රඤ්ජ රාගෙ, රඤ්ජෙර්ණෞ මෘගරමණෙ'ර්ථෙ නලොපො වාච්‍යඃ. රජයති මෘගාන්, අරීරජත්.**

---

ධාතුව දුගී බැව්හි වේ. "දරිද්‍රතං ප්‍රේරයති" යන වාක්‍යයෙහි දරිද්‍රයති යනු ද, ලුඞ්හි අදදරිද්‍රත් යනු ද වේ. (**"ණෞජ්චුණ්සඃයුවො, ඝිඤා අන්‍යස්‍ය දරිද්‍රාතෙරනප්‍යාලොපො ලුඞි වා"** යි කී හෙයින් ධාත්වන්ත ආකාරයට ලොප් වේ.) අදදරිද්‍රතාම් යනු ලුඞ් පඃ ප්‍රඃ ද්විවචන යි.

(49) දුෂ වෛකෘතෙ‍්‍ය, අකාරනුබන්ධ "දුෂ්" ධාතුව විකෘතභාවයෙහි (=සිත දුෂ්ට වීමෙහි) වේ. ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; දුෂෙඃ, දුෂ් ධාතුවට; වා, විකල්පයෙන්; දීර්ඝඃ වක්තව්‍යඃ, දීර්ඝය කිය යුතුයි. "දුෂ්‍යන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි දූෂයති යනු වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. විකල්පයෙන් දීර්ඝ නුවූ පක්ෂයෙහි ගුණ ව දෞෂයති යනු වේ. ලුඞ්හි අදූදුෂත් යනු වේ. (50) ෂට වෙෂ්ටායාම්, අකාරානුබන්ධ "ෂට්" ධාතුව කායික ව්‍යාපාරයෙහි වේ. ("උපධායාලඝොඃ" යි වෘද්ධි වීමෙන් "ෂාටයති" යි සිටි කල්හි) "මිතාං හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් හ්‍රස්ව වේ. (ෂටාදිය මිත් සංඥ බැවිනි.) "ෂටමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ෂටයති යනු ද, ලුඞ්හි අජීෂටත් යනු ද වේ. (51) ව්‍යථ දුඃඛ භය චලනයොඃ, අකාරානුබන්ධ "ව්‍යථ්" ධාතුව දුක ය- බියෙන් සැලීම ය යන අර්ථ ද්වයෙහි වේ. "ව්‍යථමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ව්‍යථයති යනු ද, ලුඞ්හි අවිව්‍යථත් යනු ද වේ. පඤ්ච පඤ්චාශතඃ, පස් පණසක් මිත්සංඥ ධාතුන්ගේ; * රූපම්, රූපය; එවම්, මෙසේ යි.

a. ජනී ජෘෂ් ක්නසු රඤ්ජඃ, ජනී- ජෘස්- ක්නසු- රඤ්ජ යන ධාතුහු ද; අමන්තාඃ ච, (ක්‍රම්- ගම් ආදි) "අම්" යන්න අන්ත කොට ඇති ධාතුහු ද (මිත් සංඥ වෙත්. මෙහි ජනී- ජෘෂ්- ක්නසු යන ධාතු ත්‍රය දෛවාදික ද, රඤ්ජ ධාතුව දෛවාදික හා භෞවාදික ද වෙති.)

---

* පාණිනීය ධාතු පාඨයෙන් ඒ 55 බැලිය යුතු යි.

**(56–57) ශම- දම උපශමනෙ, ශමයති- අශිශමත්. දමයති- අදීදමත්. ජානාතෙර්ණෙඃ වා හ්‍රස්වඃ. (58) ඤා 'වබොධනෙ, එකො ජානාති තමන්‍යඃ ප්‍රෙරයතීති= ඥපයති- අජිඥපත්.**

---

b. එතෙ අපි, මේ ජනී ආදි ධාතූහු ද; මිතඃ, මිත් වෙත්; (මිත් හෙයින් "මිතාං හ්‍රස්වඃ" යි හ්‍රස්ව වේ.) (52) "ජායමානං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ජනයති යනු ද, ලුඞ්හි අජීජනත් යනු ද වේ. (53) ජෲෂ් වයො හානෞ, "ජෲ" ධාතුව වයස් පිරිහීමෙහි වේ. ෂ් ඉත්, "ෂ්" යනු ඉත් ය. "ජීර්‍යන්තං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ජරයති යනු ද, ලුඞ්හි අජීජරත් යනු ද වේ. (මෙය ෂිත් කොට හෙවත් "ෂ්" යන්න ඉත් කොට දැක් වූ හෙයින් දිවාදි ගණික ජෲ ධාතුව පමණක් ගත යුතු යි. ක්‍ර්‍යාදි ගණික ණ්‍යන්ත ජෲ ධාතුව ලට්හි "ජාරයති" යනාදීන් වර නැගේ. මිත් සංඥා නො වන හෙයින් හ්‍රස්ව නො වීමෙනි.) [54] ක්නසු හ්වරණ දීප්ත්‍යොඃ, උකාරානුබන්ධ "ක්නස්" ධාතුව කුටිල බව ය- බැබලීම ය යන අර්ථ දෙක්හි වේ. "ක්නස්‍යන්තං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ක්නසයති යනු ද, ලුඞ්හි අචික්නසත් යනු ද වේ. [55] රඤ්ජ රාගෙ, අකාරානුබන්ධ "රඤ්ජ්" ධාතුව ඇල්මෙහි වේ. (මෙහි ප්‍රකෘතිය "රන්ජ්" යනු යි. ඤකාරය "නශ්චාපදාන්තස්‍ය ඣලෙ- යමා යපේ'ඝ්‍ය" යන සූත්‍ර බලයෙනි.) ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; මෘගරමණෙ අචෙ, මෘග රමණාර්ථය වාච්‍ය කල්හි; රඤ්ජෙඃ, රන්ජ් ධාතුහුගේ; නලොපඃ, නකාර ලොපය; වාච්‍යඃ, කිය යුතු යි. "රජ්‍යන්තං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි රජයති යනු වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. මෘගාන්, මුවන්; රජයති, දඩයම් කෙරෙයි. ලුඞ්හි අරීරජත් යනු වේ. (මෘග රමණාර්ථයෙන් අන් තන්හි "රඤ්ජයති- අරරඤ්ජත්" යි නකාරයට ලොප් නො වීමෙන් වර නැගේ. "රඤ්ජයති මෘගාන්"= මෘගාන්, මුවන්; රඤ්ජයති, තෘණ දනාදියෙන් තමා කෙරෙහි අලවයි.)

(56–57) ශම- දම උපශමනෙ, අකාරානුබන්ධ "ශම්- දම්" ධාතු ද්වය සන්සිඳීම් අර්ථයෙහි වේ. "ශාම්‍යන්තං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි ශමයති යනු ද, ලුඞ්හි අශිශමත් යනු ද, "දාම්‍යන්තං ප්‍රෙරයති" යන වාක්‍යයෙහි දමයති යනු ද, ලුඞ්හි අදීදමත් යනු ද වේ. (අමන්ත හෙයින් මිත් ය.) ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; ජානාතෙඃ, ඥා ධාතුහට; වා, විකල්පයෙන්; හ්‍රස්වඃ, හ්‍රස්ව වේ. [58] ඥා අවබොධනෙ, "ඥා" ධාතුව අවබොධ කිරීමෙහි වේ. එකඃ, එකෙක්; ජානාති, දනියි; තම්, ඔහු; අන්‍යඃ, අනිකෙක්; ප්‍රෙරයති ඉති,

**a. ජ්වලග්ලාස්නාශච වා මිතඃ. (59) ජ්වල දීප්තෞ, ජ්වලයති- ජ්වාලයති, අජිජ්වලත්. (60) ග්ලෛ හර්ෂක්ෂයෙ, ග්ලපයති- ග්ලාපයති, අජිග්ලපත්. (61) ෂ්ණා ශෞචෙ. "ආදෙඃ ෂ්ණඃ ස්නඃ" ස්නපයති- ස්නාපයති, අසිස්නපත්.**

**(62) ඔස්ඵායී වෘද්ධෞ. ස්ඵායො වකාරඃ ස්‍යාත් ඤෞ පරෙ. ස්ඵාවයති- අපිස්ඵවත්. භියො ඤෞ වා පුගාත්වෙ වාච්‍ය. (63) භීෂයති- භාපයති- භායයති. අබීභිෂත්- අබිභපත්- අබිභයත්.**

---

මෙහෙයයි. (=හෝ "ජානන්තං ප්‍රේරයති") යන වාක්‍යයෙහි; ඥපයති, ඥපයති යනු වේ. (විකල්පයෙන් හ්‍රස්ව නුවූ පක්ෂයෙහි ඥාපයති යනු වේ.) ලුඞ්හි අජිඥපත් යනු වේ. ("රාතො ඤෞ පුක්" යි පුගාගම වේ.)

a. ජ්වලග්ලාස්නාඃ ච, ජ්වල- ග්ලෛ- ෂ්ණා යන ධාතුහු ද; වා, විකල්පයෙන්; මිතඃ, මිත් සංඥ වෙත්. (ජ්වල ධාතුව උපසර්ගයන් කෙරෙන් පර ව යෙදුනු කල්හි නිත්‍යයෙන් මිත් වේ. මිත් පක්ෂයෙහි "මිතාං හ්‍රස්වඃ" යි හ්‍රස්ව වේ.) (59) ජ්වල දීප්තෞ, "ජ්වල" ධාතුව බැබලීමෙහි වේ. "ජ්වලන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ජ්වලයති යනු ද, මිත්හු විකල්ප පක්ෂයෙහි ජ්වාලයති යනු ද, ලුඞ්හි අජිජ්වලත් යනු ද වේ. (60) ග්ලෛ හර්ෂක්ෂයෙ, "ග්ලෛ" ධාතුව සතුට පිරිහීමෙහි (=ගිලන් වීමෙහි) වේ. "ග්ලායන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ග්ලපයති යනු ද, විකල්ප පක්ෂයෙහි ග්ලාපයති යනු ද, ලුඞ්හි අජිග්ලපත් යනු ද වේ. (61) ෂ්ණා ශෞචෙ, ෂොපදෙශ "ෂ්ණා" ධාතුව පවිත්‍ර බැව්හි (=නෑමෙහි) වේ. "ආදෙඃ ෂ්ණඃ සනඃ" යන සූත්‍රයෙන් ෂකාරයට සකාරය වේ. ( එකල්හි "නිමිත්තාභාවෙ නෛමිත්තිකස්‍යාප්‍යභාවඃ" යි කී හෙයින් ෂකාර හෙතුවෙන් "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යි ආදෙශ වූ ණකාරයට මූල ප්‍රකෘතිය වූ නකාරය ම වේ.) "සනාන්තං ප්‍රේරයති" යන වාක්‍යයෙහි සනපයති යනු ද, මිත්හු විකල්ප පක්ෂයෙහි සනාපයති යනු ද, ලුඞ්හි අසිසනපත් යනු ද වේ.

(62) ඔස්ඵායී වෘද්ධෞ, ඔ- ඊ අනුබන්ධ "ස්ඵාය්" ධාතුව වැඩීමෙහි වේ. ඤෞ පරෙ, ඤි ප්‍රත්‍යය පර කල්හි; ස්ඵායඃ, ස්ඵාය් ධාතුහුගේ අන්තයට; වකාරඃ ස්‍යාත්, වකාරය වන්නේ ය. "ස්ඵායමානං ප්‍රේරයති" යන වාක්‍යයෙහි ස්ඵාවයති යනු ද, ලුඞ්හි අපිස්ඵවත් යනු ද වේ.

a. **ව්‍යාපාරමාත්‍රෙ ණිජ්වක්තව්‍යඃ, ස ච ඤිත්. හලං ගෘහ්ණාතීති= හලයති.**

## ඉති ණ්‍යන්ත ප්‍රක්‍රියා.

---

ණෞ, ණි ප්‍රත්‍යය පර කල්හි; භියඃ, භී ධාතුව සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ෂුගාත්වෞ, ෂුක් ආගමය- ආත්වය යන දෙක; වාච්‍යෞ, කිය යුතු යි. (එක් පක්ෂයෙක්හි ෂුගාගමය ද, එක් පක්ෂයෙක්හි ඊකාරයට ආකාරය ද, එක් පක්ෂයෙක්හි ඒ දෙක ම නො වීම ද වේ. එහෙයින් ණ්‍යන්ත භී ධාතුව තුන් අයුරකින් වර නැඟේ.) (63) “බිභ්‍යතං ප්‍රේරයති” යන වාක්‍යයෙහි ෂුගාගම පක්ෂයෙහි භීෂයති යනු ද, ආත්ව පක්ෂයෙහි භාපයති යනු ද, විකල්ප පක්ෂයෙහි භායයති යනු ද වේ. ලට් ප: ප්‍ර: එක වචන යි. ලුඞ්හි පිළිවෙළින් **අබීභිෂත්**- අබීභපත්- අබීභයත් යනු වේ.

a. ව්‍යාපාර මාත්‍රෙ, ව්‍යාපාර මාත්‍රයක් හෙවත් ක්‍රියා මාත්‍රයක් ගම්‍යමාන කල්හි; ණිඃ වක්තව්‍යඃ, (නාමයන් කෙරෙන් පර ව) ණි ප්‍රත්‍යය කිය යුතු යි. සඃ ච, හෙ ද; ඤිත්, ඤිත් සංඥ වේ. (ඤිත් බැවින් “ඤිති ටෙඃ” යි ටිසංඥ ලොපය වේ.) හලං, නඟුල; ගෘහ්ණාති ඉති, ගණී නු යි; හලයති, හලයති යනු වේ.

(“හල” යන නාමයෙන් පර ව ණි ප්‍රත්‍යය ව “යතඃ” යි අකාර ලොප් වූ කල්හි “ස ධාතුඃ” යි ඊට ධාතු සංඥ වී ඉන් පර ව තිප් ප්‍රත්‍යය හා අප් විකරණය වීමෙන් සිද්ධ යි. මෙය **නාමධාතු ප්‍රක්‍රියාවට** ම ඇතුළත් විය යුතු යයි හඟිමු. හලයති- හලයතෙ, හලයෙත්- හලයෙත, හලයතු- හලයතාම්, අහලයත්- අහලයත, හලයාඤ්චකාර- හලයාඤ්චක්‍රෙ, හල්‍යාත්- හලයිෂීෂ්ට, හලයිතා- හලයිතා, හලයිෂ්‍යති- හලයිෂ්‍යතෙ, අහලයිෂ්‍යත්- අහලයිෂ්‍යත, අජහලත්- අජහලත යනාදි වශයෙන් දශ ලකාරයෙහි පරස්මෙපද- ආත්මනෙපද දෙක්හි ම වර නැඟිය යුතු යි. **“අග්ලොපිනො නාඞ් කාර්‍ය්‍යම්”** යි කී හෙයින් ලුඞ් ලකාරයෙහි “අඞි ලඝෞ හ්‍රස්ව උපධායාඃ- ලඝොර්දීර්ඝඃ” යන සූත්‍රවලින් විහිත අඞ් කාර්‍ය්‍යය නො වේ.)

**ණ්‍යන්ත ප්‍රක්‍රියා**, ණ්‍යන්ත ධාතූන් පිළිබඳ පද සාධන ක්‍රියාව; **ඉති**, මෙසේ යි.

## ණ්‍යන්ත ප්‍රක්‍රියාව සමාප්ත යි.

a. **අථ සාන්ත ප්‍රක්‍රියා නිරූප්‍යතෙ.**

## 182. ඉච්ඡායාමාත්මනඃ සඃ.

**(ඉච්ඡායාම් 7-1. ආත්මනඃ 6-1. සඃ 1-1.)**

b. **ධාතොරිච්ඡායාමර්ථෙ සඃ ප්‍රත්‍යයො භවති සා චෙත් ස්වසම්බන්ධිනි.**

**"ද්විශ්ච" "ස ධාතුඃ." ධාතුඤ්චාදජ් තිබාදි. "අදෙ." (1) භවිතුමිච්ඡති= බුභූෂති.**

---

a. අථ, ස්‍යන්ත ප්‍රක්‍රියාවට අනතුරු ව; සාන්ත ප්‍රක්‍රියා, ස ප්‍රත්‍යයාන්ත ධාතුන්ගේ පද සාධන ක්‍රියාව; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ.

182. ස ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ධාතොඃ" යන සූත්‍රය අනුවෘත්ත වේ. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ආත්මනඃ, තමන් පිළිබඳ; ඉච්ඡායාම්, ඉච්ඡාර්ථයෙහි; සඃ, ස ප්‍රත්‍යය වේ.

b. ධාතොඃ, ධාතුහු කෙරෙන්; ඉච්ඡායාම් අර්ථෙ, කැමති වීම ය යන අර්ථයෙහි; චෙත්, ඉදින්; සා, ඒ ඉච්ඡාතොමෝ; ස්වසම්බන්ධිනී, තමන් පිළිබඳ වූවා නම්; සඃ ප්‍රත්‍යයඃ භවති, ස ප්‍රත්‍යය වේ.

("ඉච්ඡති" යන්නෙන් කියවෙන ඉච්ඡා සඞ්ඛ්‍යාත ක්‍රියාවත් ඊට මුලින් යෙදෙන තුමන්ත ක්‍රියාවත් සමාන කර්තෘක බව "සා චෙත් ස්වසම්බන්ධිනි" යන්නෙන් අඟවයි. එහෙයින් ම සිද්ධාන්ත චන්ද්‍රිකා තත්ත්වදීපිකාවෙහි "ආද් භුවි කර්මණ්‍යන්‍යතඃ කර්මණ්‍යනුවර්ත්‍ය පඤ්චම්‍යා විපරිණම්‍ය කර්මණො ධාතොරිති සාමානාධිකරණ්‍යෙන ව්‍යාඛ්‍යෙයම්" යනුවෙන් මේ සූත්‍රයට "ආද් භුවි කර්මණි" යන සූත්‍රයෙන් විභක්ති විපර්යාස වශයෙන් "කර්මණඃ" යි අනුවර්තනය කොට තුල්‍යාධිකරණ භාවයෙන් "කර්ම වූ ධාතුහු කෙරෙන්" ස ප්‍රත්‍යය වේ යයි අර්ථ කිය යුතු බව කීහ. භවිතුම් ඉච්ඡති යි කී කල්හි "ඉච්ඡති" යන ක්‍රියාවට කර්මය වූයේ "භවිතුම්" යන තුමන්ත ධාතුවෙන් කියවෙන වීම යි. එහෙයින් ස ප්‍රත්‍යය වන්නේ ඒ ධාතුවෙන් පර ව ය. ස්වසම්බන්ධි ඉච්ඡාර්ථයෙහි යයි කී බැවින් කැමති වනු ලබන ක්‍රියාව තමන් පිළිබඳ විය යුතු යි. නො එසේ වුව ස ප්‍රත්‍යය නො වේ. ශිෂ්‍යාණාං පඨනමිච්ඡති ගුරුඃ යන මෙහි කැමති වනු ලබන්නේ පඨනය යි. එය ගුරුහු පිළිබඳ නො වේ. ශිෂ්‍යයන් පිළිබඳ ය. එහෙයින් ස ප්‍රත්‍යය නො වේ.)

"ද්විශ්ච" යන සූත්‍රයෙන් ද්විත්ව වේ. (එවිට "භූභූ + ස" යි සිටී. "හ්‍රස්වඃ" යි පූර්ව රූපයට හ්‍රස්ව වේ. "ඣපානාං ජබචපාඃ" යි පූර්ව භකාරයට බකාරය වේ. "ඛ්විලාත් ෂඃ සඃ කෘතස්‍ය" යි සකාර

## 183. වුඃ සෙ. (වුඃ 5-1. සෙ 7-1.)

a. උශච ආ ච= වඃ, තස්මාත්= වුඃ. උවණ්ණාන්තාදාවණ්ණාන්තාචච ග්‍රහගුහිභ්‍යාඤ්ච සෙ පරෙ ඉට් න භවති. "නානිටි සෙ."

(2) භූෂ ජ්ලවන තරණයොඃ. භාම්‍යන්තාත් පරස්‍ය සස්‍ය කිත්ත්වං වාච්‍යම්. "සෘත ඉර්" තරිතුම්ච්ඡති= තිතිර්ෂති-අතිතිර්ෂීත්.

---

යට ෂකාරය වේ. එකල්හි "බුභූෂ" යි වේ.) "ස ධාතූඃ" යන සූත්‍රයෙන් ඊට ධාතු සංඥ වේ. ධාතුත්වාත්, ධාතු බැවින්; අප්, ("අප් කතීරි" යි) අප් විකරණය ද, තිබාදි, තිප්- තස්- අන්ති යනාදිය ද වේ. "අදෙ" යන සූත්‍රයෙන් ෂකාරසථ අකාරයට ලොප් වේ. භවිතුම්, වන්නට; ඉච්ඡති, කැමති වෙයි යන අර්ථයෙහි; බුභූෂති, බුභූෂති යනු වේ.

183. ඉට් ප්‍රතිෂෙධ විධි සූත්‍ර යි. "සිසතාසීස්‍යපාම්ට්" යි 'ඉට්' යනු ද, "නෛකස්වරාදනුදාත්තාත්" යි 'න' යනු ද අනුවෘත්ත යි. සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; වුඃ, උවණ්ණාන්ත- ඍවණ්ණාන්ත ධාතුන් ෂකාරෙන් පර ව; න ඉට්, ඉඩාගම නො වේ.

a. ඌඃ ච, උවණ්ණය ද, ආ ච, ඍවණ්ණය ද; වඃ, වෘ යනු වේ. තස්මාත්, ඔහු කෙරෙන් යන අර්ථයෙහි; වුඃ, වුඃ යනු වේ. සෙ පරෙ, ස ප්‍රත්‍යය පර කල්හි; උවණ්ණාන්තාත්, උවණ්ණාන්ත ධාතුහු කෙරෙන් ද; ඍවණ්ණාන්තාත් ච, ඍවණ්ණාන්ත ධාතුහු කෙරෙන් ද; ග්‍රහගුහිභ්‍යාං ච, ග්‍රහ උපාදානෙ- ගුහූ සංවරණෙ යන ධාතු දෙදෙනා කෙරෙන් ද; ඉට් න භවති, ඉඩාගම නො වේ. ("සිසතාසීස්‍යපාම්ට්" යන සූත්‍රයෙන් ස ප්‍රත්‍යය සම්බන්ධ ව විහිත ඉඩාගමය මෙයින් ප්‍රතිෂිද්ධ ය.) "නානිටි සෙ" යන සූත්‍රයෙන් ඉඩාගම රහිත සප්‍රත්‍යය පර කල්හි ගුණ ප්‍රතිෂෙධය වේ. (බුභූෂති, බුභූෂෙත්; බුභූෂතු, අබුභූෂත්, බුභූෂාඤ්චකාර, බුභූෂ්‍යාත්, * බුභූෂිතා, බුභූෂිෂ්‍යති, අබුභූෂිෂ්‍යත්, අබුභූෂීත් යනු සත්තාර්‍ථ භූ ධාතුහුගේ ලඩාදි දශ ලකාරයෙහි පරස්මෛපද- ප්‍රථම පුරුෂෛක වචන යි. ප්‍රාප්ත්‍යර්ථ භූ ධාතුහුගේ දශ ලකාරයෙහි ආත්මනෙපද ප්‍රඃ එක වචන රූපයෝ "බුභූෂතෙ, බුභූෂෙත, බුභූෂතාම්, අබුභූෂත, බුභූෂාඤ්චක්‍රෙ, බුභූෂිෂීෂ්ට, බුභූෂිතා, බුභූෂිෂ්‍යතෙ, අබුභූෂිෂ්‍යත, අබුභූෂිෂ්ට" කියා වෙත්. මෙසේ ස ප්‍රත්‍යයාන්ත වූ කල්හි ද උභයපදී ධාතු උභය පදයෙහිත්, පරස්මෛපදී ධාතු පරස්මෛපදයෙහිත් ආත්මනෙපදී ධාතු ආත්මනෙපදයෙහිත් වර නැගිය යුතු.)

---

* "යතඃ" යි අකාර ලොපය විය.

(3) ඩුකෘඤ් කරණෙ, කර්තුමිච්ඡති= චිකීර්ෂති.

## 184. සෙ දීඝ්ඃ. (සෙ 7-1. දීඝඃ. 1-1.)

a සෙ පරෙ පූර්වස්‍ය දීඝෝ භවති.

(4) චිඤ් චයනෙ, "චිනොතෙඃ සණාදෞ කිත්වං වා වාච්‍යම්." චිකීෂති- චිචීෂති. (5) ජි ජයෙ, "සපරොක්ෂයොර් ජෙර්ගිඃ." ජෙතුමිච්ඡති= ජිගීෂති. (6) යු මිශ්‍රණෙ, යුයූෂති.

---

[2] තෘ පලවන තරණයොඃ, "තෘ" ධාතුව පැනීම ය- පීනීම ය යන අර්ථ දෙක්හි වේ. නාම්‍යන්තාත්, නාමින් ස්වරාන්ත ධාතුහු කෙරෙන්; පරස්‍ය, පර වූ; සස්‍ය, ස ප්‍රත්‍යයාගේ; කිත්වං වාච්‍යම්, කිත් බව කිය යුතු යි. "ඍත ඉර්" යන සූත්‍රයෙන් ඍකාරයට "ඉර්" ආදෙශ වේ. (මේ කිත් කිරීමේ ප්‍රයෝජන යි. ඉන් පසු "ය්වොර්වි හසෙ" යි දීඝ් වේ.) තරිතුම්, පීනන්නට; ඉච්ඡති, කැමති වෙයි යන අර්ථයෙහි; තිතීර්ෂති, තිතිර්ෂති යනු වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. ලුඞ්හි අතිතීර්ෂීත් යනු වේ.

[3] ඩුකෘඤ් කරණෙ, ඩු- ඤ් අනුබන්ධ "කෘ" ධාතුව කිරීමෙහි වේ. කර්තුම් ඉච්ඡති, කරන්නට කැමති වෙයි යන අර්ථයෙහි; චිකීර්ෂති, චිකීර්ෂති යනු වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. (චිකීර්ෂේත්, චිකීර්ෂතු, අචිකීර්ෂත්, චිකීර්ෂාඤ්චකාර, චිකීර්ෂ්‍යාත්, චිකීර්ෂිතා, චිකීර්ෂිෂ්‍යති, අචිකීර්ෂිෂ්‍යත්, අචිකීර්ෂීත් යනු සෙසු නව ලකාරයෙහි පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. "කෘ + ස" යි සිටි කල්හි "සෙ දීඝ්ඃ" යි දීඝ් වේ. "කෲ + ස" යි වේ. ඉන් පසු "ඍත ඉර්" යි ඉර් ආදෙශ වේ. එකල්හි "කිර් + ස" යි සිටි යි. නැවත චිත්ව වේ. "ය්වොර්වි හසෙ" යි දීඝ් ව "ස්විලාත්-" යි සකාරයට ෂකාර ව "කුහොශ්චුඃ" යි කකාරයට චකාර ව "චිකීර්ෂ" යි වේ. ඉක්බිති ඊට "ස ධාතුඃ" යි ධාතු සංඥ වී අප් විකරණය හා තිප් ප්‍රත්‍යය වීමෙන් "චිකීර්ෂති" යි සිද්ධ යි.)

184. දීඝ් විධි සූත්‍ර යි. "ස ධාතුඃ" යි විඃ විඃ වශයෙන් "ධාතොඃ" යනු අනුවෘත්ත වේ. සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; ධාතොඃ, ධාතුහට; දීඝ්ඃ, දීඝ් වේ.

a. සෙ පරෙ, ස ප්‍රත්‍යය පර කල්හි; පූර්වස්‍ය, පූර්ව ස්වරයට; දීඝ්ඃ භවති, දීඝ් වේ.

(4) චිඤ් චයනෙ, 'ඤ්' අනුබන්ධ "චි" ධාතුව රැස් කිරීමෙහි වේ. සණාදෞ, ස ප්‍රත්‍යය හා ණබාදිය පර කල්හි; චිනොතෙඃ, චි ධාතුහට; වා, විකල්පයෙන්; කිත්වං වාච්‍යම්, කිකාර බව කිය යුතු යි.

(7) ඩුපචඡ් පාකෙ, "යඃ සෙ" පක්තුමිච්ඡති= පිපක්‍ෂති.
(8) පාතු මිච්ඡති= පිපාසති.

a. ගෞණඃ ප්‍රකෘත්‍යර්ථො'ත්‍ර සාත්.

b. ප්‍රකෘති ප්‍රත්‍යයොර්මධ්‍යෙ ප්‍රත්‍යයාර්ථඃ ප්‍රධානීභූතඃ, අත්‍ර සප්‍රත්‍යයෙ තු වෛපරීත්‍යං, ප්‍රකෘත්‍යර්ථඃ ප්‍රධානීභූතඃ. තෙන කාඞ්ඛෙන පිපක්‍ෂතිත්‍යත්‍ර තෘතීයායාඃ පාකෙන සම්බන්ධො, න ත්විච්ඡයා.

---

විකිෂති- විචීෂති, "චෙතුම්ච්ඡති" (=රැස් කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි කිකාරාදෙශ පක්‍ෂයෙහි විකිෂති යනු ද, විකල්ප පක්‍ෂයෙහි විචීෂති යනු ද වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. (ලුඞ්හි අවිකිෂීත්- අවිචීෂීත් යනු වේ.)

(5) ජි ජයෙ, "ජි" ධාතුව දිනීමෙහි වේ. "සපරොක්‍ෂයොර්ජෙර්ගිඃ" යන සූත්‍රයෙන් ජියන්නට ගියන්න වේ. ජෙතුම් ඉච්ඡති= ජිගීෂති, දිනන්නට කැමති වෙයි යන අර්ථයෙහි ජිගීෂති යනු වේ. (ලුඞ්හි අජිගීෂීත් යනු වේ.)

(6) යු මිශ්‍රණෙ, "යු" ධාතුව මිශ්‍ර කිරීමෙහි වේ. යුයූෂති, "යවිතුම්ච්ඡති" (=මිශ්‍ර කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි යුයූෂති යනු වේ. (ලුඞ්හි අයුයූෂීත්- අයුයූෂිෂ්ටාම්- අයුයූෂිෂුඃ යනාදි වශයෙන් වර නැගේ.)

(7) ඩුපචඡ් පාකෙ, ඩු- අඡ් අනුබන්ධ "පච්" ධාතුව පිසීමෙහි වේ. "යඃ සෙ" යන සූත්‍රයෙන් පූර්ව රූපයේ අකාරයට ඉකාරය වේ. පක්තුම් ඉච්ඡති= පිපක්‍ෂති, පිසන්නට කැමති වෙයි යන අර්ථයෙහි පිපක්‍ෂති යනු වේ. ("චොඃ කුඃ" යි චයන්නට කයන්න විය. ලුඞ්හි අපිපක්‍ෂීත් යනු වේ.)

(8) පාතුම් ඉච්ඡති= පිපාසති, බොන්නට කැමති වෙයි යන අර්ථයෙහි පිපාසති යනු වේ. (ලුඞ්හි අපිපාසීත් යනු වේ. "පා පානෙ" ධාතු යි.)

a. සාත් අත්‍රයත්‍ර, ස ප්‍රත්‍යයෙන් අන් තන්හි; ප්‍රකෘති + අර්ථඃ, ප්‍රකෘත්‍යර්ථය හෙවත් ධාත්වර්ථය; ගෞණඃ, අප්‍රධාන වෙයි.

b. ප්‍රකෘති ප්‍රත්‍යයොඃ මධ්‍යෙ, ප්‍රකෘති ය- ප්‍රත්‍ය ය යන දෙක අතුරෙන්; ප්‍රත්‍යයාර්ථඃ, ප්‍රත්‍යය පිළිබඳ අර්ථය; ප්‍රධානීභූතඃ, මුඛ්‍ය වූයේ වෙයි. අත්‍ර සප්‍රත්‍යයෙ තු, මේ ස ප්‍රත්‍යය විෂයෙහි වනාහි; වෛපරීත්‍යම්, විපරීත බව වේ. (කෙසේ ද යත්?) ප්‍රකෘත්‍යර්ථඃ, ධාතු

**(9) මෘඞ් ප්‍රාණත්‍යාගෙ, මර්තුමිච්ඡති= මුමූෂති. "පොරුර්." (10) පෘෘ පාලනපූරණයොඃ, පුපූෂති. (11) වෘඞ් ඉත්‍යස්‍ය උර් වාච්‍යඃ. වෘඞ් වරණෙ, වරීතුමිච්ඡති= වුවූෂති. (12) රුදවිදමුෂ ග්‍රහිස්වපිප්‍රච්ඡඃ සඃ කිද් වාච්‍යඃ. රුදිර් අශ්‍රු විමොචනෙ, රුරුදිෂති.**

---

ප්‍රකෘතිය පිළිබඳ අර්ථය; ප්‍රධානීභූතඃ, මුඛ්‍ය වූයේ වේ. තෙන, එහෙයින්; කාෂෙඨන පිපඨිෂති ඉති අත්‍ර, "කාෂෙඨන පිපඨිෂති" (=දරින් පිසනු කැමති වෙයි) යන මෙහි; පාකෙන, පාක ක්‍රියාව හා; තෘතීයායාඃ, ("කාෂෙඨන" යන) තෘතීයාවගේ; සම්බන්ධඃ, සම්බන්ධය වේ. න තු ඉච්ඡයා, ඉච්ඡාව සමග නො වේ. (සාමාන්‍යයෙන් ප්‍රකෘති- ප්‍රත්‍යය දෙකින් ප්‍රත්‍යයාර්ථය ප්‍රධාන වන නමුත් මේ සප්‍රත්‍යය විෂයෙහි ඒ රීතිය වෙනස් වන බවත්, මෙහි දී සප්‍රත්‍යයේ අර්ථය අප්‍රධාන බවත්, ධාතු ප්‍රකෘතියේ අර්ථය ම ප්‍රධාන බවත් මෙයින් දක්වූහ.)

(9) **මෘඞ් ප්‍රාණ ත්‍යාගෙ,** ඞනුබන්ධ "මෘ" ධාතුව පණ හැරීමෙහි වේ. මර්තුම් ඉච්ඡති= මුමූෂති, මැරෙන්නට කැමති වෙයි යන අර්ථයෙහි මුමූෂති යනු වේ. (ලුඞ්හි අමුමූර්ෂීත් යනු වේ.) "සෙ දීඝඃ" යි දීඝ වේ. "පොරුර්" යන සූත්‍රයෙන් ඍකාරයට 'උර්' ආදෙශ වේ. ("ය්වොර්වි හසෙ" යි උකාරයට දීඝ වේ.)

(10) **පෘෘ පාලන පූරණයොඃ,** "පෘෘ" ධාතුව පාලන ය- පිරීම ය යන අර්ථ දෙක්හි වේ. පුපූෂති, "පර්තුං පරිතුං පරීතුං වා ඉච්ඡති" (=පුරවන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි පුපූෂති යනු වේ. (ලුඞ්හි අපුපූර්ෂීත් යනු වේ.)

(11) **වෘඞ් ඉති අස්‍ය,** වෘඞ් යන මේ ධාතුහට; උර් වාච්‍යඃ උර් ආදෙශය කිය යුතු යි. **වෘඞ් වරණෙ,** ඞනුබන්ධ "වෘ" ධාතුව ගිවිසීමෙහි වේ. වරීතුම් ඉච්ඡති= වුවූෂති, ගිවිසුමට කැමති වෙයි යන අර්ථයෙහි වුවූෂති යනු වේ. (ලුඞ්හි අවුවූර්ෂීත් යනු වේ.)

(12) **රුදවිදමුෂග්‍රහිස්වපිප්‍රච්ඡඃ,** රුද්- විද්- මුෂ්- ග්‍රහ්- ස්වප් ප්‍රච් යන ධාතූන් කෙරෙන් පර වූ; සඃ, ස ප්‍රත්‍යය; කිත් වාච්‍යඃ, කිත් යයි කිය යුතු යි. (ගුණ නො වීම හා ග්‍රහාදි ත්‍රිකයට සම්ප්‍රසාරණ වීම මේ කිත් සංඥා කිරීමේ ප්‍රයෝජනය යි.) **රුදිර් අශ්‍රු විමොචනෙ,** ඉර් අනුබන්ධ "රුද්" ධාතුව කඳුලු මිදීමෙහි වේ. රුරුදිෂති, "රොදිතුමිච්ඡති" (=හඬන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි රුරුදිෂති යනු වේ. ලට් ප්‍ර: එක වචන යි. (රුරුදිෂෙත්, රුරුදිෂතු, අරුරුදිෂත්, රුරුදිෂාඤ්චකාර, රුරුදිෂ්‍යාත්, රුරුදිෂිතා, රුරුදිෂිෂ්‍යති, අරුරුදිෂිෂ්‍යත්, අරුරුදිෂීත් යනු සෙසු නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.)

**(13) විද් ඤානෙ, විවිදිෂති. (14) මුෂ ථෙයෙ, මුමුසිෂති. (15) ග්‍රහ උපාදානෙ, "හො ඪඃ" "ආදිජබානාම්–" "ෂඪොඃ කඃ සෙ" ෂත්වම්, ක්ෂඃ. ග්‍රහිතුම්ච්ඡති= ජිඝෘක්ෂති. (16) සුෂුප්සති.**

**(17) ප්‍රච්ඡ ඥීප්සායාම්. කෘෘ ගෘෘ දෘ ධෘ ප්‍රච්ඡ සම්ඩ අඤ්ජු ශුඩ්තිනාං සසේ‍යඩ් වක්තව්‍යඃ. පිපෘච්ඡිෂති. (18) කරිතු මිච්ඡති= චිකරිෂති. (19) ජිගරිෂති– ජිගලිෂති. (20) දිදරිෂතෙ.**

---

(13) විද් ඤානෙ, "විද්" ධාතුව දැනීමෙහි වේ. විවිදිෂති, "වෙදිතු මිච්ඡති" (=දැනගන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි විවිදිෂති යනු වේ. (ලුඞ්හි අවිවිදිෂීත් යනු වේ.)

(14) මූෂ ස්තෙයෙ, අකාරානුබන්ධ "මූෂ්" ධාතුව සොරකම්හි වේ. මුමූෂිෂති, "මොෂිතුමිච්ඡති" (=හොරෙන් ගන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි මුමූෂිෂති යනු වේ. (ලුඞ්හි අමුමූෂිෂීත් යනු වේ.)

(15) ග්‍රහ උපාදානෙ, අකාරානුබන්ධ "ග්‍රහ්" ධාතුව ගැන්මෙහි වේ. "හො ඪඃ" යන සූත්‍රයෙන් හකාරයට ඪකාරය වේ. "ආදි ජබානාං ඣභාන්තස්‍ය ඣභාඃ ස්ධ්වොඃ" යන සූත්‍රයෙන් ගකාරයට ඝකාරය වේ. "ෂඪොඃ කඃ සෙ" යන සූත්‍රයෙන් ඪකාරයට කකාරය වේ. ෂත්වම්, ("ඉණ්කොඃ ෂඃ සඃ කෘතස්‍ය" යි සකාරයට) ෂකාර බව වේ. ක්ෂඃ, ("කෂසංයොගෙ ක්ෂඃ" යි ක– ෂ දෙකට) ක්ෂ යන්න වේ. ග්‍රහීතුම් ඉච්ඡති= ජිඝෘක්ෂති, ගන්නට කැමති වෙයි යන අර්ථයෙහි ජිඝෘක්ෂති යනු වේ. (ලුඞ්හි අජිඝෘක්ෂීත්, අජිඝෘක්ෂිෂ්වාම්, අජිඝෘක්ෂිෂුඃ යනාදි වශයෙන් වර නැගේ.)

(16) සුෂුප්සති, "ස්වප්තුමිච්ඡති" (=නිදන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි සුෂුප්සති යනු වේ. ("ඤිෂ්වප් ශයෙ" යන ධාතු ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. (ලිට්– ආශීර් ලිඞ්– ලෘඞ්– ලුඞ් ප්‍රථම පුරුෂෛක වචනයන්හි සුෂුප්සාඤ්චකාර– සුෂුප්ස්‍යාත්– අසුෂුප්සිෂ්‍යත්– අසුෂුප්සීත් යනු වේ.)

(17) ප්‍රච්ඡ ඥීප්සායාම්, අකාරානුබන්ධ "ප්‍රච්ඡ්" ධාතුව දැනගණු කැමති බැව්හි වේ. කෘෘ ගෘෘ—ඩර්තීනාම්, කෘෘ– ගෘෘ– දෘ– ධෘ– ප්‍රච්ඡ– සම්ඞ– අඤ්ජු– අශූඞ්– ඍ යන මේ ධාතුන්ගේ; සස්‍ය, ස ප්‍රත්‍යය සම්බන්ධ ව; ඉට් වක්තව්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. පිපෘච්ඡිෂති, "ප්‍රෂ්ටුමිච්ඡති" (=විචාරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි පිපෘච්ඡිෂති යනු වේ. (ලුඞ්හි අපිපෘච්ඡිෂීත් යනු වේ.)

(18) කරිතුම් ඉච්ඡති– *චිකරිෂති (=චිකරීෂති,) විසුරුවන්නට කැමති වෙයි යන අර්ථයෙහි චිකරිෂති (=චිකරීෂති) යනු වේ. (ලුඞ්හි අචිකරිෂීත් යනු යි. "කෘෘ වික්ෂෙපෙ" ධාතු යි )

---

* ඉඩාගමයට දීර්ඝ ද වේය යනු මු: බො:

**(21) දිධරිෂතෙ.* (22) සිසමිෂතෙ. (23) "ස්වරාදෙඃ පරඃ" අඤ්ජිජිෂති. (24) අශිශිෂතෙ. (25) අරිරිෂති. (26) අද් හ ක්ෂණෙ. "සිසයොඃ–" ඉති ඝසාදෙශඃ "සඝෙතා'නපි" අත්තුමිච්ඡති= ජිඝත්සති.**

---

(19) ජිගරිෂති(=ජිගරීෂති)-ජිගලිෂති, "ගරිතුම්ච්ඡති" (=ගිලින්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ජිගරිෂති (=ජිගරීෂති) යනු ද, ජිගලිෂති යනු ද වේ. ("ගෘ නිගරණෙ" යන ධාතු ලට් ප්‍ර: එක වචන යි. (ලුඞ්හි අජිගරිෂීත්- අජිගලිෂීත් යනු වේ. ගිරතෞ රස්‍ය වා ලඃ ස්වරෙ වාච්‍යඃ යි කීහෙයින් පක්ෂයෙක්හි රකාරයට ලකාරය විය.)

(20) දිදරිෂතෙ, "දර්තුම්ච්ඡති" (=ආදරය කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි දිදරිෂතෙ යනු වේ. (ලුඞ්හි අදිදරිෂිෂ්ට යනු යි. "දෘඞ් ආදරෙ" ධාතු යි.)

(21) දිධරිෂතෙ, "ධර්තුම්ච්ඡති" (=දරන්නට කැමති වෙයි) වාක්‍යයෙහි දිධරිෂතෙ යනු වේ. (ලුඞ්හි අදිධරිෂිෂ්ට යනු යි. "ධෘඞ් අවස්ථානෙ" ධාතු යි.)

(22) සිසමිෂතෙ, "සෙමතුම්ච්ඡති" (සිනා සෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි සිසමිෂතෙ යනු වේ. (ලුඞ්හි අසිසමිෂිෂ්ට, අසිසමිෂිෂාතාම්, අසිසමිෂිෂත යනාදි වශයෙන් වර නැගේ. "ස්මිඞ් ඊෂද්ධසනෙ" ධාතු යි.)

(23) "ස්වරාදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පරාවයවයට ද්විත්ව වේ. අඤ්ජිජිෂති, "අඤ්ජිතු මිච්ඡති" (= අඤ්ජනය කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි අඤ්ජිජිෂති යනු වේ. (ආඤ්ජිජිෂත්- අඤ්ජිජිෂාඤ්චකාර- ආඤ්ජිජිෂිෂ්‍යත්- ආඤ්ජිජිෂීත් යනු පිළිවෙළින් ලඞ්- ලිට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එක වචන යි. "අඤ්ජූ ව්‍යක්ති ම්‍රක්ෂණ කාන්තිගතිෂු" යන ධාතු යි. "ස්වරාත් පරඃ සංයොගාද්යො-න්‍දරා ද්විනී" යි කී හෙයින් "ස්වරාදෙඃ පරඃ" යන්නෙන් විහිත ද්විත්වය නකාරය හැර ජකාරයට විය. ධාතු ප්‍රකෘතිය "අන්ජ්" යනු යි. ඤකාරය ලාක්ෂණික ය.)

(24) අශිශිෂතෙ, "අශිතුම්ච්ඡති" (=පැතිරෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි අශිශිෂතෙ යනු වේ. (ලුඞ්හි ආශිශිෂිෂ්ට, ආශිශිෂිෂාතාම්, ආශිශිෂිෂත යනාදි වශයෙන් වර නැගේ. "අශූඞ් ව්‍යාප්තෞ" යන ධාතු යි.)

---

* දිදරිෂති- දිධරිෂති- පොත්හි.

**a. හනතීඩොඃ සො ඤිත්.**

**b. හනතීඩොධාතොඃ සො ඤිද් භවති. (27) හන් හිංසාගත්‍යොඃ. ද්විත්වම්. * "කුහොශ්චුඃ" "ඛඵානාං ජබචපාඃ" "යඃ සෙ" "හනො ඝ් නෙ" "අත උපධායාඃ" "නශ්චාපදාන්තෙ ඣලෙ" "ස ධාතුඃ" "අප් කත්රි" "අදෙ" හන්තුමිච්ඡති= ජිඝාංසති.**

---

(25) අරිරිෂති, "අර්තුමිච්ඡති" (=යන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි අරිරිෂති යනු වේ. (ලඞ්- ලෘඞ්- ලුඞ් ප්‍රː එක වචන යන්හි ආරිරිෂත්- ආරිරිෂිෂ්‍යත්- ආරිරිෂීත් යනු වේ. "ඍ ගතෞ" යන ධාතු යි. පළමු කොට "ඍ + ඉස" යි සිටී. ඉන් පසු ගුණ ව, ෂත්ව වේ. එකල්හි "අරිෂ" යි සිටී යි. "ස්වරාදෙඃ පරඃ" යි රිකාරයට ද්විත්ව ව තිබාදිය වීමෙන් "අරිරිෂති" යි වේ.

(26) අද් භක්ෂණෙ, අද් ධාතුව කෑමෙහි වේ. සිසයොඃ- ඉති, "සිසයොරදෙඝ්සෘ ලිටි තු වා" යි කී හෙයින්; ඝසාදෙශඃ, ඝස් ආදෙශ වේ. "සඃ සො'නපි" යන සූත්‍රයෙන් 'ඝස්' ආදෙශයෙහි සකාරයට තකාරය වේ. අත්තුම් ඉච්ඡති= ජිඝත්සති, කන්නට කැමති වෙයි යන අර්ථයෙහි ජිඝත්සති යනු වේ. (ලිට්හි ජිඝත්සාඤ්චකාර යනු ද, ලුඞ්හි අජිඝත්සීත් යනු ද වේ.)

a. හනතීඩොඃ, හන්- ඉඞ් යන ධාතු දෙදෙනාගේ; සඃ, ස ප්‍රත්‍යය; ඤිත්, ඤිත් සංඥ වේ.

b. හනතීඩොඃ ධාත්වොඃ, හන්- ඉඞ් යන ධාතු දෙදෙනාගේ; සඃ, ස ප්‍රත්‍යය; ඤිත් භවති, ඤිත් සංඥ වේ. (වෘද්ධි වීම එහි ප්‍රයෝජන යි.)

(27) හන් හිංසා ගත්‍යොඃ, "හන්" ධාතුව හිංසා ය- ගමන ය යන අර්ථ දෙක්හි වේ. ද්විත්වම්, ද්විත්ව වේ. "කුහොශ්චුඃ" යන සූත්‍රයෙන් පූර්ව හකාරයට ඣකාරය වේ. "ඛඵානාං ජබචපාඃ" යන සූත්‍රයෙන් ඣකාරයට ජකාරය වේ. "යඃ සෙ" යන සූත්‍රයෙන් පූර්ව රූපයේ අකාරයට ඉකාරය වේ. "හනො ඝ් නෙ" යන සූත්‍රයෙන් ප්‍රකෘතිසථ හකාරයට ඝකාරය වේ. "අත උපධායාඃ" යන සූත්‍රයෙන් ඝකාරසථ අකාරයට වෘද්ධි වේ. "නශ්චාපදාන්තෙ ඣලෙ" යන සූත්‍රයෙන් නකාරයට අනුස්වාරය වේ. (එකල "ජිඝාංස" යි සිටී.) "ස ධාතුඃ" යන සූත්‍රයෙන් එය ධාතු සංඥ වේ. "අප් කත්රි" යන සූත්‍ර

---

* ඇතැම් පොත්හි මෙතැන්හි "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි පැණේ. ඒ නිරර්ථක ය.

**(28) ඉඞඃ සෙ ගම් වාච්‍යඃ අධ්‍යෙතුමිච්ඡති= අධිජිගාංසතෙ. (29) ගමෙඃ සෙ ඉඩ් වාච්‍යඃ. ගන්තුමිච්ඡති= ජිගමිෂති.**

## 185. ඉ‍ෙසස්. (ඉස් 1-1. සෙ 7-1.)

**a අපිත් දුධාරභ්ලභ්ශක්පද්පත්මිමීමාමාඞ් මෙඞ් හිංසාර්ථරාධාං ස්වරස්‍ය සෙ පරෙ ඉසාදෙශො භවති, පූර්වස්‍ය ච ලොපඃ.**

---

යෙන් අප් විකරණය වේ. "අදෙ" යන සූත්‍රයෙන් සකාරස්ථ අකාරයට ලොප් වේ. හන්තුම් ඉච්ඡති= ජිඝාංසති, නසන්නට කැමති වෙයි යන අර්ථයෙහි ජිඝාංසති යනු වේ. (ලුඞ්හි අජිඝාංසීත්, අජිඝාංසිෂ්ටාම්, අජිඝාංසිෂුඃ යනාදි වශයෙන් වර නැගේ.)

(28) සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; ඉඞඃ, ඉඞ් ධාතුහට; ගම් වාච්‍යඃ, 'ගම්' ආදෙශය කිය යුතු යි. අධ්‍යෙතුම් ඉච්ඡති= අධිජිගාංසතෙ, හදුරන්නට කැමති වෙයි යන අර්ථයෙහි අධිජිගාංසතෙ යනු වේ. (අධි පූර්ව "ඉඞ් අධ්‍යයනෙ" ධාතු ලට් ප්‍රඃ එක වචන යි. අධිජිගාංසෙතෙ, අධිජිගාංසතාම්, අධ්‍යජිගාංසත, අධිජිගාංසාඤ්චක්‍රෙ, අධිජිගාංසිෂීෂ්ට, අධිජිගාංසිතා, අධිජිගාංසිෂ්‍යතෙ, අධ්‍යජිගාංසිෂ්‍යත, අධ්‍යජිගාංසිෂ්ට යනු සෙසු නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෙක වචන යි.)

(29) ගමෙඃ, ගම් ධාතුහු කෙරෙන්; සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; ඉට් වාච්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. ගන්තුම් ඉච්ඡති= ජිගමිෂති, යන්නට කැමති වෙයි යන අර්ථයෙහි ජිගමිෂති යනු වේ. (ලුඞ්හි අජිගමිෂීත් යනු යි.)

185. ආදෙශ හා ලොප විධි සූත්‍ර යි. "දං හෙඃ" යි 'දම්' යනු ද, "ලොපඃ පචාං කිතෙ‍්‍ය වාස්‍ය" යි 'ලොපඃ' යනු ද, "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද "ද්‍යොඃ ස්වරෙ'පි පිති තොපධායාඃ" යි වි: වි: වශයෙන් 'ස්වරස්‍ය' යනු ද, "අපිහ්‍යනාදිර්ඞිත්" යි වි: වි: වශයෙන් 'අපිතාම්' යනු ද අනුවෘත්ත යි. සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; අපිතාම්, පිත් නුවූ; දම්, දා ආදි ධාතුන්ගේ; ස්වරස්‍ය, ස්වරයට; වා, ව්‍යවස්ථා වශයෙන්; ඉස්, ඉස් යනාදෙශ වේ. පූර්වස්‍ය, පූර්ව රූපයට; ලොපඃ, ලොප් වේ.

a. සෙ පරෙ, ස ප්‍රත්‍යය පර කල්හි; අපිත් දුධා— රාධාම්, පයන්ත ඉත් කොට නැති දා- ධා රූප ධාතු ය, රභ්- ලභ්- ශක්- පද්- පත්- මි- මී- මා- මාඞ්- මෙඞ් ධාතු ය, හිංසාර්ථ වූ රාධ් ධාතු ය යන මොවුන්ගේ; ස්වරස්‍ය, ස්වරයට; ඉසාදෙශඃ භවති, 'ඉස්' ආදෙශ වේ. පූර්වස්‍ය ච, පූර්ව රූපයට ද; ලොපඃ, ලොප් වේ.

**(30) දිත්සති. (31) ඛිත්සති. (32) "සොකාරගද්දෙසුව" "බිසෙ චපා ඛසානාමි" රිප්සතෙ. * (33) ලිප්සතෙ. * (34) ශික්ෂති. × (35) පිත්සතෙ. (36) "පතො වෙචි" පිත්සති- පිපතිෂති. ඉචි පක්ෂෙ ඉස් පූර්වලොපෞ න භවතඃ.**

(මේ සූත්‍රයෙන් කායර්‍ය ද්වයෙක් විහිත ය. යථොක්ත ධාතූන්ගේ ස්වරයට "ඉස්" ආදෙශය ද, ද්විත්වයෙහි පූර්ව රූපයට ලොපය ද යන දෙක යි. අනුවෘත්ත වන වා ශබ්දය ව්‍යවස්ථා වාචක ය. ඒ ව්‍යවස්ථාව නම් ඉඩාගම රහිත සයන්ත පර කල්හි ම මේ විධි චය වේ ය යනු යි. එබැවින් අනිට් පක්ෂයෙහි "පතිතුමිච්ඡති= පිත්සති" යනු ද, සෙට් පක්ෂයෙහි "පිපතිෂති" යනු ද වේ. පිත් නුවූ (=අපිත්) යයි කී හෙයින් "දෛප් ශොධනෙ- දප් ලවනෙ" යන ධාතු දෙකට මේ විධීහු නො වෙත්.

භ්වාදි පරස්මෛපදි දණ් දානෙ- භ්වාදි ආත්මනෙපදි දෙඞ් පාලනෙ- ජුහොත්‍යාදි උභයපදි ඩුදාඤ් දානෙ- දිවාදි පරස්මෛපදි දො අවඛණ්ඩනෙ යන මොහු දා රූප ධාතුහු ය. භ්වාදි පරස්මෛපදි ධෙට් පානෙ- ජුහොත්‍යාදි උභයපදි ඩුධාඤ් ධාරණෙ යන දෙක ධා රූප ධාතුහු ය. "රභ්" යන්නෙන් රභ රාභස්‍යෙ යන ධාතුව ද, "ලභ්" යන්නෙන් ඩුලභෂ් ප්‍රාප්තෞ යන ධාතුව ද, "ශක්" යන්නෙන් ස්වාදි පරස්මෛපදි ශක්ලෘ ශක්තෞ- දිවාදි උභයපදි ශක මර්ෂණෙ යන ධාතු ද්වය ද, "පද්" යන්නෙන් පද ගතෞ යන ධාතුව ද, "පත්" යන්නෙන් පත්ලෘ පතනෙ යන ධාතුව ද, "මි" යන්නෙන් ස්වාදි උභයපදි ඩුමිඤ් ප්‍රක්ෂෙපණෙ- දිවාදි ආත්මනෙපදි මීඞ් ප්‍රාණ වියොගෙ යන ධාතු ද්වය ද, "මී" යන්නෙන් ක්‍ර්‍යාදි උභයපදි මීඤ් හිංසායාම් යන ධාතුව ද, "මා" යන්නෙන් අදාදි පරස්මෛපදි මා මානෙ යන ධාතුව ද, "මාඞ්" යන්නෙන් ජුහොත්‍යාදි- දිවාදි ආත්මනෙපදි මාඞ් මානෙ යන ධාතු ද්වය ද, "මෙඞ්" යන්නෙන් භ්වාදි ආත්මනෙපදි මෙඞ් ප්‍රණිදානෙ යන ධාතුව ද ගැණෙති. මීලඟට පිළිවෙළින් නිදර්ශන දක්වන ලදහ.)

(30) දිත්සති, "දාතුමිච්ඡති" (=දෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි දිත්සති යනු වේ. ලට් පඃ ප්‍රඃ එක වචන යි. (දිත්සෙත්, දිත්සතු, අදිත්සත්, දිත්සාඤ්චකාර, දිත්ස්‍යාත්, දිත්සිතා, දිත්සිෂ්‍යති, අදිත්සිෂ්‍යත්, අදිත්සීත් යනු සෙසු නව ලකාරයෙහි පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචන යි. "සඃස්‍යාර්ධධාතුකෙ" යි 'ඉස්' ආදෙශයෙහි සකාරයට තකාරය වේ.)

* රිප්සති - ලිප්සති, පොත්හි.

× ශික්ෂතෙ,පොත්හි.

**(37- 38) ඩු මිඤ් ප්‍රක්ෂෙපෙ- මිඤ් හිංසායාම්, මිත්සති. (39- 40) මාඞ් මානෙ- මෙඞ් ශොධනෙ, මිත්සතෙ. (41) රධ සංසිද්ධෞ, රිත්සති. ***

(31) ධිත්සති, "ධාතුමිච්ඡති" (=දරන්නට හෝ බොන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ධිත්සති යනු වේ. (ලුඞ්හි අධිත්සීත් යනු යි )

(32) "සෙකාරුද්ධේශව" යන සූත්‍රයෙන් ඉස් ආදෙශයේ සකාර යට ලොප් වේ. "ඛසෙ චපා ඣසානාම්" යන සූත්‍රයෙන් භයන්නට පයන්න වේ. රිප්සතෙ, "රබ්ධුමිච්ඡති" (=පටන් ගන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි රිප්සතෙ යනු වේ. (ලුඞ්හි අරිප්සිෂ්ට යනු යි.)

(33) ලිප්සතෙ, "ලබ්ධුමිච්ඡති" (=ලබන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ලිප්සතෙ යනු වේ. (ලුඞ්හි අලිප්සිෂ්ට යනු යි.)

(34) ශික්ෂති, "ශක්තුමිච්ඡති" (=සමත් වන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ශික්ෂති යනු වේ. (ලුඞ්හි අශික්ෂීත් යනු යි.)

(35) පිත්සතෙ, "පත්තුමිච්ඡති" (=පැමිණෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි පිත්සතෙ යනු වේ. ("ඛසෙ චපාඃ–" යි දකාර යට තකාරය විය. ලුඞ්හි අපිත්සිෂ්ට– අපිත්සිෂාතාම්– අපිත්සිෂත යනාදි වශයෙන් වර නැඟේ.)

(36) "පතො වෙට්" × යන සූත්‍රයෙන් විකල්පයෙන් ඉඩාගම වේ. පිත්සති- පිපතිෂති, "පතිතුමිච්ඡති" (වැටෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි පිත්සති යනු ද, විකල්පයෙන් ඉඩාගම වූ පක්ෂයෙහි පිපතිෂති යනු ද වේ. ඉට් පක්ෂෙ, ඉඩාගම පක්ෂයෙහි; ඉස් පූර්‍ව ලොපෞ, ඉස් ආදෙශ- පූර්‍ව ලොප දෙදෙන; න භවතඃ, නො වෙත්. (ලුඞ්හි අපිත්සීත්- අපිපතිෂීත් යනු වේ.)

(37–38) ඩුමිඤ් ප්‍රක්ෂෙපෙ, ඩු- ඤ් අනුබන්ධ "මි" ධාතුව බහා ලීමෙහි වේ. මීඤ් හිංසායාම් 'ඤ්' අනුබන්ධ "මී" ධාතුව පෙළීමෙහි වේ. මිත්සති (=මිත්සතෙ) "මෙතු මිච්ඡති" (=බහා ලන්නට නොහොත් පෙළන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි මිත්සති (=මිත්සතෙ) යනු වේ. (ලුඞ්හි අමිත්සීත්=අමිත්සිෂ්ට යනු යි.)

---

* අත්‍ර තු හිංසාර්‍ථඃ- මු: බො: ටීකා.

× මෙය පෙර නො කී සූත්‍රයෙකි. සූත්‍ර පාඨයෙහි පෙණේ. වා යනු ව්‍යවස්ථා වාචක යි. එහෙයින් මේ ඉඩ් විකල්පය සන්‍ප්‍රත්‍යය සම්බන්ධ ව ම වේ. "පතෘ පතනෙ ඉත්‍යෙතස්මාදිඩ් වා භවති සෙ පරෙ" යි වෘත්තිය ගත යුතු යි.

## 186. ආප්නොතෙරීඃ. (ආප්නොතෙඃ 6- 1, ඊඃ 1-1.)

**a. ආප්නොතෙරාකාරස්සෙකාරෙ භවති සෙ පරෙ, පුබ්බස්ස ච ලොපඃ. (42) ආපෘ ව්‍යාපෙතෟ, ඊප්සති.**

---

(39–40) මාඞ් මානෙ, ඞනුබන්ධ "මා" ධාතුව මැනීමෙහි වේ. මෙඞ් ශොධනෙ, ඞනුබන්ධ "මෙ" ධාතුව පවිත්‍ර කිරීමෙහි වේ. මිත්සතෙ, "මාතු මිච්ඡති" (=මනින්නට නොහොත් පවිත්‍ර කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි මිත්සතෙ යනු වේ. (ලුඞ්හි අමිත්සිෂ්ට– අමිත්සිෂාතාම්– අමිත්සිෂත යනාදි වශයෙන් වර නැගේ. මි– මී– මා– මෙ යන ධාතු චතුෂ්කයෙන් ම සිද්ධ වන සාන්ත රූපයෝ එක් බඳු වෙති. වෙනස නම් මි– මී දෙක උභය පදයෙහි ද, මා– මෙ දෙක හුදු ආත්මනෙපදයෙහි ද වර නැගීම පමණෙකි. ඞනුබන්ධ නුවූ "මා මානෙ" ධාතුවෙන් ද මෙසේ ම සිද්ධ ව පරස්මෛපදයෙහි පමණක් වර නැගේ.)

(41) රාධ සංසිද්ධෞ, අකාරානුබන්ධ "රාධ්" ධාතුව මනා කොට සිදු වීමෙහි වේ. (මෙහි වනාහි හිංසාර්ථයෙහි වේ.) රිත්සති, "රාද්ධු මිච්ඡති" (=හිංසා කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි රිත්සති යනු වේ. (ලුඞ්හි අරිත්සීත් යනු යි.)

186. ආදෙශ හා ලොප විධි සූත්‍ර යි. "ඉච්ඡායාමාතමනඃ සඃ" යි ව: වි: වශයෙන් 'සෙ' යනු ද, "නාතඃ" යි 'ආතඃ' යනු ද, "උස්‍යා ලොපඃ" යි 'ලොපඃ' යනු ද, "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද අනුවෘත්ත යි. සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; ආපෙනාතෙඃ, ආප් ධාතුහුගේ; ආතඃ, ආකාරයට; ඊඃ, ඊකාරය වේ. පූර්වස්‍ය, (ද්විත්ව-යෙහි) පූර්ව රූපයට; ලොපඃ, ලොප් වේ.

a. සෙ පරෙ, ස ප්‍රත්‍යය පර කල්හි; ආපෙනාතෙඃ, ආප් ධාතුහුගේ; ආකාරස්‍ය, ආකාරයට; ඊකාරඃ භවති, ඊකාරය වේ. පූර්වස්‍ය ච, පූර්ව රූපයට ද; ලොපඃ, ලොප් වේ.

(42) ආපෘ ව්‍යාපෙතෟ, ළනුබන්ධ "ආප්" ධාතුව පැතිරීම් අර්ථයෙහි වේ. ඊප්සති, "ආප්තුමිච්ඡති" (=පැතිරෙන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ඊප්සති යනු වේ. (ඊප්සෙත්, ඊප්සතු, ඓප්සත්, ඊප්සාඤ්චකාර, ඊප්ස්‍යාත්, ඊප්සිතා, ඊප්සිෂ්‍යති, ඓප්සිෂ්‍යත්, ඓප්සීත් යනු සෙසු නව ළකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.)

**187. අශෙරනායො වා.** (අශෙඃ 5-1. අනායඃ 1-1. වා, නි:)

a. **අශෙරිච්ඡායාං සස්ථානෙ වා අනායප්‍රත්‍යයො භවති. (43) අශනායති- අශිශිෂති.**

b. **පත තන දරිද්‍රාභ්‍යඃ සෙ වා ඉඩ් වාච්‍යඃ.**

**(44) තිතනිෂති- තිතංසති. තනෙඃ සෙ වා දීර්ඝඃ. තිතාංසති. (45) දිදරිද්‍රිෂති- දිදරිද්‍රාසති.**

---

187. අනාය ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ඉච්ඡායාමාත්මනඃ සඃ" යි 'ඉච්ඡායාම්- ආත්මනඃ' යනු අනුවෘත්ත වේ. අශෙඃ, අශ් ධාතුහු කෙරෙන්; ආත්මනඃ, තමන් පිළිබඳ; ඉච්ඡායාම්, ඉච්ඡාර්ථයෙහි; වා, විකල්පයෙන්; අනායඃ, අනාය ප්‍රත්‍යය වේ.

a. අශෙඃ, "අශ භොජනෙ" යන ධාතුහු කෙරෙන්; ඉච්ඡායාම්, ඉච්ඡාර්ථයෙහි; සස්ථානෙ, සප්‍රත්‍යයාගේ ස්ථානයෙහි හෙවත් සප්‍රත්‍යය විය යුතු තැන්හි; වා, විකල්පයෙන්; අනාය ප්‍රත්‍යයඃ භවති, අනාය ප්‍රත්‍යය වේ. අශනායති- අශිශිෂති, "අශිතුම්ච්ඡති" (=අනුභව කරන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි අශනායති යනු ද, විකල්ප පක්ෂයෙහි ස ප්‍රත්‍යය වීමෙන් අශිශිෂති යනු ද වේ. (ලට් ප්‍ර: එක වචන යි. ආශනායත්- ආශිශිෂත්, අශනායාඤ්චකාර- අශිශිෂාඤ්චකාර, ආශනායිෂ්‍යත්- ආශිශිෂිෂ්‍යත්, ආශනායීත්- ආශිශිෂීත් යනු පිළිවෙළින් දෙක බැගින් ලඞ්- ලිට්- ලෘඞ්- ලුඞ්- ප්‍රථම පුරුෂෛක වචන රූපයෝ යි.)

b. සෙ, සප්‍රත්‍යය පර කල්හි; පත තන දරිද්‍රාභ්‍යඃ, පතෘ පතනෙ- තනු විස්තාරෙ- දරිද්‍රා දුර්ගතෞ යන ධාතූන් කෙරෙන් පර ව; වා, විකල්පයෙන්; ඉට් වාච්‍යඃ, ඉඩාගමය කිය යුතු යි. (සානන 'පත්' ධාතුව යට දක්වන ලදී.)

(44) තිතනිෂති- තිතංසති, "තනිතුම්ච්ඡති" (=පතුරුවන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි තිතනිෂති යනු ද, විකල්පයෙන් ඉඩාගම නුවූ පක්ෂයෙහි තිතංසති යනු ද වේ. සෙ, ස ප්‍රත්‍යය පර කල්හි; තනෙඃ, තන් ධාතුහට; වා, විකල්පයෙන්; දීර්ඝඃ, දීර්ඝ වේ. (එකල්හි) තිතාංසති, යනු වේ. (මෙසේ සප්‍රත්‍යයාන්ත තන් ධාතුව තුන් අයුරකින් වර නැගේ. ලුඞ්හි අතිතනිෂීත්- අතිතංසීත්- අතිතාංසීත් යනාදි වශයෙනි. අනිට් පක්ෂයෙහි තන් ධාතුහුගේ නකාරයට "නශ්චාපදාන්තෙ ඣලෙ" යි අනුස්වාරය වේ.)

(45) දිදරිද්‍රිෂති- දිදරිද්‍රාසති, "දරිද්‍රිතුම්ච්ඡති" (=දිළිඳු වන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි දිදරිද්‍රිෂති යනු ද, විකල්පයෙන් ඉඩාගම නුවූ පක්ෂයෙහි දිදරිද්‍රාසති යනු ද වේ. (ලුඞ්හි අදිදරිද්‍රිෂීත්- අදිදරිද්‍රාසීත් යනාදි වශයෙන් වර නැගේ.)

**a. දම්භිඥපිභ්‍යාං වෙඩිසෙස දීර්ඝතා ච. ***

**b. දම්භිඥපිභ්‍යාං ධාතුභ්‍යාං වා ඉඩ් භවති සප්‍රත්‍යයෙ පරෙ. යදා නෙට්, තදා කිම්? අනයොර්දම්භිඥපෙ‍්‍යාර්ධාත්වොඃ සානුස්වාරස්‍ය ස්වරස්‍ය ඉස් භවති. ඉකාරස්‍ය දීර්ඝතා, දම්භෙරිකාරස්‍ය වා දීර්ඝතා. චකාරත් පූර්වස්‍ය ලොපඃ.**

**(46) දම්භ දම්භනෙ, ආත්මනඃ දම්භිතු මිච්ඡති= දිදම්භිෂති. ද්විත්වම්, ඉස්, "ආදිජබානාම්-" "බසෙ චපා ඣසානාම්" "සෙකාරශ්‍රෙශච" වා දීර්ඝතා. ධිප්සති-ධිප්සති.**

---

a, සෙ, සප්‍රත්‍යය පර කල්හි; දම්භිඥපිභ්‍යාම්, දන්භ්-ඥප් ධාතු ද්වයෙන් පර ව; වා, විකල්පයෙන්; ඉට්, ඉඩාගම වේ. ඉස්, (විකල්ප පක්ෂයෙහි අනුස්වාර සහිත ස්වරයට) ඉස් ආදෙශ වේ. දීර්ඝතා ච, දීර්ඝ බව ද වේ.

b. සප්‍රත්‍යයෙ පරෙ, ස ප්‍රත්‍යය පර කල්හි; දම්භිඥපිභ්‍යාං ධාතුභ්‍යාම්, "දම්භ දම්භනෙ- ඥප ඥානඥාපනයොඃ" යන ධාතු දෙකෙන් පර ව; වා ඉට් භවති, විකල්පයෙන් ඉඩාගම වේ. යදා, යම් කාලෙක්හි; න ඉට්, ඉඩාගම නො වේ ද; තදා, එකල්හි; කිම්, කුමක් වන්නේ ද යත්? අනයොඃ දම්භිඥපෙ‍්‍යාඃ ධාත්වොඃ, මේ දන්භ්-ඥප් යන ධාතු දෙදෙනාගේ; සානුස්වාරස්‍ය, ("නශ්චාපදන්තෙ ඣසෙ" යි නකාරයට වූ) අනුස්වාරය සහිත; ස්වරස්‍ය, ස්වරයට; ඉස් භවති, ඉස් ආදෙශ වේ. ඉකාරස්‍ය, ඉකාරයට; දීර්ඝතා, දීර්ඝ බව වේ. දම්භෙඃ ඉකාරස්‍ය, දන්භ් ධාතුහු පිළිබඳ ඉකාරයට; වා දීර්ඝතා ච, විකල්පයෙන් දීර්ඝ බව ද වේ. (දන්භ්- ඥප් ධාතු ද්වයෙන් පර ව විකල්පයෙන් ඉඩාගම වන බව ද; අනිට් පක්ෂයෙහි සානුස්වාර ධාතු ස්වරයට "ඉස්" යනාදෙශ ව එහි ඉකාරයට දීර්ඝ වන බව ද, ඉතුදු දන්භ් ධාතුවට වන ඉස් ආදෙශයේ ඉකාරයට විකල්පයෙන් දීර්ඝ වන බව ද මෙයින් කීහ.) චකාරත්, ("දීර්ඝතා ච" යන තැන්හි) ච ශබ්ද බලයෙන්; පූර්වස්‍ය, පූර්ව රූපයට; ලොපඃ, ලොප් වේ.

(46) දම්භ දම්භනෙ, අකාරානුබන්ධ "දන්භ්" ධාතුව රැවටීමෙහි වේ. ආත්මනඃ දම්භිතුම්, තමා දම්භනය; ඉච්ඡති, කැමති වෙයි යන අර්ථයෙහි; දිදම්භිෂති, ඉඩාගම පක්ෂයෙහි දිදම්භිෂති යනු වේ. ද්විත්වම්, ද්විත්ව වේ. ඉස්, ඉස් යනාදෙශ වේ. (පූර්ව රූපයට ද ලොප් වේ.) "ආදිජබානාම්" යනාදි සූත්‍රයෙන් දකාරයට ධකාරය වේ. "බසෙ චපා ඣසානාම්" යන සූත්‍රයෙන් භකාරයට පකාරය වේ. "සෙකාරශ්‍රෙශච" යන සූත්‍රයෙන් සකාරයට ලොප් වේ. වා

---

* සාරස්වත සූත්‍රයෙක් නො වේ.

(47) ඥා'වබොධනෙ. "ඉච්ඡායාමාත්මනඃ සඃ" "ද්විශ්ච" "හ්‍රස්වඃ" "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" "යඃ සෙ" වා ඉට්. "ගුණඃ" "එ අය්" "ස්වරහීනම්–" ෂත්වම්. "ස ධාතුඃ" තිප්. අප්, "අදෙ" ආත්මනඃ ඥපයිතුමිච්ඡතීති= ජිඥපයිෂති. පක්ෂෙ, "ජිඥපි ස" ඉති සපිතෙ, ස්වරස්‍ය ඉස්, තස්‍ය දීර්ඝතා. පූර්වස්‍ය ලොපඃ. "ණෙඃ" "සෙකාරාද්දෙශ්ච" ඥීප්සති.

---

දීර්ඝතා, විකල්පයෙන් දීර්ඝ බව වේ. ඥීප්සති– ඥිප්සති, අනිට් පක්ෂයෙහි දීර්ඝ වීමෙන් ඥීප්සති යනු ද, දීර්ඝ නො වීමෙන් ඥිප්සති යනු ද වේ. (මෙසේ දමහ ධාතුව ද සප්‍රත්‍යයාන්ත වීමෙන් තුන් අයුරකින් වර නැගේ. ලුඞ්හි අදිදමහිෂීත්– අධීප්සීත්– අධිප්සීත් යනු ප්‍රථම පුරුෂෙක වචන යි.)

(47) ඥා අවබොධනෙ, "ඥා" ධාතුව අවබොධ කිරීමෙහි වේ. "ඉච්ඡායා මාත්මනඃ සඃ" යන සූත්‍රයෙන් ස ප්‍රත්‍යය වේ. "ද්විශ්ච" යන සූත්‍රයෙන් ද්විත්ව වේ. "හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් පූර්ව රූපයට හ්‍රස්ව වේ. "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යන සූත්‍රයෙන් ජකාරය ශෙෂ වේ. "යඃ සෙ" යන සූත්‍රයෙන් ජකාරයේ අකාරයට ඉකාරය වේ. වා ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. ("ධාතොඃ ප්‍රේරණෙ" යි ණිච් ප්‍රත්‍යය වේ. "රාතො ණෞ පුක්" යි පුගාගම වේ.) "ගුණඃ" යන සූත්‍රයෙන් ඉකාරයට ගුණ වේ. "එ අය්" යන සූත්‍රයෙන් එකාරයට 'අය්' ආදෙශ වේ. "ස්වරහීනං පරෙණ සංයොජ්‍යම්" යි කී හෙයින් පර නයනය වේ. ෂත්වම්, ("ක්විලාත් ෂඃ සඃ කෘතස්‍ය" යි) ෂකාර බව වේ. "ස ධාතුඃ" යන සූත්‍රයෙන් ධාතු සංඥ වේ. තිප්, (ඒ "ජිඥපයිෂ" ධාතුවෙන් පර ව) තිප් ප්‍රත්‍යය වේ. අප්, "අප් කර්තරි" යි අප් විකරණය වේ. "අදෙ" යන සූත්‍රයෙන් ෂකාරයේ අකාරයට ලොප් වේ. ආත්මනඃ ඥපයිතුම්, තමාගේ අවබොධ කරවීම; ඉච්ඡති ඉති, කැමති වෙයි යන අර්ථයෙහි; ජිඥපයිෂති, ජිඥපයිෂති යනු වේ. පක්ෂෙ, පක්ෂයෙක්හි; ජිඥපි ස ඉති, "ජිඥපි + ස" කියා; සපිතෙ, සිටි කල්හි; ස්වරස්‍ය, ධාතු ස්වරයට; (හෙවත් ආකාරයට;) ඉස්, ඉස් යනාදෙශ වේ. තස්‍ය, ඒ ඉස් ආදෙශයාගේ ඉකාරයට; දීර්ඝතා, දීර්ඝ බව වේ. පූර්වස්‍ය, පූර්ව රූපයට (හෙවත් ජ යන්නට;) ලොපඃ, ලොප් වේ. "ණෙඃ" යන සූත්‍රයෙන් ණිච් ප්‍රත්‍යයට ලොප් වේ. "සෙකාරාද්දෙශ්ච" යන සූත්‍රයෙන් ඉස් ආදෙශයේ සකාරයට ලොප් වේ. ඥීප්සති, (අනිට් පක්ෂයෙහි) ඥීප්සති යනු වේ. (ලුඞ් ප්‍රථම පුරුෂෙක වචනයෙහි අජිඥපයිෂීත් යනු ද, අඥීප්සීත් යනු ද වේ.)

(48) ඥප ඥාන ඥාපනයොඃ. "මිතාං හ්‍රස්වඃ" * ජිඥපයිෂති- ඥීප්සති.

## ඉති සාන්ත ප්‍රක්‍රියා.

a. අථ යඞන්ත ප්‍රක්‍රියා නිරූප්‍යතෙ:-

## 188. අතිශයෙ හසාදෙර්යඞ් ද්විශ්ච.

(අතිශයෙ 7-1. හසාදෙඃ 5-1. යඞ් 1-1. ද්විඃ 2-1. ච-නි:)

b. හසාදෙරෙකස්වරාද්ධාතොරතිශයෙ‘ර්ථෙ යඞ් ප්‍රත්‍යයො භවති. තස්මින් සති ධාතොර්ද්විත්වම්.

---

(48) ඥප ඥානඥාපනයොඃ, අකාරානුබන්ධ "ඥප්" ධාතුව දැනීම ය- දැන්වීම ය යන අර්‍ථ දෙක්හි වේ. "මිතාං හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් හ්‍රස්ව වේ. ජිඥපයිෂති, "ඥපයිතු මිච්ඡති" (=දන්වන්නට කැමති වෙයි) යන වාක්‍යයෙහි ජිඥපයිෂති යනු වේ. අතිරි පක්‍ෂයෙහි 'ඉස්' ආදෙශවීමෙන් ඥීප්සති යනු වේ. (ලට් ප්‍රථම පුරුෂෙක වචන යි. මෙසේ ස ප්‍රත්‍යයාන්ත ඥප් ධාතුව දෙඅයුරකින් වර නැඟේ. ලුඞ් ප්‍රථම පුරුෂෙක වචනයෙහි අජිඥපයිෂීත්- අඥීප්සීත් යනු වේ.)

සාන්ත ප්‍රක්‍රියා, ස ප්‍රත්‍යයාන්ත ධාතූන්ගේ පද සාධන ක්‍රියාව; ඉති, මෙසේ යි.

## සාන්ත ප්‍රක්‍රියාව සමාප්ත යි.

a. අථ, සාන්ත ප්‍රක්‍රියාවට අනතුරුව; යඞන්ත ප්‍රක්‍රියා, යඞ් ප්‍රත්‍යයාන්ත ධාතූන්ගේ පද සාධන ක්‍රියාව; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ.

188. යඞ් ප්‍රත්‍යය හා ද්විත්ව විධි සූත්‍ර යි. අතිශයෙ, අතිශයාර්‍ථයෙහි; හසාදෙඃ, හස ප්‍රත්‍යාහාර වර්‍ණාදි ධාතූහු කෙරෙන්; යඞ්, යඞ් ප්‍රත්‍යය වේ. ද්විඃ ච, ධාතුහට ද්විත්ව ද වේ.

b. හසාදෙඃ, හස ප්‍රත්‍යාහාර වර්‍ණයක් හෙවත් ව්‍යඤ්ජනයක් ආදි කොට ඇති; එකස්වරාත් ධාතොඃ, එකස්වර ධාතූහු කෙරෙන්; අතිශයෙ අර්ථෙ, අතිශයාර්ථයෙහි; යඞ් ප්‍රත්‍යයඃ භවති, යඞ් ප්‍රත්‍යය වේ. තස්මින් සති, ඒ යඞ් ප්‍රත්‍යය ඇති කල්හි; ධාතොඃ, ධාතුහට; ද්විත්වම්, ද්විත්ව වේ.

---

* ජිඥපයිෂති- පොත්හි.

## 189. යඞ්. (යඞ් 7-1.)

**a යඞ් සති ලුකි ච පූර්වස්‍ය නාමිනො ගුණො භවති. "ස ධාතුඃ" ඞිත්වාදාත්මනෙපදම්, අප්.**

**(1) අතිශයෙන භවතිති = බොභූයතෙ, බොභූයෙත, බොභූයතාම්, අබොභූයත, බොභූයාඤ්චක්‍රෙ, බොභූයිෂීෂට, බොභූයිතා, බොභූයිෂ්‍යතෙ, අබොභූයිෂ්‍යත, අබොභූයිෂට.**

---

(මේ සූත්‍රයෙන් අතිශයාර්ථයෙහි යඞ් ප්‍රත්‍යය හා ඒ යඞන්ත ධාතුහට ද්විත්වය ද විහිත ය. i පෞනඃපුන්‍ය ය, ii භෘශාර්ථය යි අතිශයය ද්වි ප්‍රකාර වේ. i **පෞනඃපුන්‍යය** නම් නැවත නැවත වීම හෝ කිරීම යි. ii **භෘශාර්ථය** නම් අත්‍යර්ථයෙන් වීම හෝ කිරීම යි. ඒ ද්විප්‍රකාර වූ ම අතිශයාර්ථයෙහි භසාදි එකස්වර ධාතූන් කෙරෙන් යඞ් ප්‍රත්‍යය වේ. ස්වරාදි ධාතූන් කෙරෙන් හා අනෙකස්වර ධාතූන් කෙරෙන් නො වේ. එහෙයින් භෘශමීක්ෂතෙ යන තැන්හි ස්වරාදි ධාතු බැවින් ද, පුනඃ පුනර්ජාගර්ති යන තැන්හි අනෙකස්වර ධාතු බැවින් ද යඞ් ප්‍රත්‍යය නො වේ. යඞ් ප්‍රත්‍යය වූ පසු මේ සූත්‍රයෙන් ම ධාතුහට ද්විත්ව ද වේ.)

189. ගුණ විධි සූත්‍ර යි. "නිජාං ගුණඃ" යි 'ගුණඃ' යනු ද, "භෘඤුං ලුකි" යි 'ලුකි' යනු ද, "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද අනුවෘත්ත යි. යඞි, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි ච, යඞ් ප්‍රත්‍යයට ලුක් වීම ඇති කල්හි ද; පූර්වස්‍ය, පූර්ව රූපයට; ගුණඃ, ගුණ වේ.

a. යඞි සති, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි ච, යඞ් ලුක් ඇති කල්හි ද; පූර්වස්‍ය නාමිනඃ, පූර්ව රූපයේ නාමින් ස්වරයට; ගුණඃ, ගුණ වේ. (සූත්‍රයට "නාමිනඃ" යි අනුවෘත්ත නො වතුදු ගුණය නාමින් ස්වරයන් පිළිබඳ වූ ම හෙයින් සූත්‍ර වෘත්තියෙහි "නාමිනඃ" යි ව්‍යාඛ්‍යාන කළහ. මේ සූත්‍රයෙන් පූර්ව රූපයට ගුණ වේ. "ඛපානාං ජබවපාඃ" යි පූර්ව භකාරයට බකාරය වේ.) "ස ධාතුඃ" යන සූත්‍රයෙන් ඒ යඞ් ප්‍රත්‍යයාන්තය ධාතු සංඥ වේ. ඞිත්වාත්, ඞිත් බැවින්; ආත්මනෙපදම්, ආත්මනෙපදය වේ. අප්, "අප් කර්තරි" යි අප් විකරණය වේ. ("අදෙ" යි යකාරයට අකාරයට ලොප් වේ.)

(1) අතිශයෙන භවති ඉති, නැවත නැවත හෝ අත්‍යර්ථයෙන් වෙයි යන අර්ථයෙහි; බොභූයතෙ, ලට් ප්‍රථම පුරුෂෛක වචනයෙහි බොභූයතෙ යනු වේ. බොභූයෙත -පෙ- අබොභූයිෂට යනු පිළිවෙළින් සෙසු නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි. (මෙසේ යඞන්ත ධාතූහු දශ ලකාරයෙහි ම ආත්මනෙපදයෙහි පමණක් වර නැගෙති.)

(2) බොභුජ්‍යතෙ.

## 190. අනපි ච හසාත්. (අනපි 7-1. ච-නි: හසාත් 5-1.)

a. **හසාදුත්තරස්‍ය යඞො ලුග් භවති අනපි විෂයෙ.**

b. **ධාත්වංශලොපනිමිත්තෙන ආර්ධධාතුකෙ පරෙ තන්නිමිත්තෙන සමානනාමිනාං ගුණවෘද්ධී න වාච්‍යෙ. බොභුජාඤ්චක්‍රෙ.**

---

(2) බොභුජ්‍යතෙ, "අතිශයෙන භුනක්ති භුඞ්ක්තෙ වා (=අතිශයින් පාලනය හෝ අනුභවය කෙරෙයි) යන විග්‍රහයෙහි ලට් ප්‍ර: එක වචනයෙහි බොභුජ්‍යතෙ යනු වේ. (බොභුජ්‍යේත, බොභුජ්‍යතාම්, අබොභුජ්‍යත යනු විධිලිඞ්- ලොට්- ලඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

190. ලුග් විධි සූත්‍ර යි. "යඞ උඵකාඃ" යි 'යඞඃ' යනු ද, "ලුකි" යි වි: වි: වශයෙන් 'ලුක්' යනු ද අනුවෘත්ත යි. අනපි ච, අනප් විෂයෙහි ද; හසාත්, හස ප්‍රත්‍යාහාර වර්ණයා කෙරෙන් පර වූ; යඞඃ යඞ් ප්‍රත්‍යයට; ලුක්, ලුක් වේ.

a. අනපි විෂයෙ, අනප් විෂයෙහි; හසාත් උත්තරස්‍ය, හස ප්‍රත්‍යාහාරයෙන් පර වූ; යඞඃ, යඞ් ප්‍රත්‍යයට; ලුග් භවති, ලුක් වේ. (මෙයින් ආර්ධ ධාතුක ලකාරයන්හි හලන්ත ධාතූන් කෙරෙන් පර යඞ් ප්‍රත්‍යයට ලුක් වේ.)

b. ධාත්වංශ ලොප නිමිත්තෙන, ධාත්වංශ ලොපයට නිමිති වූ; ආර්ධ ධාතුකෙ පරෙ, ආර්ධ ධාතුක ලකාර පර කල්හි; තන් නිමිත්තෙන, ඒ නිමිති කොට ඇති; සමාන නාමිනාම්, සමාන නාමීන් පිළිබඳ; ගුණවෘද්ධී, ගුණ- වෘද්ධි දෙක; න වාච්‍යෙ, නො කිය යුතු යි. ("ස ධාතුඃ" යි යඞන්තය ධාතු සංඥ වන හෙයින් ධාත්වංශය නම් මෙහි යඞ් ප්‍රත්‍යය යි. ආර්ධ ධාතුක ලකාර විෂයෙහි "අනපි ච හසාත්" යි හලන්ත ධාතූන් කෙරෙන් පර වූ යඞ් ප්‍රත්‍යය ලොප් වූ කල්හි ඒ ධාතූන් පිළිබඳ සමාන නාමීන් ස්වරයන්ට "උපධායා ලඝොඃ" යි පැමිණෙන ගුණය ද, "ධාතොර්නාමිනඃ" යි පැමිණෙන වෘද්ධිය ද මෙයින් ප්‍රතිෂිද්ධ ය. සමාන නාමීන් ස්වරයෝ නම් ඉ- උ- ඍ- ඏ යන මොහු යි.) බොභුජාඤ්චක්‍රෙ යනු ලිට් ප්‍රථම පුරුෂෛක වචන යි. (බොභුජිෂීෂ්ට, බොභුජිතා, බොභුජිෂ්‍යතෙ, අබොභුජිෂ්‍යත, අබොභුජිෂ්ට යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. "භුජ පාලනාභ්‍යවහරණයොඃ" යන ධාතු යි.)

**(3) මුහ වෛචිත්‍යෙ, මොමුහ්‍යතෙ. (4) ලිහ ආස්වාදනෙ, ලෙලිහ්‍යතෙ. (5) හු දානාදනයොඃ, ජොහූයතෙ. (6) විද් ඥානෙ, වෙවිද්‍යතෙ.**

## 191. ආතඃ. (ආ 1-1. අතඃ 6-1.)

---

(3) මුහ වෛචිත්‍යෙ, අකාරානුබන්ධ "මුහ්" ධාතුව විචිත්තභාවයෙහි හෙවත් මුළා බැව්හි වේ. මොමුහ්‍යතෙ, "අතිශයෙන මුහ්‍යති" (=අතිශයින් මුළා වෙයි) යන වාක්‍යයෙහි මොමුහ්‍යතෙ යනු වේ. (ලට් ප්‍රඃ එක වචන යි. මොමුහේ‍යත, මොමුහ්‍යතාම්, අමොමුහ්‍යත, මොමුහාඤ්චක්‍රෙ, මොමුහිෂීෂ්ට, මොමුහිතා, මොමුහිෂ්‍යතෙ, අමොමුහිෂ්‍යත, අමොමුහිෂ්ට යනු විධි ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

(4) ලිහ ආස්වාදනෙ, අකාරානුබන්ධ "ලිහ්" ධාතුව රස විඳ ගැන්මෙහි වේ. ලෙලිහ්‍යතෙ, "අතිශයෙන ලෙඪි" (=අතිශයින් ලොවියි) යන වාක්‍යයෙහි ලෙලිහ්‍යතෙ යනු වේ. (ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. ලෙලිහේ‍යත, ලෙලිහ්‍යතාම්, අලෙලිහ්‍යත, ලෙලිහාඤ්චක්‍රෙ, ලෙලිහිෂීෂ්ට, ලෙලිහිතා, ලෙලිහිෂ්‍යතෙ, අලෙලිහිෂ්‍යත, අලෙලිහිෂ්ට යනු පිළිවෙළින් විධි ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. මතු ද මෙසේ වර නැගිය යුතු. ලකාර- පුරුෂ- වචනයන් නො දක්වෙන තැන්හි ලට්- ප්‍රථම පුරුෂ එක වචනයන් බව ද දත යුතු යි.)

(5) හු දානාදනයොඃ, "හු" ධාතුව දීමය- කෑමය යන අර්ථ දෙක්හි වේ. ජොහූයතෙ, "අතිශයෙන ජුහොති" (=අතිශයින් දෙයි නොහොත් කයි) යන වාක්‍යයෙහි ජොහූයතෙ යනු වේ. (ලුඞ්හි අජොහුයිෂ්ට, අජොහුයිෂාතාම්, අජොහුයිෂත යනාදි වශයෙන් වර නැගේ.)

(6) විද් ඥානෙ, "විද්" ධාතුව දැනීමෙහි වේ. වෙවිද්‍යතෙ, "අතිශයෙන . වෙත්ති" (=අතිශයින් දනී) යන වාක්‍යයෙහි වෙවිද්‍යතෙ යනු වේ. (වෙවිදාඤ්චකාර, අවෙවිදිෂ්ට යනු ලිට්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

191. ආකාරාදෙශ විධි සූත්‍ර යි. "යඞි" යන සූත්‍රය ද, "හ්‍රඃඤ්ං ලුකි" යි 'ලුකි' යනු ද, "පුම්ස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පුම්ස්‍ය' යනු ද, අනුවෘත්ත යි. යඞි, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි, ලුක් වීම ඇති කල්හි ද; පුම්ස්‍ය, පුම් රූපය පිළිබඳ; අතඃ, අකාරයට; ආ, ආකාරාදෙශ වේ.

**a. යඬි ලුකි ච සති පුබ්බස්ස අකාරස්ස ආකාරො භවති අකිති. (7) පාපච්චතෙ. (8) පඨ ව්‍යක්තායං වාචි, පාපඨ්‍යතෙ.**

**b. සුචිසූත්‍රිමූත්‍ර්‍යටාතාසිගුණොතිභ්‍යා යඬ වාච්‍යඃ.**

**(9) සොසූච්‍යතෙ. (10) සොසූත්‍ර්‍යතෙ. (11) මොමූත්‍ර්‍යතෙ.**

---

a. යඬි, යඬ් ප්‍රත්‍යය ද; ලුකි ච, ලුක් වීම ද; සති, ඇති කල්හි; පුබ්බස්ස, පූර්ව රූපයාගේ; අකාරස්ස, අකාරයට; ආකාරඃ භවති, ආකාරය වේ. අකිති, කිද්විෂයෙහි නො වේ.

(7) පාපච්‍යතෙ, "අතිශයෙන පචති" (=අතිශයින් පිසයි) යන වාක්‍යයෙහි පාපච්‍යතෙ යනු වේ. (ලිට්හි පාපචාඤ්චක්‍රෙ යනු ද, ලුඬ්හි අපාපචිෂ්ට යනු ද වේ. "ඩුපචඡ් පාකෙ" යන ධාතු යි.)

(8) පඨ් ව්‍යක්තායං වාචි, අකාරානුබන්ධ "පඨ්" ධාතුව ව්‍යක්ත වචනයෙහි වේ. පාපඨ්‍යතෙ, "අතිශයෙන පඨති" (=අතිශයින් හඬරයි) යන වාක්‍යයෙහි පාපඨ්‍යතෙ යනු වේ. (ලුඬ්හි අපාපඨිෂ්ට යනු වේ.)

b. සූචිසූත්‍රිමූත්‍ර්‍යට්‍යතාසිගුණෝතිභ්‍යඃ, සූච පෛශුන්‍යෙ- සූත්‍ර වෙෂ්ටනෙ- මූත්‍ර ප්‍රස්‍රවණෙ- අට ගතෞ- ඍ ගතෞ- අශ් භොජනෙ- ඌර්ණුඤ් ආච්ඡාදනෙ යන ධාතූන් කෙරෙන් පර ව; යඬ් වාච්‍යඃ, යඬ් ප්‍රත්‍යය කිය යුතු යි. (මෙහි සූච- සූත්‍ර- මූත්‍ර යන තුණ චුරාදි ගණික අකාරාන්ත ධාතුහු ය. එහෙයින් ඔවුන් කෙරෙන් අනෙක ස්වර බැවින් ද, අට- ඍ- අශ්- ඌර්ණුඤ් යන මොවුන් කෙරෙන් ස්වරාදි ධාතු බැවින් ද "අතිශයෙ හසාදෙර්යඬ් ද්විශච" සි යඬ් ප්‍රත්‍යය නො වන හෙයින් මෙසේ කීහ.)

(9) සොසූච්‍යතෙ, "අතිශයෙන සූචයති" (=අතිශයින් කේලාම් කියයි) යන වාක්‍යයෙහි සොසූච්‍යතෙ යනු වේ. ("යතඃ" යි ධාත්වන්ත අකාරයට ලොප් වේ. සොසූචාඤ්චක්‍රෙ, අසොසූචිෂ්ට යනු ලිට්- ලුඬ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

(10) සොසූත්‍ර්‍යතෙ, "අතිශයෙන සූත්‍රයති" (=අතිශයින් වෙළයි) යන වාක්‍යයෙහි සොසූත්‍ර්‍යතෙ යනු වේ. (සොසූත්‍රේ‍යත, සොසූත්‍ර්‍යතාම්, අසොසූත්‍ර්‍යත, සොසූත්‍රාඤ්චක්‍රෙ, සොසූත්‍රිෂීෂ්ට, සොසූත්‍රිතා, සොසූත්‍රිෂ්‍යතෙ, අසොසූත්‍රිෂ්‍යත, අසොසූත්‍රිෂ්ට යනු විධි- ලිඞ් -පෙ- ලුඬ් ප්‍ර: එක වචන යි.)

(11) මොමූත්‍ර්‍යතෙ, "අතිශයෙන මූත්‍රයති" (අතිශයින් මූත්‍ර කෙරෙයි) යන වාක්‍යයෙහි මොමූත්‍ර්‍යතෙ යනු වේ. (ලුඬ්හි අමොමූත්‍රිෂ්ට යනු වේ.)

**(12) අට ගතෞ, ගත්‍යර්ථාත් කෞටිල්‍ය එව යඞ්. "ස්වරාදෙඃ පරඃ" යඞ් සහිතස්‍ය ද්විත්වම්. අට්‍යට්‍ය ඉති ස්ථිතෙ, "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" "ආතඃ" ඉති පූර්වස්‍යාත්වම්. කුටිලම් අටතීති=අටාට්‍යතෙ. අටාටාඤ්චක්‍රෙ, අටාටිෂිෂ්ට. (13) ව්‍රජ ගතෞ, කුටිලං ව්‍රජතීති= වාව්‍රජ්‍යතෙ. (14) අශ් භොජනෙ, අශාශ්‍යතෙ. (15) ඌර්ණුඤ් ආච්ඡාදනෙ, ඌර්ණෝනූයතෙ. "ස්වරාත් පරඃ සංයොගාදයො නදරා ද්විඃ."**

---

(12) අට ගතෞ, අකාරානුබන්ධ "අට්" ධාතුව ගමන්හි වේ. ගත්‍යර්ථාත්, ගමනාර්ථ ධාතුහු කෙරෙන්; කෞටිල්‍යෙ එව, කුටිල භාවයෙහි ම හෙවත් වක් ව යෑම් අර්ථයෙහි ම; යඞ්, යඞ් ප්‍රත්‍යය වේ. "ස්වරාදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පරාවයවයට ද්විත්ව වේ. යඞ් සහිතස්‍ය, යඞ් ප්‍රත්‍යය සහිත වූවහුට; ද්විත්වම්, ද්විත්වය වේ. අට්‍යට්‍ය ඉති, "අට්‍යට්‍ය" කියා; ස්ථිතෙ, සිටි කල්හි; "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යන සූත්‍රයෙන් ආදි ව්‍යඤ්ජනය ශෙෂ වේ. ආතඃ ඉති "ආතඃ" යන සූත්‍රයෙන්; පූර්වස්‍ය, පූර්ව වූ ටකාරයෙහි අකාරයට; ආත්වම්, ආකාර බව වේ. කුටිලම් අටති ඉති, වක් ව යෙයි යන අර්ථයෙහි; අටාට්‍යතෙ, ලට් ප්‍රථම පුරුෂෛක වචනයෙහි අටාට්‍යතෙ යනු වේ. අටාටාඤ්චක්‍රෙ- අටාටිෂිෂ්ට යනු ලිට්- ආශීර්ලිඞ් ප්‍ර: ඒක වචන යි.

(13) ව්‍රජ ගතෞ, අකාරානුබන්ධ "ව්‍රජ්" ධාතුව ගමනාර්ථයෙහි වේ. කුටිලං ව්‍රජතීති= වාව්‍රජ්‍යතෙ, වක් ව යෙයි යන අර්ථයෙහි වාව්‍රජ්‍යතෙ යනු වේ (වාව්‍රජාඤ්චක්‍රෙ, අවාව්‍රජිෂ්‍යත, අවාව්‍රජිෂ්ට යනු ලිට්- ලෘඞ්-ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

(14) අශ් භොජනෙ "අශ්" ධාතුව අනුභව කිරීමෙහි වේ. අශාශ්‍යතෙ, "අතිශයෙන අශ්නාති" (=අතිශයින් අනුභව කරයි) යන වාක්‍යයෙහි අශාශ්‍යතෙ යනු වේ * (ආශාශ්‍යත- අශාශාඤ්චක්‍රෙ- ආශාශිෂ්‍යත- ආශාශිෂ්ට යනු ලඞ්- ලිට්- ලෘඞ්- ලුඞ්- ප්‍රථම පුරුෂෛක වචන යි.)

(15) ඌර්ණුඤ් ආච්ඡාදනෙ, ඤ් අනුබන්ධ "ඌර්ණු" ධාතුව වැසීමෙහි වේ. ඌර්ණෝනූයතෙ, "අතිශයෙන ඌර්ණෝති" (=අතිශයින් වසයි) යන වාක්‍යයෙහි ඌර්ණෝනූයතෙ යනු වේ. (ඌර්ණෝනූයෙත- ඌර්ණෝනූයතාම්- ඖර්ණෝනූයත- ඌර්ණෝනූයාඤ්චක්‍රෙ- ඌර්ණෝනූයිෂීෂ්ට- ඌර්ණෝනූයිතා- ඌර්ණෝනූයිෂ්‍යතෙ- ඖර්ණෝනූයිෂ්‍යත- ඖර්ණෝනූයිෂ්ට යනු විධිලිඞාදි ප්‍රථම පුරුෂෛක වචන යි. නකාරයෙහි උකාරයට "යෙ" යි දීර්ඝ වේ.)

---

* අශූඞ් ව්‍යාප්තෞ= අතිශයෙන අශ්නුතෙ.

**(16) "ගුණොර්ති සංයොගාද්‍යොඃ" යකාරපරස්‍ය රේඵස්‍ය ද්විත්වං වාච්‍යම්. අරය්‍යීතෙ.**

**(17) ලුප සද චර ජප ජභ දහ දංශ ගෲහෙභ්‍යො ධාත්වර්‍ථ ගර්හායාමෙව යඬ්. ගර්හිතං ලුම්පතිති = ලොලුප්‍යතෙ. (18) සාසද්‍යතෙ.**

## 192 ඤුමජපාං නුක්. (ඤුමජපාම් 6-1. නුක් 1-1.)

"ස්වරාත් පරඃ සංයොගාදයො නදරා ද්විනී," "ස්වරයා කෙරෙන් පර වූ සංයොගාදි නකාර- දකාර- රකාරයෝ ද්විරුක්ත නො වෙත්" යයි කී හෙයින් රකාරය ද්විරුක්ත නො වීය. (ණත්වය අසිඬ බැවින් දනත්‍ය නුකාරය ම ද්විරුක්ත විය.)

(16) "ගුණො'ර්ති සංයොගාද්‍යොඃ" යන සූත්‍රයෙන් ධාතුහට ගුණ වේ. යකාර පරස්‍ය, යකාරය පර කොට ඇති; රේඵස්‍ය, රකාරයට; ද්විත්වං වාච්‍යම්, ද්වීත්වය කිය යුතු යි. ("ස්වරාත් පරඃ සංයොගාදයො නදරා ද්විනී" යනුවෙන් ප්‍රතිෂෙධ නො වෙයි යූ සේ යි.) අරය්‍යීතෙ, "කුටිලම් ඉයර්ති" (=වක් ව යෙයි) යන වාක්‍යයෙහි අරය්‍යීතෙ යනු වේ. (ලඬ්- ලිට්- ලෘට්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචනයන්හි පිළිවෙළින් ආරය්‍යීත- අරාරය්‍යාංචක්‍රෙ- ආරාරිෂ්‍යත- ආරාරිෂ්ට යනු වේ "ඍ ගතෞ" යන ධාතු යි.)

(17) ලුප — ගෲභ්‍යඃ, ලුප- සද- චර- ජප- ජභ- දහ- දංශ- ගෲ යන ධාතූන් කෙරෙන් පර ව; ධාත්වර්‍ථ ගර්හායාම් එව, ධාත්වර්‍ථය පිළිබඳ නින්දාර්‍ථයෙහි ම; යඬ්, යඬ් ප්‍රත්‍යය වේ. ගර්හිතං ලුම්පති ඉති= ලොලු ප්‍යතෙ, නින්දිත ලෙස සිඳියි යන අර්‍ථයෙහි ලොලුප්‍යතෙ යනු වේ. (ලුඞ්හි අලොලුපිෂ්ට යනු වේ. "ලුපෘ ඡේදනෙ" යන ධාතු යි.)

(18) සාසද්‍යතෙ, "ගර්හිතං සීදති" (=නින්දිත ලෙස හිඳී) යන වාක්‍යයෙහි සාසද්‍යතෙ යනු වේ. (සාසද්‍යාංචක්‍රෙ- අසාසදිෂ්ට යනු ලිට්- ලුඞ්- ප්‍රඃ එක වචන යි. "ෂද්ෲ විශරණාදෞ" යන ධාතු යි.)

(192) නුගාගම විධි සූත්‍ර යි. "පූර්‍වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්‍වස්‍ය' යනු ද- "හෘස්වං ලුකි" යි 'ලුකි' යනු ද- "යඞි" යන සූත්‍රය ද අනුවෘත්ත යි.

යඞි, යඬ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි, යඬ් ප්‍රත්‍යයට ලුක් වීම ඇති කල්හි ද; ඤුමජපාම්, ඤුම ප්‍රත්‍යාහාරාන්තය- ජපාදිය යන ධාතූන්ගේ; පූර්‍වස්‍ය, පූර්‍ව රූපය සම්බන්ධ ව; නුක්, නුගාගම වේ.

**a. ඤමාන්තස්‍ය ජපාදීනාං ච පූර්වස්‍ය නුගාගමො භවති යඞි ලුකි ච සති.**

**b. ජප් ජභ් දහ් දංශ් භඤ්ජ් පශ් * එතෙ ජපාදයඃ.**

**(19) ජඞ්ගම්‍යතෙ. (20) බම්භ්‍රම්‍යතෙ. (21) අඣසෙ'ප්‍යනුස්වාරඃ, ආදෙශිනා ආදෙශො නිර්දිශ්‍යතෙ. යංයම්‍යතෙ.**

---

a. යඞි සති ච, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි (සති ච), ලුක් වීම ඇති කල්හි ද; ඤමාන්තස්‍ය, ඤම ප්‍රත්‍යාහාර වර්ණයක් අන්ත කොට ඇති ධාතුහුගේත්; ජපාදීනාං ච, ජපාදි ධාතූන්ගේත්; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; නුගාගමඃ භවති, නුක් ආගම වේ. (ඤ– ණ– න– ඞ– ම යන අකුරු අන්ත කොට ඇති ධාතූන්ගේ හා මතු දක්වනු ලබන ජපාදි ධාතූන්ගේත් පූර්ව රූපයාගේ අන්තයෙහි නකාරයක් ආගම වන බව මෙයින් සූචිත යි.)

b. ජප්— එතෙ, ජප ව්‍යක්තායාං වාචි– ජභ ගාත්‍ර විනාමෙ– දහ භස්මීකරණෙ– දන්ශ දංශනෙ– භඤ්ජො ආමර්දනෙ– පශ් බාධනග්‍රන්ථනයොඃ යන මොහු; ජපාදයඃ, ජපාදි ධාතුහු නම් වෙත්.

(19) ජඞ්ගම්‍යතෙ, "කුටිලං ගච්ඡති" (=වක් ව යෙයි) යන වාක්‍යයෙහි ජඞ්ගම්‍යතෙ යනු වේ. (ලිට්හි ජඞ්ගමාඤ්චක්‍රෙ යනු ද– ලුඞ්හි අජඞ්ගමිෂ්ට යනු ද වේ. "ගම්ලෘ ගතෞ" ධාතු යි. ආගම වූ නකාරයට "නශ්චාපදාන්තෙ ඣසෙ" යි අනුස්වාර ව "යමා යපෙ'ස්‍ය" යි වර්ගාන්ත ඞකාරය වේ. පූර්ව රූපයේ ගකාරයට "කුහොශ්චුඃ" යි ජකාරය වේ. "අකිති" යි කී හෙයින් මෙහි පූර්ව රූපය සම්බන්ධි අකාරයට ආකාරය නො වේ. මත්තෙහි ද මෙසේ යි.)

(20) බම්භ්‍රම්‍යතෙ, "අතිශයෙන භ්‍රාම්‍යති" (=අතිශයින් භ්‍රමණය කෙරෙයි) යන වාක්‍යයෙහි බම්භ්‍රම්‍යතෙ යනු වේ. (ලුඞ්හි අබම්භ්‍රමිෂ්ට යනු වේ. "භ්‍රමූ චලනෙ" ධාතු යි.)

(21) අඣසෙ අපි, ඣස ප්‍රත්‍යාහාරාන්තර්ගත නුවූ වර්ණය පර කල්හි ද; අනුස්වාරඃ, නකාරයට අනුස්වාරය වේ. ආදෙශිනා, ආදෙශ ඇත්තහු විසින්; ආදෙශඃ, ආදෙශය; නිර්දිශ්‍යතෙ, දක්වනු ලැබේ. මෙහි "ආදෙශින්" නම් නකාරය යි. "ආදෙශ" නම් අනුස්වාරය යි. "නශ්චාපදාන්තෙ ඣසෙ" යි අපදාන්ත නකාරයට අනුස්වාරය වන්නේ ඣස ප්‍රත්‍යාහාර පර නිමිත්තෙනි. එහෙත් මෙහි පර නිමිත්ත නො සලකා ම අනුස්වාරය වෙයි යූ සේ යි.) යංයම්‍යතෙ, "අතිශයෙන යච්ඡති" (=අතිශයින් නවතියි) යන වාක්‍යයෙහි යංයම්‍යතෙ යනු වේ. (ලුඞ්හි අයංයමිෂ්ට යනාදි වශයෙන් වර නැගේ. "යම උපරමෙ" ධාතු යි.)

---

* "පශ ධාතුර්දන්ත්‍යාන්තඃ සෞත්‍රො ගත්‍යර්ථඃ. තාලව්‍යාන්ත ඉති මාධවඃ." සුබොධිනී.

**(22) කණ ශබ්දෙ, චඞ්කණ්‍යතෙ. (23) තන්තන්‍යතෙ. (24) ජප මානසෙ ච, ගර්හිතං ජපතීති = ජඤ්ජප්‍යතෙ. 25 ජභ ගාත්‍ර විනාමෙ. ජම්භත ඉති * =ජඤ්ජභ්‍යතෙ. (26) දහ භස්මී කරණෙ, දන්දහ්‍යතෙ. (27) "නො ලොපඃ" දන්දශ්‍යතෙ. (28) බම්භජ්‍යතෙ. (29) පශ් බාධනග්‍රන්ථනයොඃ, පශතීති= පම්පශ්‍යතෙ.**

---

(22) කණ ශබ්දෙ, අකාරානුබන්ධ "කණ්" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. චඞ්කණ්‍යතෙ, "අතිශයෙන කණති" (=අතිශයින් ශබ්ද කෙරෙයි) යන වාක්‍යයෙහි චඞ්කණ්‍යතෙ යනු වේ. (චඞ්කණාඤ්චක්‍රෙ- අචඞ්කණිෂ්ට යනු ලිට්- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි.)

(23) තන්තන්‍යතෙ, "අතිශයෙන තනොති" (=අතිශයින් විස්තර කෙරෙයි) යන වාක්‍යයෙහි තන්තන්‍යතෙ යනු වේ. ("තනු විස්තාරෙ" ධාතු යි. මෙතෙක් දක්වන ලද්දෙ ඤමාන්ත ධාතූහු ය.)

(24) ජප මානසෙ ච, අකාරානුබන්ධ "ජප්" ධාතුව සිතීමෙහි ද වේ. ගර්හිතං ජපති ඉති= ජඤ්ජප්‍යතෙ, නින්දිත සේ කියයි හෝ සිතයි) යන අර්ථයෙහි ජඤ්ජප්‍යතෙ යනු වේ. [ලිට්- ලුඞ් දෙක්හි ජඤ්ජපාඤ්චක්‍රෙ- අජඤ්ජපිෂ්ට යනාදී වශයෙන් වරනැගේ.)

(25) ජභ ගාත්‍ර විනාමෙ, "ජභ්" ධාතුව අවයව නැමීමෙහි වේ. ජම්භතෙ ඉති= ජඤ්ජභ්‍යතෙ, නින්දිත සේ ජෘම්භණය කෙරෙයි යන අර්ථයෙහි ජඤ්ජභ්‍යතෙ යනු වේ.

(26) දහ භස්මීකරණෙ, "දහ්" ධාතුව හළු කිරීමෙහි වේ. දන්දහ්‍යතෙ, "ගර්හිතං දහති" (=නින්දිත සේ දවයි) යන වාක්‍යයෙහි දන්දහ්‍යතෙ යනු වේ. (ලුඞ්හි අදන්දහිෂ්ට යනාදී වශයෙනි.)

(27) "නො ලොපඃ" යන සූත්‍රයෙන් දන්ශ් ධාතුහුගේ නකාරයට ලොප් වේ. දන්දශ්‍යතෙ, "ගර්හිතං දශති" (=නින්දිත සේ ඩසියි) යන වාක්‍යයෙහි දන්දශ්‍යතෙ යනු වේ.

(28) බම්භජ්‍යතෙ, "අතිශයෙන භනක්ති" (=අතිශයින් බිඳියි හෝ මඩියි) යන වාක්‍යයෙහි බම්භජ්‍යතෙ යනු වේ. (ලුඞ්හි අබම්භජිෂ්ට යනු යි. "භඤ්ජෝ ආමර්දනෙ" ධාතුයි. මෙහි ද "නො ලොපඃ" යි ධාතුහුගේ නකාරයට ලොප් වේ )

(29) පශ් බාධනග්‍රන්ථනයොඃ, "පශ්" ධාතුව පෙළීම ය– ගෙතීම ය යන අර්ථ දෙක්හි වේ. පශතීති–පම්පශ්‍යතෙ, (අතිශයින්) පෙළයි නොහොත් ගොතයි යන අර්ථයෙහි පම්පශ්‍යතෙ යනු වේ. (පම්පශාඤ්චක්‍රෙ- අපම්පශිෂ්ට යනු ලිට්- ලුඞ් ප්‍රඃ ඒක වචන යි. මෙතෙක් ජපාදියට නිදර්ශන යි.)

---

* ජභතීති- පොත්හි.

## 193. චරඵලොරුච්චාස්‍ය.

( චරඵලොඃ 6-2. උත් 1-1. ච-හිඃ අස්‍ය 6-1. )

**a. අනයොර්‍යඞ් ලුකි ච සති පූර්වස්‍ය නුගාගමො භවති, පූර්වාත් පරස්‍ය අකාරස්‍ය උකාරඃ.**

**(30) චඤ්චූර්‍යතෙ. (31) ඵල නිෂ්පත්තෞ, පම්ඵුල්‍යතෙ.**

**b. වලයාන්තස්‍ය වා නුක්.**

**(32) මව සෞඵල්‍යෙ, මම්මව්‍යතෙ– මාමව්‍යතෙ. (33) චල කම්පනෙ, චඤ්චල්‍යතෙ– චාචල්‍යතෙ. (34) දයඞ් දානෙ, දන්දය්‍යතෙ– දාදය්‍යතෙ.**

---

193 නුගාගම හා උකාරාදෙශ විධි සූත්‍ර යි. "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද– "හෘඤං ලුකි" යි 'ලුකි' යනු ද– "ඤ්මජපාං නුක්" යි 'නුක්' යනු ද– "යඞ්" යන සූත්‍රය ද අනුවෘත්ත යි.

යඞ්, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි, ලුක් වීම ඇති කල්හි ද; චරඵලොඃ, චර– ඵල ධාතු දෙදෙනාගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; නුක්, නුගාගම වේ. අස්‍ය, අකාරයට; උත් ච, උකාරාදෙශ ද වේ.

a. යඞි, යඞ් ප්‍රත්‍යය ද, ලුකි ච, ලුක් වීමද; සති, ඇති කල්හි; අනයොඃ, මේ චර– ඵල ධාතු දෙදෙනාගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; නුගාගමඃ භවති, නුක් ආගම වේ. පූර්වාත් පරස්‍ය, පූර්වයා කෙරෙන් පර වූ; අකාරස්‍ය, අකාරයට; උකාරඃ, උකාරයෙක් වේ.

(30) චඤ්චූර්‍යතෙ, "ගර්හිතං චරති" (=නින්දිත සේ හැසිරෙයි) යන වාක්‍යයෙහි චඤ්චූර්‍යතෙ යනු වේ. ("වොර්වි හසෙ" යි උකාරයට දීර්ඝ වේ. චඤ්චූරාඤ්චක්‍රෙ– අචඤ්චූරිෂ්‍යත– අචඤ්චූරිෂ්ට යනු ලිට්– ලෘඞ්– ලුඞ් ප්‍රඃ එක වචන යි. "චර ගති භක්ෂණයොඃ" ධාතු යි.)

(31) ඵල නිෂ්පත්තෞ, "ඵල්" ධාතුව නිපැදීමෙහි වේ. පම්ඵුල්‍යතෙ, "අතිශයෙන ඵලති" (=අතිශයින් නිපදියි හෝ පැලෙයි) යන වාක්‍යයෙහි පම්ඵුල්‍යතෙ යනු වේ. (ලිට්– ලුඞ් දෙක්හි පම්ඵුලාඤ්චක්‍රෙ– අපම්ඵුලිෂ්ට යනාදි වශයෙනි.)

b. වලයාන්තස්‍ය, වකාර– ලකාර– යකාරාන්ත ධාතුහුගේ පූර්ව රූපය සම්බන්ධ ව; වා, විකල්පයෙන්; නුක්, නුගාගම වේ. (නුගාගම නො වන පක්ෂයෙහි "ආතඃ" යි පූර්ව අකාරයට ආකාරය වේ.)

(32) මව සෞඵල්‍යෙ, අකාරානුබන්ධ "මව්" ධාතුව ස්ථූල භාවයෙහි වේ. මම්මව්‍යතෙ– මාමව්‍යතෙ, "අතිශයෙන මවති"

## 194. රීගෘදුපධස්‍ය. (රීක් 1-1. ඍදුපධස්‍ය 6-1.)

**a. ඍකාරොපධස්‍ය ධාතොර්යඞි සති පූර්වස්‍ය රිගාගමො භවති. කිත්ත්වාදාකාරාභාවඃ.**

**(35) නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, අතිශයෙන නෘත්‍යති= නරීනෘත්‍යතෙ, නටඃ. අත්‍ර ණත්වාභාවො වාච්‍යඃ. (36) වෘතුඞ් වර්තනෙ, වරීවෘත්‍යතෙ. (37) ග්‍රහ උපාදනෙ, ජරීගෘහ්‍යතෙ.**

---

(=අතිශයින් මහත් කෙරෙයි) යන වාක්‍යයෙහි නුගාගම පක්ෂයෙහි මම්මව්‍යතෙ යනු ද, විකල්ප පක්ෂයෙහි මාමව්‍යතෙ යනු ද වේ. (ලුඞ්හි අමම්මවිෂ්ට- අමාමවිෂ්ට යනාදි වශයෙනි.)

(33) චල කම්පනෙ, "චල්" ධාතුව සැලීමෙහි වේ. චඤ්චල්‍යතෙ- චාචල්‍යතෙ, "අතිශයෙන චලති" (=අතිශයින් සැලෙයි) යන වාක්‍යයෙහි නුගාගම පක්ෂයෙහි චඤ්චල්‍යතෙ යනු ද- විකල්ප පක්ෂයෙහි චාචල්‍යතෙ යනු ද වේ.

(34) දයඞ් දානෙ, අඞ් අනුබන්ධ "දය්" ධාතුව දීමෙහි වේ. දඳය්‍යතෙ- දාදය්‍යතෙ, "අතිශයෙන දයතෙ" (=අතිශයින් දෙයි) යන වාක්‍යයෙහි නුගාගම පක්ෂයෙහි දඳය්‍යතෙ යනු ද- විකල්ප පක්ෂයෙහි දාදය්‍යතෙ යනු ද වේ. (අදඳයිෂ්ට- අදාදයිෂ්ට යනු ලුඞ් ප්‍ර: එක වචන යි.)

194 රීගාගම විධි සූත්‍ර යි. "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද- "යඞි" යන සූත්‍රය ද අනුවෘත්ත යි.

යඞි, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි; ඍදුපධස්‍ය, ඍකාරය උපධා කොට ඇති ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; රීක්, රීගාගම වේ.

a. යඞි සති, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි; ඍකාරොපධස්‍ය, ඍකාරය උපධා කොට ඇති; ධාතොඃ, ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; රීගාගමඃ භවති, රීක් ආගම වේ. (මෙහි කයන්ත පමණක් ඉත් ය. "රඃ" යි පූර්ව රූපයේ ඍකාරයට අකාරය වේ.) කිත්ත්වාත්, කිත් බැවින්; ආකාර + අභාවඃ, ආකාරයාගේ වැළැක්ම වේ. "ආතඃ" යි විහිත ආකාරාදෙශය නො වෙයි කී නියා යි.)

(35) නෘතී ගාත්‍ර වික්ෂෙපෙ, ඊ අනුබන්ධ "නෘත්" ධාතුව අවයව විසුරුවීමෙහි (=නැටීමෙහි) වේ. අතිශයෙන නෘත්‍යති= නරීනෘත්‍යතෙ, අතිශයින් නටයි යන අර්ථයෙහි නරීනෘත්‍යතෙ යනු වේ. නටඃ, නළු තෙමේ; නරීනෘත්‍යතෙ, අතිශයින් නොහොත්

ඎ. ඍත්වතො රීග් වාච්‍යඃ.

**(38) ඔව්‍රශ්චූ ඡේදනෙ, වරීවෘශ්ච්‍යතෙ. (39) ප්‍රච්ඡ ඥීප්සායාම්, පරීපෘච්ඡ්‍යතෙ. (40) කෘපූ සාමර්ථ්‍යෙ, "කෘපො රො ලඃ" ඍ- ඏ, චලීක්ලෘප්‍යතෙ. (41) වශෙර්‍යඞි න සම්ප්‍රසාරණම්, වාවශ්‍යතෙ.**

---

නැවත නැවත නටයි. (නරීනෘත්‍යතෙ- නරීනෘත්‍යතාම්- අනරීනෘත්‍යත - නරීනෘතාඤ්චක්‍රෙ - නරීනෘතිෂීෂ්ට- නරීනෘතිතා- නරීනෘතිෂ්‍යතෙ- අනරීනෘතිෂ්‍යත- අනරීනෘතිෂ්ට යනු විධිලිඞ් ආදි නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.) අත්‍ර, මෙහි; ණත්ව + අභාවඃ, ණත්වය නො වීම; වාච්‍යඃ, කිය යුතු යි. * ("අවකුප්වනානරේ'පි" යි මූර්ධන්‍ය ණකාරය නො වෙයි යනු භාව යි.)

(36) වෘතුඞ් වර්තනෙ, උඞ්- අනුබන්ධ "වෘත්" ධාතුව පැවැත්මෙහි වේ. වරීවෘත්‍යතෙ, "අතිශයෙන වර්තතෙ" (=අතිශයින් පවතී) යන වාක්‍යයෙහි වරීවෘත්‍යතෙ යනු වේ. (ලුඞ්හි අවරීවෘතිෂ්ට යනාදි වශයෙනි.)

(37) ග්‍රහ උපාදනෙ, අකාරානුබන්ධ "ග්‍රහ්" ධාතුව ගැන්මෙහි වේ. ජරීගෘහ්‍යතෙ, "අතිශයෙන ගෘහ්ණාති" (=අතිශයින් ගණියි) යන වාක්‍යයෙහි ජරීගෘහ්‍යතෙ යනු වේ. ("ග්‍රහාං කිති ච" යි සම්ප්‍රසාරණ වේ. "කුහොශ්චුඃ" යි පූර්ව ගකාරයට ජකාරය වේ.)

ඎ. ඍත්වතඃ, ඍකාරවත් ධාතුහුගේ පූර්ව රූපය සම්බන්ධ ව; රීග් වාච්‍යඃ, රීගාගමය කිය යුතු යි. (උපධා සංඥා නුවූ ද ඍකාරය සහිත ධාතූන්ගේ පූර්ව රූපය සම්බන්ධ ව රීගාගම වන බව මෙයින් දක්වේ.)

(38) ඔව්‍රශ්චූ ඡේදනෙ, ඔ- ඌ අනුබන්ධ "ව්‍රශ්ච්" ධාතුව සිඳීමෙහි වේ. වරීවෘශ්ච්‍යතෙ, "අතිශයෙන වෘශ්චති" (=අතිශයින් සිඳියි) යන වාක්‍යයෙහි වරීවෘශ්ච්‍යතෙ යනු වේ. (ලුඞ්හි අවරීවෘශ්චිෂ්ට යනාදි වශයෙනි.)

(39) ප්‍රච්ඡ ඥීප්සායාම්, අකාරානුබන්ධ "ප්‍රච්ඡ්" ධාතුව දැනගණු කැමති බැව්හි වේ. පරීපෘච්ඡ්‍යතෙ, "අතිශයෙන පෘච්ඡති" (=අතිශයින් විචාරයි) යන වාක්‍යයෙහි පරීපෘච්ඡ්‍යතෙ යනු වේ. (ලුඞ්හි අපරීපෘච්ඡිෂ්ට යනාදි වශයෙනි.)

(40) කෘපූ සාමර්ථ්‍යෙ, ඌ අනුබන්ධ "කෘප්" ධාතුව සමත් බැව්හි වේ. "කෘපො රො ලඃ" යන සූත්‍රයෙන් රකාරයට ලකාරය වේ. ඍ- ඏ, ඍකාරයට (සවර්ණ හෙයින්) ඏකාරය වේ. චලීක්ලෘප්‍යතෙ, "අතිශයෙන කල්පතෙ" (=අතිශයින් සමත් වෙයි) යන වාක්‍යයෙහි චලීක්ලෘප්‍යතෙ යනු වේ. (ලිට්- ලුඞ් දෙක්හි චලීක්ලෘපාඤ්චක්‍රෙ- අචලීක්ලෘපිෂ්ට යනාදි වශයෙනි.)

---

* "ක්ෂුභ්නාදිෂු ච" එෂු ණත්වං න ස්‍යාත්- සි: කෞ: 179 පිට.

## 195. පදාං නීක්. * (පදම් 6-3. නීක් 1-1.)

**a. පද ස්‍රංසු ධ්වංසු භ්‍රංශු දංශු කස් වඤ්චු පත ස්කන්දාං යඞ් ලුකි ච සති පූර්වස්‍ය නීගාගමො වාච්‍යඃ.**

**(42) පනිපද්‍යතෙ. "නො ලොපඃ" ස්‍රංසු- ධ්වංසු- භ්‍රංශු අධඃ පතනෙ.(43) සනීස්‍රස්‍යතෙ.(44) දනීධ්වස්‍යතෙ. (45) බනීභ්‍රශ්‍යතෙ.**

---

(41) යඞ්, යඞ් ප්‍රත්‍යය පර කල්හි; වශෙඃ, වශ් ධාතුහට; න සම්ප්‍රසාරණම්, සම්ප්‍රසාරණ නො වේ. වාවශ්‍යතෙ, "අතිශයෙන වෂ්ටි" (=අතිශයින් කැමති වෙයි) යන වාක්‍යයෙහි වාවශ්‍යතෙ යනු වේ. (ලුඞ්හි අවාවශිෂ්ට යනාදි වශයෙනි.)

195. නීගාගම විධි සූත්‍ර යි. "පූර්වස්‍ය හසාදිඃ ශෙෂඃ" යි 'පූර්වස්‍ය' යනු ද- "හඃස්‍යං ලුකි" යි 'ලුකි' යනු ද- "යඞ්" යන සූත්‍රය ද අනුවෘත්ත යි. යඞ්, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි ද; ලුකි, ලුක් වීම ඇති කල්හි ද; පදාම්, පදාදි ධාතූන්ගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; නීක්, නීගාගම වේ.

a. යඞ්, යඞ් ප්‍රත්‍යය ද; ලුකි ච, ලුග් වීම ද; සති, ඇති කල්හි; පද ස්‍රංසු— ස්කන්දාම්, පද්- ස්‍රන්ස්- ධ්වන්ස්- භ්‍රන්ශ්- දන්ශ්- කස්- වන්ච්- පත්- ස්කන්ද් යන ධාතූන්ගේ; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; නීගාගමඃ වාච්‍යඃ, නීක් ආගමය කිය යුතු යි. (මේ සූත්‍ර යෙහි "පදාම්" යන බහු වචනය ආද්‍යර්ථ ය. නීගාගමයෙහි කයන්ත පමණක් ඉත් ය. මෙ ද කිත් බැවින් "ආතඃ" යි පූර්ව රූපයේ අකාරයට ආකාරය නො වේ.)

(42) පනීපද්‍යතෙ, " අතිශයෙන පද්‍යතෙ" (=අතිශයින් පැමිණෙයි) යන වාක්‍යයෙහි පනීපද්‍යතෙ යනු වේ. (ලුඞ්හි අපනීපදිෂ්ට යනාදි වශයෙනි.) "නො ලොපඃ" යන සූත්‍රයෙන් (ස්‍රන්ස්- ධ්වන්ස්- භ්‍රන්ශ්- දන්ශ්- වන්ච්- ස්කන්ද් යන ධාතූන්ගේ) නකාරයට ලොප් වේ. ස්‍රංසු ධ්වංසු භ්‍රංශු, උකාරානුබන්ධ "ස්‍රන්ස්- ධ්වන්ස්- භ්‍රන්ශ්" යන ධාතු ත්‍රය; අධඃ පතනෙ, යටට වැටීමෙහි වේ.

(43) සනීස්‍රස්‍යතෙ, "අතිශයෙන ස්‍රංසතෙ" (=අතිශයින් වැටෙයි) යන වාක්‍යයෙහි සනීස්‍රස්‍යතෙ යනු වේ. (ලිට්- ලුඞ් දෙක්හි සනීස්‍රසාඤ්චක්‍රෙ- අසනීස්‍රසිෂ්ට යනාදි වශයෙන් වර නැගේ.)

(44) දනීධ්වස්‍යතෙ, "අතිශයෙන ධ්වංසතෙ" (=අතිශයින් පිරිහෙයි) යන වාක්‍යයෙහි දනීධ්වස්‍යතෙ යනු වේ. ("ඣපානාං ජබචපාඃ" යි පූර්ව ධකාරයට දකාරය වේ.)

---

* මේ සූත්‍රය පොත්හි නොපෙණේ.

**(46) වඤ්චු වඤ්චනෙ, වනීවච්‍යතෙ. (47) දනීදශ්‍යතෙ. (48) චනීකස්‍යතෙ. (49) පනීපත්‍යතෙ. (50) චනීස්කන්ද්‍යතෙ.**

## 196. ඍතො රිඞ්. * (සාතඃ 6-1. රිඞ 1-1.)

**a. ඍකාරස්‍ය රිඞාදෙශො භවති යඞි සති. තතො ද්විත්වම්. "යෙ."**

---

(45) බනීභ්‍රශ්‍යතෙ, "අතිශයෙන භ්‍රශ්‍යති" (=අතිශයින් බසියි) යන වාක්‍යයෙහි බනීභ්‍රශ්‍යතෙ යනු වේ. (පූර්වෝක්ත සූත්‍රයෙන් මෙහි ද භකාරයට බකාරය වේ.)

(46) වඤ්චු වඤ්චනෙ, උකාරානුබන්ධ "වන්ච්" ධාතුව රැවටීමෙහි වේ. වනීවච්‍යතෙ, "අතිශයෙන වඤ්චති" (=අතිශයින් රවටයි) යන වාක්‍යයෙහි වනීවච්‍යතෙ යනු වේ. (ලුඞ්හි අවනීවචිෂට යනාදී වශයෙනි.)

(47) දනීදශ්‍යතෙ, "අතිශයෙන දශති" (=අතිශයින් ඩසියි) යන වාක්‍යයෙහි දනීදශ්‍යතෙ යනු වේ. ("දංශ දංශනෙ" ධාතු යි.)

(48) චනීකස්‍යතෙ, "අතිශයෙන කසති" (=අතිශයින් යයි) යන වාක්‍යයෙහි චනීකස්‍යතෙ යනු වේ. ("කුහොශ්චුඃ" යි පූර්ව අවයවයේ කකාරයට චකාරය වේ. "කස ගතෞ" ධාතු යි.)

(49) පනීපත්‍යතෙ, "අතිශයෙන පතති" (=අතිශයින් වැටේ) යන වාක්‍යයෙහි පනීපත්‍යතෙ යනු වේ. ("පතෘ පතනෙ" ධාතු යි.)

(50) චනීස්කන්ද්‍යතෙ, "අතිශයෙන ස්කන්දති" (=අතිශයින් යෙයි හෝ වියලෙයි) යන වාක්‍යයෙහි චනීස්කන්ද්‍යතෙ යනු වේ. (පෙර මෙන් කකාරයට චකාරය වේ. "ස්කන්දිර් ගතිශොෂණයොඃ" ධාතු යි.)

196. රිඞාදෙශ විධි සූත්‍ර යි. "කර්තුඊඞ්" යි වි: වි: වශයෙන් 'යඞි' යනු අනුවෘත්ත වේ. යඞි, යඞ් ප්‍රත්‍යය පර කල්හි; ඍතඃ, ඍකාරයට; රිඞ්, රිඞාදෙශ වේ.

a. යඞි සති, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි; ඍකාරස්‍ය, ඍකාරයට; රිඞාදෙශඃ භවති, රිඞ් ආදෙශ වේ. තතඃ, ඉන් පසු; ද්විත්වම්, ද්විරුක්ත බව වේ. "යෙ" යන සූත්‍රයෙන් ඉකාරයට දීර්ඝ වේ. ("යඞි" යි පූර්ව රූපයට ගුණ වේ. "කුහොශ්චුඃ" යි චකාරය ද වේ.)

---

* ඍතො රිඃ = පොත්හි.

**(51) වෙක්‍රියතෙ- වෙක්‍රීයාඤ්චක්‍රෙ. (52) ජෙග්‍රියතෙ.**

## 197. දාදෙ‍ඊඃ. (දාදෙඃ 6-1. ඉඃ 1-1.)

**a. අපිද්දධාමාගෙහාක්පිබසොසථාමිකාරෙ භවති කිති ඞිති හසෙ පරෙ.**

**(53) දෙදීයතෙ-දෙදීයාඤ්චක්‍රෙ. "යෙ." (54) දෙධීයතෙ. (55) මෙමියතෙ. (56) ජෙගීයතෙ. (57) ජෙහියතෙ. (58) පෙපියතෙ. (59) සෙෂීයතෙ. (60) තෙෂ්ඨීයතෙ.**

---

(51 වෙක්‍රියතෙ, "අතිශයෙන කරොති" (=අතිශයින් කෙරෙයි) යන වාක්‍යයෙහි වෙක්‍රියතෙ යනු වේ. වෙක්‍රීයාඤ්චක්‍රෙ යනු ලිට් ප්‍ර: එක වචන යි. (වෙක්‍රියිෂීෂ්ට- වෙක්‍රියිතා-වෙක්‍රියිෂ්‍යතෙ- අවෙක්‍රියිෂ්‍යත- අවෙක්‍රියිෂ්ට යනු පිළිවෙළින් ආශීර්ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. "ඩුකෘඤ් කරණෙ" ධාතු යි.)

(52) ජෙග්‍රියතෙ, "අතිශයෙන හරති" (=අතිශයින් හරී) යන වාක්‍යයෙහි ජෙග්‍රියතෙ යනු වේ. (කෘ ධාතුව මෙහි. "හෘඤ් හරණෙ" ධාතු යි.)

197. ඉකාරාදෙශ විධි සූත්‍ර යි. "අපිත්‍යතාදිර්ඞිත්" යි වි: විඃ වශයෙන් 'අපිතඃ' යනු ද- 'ඞිති' යනු ද- "ණාදිඃ කිත්" යි වි: වි: වශයෙන් 'කිති' යනු ද- "යෙවාර්වි හසෙ" යි 'හසෙ' යනු ද අනුවෘත්ත යි. කිති, කිත් වූ ද; ඞිති, ඞිත් වූ ද; හසෙ, හස ප්‍රත්‍යාහාරය පර කල්හි; අපිතඃ, පිත් නො වූ හෙවත් පයන්න ඉත් කොට නැති; දාදෙඃ, දා ආදි ධාතු ගණයේ අන්තයට; ඉඃ, ඉකාරාදෙශ වේ.

a. කිති ඞිති හසෙ පරෙ, කිත් වූ ද- ඞිත් වූ ද හස ප්‍රත්‍යාහාර වර්ණය පර කල්හි; අපිත් දාධා—සථාමි, පිත් නුවූ දා- ධා- මා- ගෙ- හා- පා- සො- සථා යන ධාතූන්ගේ අන්තයට; ඉකාරඃ භවති; ඉකාරාදෙශ වේ. (මෙහි "දා" යන්නෙන් ඩුදාඤ් දානෙ- දෙ අවඛණ්ඩනෙ- දෙඞ් පාලනෙ යන ධාතු ත්‍රය ද, "මා" යන්නෙන් මා මානෙ- මාඞ් මානෙ- මෙඞ් ප්‍රණිදානෙ යන ධාතු ත්‍රය ද ගණු ලැබේ. "අපිත්" යි කී හෙයින් දාප්- දෛප් දෙකට නො වේ. මේ ඉකාරාදෙශය වූ පසු ධාතුහට විත්ව වේ.)

(53) දෙදීයතෙ, "අතිශයෙන දදාති, ද්‍යති, දයතෙ වා" (=අතිශයින් දෙයි, සිඳියි හෝ රකියි) යන වාක්‍යයෙහි දෙදීයතෙ යනු වේ. දෙදීයාඤ්චක්‍රෙ යනු ලිට් ප්‍ර: එක වචන යි. "යෙ" යන සූත්‍රයෙන් දීඝ වේ.

a. ඝ්‍රාධ්මොරී.

b. අනයොරීකාරෝ භවති යඞි සති.

**(61)** ජේඝ්‍රීයතෙ. **(62)** දෙධ්මීයතෙ. **(63)** හශෙනර්භිංසායාං ස්නි වා වාච්‍යඃ. ජේස්නීයතෙ "ඝඳමජපාං නුක්" ද්විරුක්තාස්‍ය

---

(54) දෙධීයතෙ, "අතිශයෙන දධාති"(=අතිශයින් දරයි) යන වාක්‍යයෙහි දෙධීයතෙ යනු වේ.

(55) මෙමීයතෙ, "අතිශයෙන මාති, මිමීතෙ, මයතෙ වා" (=අතිශයින් ප්‍රමාණ කෙරෙයි හෝ ගණු දෙනු කෙරෙයි) යන වාක්‍යයෙහි මෙමීයතෙ යනු වේ.

(56) ජෙගීයතෙ, "අතිශයෙන ගායති" (=අතිශයින් ගයයි) යන වාක්‍යයෙහි ජෙගීයතෙ යනු වේ. ("කුහොශ්චුඃ" සි පූර්ව ගකාරයට ජකාරය වේ. "ගෛ ශබ්දෙ" ධාතු යි.)

(57) ජෙහීයතෙ, "අතිශයෙන ජහාති" ("අතිශයින් හරී) යන වාක්‍යයෙහි ජෙහීයතෙ යනු වේ. ("කුහොශ්චුඃ" සි පූර්ව හකාරයට ඣකාරය වේ. "ඣපංතාම්-" සි ඊට ජකාරය වේ. "ඔහාක් ත්‍යාගෙ" ධාතු යි.)

(58) පෙපීයතෙ, "අතිශයෙන පිබති" (=අතිශයින් බොයි) යන වාක්‍යයෙහි පෙපීයතෙ යනු වේ. ("පා පානෙ" ධාතු යි.)

(59) සෙෂීයතෙ, "අතිශයෙන ස්‍යති" (=අතිශයින් නසී) යන වාක්‍යයෙහි සෙෂීයතෙ යනු වේ. ("ෂො'න්තකර්මණි" ධාතු යි.)

(60) තෙෂ්ඨීයතෙ, "අතිශයෙන තිෂ්ඨති" (=අතිශයින් සිටී) යන වාක්‍යයෙහි තෙෂ්ඨීයතෙ යනු වේ. ("ෂ්ඨා ගති නිවෘත්තෞ" ධාතු යි.)

a. ඝ්‍රාධ්මොඃ, ඝ්‍රා- ධ්මා ධාතු දෙකේ අන්තයට; ඊ, ඊකාරාදෙශ වේ.

b. යඞි සති, යඞ් ප්‍රත්‍යය ඇති කල්හි; අනයොඃ, මේ "ඝ්‍රා ගන්ධොපාදනෙ- ධ්මා ශබ්දාග්නි සංයොගයොඃ" යන ධාතු දෙකට; ඊකාරඃ භවති, ඊකාරය වේ. ("යෙ" සි දීඝී වන හෙයින් ඉකාරාදෙශයෙන් සිද්ධ වතුදු යඞ්ලුක් ප්‍රක්‍රියායෙහි ප්‍රයොජනය පිණිස ඊකාරාදෙශය විහිත ය.)

(61) ජෙඝ්‍රීයතෙ, "අතිශයෙන ජිඝ්‍රති" (=අතිශයින් ආඝ්‍රාණය කෙරේ) යන වාක්‍යයෙහි ජෙඝ්‍රීයතෙ යනු වේ.

(62) දෙධ්මීයතෙ, "අතිශයෙන ධමති" (=අතිශයින් පිඹී) යන වාක්‍යයෙහි දෙධ්මීයතෙ යනු වේ. (ලිට්- ලුඞ් දෙක්හි දෙධ්මීයාඤ්චක්‍රෙ- අදෙධ්මීයිෂ්ට යනාදි වශයෙනි.)

**හන්තෙඃ කුත්වං වාච්‍යම්. ජඞ්ඝන්‍යතෙ. (64) වායො යඞි කී වාච්‍යඃ. වායෘ සන්තානපාලනයොඃ * වෙකීයතෙ. (65) කවතෙරීඩි චුත්වාභාවො වාච්‍යඃ. කු ශබ්දෙ, කොකූයතෙ.**

**(66) ශීඞො'යඞි ක්ඞිති යෙ වක්තව්‍යඃ. ශාශය්‍යතෙ.**

---

(63) හිංසායාම්, හිංසාර්ථයෙහි වූ; හන්තෙඃ, 'හන්' ධාතුහට; වා, විකල්පයෙන්; ඝ්නී වාච්‍යඃ, ඝ්නී ආදෙශය කිය යුතු යි. ("ඝ්නි"යි හ්‍රස්වාදෙශයෙන් ද සිද්ධ වන නමුත් ප්‍රක්‍රියා ලාඝවය පිණිස දීර්ඝාදෙශය විහිත ය.) ජෙඝ්නීයතෙ, "අතිශයෙන හන්ති" (=අතිශයින් නසයි) යන වාක්‍යයෙහි ජෙඝ්නීයතෙ යනු වේ. ඝදමජපාං නුක්, ඝ්නී ආදෙශය නුවූ පක්ෂයෙහි "ඝදමජපාං නුක්" යන සූත්‍රයෙන් පූර්ව රූපය සම්බන්ධ ව නුගාගම වේ. ද්විරුක්තස්‍ය හන්තෙඃ, ද්විරුක්ත වූ හන් ධාතුහට; කුත්වම්, කවර්ග බව; වාච්‍යම්, කිය යුතු යි. (වර්ග චතුර්ථාක්ෂරය හකාරයට සවර්ණ හෙයින් මෙහි ඝකාරය වේ. පූර්ව රූපයේ හකාරයට "කුහොශ්චුඃ" යි ඣකාරය ච "ඣපානාං ජබදපාඃ" යි ජකාරය වේ. ආගම වූ නකාරයට "නශ්චාපදාන්ත ඣසෙ" යි අනුස්වාර ච "යමා යපෙ'ස්‍ය" යි වර්ගාන්ත ඞකාරය වේ. එකල්හි ලට් ප්‍ර: එක වචනයෙහි) ජඞ්ඝන්‍යතෙ යනු වේ. (ලිට්- ලුඞ් දෙක්හි ජඞ්ඝන්‍යාඤ්චක්‍රෙ- අජඞ්ඝනිෂ්ට යනාදි වශයෙන් වර නැගේ.)

(64) යඞි, යඞ් ප්‍රත්‍යය පර කල්හි; වායඃ, 'වාය්' ධාතුහට; කී වාච්‍යඃ, 'කී' ආදෙශය කිය යුතු යි. (මෙහි ද දීර්ඝාදෙශය යඞ් ලුගන්ත යෙහි ප්‍රයොජනය පිණිස යි.) වායෘ සන්තාන පාලනයොඃ, ඍකා රානුබන්ධ "වාය්" ධාතුව පැතිරවීම රැකීම යන අර්ථ දෙක්හි වේ. වෙකීයතෙ, "අතිශයෙන වායති"(=අතිශයින් පතුරුවයි හෝ රකියි) යන වාක්‍යයෙහි වෙකීයතෙ යනු වේ. (ලුඞ්හි අවෙකීයිෂ්ට යනාදි වශයෙනි.)

(65) යඞි, යඞ් ප්‍රත්‍යය පර කල්හි; කවතෙඃ, කු ධාතුහට; චුත්ව + අභාවඃ, චවර්ග බව නො වීම; වාච්‍යඃ. කිය යුතු යි. ("කුහොශ්චුඃ" යි පූර්ව රූපයට චකාරය නො වෙයි යු සේ යි.) කු ශබ්දෙ, "කු" ධාතුව ශබ්දාර්ථයෙහි වේ. කොකූයතෙ, "අතිශයෙන කවතෙ" (=අතිශයින් ශබ්ද කෙරෙයි) යන වාක්‍යයෙහි කොකූ යතෙ යනු වේ. (ලුඞ්හි අකොකූයිෂ්ට යනාදි වශයෙනි.)

---

* වායෘ පූජානිශාමනයොඃ- සුබොධිනී.

(67) ඪෞකෘ ගතෞ, ඩොඪෞක්‍යතෙ. (68)ත්‍රෞකෘ ගතෞ, තොත්‍රෞක්‍යතෙ.

---

## ඉති යඞන්ත ප්‍රක්‍රියා.

a. අථ යඞ්ලුක් ප්‍රක්‍රියා නිරූප්‍යතෙ:-

---

(66) ක්ඞිති යෙ, කිත් වූ ද- ඞිත් වූ ද යකාරය පර කල්හි; ශීඞ්, "ශීඞ් ස්වප්නෙ" යන ධාතුහට; අයඞ් වක්තව්‍යඃ, 'අයඞ්' ආදෙශය කිය යුතු යි. (ඞිත් බැවින් අන්තයට වේ.) ශාශය්‍යතෙ, "අතිශයෙන ශෙතෙ" (=අතිශයින් ශයනය කෙරේ) යන වාක්‍ය යෙහි ශාශය්‍යතෙ යනු වේ. (ලිට්-ලුඞ් දෙක්හි ශාශයාඤ්චක්‍රෙ-අශාශයිෂ්ට යනාදි වශයෙනි.)

(67) ඪෞකෘ ගතෞ, රනුබන්ධ "ඪෞක්" ධාතුව ගමන්හි වේ. ඩොඪෞක්‍යතෙ, "අතිශයෙන ඪෞකතෙ" (=අතිශයින් පැමිණෙයි) යන වාක්‍යයෙහි ඩොඪෞක්‍යතෙ යනු වේ. ("හ්‍රස්වඃ" යි හ්‍රස්ව වීම් වශයෙන් පූර්ව රූපයේ ඖකාරයට උකාරය ව "යඞි" යි ගුණ වේ. "ඣපානාං ජබචපාඃ" යි ඪකාරයට ඩකාරය වේ. (ලුඞ්හි අඩොඪෞකිෂ්ට යනාදි වශයෙනි.)

(68) ත්‍රෞකෘ ගතෞ, රනුබන්ධ "ත්‍රෞක්" ධාතුව ගමනාර්ථයෙහි වේ. තොත්‍රෞක්‍යතෙ, "අතිශයෙන ත්‍රෞකතෙ" (=අතිශයින් ගමන් කෙරෙයි) යන වාක්‍යයෙහි තොත්‍රෞක්‍යතෙ යනු වේ. (ලට් ප්‍ර: එක වචන යි. පද සිද්ධිය පෙර මෙනි. තොත්‍රෞක්‍යෙත-තොත්‍රෞක්‍යතාම්- අතොත්‍රෞක්‍යත- තොත්‍රෞකාඤ්චක්‍රෙ- තොත්‍රෞකිෂීෂ්ට- තොත්‍රෞකිතා- තොත්‍රෞකිෂ්‍යතෙ- අතොත්‍රෞකිෂ්‍යත-අතොත්‍රෞකිෂ්ට යනු සෙසු නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.)

යඞන්ත ප්‍රක්‍රියා, යඞන්ත ධාතුන්ගේ පද සාධන ක්‍රියාව; ඉති, මෙසේ යි.

## යඞන්ත ප්‍රක්‍රියාව සමාප්ත යි.

---

a. අථ, යඞන්ත ප්‍රක්‍රියාවට අනතුරු ව; යඞ්ලුක් ප්‍රක්‍රියා, යඞ් ලුගන්ත ධාතුන්ගේ පද සාධන ක්‍රියාව; නිරූප්‍යතෙ, දක්වනු ලැබේ.

## 198. වාන්‍යත්‍ර. (වා- නි: අන්‍යත්‍ර- නි:)

**a. ලුගනුවර්තතෙ. අන්‍යත්‍රෙත්‍යුකප්‍රත්‍යයසංයොගං විනාපි යඞො ලුග් භවති.**

---

198. යඞ්ලුක් විධි සූත්‍ර යි. "යඞ ඌකඃ" යි 'යඞඃ' යනු ද- "ලුකි" යි වි: වි: වශයෙන් 'ලුක්' යනු ද අනුවෘත්ත යි. අන්‍යත්‍ර, සෙසු තැන්හි; යඞඃ, යඞ් ප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; ලුක්, ලුක් වේ.

a. ලුක් + අනුවර්තතෙ, "ලුක්" යනු අනුවෘත්ත වේ. අන්‍යත්‍ර ඉති, අන්‍යත්‍ර යයි සේ යි; ඌක ප්‍රත්‍යය සංයොගං විනා අපි, ඌක ප්‍රත්‍යය සංයොගයක් නැති ව ද; වා, විකල්පයෙන්; යඞඃ, යඞ් ප්‍රත්‍යයට; ලුක් භවති, ලුක් වේ. (කෘදන්තයෙහි "දන්දශූකඃ" යනාදීන් දක්වනු ලබන ඌක ප්‍රත්‍යය පර කල්හි නිත්‍යයෙන් යඞ් ප්‍රත්‍යයට ලුක් වේ.) සෙසු තැන්හි ද විකල්පයෙන් ලුක් වන බව මෙයින් දැක්වූහ.

ධාතුන් කෙරෙන් පර ව "අතිශයෙ භසාදෙර්යඞ් ද්විශ්ච" යි යඞ් ප්‍රත්‍යය ව ධාතුවට ද්විත්ව ද වූ පසු "යඞි" යි පූර්ව රූපයට ගුණ වේ. ඉක්බිති මේ සූත්‍රයෙන් යඞ් ප්‍රත්‍යයට ලොප් වේ. "ස ධාතුඃ" යි ධාතු සංඥ වේ. එකල්හි ඒ යඞ්ලුගන්ත ධාතුහු කෙරෙන් අප් විකරණය හා ලඞාදි විභක්තිහු වෙත්. එහෙත් ධාතුන් පිළිබඳ සියලු කාර්‍ය්‍යයෝ යඞ් ලුග් විෂයෙහි නො වෙත්. එහෙයින් කීහ:-

"ශ්තිපා ශපානුබන්ධෙන- නිර්දිෂ්ටං යද්ගණෙන ච,
යත්‍රෙකාජ් ග්‍රහණඤ්චව- පඤ්චෛතානි න යඞ් ලුකි."

"ශ්තිප් ප්‍රත්‍යයෙන් ද- ශප් (=අප්) විකරණයෙන් ද- අනුබන්ධයෙන් ද- ගණ වශයෙන් ද යම් කාර්‍ය්‍යයක් දක්වන ලද ද, එසේ ම යම් තැනෙක්හි එකස්වර ග්‍රහණයෙන් යමක් දක්වන ලද ද, ඒ මේ කාර්‍ය්‍ය පස යඞ්ලුග් විෂයෙහි නො වෙති" යනු අර්ථ යි. (1) මෙහි ශ්තිප් ප්‍රත්‍යය නම් "ඉක්ශ්තිපෞ ධාතු නිර්දේශෙ" යි විහිත "ශ්තිප්" ප්‍රත්‍යය යි. එයින් නිර්දිෂ්ට "ත්‍රනොතෙ ණෝ වා" යනාදි සූත්‍රවලින් විහිත කාර්‍ය්‍යය යඞ්ලුග් විෂයෙහි නොවේ. (2) ශප් විකරණය නම් මේ ව්‍යාකරණයෙහි "අප්" විකරණය යි. එයින් නිර්දිෂ්ට "රඤ්ජ් දංශෂඤ්ජ ස්වඤ්ජාම්" යනාදි සූත්‍රවලින් විහිත කාර්‍ය්‍යය ද නො වේ. (3) අනුබන්ධයෙන් නිර්දිෂ්ට හෙයින් භෲඤං ලුකි යනාදීන් විහිත කාර්‍ය්‍යය ද;(4) ගණයෙන් නිර්දිෂ්ට හෙයින් "දිවෘදෙර්ඝඃ" යනාදීන්

## 199. ලුකි සති පිතඃ ත්සෙමා වෙට්.

(ලුකි 7-1. සති 7-1. පිතඃ 6-1. ත්සමඃ 6-1. වා–නි: ඊට් 1-1.)

**a. ලුකි සති පිතඃ ත්සෙමා වා ඊඩ් වක්තව්‍යඃ. *(1) බොභවීති- බොභොති, බොභූතඃ, බොභුවති.**

**b, යඞ්ලුගන්තං පරස්මෛපදං හ්වාදිවච්ච ද්‍රෂ්ටව්‍යම්. † හ්වාදිවත්ත්වාදපො ලුග්, ද්විත්වමපි ඥාතව්‍යම්.**

---

විහිත කාර්‍ය්‍යය ද, (5) එකස්වර ග්‍රහණයෙන් නිර්දිෂ්ට හෙයින් "නෛකස්වරාදනුදාත්තාත්" යනාදීන් විහිත කාර්‍ය්‍යය ද නො වෙති. මේ යඞ් ලුගන්තයට චර්කරීත යයි ද පෞරාණිකයන්ගේ නමක් වෙයි.)

199. ඊඩාගම විධි සූත්‍ර යි. ලුකි සති, යඞ් ප්‍රත්‍යයට ලුක් වීම ඇති කල්හි; පිතඃ, පිත් වූ හෙවත් පයන්ත ඉත් කොට ඇති; ත්සමඃ, තකාර– සකාර– මකාර සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඊට්, ඊඩාගම වේ.

a, ලුකි සති, ලුක් වීම ඇති කල්හි; පිතඃ, පිත් වූ; ත්සමඃ, තකාර– සකාර– මකාර සම්බන්ධ ව; වා, විකල්පයෙන්; ඊට් වක්තව්‍යඃ, ඊඩාගමය කිය යුතු යි. (මෙයින් පිත් වූ තකාර– සකාර– මකාරාදි ප්‍රත්‍යයන් සම්බන්ධ ව ඊඩාගම වන බව දැක්වේ.)

(1) බොභවීති– බොභොති, "අතිශයෙන භවති" යන වාක්‍ය යෙහි ඊඩාගම පක්ෂයෙහි බොභවීති යනු ද, විකල්ප පක්ෂයෙහි බොභොති යනු ද ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. බොභූතඃ– බොභුවති යනු ද්වි– බහු වචන යි. (බොභුවති යන මෙහි "ද්‍යොඃ" යන් නෙන් 'අන්ත්' හට 'අත්' ආදෙශ ද, "නු ධාතොඃ" යි ධාතුස්ථ ඌකාරයට 'උව්' ආදෙශ ද වේ.)

b. යඞ්ලුගන්තම්, යඞ්ලුගන්ත ධාතු රූපය; පරස්මෛපදම්, පරස්මෛපද ඇත්තේ ය. හ්වාදිවත් ච, හ්වාදිය (=ජුහොත්‍යාදිය) මෙන් ද; ද්‍රෂ්ටව්‍යම්, දැක්ක යුතු යි. හ්වාදිවත්ත්වාත්, හ්වාදිය වැනි බැවින්; අපඃ, අප් විකරණයට; ලුක්, ලුක් වේ; ද්විත්වම් අපි, ද්විත්වය ද; ඥාතව්‍යම්, දත යුතු යි. (විකරණය ලුක් වන හෙයින් ද, ධාතුහට ද්විත්ව වන හෙයින් ද යඞ් ලුගන්තය ජුහොත්‍යාදිය මෙනැයි මෙහි කී නමුත් සුබොධිනී ආදියෙහි "යඞ්ලුගන්තමදාදෞ බොධ්‍යම්" යි අදාදිය මෙනැයි කීහ. ආත්මනෙපදි ධාතූන්ගෙන් නිපන් යඞ් ලුගන්තයෝ ද පරස්මෛපදයෙහි පමණක් ම වර නැගෙති.)

---

* මේ සූත්‍ර වෘත්තිය පොත්හි නො පෙනේ.

† "චර්කරීතං පරස්මෛපදං අදාදිවච්ච ද්‍රෂ්ටව්‍යම්" – රූපාවතාර.

**a. බොභූයාත්, බොභවීතු- බොහොතු- බොභූතාත්, බොභූතාම්, බොභූවතු. අබොභවීත්- අබොහොත්, අබොභූතාම්, අබොභවුඃ. [1] බොභවාඤ්චකාර, [2] බොභූයාත්, බොභවිතා, බොභවිෂ්‍යති, අබොභවිෂ්‍යත්.**

**b. "දෘදෙඃ පෙ." ගුණං බාධිත්වා නිත්‍යත්වාද් වුක්. අබොභූවීත් [3] – අබොහොත්, අබොභූතාම්, අබොභූවුඃ. [4]**

**(2) පාපචීති- පාපකති, පාපකතඃ, පාපචති. පාපච්‍යාත්, පාපචීතු- පාපක්තු. "ඣසාදධිහේඃ" පාපග්ධි. අපාපචීත්- අපාපක්, පාපචාඤ්චකාර, පාපච්‍යාත්, පාපචිතා, පාපචිෂ්‍යති, අපාපචිෂ්‍යත්, අපාපචීත්.**

---

a. බොභූයාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. බොභවීතු- බොහොතු- බොභූතාත් යනු ලොට් ප්‍ර: එක වචන යි. (ඊඞ් විකල්පත්වයෙන් හා තාතඞ් ආදෙශයෙන් රූප ත්‍රයයෙකි.) බොභූතාම්, බොභූවතු යනු ද්වි- බහු වචන යි. අබොභවීත්- අබොහොත් යනු ලඞ් ප්‍ර: එක වචන යි. අබොභූතාම්, අබොභවුඃ යනු ද්වි- බහු වචන යි. බොභවාඤ්චකාර -පෙ- අබොභවිෂ්‍යත් යනු ලිට්- ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි.

b. "දෘදෙඃ පෙ" යන සූත්‍රයෙන් සි ප්‍රත්‍යයට ලොප් වේ. ගුණං බාධිත්වා, (ඊඩාගම වූ පක්ෂයෙහි) ගුණය වළකා; නිත්‍යත්වාත්, නිත්‍ය බැවින්; වුක්, (භුවඃ සිලොපෙ ස්වරෙ වුග් වක්තව්‍යඃ යි කී හෙයින්) වුගාගම වේ. අබොභූවීත්- අබොහොත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි. අබොභූතාම්- අබොභූවුඃ යනු ද්වි- බහු වචන යි.

(2) පාපචීති- පාපකති යනු "අතිශයෙන පචති" යන වාක්‍යයෙහි යඞ්ලුගන්ත ලට් ප්‍ර: එක වචන යි. පාපකතඃ- පාපචති යනු ද්වි- බහු වචන යි. පාපච්‍යාත් යනු විධි ලිඞ් ප්‍ර: එක වචන යි. පාපචීතු- පාපක්තු යනු ලොට් ප්‍ර: එක වචන යි. ("පාපකතාත්" යි ද රූපයෙක් ලැබේ.) "ඣසාදධිහේඃ" යන සූත්‍රයෙන් හි ප්‍රත්‍යයට 'ධි' ආදෙශ වේ. පාපග්ධි (=පාපකතාත්) යනු ලොට් ම: එක වචන යි. අපාපචීත්- අපාපක් යනු ලඞ් ප්‍ර: එක වචන යි. (ඊට් නුවූ පක්ෂයෙහි "දිස්‍යොහීසාත්" යි දිප්- සිප් දෙකට ලුක් වේ. අපාපචීඃ- අපාපක් යනු ම: එක වචන යි.) පාපචාඤ්චකාර -පෙ- අපාපචීත් යනු ලිට්- ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එක වචන යි.

---

1. අබොභූවත්- 2. බොභූවාඤ්චකාර-
3. අබොභූවීත්- 4. අබොභූවුඃ, මු: බො:

**(3) "ද්වෙඃ සවරෙ'පි පිති නොපධායාඃ." * බොභුජීති– බොභොක්ති, අබොභුජීත්–අබොභොක්, (4) වාවදීති– වාවත්ති. (5) ජාඝටීති– ජාඝට්ටි.**

**a. ඍඃකාරාන්තානාමෘදුපධානාං ච යඞ්ලුකි සති පූර්වස්‍ය රුක් රික් රීක් ආගමා වක්තව්‍යාඃ. "රඃ."**

---

(3) "ද්වොඃ සවරෙ'පි පිති නොපධායාඃ" යන සූත්‍රයෙන් ඊඩාගම පක්‍ෂයෙහි ගුණ ප්‍රතිෂෙධ වේ. බොභුජීති– බොභොක්ති යනු "අතිශයෙන භුනක්ති, භුඞ්ක්තෙ වා" යන වාක්‍යයෙහි ලට් ප්‍රඃ එක වචන යි. අබොභුජීත්– අබොභොක් යනු ලඞ් ප්‍රඃ එක වචන යි. (බොභුජාඤ්චකාර– බොභුජ්‍යාත්– බොභුජිතා– බොභුජිෂ්‍යති– අබොභුජිෂ්‍යත්– අබොභුජීත් යනු ලිට් –පෙ– ලුඞ් ප්‍රඃ එක වචන යි. "භුජ පාලනාභ්‍යවහරණයොඃ" ධාතු යි.)

(4) වාවදීති– වාවත්ති යනු "අතිශයෙන වදති" යන වාක්‍යයෙහි ලට් ප්‍රඃ එක වචන යි. (වාවද්‍යාත් යනු විධි ලිඞ් ප්‍රඃ එක වචන යි. වාවදීතු– වාවත්තු– වාවත්තාත් යනු ලොට්හි ද, අවාවදීත්– අවාවත් යනු ලඞ්හි ද ප්‍රඃ එක වචන යි. වාවදාඤ්චකාර– වාවද්‍යාත්– වාවදිතා– වාවදිෂ්‍යති– අවාවදිෂ්‍යත්– අවාවාදීත් යනු ලිට් –පෙ– ලුඞ් ප්‍රඃ එක වචන යි. "වද ව්‍යක්තායාං වාචි" ධාතු යි.)

(5) ජාඝටීති– ජාඝට්ටි යනු "අතිශයෙන ඝටතෙ" යන වාක්‍යයෙහි ලට් ප්‍රඃ එක වචන යි. (ඊට් නො වන පක්‍ෂයෙහි "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යි ටුත්වය වේ. ජාඝට්‍යාත් යනු විධි ලිඞ්හි ද, ජාඝටීතු– ජාඝට්ටු– ජාඝට්ටාත් යනු ලොට්හි ද, අජාඝටීත්– අජාඝට් යනු ලඞ්හි ද ප්‍රඃ එක වචන යි. සෙස්ස සුගම යි. "ඝට චෙෂ්ටායාම්" ධාතු යි.)

a. යඞ්ලුකි සති, යඞ් ප්‍රත්‍යයට ලුක් වීම ඇති කල්හි; ඍඃකාරාන්තානාම්, ඍඃකාරාන්ත ධාතූන්ගේ ද; ඍදුපධානාං ච, ඍඃකාරය උපධා කොට ඇති ධාතූන්ගේ ද; පූර්වස්‍ය, පූර්ව රූපය සම්බන්ධ ව; රුක් රික් රීක් ආගමාඃ, රුක්– රික්– රීක් යන ආගමයෝ; වක්තව්‍යාඃ, කිය යුත්තාහ. (රුක් ආගමයෙහි "උක්" යනු ද, රික්– රීක් දෙක්හි "ක්" යන්න පමණක් ද ඉත් ය.) "රඃ" යන සූත්‍රයෙන් පූර්ව රූපයේ ඍඃකාරයට අකාරය වේ. (ආගමයන් 'කිත්' බැවින් "ආතඃ" යි පූර්ව අකාරයට ආකාරය නො වේ.)

---

* පොත්හි, මෙතැන්හි "ද්වෙඃ – ද්විරුක්තස්‍ය පිති සාර්වධාතුකෙ සවරෙ'පි නොපධායා ගුණඃ" යි සූත්‍ර– වෘත්ති ද්වයක් පෙණේ. ඒ නිරර්ථක ය.

**(6) ඩුකෘඤ් කරණෙ. චර්කරීති - චරිකරීති - චරීකරීති, චර්කර්ති - චරිකර්ති - චරීකර්ති, චර්කෘතඃ - චරිකෘතඃ - චරීකෘතඃ, චර්ක්‍රති- චරික්‍රති - චරීක්‍රති. අචර්කාරීත්- අචරිකාරීත්- අචරීකාරීත්.**

**(7) වර්වෘතීති- වරිවෘතීති- වරීවෘතීති, වර්වර්ති- වරිවර්ති- වරීවර්ති. අවර්වෘතීත්- අවරිවෘතීත්- අවරීවෘතීත්, "ගතාසසා."**

---

(6) ඩුකෘඤ් කරණෙ, ඩු- ඤ් අනුබන්ධ "කෘ" ධාතුව කිරීමෙහි වේ. චර්කරීති- චරිකරීති- චරීකරීති යනු "අතිශයෙන කරොති" යන වාක්‍යයෙහි ඊඩාගම පක්ෂයෙහි ද, චර්කර්ති- චරිකර්ති- චරීකර්ති යනු විකල්ප පක්ෂයෙහි ද ලට් ප්‍ර: එක වචන යි. චර්කෘතඃ- චරිකෘතඃ- චරීකෘතඃ යනු ද්වි වචන යි. චර්ක්‍රති- චරික්‍රති- චරීක්‍රති යනු බහු වචන යි. (පිළිවෙළින් රුක්- රික්- රීක් ආගම ත්‍රයයෙන් සිද්ධ යි. මෙසේ පුරුෂ ත්‍රයෙහි ම එක වචනයන්හි රූප සය බැගින් ද, ද්වි- බහු වචනයන්හි රූප ත්‍රය බැගින් ද ලැබෙන හෙයින් ලට්හි රූප සතිසෙකි. ලොට්හි ද එපමණ මැයි. ප්‍රථම පුරුෂෙක වචනයෙහි 9 ක් ද, මධ්‍යම පුරුෂෙක වචනයෙහි 6 ක් ද, සෙසු වචනයන්හි තුණ බැගින් ද ලැබෙන හෙයිනි. ලඞ්හි ප්‍රථම- මධ්‍යම පුරුෂෙක වචනයන්හි රූප සය බැගින් ලැබෙන හෙයින් සියල්ල 33 කි. ලිට්හි සියලු වචනයන්හි රූප 9 බැගින් ලැබෙන හෙයින් සියල්ල 81 කි. සෙසු ලකාරයන්හි රූප 27 බැගින් ලැබේ.)

(චර්කෘයාත්- චරිකෘයාත්- චරීකෘයාත් යනු විධි ලිඞ්හි ද, චර්කරීතු- චරිකරීතු- චරීකාරීතු, චර්කර්තු- චරිකර්තු- චරීකර්තු, චර්කෘතාත්- චරිකෘතාත්- චරීකෘතාත් යනු ලොට්හි ද, අචර්කරීත්- අචරිකරීත්- අචරීකරීත්- අචර්කඃ- අචරිකඃ- අචරීකඃ යනු ලඞ්හි ද, චර්කරාඤ්චකාර- චරිකරාඤ්චකාර- චරීකරාඤ්චකාර, චර්කරාම්බභූව- චරිකරාම්බභූව- චරීකරාම්බභූව, චර්කරාමාස- චරිකරාමාස- චරීකරාමාස යනු ලිට්හි ද, චර්ක්‍රියාත්- චරික්‍රියාත්- චරීක්‍රියාත් යනු ආශීර් ලිඞ්හි ද, චර්කරිතා- චරිකරිතා- චරීකරිතා යනු ලුට්හි ද, චර්කරිෂ්‍යති- චරිකරිෂ්‍යති- චරීකරිෂ්‍යති යනු ලෘට්හි ද, අචර්කරිෂ්‍යත්- අචරිකරිෂ්‍යත් -අචරීකරිෂ්‍යත් යනු ලෘඞ්හි ද ප්‍රථම පුරුෂෙක වචන යි.) අචර්කාරීත්- අචරිකාරීත්- අචරීකාරීත් යනු ලුඞ් ප්‍රථම පුරුෂෙක වචන යි.

(7) වර්වෘතීති- වරිවෘතීති- වරීවෘතීති, වර්වර්ති- වරිවර්ති- වරීවර්ති යනු "අතිශයෙන වර්තතෙ" යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. (වර්වෘත්‍යාත්- වරිවෘත්‍යාත්- වරීවෘත්‍යාත් යනු විධි ලිඞ්හි ද, වර්වෘතීතු- වරිවෘතීතු- වරීවෘතීතු, වර්වර්තු- වරිවර්තු- වරීවර්තු වර්වෘත්තාත්- වරිවෘත්තාත්- වරීවෘත්තාත් යනු ලොට්හි ද ප්‍ර: එක

**අවව්ර්ත්- අවරිවර්ත්-අවරීවර්ත්. අවවෘතනාම්-අවරිවෘතනාම්-අවරීවෘතනාම්. වව්තීාක්ෂවකාර - වරිවතීාක්ෂවකාර- වරීවතීාක්ෂවකාර.**

**(8) වනිවක්ෂ්චීති - වනිවඞ්කති. "නො ලොපඃ" වනීවකතඃ, වනීවචති. (9) ජඞ්ගමීති- ජඞ්ගනති. "ලොපස්ත්වනුදාත්ත තනාම්" ජඞ්ගනඃ. "ගමාං ක්ඞිරෙ" ජඞ්ග්මති. ධාතුග්‍රහණොක්තං යඞ්ලුකි වෙති කෙචිත්. ජඞ්ගමති. "මො නො ධාතොඃ" * ජඞ්ගන්මි, ජඞ්ගන්වඃ, ජඞ්ගන්මඃ.**

---

වචන යි.) අවව්ෘතීත්- අවරිවෘතීත්- අවරීවෘතීත් යනු ලඞ් ප්‍ර: එකවචන යි. "රාත්සස්‍ය" යනුවෙන් රකාරයා කෙරෙන් පර සකාරයට ලොප් වේ. (අතිකකට ලොප් නො වේ.) අවව්ර්ත්- අවරිවර්ත්- අවරීවර්ත් යනු ඊට් නුවූ පක්ෂයෙහි ලඞ් ප්‍ර: එක වචන යි. අවව්ෘතතාම්- අවරිවෘතතාම්- අවරීවෘතතාම් යනු ද්වි වචන යි. වව්තීාක්ෂවකාර- වරිවතීාක්ෂවකාර- වරීවතීාක්ෂවකාර, (වව්තීාම්බභූව- වරිවතීාම්බභූව- වරීවතීාම්බභූව, වව්තීාමාස- වරිවතීාමාස- වරීවතීාමාස) යනු ලිට් ප්‍ර: එක වචන යි. (වව්ෘත්‍යාත්- වරිවෘත්‍යාත්- වරීවෘත්‍යාත් යනු ආශීර් ලිඞ්හි ද, වව්ර්තිතා- වරිවර්තිතා- වරීවර්තිතා යනු ලුට්හි ද, වව්ර්තිෂ්‍යති- වරිවර්තිෂ්‍යති- වරීවර්තිෂ්‍යති යනු ලෘට්හි ද, අවව්ර්තිෂ්‍යත්- අවරිවර්තිෂ්‍යත්- අවරීවර්තිෂ්‍යත් යනු ලෘඞ්හි ද, අවව්ර්තීත්- අවරිවර්තීත්- අවරීවර්තීත් යනු ලුඞ්හි ද ප්‍රථම පුරුෂෛක වචන යි. "වෘතුඞ් වර්තනෙ" ධාතු යි. මෙසේ ඍකාරාන්ත ධාතු 'කෘ' ධාතුව මෙන් ද, ඍදුපධ ධාතු 'වෘත්' ධාතුව මෙන් ද වර නැගෙති.)

(8) වනීවක්ෂ්චීති- වනීවඞ්කති යනු "අතිශයෙන වක්ෂ්චති" යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. ("පදං නීක්" යි නීගාගම වේ.) "තො ලොපඃ" යන සූත්‍රයෙන් තකාරයට ලොප් වේ. වනීවකතඃ- වනීවචති යනු ද්වි- බහු වචන යි. (විධි ලිඞ්හි වනීවච්‍යාත් යනු ද, ලොට්හි වනීවක්ෂ්චීතු- වනීවඞ්ක්තු- වනීවඞ්කතාත් යනු ද, ලඞ්හි අවනීවක්ෂ්චීත්- අවනීවන් යනු ද, ලිට්හි වනීවක්ෂ්චාඤ්චකාර- වනීවක්ෂ්චාම්බභූව- වනීවක්ෂ්චාමාස යනු ද ප්‍ර: එක වචන යි. වනීවච්‍යාත්- වනීවක්ෂ්චිතා- වනීවක්ෂ්චිෂ්‍යති- අවනීවක්ෂ්චිෂ්‍යත්- අවනීවක්ෂ්චීත් යනු ආශීර් ලිඞ්-පෙ-ලුඞ් ප්‍ර: එක වචන යි. "වක්ෂ්චු, වක්ෂ්චනෙ" ධාතු යි.)

(9) ජඞ්ගමීති- ජඞ්ගනති යනු "අතිශයෙන ගච්ඡති" යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. ("ක්ෂමජපාං නුක්" යි නුගාගම ව-

---

* පොත්හි මෙතැන්හි ද සූත්‍ර- වෘත්ති දෙක ම පෙණේ. පෙර කියන ලද්දක් හෙයින් මෙතැන්හි දක්වීම නිෂ්ඵල ය. පොතේ 42 වෙනි පිට බලනු.

**(10) ද්විරුක්තස්‍ය හන්තෙඃ කුත්වං වාච්‍යම්. ජඞ්ඝනීති- ජඞ්ඝන්ති, ජඞ්ඝතඃ, ජඞ්ඝ්නති. (11) ජාහෙති- ජාහාති, ජහිතඃ, ජහති. එවං දධෙතීත්‍යාදි.**

---

“නශ්චාපදාන්තස්‍ය ඣලි” යි අනුස්වාර ව “යමො යපෙ'ණුස්‍ය” යි ඞකාරය වේ. (ඊට නො වන පක්‍ෂයෙහි ධාතුස්ථ මකාරයට ද අනුස්වාර ව වර්ගාන්තාදෙශ වේ.) “ලොපස්ත්වනුදාත්ත තනාම්” යන සූත්‍රයෙන් ධාත්වන්ත මකාරයට ලොප් වේ. ජඞ්ගතඃ යනු ලට් ප්‍ර: ද්වි වචන යි. “ගමාං සවරෙ” යන සූත්‍රයෙන් උපධා සංඥයට ලොප් වේ. ජඞ්ග්මති යනු බහු වචන යි. යඞ් ලුකි, යඞ් ප්‍රත්‍යයට ලුක් වීම ඇති කල්හි; ධාතු ග්‍රහණ + උක්තම්, ධාතු ග්‍රහණයෙන් කියන ලද්ද; වා ඉති, විකල්පයෙන් වේ යයි; කෙචිත්, සමහරු කියත්. (ඒ මතය ලෙස “ගමාං සවරෙ” යි විහිත උපධා ලොපය ධාතු ග්‍රහණොක්ත බැවින් විකල්පයෙන් වේ.) ජඞ්ගමති යනු උපධා ලොපය නුවූ පක්‍ෂයෙහි ලට් ප්‍ර: බහු වචන යි. “මො නො ධාතොඃ” යන සූත්‍රයෙන් ධාත්වන්ත මකාරයට නකාරය වේ. ජඞ්ගන්මි- ජඞ්ගන්වඃ- ජඞ්ගන්මඃ යනු ලට් උත්තම පුරුෂ යි. (විධිලිඞ්හි ජඞ්ගම්‍යාත් යනු ද, ලොට්හි ජඞ්ගමීතු- ජඞ්ගන්තු- ජඞ්ගතාත් යනු ද, ලඞ්හි අජඞ්ගමීත්- අජඞ්ගන් යනු ද, ලිට්හි ජඞ්ගමාඤ්චකාර- ජඞ්ගමාම්බභූව- ජඞ්ගමාමාස යනු ද ප්‍ර: එක වචන යි. ජඞ්ගම්‍යාත්- ජඞ්ගමිතා- ජඞ්ගමිෂ්‍යති- අජඞ්ගමිෂ්‍යත්- අජඞ්ගමීත් යනු ආශීර්ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. “ගම්ඍ ගතෞ” ධාතු යි.)

(10) ද්විරුක්තස්‍ය, ද්විරුක්ත වූ; හන්තෙඃ, ‘හන්’ ධාතුහට; කුත්වම්, කවර්ග බව; වාච්‍යම්, කිය යුතු යි. (සවර්ණ භාවයෙන් හකාරයට ඝකාරය වේ. පූර්ව හකාරයට “කුහොශ්චුඃ” යි ඣකාරයද, ඊට ජකාරය ද වේ.) ජඞ්ඝනීති- ජඞ්ඝන්ති යනු “අතිශයෙන හන්ති” යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. ජඞ්ඝතඃ- යනු ද්වි වචන යි. (“ලොපස්ත්වනුදාත්ත තනාම්” යි ධාත්වන්ත නකාරයට ලොප් වේ.) ජඞ්ඝ්නති යනු බහු වචන යි. (සමහරුන්ගේ මතය ලෙස ජඞ්ඝන්ති කියා ද වේ ආශීර්ලිඞ්හි වධ්‍යාත් යනාදි වශයෙන් ද, ලුඞ්හි අවධීත් යනාදි වශයෙන් ද වධාදෙශ වීමෙන් වර නැගේ. * සෙසු ලකාරයන්හි “ගම්” ධාතුව මෙනි.)

(11) ජාහෙති- ජාහාති යනු “ අතිශයෙන ජහාති” යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. (ඊඩාගමය වූ කල්හි “අ ඉ එ” යි සන්ධි වේ. පූර්ව අංකාරයට “හ්‍රස්වඃ” යි හ්‍රස්ව ව නැවත “ආතඃ” යි ආකාරය

---

* “වධාදෙශස්‍ය විභාෂාතු න භවති”- සි: කෞ: 420 පිට
එහෙයින් වාවධ්‍යාත් යනාදි වශයෙන් නො වේ.

**(12) දදෙති– දදති, දත්තඃ, දදති. දදෙතු, දදෙයාත්, අදදත්. (13) එවං ධෙට්. දධෙති– දධාති, දත්තඃ, * දධති. දධෙයාත්, අදධාසීත් –අදධාත් – අදධත්. (14) ධාඤ්, දධාති– ධාත්තඃ. †**

---

වේ. ජාහීතඃ යනු ද්වි වචන යි. ("ද්‍යොසෙතෟ" යි ආකාරයට ඊකාරය වේ.) ජාහති යනු බහු වචන යි. ("ද්‍යොසෙතෟ" යන්නෙන් ම ආකාරයට ලොප් වේ. විධි ලිඞ්හි ජාහීයාත් යනු ද, ලොට්හි ජාහෙතු– ජාහාතු–ජාහීතාත් යනු ද, ලඞ්හි අජාහෙත්– අජාහාත් යනු ද, ලිට්හි ජාහාඤ්චකාර– ජාහාම්බභූව–ජාහාමාස යනු ද ප්‍ර: එක වචන යි. ජාහියාත්– ජාහිතා– ජාහිෂ්‍යති– අජාහිෂ්‍යත්– අජාහාසීත් යනු ආශීර්ලිඞ් –පෙ– ලුඞ් ප්‍ර: එක වචන යි. "ඔහාක් ත්‍යාගෙ" ධාතු යි.) දධෙති ඉති ආදි, දධෙති යනාදිය ද; එවම්, මෙසේ යි.

(12) දදෙති– දදති යනු "අතිශයෙන දදති" යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. දත්තඃ යනු ද්වි වචන යි. ("දදෙඃ" යි. ආකාරයට ලොප් ව "ඛසෙ චපාඃ–" යනාදීන් දකාරයට තකාරය වේ.) දදති යනු බහු වචන යි. (දද්‍යාත් යනු විධිලිඞ් ප්‍ර: එක වචන යි.) දදෙතු (–දදතු– දත්තාත්) යනු ලොට් ප්‍ර: එක වචන යි. (අදදෙත්– අදදත් යනු ලඞ්හි ද, දදඤ්චකාර– දදම්බභූව– දදමාස යනු ලිට්හි ද ප්‍ර: එක වචන යි.) දදෙයාත්– දදෙතා– දදෙෂ්‍යති– අදදෙෂ්‍යත් යනු ආශීර්ලිඞ් –පෙ– ලෘඞ් ප්‍ර: එක වචන යි. (දදෙයාත් යන තන්හි "දදෙරෙඃ" යි එකාරය වේ. දදෙතා යනාදිය ඉඩාගමයෙන් පසු "අ ඉ එ" යි සන්ධි වීමෙන් සිද්ධ යි.) අදදත් යනු ලුඞ් ප්‍ර: එක වචන යි. ("දදෙඃ පෙ" යි සි ප්‍රත්‍යයට ලොප් වේ. "ඩුදඤ් දනෙ" ධාතු යි.)

(13) ධෙට්, "ධෙට් පානෙ" ධාතුව ද; එවම්, මෙසේ යි. දධෙති– දධාති, යනු "අතිශයෙන ධයති" යන වාක්‍යයෙහි ලට් ප්‍ර: එක වචන යි. ("සන්ධ්‍යක්ෂරාණාමා" යි එකාරයට ආකාරය වේ.) දත්තඃ යනු ද්වි වචන යි. ("දදෙඃ යි ආකාරයට ලොප් ව "ඛසෙ චපා ඣසානාම්" යි ධකාරයට තකාරය වේ.) දධති යනු බහු වචන යි. (විධිලිඞ්හි දධ්‍යාත්– යනු ද, ලොට්හි දධෙතු– දධාතු– දත්තාත් යනු ද, ලඞ්හි අදධාත්– අදධෙත් යනු ද, ලිට්හි දධාඤ්චකාර– දධාම්බභූව–දධාමාස යනු ද ප්‍ර: එක වචන යි.) දධෙයාත්–(දධෙතා–

---

* දධඃ– පොත්හි, ව්‍යවස්ථිතාණි වානුවෘත්තියෙන් හෝ "දදෙඃ" යි ආලොපය ස්ථානිවත් බැවින් හෝ "තථොර්ධඃ" යි ධකාරය නො වේ.

† ධත්තඃ– පොත්හි.

**(15) පිතොස්තු, දෘදෙති, දෘදීතඃ, දෘදීහි, දෘදෘයාත්, අදෘදෘසීත්. ජහාතෙඃ පූර්වස්‍ය දීර්ඝො වෙති කෙචිත්. ජහාති.**

## ඉති යඞ්ලුක් ප්‍රක්‍රියා.

---

දෘධෙෂ්‍යති- අදෘධෙෂ්‍යත් යනු ආශීර්ලිඞ් -පෙ- ලෘඞ්) ප්‍ර: එක වචන සි. ලුඞ් ප්‍ර: එක වචනයෙහි අදෘධාසීත් යනු ද, සි ප්‍රත්‍යය ලොපයෙන් අදෘධාත් යනු ද, විකල්පයෙන් ඞ ප්‍රත්‍යය * වීමෙන් අදෘධත් යනු ද වේ.

(14) ධාඤ්, "ඩුධාඤ් ධාරණ පොෂණයොඃ" යන ධාතුව දක්වනු ලැබේ. (දෘධෙති-) දෘධාති යනු ලට් ප්‍ර: එක වචන සි. ධාත්තඃ යනු ද්වි වචන සි. ("පූර්වස්‍ය ක්ඞිති ඛසෙ ධඃ" යි පූර්ව දකාරයට ධකාරය වේ. ලොට් ප්‍ර: එක වචනයෙහි දෘධෙතු- දෘධාතු- ධාත්තාත් යනු ද, ලුඞ් ප්‍ර: එක වචනයෙහි "දෘදෙඃ පෙ" යි සිලොපයෙන් අදෘධාත් යනු ද වේ. සෙස්ස 'ධෙට්' ධාතුව මෙනි.)

(15) පිතොඃ තු, පිත් වූ (දෘප් ලවනෙ- දෛප් ශොධනෙ යන) ධාතු දෙදෙනාගේ වනාහි (රූප දක්වනු ලැබේ. ඒ දෙක ම එක සේ වර නැගේ.) දෘදෙති- (දෘදෘති) යනු ලට් ප්‍ර: එක වචන සි. දෘදීතඃ යනු ද්වි වචන සි. ("ද්වොසෙතෟ" යි ඊකාරය වේ. දෘදීයාත් යනු විධිලිඞ් ප්‍ර: එක වචන සි. දෘදීහි යනු ලොට් ම: එක වචන යි දෘදෘයාත්- අදෘදෘසීත් යනු ආශිර්ලිඞ්-ලුඞ් ප්‍ර: එක වචන සි. (සෙසු ලකාරයන්හි 'ඩුදෘඤ්' ධාතුව මෙන් වර නැගිය යුතු.) ජහාතෙඃ, හා ධාතුහුගේ; පූර්වස්‍ය, පූර්ව අවයවයට; දීර්ඝඃ, දීර්ඝය (="ආතඃ" යි වන ආකාරාදෙශය;) වා ඉති, විකල්පයෙන් වේ යයි; කෙචිත්, සමහරු (කියත්). ජහාති, ඒ මතයෙහි ජහාති- (ජහීතඃ- ජහති) යනාදි වශයෙන් වර නැගේ.

යඞ් ලුක් ප්‍රක්‍රියා, යඞ්ලුගන්ත ධාතූන්ගේ පද සාධන ක්‍රියාව; ඉති, මෙසේ යි.

## යඞ්ලුක් ප්‍රක්‍රියාව සමාප්ත යි.

---

* "ධෙටො භූතමාත්‍රෙ දිබාදිපරෙ ඬො වා විභාෂාඩව" සි: ව: 42 පිට.

a. අථ නාමධාතු ප්‍රක්‍රියාඃ-

## 200. නාම්නො ය ඊ චාස්‍ය.

(නාම්නඃ 5-1. යඃ 1-1. ඊ 1-1. ච, නි: අස්‍ය 6-1.)

**b. නාම්න ඉච්ඡායාමර්ථෙ යඃ ප්‍රත්‍යයො භවති, තත් සන්නි යොගෙ චාවර්ණස්‍ය * ඊකාරඃ.**

**c. ආත්මනඃ පුත්‍ර මිච්ඡතිති= පුත්‍රීයති, පුත්‍රීයෙත්, පුත්‍රීයතු, අපුත්‍රීයත් ඉත්‍යාදි.**

---

a අථ, ශබ්දලුක් ප්‍රක්‍රියාවට අනතුරු ව; නාමධාතු ප්‍රක්‍රියා, නාමධාතුන් පිළිබඳ පද සාධන ක්‍රියාව දක්වනු ලැබේ. (නාමයන් කෙරෙන් පර ව ඒ ඒ අර්ථයන්හි ප්‍රත්‍යයන් කොට නිපදවනු ලබන ධාතූහු නාමධාතු නම් වෙත්.)

200. යප්‍රත්‍යය හා ඊකාරාදෙශ විධි සූත්‍ර යි. "ඉච්ඡායා මාත්මනඃ සඃ" යි 'ඉච්ඡායාම්' යනු ද- 'ආත්මනඃ' යනු ද- "ආද් භුවි කර්මණි" යි 'කර්මණි' යනු ද අනුවෘත්ත යි.

ආත්මනඃ, තමහට; ඉච්ඡායාම්, කැමති වීම් අර්ථයෙහි; කර්මණි, කර්මයෙහි පවත්නා වූ; නාම්නඃ, නාමයා කෙරෙන් පර ව; යඃ, ය ප්‍රත්‍යය වේ. අස්‍ය, අවර්ණයට; ඊ ච, ඊකාරයෙක් ද වේ.

b. ඉච්ඡායාම් අර්ථෙ, කැමතිය යන අර්ථයෙහි; නාම්නඃ, නමයා කෙරෙන්; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. තත්සන්නි යොගෙ, ඒ යප්‍රත්‍යය හා එක් ව යෙදීම ඇති කල්හි; අවර්ණස්‍ය, (නාමයාගේ අන්ත්‍ය) අවර්ණයට; ඊකාරඃ ච, ඊකාරයෙක් ද වේ.

(මෙයින් ඉච්ඡා ක්‍රියාවට කර්ම වූ ද්විතීයාන්ත නාමයා කෙරෙන් ය ප්‍රත්‍යය වේ. ඉන් පසු ඒ යප්‍රත්‍යයට පෙරටු ව සිටි අවර්ණයට ඊකාරාදෙශ ද වේ. එසේ ලැබෙනුයේ අවර්ණාන්ත නාම යන් කෙරෙන් යප්‍රත්‍යය වීමෙහි පමණෙකි. සෙසු නාමයන් කෙරෙන් යප්‍රත්‍යය වූ කල්හි ඊකාරාදෙශයෙක් නො වේ. **යජමානස්‍ය පුත්‍රමිච්ඡති පුරොධාඃ** යි ඉෂ්‍යමාණ වස්තුව ස්ව සම්බන්ධිත්වයෙන් නො සැලකෙන තන්හි ද, මහාන්තං පුත්‍ර මිච්ඡති යි සවිශෙෂණ නාමයන් කෙරෙන් ද යප්‍රත්‍යය නො වේ. "සමාස ප්‍රත්‍යයයොඃ" යි විභක්ති ලොපය වේ. "ස ධාතුඃ" යි ධාතු සංඥ වේ. ඉන් පසු තිබාදීහු වෙති.)

c. ආත්මනඃ, තමහට; පුත්‍රම්, පුතෙකු; ඉච්ඡති ඉති, කැමති වෙයි යන අර්ථයෙහි; පුත්‍රීයත්, පුත්‍රීයති යනු වේ. ලට් ප්‍රථම පුරුෂෛක වචන යි. පුත්‍රීයෙත්, පුත්‍රීයතු, අපුත්‍රීයත් යනු විධිලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචන යි. ඉති ආදි, මේ ආදිය වේ.

---

* චාකාරස්‍ය - පොත්හි.

a. යාදෞ ප්‍රත්‍යයෙ ඔකාරෞකාරයොරවාවෞ වක්තව්‍යෞ. ගාම් ඉච්ඡතීති = ගව්‍යති. නාවම් ඉච්ඡතීති = නාව්‍යති. ත්වද්‍යති. මද්‍යති. යුෂ්මද්‍යති, අස්මද්‍යති. ධනීයති. ගව්‍යාඤ්චකාර.

b යකාරස්‍යානපි වා ලොපො වාච්‍යඃ. ගවාඤ්චකාර. ගව්‍යාත්, ගව්‍යිතා- ගවිතා, අගව්‍යීත්- අගවීත්, අගව්‍යිෂ්ටාම්-

---

(පුත්‍රීයාඤ්චකාර- පුත්‍රීය්‍යාත්- පුත්‍රීයිතා- පුත්‍රීයිෂ්‍යති- අපුත්‍රීයිෂ්‍යත්- අපුත්‍රීයීත් යනු ලිට් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. ("යතඃ" යි ය ප්‍රත්‍යයස්ථ අකාරයට ලොප් වේ. **ශාලාමිච්ඡති = ශාලීයති, මාලාමිච්ඡති = මාලීයති** යනු ආකාරාන්ත නාමයන් කෙරෙන් යප්‍රත්‍යය ව ආකාරයට ඊකාරය වන බවට උදාහරණ යි.)

a. යාදෞ ප්‍රත්‍යයෙ, යකාරය ආදි කොට ඇති ප්‍රත්‍යය පර කල්හි; ඔකාර + ඖකාරයොඃ, ඔකාර- ඖකාර දෙකට; අවාවෞ, අව්- ආව් ආදෙශ දෙක; වක්තව්‍යෞ, කිය යුතු යි. (සන්ධි ප්‍රක්‍රියාවෙහි කී **"ක්වචිත් ස්වරවද්‍යකාරඃ"** යනු මීට සාධක ය.) ගාම් ඉච්ඡති ඉති =ගව්‍යති, දෙන කැමති වෙයි යන අර්ථයෙහි ගව්‍යති යනු වේ. (ගො ශබ්දයෙන් පර ව ය ප්‍රත්‍යය වූ පසු ඔකාරයට 'අව්' ආදෙශ වේ. ගව්‍යේත්- ගව්‍යතු- අගව්‍යත් යනු විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචන යි.) නාවම් ඉච්ඡති ඉති = නාව්‍යති, නැවක් කැමති වෙයි යන අර්ථයෙහි නාව්‍යති යනු වේ. (නෞ ශබ්දයෙන් පර ව යප්‍රත්‍යය වූ කල්හි ඖකාරයට "ආව්" ආදෙශ වේ.) ත්වද්‍යති, "ත්වාමිච්ඡති" (=තා කැමති වෙයි) යන වාක්‍යයෙහි ත්වද්‍යති යනු වේ. මද්‍යති, "මා මිච්ඡති" (=මා කැමති වෙයි) යන වාක්‍යයෙහි මද්‍යති යනු වේ. ("ත්වනම දෙකත්වෙ" යි යුෂ්මද්- අස්මද් ශබ්ද දෙකට ත්වද්- මද් ආදෙශ යි.) යුෂ්මද්‍යති, "යුවාං යුෂ්මාන් වා ඉච්ඡති" (තොප දෙදෙන හෝ බොහෝ වූ තොප කැමති වෙයි) යන වාක්‍යයෙහි යුෂ්මද්‍යති යනු වේ. අස්මද්‍යති, "ආවාම් අස්මාන් වා ඉච්ඡති" (=අප දෙදෙන හෝ බොහෝ වූ අප කැමති වෙයි) යන වාක්‍යයෙහි අස්මද්‍යති යනු වේ. ධනීයති, "ධනම් ඉච්ඡති" (=ධනය කැමති වෙයි) යන වාක්‍යයෙහි ධනීයති යනු වේ. (මේ සියල්ල ලඞාදි සතරෙහි 'පුත්‍රීය' ධාතුව මෙන් වර නැගේ.) ගව්‍යාඤ්චකාර යනු 'ගව්‍ය' ධාතු ලිට් ප්‍ර: එක වචන යි.

b. අනපි, අනබ් විෂයෙහි; යකාරස්‍ය, යකාරයට; වා, විකල්ප යෙන්; ලොපඃ වාච්‍යඃ, ලොපය කිය යුතු යි. ("අනපි ච හසාත්" යි විහිත නිත්‍ය විධිය මෙයින් විකල්ප කෙරේ.) ගවාඤ්චකාර යනු යකාරයට ලොප් වූ පක්ෂයෙහි ලිට් ප්‍ර: එක වචන යි. ගව්‍යාත්,

**අගවිෂටාම්, අගවිසිෂුඃ- අගවිෂුඃ. නාවෳාත්, නාවිසිතා- නාවිතා, අනාවිසීත්- අනාවීත්.**

a. **කාම්‍යච්ච. පුත්‍රම් ඉච්ඡතිති = පුත්‍ර කාම්‍යති.**

b. **හසාන්තතද්ධිතයස්‍ය * ලොපො යෙ. ගාර්ගියති. වාච්‍යති. හසාද්‍යස්‍ය ලොපො වාපි. සමිධියිතා - සමිධිතා, මානනාච්‍යාභ්‍යාං යො න. කිමිච්ඡති, ඉදමිච්ඡති, සවරිච්ඡති.**

---

ගවිසිතා- ගවිතා, (ගවිසිෂ්‍යති- ගවිෂ්‍යති, අගවිසිෂ්‍යත්- අගවිෂ්‍යත්,) අගවිසීත්- අගවීත් යනු ආශීර් ලිඞ් -පෙ- ලුඞ් ප්‍රථම පුරුෂෛක වචන යි. අගවිසිෂටාම්- අගවිෂටාම්, අගවිසිෂුඃ- අගවිෂුඃ යනු ලුඞ් ද්වි- බහු වචන යි. නාවෳාත් යනු 'නාව්‍ය' ධාතු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන යි. නාවිසිතා- නාවිතා, අනාවියීත්- අනාවීත් යනු ලුට්- ලුඞ් ප්‍ර: එක වචන යි. (සෙස්ස ද 'ගව්‍ය' ධාතුව සේ වර නැගිය යුතු.)

(තඩ්ඩුකාඤ්චකාර- තඩදූකාඤ්චකාර, තඩ්ඩුත්, තඩ්යිතා- තඩිතා, තඩ්යිෂ්‍යති- තඩිෂ්‍යති, අතඩ්යිෂ්‍යත්- අතඩිෂ්‍යත්, අතඩ්යීත්- අතඩීත් යනු 'තඩ්ඩු' ධාතු ලිට් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. "මඩ්ඩු" ආදිය ද මෙසේ ම වර නැගේ.)

a. කාම්‍යච් ච, නාමයා කෙරෙන් ඉච්ඡාර්ථයෙහි කාම්‍යච් ප්‍රත්‍යය ද වේ. (මේ පාණිනීය සූත්‍රයෙකි.) පුත්‍රම් ඉච්ඡති ඉති = පුත්‍ර කාම්‍යති, පුතකු කැමති වෙයි යන අර්ථයෙහි පුත්‍රකාම්‍යති යනු වේ. (පුත්‍රකාම්‍යෙත්- පුත්‍රකාම්‍යතු- අපුත්‍රකාම්‍යත්- පුත්‍රකාම්‍යාඤ්චකාර- පුත්‍රකාම්‍යාත්- පුත්‍රකාම්‍යිතා- පුත්‍රකාම්‍යිෂ්‍යති- අපුත්‍රකාම්‍යිෂ්‍යත්- අපුත්‍රකාම්‍යීත් යනු විධි ලිඞ් -පෙ- ලුඞ් ප්‍ර: එක වචන යි. **යකාරස්‍යාපි වා ලොපො වාච්‍යඃ** යන්නෙන් මෙහි යකාර ලොපය නො වේ.)

b. යෙ, ය ප්‍රත්‍යය පර කල්හි; හසාත්, හස ප්‍රත්‍යාහාර වර්ණයෙන් පර වූ; තද්ධිත යස්‍ය, තද්ධිත යකාරයට; ලොපඃ, ලොප් වේ. (තද්ධිත වශයෙන් පැමිණි යකාරයට ලොප් වෙයි යු සේ යි.) ගාර්ගීයති, "ගාග්‍ර්‍යමිච්ඡති" (= ගර්ගාපත්‍යයෙකු කැමති වෙයි) යන වාක්‍යයෙහි ගාර්ගීයති යනු වේ. ("ගාග්‍ර්‍ය" යන තද්ධිතාන්ත නාමයෙන් පර ව ඉච්ඡාර්ථයෙහි යප්‍රත්‍යය වූ කල්හි තද්ධිත යකාරයට ලොප් ව "ගාර්ගී" යි වේ. ඉන් පසු අකාරයට ඊකාර ව "ගාර්ගීයති" යි වේ. ලුඞ්හි අගාර්ගීයීත් යනාදි වශයෙනි.)

---

* තද්ධිතස්‍ය = පොත්හි.

**a. කරණෙ ච.**

**b. නාමිනා කරණෙ'ඊථෙ යඃ ප්‍රත්‍යයො භවති. කණ්ඩූං කරොතීති = කණ්ඩූයති. නමස්‍යති, තපස්‍යති, වරිවස්‍යති, ගුරූන් ශුශ්‍රූෂත ඉත්‍යර්ථඃ.**

**c. ක්ෂීරලවණයොස්තෘෂ්ණායාං යඃ සුච් ච. ක්ෂීරස්‍යති, ලවණස්‍යති.**

---

වාච්‍යති, "වාචමිච්ඡති" (=වචනය කැමති වෙයි) යන වාක්‍යයෙහි වාච්‍යති යනු වේ. (අනබ් විෂයෙහි යකාර ලොප විකල්පයෙන් වාච්‍යාඤ්චකාර - වාචාඤ්චකාර යනාදි වශයෙන් දෙපරිද්දකින් වර නැගේ.)

අනපි, අනබ් විෂයෙහි; හසාත්, හස ප්‍රත්‍යාහාරයා කෙරෙන් පර වූ; යස්‍ය, යප්‍රත්‍යයට; වා, විකල්පයෙන්; ලොපඃ, ලොප් වේ. ("යකාරස්‍යානපි වා ලොපො වාච්‍යඃ" යන්නෙන් කියන ලද්දේත් මෙය ම බැවින් මේ වාක්‍යය නිරර්ථක යයි හැගේ.) සමිධියිතා- සමිධිතා යනු ලුට් ප්‍ර: එක වචන යි. "සමිධමිච්ඡති" (=දර කැමති වෙයි) යනු වාක්‍ය යි. අබ් විෂයෙහි සමිධ්‍යති යනාදි වශයෙන් ද, අනබ් විෂයෙහි සමිධ්‍යාඤ්චකාර- සමිධාඤ්චකාර යනාදි වශයෙන් ද වර නැගේ.)

මාන්තාව්‍යයාභ්‍යාම්, මකාරාන්ත ශබ්දය- අව්‍යය ශබ්දය යන දෙකින් පර ව; යඃ න, යප්‍රත්‍යය නො වේ. "කිමිච්ඡති- ඉදමිච්ඡති" යනු මකාරාන්ත ශබ්දයන් කෙරෙන් යප්‍රත්‍යය නො වීමට නිදශීන යි. "ස්වරිච්ඡති" යනු අව්‍යය ශබ්දයන් කෙරෙන් ය ප්‍රත්‍යය නො වීමට නිදශීන යි.

a. කරණෙ ච, කිරීම් අර්ථයෙහි ද (නාමයා කෙරෙන් යප්‍රත්‍යය වේ.

b. නාම්නඃ, නාමයා කෙරෙන්; කරණෙ අර්ථෙ, කිරීම් අර්ථයෙහි; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ. කණ්ඩූං කරොති ඉති =කණ්ඩූයති, කැසීම කෙරෙයි යන අර්ථයෙහි කණ්ඩූයති යනු වේ. (ලුඞ්හි අකණ්ඩූයීත් යනාදි වශයෙනි.) නමස්‍යති, "නමඃ කරොති" (=නමස්කාර කෙරෙයි) යන වාක්‍යයෙහි නමස්‍යති යනු වේ. තපස්‍යති, "තපඃ කරොති" (=තපස් කෙරෙයි) යන වාක්‍යයෙහි තපස්‍යති යනු වේ. වරිවස්‍යති, "වරිවඃ කරොති" (=පිදීම කෙරෙයි) යන වාක්‍යයෙහි වරිවස්‍යති යනු වේ. ගුරූන් ශුශ්‍රූෂතෙ ඉති, ගුරුවරුන්ට ඇහුම් කන් දෙයි (=මෙහෙ කෙරෙයි) යන; අර්ථඃ, අර්ථ යි. (වර නැගිලි පෙර සේ මැයි.)

c. ක්ෂීර ලවණයොඃ, ක්ෂීර- ලවණ ශබ්ද දෙක සම්බන්ධ ව; තෘෂ්ණායාම්, තෘෂ්ණාර්ථයෙහි; යඃ, යප්‍රත්‍යය වේ. සුච් ච, (ඒ යප්‍රත්‍යය සම්බන්ධ ව) සුඞාගම ද වේ. ක්ෂීරස්‍යති, "ක්ෂීරමිච්ඡති"

a. ශබ්දාදිභ්‍යො යඞ්. "යෙ" ශබ්දායතෙ, වෛරායතෙ, කලහායතෙ, අභ්‍රායතෙ, මෙඝායතෙ, කෂ්ටායතෙ.

b. ඌෂ්මබාෂ්පාභ්‍යාමුද්වමනෙ යඞ් වාච්‍යඃ. ඌෂ්මාණ මුද්වමති = ඌෂ්මායතෙ, බාෂ්පායතෙ.

## 201. ක්‍යිර්ඞිත් කරණෙ. (ක්‍යිඃ 1-1. ඞිත් 1-1. කරණෙ 7-1.)

(=කිරි කැමති වෙයි) යන වාක්‍යයෙහි ක්ෂීරස්‍යති යනු වේ. (අනබ්‍ විෂයෙහි ක්ෂීරස්‍යාඤ්චකාර- ක්ෂීරසාඤ්චකාර යනාදි වශයෙනි.) ලවණස්‍යති, "ලවණමිච්ඡති" (=ලුණු කැමති වෙයි) යන වාක්‍යයෙහි ලවණස්‍යති යනු වේ. ("ක්ෂීරස්‍ය" යන නාම ධාතුව මෙනි.)

a. ශබ්දාදිභ්‍යඃ, 'ශබ්ද' ශබ්දාදීන් කෙරෙන්; යඞ්, යඞ් ප්‍රත්‍යය වේ. (මෙ ද කිරීම් අර්ථයෙහි ය. මෙහි ඞකාරය ආත්මනෙපද බවට ය.) "යෙ" යන සූත්‍රයෙන් පූර්වයට දීර්ඝ වේ. ශබ්දායතෙ, "ශබ්දං කරොති" (=ශබ්ද කෙරෙයි) යන වාක්‍යයෙහි ශබ්දායතෙ යනු වේ. (ශබ්දායෙත- ශබ්දායතාම්- අශබ්දායත- ශබ්දායාඤ්චක්‍රෙ- ශබ්දායිෂීෂ්ට- ශබ්දායිතා- ශබ්දායිෂ්‍යතෙ- අශබ්දායිෂ්‍යත- අශබ්දායිෂ්ට යනු පිළිවෙළින් විධිලිඞ් ආදි නව ලකාරයෙහි ප්‍රථම පුරුෂෛක වචන යි.) වෛරායතෙ, "වෛරං කරොති" (=වෛර කෙරෙයි) යන වාක්‍යයෙහි වෛරායතෙ යනු වේ. කලහායතෙ, "කලහං කරොති" (=කලහ කෙරෙයි) යන වාක්‍යයෙහි කලහායතෙ යනු වේ. අභ්‍රායතෙ, "අභ්‍රං කරොති" (=වලාකුළක් කෙරෙයි) යන වාක්‍යයෙහි අභ්‍රායතෙ යනු වේ. මෙඝායතෙ, "මෙඝං කරොති" (=වලාකුළක් කෙරෙයි) යන වාක්‍යයෙහි මෙඝායතෙ යනු වේ. කෂ්ටායතෙ, "කෂ්ටං කරොති" * (=දුක කෙරෙයි) යන වාක්‍යයෙහි කෂ්ටායතෙ යනු වේ. ("ශබ්දාය" යන්න මෙන් ආත්මනෙපදයෙහිම වර නැගිය යුතු.)

b. ඌෂ්මබාෂ්පාභ්‍යාම්, ඌෂ්මන්- බාෂ්ප ශබ්ද දෙකින්; උද්වමනෙ, වැමෑරීම් අර්ථයෙහි; යඞ් වාච්‍යඃ, යඞ් ප්‍රත්‍යය කිය යුතු යි. ඌෂ්මාණම් උද්වමති= ඌෂ්මායතෙ, උණුසුම වමාරයි යන අර්ථයෙහි ඌෂ්මායතෙ යනු වේ. බාෂ්පායතෙ, "බාෂ්පමුද්වමති" (=කඳුලු පිට කෙරෙයි) යන වාක්‍යයෙහි බාෂ්පායතෙ යනු වේ. (ආත්මනෙපදයෙහි ම වර නැගිය යුතු.)

201. ක්‍යි ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "නාම්නො ය ඊ වාස්‍ය" යි. 'නාම්නඃ' යනු අනුවෘත්ත යි. කරණෙ, කිරීම් අර්ථයෙහි; නාම්නඃ, නාමයා කෙරෙන්; ක්‍යිඃ, ක්‍යි ප්‍රත්‍යය වේ. ඞිත්, (හෙතෙමේ) ඞිත් සංඥ ද වේ.

* කෂ්ටාය ක්‍රමණෙ- සි: ච: "පාපං කර්තුමුත්සහතෙ"

a. නාමිනො ණිඃ ප්‍රත්‍යයො භවති කාරණෙ'ත්ථෙ, ස ච ඤිත්. ණකාර උභයපදත්ථඃ.

b. ඝටං කාරෙතීති = ඝටයති. අග්ලොපිනො නාඩකාර්‍ය්‍යම්. අජඝටත්. මහාන්තං කාරෙතීති = මහයති- අමමහත්. ණවිෂ්ඨ වත් කාර්‍ය්‍යම්.

## 202. පෘථ්වාදෙ රඃ. (පෘථ්වාදෙඃ 6-1. රඃ 1-1.)

a. නාම්නඃ, නාමයා කොරෙන්; කාරණෙ අර්ථෙ; කිරීම් අර්ථ යෙහි; ණිඃ ප්‍රත්‍යයඃ භවති, ණි ප්‍රත්‍යය වේ. සඃ, හේ; ඤිත් ච, ඤිත් සංඥ ද වේ. ණකාරඃ, (ණි ප්‍රත්‍යයේ) ණකාරය; උභයපදාර්ථඃ, උභය පදය වීම ප්‍රයොජන කොට ඇත්තේ ය.

b. ඝටං කාරොති ඉති= ඝටයති, කළය කොරෙයි යන අර්ථ යෙහි ඝටයති යනු වේ. (ණි ප්‍රත්‍යය ඤිත් බැවින් "ඤිති වෙඃ" යි නාමයාගේ විසංඥයට ලොප් වේ. අප් යන විකරණය වේ. ඉන් පසු ගුණ හා අයාදෙශ වේ. උභයපදී බැවින් ඝටයතෙ යනාදි වශයෙන් ආත්මනෙපදයෙහි ද වර නැගිය යුතු.) අග්ලොපිනඃ, අ- ඉ- උ- ඍ- ඌ යන ස්වරයන්ගේ ලොපය ඇත්තහු සම්බන්ධ ව; අඩ් කාර්‍ය්‍යං න, අඩ්කාර්‍ය්‍යය නො වේ. (විසංඥ ලොප වශයෙන් මෙහි ද අකාර ලොපය ඇති බැවින් අඩ් කාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත "අඩි ලඝොඃ හ්‍රස්ව උපධායාඃ" - "ලඝොර්දීර්ඝඃ" යන සූත්‍ර දෙකින් විහිත කාර්‍ය්‍ය නො වේ. එහෙයින් "අජීඝටත්" යි නො වේ.) අජඝටත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. (ආත්මනෙපදයෙහි අජඝටත යනාදි වශයෙනි.) මහාන්තං කරොති ඉති= මහයති, මහත් කොරෙයි යන අර්ථයෙහි මහයති යනු වේ. ("මහත්" ශබ්දයෙන් පර ව ණි ප්‍රත්‍යය ව විසංඥ ලොපයෙන් සිද්ධ යි.) අමමහත් යනු ලුඞ් පඃ ප්‍රඃ එක වචන යි. උභය පදයෙහි ම වර නැගිය යුතු.)

ණෙඃ, ණි ප්‍රත්‍යය පර කල්හි; ඉෂ්ඨවත් කාර්‍ය්‍යම්, ඉෂ්ඨ ප්‍රත්‍යය පර කල්හි මෙන් කට යුතු යි. (ඉෂ්ඨ ප්‍රත්‍යය පර කල්හි යම් කාර්‍ය්‍යයෙක් විහිත ද, ණි ප්‍රත්‍යය පර කල්හිත් නාමයට ඒ කාර්‍ය්‍යය කට යුතු ය යන අර්ථ යි. ඉෂ්ඨ ප්‍රත්‍යය පර කල්හි වින්- මතු-වතු ප්‍රත්‍යයන්ගේ ලොපය, ඍකාරයට රකාරාදෙශය, ගුරු ශබ්දාදියට 'ගර්' ආදි ආදෙශ හා විසංඥ අලොපය යන කාර්‍ය්‍යයෝ විහිතයහ. ඔහු ණි ප්‍රත්‍යය පර කල්හි ද වෙත්.)

202. රකාරාදෙශ විධි සූත්‍ර යි. "ණිර් ඤිත් කාරණෙ" යි විඃ විඃ වශයෙන් 'ණෙඃ' යනු අනුවෘත්ත යි. ණෙඃ, ණි ප්‍රත්‍යය පර කල්හි; පෘථ්වාදෙඃ, පෘථු ශබ්දාදිය පිළිබඳ ඍකාරයට; රඃ, රකාරය වේ.

a. පෘථ්වාදේරෘකාරස්‍ය රෝ භවති ණෞ පරේ.

b. පෘථුං කරෝති = ප්‍රථයති. ම්‍රදයති. ද්‍රඪයති. ස්ථූලං කරෝති = ස්ථවයති. "අඩි ලඝෝ හ්‍රස්ව උපධායාඃ" අතිස්ථවත්. දවයති- අදීදවත්. ප්‍රියං කරෝති = ප්‍රාපයති. ගුරුං කරෝති = ගරයති. ස්ථිරං කරෝති = ස්ථාපයති. ඌඪිං කරෝතීති = ඌඪයති. "ණෞ චඩි ද්විශ්ච" "ණේඃ" "ස්වරාදේඃ පරඃ" අඩි පූර්වස්‍ය ඪස්‍ය වා ජඃ. ඖඩිඪත් - ඖජිඪත්.

---

a. ණෞ පරේ, ණි ප්‍රත්‍යය පර කල්හි; පෘථ්වාදේඃ, පෘථු ශබ්දාදිය පිළිබඳ; ඍකාරස්‍ය, ඍකාරයට; රඃ භවති, රකාරාදේශය වේ.

b. පෘථුං කරෝති= ප්‍රථයති, මහත් කෙරෙයි යන අර්ථයෙහි ප්‍රථයති යනු වේ. (ලුඞ්හි 'අපප්‍රථත්' යනාදි වශයෙනි.) ම්‍රදයති, "මෘදුං කරෝති" (=මොළොක් කෙරෙයි) යන වාක්‍යයෙහි ම්‍රදයති යනු වේ. (ලුඞ්හි 'අමම්‍රදත්' යනාදි වශයෙන් වර නැගේ.) ද්‍රඪයති, "දෘඪං කරෝති" (=දැඩි කෙරෙයි) යන වාක්‍යයෙහි ද්‍රඪයති යනු වේ. (ලුඞ්හි 'අදද්‍රඪත්' යනාදි වශයෙනි. පිළිවෙළින් පෘථු- මෘදු- දෘඪ ශබ්දයන්ගේ ඍකාරයට "පෘථ්වාදෙ රඃ" යි රකාරය වීමෙන් සිද්ධ යි.)

ස්ථූලං කරෝති= ස්ථවයති, මහත් කෙරෙයි යන අර්ථයෙහි ස්ථවයති යනු වේ. (ස්ථූල ශබ්දයට "ස්ථව්" ආදේශ යි ) "අඩි ලඝෝ හ්‍රස්ව උපධායාඃ" යන සූත්‍රයෙන් පූර්ව අකාරයට ඉකාරය වේ. අතිස්ථවත්* යනු ලඞ් ප: ප්‍ර: එක වචන යි. දවයති, "දූරං කරෝති" (=දුරු කෙරෙයි) යන වාක්‍යයෙහි දවයති යනු වේ. (දූර ශබ්දයට "දව්" ආදේශ යි.) අදීදවත්* යනු ලුඞ් ප: ප්‍ර: එක වචන යි.

ප්‍රියං කරෝති= ප්‍රාපයති, ප්‍රිය කෙරෙයි යන අර්ථයෙහි ප්‍රාපයති යනු වේ. (ප්‍රිය ශබ්දයට "ප්‍ර" ආදේශ වේ. "ආදිස්වරස්‍ය ඞ්නිති ච වෘද්ධිඃ" යි වෘද්ධි (=ආකාර) වූ පසු "රාතො ණෞ පුක්" යි පුගාගම වේ. ලුඞ්හි අපිප්‍රපත්† යනාදි වශයෙනි.) ගුරුං කරෝති= ගරයති, ගුරු කෙරෙයි යන අර්ථයෙහි ගරයති යනු වේ. (ගුරු ශබ්දයට "ගර්" ආදේශ යි. ලුඞ්හි අජීගරත්+ යනාදි වශයෙනි.) ස්ථිරං කරෝති= ස්ථාපයති, ස්ථිර කෙරෙයි යන අර්ථයෙහි ස්ථාපයති යනු වේ (ස්ථිර ශබ්දයට "ස්ථ" ආදේශ ව වෘද්ධි වූ පසු පුගාගම වේ.)

---

* මේ දෙක සිද්ධාන්ත චන්ද්‍රිකා- තත්වබෝධිනී- කෞමුදී ටීකාවන්හි "අතුස්ථවත්- අදූදවත්" යි පෙණේ. එසේ නම් ආදේශ "ස්ථො- දෙ" යි විය යුතු.

† අපිප්‍රයත් - අතිස්ථයත්- සි: කෞ:

\+ චන්ද්‍රකීර්ති ටීකාවෙහි "අජගරත්" යි පෙණේ. එසේ නම් ආදේශය අකාරාන්ත විය යුතු.

a. වහඃ ක්තෙ ක්තෞ ක්තසම්ප්‍රසාරෙ
හො ඪස්තථොර්ධඃ ෂ්ටුභිනා ඪි ඪශ්ච,
ඌඪිශ්ච ණිර්ඤිත් කරණෙ ස ධාතුර්
ණෙරඞ් ස්වරාදෙර් ඪ ජ ඖජිඪච්ච.

b. ඌඪං කරොතීති = ඌඪයති. ඖඩඪත්- ඖජඪත්.

---

ඌඪිං කරෙති ඉති= ඌඪයති, ඉසිලීම කෙරෙයි යන අර්ථයෙහි ඌඪයති යනු වේ. "ණෙරඞ් ද්විශ්ච" යන සූත්‍රයෙන් අඞ් ප්‍රත්‍යය වේ. "ණෙඃ" යන සූත්‍රයෙන් ණිප්‍රත්‍යයට ලොප් වේ. "ස්වරාදෙඃ පරඃ" යන්නෙන් පර අවයවය ද්විරුක්ත වේ. අඞි, අඞ් ප්‍රත්‍යය පර කල්හි; පූර්වස්‍ය ඪස්‍ය, පූර්ව ඪකාරයට; වා, විකල්පයෙන්; ජඃ, ජකාරය වේ. ඖඩිඪත් යනු ද- ඖජිඪත් යනු ද ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (මෙසේ ලුඞ් ලකාර යෙහි ද්විප්‍රකාරයකින් වර නැගේ. ඉක්බිති "ඖජිඪත්" යන්නෙහි පද සිද්ධිය ශ්ලොකයකින් දක්වයි.)

a. වහඃ, 'වහ්' ධාතුහු කෙරෙන්; ක්තෞ ක්තෙ, ක්ති ප්‍රත්‍යය කළ කල්හි; ක්ත සම්ප්‍රසාරෙ, කරණ ලද සම්ප්‍රසාරණය ඇති කල්හි; හො ඪඃ, "හො ඪඃ" යන සූත්‍රයෙන් හකාරයට ඪකාරය වේ. තථොර්ධඃ, "තථොර්ධඃ" යන සූත්‍රයෙන් ක්ති ප්‍රත්‍යයේ තකාරයට ධකාරය වේ. ෂ්ටුභිනා, "ෂ්ටුභිඃ ෂ්ටුඃ" යන සූත්‍රයෙන් ඪකාර- ධකාර සංයොගයෙහි ධකාරයට ද ඪකාරය වේ. ඪි ඪඃ ච, "ඪි ඪො ලොපො දීර්ඝශ්ච" යන සූත්‍රයෙන් ඪකාරය පර කල්හි පූර්ව ඪකාරයට ලොප් වේ. ආදි උකාරයට දීර්ඝ ද වේ. ඌඪිඃ ච, (එකල්හි) "ඌඪි" යනු වේ. ණිර්ඤිත් කරණෙ, යථොක්ත "ඌඪි" යන නාමයෙන් පර ව "ණිර්ඤිත් කරණෙ" යන සූත්‍රයෙන් කිරීම් අර්ථයෙහි ණි ප්‍රත්‍යය වේ. ණේ ඤිත් ද වේ. ස ධාතුඃ, ඒ ණ්‍යන්ත ඌඪි ශබ්දය "ස ධාතුඃ" යන සූත්‍රයෙන් ධාතු සංඥ වේ. ණෙරඞ්, "ණෙරඞ් ද්විශ්ච" යන සූත්‍රයෙන් ණ්‍යන්තයා කෙරෙන් අඞ් ප්‍රත්‍යය වේ. ස්වරාදෙඃ, "ස්වරාදෙඃ පරඃ" යන සූත්‍රයෙන් පර අවයවයට ද්විත්ව වේ. ඪ, ඪකාරයට; ජඃ, ජකාරය වේ. ඖජිඪත් ච, (එකල්හි) ලුඞ් ප: ප්‍ර: එක වචනයෙහි ඖජිඪත් කියා ද වේ. (ච ශබ්දයෙන් "ඖඩිඪත්" කියා ද වේ.)

b. ඌඪං කරෙති ඉති= ඌඪයති, උසුලන ලද්දක් කෙරෙයි යන අර්ථයෙහි ඌඪයති යනු වේ. ඖඩඪත් යනු ද, ඖජඪත් යනු ද ලුඞ් ප: ප්‍ර: එක වචන යි. (පද සිද්ධිය ශ්ලොකොක්ත පරිද්දෙනි. මෙහි ක්ත ප්‍රත්‍යයාන්ත "ඌඪ" ශබ්දය කෙරෙන් ණි ප්‍රත්‍යය වේ. වෙනස එපමණෙකි.)

## 203. කර්තුර්යඞ්. (කර්තුඃ 6-1. යඞ් 1-1.)

**a. කර්තුරුපමානාදාචාරෙ'ර්ථෙ යඞ් ප්‍රත්‍යයො භවති. ශ්‍යෙන ඉව ආචරතීති = ශ්‍යෙනායතෙ, කාකඃ. පණ්ඩිතායතෙ, මූර්ඛඃ.**

**b. යඞි සලොපො වාච්‍යඃ, පයසස්තු විභාෂයා. අප්සරායතෙ, ඔජායතෙ. පයායතෙ- පයස්‍යතෙ. සුමනායතෙ.**

---

203. යඞ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "නාම්නො ය ඊ වාසය" යි 'නාම්නඃ' යනු ද- "ආචාර උපමානාත්" යන සූත්‍රය ද අනුවෘත්ත යි. කර්තුඃ, කර්තෘහට; උපමානාත්, උපමාන වූ; නාම්නඃ, නාමයා කෙරෙන්; ආචාරෙ, ආචාරාර්ථයෙහි; යඞ්, යඞ් ප්‍රත්‍යය වේ.

a. කර්තුඃ, කර්තෘහට; උපමානාත්, උපමාන වාචී වූ නාමයෙන් පර ව; ආචාරෙ අර්ථෙ, ආචාරාර්ථයෙහි; යඞ් ප්‍රත්‍යයඃ භවති, යඞ් ප්‍රත්‍යය වේ. (මේ යඞ් ප්‍රත්‍යය වන්නේ ප්‍රථමාන්ත නාමයා කෙරෙනි. ඞකාරය ආත්මනෙපදාර්ථ යි.) ශ්‍යෙනඃ ඉව ආචරති ඉති =ශ්‍යෙනායතෙ, උකුස්සෙකු මෙන් හැසිරෙයි යන අර්ථයෙහි ශ්‍යෙනායතෙ යනු වේ. කාකඃ, කවුඩු තෙමේ යි. ("යෙ" යි දීර්ඝ වේ. ශ්‍යෙනායෙත- ශ්‍යෙනායතාම්- අශ්‍යෙනායත- ශ්‍යෙනායාඤ්චක්‍රෙ- ශ්‍යෙනායිෂීෂ්ට- ශ්‍යෙනායිතා- ශ්‍යෙනායිෂ්‍යතෙ- අශ්‍යෙනායිෂ්‍යත- අශ්‍යෙනායිෂ්ට යනු විධිලිඞ් ආදි නවයෙහි ප්‍රථම පුරුෂෙක වචන යි. ආත්මනෙපදයෙහි පමණක් වර නැගිය යුතු යි.) පණ්ඩිතායතෙ, "පණ්ඩිත ඉව ආචරති" (=පණ්ඩිතයෙකු මෙන් හැසිරෙයි) යන වාක්‍යයෙහි පණ්ඩිතායතෙ යනු වේ. මූර්ඛඃ, මෝඩයා යි.

b. යඞි, යඞ් ප්‍රත්‍යය පර කල්හි; සලොපඃ, සකාර ලොපය; වාච්‍යඃ, කිය යුතු යි. පයසඃ තු, පයස් ශබ්දයාගේ වනාහි; විභාෂයා, විකල්පයෙන් සකාරයට ලොප් වේ. (අප්සරස්- ඔජස්- සුමනස් ශබ්දයන්ගේ සකාරයට නිත්‍යයෙන් ලොප් වන බව ද, සෙසු සකාරාන්ත ශබ්දයන්ගේ සකාරයට විකල්පයෙන් ලොප් වන බව ද සිද්ධාන්ත චන්ද්‍රිකාවෙහි කිහ. රූපාවතාරයෙහි:-

**"ඔජසො'ප්සරසො නිත්‍යං- පයසස්තු විභාෂයා,**
**සකාරස්‍යෙෂ්‍යතෙ ලොපඃ- ශබ්ද ශාස්ත්‍ර විචක්ෂණෛඃ."**
යි පෙණේ.)

අප්සරායතෙ, "අප්සරස ඉව ආචරති" (=දෙවඟනන් මෙන් හැසිරෙයි) යන වාක්‍යයෙහි අප්සරායතෙ යනු වේ. ඔජායතෙ, "ඔජස්වී වාචරති*" (=ඔද ඇත්තෙකු මෙන් හැසිරෙයි) යන වාක්‍යයෙහි

---

* "ඔජ ඉව ආචරති" යි චන්ද්‍රකීර්ති ටීකාවෙහි පෙණේ. එහෙත් "ඔජඃ ශබ්ද සනාදවති වෘත්‍යන්තඃ" යි සුබොධිනියෙහි කී හෙයින් මෙසේ වාක්‍ය දැක්වීමු.

a නාමිත ආචාරෙ ක්විබ් වාච්‍යඃ. ඝාෂණ ඉව ආචරති = ඝාෂණති. ක්විපො ලොපඃ.

## 204. ආචාර උපමානාත්. (ආචාරෙ 7-1. උපමානාත් 5-1.)

b. කම්මාධාරයොරුපමානාත් යඃ ප්‍රත්‍යයො භවති ආචාරෙ'ඊ. අකාරස්‍යෙකාරඃ, පුත්‍රීයති ශිෂ්‍යමුපාධ්‍යායඃ. ප්‍රාසාදීයති කුට්‍යාම්.

---

ඔජායතෙ යනු වේ. පයායතෙ-පයස්‍යතෙ, "පය ඉව ආචරති" (=කිරි මෙන් හැසිරෙයි) යන වාක්‍යයෙහි සකාර ලොප පක්‍ෂයෙහි පයායතෙ යනු ද- විකල්ප පක්‍ෂයෙහි පයස්‍යතෙ යනු ද වේ. සුමනායතෙ, "සුමනා ඉව ආචරති" (=යහපත් සිතැත්තෙකු මෙන් හැසිරෙයි) යන වාක්‍යයෙහි සුමනායතෙ යනු වේ. (වර නැගිලි පෙර මෙනි.)

a. ආචාරෙ, ආචාරාර්ථයෙහි; නාම්නඃ, නාමයා කෙරෙන්; ක්විප් වාච්‍යඃ, ක්විප් ප්‍රත්‍යය කිය යුතු යි. ඝෘෂණ ඉව ආචරති= ඝෘෂණති, විෂ්ණු මෙන් හැසිරෙයි යන අර්ථයෙහි ඝෘෂණති යනු වේ. ක්විපඃ, ක්විප් ප්‍රත්‍යයට; ලොපඃ, ලොප් වේ.

204. යප්‍රත්‍යය විධි සූත්‍ර යි. "නාම්නො ය ඊ වාස්‍ය" යන සූත්‍රය අනුවෘත්ත යි. උපමානාත්, උපමාන වූ; නාම්නඃ, නාමයා කෙරෙන්; ආචාරෙ, ආචාරාර්ථයෙහි; යඃ, ය ප්‍රත්‍යය වේ; අස්‍ය අවර්ණයට; ඊ ච, ඊකාරයෙක් ද වේ.

b. කර්මාධාරයොඃ, කර්ම- ආධාර දෙකුට; උපමානාත්, උපමාන වූ නාමයා කෙරෙන්; ආචාරෙ අර්ථෙ, ආචාරාර්ථයෙහි; යඃ ප්‍රත්‍යයඃ භවති, ය ප්‍රත්‍යය වේ; අකාරස්‍ය, අකාරයට; ඊකාරඃ, ඊකාරය වේ. ("උපමාන වූ නාමයා කෙරෙන්" යයි සූත්‍රයෙහි සාමාන්‍යයෙන් කිව ද මේ ප්‍රත්‍යය වනුයේ කර්ම - ආධාර දෙකට උපමාන වූ නාමයෙන් පර ව බැවින් සූත්‍ර වෘත්තියෙහි "කර්මාධාරයොඃ" යි කීහ.) පුත්‍රීයති, "පුත්‍රමිවාචරති" (=පුතෙකු මෙන් කෙරෙයි) යන වාක්‍යයෙහි පුත්‍රීයති යනු වේ. උපාධ්‍යායඃ, උපාධ්‍යාය තෙමේ; ශිෂ්‍යම්, ශිෂ්‍යයා; පුත්‍රීයති, පුතකු මෙන් කෙරෙයි. (කර්මොපමාන නාමයෙන් පර යප්‍රත්‍යයට නිදර්ශන යි.) ප්‍රාසාදීයති, "ප්‍රාසාද ඉවාචරති" (=පහයෙහි මෙන් හැසිරෙයි ) යන වාක්‍යයෙහි ප්‍රාසාදීයති යනු වේ. කුට්‍යාම්, කුටියෙහි; ප්‍රාසාදීයති, පහයෙහි මෙන් හැසිරෙයි. (ආධාරොපමාන නාමයෙන් පර යප්‍රත්‍යයට නිදර්ශන යි.)

a. භෘශාදිභ්‍යො'භූතතද්භාවෙ ක්‍යඞ් වාච්‍යඃ. අභෘශො භෘශො භවතීති = භෘශායතෙ. ශ්‍යාමායතෙ, ඉත්‍යාදි.

b. අශ්වවෘෂයොර්මෛථුනෙච්ඡායාං යඃ ප්‍රත්‍යයඃ සුගාගමශ්ච. අශ්වස්‍යති වඩවා. වෘෂස්‍යති ගෞඃ.

c. සුඛාදිභ්‍යො ඥපනායාං ක්‍යඞ්. සුඛං ඥපයති = සුඛායතෙ.

## ඉති නාමධාතු ප්‍රක්‍රියා.

---

a. භෘශාදිභ්‍යඃ, භෘශ ශබ්දාදීන් කෙරෙන්; අභූත තද්භාවෙ, අභූත තද්භාවාර්ථයෙහි; ක්‍යඞ් වාච්‍යඃ, ක්‍යඞ් ප්‍රත්‍යය කිය යුතු යි. (පෙර නුවූවක් එයින් වීම අභූත තද්භාව නම්.) අභෘශඃ භෘශඃ භවති ඉති= භෘශායතෙ, අතිශය නුවූවක් අතිශයවෙයි යන අර්ථයෙහි භෘශායතෙ යනු වේ. ශ්‍යාමායතෙ, "අශ්‍යාමශ්ශ්‍යාමො භවති" (=සම්වන් නුවූවක් සම්වන් වෙයි) යන වාක්‍යයෙහි ශ්‍යාමායතෙ යනු වේ. ඉත්‍යාදි, මේ ආදිය යි.

b. අශ්වවෘෂයොඃ, අශ්ව – වෘෂ ශබ්ද දෙක සම්බන්ධ; මෛථුනෙච්ඡායාම්, මෛථුනාශාර්ථයෙහි; යඃ ප්‍රත්‍යයඃ, ය ප්‍රත්‍යය ද; සුගාගමඃ ච, සුක් ආගමය ද වේ. (සුගාගමය වනුයේ යථොක්ත ශබ්ද ද්වය සම්බන්ධ ව හෙයින් ඔවුන්ගේ අන්තයෙහි වේ.) අශ්වස්‍යති, "මෛථුනාර්ථම් අශ්වමිච්ඡති" (=මෙවුන්දම් පිණිස අසෙකු කැමති වෙයි) යන වාක්‍යයෙහි අශ්වස්‍යති යනු වේ. වඩවා, වෙළඹ තොමෝ; අශ්වස්‍යති, මේවුන්දම් පිණිස අසෙකු කැමති වෙයි. වෘෂස්‍යති, "මෛථුනාර්ථං වෘෂමිච්ඡති" (=මෙවුන්දම් පිණිස ගොණෙකු කැමති වෙයි) යන වාක්‍යයෙහි වෘෂස්‍යති යනු වේ. ගෞඃ, දෙන තොමෝ; වෘෂස්‍යති, මෙවුන්දම් පිණිස ගොණෙකු කැමති වෙයි.

c. සුඛාදිභ්‍යඃ, සුඛ ශබ්දාදීන් කෙරෙන්; ඥපනායාම්, ඇඟවීම් අර්ථයෙහි; ක්‍යඞ්, ක්‍යඞ් ප්‍රත්‍යය වේ. සුඛං ඥපයති= සුඛායතෙ, සැප අඟවයි යන අර්ථයෙහි සුඛායතෙ යනු වේ.

නාමධාතු ප්‍රක්‍රියා, නාමධාතූන්ගේ පද සාධන ක්‍රියාව; ඉති, මෙසේ, යි.

## නාමධාතු ප්‍රක්‍රියාව සමාප්ත යි.

---

a. අථාත්මනෙපද ව්‍යවස්ථා.

**205. නිවිශාදෙඃ.** (නිවිශාදෙඃ 5-1.)

b. නිත්‍යාද්‍යුපසර්ගපූර්වකාද් විශාදෙර්ධාතොරාත්මනෙපදං භවති. නිවිශතෙ.

**206. විපරාභ්‍යාං ජෙඃ.** (විපරාභ්‍යාම් 5-2. ජෙඃ 5-1.)

විජයතෙ. පරාජයතෙ.

**207. සමො ගමාදිභ්‍යඃ.** (සමඃ 5-1. ගමාදිභ්‍යඃ 5-3.)

c. සඞ්ගච්ඡතෙ. ගමඃ පරෞ සිසෞ ආත්මනෙපදෙ වා කිතෞ වාච්‍යෞ. "ලොපස්ත්වනුදාත්ත තනාම්" සඞ්ගසිෂ්ට- සඞ්ගංසිෂ්ට. "හ්‍රස්වාජ්ඣසෙ" සමගත- සමගංසත.

---

a. අථ, නාමධාතු ප්‍රක්‍රියාවට අනතුරුව; ආත්මනෙපද ව්‍යවස්ථා, ආත්මනෙපද ව්‍යවස්ථාව (දක්වනු ලැබේ. ඇතැම් පරස්මෛපදී ධාතූහු ද උපසර්ග පූර්වකත්වාදි හේතූන් කරණ කොට ගෙණ ආත්මනෙපදයෙහි වර නැගෙති. දැන් ඔහු කියනු ලැබෙත්.)

205. ආත්මනෙපද විධි සූත්‍ර යි. "ආදනුදාත්තඞිතඃ" යි "ආත්" යනු අනුවෘත්ත වේ. (මේ ප්‍රක්‍රියායෙහි සියලු සූත්‍රයෝ ආත්මනෙපද විධායකයහ. එහෙයින් ඒ සියල්ලට ම මේ "ආත්" යන්න අනුවෘත්ත වේ.) නිවිශාදෙඃ, නි ආදි උපසර්ගයන් පූර්ව කොට ඇති විශ් ආදි ධාතූහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

b. නි ඉති ආදි උපසර්ග පූර්වකාත්, නි යනාදි උපසර්ග පෙරවූ කොට ඇති; විශාදෙඃ ධාතොඃ, 'විශ්' ආදි ධාතූහු කෙරෙන්; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. නිවිශතෙ යනු නිදර්ශන යි.

206. විධි සූත්‍ර යි. විපරාභ්‍යාම්, වි-පරා යන උපසර්ග දෙකින් පර වූ; ජෙඃ, "ජි ජයෙ" යන ධාතූහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

විජයතෙ- පරාජයතෙ යනු උදාහරණ යි.

207. විධි සූත්‍ර යි. සමඃ, 'සම්' උපසර්ගයෙන් පර වූ; ගමාදිභ්‍යඃ, 'ගම්' ආදි ධාතූන් කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

c. සඞ්ගච්ඡතෙ යනු උදාහරණ යි. ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි, ගමඃ පරෞ, ගම් ධාතූහු කෙරෙන් පර වූ; සිසෞ, සි-සී දෙක; වා, විකල්පයෙන්; කිතෞ වාච්‍යෞ, කිත් යයි කිය යුතු යි.

a. ඍචඡ ගතීන්ද්‍රියප්‍රලයමූර්තිභාවෙෂු, සමෘච්ඡතෙ. සමප්‍රෘච්ඡතෙ. ස්වෘ ශබ්දොපතාපයොඃ, සංස්වරතෙ, සංස්වෘෂීෂ්ට– සංස්වරිෂීෂ්ට, සමියෘතෙ, සංශෘණුතෙ, සංවිතෙත – සංවිද්‍රතෙ. "වෙතෙතරතො රුට්" සංවිද්‍රතෙ– සංවිදතෙ. සමපශ්‍යතෙ.

b. ගම ඍචඡ ප්‍රච්ඡ ස්වෘ ඍ ශ්‍රු විද දෘශ එතෙ ගමාදයඃ.

## 208. ආඞො දෙ'නාස්‍යවිහරණෙ.

(ආඞඃ 5-1. දඃ 5-1. අනාස්‍යවිහරණෙ 7-1 )

"ලොපස්ත්වනුදාත්ත තනාම්" යන සූත්‍රයෙන් (කිත් වූ පක්‍ෂයෙහි) ධාතුහුගේ මකාරයට ලොප් වේ. සඞගසීෂ්ට යනු "සී" යන්න කිත් වූ පක්‍ෂයෙහි ද– සඞගංසීෂ්ට යනු විකල්ප පක්‍ෂයෙහි ද උදාහරණ සි. (ආශීර් ලිඞ් ප්‍ර: එක වචන සි. සි යන්න කිත් වූ පක්‍ෂයෙහි "ලොපස්ත්වනුදාත්ත තනාම්" සි මකාර ලොප් වේ.) ඉන් පසු "හ්‍රස්වාඞ්ඣසෙ" යන සූත්‍රයෙන් සිප්‍රත්‍යයට ලොප් වේ. සමගත යනු සි ප්‍රත්‍යය කිත් වූ පක්‍ෂයෙහි ද– සමගංස්ත යනු විකල්ප පක්‍ෂයෙහි ද උදාහරණ සි. (ලුඞ් ප්‍ර: එක වචන සි.)

a. ඍච්ඡ ගති ඉන්ද්‍රිය ප්‍රලය මූර්තිභාවෙෂු, අකාරානුබන්ධ "ඍච්" ධාතුව ගමන ය– ඉන්ද්‍රිය විනාශ ය– (=මූළා වීම) මූර්ති භාවය යන අර්ථයන්හි වේ. සමෘච්ඡතෙ යනු "සම්" පූර්ව වීමෙන් ආත්මනෙපදි වන බවට උදාහරණ සි. සමප්‍රෘච්ඡතෙ යනු "ප්‍රච්" ධාතුව ආත්මනෙපදි වන බවට උදාහරණ සි. ස්වෘ ශබ්දොපතාපයොඃ, "ස්වෘ" ධාතුව ශබ්දය– තැවීම ය යන අර්ථ දෙක්හි වේ. සංස්වරතෙ යනු (එය) ආත්මනෙපදි වන බවට උදාහරණ සි. සංස්වෘෂීෂ්ට යනු ද– සංස්වරිෂීෂ්ට යනු ද ආශීර්ලිඞ් ප්‍ර: එක වචන සි. (ඉඩ් විකල්පත්වයෙන් රූප දෙකෙකි.) සමියෘතෙ යනු "ඍ" ධාතුව ද, සංශෘණුතෙ යනු "ශ්‍රු" ධාතුව ද ආත්මනෙපදි වන බවට උදාහරණ සි. සංවිතෙත– සංවිදතෙ යනු "සම්" පූර්ව වීමෙන් ආත්මනෙපදි වූ "විද්" ධාතුහුගේ ලට් ප්‍ර: එක– ද්වි වචන සි. "වෙතෙතරතො රුට්" * යන සූත්‍රයෙන් විකල්පයෙන් රුඩාගම වේ. සංවිද්‍රතෙ– සංවිදතෙ යනු බහු වචන සි. සමපශ්‍යතෙ යනු "දෘශ්" ධාතුව ආත්මනෙපදි වන බවට උදාහරණ සි.

b. ගම— දෘශ එතෙ, ගම්– ඍච්ඡ– ප්‍රච්ඡ– ස්වෘ– ඍ – ශ්‍රු – විද්– දෘශ් යන මොහු; ගමාදයඃ, ගමාදි ධාතුහු සි.

208. විධි සූත්‍ර සි. ආඞඃ, ආඞ් උපසර්ගයෙන් පර වූ; දඃ, 'දා' ධාතුහු කෙරෙන්, අනාස්‍යවිහරණෙ, මුඛ ප්‍රසාරණය තොර කොට ඇති අර්ථයෙහි; ආත්, ආත්මනෙපදය වේ.

---

* මේ සූත්‍රය පෙර කියන ලදී. 38 පිට බලනු.

a. ආඞ්පූර්වාද් දදතෙරාත්මනෙපදං භවති මුඛප්‍රසාරණව්‍යතිරිකෙත'ර්ථේ. ආදත්තෙ. මුඛං ව්‍යාදදාති අත්‍ර න.

## 209. ක්‍රීඩො'නුසම්පරිභ්‍යශ්ච.

( ක්‍රීඩඃ 5-1. අනුසම්පරිභ්‍යඃ 5-3. ච. නිː )

b. අනුසම්පරිභ්‍යඃ ක්‍රීඩතෙරාත්මනෙපදං ස්‍යාත්. ක්‍රීඩ විහාරෙ ශබ්දෙ ච. අනුක්‍රීඩතෙ, සඞ්ක්‍රීඩතෙ, පරික්‍රීඩතෙ. ශබ්දෙ තු න. සඞ්ක්‍රීඩති චක්‍රම්.

## 210. සමවප්‍රොපවිභ්‍යඃ ස්ථඃ

(සමවප්‍රොපවිභ්‍යඃ 5-3. ස්ථඃ 5-1.)

c. එභ්‍යස්තිෂ්ඨතෙරාත්මනෙපදං භවති. සන්තිෂ්ඨතෙ, අවතිෂ්ඨතෙ, ප්‍රතිෂ්ඨතෙ, උපතිෂ්ඨතෙ, විතිෂ්ඨතෙ.

---

a. ආඞ්පූර්වාත්, ආඞ් යන උපසර්ගය පූර්ව කොට ඇති; දදතෙඃ, දා ධාතුහු කෙරෙන්; මුඛ ප්‍රසාරණ ව්‍යතිරිකෙත අර්ථෙ, මුව විවෘත කිරීම තොර කොට ඇති අර්ථයෙහි; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. ආදත්තෙ යනු උදාහරණ යි. මුඛං ව්‍යාදදාති අත්‍ර න, "මුඛං ව්‍යාදදාති" (=මුව විවෘත කෙරෙයි) යන මෙහි ආත්ම නෙපදය නො වේ.

209. විධි සූත්‍ර යි. අනුසම්පරිභ්‍යඃ, අනු- සම්- පරි යන උපසර්ගයන්ගෙන් පර වූ; ක්‍රීඩඃ ච, 'ක්‍රීඩ්' ධාතුහු කෙරෙන් ද; ආත්, ආත්මනෙපදය වේ.

b. අනුසම්පරිභ්‍යඃ, අනු- සම්- පරි උපසර්ගයන් කෙරෙන් පර වූ; ක්‍රීඩතෙඃ, ක්‍රීඩ් ධාතුහු කෙරෙන්; ආත්මනෙපදං ස්‍යාත්, ආත්මනෙපදය වන්නේ ය. ක්‍රීඩ විහාරෙ ශබ්දෙ ච, අකාරානුබන්ධ "ක්‍රීඩ්" ධාතුව ක්‍රීඩාවෙහි ද- ශබ්දයෙහි ද වේ. අනුක්‍රීඩතෙ- සඞ්ක්‍රීඩතෙ- පරික්‍රීඩතෙ යනු පිළිවෙළින් උදාහරණ යි. ශබ්දෙ තු, ශබ්දාර්ථයෙහි වනාහි; න, ආත්මනෙපදය නො වේ. සඞ්ක්‍රීඩති චක්‍රම් (=චක්‍රය ශබ්ද කෙරෙයි) යනු ඊට උදාහරණ යි.

210. විධි සූත්‍ර යි. සමවප්‍රොපවිභ්‍යඃ, සම්- අව- ප්‍ර- උප- වි යන උපසර්ගයන්ගෙන් පර වූ; ස්ථඃ, 'ස්ථා' ධාතුහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

c. එභ්‍යඃ, මේ 'සම්' ආදි උපසර්ගයන් කෙරෙන් පර වූ; තිෂ්ඨතෙඃ, ස්ථා ධාතුහු කෙරෙන්; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. සන්තිෂ්ඨතෙ -පෙ- විතිෂ්ඨතෙ යනු පිළිවෙළින් උදාහරණ යි.

**211. ආඞො යමහනඃ.** (ආඞඃ 5-1. යමහනඃ 5-1.)

a. ආඞ්පරයොඃසීමහනොරාත්මනෙපදං භවති. ආයච්ඡතෙ- ආහතෙ.

b. අකර්මකයොරාත්මාඞ්ගකර්මකයො ර්වා. ආයච්ඡතෙ පාණිම්. ආහතෙ ශිරඃ. අන්‍යථා පරශිර ආයච්ඡති. ශත්‍රූමාහන්ති.

c. හනෙනරාත්මනෙපදෙ සිඃ කිද් වාච්‍යඃ. නො ලොපඃ, ආහත. "ලොපස්ත්වනු—" හනෙනඃ ස්‍යාශීඃසිද්‍යොඃ වධාදෙශ ආති වා. ආවධිෂට.

**212 උද්විභ්‍යාං තපඃ.** (උද්විභ්‍යාම් 5-2. තපඃ 5-1.)

---

211. විධි සූත්‍ර යි. ආඞඃ, ආඞ් උපසර්ගයෙන් පර වූ; යමහනඃ, 'යම්- හන්' ධාතු දෙකින්; ආත්, ආත්මනෙපදය වේ.

a. ආඞ්පරයොඃ, ආඞ් උපසර්ගයෙන් පර වූ; යමහනොඃ, යම්- හන් ධාතු ද්වය සම්බන්ධ ව; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. ආයච්ඡතෙ- ආහතෙ යනු පිළිවෙළින් උදාහරණ යි.

b. අකර්මකයොඃ වා, කර්ම රහිත වූ හෝ; ආත්මාඞ්ගකර්මකයොඃ වා, ස්වකීය අවයවයක් කර්ම කොට ඇත්තා වූ හෝ; (යම්- හන් ධාතු දෙක සම්බන්ධ ව ආත්මනෙපදය වේ.) පාණිම්, (සිය) අල්ල; ආයච්ඡතෙ, දිගු කෙරෙයි. ශිරඃ, (සිය) හිසට; ආහතෙ, ගසා ගණියි. (ආයච්ඡතෙ- ආහතෙ යන දෙතැන්හි සිය අවයවයක් කර්ම කොට ඇති බැවින් ආත්මනෙපද විය.) අන්‍යථා, අන් පරිද්දකින් වී නම්; (පරස්මෛපදය වේ.) පරශිරඃ ආයච්ඡති (=මෙරමා හිස දිගු කරයි.) ශත්‍රූම් ආහන්ති (=සතුරාට ගසයි) යනු ඊට උදාහරණ යි.

c. හනෙනඃ, හන් ධාතුහු කෙරෙන් පර වූ; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි වූ; සිඃ, සි ප්‍රත්‍යය; කිත් වාච්‍යඃ, කිත් යයි කිය යුතු යි. නඃ ලොපඃ, (කිත් බැවින් හන් ධාතුහුගේ) නකාරයට ලොප් වේ. ආහත යනු වේ. "ලොපස්ත්වනුදාත්ත තනාම්" යනු මෙහි නකාරයට ලොප් වන සූත්‍රය යි. ස්‍යාශීඃසිද්‍යොඃ, සි ප්‍රත්‍යය - ආශීඃසාදිය යන දෙක පර කල්හි; හනෙනඃ, හන් ධාතුහට; වධාදෙශඃ, 'වධ' ආදෙශය වේ. ආති, ආත්මනෙපදයෙහි; වා, විකල්පයෙන් වධාදෙශ වේ. (ලුඞ්හි) ආවධිෂට යනු වේ. (විකල්ප පක්ෂයෙහි ආහත යනු යි. ආශීර් ලිඞ්හි ආවධිෂීෂට යනු වේ.)

212. විධි සූත්‍ර යි. උද්විභ්‍යාම්, උද්- වි යන උපසර්ග ද්වයෙන් පර වූ; තපඃ, 'තප්' ධාතුහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

a. උද්විභ්‍යාං පරස්‍යාකර්මකස්‍යාත්මාඞ්ගකර්මකස්‍ය වා තපතෙරාත්මනෙපදං භවති. උත්තපතෙ, විතපතෙ පාණිම්. අන්‍යථා මහීං විතපත්‍යර්කඃ.

## 213. උදශ්චරස්ත්‍යාගෙ.

(උදඃ 5-1. චරඃ 5-1 ත්‍යාගෙ 7-1.)

b. උත්පූර්වාච්චරතෙස්ත්‍යාගෙ'ර්ථෙ ආත්මනෙපදං භවති. ධර්මමුච්චරතෙ, ත්‍යජතීත්‍යර්ථඃ. ත්‍යාගෙ කිම්? මන්ත්‍රමුච්චරති.

## 214. සමස්තෘතීයායුක්තාච්ච.

(සමඃ 5-1, තෘතීයායුක්තාත් 5-1. ච, අ:)

---

a. උද්විභ්‍යාං පරස්‍ය, උද්-වි යන උපසර්ග ද්වයෙන් පර වූ; අකර්මකස්‍ය වා, කර්ම රහිත වූ හෝ; ආත්මාඞ්ගකර්මකස්‍ය වා, ස්වකීය අවයවයක් කර්ම කොට ඇත්තා වූ හෝ; තපතෙඃ, තප් ධාතුව සම්බන්ධ ව; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. උත්තපතෙ- විතපතෙ යනු පිළිවෙළින් උදාහරණ සි. පාණිම්, (සිය) අල්ල; උත්තපතෙ = විතපතෙ, වෙසෙසින් තවයි. අන්‍යථා, අන් පරිද්දකින් වී නම් (=අකර්මක හෝ ආත්මාඞ්ගකර්මක නො වී නම් ආත්මනෙපදය නො වේ.) ‘මහීං විතපති අර්කඃ’ (=හිරු පොළොව තවයි) යනු ඊට උදාහරණ සි.

213. විධි සූත්‍ර සි. උදඃ, උද් උපසර්ගයෙන් පර වූ; චරඃ, ‘චර්’ ධාතුහු කෙරෙන්; ත්‍යාගෙ, ත්‍යාගාර්ථයෙහි; ආත්, ආත්මනෙපදය වේ.

b. උත්පූර්වාත්, උද් උපසර්ගය පූර්ව කොට ඇති; චරතෙඃ, චර් ධාතුහු කෙරෙන්; ත්‍යාගෙ අර්ථෙ, ත්‍යාගාර්ථයෙහි; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. ධර්මම් උච්චරතෙ යනු උදාහරණ සි. ත්‍යජති ඉති, (ධර්මය) හරියි යන; අර්ථඃ, අර්ථ සි. ත්‍යාගෙ කිම්, “ත්‍යාගෙ” යනු කිම? “මන්ත්‍රමුච්චරති” (=මන්ත්‍රය උසුරුවයි) යන තැන්හි ආත්මනෙපද නො වන පිණිස සි. (ත්‍යාගාර්ථ නො වන හෙයිනි.)

214. විධි සූත්‍ර සි. “උදශ්චරස්ත්‍යාගෙ” සි ‘චරඃ’ යනු ද අනුවෘත්ත වේ. සමඃ, සම් උපසර්ගයෙන් පර වූ; තෘතීයායුක්තාත් ච, තෘතීයාන්තයක් සමග යෙදුනා වූ ද; චරඃ, ‘චර්’ ධාතුහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

a. සංපූර්වාච්චරතෙස්තෘතීයායුක්තාත් පදෙන යුක්තාද්‍යාත්ම නෙපදං භවති. අශ්වෙන සඤ්චරතෙ.

**215. ව්‍යවපරිභ්‍යඃ ක්‍රීඤ: .** (ව්‍යවපරිභ්‍යඃ 5-3. ක්‍රීඤඃ 5-1.)

b. එභ්‍යඃ ක්‍රීණාතෙරාත්මනෙපදං භවති. වික්‍රීණීතෙ– අවක්‍රීණීතෙ– පරික්‍රීණීතෙ.

**216 ශප උපාලම්භෙ.** (ශපඃ 5-1. උපාලම්භෙ 7-1.)

c. උපාලම්භෙ'ර්ථෙ ශපතෙරාත්මනෙපදං භවති.

d. වාචා ශරීරස්පර්ශනමුපාලම්භඃ, විප්‍රාය ශපතෙ. විප්‍ර ශරීරං ස්පෘශති, ශපථං කරෝතීත්‍යර්ථඃ. උපාලම්භෙ කිම්? දුෂ්ටං ශපති, ශාපං දදාතීත්‍යර්ථඃ.

---

a. සංපූර්වාත්, සම් උපසර්ගය පූර්ව කොට ඇති; තෘතීයායුක්තාත් පදෙන, තෘතීයා විභක්ත්‍යන්ත පදයක් සමඟ; යුක්තාත්, යෙදුනා වූ; චරතෙඃ, චර ධාතුහු කෙරෙන්; ආත්මනෙපදං භවති, ආත්මනෙ පදය වේ. "අශ්වෙන සඤ්චරතෙ" යනු උදාහරණ යි. අසුගෙන් (=අසු පිට) හැසිරෙයි යන අර්ථ යි.

215. විධි සූත්‍ර යි. ව්‍යවපරිභ්‍යඃ, වි– අව– පරි යන උපසර්ගයන් ගෙන් පර වූ; ක්‍රීඤඃ, 'ක්‍රීඤ්' ධාතුහු කෙරෙන්; ආත්, ආත්මනෙ පදය වේ.

b. එභ්‍යඃ, මේ වි– අව– පරි යන උපසර්ගයන්ගෙන් පර වූ; ක්‍රීණාතෙඃ, ක්‍රීඤ් ධාතුහු කෙරෙන්; ආත්මනෙපදං භවති, ආත්මනෙ පදය වේ. වික්‍රීණීතෙ– අවක්‍රීණීතෙ– පරික්‍රීණීතෙ යනු පිළිවෙළින් උදාහරණ යි.

216. විධි සූත්‍ර යි. උපාලම්භෙ, දිවිරීමෙහි වූ; ශපඃ, 'ශප්' ධාතුහු කෙරෙන්; ආත්, ආත්මනෙපදය වේ.

c. ශපතෙඃ, ශප් ධාතුහු කෙරෙන්; උපාලම්භෙ අර්ථෙ, දිවිරීම් අර්ථයෙහි; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ.

d. වාචා, වචනයෙන්; ශරීරස්පර්ශනම්, ශරීරය ස්පර්ශ කිරීම; උපාලම්භඃ, "උපාලම්භ" නම්.(ඇඟට අත ගසා දිවිරීම "උපාලම්භ" නමැයි යූ සේ යි.) විප්‍රාය, බමුණාට; ශපතෙ, දිවුරයි. විප්‍රශරීරම්, බමුණාගේ සිරුර; ස්පෘශති, ස්පර්ශ කෙරෙයි; ශපථං කරෝති ඉති, දිවිරීම කෙරෙයි යන; අර්ථඃ, අර්ථ යි. උපාලම්භෙ කිම්, "උපා-

## 217 ඥාශ්‍රුස්මෘදෘශාං සාන්තානාම්. *

(ඥාශ්‍රුස්මෘදෘශාම් 6-3. සාන්තානාම් 6-3.)

a. **සප්‍රත්‍යයාන්තානාමේෂාමාත්මනෙපදං භවති. "යඃ සෙ." ජිඥාසතෙ- ශුශ්‍රෑෂතෙ- සුස්මූර්ෂතෙ- දිදෘක්ෂතෙ.**

b. **අනුපසර්ගාජ්ජ්ඥානාතෙරාත්මගාමිනි ඵලෙ ආත්මනෙපදං වාච්‍යම්. ගාං ජානිතෙ.**

## 218. කර්මව්‍යතිහාරේ'න්‍යත්‍ර හිංසාදෙඃ. †

(කර්මව්‍යතිහාරෙ 7-1. අන්‍යත්‍ර- නි: හිංසාදෙඃ. 5-1.)

---

ලම්භ යනු කිම? දුෂ්ටං ශපති (=දුෂ්ටයාට ශාප කෙරෙයි) යන තැන්හි ආත්මනෙපද නො වන පිණිස යි. (ශප් ධාතුව උපාලම්භාර්ථ නො වන හෙයිනි.) ශාපං දදාති ඉති, ශාප දෙයි යන; අර්ථඃ, අර්ථ යි.

217. විධි සූත්‍ර යි. සාන්තානාම්, සප්‍රත්‍යයාන්ත වූ, ඥශ්‍රුස්මෘදෘශාම්, ඥා- ශ්‍රු- ස්මෘ- දෘශ් යන ධාතූන් සම්බන්ධ ව; ආත්, ආත්මනෙපදය වේ.

a. සප්‍රත්‍යයාන්තානාම්, සප්‍රත්‍යය අන්ත කොට ඇති; එෂාම්, මේ ඥා- ශ්‍රු- ස්මෘ- දෘශ්- ධාතූන්ගේ; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. "යඃ සෙ" යන සූත්‍රයෙන් පූර්ව අකාරයට ඉකාරය වේ. ජිඥාසතෙ- ශුශ්‍රෑෂතෙ- සුස්මූර්ෂතෙ- දිදෘක්ෂතෙ යනු පිළිවෙළින් ධාතු චතුෂ්කයට උදාහරණ යි.

b. අනුපසර්ගාත්, උපසර්ග රහිත වූ; ජානාතෙඃ, 'ඥා' ධාතුහු කෙරෙන්; ආත්මගාමිනි; තමන් කරා පැමිණෙන සුලු වූ; ඵලෙ, ක්‍රියා ඵලය වාච්‍ය කල්හි; ආත්මනෙපදම්, ආත්මනෙපදය; වාච්‍යම්, කිය යුතු යි. 'ගාං ජානීතෙ' යනු උදාහරණ යි.

218. විධි සූත්‍ර යි. කර්මව්‍යතිහාරෙ, කර්මව්‍යතිහාරාර්ථයෙහි; හිංසාදෙඃ අන්‍යත්‍ර, හිංසාද්‍යර්ථ ධාතුහු කෙරෙන් අන් තැන්හි; ආත්, ආත්මනෙ පදය වේ.

---

* සාන්තානාමාත්--පොත්හි. "ආත්" යි අනුවෘත්ත වන හෙයින් ඒ නිරර්ථක ය.

† හිංසාදෙරාත්--පොත්හි. ,, ,, ,,

**a. කර්මව්‍යතිහාරේ'ර්ථෙ වාච්‍යෙ හිංසාර්ථාන් ගත්‍යර්ථාන් පඨජල්පහසාන් විහාය ඉතරෙතරාන්‍යොන්‍යපරස්පරපදාභාවෙ-සර්වෙභ්‍යො ධාතුභ්‍ය ආත්මනෙපදං භවති.**

**b. පරස්පරමෙකක්‍රියාකරණං කර්මව්‍යතිහාරඃ. ශ්‍රද්ධා-ආස්තික්‍ය බුද්ධිඃ. ශ්‍රද්ධා ව්‍යතිභවතෙ, පරස්පරං භවතීත්‍යර්ථඃ. ව්‍යතිසෙත, විවදන්තෙ වාදිනඃ. අන්‍යත්‍රෙති කිම්? ව්‍යතිඝ්නන්ති-ව්‍යතිගච්ඡන්ති- ව්‍යතිපඨන්ති- ව්‍යතිජල්පන්ති- ව්‍යතිහසන්ති. ඉතරෙතරං පරස්පරං අන්‍යොන්‍යං වා ව්‍යතිලුනන්ති.**

---

a. කර්මව්‍යතිහාරෙ අර්ථෙ, කර්මව්‍යතිහාරාර්ථයක්; වාච්‍යෙ, කිය යුතු කල්හි; හිංසාර්ථාන්, හිංසාර්ථ ධාතූන් ද; ගත්‍යර්ථාන්, ගමනාර්ථ ධාතූන් ද; පඨජල්පහසාන්, පඨ- ජල්ප- හස යන ධාතූන් ද; විහාය, හැර; සර්වෙභ්‍යඃ, (ඉතිරි) සියලු ධාතූන් කෙරෙන්; ඉතරෙතරාන්‍යොන්‍ය පරස්පර පදාභාවෙ, ඉතරෙතර- අන්‍යොන්‍ය- පරස්පර යන පදයන් (යෙදීමක්) නැති කල්හි; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ.

b. පරස්පරම්, ඔවුනොවුන්; එකක්‍රියා කරණං, එක ම ක්‍රියාවක් කිරීම; කර්මව්‍යතිහාරඃ, "කර්මව්‍යතිහාර" නම්. ශ්‍රද්ධා, ශ්‍රද්ධා නම්; ආස්තික්‍ය බුද්ධිඃ, පරලොව හෝ කර්මඵල ඇතැයි යන දැනීම යි. ශ්‍රද්ධා ව්‍යතිභවතෙ, =ශ්‍රද්ධා, ඇදහිල්ල; ව්‍යතිභවතෙ, ඔවුනොවුන් කෙරෙහි වෙයි. ව්‍යතිභවතෙ යනු වි- අති පූර්ව භූ ධාතුහුගේ කර්මව්‍යතිහාරාර්ථ ලට් ආ: ප්‍ර: එක වචන යි. පරස්පරං භවති ඉති, ඔවුනොවුන් කෙරෙහි වෙයි යන; අර්ථඃ, අර්ථ යි. ව්‍යතිසෙත යනු 'අස්' ධාතුහුගේ යි. (එම අර්ථ යි.) විවදන්තෙ යනු 'වද' ධාතුහුගේ යි. වාදිනඃ, වාදීහු; විවදන්තෙ, අන්‍යොන්‍යයෝ වාද කෙරෙත්. අන්‍යත්‍ර ඉති, (සූත්‍රයෙහි වූ) අන්‍යත්‍ර යනු; කිම්, කුමට ද යත්? ව්‍යතිඝ්නන්ති –පෙ– ව්‍යතිලුනන්ති යන තැන්වල ආත්මනෙපද නො වනු පිණිස යි. ව්‍යතිඝ්නන්ති, අන්‍යොන්‍යයෝ නසා ගණිත්. ව්‍යතිගච්ඡන්ති, අන්‍යොන්‍යයෝ ගමන් කෙරෙත්. ව්‍යතිපඨන්ති, අන්‍යොන්‍යයෝ හදාරත්. ව්‍යතිජල්පන්ති, අන්‍යොන්‍යයෝ කථා කෙරෙත්. ව්‍යතිහසන්ති, අන්‍යොන්‍යයෝ සිනා සෙත්. ඉතරෙතරම්, අන්‍යොන්‍යයෝ, ව්‍යතිලුනන්ති, සිඳිත්. (වා ශබ්දයෙන් "පරස්පරම්- අන්‍යොන්‍යම්" යන පද ද්වය ද "ව්‍යතිලුනන්ති" යන්න හා වෙන වෙන ම සම්බන්ධ වන බව අඟවයි. එහෙයින්) "පරස්පරං ව්‍යතිලුනන්ති- අන්‍යොන්‍යං ව්‍යතිලුනන්ති" යි ද වේ. සමානාර්ථ යි.

a භුජො භොජනෙ ආත්මනෙපදං වාච්‍යම්. භුඤ්ජතෙ ඔදනම්. භොජනෙ කිම්? භුනක්ති මහිං නෘපඃ.

## ඉත්‍යාත්මනෙපද ප්‍රක්‍රියා

b. අථ භාවකර්ම ප්‍රක්‍රියා:-

## 219. යක් චතුර්ඥු. (යක් 1-1. චතුර්ඥු 7-3.)

a. භුජඃ, 'භුජ්' ධාතුහු කෙරෙන්; භොජනෙ, අනුභව කිරීම් අර්ථයෙහි; ආත්මනෙපදම්, ආත්මනෙපදය; වාච්‍යම්, කිය යුතු යි. භුඤ්ජතෙ ඔදනම්, (=බත අනුභව කරයි) යනු උදාහරණ යි. භොජනෙ කිම්, "භොජනෙ" යනු කුමට ද යත්? භුනක්ති යන තැන්හි ආත්මනෙපද නො වන පිණිස යි. නෘපඃ, රජ තෙමේ; මහිම්, පොළොව; භුනක්ති, පාලනය කෙරෙයි.

ආත්මනෙපද ප්‍රක්‍රියා, ආත්මනෙපද ප්‍රක්‍රියාව; ඉති, මෙතෙකින් සමාප්ත යි.

(මෙසේ ම උභයපදී- ආත්මනෙපදී ඇතැම් ධාතූන් උපසර්ග පූර්වකත්වාදිය හෙතු කොට ගෙණ පරස්මෛපදී වන බව ද පෙණේ. අනු- පරා යන උපසර්ගයන්ගෙන් පර වූ; "කෘඤ්" ධාතුහු කෙරෙන් ද, අභි- ප්‍රති- අති උපසර්ගයන්ගෙන් පර වූ "ක්‍ෂිප්" ධාතුහු කෙරෙන් ද, ප්‍ර- පරි උපසර්ගයන්ගෙන් පර "වහ්" ධාතුහු කෙරෙන් ද, පරි උප සර්ගයෙන් පර "මෘෂ්" ධාතුහු කෙරෙන් ද, පරස්මෛපදය වේ. අනුකරොති- පරාකරොති- අභික්‍ෂිපන්ති- ප්‍රතික්‍ෂිපන්ති- අතික්‍ෂිපන්ති- ප්‍රවහන්ති- පරිවහති- පරිමෘෂ්‍යති යනු පිළිවෙළින් උදාහරණ යි. සිද්ධාන්ත චන්ද්‍රිකාදිය බැලිය යුතු යි.)

## පද ව්‍යවස්ථා නිමි.

b, අථ, ඉක්බිති; භාවකර්ම ප්‍රක්‍රියා, භාවකර්ම ප්‍රක්‍රියාව දක්වනු ලැබේ.

219. යක් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ආද් භුවි කර්මණි" යි 'භුවි- කර්මණි' යනු ද- "ධාතොඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි.

චතුර්ඥු, ලඩාදි සතර පර කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; භුවි, භාව කාරකයෙහි ද- කර්මණි, කර්ම කාරකයෙහි ද- යක්, යක් ප්‍රත්‍යය වේ.

**a. ධාතොර්භාවෙ කර්මණි ච යක් ප්‍රත්‍යයො භවති චතුර්ෂු පූර්වොක්තෙෂු පරතඃ. ककාරො ගුණප්‍රතිෂෙධාර්ථඃ.**

## 220. ආත් භුවි කර්මණි. (ආත් 1-1. භුවි 7-1. කර්මණි 7-1.)

**b. අකර්මකෙභ්‍යො භුවි භාවෙ සකර්මකෙභ්‍යශ්ච කර්මණ්‍යාත්මනෙපදං භවති. යෙ කර්මනිරපෙක්ෂාං ක්‍රියාමාහුස්තෙ ’කර්මකාඃ. භූ- එධ- ආස්- ශීඞ් ප්‍රභෘතයඃ. තදුක්තම්:-**

---

a. පූර්වොක්තෙෂු, පෙර කියන ලද; චතුර්ෂු පරතඃ, ලඩාදි සතර පර කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; භාවෙ, භාවාර්ථයෙහි ද; කර්මණි ච, කර්මාර්ථයෙහි ද; යක් ප්‍රත්‍යයඃ භවති, යක් ප්‍රත්‍යය වේ. කකාරඃ, (ප්‍රත්‍යයස්ථ) කකාරය; ගුණ ප්‍රතිෂෙධාර්ථඃ, ගුණය වැළැක්වීම ප්‍රයෝජන කොට ඇත්තේ ය.

(භාවය නම් හුදු ධාත්වර්ථ මාත්‍රය යි. “ධාත්වර්ථඃ කෙවලඃ ශුද්ධො භාව ඉත්‍යභිධීයතෙ” යනුවෙන් ඒ බැව් කීහ. ඒ වනාහි සිද්ධරූප ය- සාධ්‍යරූප යයි ද්විවිධ ය. (1) සිද්ධරූප නම් කෘදන්ත භාවය යි. (2) සාධ්‍යරූප නම් මේ ආඛ්‍යාත භාවය යි. ධාත්වර්ථ මාත්‍රය වාච්‍ය කල්හි හා ක්‍රියායෙන් කර්මය උක්ත වන කල්හිත් ධාතුහු කෙරෙන් “යක්” ප්‍රත්‍යය කළයුතු බව මේ සූත්‍රයෙන් දක්වේ. එ ද වනුයේ ලට්- විධි ලිඞ්- ලොට්- ලඞ් යන සිවු ලකාරයෙහි පමණෙකි.)

220. ආත්මනෙපද විධි සූත්‍ර යි. “ධාතොඃ” යන සූත්‍රය අනුවෘත්ත යි. ධාතොඃ, ධාතුහු කෙරෙන්; භුවි, භාව කාරකයෙහි ද; කර්මණි, කර්ම කාරකයෙහි ද; ආත්, ආත්මනෙපදය වේ.

b. අකර්මකෙභ්‍යඃ, අකර්මක ධාතූන් කෙරෙන්; භුවි, “භුවි” සි සේ යි; භාවෙ, භාවයෙහි ද; සකර්මකෙභ්‍යඃ, සකර්මක ධාතූන් කෙරෙන්, කර්මණි ච, කර්ම කාරකයෙහි ද; ආත්මනෙපදං භවති, ආත්මනෙපදය වේ. (පරස්මෛපදි ආදි සියලු ධාතූන් කෙරෙන් භාවයෙහි හා කර්මයෙහි ආත්මනෙපදය ම වන බව මෙයින් කීහ. ඉක්බිති අකර්මක ධාතූන් දක්වති.) යෙ, යම් ධාතු කෙනෙක්; කර්ම නිරපෙක්ෂාම්, කර්මාපෙක්ෂාවක් නැති; ක්‍රියාම්, ක්‍රියාව; ආහුඃ, කියද්ද; තෙ, ඒ ධාතුහු; අකර්මකාඃ, “අකර්මක” නම් වෙත්. භූ- එධ- ආස්- ශීඞ් ප්‍රභෘතයඃ, භූ සත්තායාම්- එධ වෘද්ධෞ- ආස් උපවෙශනෙ- ශීඞ් ස්වප්නෙ යනාදීහු යි. තදුක්තම්, හේ (මෙසේ) කියන ලදී:-

a. ලජ්ජා සත්තා ස්ථිති ජාගරණං
වෘද්ධි ක්ෂය භය ජීවිත මරණම්,
ශයන ක්‍රීඩා රුචි දීප්ත්‍යර්ථං
ධාතුගණං තමකර්මකමාහුඃ.

---

a. ලජ්ජා සත්තා ස්ථිති ජාගරණම්, ලජ්ජා ය- වීම ය- සිටීම ය -නිදි වැරීම ය යන අර්ථ ඇත්තාවූ ද; වෘද්ධි ක්ෂය භය ජීවිත මරණම්, වැඩීම ය- පිරිහීම ය- බිය වීම ය- ජීවත් වීම ය- මැරීම ය යන අර්ථ ඇත්තා වූ ද; ශයන ක්‍රීඩා රුචි දීප්ත්‍යර්ථම්, නිදීම ය- ක්‍රීඩා කිරීම ය- කැමති වීම ය- බැබලීම ය යන අර්ථ ඇත්තා වූ ද; තං ධාතු ගණම්, ඒ ධාතු සමූහය; අකර්මකම් ආහුඃ, අකර්මක යයි කියත්. (මෙයින් ලජ්ජාදිය අර්ථ කොට ඇති ධාතූහු අකර්මක යයි පිරිසිඳිනා ලදහ. එයින් අන්‍ය වූවෝ "සකර්මක" වෙත්. අකර්මක-සකර්මක ධාතූන්ගේ ලක්ෂණ මෙසේ දැක්වූහ:-

"ඵලව්‍යාපාරයොරෙකා - නිෂ්ඨතායාමකර්මකඃ,
ධාතුස්තයොර්ධර්මිභෙදෙ - සකර්මක උදාහෘතඃ" සි.

උත්පත්ත්‍යනුකූල ව්‍යාපාරය වූ ධාත්වර්ථය ද- උත්පත්ති සඞ්ඛ්‍යාත ක්‍රියා ඵලය ද එක් ආශ්‍රයෙක්හි පිහිටි කල්හි ධාතුව අකර්මක බව ද, භින්නාශ්‍රය වූ කල්හි හෙවත් වස්තු ද්වයෙක්හි පිහිටි කල්හි සකර්මක බව ද එයින් නිර්දිෂ්ට ය.

අකර්මක ධාතූහු උපසර්ග පූර්වකත්ව හෙතුවෙන් ඇතැම් තැන්හි සකර්මක වෙති. සුඛමනුභූයතෙ ස්වාමිනා යනු උදාහරණ යි. මෙහි භූ ධාතුව අකර්මක වුව ද "අනු" උපසර්ග පූර්වකත්වයෙන් සකර්මක විය. එසේ ම ධාතූන්ගේ අර්ථාන්තර වෘත්තිත්වාදි හෙතුවෙන් සකර්මක ධාතු අකර්මක ද වෙති.

"ධාතොරර්ථාන්තරෙ වෘත්තෙ- ර්ධාත්වර්ථෙනොපසඞ්ග්‍රහාත්,
ප්‍රසිද්ධෙරවිවක්ෂාතඃ- කර්මණො'කර්මිකා ක්‍රියා." යි

ඒ බැව් දැක්වූහ. (1) ප්‍රසිද්ධාර්ථය හැර අන්‍යාර්ථයක පවත්නා කල්හි සකර්මක ධාතුව ද අකර්මක වේ. නදී වහති යනු උදාහරණ යි. මෙහි "වහ්" ධාතුව ප්‍රසිද්ධ වූ ඉසිලීම් අර්ථයෙහි නො ව ගලා බැසීම් අර්ථයෙහි වේ. (2) කර්මය ධාත්වර්ථය හා සඞ්ග්‍රහ වීමෙන් ද අකර්මක වේ. ජීවති යනු උදාහරණ යි. "පණ දරයි" යනාර්ථ යි. මෙහි "පණ" යන කර්මය ධාත්වර්ථයෙන් ම සඞ්ගෘහීත ය. (3) කර්මය ප්‍රසිද්ධ නම් එකල්හි ද ධාතුව අකර්මක වේ. මෙඝො වර්ෂති යනු උදාහරණ යි. මෙහි "ජලම්" යන කර්මය අතිශයින් ප්‍රසිද්ධ ම ය. (4) කර්මය ඇත ද එය දැක්වීමට වක්තෘහුගේ අභිප්‍රායක් නැත් නම් එකල්හි ද ධාතුව අකර්මක වේ. ස ගච්ඡති යනු උදාහරණ යි. මෙහි "ග්‍රාමම්" යන කර්මය අවිවක්ෂිත ය.)

**a. භාවස්‍යෛකත්වාදෙකවචනමෙව භවති ප්‍රථමපුරුෂස්‍ය. භූයතෙ භවතා. භූයෙත, භූයතාම්, අභූයත, බභූවෙ.**

**b. "ස්වරාන්තානාං හන්ග්‍රහදෘශාඤ්ච භාවකර්මණොඃ සිසතා. සීස්‍යපාමිඩ් වා ඉණ් වක්තව්‍යඃ" වාශබ්දාත් සෙටාං ධාතූනාං නිත්‍යමිට්, ස විකල්පෙන ණිත්. අනිටාං ධාතූනාං විකල්පෙන ඉට්, ස නිත්‍යං ණිත්. එවඤ්ච හන්දෘශොරනිටොර්වා ඉට්, ස ච නිත්‍යං ණිත්. ග්‍රහධාතුස්තු සෙට්. තතඃ පරෙ නිත්‍යමිට්, ස ච වා ණිත්. ණිත්ත්වාද් වෘද්ධිඃ. භාවිෂීෂ්ට, ණිත්ත්වාභාවෙ භවිෂීෂ්ට. භාවිතා- භවිතා, භාවිෂ්‍යතෙ- භවිෂ්‍යතෙ, අභාවිෂ්‍යත- අභවිෂ්‍යත.**

---

a. භාවස්‍ය, භාවය තමා; එකත්වාත්, එකක් බැවින්; ප්‍රථම පුරුෂස්‍ය, ප්‍රථම පුරුෂය පිළිබඳ; එක වචනම් එව, එක වචනය ම; භවති, වේ. භූයතෙ යනු භාවයෙහි ලට් රූප යි. භවතා, පින්වතා විසින්; භූයතෙ, (වත්මන්හි) වීම යි. භූයෙත- භූයතාම්- අභූයත- (බභූවෙ යනු පිළිවෙළින් විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට් රූපයෝ යි. "චතුර්ෂු" යි කී හෙයින් අනබ් විෂයෙහි යක් ප්‍රත්‍යය නො වේ.)

b. ස්වරාන්තානාම්, ස්වරාන්ත ධාතුන්ගේ ද; හන්ග්‍රහදෘශාං ච, හන්- ග්‍රහ- දෘශ් යන ධාතුන්ගේ ද; භාවකර්මණොඃ, භාව- කර්ම දෙක්හි; සිසතාසීස්‍යපාම්, සි- ස- තා- සී- ස්‍යප් යන මොවුන් සම්බන්ධි වූ; ඉට්, ඉඩාගමය; වා, ව්‍යවස්ථා වශයෙන්; ඉණ් වක්තව්‍යඃ, "ඉණ්" යයි කිය යුතු යි. (ස්වරාන්ත ධාතුන් කෙරෙන් හා හන්- ග්‍රහ- දෘශ් ධාතුන් කෙරෙන් ද භාව- කර්ම දෙක්හි වන ඉඩාගමය ව්‍යවස්ථා වශයෙන් ණිත් වන බව මෙයින් කිහ. ඉක්බිති වාශබ්දයාගේ ව්‍යවස්ථා දක්වයි.) වා ශබ්දාත්, ව්‍යවස්ථා වාචක 'වා' ශබ්දයෙන්; සෙටාං ධාතූනාම්, සෙට් ධාතූන් සම්බන්ධ ව; නිත්‍යම් ඉට්, නිත්‍යයෙන් ඉඩාගම වේ. සඃ, එය; විකල්පෙන ණිත්, විකල්පයෙන් ණිත් වේ. අනිටාං ධාතූනාම්, අනිට් ධාතූන් සම්බන්ධ ව; විකල්පෙන ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. සඃ, එය; නිත්‍යං ණිත්, නිත්‍යයෙන් ණිත් වේ. එවඤ්ච, මෙසේත්; අනිටොඃ, අනිට් වූ; හන්දෘශොඃ, හන්- දෘශ් ධාතු දෙක සම්බන්ධ ව; වා ඉට්, විකල්පයෙන් ඉඩාගම වේ. සඃ ච, හෙ ද; නිත්‍යං ණිත්, නිත්‍යයෙන් ණිත් වේ. ග්‍රහ ධාතුඃ තු, අකාරානුබන්ධ "ග්‍රහ්" ධාතුව වනාහි; සෙට්, ඉට් සහිත ය. තතඃ පරඃ, ඉන් පර වූයේ; නිත්‍යම් ඉට්, නිත්‍යයෙන් ඉඩාගම වේ. සඃ ච, හෙ ද; වා ණිත්, විකල්පයෙන් ණිත් වේ. ණිත්ත්වාත්, ණිත් බැවින්; වෘද්ධිඃ, ධාතුහට වෘද්ධි වේ; භාවිෂීෂ්ට යනු ණිත් පක්ෂයෙහි ආශීර්ලිඞ් රූප යි. ණිත්ත්වාභාවෙ, ණිත් බව නො වීමෙහි; භවිෂීෂ්ට, (වෘද්ධි නො වීමෙන්) භවිෂීෂ්ට කියා වේ. භාවිතා- භවිතා, භාවිෂ්‍යතෙ- භවිෂ්‍යතෙ, අභාවිෂ්‍යත- අභවිෂ්‍යත යනු රූප ද්වය බැගින් ලුට්- **ලෘට්- ලෘඞ් රූපයෝ යි.**

**221. ඉණ් තන්‍යකර්තරි.** (ඉණ් 1-1. තනි 7-1. අකර්තරි 7-1.)

**a. ධාතොස්තනි පරෙ භාවෙ කර්මණි ච ඉණ් ප්‍රත්‍යයො භවති. සෙරපවාදඃ. ණො වෘද්ධ්‍යර්ථඃ, "ලොපඃ." * අභාවි.**

**b. අකර්මකො'පි කදාචිත් සකර්මකතාමනුභවති. උක්තඤ්ච:-**

**c. උපසර්ගේණ ධාත්වර්ථො- බලාදන්‍යත්‍ර නීයතෙ,**
**විහාරාහාර සංහාර- ප්‍රතිහාර ප්‍රහාරවත්.**

---

221. ඉණ් ප්‍රත්‍යය විධි සූත්‍ර යි. "ධාතොඃ" යන සූත්‍රය අනුවෘත්ත යි. තනි, 'තන්' ප්‍රත්‍යය පර කල්හි; ධාතොඃ, ධාතුහු කෙරෙන්; අකර්තරි, අකර්ත්‍රර්ථයෙහි හෙවත් භාව – කර්ම දෙක්හි; ඉණ්, ඉණ් ප්‍රත්‍යය වේ.

a තනි පරෙ, තන් ප්‍රත්‍යය පර කල්හි; භාවෙ, භාවයෙහි ද; කර්මණි ච, කර්මාර්ථයෙහි ද; ධාතොඃ, ධාතුහු කෙරෙන්; ඉණ් ප්‍රත්‍යයඃ භවති, ඉණ් ප්‍රත්‍යය වේ. සෙඃ, සි ප්‍රත්‍යයාගේ; අපවාදඃ, වැළැක්ම වේ. (භාව- කර්ම දෙක්හි ලුඞ් ප්‍රථම පුරුෂෛක වචනයෙහි ධාතූන් කෙරෙන් සි ප්‍රත්‍යය විය යුතු තැන්හි ඉණ් ප්‍රත්‍යය වන බව මෙයින් දක්වන ලදී.) ණඃ, ණකාරය; වෘද්ධ්‍යර්ථඃ, වෘද්ධිය ප්‍රයොජන කොට ඇත්තේ ය. "ලොපඃ" යන සූත්‍රයෙන් තන් ප්‍රත්‍යයට ලොප් වේ. අභාවි යනු භාවයෙහි ලුඞ් රූප යි. (මෙසේ සෙසු අකර්මක ධාතුහු ද භාවයෙහි දශ ලකාරයෙහි ම ආත්මනෙපද ප්‍රථම පුරුෂෛක වචන යෙහි පමණක් වර නැගෙති.)

b. අකර්මකඃ අපි, අකර්මක ධාතුව ද; කදාචිත්, කිසි කලෙක්හි; සකර්මකතාම්, සකර්මක බව; අනුභවති, සේවනය කෙරේ. උක්තං ච, මෙ ද කියන ලදී.

c. උපසර්ගේණ, උපසර්ගය විසින්; ධාත්වර්ථඃ, ධාත්වර්ථය; බලාත්, බලයෙන්; අන්‍යත්‍ර, අන් තැනෙක්හි (අන්‍යාර්ථයෙක්හි;) නීයතෙ, පමුණුවනු ලැබේ. විහාරාහාර සංහාර ප්‍රතිහාර ප්‍රහාරවත්, විහාර- ආහාර- සංහාර- ප්‍රතිහාර- ප්‍රහාර යන මේ 'උදාහරණ මෙනි. ("විහාර" ආදි මේ සියල්ල "හෘඤ් හරණෙ" යන එක ම ධාතුවෙන් සිද්ධ වී නමුත් පූර්ව වූ වි- ආ- සම්- ප්‍රති- ප්‍ර යන උපසර්ග බලයෙන් ඔවුන්ගේ අර්ථ අන්‍යොන්‍ය විසදෘශ වෙති. (1) "විහාර" ශබ්දයෙන් වාසස්ථානය යනාදි අර්ථ ද, (2) "ආහාර" ශබ්දයෙන්

---

* පොත්හි සූත්‍ර - වෘත්ති ද්වය ම පෙණේ. එහෙත් පෙර කියන ලද්දක් හෙයින් මෙතැන්හි ද දැක්වීම නිරර්ථක ය. පොතේ 163 පිට බලනු.

**a. ධාත්වර්ථං බාධතෙ කශ්චිත්- කශ්චිත්තමනුවර්තතෙ, විශිනෂ්ටි තමෙවාර්ථ- මුපසර්ගගතිස්ත්‍රිධා.**

**b. සුඛමනුභූයතෙ ස්වාමිනා, අන්වභාවි භවො භවතා අන්වභාවිෂාතාම්, අන්වභවිෂාතාම්, අන්වභාවිෂත- අන්වභවිෂත.**

---

භොජනය යනාදි අර්ථ ද, (3) "සංහාර" ශබ්දයෙන් විනාශය යනාදි අර්ථ ද, (4) "ප්‍රතිහාර" ශබ්දයෙන් දොරටුපාලය යනාදි අර්ථ ද, (5) "ප්‍රහාර" ශබ්දයෙන් පහරය යනාදි අර්ථ ද වාච්‍ය වෙත්.)

a. කශ්චිත්, කිසියම් උපසර්ගයෙක්; ධාත්වර්ථම්, (ප්‍රසිද්ධ වූ) ධාත්වර්ථය; බාධතෙ, වළක්වයි. කශ්චිත්, කිසි උපසර්ගයෙක්; තම් එව අනුවර්තතෙ, ඒ ධාත්වර්ථය ම අනු ව පවතී; (කිසි උපසර්ගයෙක්) තම් එව අර්ථ ම්, ඒ ධාත්වර්ථය ම; විශිනෂ්ටි, වෙසෙසයි. (මෙසේ) උපසර්ග ගතිඃ, උපසර්ගයන්ගේ පැවැත්ම; ත්‍රිධා, තුන් පරිද්දකින් වේ.

(ආගච්ඡති- අධිගච්ඡති- ප්‍රතිගච්ඡති යනු පිළිවෙළින් ඊට උදාහරණ යි. (1) 'ආගච්ඡති' යන තැන්හි "ආ" උපසර්ගය තෙමේ "ගම්" ධාතුහුගේ යෑම් අර්ථය වළකා ඊම් අර්ථය ගෙණ දෙයි. (2) 'අධිගච්ඡති' යන තැන්හි "අධි" උපසර්ගය ධාත්වර්ථය අනු ව පවතිමින් යෑම් අර්ථය ම ප්‍රකාශ කෙරේ. (3) 'ප්‍රතිගච්ඡති' යන තැන්හි "ප්‍රති" උපසර්ගය ධාත්වර්ථය වෙසෙසමින් පෙරලා යෑම් අර්ථය පවසයි. මෙසේ උපසර්ග ගති ත්‍රයෙකි.)

b. ස්වාමිනා, ස්වාමිහු විසින්; සුඛම්, සුව; අනුභූයතෙ, වළඳනු ලැබේ. (මේ උදාහරණය පෙර 221 වෙනි පිටේ ද දැක්වීමු. මෙහි අනුභූයතෙ යනු ලට් ප්‍ර: එක වචන යි. කර්මකාරක බැවින් "අනුභූයෙතෙ- අනුභූයන්තෙ" යනාදි වශයෙන් දශ ලකාරයෙහි ම ආත්මනෙපදයෙහි පමණක් පුරුෂ ත්‍රයෙහි හා වචන ත්‍රයෙහිත් වර නැගිය යුතු යි. අනුභූයෙත, අනුභූයතාම්, අන්වභූයත, අනුබභූවෙ යනු විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට් ලකාරයන්හි ද, අනුභාවිෂීෂ්ට- අනුභවිෂීෂ්ට, අනුභාවිතා- අනුභවිතා, අනුභාවිෂ්‍යතෙ- අනුභවිෂ්‍යතෙ, අන්වභාවිෂ්‍යත- අන්වභවිෂ්‍යත යනු ණිත් විකල්පත්වයෙන් රූප ද්වය බැගින් ආශීර්ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ලකාරයන්හි ද ප්‍රථම පුරුෂෛක වචන යි.) අන්වභාවි යනු ලුඞ් ප්‍ර: එක වචන යි. භවතා, පින්වතා විසින්; භවඃ, භවය තෙමේ; අන්වභාවි, වළඳනා ලද්දේ ය. අන්වභාවිෂාතාම්- අන්වභවිෂාතාම්, අන්වභාවිෂත- අන්වභවිෂත යනු ද්වි- බහු වචන යි.

a. **"ශීඞො'යඞ් කිති ඞිති යෙ වක්තව්‍යඃ" ශය්‍යතෙ, ශිශ්‍යෙ, ශායිෂීෂ්ට- ශයිෂීෂ්ට, අශායි, අනුශායි, අනුශායිෂාතාම්- අනුශයිෂාතාම්, අනුශායිෂත- අනුශයිෂත.**

b. **යෙ කර්මසාපෙක්‍ෂාං ක්‍රියාමාහුසෙත සකර්මකාඃ. යකි, කටඃ ක්‍රියතෙ දෙවදත්තෙන. "ත්වං දුඃඛී ක්‍රියසෙ රාගෛඃ- විරාගෛඃ සුඛ්‍යහං ක්‍රියෙ." චක්‍රෙ, කාරිෂීෂ්ට- කෘෂීෂ්ට, කාරිතා- කර්තා, කාරිෂ්‍යතෙ- කරිෂ්‍යතෙ, අකාරිෂ්‍යත- අකරිෂ්‍යත, අකාරි, අකාරිෂාතාම්- අකෘෂාතාම්, අකාරිෂත- අකෘෂත.**

---

a. කිති ඞිති යෙ, කිත් වූ ද- ඞිත් වූ ද යකාරය පර කල්හි; ශීඞඃ, "ශීඞ් සවප්නෙ" ධාතුහට; අයඞ් වක්තව්‍යඃ, අයඞ් ආදෙශය කිය යුතු යි. (**යඞන්ත ප්‍රක්‍රියා**වේ අග ද මෙය පෙණේ. එහි ඞිත් යකාරය පර නිමිත්තෙන් ද, මෙහි කිත් යකාරය පර නිමිත් තෙන් ද කාය්‍යීය වේ.) ශය්‍යතෙ, (ශය්‍යෙත, ශය්‍යතාම්, අශය්‍යත,) ශිශ්‍යෙ යනු භාවයෙහි ලට්- (විධි ලිඞ්- ලොට්- ලඞ්-) ලිට් රූපයෝ යි. ශායිෂීෂ්ට- ශයිෂීෂ්ට, (ශායිතා- ශයිතා, ශායිෂ්‍යතෙ- ශයිෂ්‍යතෙ, අශායිෂ්‍යත- අශයිෂ්‍යත) යනු ආශීර් ලිඞ්- (ලුට්- ලෘට්- ලෘඞ්) ලකාරයන්හි ද, අශායි යනු ලුඞ් ලකාරයෙහි ද භාව රූපයෝ යි. අනුශායි යනු (අනු උපසර්ග පූර්වකත්වයෙන් සකර්මක වූ හෙයින්) කර්මකාරකයෙහි ලුඞ් ප්‍ර: එක වචන යි. අනුශායිෂාතාම්- අනුශයිෂාතාම්, අනුශායිෂත- අනුශයිෂත යනු රූප දෙක බැගින් ද්වි- බහු වචන යි. ("අනුශය්‍යතෙ, අනුශය්‍යෙතෙ, අනුශය්‍යන්තෙ" යනාදි වශයෙන් ලඩාදියෙහි ද වර නැගිය යුතු.)

b. යෙ, යම් ධාතු කෙනෙක්; කර්මසාපෙක්‍ෂාම්, කර්මාපෙක්‍ෂා සහිත වූ; ක්‍රියාම්, ක්‍රියාව; ආහුඃ, කියද්ද; තෙ, ඔහු; සකර්මකාඃ, සකර්මක නම් වෙති. යකි, යක් ප්‍රත්‍යය විෂයෙහි (කර්මකාරකයෙහි උදාහරණ දක්වනු ලැබේ.) දෙවදත්තෙන, දෙව්දතු විසින්; කටඃ, කළය; ක්‍රියතෙ, කරණු ලැබේ. මෙහි "ක්‍රියතෙ" යනු ලට් ප්‍ර: එක වචන යි. "රාගෛඃ, රාගයන් විසින්; ත්වම්, නුඹ; දුඃඛී ක්‍රියසෙ, දුක් ඇත්තෙක් කරණු ලැබෙහි; විරාගෛඃ, විරාගයන් විසින්; අහම්, මම; සුඛී ක්‍රියෙ, සුවපත් කරණු ලබමි." මෙහි "ක්‍රියසෙ- ක්‍රියෙ" යනු ලට් මධ්‍යමොත්තම පුරුෂෙක වචන යි. (විධි ලිඞ්- ලොට්- ලඞ් ප්‍ර: එක වචනයන්හි ක්‍රියෙත- ක්‍රියතාම්- අක්‍රියත යනු වේ.) චක්‍රෙ යනු ලිට් ප්‍ර: එක වචන යි. කාරිෂීෂ්ට- කෘෂීෂ්ට, කාරිතා- කර්තා, කාරිෂ්‍යතෙ- කරිෂ්‍යතෙ, අකාරිෂ්‍යත- අකරිෂ්‍යත යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි. (ඉඞ් විකල්පත්ව යෙන් රූප ද්වය බැගිනි.) අකාරි, අකාරිෂාතාම්- අකෘෂාතාම්, අකාරිෂත- අකෘෂත යනු ලුඞ් ප්‍රථම පුරුෂ යි.

a. චිඤ් චයනෙ, චීයතෙ, චිච්‍යෙ, චායිෂීෂ්ට- චෙෂීෂ්ට, චායිතා- චෙතා, චායිෂ්‍යතෙ- චෙෂ්‍යතෙ, අචායිෂ්‍යත- අචෙෂ්‍යත, අචායි, අචායිෂාතාම්- අචෙෂාතාම්. "දාදෙරිඃ" දීයතෙ, දදෙ දදාතෙ දදිරෙ.

## 222. ආතො යුක්. (ආතඃ 6-1. යුක් 1-1.)

b. ආකාරාන්තාද්ධාතොර්යුගාගමො භවති ඤිති ණිති ච පරෙ.

c. දායිෂීෂ්ට- දාසීෂ්ට, දායිතා- දාතා, දායිෂ්‍යතෙ- දාස්‍යතෙ, අදායිෂ්‍යත- අදාස්‍යත, අදායි, අදායිෂාතාම්, දාධාස්ථාමිත්වම්. අදිෂාතාම්. ධීයතෙ, අධායි, අධායිෂාතාම්- අධිෂාතාම්. ස්ථීයතෙ, අස්ථායි, ස්තූයතෙ, තුෂ්ටුවෙ, අස්තාවි, අස්තාවිෂාතාම්- අස්තොෂාතාම්, හරිහරෞ භක්තෙන.

---

a. චිඤ් චයනෙ, ඤකාරානුබන්ධ "චි" ධාතුව රැස් කිරීමෙහි වේ. චීයතෙ, චිච්‍යෙ යනු ලට්- ලිට් ප්‍රඃ එක වචන යි. චායිෂීෂ්ට- චෙෂීෂ්ට, චායිතා- චෙතා, චායිෂ්‍යතෙ- චෙෂ්‍යතෙ, අචායිෂ්‍යත- අචෙෂ්‍යත යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන යි. අචායි යනු ලුඞ් ප්‍රඃ එක වචන යි. අචායිෂාතාම්- අචෙෂාතාම් යනු ද්වි වචන යි. "දාදෙරිඃ" යන සූත්‍රයෙන් දා ධාතුහුගේ ආකාරයට ඉකාරය වේ. ("යෙ" යි පූර්වයට දීර්ඝ වේ.) දීයතෙ යනු ලට් ප්‍රඃ එක වචන යි. දදෙ- දදාතෙ- දදිරෙ යනු ලිට් ප්‍රථම පුරුෂ යි.

222. යුගාගම විධි සූත්‍ර යි. "ආදිස්වරස්‍ය ඤ්ණිති-" යි "ඤ්ණිති" යනු ද; "ධාතොඃ" යන සූත්‍රය ද අනුවෘත්ත යි. ඤ්ණිති, ඤිත්- ණිත් පර කල්හි; ආතඃ ධාතොඃ, ආකාරාන්ත ධාතුහු සම්බන්ධ ව; යුක්, යුගාගම වේ.

b. ඤිති, ඤකාර ඉත් කොට ඇති ප්‍රත්‍යය ද; ණිති ච, ණකාර ඉත් කොට ඇති ප්‍රත්‍යය ද; පරෙ, පර කල්හි; ආකාරාන්තාත් ධාතොඃ, ආකාරාන්ත ධාතුහු කෙරෙන්; යුගාගමඃ භවති, යුක් ආගම වේ. (මෙයින් ඉඩාගම පක්‍ෂයෙහි එය ණිත් බැවින් යුගාගමය වේ.)

c. දායිෂීෂ්ට- දාසීෂ්ට, දායිතා- දාතා, දායිෂ්‍යතෙ- දාස්‍යතෙ, අදායිෂ්‍යත- අදාස්‍යත යනු ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන යි. අදායි, අදායිෂාතාම් යනු ලුඞ් ප්‍රඃ එක- ද්වි වචන යි. දාධාස්ථාම්, දා- ධා- ස්ථා ධාතූන්ගේ අන්ත්‍යයට; ඉත්වම්, ඉකාර බව වේ. අදිෂාතාම් යනු අනිට් පක්‍ෂයෙහි ලුඞ් ප්‍රඃ ද්වි වචන යි. ධීයතෙ යනු "ධා" ධාතු ලට් ප්‍රඃ එක වචන යි. අධායි යනු ලුඞ් ප්‍රඃ එක වචන යි. අධායිෂාතාම්- අධිෂාතාම් යනු ද්වි වචන යි. (සෙස්ස "දා" ධාතුව මෙනි.) ස්ථීයතෙ- අස්ථායි යනු "ස්ථා" ධාතු

**a. හඤ්ඤතෙ. "හනො ඝ්න" ජඝ්නෙ, ඝානිෂීෂ්ට- හංසීෂ්ට, "හනෙතඃ ස්‍යාශිසීාද්‍යද්‍යොර්වධාදෙශො වක්තව්‍ය ආති වා" වධිෂීෂ්ට, ඝානිතා- හන්තා, ඝානිෂ්‍යතෙ- හනිෂ්‍යතෙ, අඝානිෂ්‍යත- අහනිෂ්‍යත, අඝානි- අඝානිෂාතාම්.**

**b. "හන ආත්මනෙපදෙ සිඃ කිද් වාච්‍යඃ" "ලොපස්ඣනුදාත්ත තනාම්" අහසාතාම්, අඝානිෂත- අහසත, අවධි, අවධිෂාතාම්.**

---

ලඞ්- ලුඞ් ප්‍ර: එක වචන සි. ("ද" ධාතුව මෙති.) ස්තූයතෙ, තුෂ්ටුවෙ යනු "ස්තු" ධාතු ලට්- ලිට් ප්‍ර: එක වචන සි. අස්තාවි යනු ලුඞ් ප්‍ර: එක වචන සි. අස්තාවිෂාතාම්- අස්තොෂාතාම් යනු ද්වි වචන සි. භක්තෙන, භක්තිමත්හු විසින්; හරිහරෞ, විෂ්ණු- ඊශ්වර දෙදෙන; අස්තොෂාතාම්, පසස්තා ලදහ.

a. හන්‍යතෙ යනු "හන්" ධාතු ලට් ප්‍ර: එක වචන සි. "හනො ඝ්න" යන සූත්‍රයෙන් හකාරයට ඝකාරය වේ. (ඊට පෙර "ගමාං ස්වරෙ" සි උපධා ලොපය වේ.) ජඝ්නෙ යනු ලිට් ප්‍ර: එක වචන සි. ඝානිෂීෂ්ට- හංසීෂ්ට යනු ආශීර් ලිඞ් ප්‍ර: එක වචන සි. ("ඝානිෂීෂ්ට" යන තැන්හි ඉඩාගමය ඤිත් බැවින් "අත උපධායාඃ" සි වෘද්ධි වේ. "හංසීෂ්ට" යන තැන්හි "නශ්චාපදාන්තෙ ඣසෙ" සි නකාරයට අනුස්වාරය වේ.) ස්‍යාශිසීාද්‍යෙඃ, "සි" යන්න හා ආශීර් යාදිය පර කල්හි; හනෙතඃ, "හන්" ධාතුහට; වධාදෙශඃ, 'වධ' ආදෙශය; වක්තව්‍යඃ, කිය යුතු සි. ආති, ආත්මනෙපදයෙහි; වා, විකල්පයෙන් වධාදෙශය කිය යුතු සි. (එහෙත් ඤිත් වූ ඉඩාගමය ඇති කල්හි වධාදෙශය නො වේ යයි "ඉණ්වද්භාවො වධාදෙශස්‍ය බාධකො ඥෙයඃ" සි සුබොධිනියෙහි කීහ.) වධිෂීෂ්ට යනු වධාදෙශ වූ පක්ෂයෙහි ආශීර් ලිඞ් ප්‍ර: එක වචන සි. ඝානිතා- හන්තා, ඝානිෂ්‍යතෙ- හනිෂ්‍යතෙ, අඝානිෂ්‍යත- අහනිෂ්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන සි. අඝානි, අඝානිෂාතාම් යනු ලුඞ් ප්‍ර: එක- ද්වි වචන සි.

b. හනඃ, "හන්" ධාතුහුගේ; ආත්මනෙපදෙ, ආත්මනෙපදයෙහි; සිඃ, සි ප්‍රත්‍යය; කිත් වාච්‍යඃ, කිත් යයි කිය යුතු සි. "ලොපස්ඣනුදාත්ත තනාම්" යන සූත්‍රයෙන් (කිත් වූ සිප්‍රත්‍යය පර කල්හි) ධාත්වන්ත නකාරයට ලොප් වේ. අහසාතාම් යනු සිප්‍රත්‍යය කිත් වූ පක්ෂයෙහි ලුඞ් ප්‍ර: ද්වි වචන සි. අඝානිෂත- අහසත යනු බහු වචන සි. අවධි, අවධිෂාතාම් යනු වධාදෙශ වූ පක්ෂයෙහි ලුඞ් ප්‍ර: එක- ද්වි වචන සි.

a. "ග්‍රහාං ඣිති ච" ගෘහ්‍යතෙ, ජගෘහෙ, ග්‍රාහිෂීෂ්ට, "ඊටො ග්‍රහාම්." ග්‍රහිෂීෂ්ට, ග්‍රාහිතා- ග්‍රහීතා, ග්‍රාහිෂ්‍යතෙ- ග්‍රහිෂ්‍යතෙ, අග්‍රාහිෂ්‍යත- අග්‍රහිෂ්‍යත, අග්‍රාහි, අග්‍රාහිෂාතාම්- අග්‍රහිෂාතාම්.

b. දෘශ්‍යතෙ, දදෘශෙ, දර්ශිෂීෂ්ට- දෘක්ෂීෂ්ට, දර්ශිතා- ද්‍රෂ්ටා, දර්ශිෂ්‍යතෙ- ද්‍රක්ෂ්‍යතෙ, අදර්ශි, අදර්ශිෂාතාම්- අදෘක්ෂාතාම්.

c. ඩුපචඃ පාකෙ, පච්‍යතෙ, පෙචෙ, පක්ෂීෂ්ට, පක්තා, පක්ෂ්‍යතෙ, අපක්ෂ්‍යත, අපාචි, අපක්ෂාතාම්.

## 223. තනොතෙ ර්වා.* (තනොතෙඃ 6-1. වා, නිඃ)

a. "ග්‍රහාං ඣිති ච" යන සූත්‍රයෙන් "ග්‍රහ්" ධාතුහට සම්ප්‍රසාරණ වේ. ගෘහ්‍යතෙ, ජගෘහෙ, ග්‍රාහිෂීෂ්ට යනු ලට්- ලිට්- ආශීර් ලිඞ් ප්‍රඃ එක වචන යි. "ඊටො ග්‍රහාම්" යන සූත්‍රයෙන් ව්‍යවස්ථා වශයෙන් ඉඩාගමයට ඊකාරය වේ. ග්‍රහීෂීෂ්ට යනු ඒ පක්ෂයෙහි ආශීර් ලිඞ් ප්‍රඃ එක වචන යි. ("ඉණ් වත්" භාවයක් නැති හෙයින් වෘද්ධි නො වේ.) ග්‍රාහිතා- ග්‍රහීතා, ග්‍රාහිෂ්‍යතෙ- ග්‍රහීෂ්‍යතෙ, අග්‍රාහිෂ්‍යත- අග්‍රහීෂ්‍යත යනු ලුට්- ලෘට්- ලෘඞ් ප්‍රඃ එක වචන යි. අග්‍රාහි යනු ලුඞ් ප්‍රඃ එක වචන යි. අග්‍රාහිෂාතාම්- අග්‍රහීෂාතාම් යනු ද්වි වචන යි.

b. දෘශ්‍යතෙ, දදෘශෙ යනු "දෘශ්" ධාතු ලට්- ලිට් ප්‍රඃ එක වචන යි. දර්ශිෂීෂ්ට- දෘක්ෂීෂ්ට, දර්ශිතා- ද්‍රෂ්ටා, දර්ශිෂ්‍යතෙ- ද්‍රක්ෂ්‍යතෙ යනු රූප දෙක බැගින් ආශීර් ලිඞ්- ලුට්- ලෘට් ප්‍රඃ එක වචන යි. අදර්ශි යනු ලුඞ් ප්‍රඃ එක වචන යි. අදර්ශිෂාතාම්- අදෘක්ෂාතාම් යනු ද්වි වචන යි. ("ඡශෂරාජාදෙඃ ෂඃ" යි ශකාරයට ෂකාර ව "ෂඪොඃ කඃ සෙ" යි ඊට කකාර ව "ඛිලාත් ෂඃ සඃ කෘතස්‍ය" යි කකාරයෙන් පර සකාරයට ෂකාරය ව "දෘක්ෂීෂ්ට" යනාදිය සිද්ධ යි. "සිසොඃ" යි ගුණ ප්‍රතිෂෙධ යි.)

c. ඩුපචඃ පාකෙ, ඩු-අඃ අනුබන්ධ "පච්" ධාතුව පිසීමෙහි වේ. පච්‍යතෙ, පෙචෙ, පක්ෂීෂ්ට, පක්තා, පක්ෂ්‍යතෙ, අපක්ෂ්‍යත, අපාචි යනු පිළිවෙළින් ලට්- ලිට්- ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍රඃ එක වචන යි. අපක්ෂාතාම් යනු ලුඞ් ද්වි වචන යි.

223. ආකාරාදෙශ විධි සූත්‍ර යි. "සඞ්ඛ්‍යක්ෂරාණාමා" යි "ආ" යනු ද, "අයකි" යි "යකි" යනු ද අනුවෘත්ත යි.

යකි, යක් ප්‍රත්‍යය පර කල්හි; තනොතෙඃ, "තන්" ධාතුහුගේ අන්තයට; වා, විකල්පයෙන්; ආ, ආකාරය වේ.

* තනොතෙර්තො වා- පොත්හි.

**a. තනොතෙ ත්ඤකාරස්‍ස වා ආකාරො භවති යකි පරෙ. තායතෙ- තඤ්‍ඤතෙ, තෙනෙ, අතානි, අතනිෂාතාම්.** *

**b. භඤ්ජා ආමද්දනෙ, "නො ලොපඃ" භජ්‍යතෙ, අකිත්ත්වාත් බභඤ්ජ, භඞ්ක්ෂීෂට, භඞ්ක්තා, භඞ්ක්ෂ්‍යතෙ, "භඤ්ජරිණි වා න ලොපො වාච්‍යඃ" අභඤ්ජි- අභාජි.**

**c. ශම උපශමෙ, ශම්‍යතෙ මුනිනා. "ධාතොඃ ප්‍රේරණෙ" "මිතාං හ්‍රස්වඃ" "ඤෙඃ" ශම්‍යතෙ මොහො හරිණා. ශම සාඤ්වක්‍රො.**

---

a. යකි පරෙ, යක් ප්‍රත්‍යය පර කල්හි; තනොතෙඃ, "තන්" ධාතුහුගේ; නකාරස්‍ය, නකාරයට; වා, විකල්පයෙන්; ආකාරඃ භවති, ආකාරය වේ. (ඉන් පසු "සවර්ණේ දීර්ඝඃ සහ" යි දීර්ඝ වේ.) තායතෙ යනු ආකාරය වූ පක්ෂයෙහි ද, තන්‍යතෙ යනු විකල්ප පක්ෂයෙහි ද ලට් ප්‍ර: එක වචන යි. තෙනෙ, අතානි යනු ලිට්- ලුඞ් ප්‍ර: එක වචන යි. අතනිෂාතාම් යනු ලුඞ් ද්වි වචන යි. (තනිෂීෂට, තනිතා, තනිෂ්‍යතෙ, අතනිෂ්‍යත යනු ආශිර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි.)

b. භඤ්ජා ආමද්දනෙ, ඔකාරානුබන්ධ "භන්ජ්" ධාතුව මැඩීමෙහි වේ. "නො ලොපඃ" යන සූත්‍රයෙන් ධාතුහුගේ නකාරයට ලොප් වේ. භජ්‍යතෙ යනු ලට් ප්‍ර: එක වචන යි. අකිත්ත්වාත්, කිත් නො වන බැවින්; බභඤ්ජ, (නකාර ලොප් නො ව) ලිට් ප්‍ර: එක වචනයෙහි 'බභඤ්ජ' කියා වේ. භඞ්ක්ෂීෂට, භඞ්ක්තා භඞ්ක්ෂ්‍යතෙ යනු ආශිර් ලිඞ්- ලුට්- ලෘට් ප්‍ර: එක වචන යි ("භන්ජ් + සීෂ්ට" යි සිටි කල්හි "චොඃ කුඃ" යි ජකාරයට ගකාර ව ඊට "ඛසෙ චපාඃ" යනාදීන් කකාර ව "ක්ෂිලාත්-" යි සකාරයට ෂකාර ව "නශ්චාපදාන්තෙ ඣලි" යි නකාරයට අනුස්වාර ව "යමා යපෙ'ස්‍ය" යි ඊට ඞකාරය වීමෙන් "භඞ්ක්ෂීෂ්ට" යි සිද්ධ යි. සෙස්ස ද එසේ යි.) ඉණි, ඉණ් ප්‍රත්‍යය පර කල්හි; භඤ්ජඃ, "භන්ජ්" ධාතුහුගේ නලොපඃ, නකාර ලොපය; වා වාච්‍යඃ, විකල්පයෙන් වේ යයි කිය යුතු යි. අභඤ්ජි යනු නකාර ලොප විකල්ප පක්ෂයෙහි ද, අභාජි යනු නකාර ලොප පක්ෂයෙහි ද ලුඞ් ප්‍ර: එක වචන යි.

c. ශම උපශමෙ, "ශම්" ධාතුව සන්සිඳීමෙහි වේ. ශම්‍යතෙ යනු (ධාතුව අකර්මක හෙයින්) භාවයෙහි ලඩ් රූපය යි. මුනිනා, මුනිහු විසින්; ශම්‍යතෙ, සන්සිඳීම යි. "ධාතොඃ ප්‍රේරණෙ" යන

---

* මෙහි "අතානිෂාතාම්" යි ද රූපයෙක් පොත්හි පෙණේ. චන්ද්‍රකීර්ති ටීකාවෙහි ලුට් ආදියෙහි ද එසේ වර නගා තිබේ. එහෙත් ඉණ්වද්භාවය හඳුරණ ලද්දේ ස්වරාන්ත ධාතුන් හා හන්-ග්‍රහ-දෘශ් ධාතුන් සම්බන්ධ ව පමණයි. එබැවින් එබඳු රූපයක් නො ලැබිය හැකි යි.

**a. ඤ්‍යන්තානාං මිතාමිණි ණිදිටි ච වා වෘද්ධිර්වාච්‍යා ණිදිටි ඤිලොපශ්ච. අශමි- අශාමි, අශමිෂාතාම්- අශාමිෂාතාම්, ණිද්වද්ඩභාවපක්ෂෙ අශමයිෂාතාම්. "ගුණොර්ති සංයොගාද්‍යොඃ" අයසීතෙ. සමයසීතෙ.**

---

සූත්‍රයෙන් ශම් ධාතුහු කෙරෙන් ඤි ප්‍රත්‍යය වේ. "මිතාං හ්‍රස්වඃ" යන සූත්‍රයෙන් හ්‍රස්ව වේ. (මේ හ්‍රස්වය වන්නේ "ඤිත්" පර නිමිත්තෙන් "අත උපධායාඃ" සි වෘද්ධි වූ පසු ය.) "ඤෙඃ" යන සූත්‍රයෙන් ඤි ප්‍රත්‍යයට ලොප් වේ. ශම්‍යතෙ යනු (ඤ්‍යන්ත හෙයින්) කර්ම කාරකයෙහි ලට් ප්‍ර: එක වචන යි. හරිණා, විෂ්ණුහු විසින්; මොහඃ, මොහය; ශම්‍යතෙ, සන්සිඳුවනු ලැබේ. ශමයාඤ්චක්‍රෙ යනු ලිට් ප්‍ර: එක වචන යි.

a ඉණි, ඉණ් ප්‍රත්‍යය පර කල්හි ද; ණිදිටි ච, ණිත් වූ ඉඩාගමය පර කල්හි ද; ඤ්‍යන්තානාම්, ඤි ප්‍රත්‍යයාන්ත වූ; මිතාම්, මිත් සංඥ ධාතූන්ට; වා, විකල්පයෙන්; වෘද්ධිඃ වාච්‍යා, වෘද්ධිය කිය යුතු යි. ණිදිටි, ණිත් වූ ඉඩාගමය පර කල්හි; ඤිලොපඃ ච, ඤි ප්‍රත්‍යය ලොපය ද වේ.

(ශාමිෂීෂ්ට- ශමිෂීෂ්ට- ශමයිෂීෂ්ට, ශාමිතා- ශමිතා- ශමයිතා, ශාමිෂ්‍යතෙ- ශමිෂ්‍යතෙ- ශමයිෂ්‍යතෙ, අශාමිෂ්‍යත- අශමිෂ්‍යත- අශමයිෂ්‍යත යනු පිළිවෙළින් ආශීර් ලිඞ්- ලුට්- ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි වෘද්ධි වීමෙන් ද, විකල්පයෙන් වෘද්ධි නො වීමෙන් ද, ඉණ්වද්භාවය නො වීමෙන් හෙවත් ඉඩාගමය ණිත් නො වීමෙන් ද රූප ත්‍රය බැගින් ලැබේ. "ශම්" ධාතුව පිළිබඳ ව ඉණ්වද් භාවය වන්නේ ඤ්‍යන්ත වූ පසු ස්වරාන්ත ධාතුවක් වශයෙනි.)

අශාමි- අශමි, අශාමිෂාතාම්- අශමිෂාතාම්- යනු ලුඞ් ප්‍ර: එක- ද්වි වචන යි. ණිත් + වත් + ඉට් + අභාවපක්ෂෙ, ණිත් වැනි ඉඩාගමය නුවූ පක්ෂයෙහි; අශමයිෂාතාම්, ලුඞ් ප්‍ර: ද්වි වචනයෙහි 'අශමයිෂාතාම්' කියා වේ. (අශාමිෂත- අශමිෂත · අශමයිෂත යනු බහු වචන යි.) "ගුණොර්තිසංයොගාද්‍යොඃ" යන සූත්‍රයෙන් ගුණ වේ. අයසීතෙ යනු "ඍ" ධාතු ලට් ප්‍ර: එක වචන යි. (අයෛත, අයීතාම්, ආයීත, ආරෙ යනු විධි ලිඞ්- ලොට්- ලඞ්- ලිට් ප්‍ර: එක වචන යි. ආරිෂීෂ්ට- ඍෂීෂ්ට, ආරිතා- අර්තා යනු රූප දෙක බැගින් ආශීර් ලිඞ්- ලුට් ප්‍ර: එක වචන යි. ආරිෂ්‍යතෙ, -අරිෂ්‍යතෙ, ආරිෂ්‍යත, ආරි යනු ලෘට්- ලෘඞ්- ලුඞ් ප්‍ර: එක වචන යි.) සමයසීතෙ යනු "සමෘ" ධාතු ලට් ප්‍ර: එක වචන යි. (ලිට්හි සසමරෙ යනු ද, ආශීර් ලිඞ්හි සමාරිෂීෂ්ට- සමෘෂීෂ්ට යනු ද, ලුට්හි සමාරිතා- සමර්තා යනු ද, ලෘට්හි සමාරිෂ්‍යතෙ -සමරිෂ්‍යතෙ, යනු ද, ලෘඞ්හි අසමාරිෂ්‍යත -අසමරිෂ්‍යත, යනු ද, ලුඞ්හි අසමාරි යනු ද ප්‍ර: එක වචන යි.)

**a. යත් කර්ම ගුණසංයොගාත් කර්තෘත්වෙන විවක්ෂ්‍යතෙ ස කර්මකර්තා. තදුක්තම්:-**

**b. “ක්‍රියමාණං තු යත් කර්ම- ස්වයමෙව ප්‍රසිද්ධ්‍යති,**
**සුකරෛඃ ස්වෛර්ගුණෛර්‍යස්මාත්- කර්මකර්තෙති තද්විදුඃ.”**

**c. තත්‍රාප්‍යෙතදෙවොදාහරණම්.**

**d. කර්මවත් කර්මණා තුල්‍යක්‍රියඃ. ***

**e. කර්මස්ථයා ක්‍රියයා තුල්‍යක්‍රියඃ කර්තා කර්මවද් භවති. ***

---

a. යත් කර්ම, යම් කර්මයක්; ගුණ සංයොගාත්, ගුණ සංයොග හෙතුවෙන්; කර්තෘත්වෙන, කර්තෘ භාවයෙන්; විවක්ෂ්‍යතෙ, විවක්ෂා කරනු ලැබේ ද; සඃ, හෙතෙමේ; කර්මකර්තා, “කර්මකර්තෘ” නම් වේ. තත් උක්තම්, ඒ කියන ලදී:-

b. ක්‍රියමාණම්, කරනු ලබන්නා වූ; යත් කර්ම, යම් කර්මයෙක්; යස්මාත්, යම් හෙයකින්; සුකරෛඃ, සුකර වූ; ස්වෛඃ ගුණෛඃ, ස්වකීය ගුණයන් කරණ කොට ගෙණ; ස්වයම් එව, තෙමේ ම; ප්‍රසිද්ධ්‍යති, ප්‍රසිද්ධ වේ ද හෙවත් නිෂ්පත්තියට පැමිණේ ද; තත් තු, ඒ වනාහි; කර්මකර්තා ඉති, කර්මකර්තෘ යයි; විදුඃ, දනිත්.

(මෙයින් ‘කර්මකර්තෘ’ හඳුන්වන ලදී. යම් කර්මස්ථ ක්‍රියාවක් සාධන සම්පත්තීන් හෙතු කොට ගෙණ ඉබේ ම සිද්ධ වේ නම් ඊට කර්මය වූයේත් කර්තෘ වූයේත් එක ම වස්තුවකි. එහෙයින් ඒ කර්මකර්තෘ යයි කියනු ලැබේ. **ස්වයංකර්තෘ ස්වයංකර්ම** යනු ද ඊට ම නමෙකි. මෙය ලැබෙනුයේ සකර්මක ධාතූන් අතර කර්මස්ථ ක්‍රියා ඇති ධාතූන් විෂයෙහි පමණෙකි. අනික් කර්තෘ කෙනෙකුන් නැති බැවින් කර්මය ම කර්තෘ වශයෙන් ද සැලකීම මෙහි ස්වභාවය යි. ක්‍රියා භාරය කර්මයට අයත් හෙයින් ද, එය ම කර්තෘ වී උක්ත වන හෙයින් ද ‘ස්වයංකර්තෘ ස්වයංකර්ම’ ක්‍රියාව කර්මකාරක ප්‍රත්‍යයෙන් සිදු වේ.)

c. තත්‍ර අපි, ඒ කර්මකර්තෘ විෂයෙහි ද; එතත් එව උදාහරණම්, මේ කර්මකාරක ක්‍රියාව ම උදාහරණ යි. (කර්මකර්තෘ ක්‍රියාව ද කර්ම කාරකයෙහි ම වර නැගෙන හෙයිනි.)

d. කර්මණා, කර්මස්ථ ක්‍රියාව හා; තුල්‍යක්‍රියඃ, සමාන ක්‍රියා ඇත්තේ; කර්මවත්, කර්මය මෙනි.

e. කර්මස්ථයා ක්‍රියයා, කර්මස්ථ ක්‍රියාව හා; තුල්‍යක්‍රියඃ, සමාන ක්‍රියා ඇති; කර්තා, කර්තෘ තෙමේ; කර්මවත් භවති, කර්මය මෙන් වේ.

---

* මේ පාණිනීය සූත්‍ර- වෘත්ති ද්වයෙකි.

**a. ලූයතෙ කෙදාරඃ ස්වයමෙව. ලුලුවෙ, අලාවි, අලාවිෂාතාම්. පච්‍යතෙ ඔදනඃ ස්වයමෙව, භිදිර් විදාරණෙ, භිද්‍යතෙ කාෂ්ඨං ස්වයමෙව. අභෙදි.**

**b දුහස්නුනමාං කර්මකර්තරි යගිණෞ න. දුග්ධෙ, ස්නුතෙ ගෞඃ ස්වයමෙව. නමතෙ දණ්ඩඃ ස්වයමෙව. අදුග්ධ. අස්නොෂ්ට– අස්නාවිෂ්ට. අනංස්ත. අථ ද්විකර්මකාඃ:–**

**c. දුහ්යාච්පච්දණ්ඩිරුධිප්‍රච්ඡි– චිබ්‍රූශාසුජිමන්ථ්මුෂාම්,**
**කර්මයුක් ස්‍යාදකථිතං– තථා ස්‍යාන් නීහෘකෘෂ්වහාම්.**

---

a. කෙදාරඃ, කුඹුර; ස්වයම් එව, තෙමේ ම; ලූයතෙ, කැපේ. (මෙහි "ලූයතෙ" යනු කර්මකර්තෘක ලට් ප්‍ර: එක වචන යි. කෙදාරය තෙමේ අනුන්ගේ උපකාරයක් හෝ මෙහෙයීමක් නැති ව ඉබේ ම කැපුනු හෙයින් "කර්මකර්තෘ" යි.) ලුලුවෙ, අලාවි යනු ලිට්– ලුඞ් ප්‍ර: එක වචන යි. අලාවිෂාතාම්, යනු ද්වි වචන යි. ඔදනඃ, බත; ස්වයම් එව, තෙමේ ම; පච්‍යතෙ, පැසේ. භිදිර් විදාරණෙ, ඉරනුබන්ධ "භිද්" ධාතුව පැලීමෙහි වේ. කාෂ්ඨම්, කාෂ්ඨය (=දර;) ස්වයම් එව, තෙමේ ම; භිද්‍යතෙ, පැලේ. අභෙදි යනු ලුඞ් ප්‍ර: එක වචන යි.

b. දුහස්නුනමාම්, 'දුහ්– ස්නු– නම්' යන ධාතූන්ගේ; කර්මකර්තරි, කර්මකර්තෘ විෂයෙහි; යක් ඉණෞ, යක්– ඉණ් ප්‍රත්‍යය දෙදෙන; න, නො වෙත්. (යථොක්ත ධාතූන් කෙරෙන්; "ස්වයංකර්තෘ ස්වයංකර්ම" විෂයෙහි "යක් චතුර්ෂු" යි යක් ප්‍රත්‍යය ද, "ඉණ් තත්‍යකර්තරි" යි ඉණ් ප්‍රත්‍යය ද නො වන බව මෙයින් දක්වූහ.) ගෞඃ, දෙන; ස්වයමෙව, තොමෝ ම; දුග්ධෙ, දෙවේ; ස්නුතෙ, (කිරි) වැගිරේ. දණ්ඩඃ, ලීය; ස්වයමෙව, තෙමේ ම; නමතෙ, නැමේ. (මෙහි දුග්ධෙ– ස්නුතෙ– නමතෙ යනු පිළිවෙළින් 'දුහ්– ස්නු– නම්' ධාතූන්ගේ කර්මකර්තෘ විෂයෙහි ලට් ප්‍ර: එක වචන යි.) යක් ප්‍රත්‍යය නො වන බවට උදාහරණ යි. අදුග්ධ, අස්නොෂ්ට– අස්නාවිෂ්ට, අනංස්ත යනු ලුඞ් ප්‍ර: එක වචන යි. ඉණ් ප්‍රත්‍යය නො වන බවට උදාහරණ යි.

අථ, ඉක්බිති; ද්විකර්මකාඃ, ද්විකර්මක ධාතූහු දක්වනු ලැබෙත්:–

c. දුහ්යාච්— මුෂාම්= දුහ්, ප්‍රපූරණාර්ථයෙ වූ "දුහ්" ධාතු ය; යාච්, ඉල්ලීම් අර්ථයෙහි වූ "යාච්" ධාතු ය; පච්, පිසීම් අර්ථයෙහි වූ "පච්" ධාතු ය; දණ්ඩි, දඬුවම් කිරීම් අර්ථයෙහි වූ "දණ්ඩි" ධාතු ය; රුධි, ඇවිරීම් අර්ථයෙහි වූ "රුධ්" ධාතු ය; ප්‍රච්ඡි, විචාරීම් අර්ථයෙහි වූ "ප්‍රච්ඡ්" ධාතු ය; චි, රැස් කිරීම් අර්ථයෙහි වූ "චි" ධාතු ය; බ්‍රූ, ව්‍යක්ත වචනාර්ථයෙහි වූ "බ්‍රූ" ධාතු ය; ශාසු, අනුශාසනා කිරීම්

**ඞ. න්‍යාදයො ණ්‍යන්ත නිෂ්කර්ම- ගත්‍යර්ථා මුඛ්‍යකර්මණි,
ප්‍රත්‍යයං යාන්ති දුහ්‍යාදි- ගෞණෙ'න්‍යෙ තු යථාරුචි.**

---

අර්ථයෙහි වූ "ශාස්" ධාතු ය; ජි, දිනීම් අර්ථයෙහි වූ "ජි" ධාතු ය; මන්ථ්, කැලඹීම් අර්ථයෙහි වූ "මන්ථ්" ධාතු ය; මූෂාම්, චෞර්‍යාර්ථ යෙහි වූ "මූෂ්" ධාතු ය යන මොවුන්ගේ; කර්මයුක්, කර්මය හා යෙදෙන් නේ; අකථිතං ස්‍යාත්, "අකථිත කර්ම" නම් වන්නේ ය. නීහෘකෘෂ් වහාම්= නී, පැමිණවීම් අර්ථයෙහි වූ "නී" ධාතු ය; හෘ, හැරීම් අර්ථ යෙහි වූ "හෘ" ධාතු ය; කෘෂ්, ඇදීම් අර්ථයෙහි වූ "කෘෂ්" ධාතු ය; වහාම්, ඉසිලීම් අර්ථයෙහි වූ "වහ්" ධාතු ය යන මොවුන්ගේ ද; තථා ස්‍යාත්, එසේ ම (කර්මය හා යෙදෙන්නේ අකථිතකර්ම නම්) වන්නේ ය.

(යම් ධාතුවෙක් කර්ම දෙකක් අපෙක්‍ෂා කෙරේ නම් ඒ "ද්වි කර්මක" නම්. මේ ශ්ලොකයෙන් "දුහාදිය- න්‍යාදිය" යයි එබඳු ධාතු කොටස් දෙකක් දක්වූහ. එසේ ම ඔවුන්ගේ අප්‍රධාන කර්මය "අකථිත කර්ම" නම් බව ද කීහ. මෙ හැර ණ්‍යන්ත සකර්මක ධාතුහු ද ද්විකර්මක ධාතුස්ථානයෙහි සිටිති.)

ඞ. න්‍යාදයඃ, නී ආදි ධාතුහු ද, ණ්‍යන්ත නිෂ්කර්මගත්‍යර්ථාඃ, ණි ප්‍රත්‍යයාන්ත අකර්මක ධාතු හා ගමනාර්ථ ධාතුහු ද; මුඛ්‍යකර්මණි, ප්‍රධාන කර්මයෙහි; ප්‍රත්‍යයම්, ප්‍රත්‍යයට; යාන්ති පැමිණෙත්. දුහ්‍යාදිඃ, දුහාදි ගණය; ගෞණෙ, අප්‍රධාන කර්මයෙහි; (ප්‍රත්‍යයං යාති, ප්‍රත්‍ය යට පැමිණෙයි.) අන්‍යෙ තු, සෙසු ධාතුහු වනාහි; යථාරුචි, රිසි සේ (ප්‍රත්‍යයට පැමිණෙත්.)

(න්‍යාදි ධාතු චතුෂ්කයත් ණි ප්‍රත්‍යයාන්ත අකර්මක ධාතු හා ගමනාර්ථ ධාතුත් ප්‍රධාන කර්මය අපෙක්‍ෂා කොට ද, දුහාදි ධාතු දෙළස අප්‍රධාන කර්මය අපෙක්‍ෂා කොට ද, සෙසු ධාතුන් වක්තෘ විවක්‍ෂා ලෙස ද කර්මකාරකයෙහි සිද්ධ වන බව මෙයින් පැවසූහ. මෙය ම සිද්ධාන්ත චන්ද්‍රිකායෙහි:–

"ගෞණෙ කර්මණි දුහ්‍යාදෙඃ- ප්‍රධානෙ නීහෘකෘෂ්වහාම්,
බුද්ධිභක්ෂාර්ථයොඃ ශබ්ද- කර්මණාඤ්ච නිජෙච්ඡයා,
ප්‍රයොජ්‍යකර්මණ්‍යන්‍යෙෂාං- ණ්‍යන්තානාං ලාදයො මතාඃ." යි

ඉගැන්වූහ. (මෙය සාරස්වත කාරකාවසානයෙහිත් පෙණේ. එය ද බලනු.) දුහාදිය පිළිබඳ කර්මකාරක ආඛ්‍යාතය අප්‍රධාන කර්මය කෙරෙහිත්, නී- හෘ- කෘෂ්- වහ් ධාතුන් පිළිබඳ ආඛ්‍යාතය ප්‍රධාන කර්මය කෙරෙහිත් වන බව ද, ණ්‍යන්ත වූ අවබොධාර්ථ–

ෙ ඞ. **"නින්‍යෙ විජනමජාගරි- රජනීමගමි මදමයාචි සම්භොගම්,**
**ගොපී හාස්‍යමකාරීත-භාවශ්චෛවනාමනන්තෙන."**

---

අනුභවනාර්ථ ධාතූන්ගේ හා ශබ්දකර්මක ධාතූන්ගේ ආඛ්‍යාතය වක්තෘ විවක්‍ෂා පරිද්දෙන් ප්‍රධාන හෝ අප්‍රධාන කර්මය කෙරෙහි වන බව ද, සෙසු ණ්‍යන්ත ධාතූන්ගේ ආඛ්‍යාතය ප්‍රයොජ්‍ය කර්ම සඞ්ඛ්‍යාත අප්‍රධාන කර්මය කෙරෙහි වන බව ද එහි අදහස යි. ප්‍රයොජ්‍ය කර්මය නම් කර්ම සංඥාව ලැබූ ප්‍රයොජ්‍ය කර්තෘ ම ය. යම් කර්මයක් අපෙක්‍ෂා කොට ආඛ්‍යාතය යෙදේ නම් එයින් ඒ කර්මය උක්ත වන බව සැලකිය යුතු යි. ශ්ලොකයෙහි "ලාදයඃ" යි කී හෙයින් කර්මකාරක 'ශාන' ප්‍රත්‍යය හා ආදි ශබ්දයෙන් 'කෘත්‍ය- ක්ත- ඛලර්ථ' ප්‍රත්‍යයන් ද මෙසේ ම යෙදෙන බව දක්වයි.)

ඞ. අනනෙතන, විෂ්ණුහු විසින්; ගොපී, ගොපලු ලිය තොමෝ; විජනම්, නිර්ජන ස්ථානයකට; නින්‍යෙ, පමුණුවන ලද්දී ය. රජනීම්, රැය මුළුල්ලෙහි; අජාගරි, නිදි මරවන ලද්දී ය. මදම්, මදයට; අගමි, පමුණුවන ලද්දී ය. සම්භොගම්, සෙවනය; අයාචි, ඉල්ලන ලද්දී ය. හාස්‍යම්, සිනාව; අකාරීත, කරවන ලද්දි ය. එනාම්, මැ ලවා; භාවඃ ච, ඇල්ම ද; (අකාරීත, කරවන ලද්දේ ය.)

(මෙහි i. **අනනෙතන ගොපී විජනං නින්‍යෙ.** ii. **අනනෙතන ගොපී රජනීමජාගරි.** iii. **අනනෙතන ගොපී මදමගමි** කියා වෙන් වෙන් වූ වාක්‍ය සම්බන්ධ ත්‍රයෙහි ම "ගොපී" යනු මුඛ්‍ය කර්මය යි. එය අපෙක්‍ෂා කොට "නින්‍යෙ" යනු න්‍යාදිය හෙයින් ද, "අජාගරි" යනු ණ්‍යන්ත අකර්මක ධාතු හෙයින් ද, "අගමි" යනු ණ්‍යන්ත ගමනාර්ථ ධාතු හෙයින් ද කර්මකාරකයෙහි සිද්ධ වූහ. ඒ ක්‍රියාවන් ගෙන් මුඛ්‍ය කර්මය උක්ත හෙයින් "ගොපී" යි ප්‍රථමා විභක්තියෙන් සිටියේ ය. iv. **අනනෙතන ගොපී මදමයාචි** යන වාක්‍යයෙහි "ගොපී" යනු අමුඛ්‍ය හෙවත් අප්‍රධාන කර්මය යි. "අයාචි" යන්න දුහාදිය හෙයින් එය අපෙක්‍ෂා කොට කර්මකාරකයෙහි සිද්ධ විය. එයින් අප්‍රධාන කර්මය උක්ත හෙයින් මෙහි ද "ගොපී" යි ප්‍රථමා විභක්තියෙන් සිටියේ ය. v. **අනනෙතන ගොපී හාස්‍යමකාරීත.** vi. **අනනෙතන එනාං භාවො'කාරීත** යන වාක්‍ය දෙක්හි "හාස්‍යම්- භාවඃ" යනු ප්‍රධාන කර්ම යි. **"අන්‍යෙ තු යථාරුචි"** යි කී හෙයින් මුල් වාක්‍යයෙහි "ගොපී" යන අප්‍රධාන කර්මය ද, දෙවෙනි වාක්‍යයෙහි "භාවඃ" යන ප්‍රධාන කර්මය ද අපෙක්‍ෂා කොට "අකාරීත" යන ක්‍රියාව කර්මකාරකයෙහි සිද්ධ විය. එයින් ඒ කර්ම දෙක ම උක්ත හෙයින් ප්‍රථමා විභක්තියෙන් ද සිටියේ ය.)

a. කත්තුරිෂ්ටතමං ප්‍රධානං කම්. අනාදප්‍රධානම්. නගරං නීයතෙ නාගරිකෙහි වනෙචරා. භොජනං යාචෘතෙ යජමානො යාචකෙන. පෘච්ඡ්‍යතෙ පන්ථානං පථිකෙන පාන්ථඃ. ශිෂ්‍යෙ ණාචායඃ තත්ත්වං පෘච්ඡ්‍යතෙ.

b. කටශ්චිකීර්ෂ්‍යතෙ දෙවදත්තෙන. "යතඃ" බොභූය්‍යතෙ. "අනපි ච භයාත්" පාපච්‍යතෙ තෙන, පාපචිතා, අපාපචි ත්‍යාදි.

# ඉති භාවකම් ප්‍රක්‍රියා.

a. කර්තෘ, කර්තෘ හට; ඉෂ්ටතමම්, අතිශයින් ඉෂ්ට වූයේ හෙවත් කර්තෘ විසින් අතිශයින් කැමති වන ලද්දේ; ප්‍රධානං කම්, ප්‍රධාන කම්ය යි. අන්‍යත්, අනික; අප්‍රධානම්, අප්‍රධාන කම්ය යි. නාගරිකෛඃ, නුවරුන් විසින්; වනෙචරඃ, වනචර තෙමේ; නගරම්, නුවරට; නීයතෙ, පමුණුවනු ලැබේ. යාචකෙන, යදියා විසින්; යජමානඃ, යාග කරන්නා; භොජනම්, බොජුන්; යාච්‍යතෙ, යදිනු ලැබේ. පථිකෙන, මගියා විසින්; පාන්ථඃ, මාගීඥ තෙමේ; පන්ථානම්, මග; පෘච්ඡ්‍යතෙ, විචාරණු ලැබේ. ශිෂ්‍යෙණ, ශිෂ්‍යයා විසින්; ආචායඃ, ආචායී තෙමේ; තත්ත්වම්, තත්ත්වය; පෘච්ඡ්‍යතෙ, විචාරණු ලැබේ. (මේ වාක්‍යයන්හි පිළිවෙළින් 'වනෙචරඃ- භොජනම්- පන්ථානම්- තත්ත්වම් යනු ප්‍රධාන කම් යි. ඔවුන් කර්තෘන් විසින් අතිශයින් කැමති වන ලද බැවිනි.)

b. දෙවදත්තෙන, දෙව්දත්තු විසින්; කටඃ, කලාල; චිකීර්ෂ්‍යතෙ, කරණු කැමති වනු ලැබේ. (මෙහි "චිකීර්ෂ්‍යතෙ" යනු සංනන්ත 'කෘ' ධාතුහුගේ කම්කාරකයෙහි ලට් ප්‍ර: එක වචන යි. චිකීර්ෂ්‍යෙත, චිකීර්ෂ්‍යතාම්, අචිකීර්ෂ්‍යත, චිකීර්ෂාංචක්‍රෙ, චිකීර්ෂිෂීෂ්ට, චිකීර්ෂිතා, චිකීර්ෂිෂ්‍යතෙ, අචිකීර්ෂිෂ්‍යත, අචිකීර්ෂි යනු සෙසු නව ලකාර යෙහි ප්‍ර: එක වචන යි. මෙසේ සෙසු සංනන්ත ධාතු ද කම්කාරක යෙහි වර නැගිය යුතු.)

"යතඃ" යන සූත්‍රයෙන් යඞ් ප්‍රත්‍යයේ අකාරයට ලොප් වේ. බොභූය්‍යතෙ යනු යඞන්ත 'භූ' ධාතුහුගේ භාවයෙහි ලඞ් රූපය යි. (විධිලිඞ් ආදියෙහි ද දත යුතු) "අනපි ච භයාත්" යන සූත්‍රයෙන් යඞ් ප්‍රත්‍යයට ලොප් වේ. තෙන, ඔහු විසින්; පාපච්‍යතෙ, අතිශයින් පිසනු ලැබේ. (මෙහි "පාපච්‍යතෙ" යනු යඞන්ත 'පච්' ධාතුහුගේ කම් කාරකයෙහි ලට් ප්‍ර: එක වචන යි. පාපච්‍යෙත, පාපච්‍යතාම්, අපාපච්‍යත, පාපචාංචක්‍රෙ

a. අථ ලකාරාර්ථ ප්‍රක්‍රියා:-

**224. හශ්ඨපෞනඃපුන්‍යයෝර්ලෝණ්මධ්‍යම පුරුෂෛකවචනාන්තතා නිපාත්‍යතෙ.**

(හශ්ඨපෞනඃ පුන්‍යයෝඃ 7-2. ලෝණ්ම -පෙ- න්තතා 1-1. නිපාත්‍යතෙ- ආ:)

b. සර්වකාලේ සර්වපුරුෂවිෂයෙ. අතීතෙ කාලෙ:-

c. "පුර්මවස්කන්ද ලුනීහි නන්දනං
මුෂාණ රත්නානි හරාමරාඩ්ගනාඃ,
විගෘහ්‍ය චක්‍රෙ නමුචිද්විෂා බලි
ය ඉත්ථමස්වාස්ථ්‍යමහර්නිශං * දිවඃ."

පාපවිෂීෂට යනු විධිලිඞ්- ලෝට්- ලඞ්- ලිට්- ආශීර්ලිඞ් ප්‍ර: එක වචන යි.) පාපවිතා යනු ලුට් ප්‍ර: එක වචන යි. (පාපවිෂ්‍යතෙ, අපාපවිෂ්‍යත යනු ලෘට්- ලෘඞ් ප්‍ර: එක වචන යි.) අපාපවි යනු ලුඞ් ප්‍ර: එක වචන යි. ඉත්‍යාදි, යනාදිය යි. (සෙසු යඞන්ත ධාතු ද කර්ම කාරකයෙහි මෙසේ වර නැගිය යුතු.)

## භාවකර්ම ප්‍රක්‍රියාව සමාප්ත යි.

---

a. අථ, භාවකර්ම ප්‍රක්‍රියාවට අනතුරු ව; ලකාරාර්ථ ප්‍රක්‍රියා, ලකාරාර්ථ ප්‍රක්‍රියාව; ( දක්වනු ලැබේ. ඒ ඒ ලකාරයන් වන විශෙෂාර්ථයෝ මේ කොටසෙහි කියනු ලැබෙත්.)

224. නිපාතන විධි සූත්‍ර යි. හශ්- පෞනඃපුන්‍යයෝඃ, බලාත්කාරය- නැවත නැවත කිරීම ය යන අර්ථ දෙක්හි; ලෝට් මධ්‍යම පුරුෂ එකවචනාන්තතා, ලෝට් විභක්ති මධ්‍යම පුරුෂ එක වචනාන්ත බව; නිපාත්‍යතෙ, නිපාතනය කරණු ලැබේ.

b, සර්වකාලෙ, සියලු කාලයෙහි; සර්වපුරුෂ විෂයෙ, සියලු පුරුෂ විෂයෙහි; (හශ්- පෞනඃපුන්‍ය දෙක්හි ලෝට් මධ්‍යම පුරුෂ එක වචනය) වේ. අතීතෙ කාලෙ, අතීත කාලයෙහි (ලෝණ් මධ්‍යම පුරුෂෛක වචනයට) උදාහරණ දක්වනු ලැබේ:-

c. යඃ, යමෙක් තෙමේ; නමුචි ද්විෂා, ඉන්ද්‍රයා සමග; විගෘහ්‍ය, විරුද්ධ ව; පුරම්, "අමරාවතී" නම් දෙව් පුරය; අවස්කන්ද, අවහිර කොළේ ද හෙවත් වට ලා ගත්තේ ද; නන්දනම්, නන්දනොද්‍යානය; ලුනීහි, සින්දේ ද; රත්නානි, රත්නයන්; මුෂාණ, සොරකම් කොට

* "අහර්දිවම්" යි ද පාඨ යි.

**a. "වර්තමානාර්ථායා අපි විභක්තෙඃ සමයොගෙ භූතාර්ථතා වක්තව්‍යා." ආහ ස්ම හාරීතඃ යජති ස්ම යුධිෂ්ඨිරඃ.**

**b. "වෛචිත්‍ර්‍යාපන්නවයොරල්පකාලෙ'පි ණාදිර්වක්තව්‍යඃ." සුප්තො'හං කිල විලලාප. නාහං කලිඞ්ගං ජගාම.**

---

ගත්තේ ද; අමරාඞ්ගනාඃ, දෙවඟනන්; හර, පැහැර ගත්තේ ද; ඉත්ථම්, මෙසේ; අහර්නිශම්, දිවා– රෑ මුළුල්ලෙහි; දිවඃ, දෙව් ලොවට; අසවාසව්‍යම්, නො සැප බව; චක්‍රෙ, කෙළේ ද; (ඒ රාවණ තෙමේ යි.)

(මේ ශිශුපාලවධ නම් මාඝ කාව්‍යයේ ප්‍රථම සර්ගයේ පණස් එක් වන ශ්ලෝකය යි. මෙහි අතීත කාලික ලකාරයෙක්හි ප්‍රථම පුරුෂෙක වචනයෙන් දැක්විය යුතු ක්‍රියාවන් "අවස්කන්ද- ලුනීහි- මුෂාණ- හර" කියා ලොණ් මධ්‍යම පුරුෂෙක වචනයෙන් දැක් වූහ. රාවණ මේ ක්‍රියා බලාත්කාරයෙන් කළ හෙයින් ද, නැවත නැවත කළ හෙයින් ද මොහු භෘශාර්ථ- පෞනඃපුන්‍යාර්ථ දෙක්හි ම සිද්ධයහ යි සැලකිය හැකි ය. ක්‍රියා සමභිහාරයෙහි ලොණ් මධ්‍යම පුරුෂෙක වචනය වේ යයි පාණිනියයෙහි කිහ. "ක්‍රියා සමභිහාර" නම් භෘශාර්ථය හෝ පෞනඃ පුන්‍යාර්ථය යි.)

a සමයොගෙ, "ස්ම" යන නිපාතයාගේ යෙදීම ඇති කල්හි; වර්තමානාර්ථායාඃ, වර්තමානාර්ථ ඇති; විභක්තෙඃ අපි, විභක්තිහුගේ ද; භූතාර්ථතා, අතීතාර්ථ ඇති බව; වක්තව්‍යා, කිය යුතු යි. (ලඞ් විභක්ත්‍යන්තය සමග "ස්ම" යන්න යෙදුන කල්හි ද අතීතාර්ථ බව වෙයි යු සේ යි.) හාරීතඃ, හාරීත මුනි තෙමේ; ආහ ස්ම, කීයේ ය. යුධිෂ්ඨිරඃ, යුධිෂ්ඨිර තෙමේ; යජති ස්ම, යාග කෙළේ ය. (මෙහි ආහ- යජති, යන වර්තමානාර්ථ ක්‍රියා දෙක 'ස්ම' යොගය හෙයින් අතීතාර්ථ විය )

b. වෛචිත්‍ර්‍යාපන්නවයොඃ, මුළා බව ය– වළහන බව ය යන අර්ථ දෙක්හි; අල්පකාලෙ අපි, ස්වල්ප කාලයක් වාච්‍ය කල්හි ද; ණාදිඃ, ණබාදිය, වක්තව්‍යඃ, කිය යුතු යි. (ස්වල්ප කාලයෙක්හි නමුත් චිත්ත වික්ෂෙපයෙන් කරණ ලද්දක් හෝ වැළහීමක් කිය යුතු කල්හි ලිඞ් ලකාරය වෙයි කී නියා යි. සිද්ධාන්ත චන්ද්‍රිකායෙහි "අත්‍යන්තාපහ්නවයෙහි" යයි කිහ.) අහම්, මම; සුප්තඃ, සැතපුනේ; විලලාප කිල, වැලපුනෙම් ලු! (සිහිනෙන් හෝ සිහි මුළා බැවින් තමන් කරණ ලද්ද තෙමේ ම නො දත්තේ පසු ව අනුන්ගෙන් අසා මෙසේ කියයි. මෙහි "කිල" යන නිපාතයෙන් තමන් නො දත් බව අඟවයි.) අහම්, මම; කලිඞ්ගම්, කලිඟු රටට; න ජගාම, නො ගියෙම් ලු.

a. යාවත් පුරා නිපාතයොර්යොගෙ භවිෂ්‍යදර්ථෙ තිබාදයඃ, ලට්. පුරා කරොති, යාවත් කරොති, කරිෂ්‍යතීත්‍යර්ථඃ.

b. "ස්මෘත්‍යර්ථධාතුයොගෙ භූතෙ'ර්ථෙ ලෘට්." ස්මරසි මිත්‍ර යදුපකරිෂ්‍යසි, උපාකුරුථා ඉත්‍යර්ථඃ.

---

## ඉති ලකාරාර්ථ ප්‍රක්‍රියා.

---

("අඞ්ගවඞ්ගකලිඞ්ගෙෂු- සෞරාෂ්ට්‍රමගධෙෂු ච,
තීර්ථයාත්‍රාං විනාගත්වා- පුනඃ සංස්කාරමර්හති." යි

කී හෙයින් කලිඟු රට ද නිෂිද්ධ දෙශයෙකි. පිළිකුල් කට යුතු හෙයිනි. නුඹ කලිඟු රටෙහි විසූවෙහි දැයි කිසි කෙනෙකුන් විසින් විචාරණ ලද්දේ එසේ කියයි. එහි වසන්නා තබා ගියේ වත් නැතැයි එයින් අඟවන හෙයින් අත්‍යන්තාපහ්නවය යි.)

a. යාවත් පුරා නිපාතයොඃ යොගෙ, යාවත්- පුරා නිපාත දෙදෙනාගේ යෙදීමක් ඇති කල්හි; භවිෂ්‍යත් අර්ථෙ, අනාගතාර්ථයෙහි; තිබාදයඃ, තිප් ආදි ප්‍රත්‍යයෝ වෙත්; ලට්, ලට් ලකාරය යි. පුරා කරොති "පුරා කරිෂ්‍යති" යි කිය යුතු තැන්හි "පුරා කරොති" යි වේ. යාවත් කරොති, "යාවත් කරිෂ්‍යති" යි කියයුතු තැන්හි "යාවත් කරොති" යි වේ. කරිෂ්‍යති ඉති, කරන්නේ ය යන; අර්ථඃ, අර්ථ යි.

b. ස්මෘති + අර්ථ ධාතු යොගෙ, සිහි කිරීම අර්ථ කොට ඇති ධාතුන්ගේ යෙදීමක් ඇති කල්හි; භූතෙ අර්ථෙ, අතීතාර්ථයෙහි; ලෘට් ලෘට් ලකාරය වේ. මිත්‍ර, මිත්‍රය; යත් උපකරිෂ්‍යසි, යම් උපකාරයක් කෙළෙහි ද (එය); ස්මරසි, සිහි කෙරෙහි; උපාකුරුථාඃ ඉති, උපකාර කෙළෙහි ද යන; අර්ථඃ, අර්ථ යි. (මෙහි අතීතාර්ථ ක්‍රියාව "ස්මෘ" ධාතුහුගේ යොගය හෙයින් "උපකරිෂ්‍යසි" යි ලෘට් ලකාර යෙන් යෙදුනේ ය.)

## ලකාරාර්ථ ප්‍රක්‍රියාව සමාප්ත යි.

---

**a. ධාතූනාමප්‍යනන්තත්වා- න්නානාර්ථත්වාච්ච සර්වථා, අභිධාතුමශක්‍යත්වා- දාඛ්‍යාතඛ්‍යාපනෛරලම්.**

**ඉති**
**ශ්‍රීමදනුභූතිස්වරූපාචාර්‍ය්‍ය විරචිතායාං**
**සාරස්වතීප්‍රක්‍රියායාමාඛ්‍යාත ප්‍රක්‍රියා සමාප්තා.**

---

## සමාප්තෝ'යං ද්විතීයා වෘත්තිඃ.

---

a. ධාතූනාම්, ධාතූන්, අනන්තත්වාත් අපි, කෙළවරක් නැති බැවින් ද; නානාර්ථත්වාත් ච, නා නා අර්ථ ඇති බැවින් ද; සර්වථා, හැම පරිද්දෙන්; අභිධාතුම්, කියන්නට; අශක්‍යත්වාත්, නො හැකි බැවින් ද; ආඛ්‍යාත ඛ්‍යාපනෛඃ, ආඛ්‍යාත ප්‍රකාශයන්ගෙන්; අලම්, පමණි.

(ධාතූහු අනන්තයහ. ඔහු ද එකක් එකක් ම නොයෙක් අර්ථ ඇත්තෝ ය. එසේ ම ඔහු සර්ව ප්‍රකාරයෙන් ප්‍රකාශ කළ නො හැක්කෝ ය. මෙසේ හෙයින් ආඛ්‍යාතයෙහි දක්වූ කොටස ම ප්‍රමාණ ය යනු භාවය යි. කවිකල්පද්‍රුමාදියෙහි ධාතූන් 1754 ක් දක්වූහ. එහෙත් ප්‍රයොගයන්ගේ බහුත්වයෙන් ධාතූහු අනන්ත මය. "වෘහස්පතී කියන්නෙක් ව කියේ වී නමුත් ඉන්ද්‍රයා අසන්නෙක් ව ඇසුයේ වී නමුත් වර්ෂ දහසකිනුත් ධාතූන්ගේ කෙළවරට නො පැමිණෙති" යනු ප්‍රාචීනාචාර්‍ය්‍ය මත යි.)

ඉති, මෙසේ; ශ්‍රීමදනුභූති ස්වරූපාචාර්‍ය්‍ය විරචිතායාම්, ශ්‍රීමත් අනුභූති ස්වරූපාචාර්‍ය්‍යවරයන් විසින් ප්‍රණීත වූ; සාරස්වතී ප්‍රක්‍රියායාම්, "සාරස්වතී" නම් පද සාධන ක්‍රියායෙහි; ආඛ්‍යාත ප්‍රක්‍රියා, ආඛ්‍යාතය පිළිබඳ පද සාධන ක්‍රියා තොමෝ, සමාප්තා, නිමියා ය.

සාරස්වත ව්‍යාකරණයේ

## මේ ද්විතීය වෘත්තිය සමාප්ත යි.

---

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු